A Study In Scarlet

ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්

# ලෝහිත පරීක්ෂණය

සහ තවත්

ෂර්ලොක් හෝම්ස් කථා




චන්දන මෙන්ඩිස්

http://sherlockholmesinvestigations1.blogspot.com/

Reading Purpose Only.. Not For Print.

U EDGE

http://sherlockholmesinvestigations.blogspot.com

# ලෝහිත පරීක්ෂණය

## සහ තවත්
## ෂර්ලොක් හෝම්ස් කථා

ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල්ගේ
A STUDY IN SCARLET හි

අනුසංක්ෂිප්ත පරිවර්තනය
**චන්දන මෙන්ඩිස්**

**චන්දන මෙන්ඩිස් ප්‍රකාශන**
141/2, දුව පාර, බැද්දගාන, කෝට්ටේ

Reading Purpose Only.. Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com




1887 දී ලෝහිත පරීක්ෂණය මුල්වරට ප්‍රකාශයට පත්වෙද්දී එහි
මුල් පිටු සඳහා මෙම චිත්‍රය නිර්මාණය කරන ලද්දේ
ඩී. එච්. ෆ්‍රිස්ටන් විසිනි.

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only, Not For Print

# පටුන


| | පිටුව |
|---|---|
| 1. ලෝහිත පරීක්ෂණය<br>A STUDY IN SCARLET | 14 |
| 2. සොහොයුරන් දෙදෙනා<br>THE ADVENTURE OF THE STOCK-BROKER'S CLERK | 179 |
| 3. කහ පුෂ්පරාගය<br>THE ADVENTURE OF THE MAZARIN STONE | 212 |
| 4. වොට්සන් හපනෙක් වූ හැටි !<br>HOW WATSON LEARNED THE TRICK | 244 |
| 5. තැපෑලෙන් ආ තෑග්ග<br>THE ADVENTURE OF THE CARDBOARD BOX | 249 |
| 6. උප ග්‍රන්ථය | 286 |


Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com



"මම සොයා ගත්තා ! මම සොයා ගත්තා !!"

ඔහු කෑගැසීය.

"............ මේ දොස්තර වොට්සන්, මේ ෂර්ලොක් හෝම්ස් මහත්මයා ............"

(මුල්ම ෂර්ලොක් හෝම්ස් චිත්‍රය (1897), ජෝජ් හචිංසන් විසිනි.

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only, Not For Print.

# ලෝහිත පරීක්ෂණය

## පළමුවන කොටස

යුද්ධ හමුදා වෛද්‍ය ඒකකයේ සේවය කළ
වෛද්‍ය ජෝන්. එච්. වොට්සන් මහතාගේ
මතක සටහන් වලින්

### 1

### ෂර්ලොක් හෝම්ස් මහතා

වර්ෂ 1878 දී ලන්ඩන් විශ්වවිද්‍යාලයෙන් මම වෛද්‍යවරයකු ලෙස සාමර්ථ්‍යය ලැබුවෙමි. ඉන්පසු යුද්ධ හමුදා ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස පුහුණුව ලැබීමට නෙට්ලි වෙත යෑමට මට සිදුවිය. පුහුණුවෙන් පසු සහකාර ශල්‍ය වෛද්‍යවරයෙකු ලෙස පස්වැනි නොදම්බලන්ඩ් පාබළ හමුදා රෙජිමේන්තුවේ මට පත්වීමක් ලැබිණ.

එවකට බ්‍රිතාන්‍ය හමුදාවෝ ඉන්දියාවේ පැවැති නිදහස් අරගලයට එරෙහිව සටනේ යෙදී සිටියහ. මා හමුදාවට බැඳෙද්දී දෙවැනි ඇෆ්ගනිස්ථාන් යුද්ධය ආරම්භ වූවා පමණි. බොම්බාය වෙත ගිය මම, ආරක්ෂා සහිතව කන්දහාර් ප්‍රදේශයට ළඟාවුණෙමි.

මෙම යුද්ධයෙන් බොහෝදෙනෙකුට හමුදා ගෞරව හා උසස්වීම් ලැබුණත් මට හිමිවූයේ අවාසනාව හා විනාශය පමණකි. මයිවාන්ඩ් හි පැවැති මාරාන්තික සංග්‍රාමයේදී සතුරන්ගේ ජසායිල් වර්ගයේ පතරොම් තුවක්කු වෙඩි පහරකින් මගේ උරහිසට තුවාල සිදුවිය. තුවාලවලින් මා අසරණ වෙද්දී මිනීමරු සාසීන්ට මා හසුවීමට ඉඩ තිබිණ. මගේ උපස්ථායකයා වූ මරේ මහත් ධෛර්යයකින්, තම දිවි නොතකා, මගේ ජීවිතය ගළවා ගත්තේය. අශ්වයකු පිට තබා මා බ්‍රිතාන්‍ය කඳවුර වෙත ගෙන ඒමට ඔහු සමත් විය.

http://sherlockholmesinvestigations.blogspot.com

තුවාලකාරයන් රාශියක් සමඟ මා, පෙෂාවර්හි මූලික රෝහල වෙත ගෙන යන ලදී. එහිදී මට සැහෙන සුවයක් ලැබිණ. වාට්ටුවේ ඔබ මොබ ඇවිදීමට හැකි තරම් සුවවෙද්දී මට උණසන්නිපාතය වැළඳිණි.

එයින් මා කොතරම් අසාධ්‍ය තත්ත්වයට පත් වූයේ ද යත් මාස ගණනක් යනතුරු, මගේ ජීවිතය බේරේවි යයි වෛද්‍යවරු විශ්වාස නොකළහ. මගේ ශරීරය බොහෝ දුර්වල විය. අවසානයේදී මා යන්තම් සුවය ලත් විගස, දිනක් හෝ පමා නොකොට මා එංගලන්තයට ආපසු යැවීමට ඔවුහු තීරණය කළහ. 'ඔරොන්ටේස්' නෞකාවෙන් ආපසු පැමිණි මම, මසකින් එංගලන්තයට ගොඩ බැස්සෙමි.

මට ඥාතීන් කිසිවකු එංගලන්තයේ සිටියේ නැත. හමුදාවෙන් මා වෙත ලැබුණු දීමනාව දිනකට සිලිං එකොළහයි පැන්ස හයකි. ඒ මුදලෙන් කැමැති ආකාරයකට ජීවත්වීමට මට නිදහස තිබිණ. ලන්ඩනයට පැමිණි මම හෝටලයක නවාතැන් ගත්තෙමි. ආදායමට වඩා වියදම අධික බව, වැඩි දිනක් යෑමට පෙර මට අවබෝධ විය. කළ යුත්තේ මා ජීවත්වෙන පිළිවෙළ වෙනස් කිරීම බව මම තේරුම් ගතිමි.

මේ තීරණය ගත් දිනයේ මා ක්‍රයිටීරියන් අවන්හලේ සිටියදී කිසිවෙක් මගේ පිටට තට්ටු කළේය. ආපසු හැරී බැලූ මට දකින්නට ලැබුණේ ස්ටැම්ෆඩ්ය. මා ශාන්ත බාර්තොලමියු රෝහලේ වෛද්‍යවරයකුව සිටියදී, ඔහු මා යටතේ සේවය කළේය. ලන්ඩනයේ මහත් පාළුවෙන් කල් ගෙවූ මට, ස්ටැම්ෆඩ් දකින්නට ලැබීම සතුටට කරුණක් විය. මා සමඟ දිවා ආහාරය ගැනීමට මම ඔහුට ආරාධනා කළෙමි.

"වොට්සන් මහත්තයා කළුවෙලා, බටපතුරක් වගේ හොඳටම කෙට්ටුවෙලා. පහුගිය කාලේ කොහෙද වෙලාද හිටියේ?"

මට මුහුණ පාන්නට සිදුවූ කරදර කම්කටොළු ගැන මම ඔහුට කෙටියෙන් විස්තර කළෙමි.

"අනේ දෙයියනේ ! දැන් ඉතින් මේ දවස්වල මොකද කරන්නේ?"

"නවතින්න තැනක් හොයනවා. සාධාරණ ගණනකට සැප පහසු කාමරයක් හොයාගන්න පුළුවන් වේවිද කියලයි මං කල්පනා කරන්නෙ."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක හරි පුදුමයි නේ. අද ඔය කතාව ඔය විදියටම මට මේ අහන්න ලැබුණෙ දෙවැනි සැරේට."

"කවුද පළමුවෙනියා ?"

"රෝහලේ වෛද්‍ය පරීක්ෂණාගාරයේ වැඩකරමින් සිටි කෙනෙක්. එයාට ඉතාම සැපපහසුවට ඉන්න පුළුවන්, හොඳ කාමර වගයක් ලැබුණාලු. කුලිය ටිකක් වැඩියිලු. එයත් එක්ක හවුලේ නැවතිලා වියදම දෙකට බෙදාගන්න කෙනෙක් නැහැ කියල උපවෙමින් හිටියෙ."

"හොඳ ආරංචියක්. මිනුට ඕන කරන්නෙ කාමර වල හවුලෙ ජීවත්වෙමින්, වියදම බෙදාගන්න කෙනෙක් නම්, ඒකට හොඳම මිනිහ මම. මාත් කැමැතියි තනියම ඉන්නවට වැඩිය, යාළුවෙක් එක්ක ජීවත්වෙන්න."

ස්ටැම්ෆඩ් මා දෙස බැලුවේ මදක් පුදුමයෙනි.

"ඔබ තවම ෂර්ලොක් හෝම්ස් හොඳ හැටි දන්නෙ නැති නිසා ඔහොම කියාවි. ඒත් ඔහුව ළඟම මිතුරෙක් කරගන්න නම් ඔබ කැමැති වේවිද මං දන්නේ නෑ."

"ඇයි, මොකක්ද ඔහුගේ ඇති වැරැද්ද?"

"නෑ. ඔහුට විරුද්ධව චෝදනා නම් මොකුත් නෑ. නමුත් එයාගෙ අදහස් ටිකක් අමුතුයි. විශේෂයෙන්ම නවීන විද්‍යාවේ සමහර ක්ෂේත්‍ර ගැන. මං දන්න තරමින් ඔහු බොහොම ශීලාචාර කෙනෙක්."

"වෛද්‍ය ශිෂ්‍යයෙක් වෙන්නැති ?" මම ඇසුවෙමි.

"නැහැ. මං දන්නෙ නැහැ ඔහුගෙ අරමුණ මොකක්ද කියල. මං හිතන්නෙ කායව්‍යවච්ඡේද විද්‍යාව ගැන ඔහුට හොඳ දැනුමක් තියෙනවා. ඉතාම හොඳ රසායන විද්‍යාඥයෙක්. ඒ උණත් වෛද්‍ය විද්‍යාව ක්‍රමානුකූලව හදාරපු කෙනෙක් නොවෙයි. ඔහු කිසිදෙයක් ක්‍රමානුකූලව ඉගෙන ගන්නෙ නෑ. ඒ වුණත් ඔහු හොයාගෙන තියෙන, පොත්පත් වල පවා නැති දේවල් අනන්තයි. ඒවා ඇහුවොත් ඔහුගේ මිත්‍ර මහාචාර්යවරු පවා පුදුමයට පත් වේවි."

"ඔබ කවදාවත් අහල නැද්ද ඔහුගේ අනාගත බලාපොරොත්තු මොනවද කියලා?"

"නෑ. ඔහු තේරුම් ගන්න අමාරු පුද්ගලයෙක්. වැඩි කතාබහක් නෑ. ඔහුට හිතක් හිතුණොත් ඔන්න නොනවත්වාම කතා කරනවා."

http://sherlockholmesinvestigations.blogspot.com

"මං කැමැතියි ඔහුව හමුවෙලා බලන්න. කවුරු හරි එක්ක හවුලේ නවාතැන් ගන්නට නම්, ඉගෙනීමකට හිත යොමු කරපු නිශ්ශබ්ද කෙනෙක් එක්ක ඉන්න එක වැඩිය හොඳයි. කලබලකාරී පරිසරයකට, මහ ශබ්ද වලට මාව තවමත් ඔරොත්තු දෙන්නෙ නෑ. ඇෆ්ගනිස්ථානෙදි ජීවිතකාලයකට ඇතිවෙන්න මං ඒවට මුහුණ දුන්න නේ. ඔබේ යාළුවා හම්බ වෙන්න පුළුවන් කොහේදී ද?"

"නොවැරදීම ඇති පරීක්ෂණාගාරේ. ඔහු එක්කො උදේ ඉඳන් රෑ වෙනකම් එතන වැඩ. එහෙම නැත්නම් සති ගණනාවක් ඒ පැත්තෙවත් එන්නෙ නෑ. වොට්සන් මහත්මය කැමැති නම් අපි කෑමෙන් පස්සෙ ඒ පැත්තෙ ගිහිං බලමු." ස්ටැම්ෆඩ් කීය.

මිතුරා සොයා යන අතරතුර ඔහු ගැන තවත් විස්තර ස්ටැම්ෆඩ් මට පැවසුවේය.

"මිනිහව හිතට ඇල්ලුවෙ නැත්නං, ඔන්න මට පස්සෙ දොස් කියන්න එපා. මමත් එයා ගැන දන්නෙ මය ඉඳල හිටල පරීක්ෂණාගාරෙදි හමුවුණු වෙලාවල දැනගනිපුව විතරයි."

"හිතට අල්ලන්නෙ නැත්නං අයින් වෙන එකයි තියෙන්නෙ. ඔබ දැන්ම හිටම මේ ප්‍රශ්නෙන් ගැළවෙන්න හදන්නෙ මොකද? ඔහු බොහොම කෝන්ති යන කෙනෙක්ද? නැත්නං වෙන මොකක් වත්ද? කෙළින්ම කියන්න."

"ඒක ටිකක් විස්තර කරන්න අමාරුයි." ස්ටැම්ෆඩ් කීවේ සිනාසෙමිනි.

"මට හිතෙන්නෙ ඔහුගේ වැඩ ටිකක් විද්‍යානුකූල වැඩියි කියල; සමහර වෙලාවට මහ විකාර විදියට. සමහර විට ඔහු මිත්‍රයෙකුට විෂ වර්ගයකින් ඉතා ස්වල්පයක් දෙන්න පුළුවන්. තරහකට නෙමෙයි. අර විෂවලින් සිදු වෙන ප්‍රතිඵල හරිහැටි දැනගන්න. ඒ වගේම මිත්‍රයාට සාධාරණයක් කරන්න, ඔහු ඒ විෂෙන් ඒ ප්‍රමාණයම බිල පෙන්වාවි. එහෙම නැත්නම් මිනීකාමරේ තියෙන මළසිරුරකට වේවැලෙන් පහර දුන්නොත්? මේව තේරුම් ගන්න අමාරුයි."

"මළසිරුරකට පහර දෙනවා?"

"ඔව්. මරණයෙන් පස්සෙ ශරීරයේ තැළීමක් සිදුවුණොත්, ඒවා කුමන ආකාරයට සිදුවේවිද, පෙනෙයිද කියල බලන්න. ඔහු එහෙම කරනව මගේ ඇස් දෙකෙන්ම දැක්කා."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒත් ඔබ කියන්නේ ඔහු වෛද්‍ය ශිෂ්‍යයෙක් නෙමෙයි කියලද?

"නැහැ. ඔහු මොන අරමුණකින් මේව කරනවද කියල දෙයියො තමයි දන්නෙ. ආ .... දැන් මන්න අපි ළඟටම ආවා. ඔබම තේරුම් ගන්නකො ඔහු මොන වගේ පුද්ගලයෙක් ද කියලා."

අපි රෝහල හරහා ගොස්, වෛද්‍ය පරීක්ෂණාගාරයට ඇතුළු වුණෙමු. පරීක්ෂණාගාරය පුරාම, බිත්ති අසල රාක්කවල රසායනික ද්‍රව්‍ය අඩංගු බෝතල් අසුරා තිබිණ. මේසය පිරී තිබුණේ බීකර, පරීක්ෂණ නළ, පිපෙට්ටු හා දැල්වෙන බන්සන් දාහකවලිනි. පරීක්ෂණාගාරය තුළ සිටියේ එක් ශිෂ්‍යයෙකු පමණි. ඉමහත් අවධානයෙන් ඔහු පරීක්ෂණ කටයුතු වල නියැලී සිටියේය. අපේ අඩි ශබ්දය ඇසී හැරී බැලූ ඔහු, මහත් සතුටට පත් වී, පරීක්ෂණ නළයක් අතින් ගෙන අප වෙත දිව ආවේය.

"මම සොයාගත්තා! මම සොයාගත්තා! " ඔහු කෑගැසීය.

"මම සොයාගත්තා ප්‍රතිකාරකයක්. ඒකට හීමොග්ලෝබින් ස්වල්පයක් එකතු කළ වහාම අවක්ෂේපයක් සෑදෙනවා. වෙන කිසිම ද්‍රව්‍යයකින් එම ප්‍රතික්‍රියාව සිදුවෙන්නෙ නෑ."

රත්රන් ඉල්ලමක් සොයාගත්තා වුවත් ඔහු ඊට වඩා සතුටට පත් නොවන්නට ඉඩ තිබිණ.

"මේ දොස්තර වොට්සන්. මේ ෂර්ලොක් හෝම්ස් මහත්මයා." ස්ටැම්ෆඩ් අප හඳුන්වා දුන්නේය.

"ආයුබෝවන් මහත්මයා. ඔබ ඇෆ්ගනිස්ථානයට ගිහිං ආව කෙනෙක් බව මට කියන්න පුළුවනි."

"දෙවියනේ! ඔබ කොහොමද ඒක දන්නෙ?"

"ඒක අමතක කරල දාමු. දැන් තියෙන ප්‍රශ්නය මොකක්ද? හීමොග්ලොබින්. ඔබට තේරෙනවා ඇති මගේ මේ සොයාගැනීමේ වැදගත්කම?"

"ජීව රසායන විද්‍යාත්මක වශයෙන් ඒක වැදගත්. ඒකෙ සැකයක් නෑ. නමුත් ප්‍රායෝගික වශයෙන් ........"

"ඇයි මනුස්සයෝ, අවුරුදු ගණනාවකින් අධිකරණ වෛද්‍ය විද්‍යා ක්ෂේත්‍රයේ වැදගත්ම සොයාගැනීම මේක නේ. ඔබට තේරෙන්නේ නැද්ද? ලේ පැල්ලමක් විශ්ලේෂණය කරන්න තියෙන ඉතාම නිරවද්‍ය පරීක්ෂණය මේකයි. මෙහෙන් එන්නකො."

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු මගේ කබායේ අතේන් අල්ලාගෙන, ඔහු පරීක්ෂණ පවත්වමින් සිටි මේසය වෙත කැඳවාගෙන ගියේය.

"අපි අලුත් ලේ ටිකක් ගමු." කී ඔහු සිරින්ජ ඉඳිකටුවක් ගෙන, ඇඟිල්ලක් සිදුරු කර ලේ ටිකක් පිටතට ගත්තේය.

"දැන් මම මේ ලේ ටිකත් පිඟෙට්ටුවට අරගෙන එයින් ඉතාම ස්වල්පයක් වතුර ලීටරයක දියකරනවා. දැන් ඔබට පෙනෙනවා ඇති වතුර වල පාටෙ වෙනසක් නෑ! පිරිසිදු වතුර වගේමයි. මෙතන තිබෙන ද්‍රාවණය, ලේ එක කොටසකට ජලය කොටස් දසලක්ෂයක් පමණ. එයටම විශේෂ වූ ප්‍රතික්‍රියාව ඇති වෙන හැටි දැන් බලමු."

ඔහු බඳුනට සුදු පැහැති ලවණයක් දමා, ඊට අවර්ණ ද්‍රවයක් එකතු කළේය. සියල්ල එක්වරම තද රතට හුරු දුඹුරු පැහැයට හැරිණි. බඳුනේ අඩියට දුඹුරු පැහැති කුඩක් අවක්ෂේප විය.

"හඃ හඃ හඃ හා. දැන් මොකද කියන්නෙ ?" ඔහු සතුටින් අත්පොළසන් දුන්නේය.

"ඔව්. ඒක බොහෝම සංවේදී පරීක්ෂණයක්."

"අලංකාරයි! අලංකාරයි!! මේ පරීක්ෂණය මීට ඉස්සර සොයාගෙන තිබුණ නම්, අද ජීවතුන් අතර ඉන්න, තක්කඩි බොහොම දෙනෙක් එල්ලුම් ගස් ගිහින් හුඟක් කල්."

"හැබෑමයි!" මම කීවෙමි.

"අපරාධ පරීක්ෂණ වල අවසානයේ, එක කරුණක් මත පැහැදිලි තීන්දුවක් ලැබීමට බාධාවෙනවා. මිනීමැරුමක සැකකරුවෙක් අල්ලාගන්නෙ බොහෝ විට මාස ගණනක් ගත වෙලා. ඔහුගේ ඇඳුම්වල තිබෙන දුඹුරු පාට පැල්ලම් මොනවාද? ලේ පැල්ලම් ද මඩ පැල්ලම්ද, මලකඩ පැල්ලම්ද පලතුරු යුෂ පැල්ලම්ද, මොනවාද? මෙච්චර කලක් ඒවට සූක්ෂම පරීක්ෂාවක් තිබුණේ නැහැ. ඔන්න දැන් අපට තියෙනවා ෂර්ලොක් හෝම්ස් පරීක්ෂණය. දැන් කිසි ප්‍රශ්නයක් ඇතිවෙන්නේ නෑ, ලේ පැල්ලම් හඳුනාගන්න."

ගිය අවුරුද්දේ ෆ්‍රැන්ක්ෆර්ට් වල සිදුවූ ෆොන් බිෂොප් මිනී මැරුම: ඒ වගේ නව නඩු ගණනාවකම සැකකාරයා නිදහස් වුණා, ඇඳුමේ තිබුණු පැල්ලම්, ලේ පැල්ලමක්ද කියල හරිහැටි දැනගන්න බැරිවීම නිසා."

Reading Purposes Only Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

පැලැස්තර කැබැල්ලක් කපා, ඇඟිල්ල සිදුරු කළ තැන ඇලවූ ඔහු,

"මට පරෙස්සම් වෙන්න සිද්ධවෙනවා. විෂ වර්ගත් එක්ක මම සෑහෙන්න පරීක්ෂණ පවත්වනව නෙ" ඇවසීය.

ඔහුගේ දෑතේ එවැනි පැලැස්තර රාශියක් ද, ප්‍රබල අම්ල වර්ග නිසා සම දුර්වර්ණ වී ඇති සැටි ද මම දුටුවෙමි.

"අපි මෙහෙ ආවෙ ලොකු වැඩකට. මගේ මේ යාළුවට නවාතැන් ගන්න තැනක් හොයනවා. ඔබ කිය කියා හිටියෙ නවාතැනට හවුල් කාරයෙක් හොයා ගන්න බැරිවුණා කියලා. ඔන්න මම කෙනෙක් අරං ආව." ස්ටැම්ෆඩ් ඇවසීය.

ෂර්ලොක් හෝම්ස් බොහෝ සතුටට පත් වූ බව ඔහුගේ මුහුණෙන්ම පෙනිණි.

"බේකර් වීදියේ, කාමර දෙකක් එක්ක උඩුමහලක් ගැන මම බලලයි තියෙන්නේ. ඒක අපි දෙන්නට ඕන තරම් ඇති. සැර දුම්කොළ වල ගඳට ඔබේ විරුද්ධත්වයක් නැහැ නේද?"

"මමත් දුම්බොන්නෙක්."

"ඒක හොඳයි. මං නොයෙක් රසායන ද්‍රව්‍ය ළඟ තියාගෙන සමහර වෙලාවට පරීක්ෂණ පවත්වනවා. ඒකෙන් ඔබට හිරිහැරයක් වේවිද?"

"කොහොමටවත් නෑ."

"කෝ බලන්න.........මොනවාද මගේ අනික් අඩුපාඩු. සමහර වෙලාවට මම කල්පනාවට වැටිලා දවස් ගණං කතා නොකර ඉන්නවා. වරදවා හිතන්න එපා, ඔබත් එක්ක තරහින් කියලා. එහෙම වෙලාවට මගේ පාඩුවේ ඉන්න හරින්න.. එතකොට මොනවද ඔබට කියන්න තිබෙන අඩුපාඩු"?

මේ හරස් ප්‍රශ්න ඇසීමෙන් මට සිනා පහළවිණි.

"මම ස්නායු දුර්වලත්වයට අත්වෙලයි ඉන්නේ. ඒ නිසා ශබ්ද වලට මම වැඩිය කැමැති නැහැ. හිටිගමන්ම රෑට නින්දෙන් නැගිටිනවා. මම හරිම කම්මැලියි."

"මගේ වයලීන වාදනය ඔබ අකමැති ශබ්දයක්ද?"

"ඒක තීරණය වෙන්නේ වාදනය කරන පුද්ගලයාගේ හැටියටයි. මිහිරි වයලීන වාදනයක් දෙවියන් වෙත කෙරෙන පූජාවක් වගේ."

http://sherlockholmesinvestigations.blogspot.com

"ආ හරි හරි. එහෙනම් ඔක්කොම හින්දුයි. හෙට දවාලට මෙතැනට ආවොත් ඔබට කාමර බලන්න යා හැකියි මා සමග"

"හොඳයි. හෙට දවාලට හමුවෙමු" ඔහුට ආචාර කරමින් මම කීවෙමි.

"මිනිහ කොහොමද මම ඇෆ්ගනිස්ථානේ ඉඳල ආපු බව දැනගත්තේ?" ආපහු එන අතර මම ස්ටැම්ෆර්ඩ්ගෙන් ඇසීමි.

"ඒක තමයි ඔහුගේ විශේෂ හැකියාව. බොහොම දෙනෙකුට අවශ්‍ය වෙලා තියෙනවා, ඔහු මේ විදියට දේවල් හොයාගන්නේ කොහොමද කියලා දැනගන්න."

"ඒක අබිරහසක්ද? කොහොම උනත් අපි දෙන්නා මුණ ගස්සවපු එකට මා ඔබට ණයගැතියි ස්ටැම්ෆර්ඩ්."

Reading Purpose Only. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# 2

# අපරාධ පරීක්ෂණ විද්‍යාව

අපි පසුවදා හමුවී, බේකර් වීදියේ අංක 221 බී දරන ස්ථානයේ නවාතැන පරීක්ෂා කොට බැලුවෙමු. එය සුවපහසු නිදන කාමර දෙකකින් ද, අලංකාර ලෙස ගෘහභාණ්ඩ වලින් සැරසූ, විශාල විසිත්ත කාමරයකින් ද සමන්විත විය. එය කොයිතරම් සිත්ගන්නාසුලු වී ද යත්, අපි එවෙලේම මුදල් ගෙවා, එහි පදිංචිය තහවුරු කළෙමු.

ෂර්ලොක් හෝම්ස් හවුලේ වාසය කිරීමට අපහසු පුද්ගලයෙකු නොවීය. රාත්‍රී දහයෙන් පසු ඔහු අවදිව සිටියේ කලාතුරකිනි. සමහර දිනවල උදෑසනින් අවදි වූ ඔහු, නිවසින් පිටත ගියේ මා අවදි වීමටත් පෙරයි. විටෙක ඔහු රසායන විද්‍යා පරීක්ෂණාගාරයේ ද, විටෙක කාය ව්‍යවච්ඡේද අංශයේ මෘතශරීර කපා බලමින් ද කාලය ගතකළේය. අවශ්‍යතාවයක් පැන නැගුණු විටෙක, ඔහු නොනවත්වාම වැඩෙහි යෙදුණේ පුදුමාකාර ශක්තියකිනි. තවත් විටෙක ඔහු විසිත්ත කාමරයේ කවිච්චිය මත වැතිරී, අතක් පයක් නොසොල්වා දින ගණනක් ගතකරයි. එවැනි වේලාවන්හි ඔහුගේ දෑසේ ඇති බැල්මෙන් ඔහු මත් බෙහෙතක් ගෙන ඇත්දැයි මගේ සිතේ සැකයක් ඇතිවේ.

ෂර්ලොක් හෝම්ස්ගේ උස අඩි හයකට මඳක් වැඩි විය යුතුය. ශරීරය සිහින් නිසා පෙනුමෙන් එඩාත් උස බවක් දිස්විය. තියුණු දෑසත්, රාජාලියෙකුගේ හොටයක් වැනි නාසයත් නිසා, ඔහුට ලැබුණේ විශේෂ පෙනුමකි. එයින් කියැවුණේ අවධානය හා දැඩි අධිෂ්ඨානය යයි මට සිතේ. ඔහුගේ දෑත් නිරන්තරයෙන්ම තීන්ත හා රසායනික ද්‍රව්‍යවල පැල්ලම්වලින් වැසී තිබිණි. එහෙත් ඔහුගේ අත්ල බොහෝ සංවේදී විය.

ෂර්ලොක් හෝම්ස් වෛද්‍ය ශිෂ්‍යයෙකු නොවීය. වෙනත් කිසිදු

http://sherlockholmesinvestigations.blogspot.com

ශාස්ත්‍රයක පාඨමාලාවක්, ඔහු ක්‍රමානුකූලව හදාරා තිබුණේ ද නැත. එහෙත් සමහර විද්‍යාවන් පිළිබඳව ඔහුට තිබුණේ පරතෙරටම ගිය දැනුමකි.

ඔහු දත් දේ මෙන්ම නොදත් දේ ද බොහෝය. සාහිත්‍යය, දර්ශනවාදය හා දේශපාලනය ගැන ඔහු කිසිම දෙයක් දැන සිටියේ නැත. සෞරග්‍රහ මණ්ඩලය පිළිබඳව ඔහුගේ නොදත්කම මා පුදුමයෙන් පුදුමයට පත්කළේය.

"මට හරිම පුදුමයි හෝම්ස්, ඔබ පොළොව ඉර වටා ගමන් කරන බව නොදන සිටීම."

"ඔබට පුදුමයි? එය දැනගත්ත වුණත් මං දැන් කොහොම හරි ඒක අමතක කරල දාන්න උත්සාහ කරනවා."

"අමතක කරන්න?"

"මම සලකන්නේ මිනිහෙකුගේ මොළය පොඩි ගබඩා කාමරයක් වගේ තැනක් හැටියට. ඒකෙ ගබඩා කරලා තබාගත යුත්තේ තමන්ට අවශ්‍ය බඩු පමණයි. තමන්ට දකින්නට ලැබෙන, අහන්න ලැබෙන හැම දේම, මොළේ ගබඩා කරගන්න මිනිහා මෝඩයෙක්. එතකොට වෙන්නේ අනවශ්‍ය දේ මොළුවේ පිරෙද්දී, ඕනෑ කරන දේවල් එළියට විසිවෙනවා. එහෙම නැත්තං ඔක්කොම අවුල් ගොඩක් වෙනවා. තමන්ට ඕනෑ කරන දේ ඕන වෙලාවට සොයාගන්න බැරි විදියට, අනවශ්‍ය දේ මොළයට ඇතුළු කර නොගැනීම ඉතාම වැදගත්."

"ඒ වුණත් සෞරග්‍රහ මණ්ඩලය?"

"ඒකෙන් මට ඇති වැඩේ මොකක්ද ? ඔබ කියනව අපි ඉර වටේ යනවලු. අපි හඳ වටේ ගියත් ඒක නිසා මගේ වැඩ කටයුතු වලටවත් මටවත්, පැන්සයක වෙනසක් සිදුවන්නේ නෑ."

මම කඩදාසියක් ගෙන ෂර්ලොක් හෝම්ස් සතු දැනුම ගැන එහි සටහන් කළෙමි.

**ෂර්ලොක් හෝම්ස්ගේ හැකියාවන්**

1. සාහිත්‍යය - කිසිත් නොදනී
2. දර්ශනය - කිසිත් නොදනී
3. තාරකා විද්‍යාව - කිසිත් නොදනී

http://sherlockholmesinvestigations.blogspot.com

4. දේශපාලනය - ඉතාම සුළු දැනුමක් ඇත
5. උද්භිද විද්‍යාව - අවිධිමත්

බෙලඩෝනා, අබිං හා විෂ වර්ග ගැන හොඳ දැනුමක් ඇත. ගෙවතු වගාව ගැන කිසිත් නොදනී.

6. භූගර්භ විද්‍යාව - ප්‍රායෝගික දැනුමක් ඇත. එහෙත් සීමිතයි.

පස් වර්ග හොඳින් හඳුනාගත හැක. සපත්තු වල හෝ කලිසම් කකුලේ තැවරී ඇති මඩවල ස්වභාවයෙන් හා වර්ණයෙන්, ඒවා ලන්ඩනයේ කිනම් පෙදෙසකදී තැවරුණු ඒවා දැයි ඔහුට කිව හැකිය.

7. රසායන විද්‍යාව - ඉතා විශිෂ්ට දැනුමක් ඇත.
8. කාය ව්‍යවච්ඡේද විද්‍යාව - නිවැරදි එහෙත් අක්‍රමවත් දැනුමක් ඇත.
9. සුවිශේෂ සිද්ධීන් පිළිබඳ දැනුම - ඉතා පුළුල් දැනුමක් ඇත.

   මේ ශතවර්ෂයේ සිදුවූ සියලුම භීෂණයන් පිළිබඳ සම්පූර්ණ විස්තර ඔහු දනී.

10. වයලීනය වාදනයට දක්ෂයි.
11. කඩු හරඹ හා බොක්සිංවල අතිදක්ෂයෙකි.
12. බ්‍රිතාන්‍ය නීතිය ගැන හොඳ ප්‍රායෝගික දැනීමක් ඇත.

ඔහු මෙවැනි ක්ෂේත්‍රවලින් ඉහළටම ඉගෙනීමේ අරමුණ කුමක්දැයි මට සිතාගත නොහැක. එහෙයින් ඒ ගැන වැඩිදුර කල්පනා කිරීම නිෂ්ඵල දෙයකැයි මම තීරණය කළෙමි.

ඔහුගේ වයලින වාදනයේ ද තිබුණේ අනෙක් විෂය ක්ෂේත්‍ර වලදී මෙන් අක්‍රමවත් විකාර ගතියකි. මාගේ ඉල්ලීම නිසා, දක්ෂනම සංගීතඥයින්ගේ වාද්‍ය ඛණ්ඩ විටෙක ඉතා අපුරුවට වාදනය කරයි. තවත් විටෙක දෑස් පියාගෙන, නොසැලකිල්ලෙන් වයලීනයේ හඬ නංවන්නේ, කිසිදු සංගීතාත්මක බවකින් තොරවය.

සතියක් පමණ යන තුරු අප සොයාගෙන අමුත්තන් කිසිවෙකු පැමිණියේ නැත. ෂර්ලොක් හෝම්ස් මා මෙන්ම මිතුරන් රහිත පුද්ගලයෙකු යයි මම සිතුවෙමි. කෙසේ වුවද ඔහු හමුවීමට සමාජයේ

http://sherlockholmesinvestigations.blogspot.com

විවිධ තරාතිරම්වල පුද්ගලයෝ හමු පැමිණියහ. මීයෙකුගේ වැනි මුහුණක් ඇති සුදුමැලි තැනැත්තෙක්, සතියකට තුන්හතර වතාවක් ආවේය. ඔහු ලෙස්ට්‍රේඩ් යයි මට හඳුන්වා දෙන ලදී. අලංකාර ලෙස හැඳ පැළැඳගත් තරුණ කාන්තාවක්, හිසකෙස් සුදුවූ වයස්ගත යුදෙව් වෙළෙන්දෙක්, දුම්රිය පෝටර් වරයෙක්, ෂර්ලොක් හෝම්ස් හමුවීමට පැමිණි අය අතර වූහ.

"මේ අය මගේ අනුග්‍රාහකයෝ. මෙතැන මට ව්‍යාපාරික ස්ථානයක් හැටියටත් පාවිච්චි කරන්නයි සිදුවෙලා තියෙන්නේ. සමාවෙන්න වොට්සන් කරදර කරනවාට. මට මේ විසිත්ත කාමරය ටිකකට පාවිච්චි කරන්න ඉඩ දෙන්න පුලුවන්ද?"

සමහර වෙලාවක ඔහු මගෙන් ඉල්ලා සිටී. එවැනි වෙලාවනිහිදී මම ඔහුගේ ව්‍යාපාරය කර ගැනීමට ඉඩ දී නිදන කාමරයට ගියෙමි.

මා මඳක් උදාසනින් අවදිවූ එක් දිනයක, උදේ ආහාරය පිළියෙල වන තුරු කියවීම සඳහා මේසය මත තිබූ සඟරාවක් අතට ගත්තෙමි.

එහි වූ එක් ලිපියක මාතෘකාව වූයේ 'ජීවන ග්‍රන්ථය' යන්නයි. එහි තැන් තැන්වල පැන්සලෙන් කළු අලකුණු කිහිපයක් ද විය. එහි විස්තර කොට තිබුණේ, කෙනෙකුට දකින්නට ලැබෙන දේ හොඳින් නිරීක්ෂණය කිරීමෙන්, කොපමණ නිගමනවලට එළැඹිය හැකි ද යන්නයි. එහි ලේඛකයා හැම දෙයක්ම අතිශයෝක්තියෙන් විස්තර කොට ඇතැයි මට සිතිණ.

"දිය බිඳක් පරීක්ෂා කොට එහි අවසන් ප්‍රතිඵලය නයගරා මහා දිය ඇල්ල හෝ අත්ලාන්තික් සාගරය වේ ද යි තර්ක ශාස්ත්‍රයේ කෙළවරට පැමිණි අයෙකුට කිව හැක. නිගමන හා විශ්ලේෂණ විද්‍යාව ද අනෙක් විද්‍යාවන් මෙන් බොහෝ කාලයක් කැපකොට ඉවසීමෙන් උගත යුතු ශාස්ත්‍රයකි. යම් මිනිසෙකුගේ නියපොතු, කබායේ අත, සපත්තු, ඇඟිලිවල කරගැට, මුහුණෙන් ප්‍රකාශ වන හැඟීම් ආදියෙන් ඔහු පිළිබඳ විස්තර මහා රාශියක් අනාවරණය වෙයි." යනුවෙන් ලිපියේ සඳහන් විය.

"මොන පිස්සු කතාද? මං ජීවිතේට කියවල නැ ඒ වාගේ විකාර." සඟරාව මේසය උඩට විසිකරමින් මං [illegible]වෙමි.

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

"ඇයි මොකක්ද?" හෝම්ස් ඇසීය.

"මේ සඟරාවෙ තිබෙන ලිපිය: මං හිතන්නේ ඔබත් ඒක කියවන්න ඇති. මං දක්ක ඔබ සමහර තැන්වල පැන්සලෙන් ලකුණු කරල තියෙනවා. බොහොම දක්ෂ විදියට ලිපිය ලියලා නම් තියෙනවා. නමුත් මේ සැපපුටුවකට වෙලා හිත දකින කෙනෙකුගේ මනස්ගාත. ඒවා ප්‍රායෝගිකව ව්‍යවහාරයට ගන්න පුළුවන් කමක් නෑ. මට ආසයි දවසක ඔය ලිපිය ලියපු එක්කෙනා, උමං දුම්රියක නග්ගවලා බලන්න. ඒකෙ ගමන් කරන අය, මොන වගේ රක්ෂාවල් කරන අයද කියල, නිරීක්ෂණවලින් නිගමනය කරන්න කියන්න. ඔහු දෙන එක පවුමට මං දාහක් ඔට්ටු අල්ලන්න ලෑස්තියි." මම කීවෙමි.

"ඔබ ඔට්ටුවෙන් පැරදිලා මුදල් විකත් නැතිකර ගනීවි. ලිපිය ගැන කියනවා නම් ඒක ලියුවේ මමයි.

"ඔබ?"

"මට සහජ හැකියාවක් තිබෙනවා නිරීක්ෂණය කිරීමටත්, ඒකෙන් නිගමනයන්ට එළැඹීමටත්. මං මේ ලිපියෙ සිද්ධාන්ත වගයක් ඉදිරිපත් කරල තියෙනවා නේද? ඒවා සියල්ලක්ම ප්‍රායෝගිකව යොදා ගන්න පුළුවන් ඒවා. කොයිතරම් ප්‍රායෝගිකද කිව්වොත් ඒකෙන් තමයි මං ජීවත්වෙන්නේ."

"ඒ කොහොමද?"

"මටම විශේෂ වුණු වෘත්තියක් තිබෙනවා. මං හිතන්නේ මුළු ලෝකයටම ඒ රැකියාව කරන එකම එක්කෙනා මම. මේ ලන්ඩනයේ කොයිතරම් රජයේ සහ පෞද්ගලික රහස් පරීක්ෂකයෝ ඉන්නවද ? එයාලා ප්‍රශ්නයක් විසඳන්න ගිහිං අමාරුවේ වැටුණම, එන්නේ මා ළඟට. මට පුළුවනි ඔවුන් නිවැරදි මාර්ගයට යොමු කරන්න. ඔවුන් දන්න සාක්ෂි සියල්ලම මට ඉදිරිපත් කරනවා. අපරාධ ඉතිහාසය ගැන මගේ දනුමත් උපයෝගි කරගෙන, මට සාමාන්‍යයෙන් පුළුවන් ඔවුනට උදව් කරන්න. අපරාධවල බොහෝ විට තිබෙනවා මූලික සමානතාවයක්. ඒ කියන්නේ අපරාධ දහසක සියලුම විස්තර ඔබ හොඳින් දන්නවා නම්, එක්දහස් එක්වෙනි අපරාධය විසඳන එක බොහොම සුළු දෙයක්. ලෙස්ට්‍රේඩ් කියන්නේ බොහොම ප්‍රසිද්ධ

http://sherlockholmesinvestigations.blogspot.com

රහස් පරීක්ෂකයෙක්. ඔහු මෑතකදී වංචාවක් සම්බන්ධව පරීක්ෂණයක යෙදුණා. ඒකෙදි ඔහු ලොකු ගැටලුවකට මැදිවුණා. ඒකයි මා හොයාගෙන ආවේ."

"එතකොට අනෙක් මිනිස්සු?"

"ඒ පෞද්ගලික රහස් පරීක්ෂක ආයතනවලින් එවන අය. ඒ ඔක්කොම මොකක් හරි ප්‍රශ්නයක් විසඳගන්න බැරුව අමාරුවේ වැටුණු අය. ඒක විසඳාගන්න ඔවුනට අවශ්‍යයි. මං එයාලගේ කතාව අහගෙන ඉන්නවා. මං ඒකට දෙන විසඳුම ඔවුන් අහගන්නවා. ඊට පස්සේ මගේ ගාස්තුව මම සාක්කුවට දාගන්නවා."

"ඔබ කියන්නේ මේ අනිත් රහස් පරීක්ෂකයෝ, සියලුම දේවල් එතැනටම ගිහිං පරීක්ෂා කරලත් විසඳගන්න බැරිවුණු ගැටලු, ඔබ මේ කාමරේ ඇතුලේ ඉඳගෙනම විසඳනව කියලද?"

"ඇත්තෙන්ම ඔව්, මට ඒකට සහජ හැකියාවක් තියෙනවා කියලා මම ඔබට කිව්වේ. මා හමුවට එන පරීක්ෂණවලින්, ඉඳහිට එකක් දෙකක්, තරමක් සංකීර්ණ යයි කියන්න පිළිවන්. එහෙම වුණාම, එතැනට ගිහිං මගේ ඇසින්ම එතැන පරීක්ෂා කර බලන්න සිදුවෙනවා."

මගේ මොළයේ එක්රැස්වෙලා තිබෙනවා නොයෙකුත් අංශ පිළිබඳ විශේෂඥ දැනුමක්. ගැටලු විසඳීමට ඒක මට ලොකු පහසුවක් වෙනවා. නිරීක්ෂණය කියන එක මට උපතින්ම පිහිටලා තිබෙන දෙයක්. අපි ඉස්සර වෙලාම හමුවුණු දවසේ ඔබ ඇෆ්ගනිස්ථානයේ ඉඳල ආව එක කියුවම ඔබ පුදුම වුණා නේද?

"කවුරු හරි ඔබට කියල තියෙන්න ඇති."

"නෑ, කවුරුවත් කිව්වේ නෑ. මම දැනගත්තා. ඒ කොහොමද? මෙන්න ඉන්නවා මහත්මයෙක්, වෛද්‍යවරයෙකු ගේ පෙනුමක් ඇති. ඒත් ඔහු හැසිරෙන්නේ යුද්ධ හමුදාවේ නිලධාරයෙක් වගේ. ඒ කියන්නේ පැහැදිලිවම හමුදා වෛද්‍යවරයෙක්. අතේ මැණික් කටුව හරියේ ඔහුගේ හමේ සාමාන්‍ය පාට සුදුවට තිබෙනවා. නමුත් මුහුණ හොඳටම කළු වෙලා. ඒ කියන්නේ බොහොම උෂ්ණ කලාපීය රටක ඉඳල ළඟදී ඇවිත් තියෙන්නේ. ඔහුගේ කෙට්ටු වුණු මුහුණෙන් සහ දුර්වල ශරීරයෙන් පෙනෙනවා බොහොම කරදර කම්කටොලු සහ අසනීපවලට මුහුණ දී ඇති බව. වම් අත තියාගෙන ඉන්නේ

http://sherlockholmesinvestigations.blogspot.com

බොහොම අපහසුවෙන්. ඒ කියන්නේ ලොකු තුවාලයක් සිදුවෙලා. ඉංග්‍රීසි ජාතික හමුදා වෛද්‍යවරයෙක්, ඉතින් බොහොම දුෂ්කරතාවලට මුහුණ දීපු උෂ්ණ කලාපික රට මොකක්ද? නිසැකවම ඇෆ්ගනිස්ථානය. ඒ ටික මගේ මොළයට එන්න තත්පරයක් ගතවුණේ නෑ."

"ඔබ ඒක පැහැදිලි කර දුන්නට පස්සේ නම්, බොහොම සරලයි කියලා තේරෙනවා. ඔබ මතක් වෙන්නේ එඩ්ගා ඇලන් පෝගේ කතාවල ඉන්න ඩුපින්. මං හිතුවේ නෑ, ප්‍රබන්ධ කතාවල මිසක්, සත්‍ය ලෝකයේ මේ වගේ අය ඉන්න බව." මම කීවෙමි.

ෂර්ලොක් හෝම්ස් නැගිට පයිප්පය දල්වා ගත්තේය.

"ඔබ මාව ඩුපින්ට සමාන කරන්නේ මගේ දක්ෂකම අගය කිරීමක් හැටියට බවට සැකයක් නෑ. නමුත් මගේ අදහසේ හැටියට ඩුපින් බොහොම අදක්ෂයෙක්. පෝ බලාපොරොත්තු වූ තරම් දක්ෂයෙක් ඩුපින්ගෙන් නිර්මාණය වෙලා නැහැ."

"ඔබ ගැබෝරියෝගේ කෘති කියවල තියෙනවද? ඒකෙ ඉන්න ලෙකොක් ඔබ කියන ආකාරයේ දක්ෂ රහස් පරීක්ෂකයෙක්ද?"

හෝම්ස් උපහාසාත්මකව සිනාසුණේය.

"ලෙකොක් කියන්නේ වැඩ ඔක්කොම අවුල් කරගන්න මිනිහෙක්. මට පොත කියවන්න ගිහින් එපාවුණා. අපරාධකාරයා අඳුනගන්න එකයි එතැන තිබුණු ප්‍රශ්නය. මට ඒක පැය විසිහතරෙන් කරන්න තිබුණා. ලෙකොක් ඒකට ගත්තා මාස හයක්. ඒ පොත හොඳයි, අපරාධ පරීක්ෂණ විද්‍යාව ඉගෙන ගන්න අයට නියම කරන්න; රහස් පරීක්ෂකයෙක් විසින් නොකළ යුත්තේ මොනවාද කියලා දැනගන්න.

මේ කාලේ අපරාධ හෝ අපරාධකාරයින් ඇත්තෙම නැති තරම්. අපරාධකාරයින් හොයාගන්න හැටි මා තරම් ඉගෙන ගත්, නොයෙක් දේවල් සොයාගත්තු, සහජ හැකියාවන් යෙදවූ, වෙන කිසිකෙනෙක් ජීවත් වෙලා නැතිව ඇති. ඒත් මොකක්ද ඒකෙන් ඇති ප්‍රයෝජනය ? පරීක්ෂණ පවත්වලා හොයන්න තරම් අපරාධ නැහැ. එහෙමත් නැත්නම් කවුරු හරි මෝඩයෙක් අපරාධයක් කරාවි: ඒක කොයිතරම් පැහැදිලි, ගැටලු රහිත එකක්ද කිවුවොත්, ස්කොට්ලන්ඩ්යාඩ් රහස් පරීක්ෂකයෙකුට වුණත් විසඳගන්න හැකි වේවි."

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහුගේ කතාබහේ තිබුණේ මහා පුරසාරම් කාරයෙකුගේ විලාසයකි. එය මට රිස්සුවේ නැත. මෙම මාතෘකාව වෙනස් කිරීම වඩාත් යෝග්‍යය යි මට සිතිණ.

"අර මනුස්සයා මොනවා හොයනවද මම දන්නේ නෑ....."

මා කීවේ ජනේලයෙන් ඉවත බලද්දී, මට දකින්නට ලැබුණු තැනැත්තෙකු නිසයි.

බේකර් වීථියේ පාරෙන් අනෙක් පැත්තේ, සාමාන්‍ය ඇඳුමෙන් සැරසී, හෙමින් හෙමින් ඇවිද ආ පුද්ගලයෙකි. නිල් පැහැති ලොකු ලියුම් කවරයක් රැගෙන ආ ඔහු, තරමක් කැලැඹීමට පත් මුහුණෙන් ගෙවල්වල අංක පරීක්ෂා කරමින් ඉදිරියට ආවේය. ඔහු කාගේ හෝ පණිවුඩකරුවෙකු බවට සැකයක් නොවීය.

"ඔබ කියන්නේ නාවික හමුදා සේවයෙන් විශ්‍රාම ලත් සාජන්ට් වරයා ගැනද?" ෂර්ලොක් හෝම්ස් මගෙන් ඇසීය.

"බොරු පුරසාරම්, කයිවාරු!" මගේ සිතේ එකවරම ඇති වුණු හැඟීම එයයි. ඔහු පවසන දෙය ඇත්තක්ද බොරුවක්ද යන්න හොයා ගැනීමට මට ඉඩක් නැති බව ඔහු දනී. ඒ නිසා මෙසේ නොබියව පුරසාරම් දොඩනවා විය යුතුය. එම් හැඟීම් මගේ සිතේ ඇති වුවත්, මම කිසිවක් නොකීවෙමි.

අපේ නිවසේ අංකය දුටු වහාම, වීථියේ ගමන් කළ පුද්ගලයා, පාර හරහා දිව ආවේය. ඉන්පසු ඔහු වේගයෙන් දොරට තට්ටු කරන හඬත්, අනතුරුව තරප්පු අඩි තබා, තරප්පුව නැග එන හඬත් අසන්නට ලැබිණි.

"මේ ලියුම ෂර්ලොක් හෝම්ස් මහත්තයට." කාමරයට ඇතුළු වූ ඔහු කීවේ ලිපිය මගේ මිත්‍රයාට අතට දෙමිනි.

නිරීක්ෂණයන් හා නිගමනයන් මඟින් බොහෝ දේවල් තමාට සොයා ගත හැකි යයි ෂර්ලොක් හෝම්ස් ලොකු ආඩම්බරයකින් පවසයි. මේ පණිවුඩකරුවා වීථියේ ඉදිරියට ඇවිද එද්දී, ඔහු අප සොයා එන්නෙකු යයි මගේ මිත්‍රයාට නොසිතෙන්නට ඇත. ඔහුගේ හපන්කම් පරීක්ෂා කිරීමට මෙය හොඳ අවස්ථාවකි. ඒ නිසා පණිවුඩකරුවාගෙන් ප්‍රශ්න කළ යුතුය.

"මොකක්ද මහත්තයා ඔබේ රැකියාව?"

http://sherlockholmesinvestigations.blogspot.com

එතරම් උනන්දුවක් නොදක්වන ආකාරයෙන් මම ඇසීමි.

"පණිවිඩකරුවෙක්. මගේ නිලඇඳුම අලුත්වැඩියා සඳහා භාරදීල මහත්තයා." ඔහු පිළිතුරු දුන්නේ රළු හඬිනි.

"ඔබ කලින් කළ රැකියාව මොකක්ද?"

"රාජකීය නාවික හමුදාවේ, පාබල අංශයේ සාජන්ට් වරයෙක්. ලියුමට යැවිය යුතු පිළිතුරක් නැද්ද මහත්තයා?"

"හොඳයි."

විළුඹ දෙක එකට ලං කොට සිරුවෙන් සිටගත් ඔහු හමුදා භටයෙකු මෙන් ආචාර කොට කාමරයෙන් පිටවී ගියේය.

Reading Purpose Only...

http://sherlockholmesinvestigations.blogspot.com

# 3

# ලෝරිස්ටන් උයනේ අභිරහස

මගේ මිතුරාගේ හැකියාව ප්‍රායෝගිකව ඔප්පු කොට පෙන්වූ මෙම සිද්ධියෙන් මම විස්මයට පත්වීමි. නිරීක්ෂණ විශ්ලේෂණය කොට, නිගමනයන්ට එළැඹීමට ඔහු දැක්වූ දක්ෂතාවය ගැන, මගේ සිතේ පැහැදීමක් ඇති විය. කෙසේ වෙතත් මෙය කල් තියා සැලසුම් කරගත් කූට උපක්‍රමයක්ද යන සැකයක් ද මගේ සිතේ ඇතිවිය. අත තිබූ ලියුම කියවා හමාර කළ හෝම්ස්, කල්පනා සයුරේ ගිලී සිටියේය.

"ඔබ අර නිගමනයන්ට එළැඹුණේ කොහොමද?"

"මොන නිගමනයන්ටද?"

"අර මනුස්සයා නාවික බලකායේ විශ්‍රාමලත් සාජන්ට්වරයෙක් බව?"

"ඔය සුළු සුළු දේවල් පැහැදිලි කරලා දෙන්න මට වෙලාවක් නැහැ." ඔහු එක්වරම කීවේය.

මඳ වේලාවකින් ඔහුගේ මුවේ සිනාරැල්ලක් නැගිණ.

"මං එහෙම කිව්වට මට සමාවෙන්න දොස්තර මහත්තයා. මං සියුම් කල්පනාවක යෙදිලයි හිටියේ. ඒක, එකිනෙකට සම්බන්ධවෙන සිදුවීම් රාශියක් ඇති, සිතුවිලි දාමයක්. ඔබ ඒක බිඳ දැමුවා. කමක් නෑ. ඒකත් හොඳයි කියමුකෝ. හොඳයි ඉතින් ඔබට පෙනුණේ නැද්ද ඔහු නාවික බලකායේ සාජන්ට් වරයෙක් බව?"

"ඇත්තෙන්ම මට පෙනුණේ නැහැ."

"ඒක මගේ හිතට කල්පනා වුණේ බොහොම පහසුවෙන්. නමුත් කොහොමද කල්පනා වුණේ කියලා තේරුම් කරල දෙන එක

Reading Purpose Only Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

මට ටිකක් අමාරුයි. දෙවරක් දෙක කීයද කියල ඇහුවොත් ඔබ කියාවි හතරයි කියලා. ඒත් ඒක වෙන්නේ කොහොමද කියල ඔප්පු කරලා පෙන්වන්න තිබුණොත් ටිකක් අමාරුයි නේද?

අර මනුස්සයා ඇවිද ආවේ පාරේන් එහා පැත්තෙ වුණත්, ඔහුගේ අතේ පිටපැත්තේ, තිල්පාටට, ලොකු නැංගුරමක ලකුණ පච්ච කොටා තිබුණු හැටි මම දුටුවා. ඒකෙන් කියන්නේ ඔහු මුහුදට සම්බන්ධ රැකියාවක යෙදෙන්නෙක් කියලා. ඔහුගේ ස්වභාවයේ හමුදා පෙනුමක් තිබුණා. නිලයෙන් අනුමතව වවන තාලේ 'සයිඩ් බර්න්ස්' දලි රැවුළ මුහුණ දෙපැත්තේ වවා තිබුණා. එතකොට අපට හිතාගන්න පුළුවන්, ඔහු රාජකීය නාවික හමුදාවේ කෙනෙක් බව. ඔබ දකින්න ඇති, මිනිහ හිස කෙළින් කරගෙන, වේවැල එහාට මෙහාට පද්දමින් ගමන් කළ ගාම්භීර තාලෙ. මෙවැනි වැදගත් පෙනුමැති, මැදි වියේ පුද්ගලයෙක්, සාජන්ට් වරයෙක් වියයුතුයි කියල මට හිතුණා."

"විශිෂ්ටයි."

"ආ..........පුදුම දෙයක්. මං මේ දැන් ඔබට කිය කියා හිටියේ මේ දවස්වල ලන්ඩනයේ අපරාධකාරයෝ නැහැ කියලනේ. මේ ලියුමෙන් පෙනෙන්නේ මගේ ඒ කියමන වැරදි වගෙයි. මේ බලන්න." සාජන්ට් වරයා ගෙන ආ ලියුම හෝම්ස් මා වෙත විසිකළේය.

"දෙයියනේ! මහා අපරාධයක් සිදුවෙලා නේද?"

"සාමාන්‍යයෙන් දකින්න ලැබෙන එවට වඩා ටිකක් වෙනස් ආකාරයේ එකක් බව නම් ඇත්තයි. කරුණාකරලා ඔය ලියුම මට ඇහෙන්න කියවන්න."

"මා හිතවත් ෂර්ලොක් හෝම්ස් මහතාණනි,

ඊයේ රාත්‍රී බ්‍රික්ස්ටන් පාරේ ලෝරිස්ටන් උයනේ අංක තුන දරන තැන, කණගාටුදායක සිදුවීමක් වී ඇති බැව්, ඔබට දැනුම් දීමට කැමැත්තෙමි. රාත්‍රියේ මුරසංචාරයේ යෙදී සිටි අපේ පොලිස්භටයාට, රෑ දෙකට පමණ මෙම ස්ථානයේ එළියක් දකින්නට ලැබී ඇත. මෙම නිවස කිසිවෙකු වාසය නොකළ පාළු එකක් නිසා, ඔහුගේ හිතට සැකයක් ඇතිවිය. එහි ගිය ඔහුට දකින්නට ලැබුණේ, ගෙයි ඉදිරි දොර විවෘතව ඇති බවයි. ලී බඩු කිසිවක් නොතිබුණු ඉදිරිපස

http://sherlockholmesinvestigations.blogspot.com

කාමරයේ බිම වැටී තිබී, හොඳින් ඇඳ පැළඳගත් මහත්මයෙකුගේ මළසිරුරක් ඔහුට හමු විය. එහි සාක්කුවක තිබුණු කාඩ් පතක මෙසේ සඳහන් විය.

**එනොක් . ජේ. ඩ්‍රෙබර්,**
ක්ලීව්ලන්ඩ්,
ඔහායෝ.
ඇමරිකා එක්සත් ජනපදය.

මේ මිනීමැරුම වටිනා දේ පැහැර ගැනීමේ අරමුණෙන් කරන ලද්දක් බව සිතිය නොහැක. එමෙන්ම ඔහු මරණයට පත්වූයේ කෙසේද යන්න පවා තීරණය කරගැනීමට පැහැදිලි සාක්ෂියක් නොමැත. කාමරයේ තැන් තැන්වල ලේ පැල්ලම් තිබූ නමුත්, මළ සිරුරේ තුවාල කිසිවක් නොමැත. ඔහු මෙම පාළු නිවසට පැමිණියේ කෙසේද යන්න, අපට සිතාගැනීමටවත් අපහසුයි. දොළහට පෙර ඔබට මෙම නිවසට පැමිණිය හැකිද? මං ඔබ එනතුරු බලා සිටිනවා. ඔබගෙන් පිළිතුරක් එන තුරු, මා හැම දෙයක්ම ඒ හැටියට තිබෙන්නනත් හරිනවා. ඔබට පැමිණීමට අපහසු නම්, මම සියලුම විස්තර දන්වන්නම්. මේ සිද්ධිය පිළිබඳව ඔබට යම් අදහසක් දිය හැකි නම්, එය ඉතා අගය කොට සලකමි.

මේ හිතවත්,
ටෝබියස් ග්‍රෙග්සන්//

"ස්කොට්ලන්ඩ්යාඩ් එකේ රහස් පරීක්ෂකයන්ගෙන් දක්ෂම මිනිහ තමා ග්‍රෙග්සන්." හෝම්ස් කීය. "අදක්ෂයන් ගොඩකින් වැඩකට ඇති මිනිසුන් ඉන්නේ ග්‍රෙග්සන් හා ලෙස්ට්‍රේඩ් විතරයි. ඔවුන් දෙදෙනාම ක්‍රියාශීලීයි. හරිම උනන්දුවකින් වැඩ කරනවා. නමුත් පරීක්ෂණ කරගෙන යන්නේ අර හැටිණි, සම්ප්‍රදායික පිළිවෙළටමයි. ඒ විතරක් නෙවෙයි. පුළුවන් වෙලාවට එකෙක් උත්සාහ කරනවා අනෙකාව යටින් කපා අරින්න. ඊටත් තියෙනවා. රූ රැජින තරඟයකට ඉදිරිපත් වුණු රූප සුන්දරියෝ දෙදෙනෙක් වගේ, මෙයාලත් දෙන්නට

Reading Purpose Only Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

දෙන්නා ඊර්ෂ්‍යාවයි. මේ පරීක්ෂණය දෙන්නාටම එක සැරේ භාරදුන්නොත්, හොඳ විනෝදාත්මක සිදුවීම් අපට බලාගන්න පුළුවන් වේවි."

කිසි කලබලයකින් තොරව ඔහු නිවි සැනසිල්ලේ කතා කරගෙන යන ආකාරය ගැන මම පුදුමයට පත්වීමි.

"අපතේ අරින්න කාලයක් නැහැ නේද? මම ගිහින් කුලීරියකට කථා කරන්නද?" මම උත්සාහයෙන් ඇසීමි.

"මට හරියටම විශ්වාස නෑ, මය වැඩේට මං යන්න ඕනැමද කියල. වෙලාවකට මං හරි කම්මැලි මිනිහෙක් ඒත් උවමනා වෙලාවට මට බොහොම කඩිසර වෙන්නත් පුළුවන්."

"ඇයි ඉතින් ඔබ නොඉවසිල්ලෙන් බලාගෙන හිටියේ මේ වගේ අවස්ථාවක් ලැබෙන තුරු නේද?" මම ඇසීමි.

"මගේ හිතවත් මිත්‍රයා. මට ඕක විසඳීමෙන් ලැබෙන ප්‍රයෝජනය මොකක්ද? මං මේ අභිරහස විසඳුවා කියමුකෝ. නමුත් කිසිම සැකයක් නෑ, ඒකේ ගෞරවය ලැබෙන්නේ ග්‍රෙග්සන්, ලෙස්ට්‍රේඩ් සහ සමාගමටයි. පොලිස් රහස් පරීක්ෂකයෙක් නොවුණාම ඇති අවාසිය ඒකයි."

"ඒත් ඔහුආයාචනා කරනවා ඔබට ඇවිත් උදවු කරන්න කියලා."

"ඔව් ඒක හරි. මොකද ඔවුන් දන්නවා, මං ඔවුනට වඩා දක්ෂයි කියලා. මා එක්ක කථා කරන කොට ඔවුන් අවංකවම ඒ ගැන සඳහන් කරනවා. නමුත් තවත් කෙනෙකුට ඒක කියන්න කලින්, තමන්ගේ දිව කපලා විසිකරාවි. කොයි එකටත් අපි ගිහින් බලමු. මගේ විශේෂ ක්‍රමයට මං එය පරීක්ෂා කර බලනවා. වෙන මොකුත් නැත්නම්, ඔවුනට සිනාසෙන්නවත් අපට අවස්ථාවක් ලැබේවි. එහෙනම් අපි යමු."

කබාය හැඳගත් පසු ඔහුගෙන් දිස්වූයේ වඩාත් උද්‍යෝගිමත් ස්වභාවයකි.

"ඔබේ හිස් වැස්මත් අරගන්න දොස්තර මහත්තයා." ඔහු කීවේය.

"ඇයි ඔබ කියන්නේ මේ ගමනට මටත් එන්න කියලද?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. වෙන කරන්න වැදගත් වැඩක් නැත්නම්."

මඳ වේලාවකට පසු අපි කුලීරියකට නැගී බ්‍රික්ස්ටන් දෙසට වේගයෙන් ගමන් ගත්තෙමු.

එය මීදුමෙන් වැසුණු අඳුරු උදෑසනක් විය. ගෙවල්වල පියැසි මඩ පැහැති මීදුමකින් ආවරණය වී තිබිණි. එහෙත් මගේ මිත්‍ර ෂර්ලොක් හෝම්ස් නම් සිටියේ මහත් උද්යෝගයෙනි. ඔහු වයලීන ගැන කථා කරන්නට පටන්ගත්තේය. ක්‍රෙමෝනා වයලීනය ගැන දීර්ඝ විස්තරයක් කළ ඔහු, ස්ට්‍රැඩිවෙරියස් හා අමාටි වයලීන අතර වෙනස්කම මට පැහැදිලි කළේය. අයහපත් කාලගුණය නිසාත්, භාරවූ කටයුත්තේ අප්‍රසන්න බව සිහිවීමෙනුත්, මම නිහඬවම සිටියෙමි.

"දැන් අපි මේ කරන්න යන මේ වැඩේ ගැන, ඔබ ඒ හැටි කල්පනා කරන්නේ නැහැ නේද?" මා ඔහුගෙන් ඇසුවේ, ඔහු දිගින් දිගටම සංගීත භාණ්ඩ ගැන කළ විස්තරයට බාධා කරමිනි.

"අපට තවමත් සතුටුදායක දත්ත කිසිවක් ලැබිල නැහැ. ප්‍රමාණවත් තරම් දත්ත නොලැබ, යමක් උපකල්පනය කරන්නට යෑම බරපතල වැරැද්දක්. එහෙම කළොම නිවැරදි අවසන් නිගමනයකට ඒම බොහොම අපහසුයි."

"දත්ත නම් ඔබට ඉක්මනටම ලැබේවි. ඔන්න අපි බ්‍රික්ස්ටන් පාරටත් ආවා. අන්න අරක වෙන්න ඕනෑ ගේ, මට ලොකු වැරදීමක් වුණේ නැත්නම්." මම කීවෙමි.

"ඔව් හැබැමයි. අශ්වකරත්තය නවත්වන්න." ඔහු අණ දුන්නේය.

"එතැනට තවත් යාර සියයක් පමණ දුරයි හෝම්ස්. තව ටිකක් දුර කරත්තයෙන් යමු." මම කීවෙමි.

"නෑ. මෙතැන ඉඳගෙන පයින් යමු. එතකොට අපට පුළුවන් වඩාත් හොඳින් සියල්ල නිරීක්ෂණය කරන්න."

ලෝරිස්ටන් උයනේ අංක 3 දරන නිවසේ තිබුණේ අවාසනාවන්ත, ශෝකය දනවන පෙනුමකි. පාරේ සිට මදක් වත්ත ඇතුළට වන්නට පිහිටා තිබුණු එය, එකම මෝස්තරයේ නිවාස හතරකින් එකක් විය. මෙයින් නිවාස දෙකක පදිංචි කරුවන් සිටි අතර, අනෙක් දෙක හිස්ව තිබිණි. තිර රෙදිවලින් අලංකාර නොවුණු ජනෙල් සහිත මේ නිවසේ, තැනක හෝ දෙකක "බදු දීමට" යනුවෙන් නාම පුවරු විය. පෙර දින රාත්‍රියේ ඇදහැළුණු වර්ෂාවෙන් වත්තේ

http://sherlockholmesinvestigations.blogspot.com

සැම තැනක්ම මඩ වී තිබිණි. මෙඩ්ගත්න වට කොට තිබුණේ අඩි තුනක් පමණ උස, ගඩොල් බැඳි තාප්පයකිනි. මෙම තාප්පය මත කෙටි ලී කණු සවි කොට තැනුණු වැටක් ද විය. හැඩිදැඩි පොලිස් භටයෙක් මේ තාප්පයට හේත්තු වී සිටියේය. නිවස ඇතුළත සිදුවන දේ දැනගැනීමේ අපේක්ෂාවෙන්, රස්තියාදුකරුවෝ කීපදෙනෙක් පොලිස්භටයා සමීපයේ එකතුවී සිටියහ.

"අපි ඉස්සර වෙලාම ගේට ඇතුළුවෙන්නේ නෑ." හෝම්ස් කීය.

"ඇයි මං හිතුවේ ඔබ කෙලින්ම එහි ඇතුළු වෙලා අභිරහස විසඳීමට පටන්ගනීවි කියල."

"නෑ. මම මුලින්ම මේ තැරියේ පදික වේදිකාව පරීක්ෂා කරලා බලන්න ඕනෑ. ඉහළ පහළ යමින් පදික වේදිකාව පිරික්සා බැලූ ඔහු, ඊළඟට ඒ පෙදෙසේ පොළොව දෙස හිස් බැල්මෙන් බලා සිටියේය. අනතුරුව අහස දෙසට නෙත් යොමු ඔහු, පාරේ අනෙක් පැත්තේ තිබූ නිවාස සහ ලැලි වැට ද සෝදිසි කර බැලීය.

ඒ සියල්ල අවසන් කොට, මගේ මිත්‍රයා මේ නිවස වෙතට වැටුණු පාර දිගේ, ඉදිරියට ගමන් කිරීමට පටන්ගත්තේය. ඔහු ගමන් කළේ පාරේ නොව, ඒ අයින දිගේ වූ තණකොළ කඩ මතින් බව කීවොත් වඩාත් නිවැරදිය. පාරේ පොළව දෙස සුපරීක්ෂාකාරීව බලමින් ඉදිරියට ගිය ඔහු, දෙවරක්ම නැවතී, කිසියම් ලකුණක් දෙස මහත් ඕනෑකමින් බලා සිටියේය. එක්වරක් ඔහුගේ මුහුණේ සිනහ රැල්ලක් ඇඳිණි. විටෙක ඔහු තමාට මොනවාදෝ කියාගත්තේ තෘප්තිමත් බවකිනි.

පාරේ වූ මැටි සහිත පසු මඩවගුරක් බවට පත්වූ තරමිය. පොලිස් නිලධරයන් කිහිපවරක් ඒ මතින් ගමන්කිරීම නිසා, එහි පා සටහන් රාශියක් විය. එවැනි තැනකින් මගේ මිත්‍රයාට යම් හෝඩුවාවක් නිරීක්ෂණය කළ හැක්කේ කෙසේද යන්න, මට සිතාගත නොහැකි විය. කෙසේ වෙතත් ඉතා සියුම් දෙයක් පවා විනිවිද දැකීමටත්, එයින් තැරුණු රහසක් වටහාගැනීමටත්, මගේ මිත්‍රයා සතුව නිරීක්ෂණ බුද්ධියක් ඇතැයි මට හැඟිණ. මා නොදුටු හෝඩුවාවල් රැසක්, ඔහුට දැනගන්නට ලැබුණු බවට සැකයක් නැත. නිවසේ දොරදු අසල සිටි උස, රත්වන් හිසකෙස් හා සුදුමැලි

http://sherlockholmesinvestigations.blogspot.com

මුහුණක් තිබූ පුද්ගලයෙක් අප පිළිගත්තේය. ඔහු ෂර්ලොක් හෝම්ස්ගේ සුරත සොලවා ආචාර කළේ මහත් සොම්නසිනි.

"ඔබේ පැමිණීම ඇත්තෙන්ම අපට ලොකු පිහිටක් මහත්මයා. අප කිසිම දෙයක් අල්ලන්නෙ නැතිව එහෙමම තැබුවා."

"ඒකත් හැර!" මගේ මිත්‍රයා කීවේ නිවස වෙතට එන පාර දෙසට අත දිගු කරමිනි.

"මීහරක් රංචුවක් ඔය පාරේ ගමන් කළත්, ඒක ඔය තරම් අවුල් ගොඩක් වෙන්නේ නෑ. ඒකට ඉඩ දෙන්න කලින් ඔබ මේ ගැන අවසන් නිගමනයකට එන්න ඇති නේද ග්‍රෙග්සන්?"

"මටත් ගේ ඇතුළේ කරන්න වැඩ රාජකාරි හුඟක් තිබුණා හෝම්ස් මහත්තයා." ග්‍රෙග්සන් කීවේ ප්‍රශ්නය මගහරිමිනි.

"මගේ මිත්‍රයා ලෙස්ට්‍රේඩ් මා දැනුම මේ පරීක්ෂණයට සම්බන්ධ වෙනවා. මං හිතුවා ඔහු ඒ පැත්ත බලාගන්න ඇති කියලා."

හෝම්ස් මා දෙස බලා, දෙබැම ඔසවමින් හෙළුවේ උපහාසාත්මක බැල්මකි.

"ඔබ සහ ලෙස්ට්‍රේඩ් වැනි දක්ෂ අපරාධ පරීක්ෂකයන් දෙදෙනෙක් මෙතැන පරීක්ෂා කළා නම්, මං හිතන්නේ නෑ තුන්වැන්නෙකුට මෙතැන හොයාගන්න දෙයක් ඉතිරි වෙලා ඇති කියලා." හෝම්ස් කීය.

ග්‍රෙග්සන් දෑත් පිරිමැද්දේ අතිශයින් තෘප්තියට පත් අයුරෙනි.

"මට හිතෙන හැටියට, කරන්න තියෙන හැම දෙයක්ම අපි කළා. ඒ වුණත් මේක මහා පැටලිලි සහගත එකක්. මං දන්නවා ඔබ මේ වගේ ඒවට හරි කැමැති බව." ග්‍රෙග්සන් කීය.

"ඔබ මෙහාට ආවේ කුලී අශ්වකරත්තයකින් නොවෙයි නේද ?" හෝම්ස් ඇසුවේය.

"නැහැ මහත්මයා."

"ලෙස්ට්‍රේඩ් ආවෙත් කුලීරියක නොමෙයි?"

"නැහැ මහත්මයා."

"එහෙම නම් අපි ගිහින් කාමරය පරීක්ෂා කරලා බලමු." කී හෝම්ස් කාමරයට ඇතුළුවිය.

http://sherlockholmesinvestigations.blogspot.com

ග්‍රෙග්සන්ගේ මුහුණේ පලවුයේ අතිශයින් මවිතයට පත් ලකුණුයි. දූවිලි පිරුණු බරාඳයකින්, අඳුරු කුස්සිය, කෑමකන කාමරය හා කන්තෝරු කාමරය එකට සම්බන්ධ විය. මෙම බරාඳයේ වමට හා දකුණට දොරවල් දෙකක් විය. මෙයින් එකක් සති ගණනාවක් තිස්සේම වසා තැබූ බව පැහැදිලිවම පෙනිණ. අනෙක් දොරටුව කෑමකන කාමරයටයි. අභිරහස් මිනීමැරුම සිදුවී තිබුණේ එහිය. හෝම්ස් ඒ තුළට ගමන් කරද්දී, මම ඔහු පසුපස ගියෙමි.

එය හරි හතරැස් හැඩගත් විශාල කාමරයක් විය. ගෘහ භාණ්ඩ කිසිවක් නොතිබුණු නිසා, එහි විශාල බව වඩාත් කැපී පෙනිණ. බිත්ති සැරසීමට යොදා තිබුණේ අවලක්ෂණ මෝස්තර සහිත කඩදාසියි. පුස්වලින් වැසී ගොස් තිබුණු මේ සැරසිලි කඩදාසි, බොහෝ තැන්වලින් ඉරීගොස්, පහළට එල්ලෙමින් තිබිණි. කඩදාසි ඉරීගිය තැන්වල, බිත්තියේ තිබූ කහපාට බදාමය දිස්විය. දොරට විරුද්ධ පැත්තේ, අලංකාර ලෙස තැනූ ගිනි උදුනකි. ඒ මත ගිනිදැල් පඩිය කෘත්‍රිම කිරිගරුඬවලින් නිමකොට තිබිණි. මෙහි එක් කෙළවරක සවිකොට තිබුණේ, රතු පැහැති ඉටිපන්දමකි. එය දල්වා තිබී නිවා දැම්ම නිසා, ඉටිපන්දමෙන් ඉතිරිව තිබුණේ අඟලක් පමණි. කාමරයට තිබුණේ එකම ජනේලයකි. එහි වීදුරු ඝන දූවිලි තට්ටුවකින් වැසී තිබිණි. ඒ නිසා කාමරය ඇතුළට වැටුණේ මඳ ආලෝකයකි. එහෙයින් කාමරය ඇතුළත දර්ශනය එතරම් පැහැදිලි විය.

මේ විස්තර සියල්ලක්ම මට දකින්නට ලැබුණේ පසුවය. මගේ අවධානය එකවරම යොමුවූයේ, කාමරයේ පොළොව මත වැටී තිබූ මළසිරුර වෙතයි. එහි දෑස් විවෘතව, හිස් බැල්මකින් කාමරයේ සිවිලිම වෙත යොමු වී තිබිණි. එය අවුරුදු හතලිස් තුනක් හෝ හතලිස් හතරක් වයසැති පිරිමියෙකුගේ මළසිරුරකි. මධ්‍යම ප්‍රමාණයේ ශරීරයක් තිබූ ඔහුගේ, උරහිස් පළල්වූ අතර, කළු පැහැති හිසකෙස් අක්බමරු විය. දින කිහිපයකින් රැවුල බෑමට නොහැකිවුණු නිසා වැඩුණු කෙටි රැවුලක් ද මුහුණේ විය. ලා පැහැයක කලිසමක්, ඇතුළු කබාය, පිට කබාය, කොලරය ආදියෙන් සැරසී සිටි ඔහුගේ, ටොප් හැට් වර්ගයේ හිස්වැස්ම බිම තිබිණි. ඔහු අත්දෙක දෙපසට විහිදාගෙන සිටියේය. එහමුත් ඔහුගේ දෑත් මිට මොළැවී තිබුණු අතර, දෙකකුල් එකට පටලැවී තිබිණ.

http://sherlockholmesinvestigations.blogspot.com

මට හැඟී ගියේ, ඔහු අවසන් මොහොතේ මාරයා සමග කළ අරගලය, ඉතා භයානක එකක් වී ඇති බවයි. දරදඬු වී තිබූ ඔහුගේ මුහුණෙන් ප්‍රකාශ වූ හැඟීම භීතිය හා වෛරයයි. මේ ආකාරයට දරුණු ලෙස මේ හැඟීම්, පළුවූ මුහුණක්, මම මළසිරුරක කිසිදිනක දැක නැත්තෙමි. මුහුණේ පළුවූ මේ භයානක විකෘති ස්වභාවයට අමතරව, ඉදිරියට නෙරා ආ හනුවත්, කෙටි නාසයත්, සිරුර තිබුණු ඉරියව්වත් නිසා, ඔහුට ලැබුණේ වානර පෙනුමකි. මේ මළසිරුර මගේ සිතට ගෙන ආවේ භීතියකි.

හැම දේ ගැනම හාරා අවුස්සා බලන, රහස් පරීක්ෂකයෙකුට උරුම පෙනුමක් ලෙස්ට්‍රේඩ් සතුවිය. ඔහු නිවසේ දොරටුව අසල බලාසිටියේය. ඔහු කතාව ඇරඹුවේ මටත්, මගේ මිත්‍රයාටත් ආචාර කරමිනි.

"මේ මිනීමැරුමෙන් මහා කලබලයක් ඇතිවේවි හෝම්ස් මහත්මයා. මං කොයි තරම් මිනීමැරුම් දකලා තියෙනවද. ඒ හැම එකක්ම පරාදයි මේකට."

"මොකුත් හෝඩුවාවක් නැද්ද?" ග්‍රෙග්සන් ඇසීය

"කිසි දෙයක් නෑ."

ෂර්ලොක් හෝම්ස් මළසිරුර වෙත ගොස්, ඒ අසලින් දණගසා ගත්තේය. අනතුරුව ඔහු ඉතා සැලකිල්ලෙන් එය පරීක්ෂාකර බැලීමට පටන් ගත්තේය.

"මිනියේ මොකුත් තුවාලයක් නැහැ කියලා, ඔබට හොඳටම විශ්වාසද?"

හෝම්ස් ඇසුවේ අවට විසිරී තිබුණු ලේ පැල්ලම් දෙසට අත දිගු කරමිනි.

"හොඳටම විශ්වාසයි." රහස් පරීක්ෂකයෝ දෙදෙනා එකවරම කීහ.

"එහෙම නම් මේ ලේ දෙවැන්නෙකුගේ, බොහෝවිට මිනීමරුවාගේ. ඒ ඉතින් මේක මිනීමැරුමක් නම්. මට මතක් වන්නේ 1834 දී උට්‍රෙච්ට් හි දී සිදුවූ වැන් ජෝන්සන්ගේ මරණය සිදුවූ තැන දකින්නට ලැබී තිබුණු දේවල්. ග්‍රෙග්සන් ඔබට මතකද ඒ සිද්ධිය?"

http://sherlockholmesinvestigations.blogspot.com

"නැහැ මහත්මයා."

"ඒක සම්පූර්ණයෙන්ම කියවා බලන්න. ඔබ එවැනි දේවල් කියවිය යුතුමයි. මේ ලෝකේ කිසිදෙයක් අලුතෙන් සිදුවෙන්නේ නෑ. මේ හැම දෙයක්ම මීට කලින් සිදුවෙලා තියෙනවා."

මෙම කතාබහ සිදුවෙද්දීත් හෝම්ස් සිටියේ මළසිරුර පරීක්ෂා කරමිනි. ඉතා වේගයෙන් ක්‍රියාත්මක වූ ඔහුගේ ඇඟිලි, මළසිරුර පුරා දිව ගියේය. විටෙක ඔහු එහි තැන් තැන් ඔබා බැලුවේය. තවත් විටෙක ඇඳුම් වල බොත්තම් විවෘත කර පරීක්ෂා කළේය. අනතුරුව තම නාසය මළසිරුරේ දෙතොල් වෙතට ළං කළ හෝම්ස්, එයින් යම් ගන්ධයක් නිකුත්වේදැයි ආඝ්‍රාණය කර බැලීය. අවසන් වශයෙන් ඔහු මියගිය තැනැත්තා හැඳ සිටි සපත්තු වල අඩිය ද පරීක්ෂා කළේය.

"මිනිය එහා මෙහා කළේ නැද්ද?"

"පරීක්ෂා කරල බලන්න උවමනා පමණට, ටිකක් එහා මෙහා කළා. එපමණයි."

"එහෙනම් මෙය දැන් මෘතශරීරාගාරයට ගෙනියන්න පුළුවනි. මේකෙන් තවත් හොයාගන්න යමක් නැහැ."

මිනිය ඉවතට ගෙනයාම සඳහා, ස්ට්‍රෙචරයක් රැගත් පුද්ගලයින් සිව්දෙනෙකු ග්‍රෙග්සන් විසින් කැඳවන ලදී. මළසිරුර ස්ට්‍රෙචරයට දමා ඉහළට ඔසවද්දී, රන්මුද්දක් බිම වැටී ඉවතට පෙරළී ගියේය. ලෙස්ට්‍රේඩ් එය අහුලා ගත්තේ විස්මයට පත් දෑසිනි.

"මේකට ගැහැනියක් සම්බන්ධයි. මේ ගැහැනියකගේ මගුල් මුද්දක්."

සිය අත්ල මත මුද්ද තබූ ඔහු, කථාකරන ගමන් එය ඉහළට ඔසවා අපට පෙන්වීය. රත්තරනින් තනා තිබූ මේ චාම් පට්ටම් මුද්ද, මනාලියකගේ ඇඟිල්ලේ පැළැඳි එකක් බවට සැකයක් නැත.

"මේකෙන් වැඩේ තවත් අවුල් සහගත වෙනවා." ඒ කීවේ ග්‍රෙග්සන්ය. "දෙයියො තමා දන්නෙ. ඉස්සර වෙලාත් ඉතින් අවුල් සහගත බවේ අඩුවක් තිබුණෙ නෑ."

"ඔබට හොඳටම විශ්වාසද මේ මුද්දෙන් ගැටලුව ටිකක් ලිහෙන එකක් නැහැ කියලා?" හෝම්ස් ඇසීය. "ඔය මුද්ද දිහා

http://sherlockholmesinvestigations.blogspot.com

නිකං බලාගෙන ඉඳීමෙන් ප්‍රයෝජනයක් නැහැ. මියගිය තැනැත්තාගේ සාක්කුවල මොනවද තිබුණේ?"

"ඒ ඔක්කොම මෙතැන තියෙනවා, මහත්මයා." ග්‍රෙග්සන් කීවේ තරප්පු පෙළේ පහතම තරප්පුවට අත දිගුකරමිනි.

ලන්ඩනයේ බැරෝ සහ සමාගමේ නිෂ්පාදිත අංක 971163 දරන රත්රන් ඔරලෝසුවක්, පිරිසිදු රත්තරනින් තැනූ, බර, ඇල්බට් මෝස්තරයේ රත්රන් දම්වැලක්, මේසොනික් ලාංඡනය සහිත රන් මුද්දක්. රත්රන් ටයි කටුවක්. එහි බූනාවි හිසක රූපයක් තිබෙනවා. එහි ඇස් වලට යොදා තිබෙන්නේ රතුකැට. ක්ලීව්ලන්ඩ්හි එනොක් ජේ ඩ්‍රෙබර් නමින්, ආගන්තුක පත්‍ර ඇසිරූ සම් කොපුවක්, ඇඳුම් වල E.J.D යන අකුරු මසා තිබෙනවා. මුදල් පසුම්බියක් නැහැ. නමුත් පවුම් හතයි සිලිං 13 ක මාරු සල්ලි, සාක්කුවේ තිබුණා. කෙටිකතා රාශියක එකතුවක් වූ බොකැසියෝගේ ඩෙකැමෙරන් නම් ග්‍රන්ථයේ කුඩා ප්‍රමාණයේ මුද්‍රිත පිටපතක්. ඒ පොතේ මුල පිටුවේ ජෝසප් ස්ටැන්ගසන් යනු නම ලියා තිබෙනවා. ඊ.ජේ.ඩ්‍රෙබර් හා ජෝසප් ස්ටැන්ගසන් දෙදෙනාට ලැබුණු ලියුම් දෙකක්."

"මොන ලිපිනයටද?"

"ස්ට්‍රෑන්ඩ් හි ඇමෙරිකන් එක්ස්චේන්ජ් ආයතනය භාරයේ ලියුම් එවලා තියෙන්නේ. අයිතිකරුවා එහි පැමිණ ලියුම් ලබාගනීවි යයි සඳහන්. ඒ ලියුම් දෙකම 'ගියොන්' දුම්නැව් සමාගමෙන්. ඔවුන්ගේ නැව් ලිවර්පූල් වරායෙන් නිව්යෝක් බලා යාත්‍රා කරන බව, ඒ ලියුම් දෙකෙහිම දැනුම් දී තිබෙනවා. මේ අවාසනාවන්ත පුද්ගලයා, ආපසු නිව්යෝක් බලා යන්න සූදානමින් සිටි බව එයින් පැහැදිලියි."

"ස්ටැන්ගසන් කියන තැනැත්තා ගැන ඔබ විමසා බැලුවාද?"

"ඒ කටයුත්ත මං වහාම සිදුකළා." ග්‍රෙග්සන් පිළිතුරු දුන්නේය. "හැම පුවත්පතකටම ඔහු ගැන විමසලා දැන්වීම් යැව්වා. ඊට අමතරව ඔහු ගැන සොයා බලන්න, ඇමෙරිකන් එක්ස්චේන්ජ් ආයතනයටත් පොලිස් භටයෙක් යැවුවා. ඔහු තවමත් ආපසු ඇවිත් නැහැ."

"ක්ලීව්ලන්ඩ් වලට විදුලිපුවතක් යැවුවද?"

"අද උදේ විදුලිපුවතක් යැවුවා."

http://sherlockholmesinvestigations.blogspot.com

"මොනවද ඔබ අහලා ඇරියේ?"

"මං මේ සිද්ධිය ගැන කෙටියෙන් සඳහන් කළා. අපට ප්‍රයෝජනවත් විය හැකි තොරතුරු තියෙනවා නම් දන්වන්න කියලා යැවුවා."

"මෙහිදී ඉතාම වැදගත් විය හැකි කාරණය ගැන විස්තර දන්වන්න කියලා ඔබ සඳහන් කළේ නැද්ද?"

"මං ස්ටැන්ගසන් ගැන අහලා යැව්වා."

"අහල බලන්න වෙන මොකුත් නෑ කියලද ග්‍රෙග්සන් ඔබ හිතන්නේ? මේ මුළු සිද්ධියම රඳා පවතින්නේ, එක් වැදගත් කාරණයක් මත. ඒ මොකක්ද කියලා ඔබට හිතාගන්න බැරිද? අයෙමත් විදුලි පුවතක් යවන්න ඔබේ බලාපොරොත්තුවක් නැද්ද?"

"මට කියන්න තිබෙන ඔක්කොම මං කියලයි තියෙන්නෙ." ග්‍රෙග්සන් කීවේ කෝපයට පත් හඬිනි.

ශබ්දයක් නොනගා සිනාසුණු හෝම්ස්, යමක් පැවසීමට සූදානම් වූවා පමණි. අප කතාබහේ යෙදෙද්දී ලෙස්ට්‍රේඩ් සිටියේ නිවසේ ඉදිරිපස කාමරය පරීක්ෂා කරමිනි. ඔහු අප වෙත දිව ආවේය. දැන් පිරිමදිමින් සිටි ඔහුගෙන් දිස්වූයේ අතිශයින්, ප්‍රීතියට පත් බවකි.

"ග්‍රෙග්සන් මහත්මයා." ලෙස්ට්‍රේඩ් කීය.

"මම මේ දන් බොහොම වැදගත් සොයා ගැනීමක් කළා. මං ඉතා සූක්ෂම අයුරින් බිත්ති පරීක්ෂා නොකළා නම්, මේක අපට මගහැරී යන්න තිබුණා." පැවසූ ලෙස්ට්‍රේඩ්ගේ දෑස් දීප්තියෙන් බැබළිණි. තම සගයාට වඩා අමුතර ලකුණු දමා ගැනීමට හැකිවීම නිසා, ඔහු සිටියේ දැඩි සතුටකිනි.

"මේ පැත්තට එන්න." ඔහු කීවේ යළිත් නිවසේ ඉදිරිපස කාමරයට ඇතුළුවෙමිනි. මළසිරුර ඉවත් කිරීමෙන් පසුව එහි පරිසරය වඩාත් සතුටුදායක විය.

"ඔහොම ඉඳගෙන මෙතැන බලන්න." කී ලෙස්ට්‍රේඩ් ගිනිකූරක් දල්වා, එහි දල්ල බිත්තිය වෙත ළං කළේය.

"අන්න අරක බලන්න!" ඔහු කෑ ගැසුවේය.

http://sherlockholmesinvestigations.blogspot.com

බිත්තිය අලංකාර කිරීමට යොදා කඩදාසි ඉරී, පහතට එල්ලෙමින් තිබූ බව, මම කලින් ද සඳහන් කළෙමි. කාමරයේ මෙම කෙළවරේ, ඉතා විශාල කඩදාසි කැබැල්ලක් ඉරාදැමීම නිසා, ලොකු කහපැහැති හතරැස් කොටුවක් නිරාවරණය වී තිබිණි. මෙම ඉඩ ප්‍රමාණය පුරා, ලේ රතු පැහැති අකුරෙන් ලියා තිබුණේ එක් වචනයකි.

RACHE

යනුවෙන් එහි සඳහන් විය.

"මේක ගැන මොකක්ද ඔබට හිතෙන්නේ?" ලෙස්ට්‍රේඩ් උස්හඬින් ඇසුවේ, මැජික් දර්ශනයකින් අන් අය විස්මයට පත්කරවන ඉන්ද්‍රජාලිකයකුගේ හඬිනි.

"කාමරයේ මේ හරිය අන්ධකාරයි. ඒ නිසා කාටවත් නොපෙනී ඒක මගහැරිල ගියා. කාටවත් මෙහේ බලන්න උවමනාවක් තිබුණේත් නැහැ. මිනීමරුවා මේක ලියලා තියෙන්නේ ඔහුගේම ලෙයින්. මේ බලන්න බිත්තිය දිගේ ලේ, පහළට ගලා ගිහින් තියෙන හැටි!

මියගිය පුද්ගලයා සියදිවි නසා ගත්තා කියන සැකය මේ කාරණය නිසා ඉවත්වෙනවා. ඔය වචනය ලියන්න, කාමරයේ මේ කෙළවරම තෝරගත්තේ මොකද? මං කියන්නම් ඒකට කාරණය. පේනව නේද උඩුන් පඩිය මත ඇති ඉටිපන්දම් කැබැල්ල? ඒ වෙලාවේ ඉටිපන්දම දල්වල තියෙන්න ඇති. එතකොට හොඳින්ම එළිය වැටෙන්නෙ මේ මුල්ලට."

"ඔබ මේක හොයා ගත්ත බව ඇත්තයි ලෙස්ට්‍රේඩ්. නමුත් මේකෙන් අපට තේරුම් ගන්න පුළුවන් මොකක්ද?" ග්‍රෙග්සන් ඇසුවේ මේ සොයාගැනීමේ ඇති වැදගත්කමක් තමා නොදකින අයුරෙනි.

"තේරුම් ගන්න පුළුවන් මොකක්ද? මේකෙන් අපට පැහැදිලිවම තේරුම් ගතහැකි කරුණක් තියෙනවා. මෙය ලියූ පුද්ගලයා, ගැහැනියකගේ නම වන - RACHEL රේචල් කියන වචනය ලියන්නයි උත්සාහ කළේ. නමුත් ඒ කටයුත්ත ඉවර කරන්න කලින් කාගෙන් හෝ ඔහුට හරි ඇයට බාධා පැමිණුණා. ඔන්න මං කිව්ව කියල මතක තියාගන්න. මේ ගැටලුව විසඳුණාට පස්සේ ඔබට දකින්න ලැබේවි. රේචල් කියන නම තියෙන, ගැහැනියක් මේකට සම්බන්ධ බව........ ඔබ මට හිනාවෙනව නේද, ෂර්ලොක් හෝම්ස්

http://sherlockholmesinvestigations.blogspot.com

මහත්මයා? ඔබ බොහෝම දක්ෂයෙක් වෙන්න පුළුවනි. නමුත් මේක විසඳලා ඉවර වෙද්දි, මේ මහලු පූසබයා අනෙක් ඔක්කොටම වඩා දක්ෂයෙක් බව ඔප්පු වෙන්නේ නැද්ද කියල බලන්න."

"මම ඇත්තෙන්ම ඔබෙන් සමාව ඉල්ලනවා ලෙස්ට්‍රේඩ්." හෝම්ස් කීවේය. ලෙස්ට්‍රේඩ් කතාකරගෙන යද්දී හෝම්ස් මහහඬින් සිනා පුණේය. එයින් පොලිස් නිලධරයා දැඩි කෝපයට පත්ව සිටියේය.

"මේ වචනය බිත්තියේ තිබී සොයාගැනීමේ ගෞරවය ඇත්තෙන්ම හිමිවන්නේ ඔබටයි. ඔබ කියන්න වගේ මේක ලියන්න ඇත්තේ, රීයේ ඊ, මේ සිද්ධියට සම්බන්ධ අනෙක් පුද්ගලයා විසින්. තවමත් මට මේ කාමරය පරීක්ෂාකර බලන්න බැරිවුණා. ඔබෙන් අවසර ලැබෙනවා නම්, දැන් මට ඒක කරන්න පුළුවනි."

කථාකරන අතුරතුරම හෝම්ස්, තම සාක්කුවෙන් කුඩා දේ ලොකු කර බලන විශාල උත්තල කාචයක් සහ ටේප් පටියක් එළියට ගත්තේය. මේ උපකරණ දෙක අතැතිව, හෝම්ස් කාමරයේ තැන් තැන්වලට ගියේ, කිසිදු ශබ්දයක් නොනගමිනි. විටෙක ඔහු නැවතී බලා සිටියේය. විටෙක බිම දණ ගසාගෙන කල්පනා කළේය. තවත් විටෙක මුනින් අතට සිමෙන්ති පොළොවේ වැතිරී, බිම තිබූ දෙයක් වෙත සුපරීක්ෂාකාරීව දෙනෙත් යොමු කළේය. තමා කළ කාර්ය වෙත ඔහුගේ අවධානය, සම්පූර්ණයෙන්ම ඇදී ගොස් තිබිණ. එය කොතරම් වී ද යත්, අනෙක් අය එහි සිටිත බවක් මගේ මිතුරාට සම්පූර්ණයෙන්ම අමතක වූ අයුරක් පෙනිණ. විටෙක ඔහු පහත් හඬින් යම් දෙයක් තමාටම කියාගත්තේය. විටෙක ඔහුට කෙඳිරි ගෑවිණි. තවත් විටෙක විස්මයට පත්වූ බව හඟවමින් ඔහු සිවුරුහන් කළේය.

මේ දේවල් නරඹමින් සිටි මට එක්වරම සිහිවූයේ, සොරුන් ඇල්ලීම සඳහා විශේෂයෙන් පුහුණු කළ, නුහුහුන් බිලඩිහවුන්ඩ් පූසබයන්ය. ඉදිරියට පනිමින්, යළි පිටුපසට පනිමින්, ඉව සොයා ඇදෙන, පූසබයෙකුගේත් මගේ මිත්‍රයාගේත් ඉරියව්වල වෙනසක් නොතිබිණි.

මිනිත්තු විස්සකට වැඩි කාලයක් ඔහු පොළොවේ තිබූ, ඔහුට පෙනුණු යම් සලකුණු ටේප් පටියෙන් මැන බැලුවේය. එහෙත් පොළොවේ කිසිම සලකුණක් තිබූ බවක් මට නම් පෙනෙන්නට

http://sherlockholmesinvestigations.blogspot.com

නොතිබිණි. වරක් දෙකක් ඔහු ටේප්පටිය බිත්තියේ තබමින් සෝදිසි කර බැලුවේ දඩි උවමනාවකිනි.

බිම එක්තැනක් හොඳින් පරීක්ෂාවට ලක්කළ හෝම්ස්, එතැන තිබූ අළු පැහැති දූවිලි ස්වල්පයක් එකතු කළේය. අනතුරුව එම දූවිලි පරෙස්සමෙන් ලියුම් කවරයකට දමා, පිටත අලවා, එය තම සාක්කුවට දමාගත්තේය. අවසන් වශයෙන් ඔහු පරීක්ෂා කළේ බිත්තියේ ලියා තිබූ වචනයයි. ඡලින් කාචය අතට ගත් හෝම්ස්, සෑම අකුරක්ම ඉතා උනන්දුවෙන් සියුම් ලෙස පරීක්ෂා කර බැලුවේය. එම කටයුත්ත අවසන් කළ පසු , ඔහු සෑහීමට පත්වූ බව පෙනිණ. ඒ බව මා දැන ගත්තේ ටේප් පටිය හා කාචය හෝම්ස් සාක්කුවට දමාගත් ආකාරයෙනි.

"කතාවක් තියෙනවා, අතිදක්ෂයා කියන්නේ අප්‍රමාණ මහන්සියකින්, කැපවීමකින් වැඩ කරන්න පුළුවන් තැනැත්තාට කියල." හෝම්ස් කීවේ සිනාමුසු මුහුණෙනි.

"ඒක හැම විටම නිවැරදියි කියලා මං කියන්නේ නැ. නමුත් අපරාධ පරීක්ෂණ කාර්යය ගත්තොත් නම් ඒක නිවැරදියි."

රජයෙන් නිලයක් නොලැබූ රහස්පරීක්ෂකයා සිටි විවිධ ඉරියව් හා කළ කටයුතු දෙස, ග්‍රෙග්සන් හා ලෙස්ට්‍රේඩ් දෙදෙනා බලා සිටියේ අතිශය උනන්දුවෙනි. එහෙත් ඔවුන්ගේ මුහුණුවල මතු වූයේ "මෙහෙමත් මෝඩයෙක් කියන තාලේ හැඟීමය. මේ වන විට මා ෂර්ලොක් හෝම්ස් ගැන ඇති කරගෙන තිබූ එක් අදහසකි. එය කුමක්ද යත්, ඔහු කළ ඉතා සුළු කටයුත්තක් පවා කෙරුණේ, කිසිවක් සොයාගැනීමට හැකි වන ප්‍රායෝගික ආකාරයකටයි.

"ඔබට මොනවාද මහත්මයා මේ ගැන හිතෙන්නේ?" ලෙස්ට්‍රේඩ් ග්‍රෙග්සන් දෙදෙනාම ඇසූහ.

"ඔබට උදවු කරන්න කියලා මං මේ කාරණාවට මැදිහත් වුණොත් වෙන්නේ මොකක්ද දන්නවද? මේක සාර්ථකව විසඳීමෙන් ඔබට හිමිවන ගෞරවය මං උදුරා ගන්න වෙනවා. හෝම්ස් කීය.

"ඔබ දෙදෙනා දැනටමත් පරීක්ෂණ කටයුතු සාර්ථකව කරගෙන යනවා නොවැ. එහෙම එකේ තවත් කෙනෙක් මේකට අත දාන එක වස වැරැද්දක්."

හෝම්ස්ගේ කටහඬේ යම්කිසි උපහාසයක් ගැබ් වී ඇද්දයි මට සිතිණ.

http://sherlockholmesinvestigations.blogspot.com

"පරීක්ෂණය ඉදිරියට කරගෙන යද්දී ලැබෙන සාර්ථක ප්‍රතිඵල මටත් කියන්න. එතකොට මටත් පුළුවන් බොහොම සන්තෝෂයෙන් ඔබට උදව්වක් කරන්න.......ඒක නෙවෙයි ලෙස්ට්‍රේඩ්. මළසිරුර සොයාගතිපු පොලිස් භටයා ඉන්නවාද? මං කැමතියි ඔහුට ටිකක් කතාකරන්න. ඔහු රාජකාරි අවසන් කරලා ගෙදර ගිහින්ද? එහෙනම් ඔහුගේ නමයි ලිපිනයයි මට දෙන්න."

ලෙස්ට්‍රේඩ් තම සටහන් පොත පරීක්ෂා කොට, එම ලිපිනය කියවූයේය.

"ජෝන් රාන්ස්, 46 ඕඩ්ලි කෝට්, කෙනිංටන් පාක් ගේට්."

හෝම්ස් එය සටහන් කර ගත්තේය.

"එහෙනම් අපි යමු දොස්තර මහත්තයා." මගේ මිත්‍රයා කීය.

"අපි ගිහින් ඔහුව හමුවෙලා එන්නම්. ඔබට පරීක්ෂණයේදී සමහර විට ප්‍රයෝජනවත් විය හැකි කරුණක් දෙකක් මං කියන්නම්. හෝම්ස් කීවේ රහස්පරීක්ෂකයන් දෙදෙනා වෙත හැරෙමිනි.

"මේක මිනීමැරුමක්. මිනීමරුවා පිරිමියෙක්. ඔහු අඩි හයකට වඩා උස මිනිහෙක්. තරුණ විය පහුකරලා, මැදි වියට එළඹෙමින් සිටින කෙනෙක්. ඒ වුණත්, ශක්තිසම්පන්න හැඩිදැඩි පුද්ගලයෙක්. උස ඒ වගේ වුණත්, ඔහුගේ දෙපතුල් කුඩා ඒවා. පැළැඳ සිටි පාවහන් බොහෝම රළු ආකාරයක බූට්ස් සපත්තු. ඒවායේ ඉස්සරහ කොටස රවුම් නොවෙයි, හතරැස්. ඔහු දුම්පානය කරන්නෙක්. ඊයේ රෑ උරල තියෙන්නේ ත්‍රිචිනොපොලි සුරුට්ටුවක්. ඔහු මේ මියගිය තැනැත්තා සමග මෙතැනට ඇවිත් තියෙන්නේ, රෝද හතරේ කුලීරියක. මේ කරත්තය ඇදගෙන ආ අශ්වයාගේ ලාඩම්වලින් තුනක් පරණයි. එකක් අලුත්. ඒ ඉදිරි කකුලක ලාඩමක්. බොහෝ වෙලාවට ඔහුට ඇත්තේ තද රතු පැහැති, හැඩිම ප්‍රභාශ වෙන මුහුණක්. ඔහුගේ දකුණු අතේ නියපොතු නම් සෑහෙන්න දිගයි. මං මේ කිව් හෝඩුවාවන් නම් බොහොම ටිකයි. නමුත් ඒවා ඔබට ප්‍රයෝජනවත් වෙන්න ඉඩ තියෙනවා.

ලෙස්ට්‍රේඩ් හා ග්‍රෙග්සන් එකිනෙකා දෙස බලා සිනාසුණහ. ඒ සිනාවල ගැබ්ව තිබුණේ, හෝම්ස් කියූ කිසිවක් ගැන කිසිදු විශ්වාසයක් නොමැති බව හඟවන සාවඥ බවකි.

"මේ මිනිහව මරාදමල තියල නේද ඔබ කියන්නේ ? ඔහුව මරල තියෙන්නේ කොහොමද? ලෙස්ට්‍රේඩ් ඇසීය.

http://sherlockholmesinvestigations.blogspot.com

"උග්‍ර විෂ වර්ගයකින්" කී හෝම්ස් නිවසින් පිටව යාමට පියවර කිහිපයක් ඉදිරියට තැබුවේය. ඔහු යළිත් ආපසු හැරුණේ ලෙස්ට්‍රේඩ්ට තවත් යමක් කීමටයි.

"ලෙස්ට්‍රේඩ් තවත් එක කාරණයක් තියෙනවා. RACHE කියන්නේ ජර්මන් වචනයක්. එහි තේරුම පළිගැනීම කියන එක. ඒ නිසා රේචල් කියන නම තියෙන තරුණ ගැහැනු ළමයෙක් හොය හොයා ඔබේ කාලය නාස්ති කරගන්න එපා."

හෝම්ස් එසේ කියද්දී, පුළුම්යට පත් පොලිස් නිලධරයන් දෙදෙනාගේ කටවල් ඔරොගෙට ඇරිණි.

Reading Purpose Only. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

# 4

# ජෝන් රාන්ස්ගේ ප්‍රකාශය

ලෝරිස්ටන් උයනේ අංක 3 දරණ නිවසෙන් අප පිටත්ව එද්දී දහවල් එක පමණ වී තිබිණි. හෝම්ස් මා සමග ගියේ ළඟම තිබූ විදුලිපණිවුඩ කාර්යාලය වෙතයි. එහිදී ඔහු ඉතා දිගු විදුලිපුවතක් යැව්වේය. අනතුරුව කුලීරියක් නවතාගත් ඔහු, ලෙස්ට්‍රේඩ් දුන් ලිපිනය වෙත අප කැඳවාගෙන යන මෙන් රියදුරාට දැනුම් දුන්නේය.

"සිද්ධිය තමන්ගේම දෑස්වලින් දුටු කෙනෙකුගේ සාක්ෂිය ඉතාමත් වටිනවා." මගේ මිත්‍රයා කීය. "ඒ වුණත් මං ඔබට කරුණක් කියන්නම් මිත්‍රයා. මේ සිද්ධිය වූ ආකාරය ගැන මට පැහැදිලි වැටහීමක් ලැබුණා. මා දැනටමත් තීරණයකට පැමිණ අවසන්. ඒ කෙසේ වෙතත් මං කැමතියි තවත් දැනගත හැකි අමතර කාරණා තියෙනවා නම් දැන ගන්න."

"ඔබේ කතාවෙන් මං හරිම පුදුමයට පත් වුණා." මම කීවෙමි. "ඔබ අර දෙන්නාට කිව් කාරණා, හරියටම නිවැරදි ඒවා කියලා ඔබට හොඳටම විශ්වාසද?"

"ඒ කරුණු වල කිසිම වැරැද්දක් වෙන්න ඉඩක් නෑ." ඔහු කීය. අපි එතැනට ළඟාවෙද්දී මට දකින්නට ලැබුණු පළමුවෙනිම දේ තමා, පදික වේදිකාවට තුදුරින්ම තිබූ රෝද සලකුණු දෙක. ඒක රෝද හතරේ කුලීරියකින් ඇතිවූ සලකුණු. පහුගිය සතියක කාලයක් ලන්ඩන් නගරයට වැස්සක් තිබුණෙ නැහැ. ඊයේ රෑ තමා වැස්සේ . ඒ කියන්නේ පොළොවේ ඒ තරම් ගැඹුරට ඇති වූ සලකුණු, ඊයේ රෑ සිදුවූ ඒවා විය යුතුයි. ඊළඟට අශ්වයාගේ කුර සලකුණු මට දකින්නට ලැබුණා. එක් අශ්ව ලාඩමක ලකුණු හොඳට පැහැදිලියි. අනෙක් තුන එතරම් පැහැදිලි නෑ. මේ කුලී රිය ඇවිත් තියෙන්නේ

http://sherlockholmesinvestigations.blogspot.com

ඊයේ රෑ වැස්සෙන් පස්සේ. ඒක එදා පාන්දරම ඇවිල්ලත් නෑ. ඇයි ග්‍රෙග්සන් ඒ ගැන අපට සහතික වුණා නේ. එහෙම නම් කුලීරිය ඇවිත් තියෙන්නේ ඊයේ රෑ. ඒ පුද්ගලයින් දෙදෙනා නිවසට ගෙනැවිත් තියෙන්නේ ඒ කුලීරියෙන්.

"හොඳයි. ඒක සරලයි කියමුකෝ. නමුත් මිනීමරුවාගේ උස ගැන ඔබ කිව්වෙ කොහොමද?"

අවස්ථා දහයක් ගත්තොත්, එයින් නවයකදීම කෙනෙකුගේ උස නිවැරදිව ලබාගත හැකි ක්‍රමයක් තියෙනවා. ඒ තමයි ඔහුගේ අඩි සටහන් දෙකක් අතර පරතරය මැනීම. ඒ කියන්නේ ඔහුගේ පියවරක දිග මැන ගැනීම. ඒක ලබාගත්තාම ඔහුගේ උස බොහෝ පහසුවෙන් ගණනය කරන්න පුළුවනි. මේ මිනීමරුවාගේ පා සටහන් නිවස ඇතුළත දූවිලි මතත්, එළියේ මඩ සහිත පොළොවෙත් මට දකින්න ලැබුණා. ඒ අනුව මා කළ ගණනය කිරීම වඩාත් තහවුරු කරගන්න මට ඉඩක් ලැබුණා. මිනිහෙක් බිත්තියක් වගේ තැනක යමක් ලියද්දී, ඔහු එය ලියන්නේ තමන්ගේ ඇස් මට්ටමට ටිකක් ඉහළින්. ඒ නිසා ඔහුගේ උස නිගමනය කිරීම, පොඩි ළමයෙකුට වුණත් කරන්න පුළුවන් තරම් පහසුයි."

"හොඳයි ඔබ කොහොමද ඔහුගේ වයස කිව්වේ?"

"ඒ මිදුලේ වැස්සට වතුර එකතුවුණු මඩ වළක් තිබුණා. ඒකේ පළල අඩි හතරහමාරයි. ඇහැට දනෙන්නේ නැතිව අඩි හතරක් පනින්න පුළුවන් කෙනෙක්, බොහොම වයස්ගත වූ කෙනෙක්වත් පාණ්ඩු රෝගයෙන් දුර්වල වූ කෙනෙක්වත් නොවෙයි. සම් අඩිය සහිත වටිනා සපත්තු කුට්ටමක් පැළඳ සිටි පුද්ගලයා, ඇවිද ගිහින් තිබුණේ වතුර වළට පිටින්. නමුත් ඉදිරිය හතරැස් බූට්ස් සපත්තු, වළ උඩින් පැන ගිහින් තිබුණා. මං මේ කරන්නේ එදා මං ලියූ ලිපියේ අඩංගු උපදෙස් ක්‍රියාවට නැංවීම. නිරීක්ෂණය හා එමගින් නිගමනයට පැමිණීම ගැන මං ලියා තිබුණා ඔබට මතක ඇති. වෙන මොනවද තේරුම් ගන්න අමාරු?"

"දිග නියපොතු ගැන ඔබ කිව්ව දේ. ඊළඟට ට්‍රිචිනෝපොලී සුරුට්ටුවක් ඉරූ බව. ඔබ කොහොමද ඒ දේවල් දනගත්තේ?"

"බිත්තියේ අර වචනය ලියා තිබුණේ, මිනිහෙක් ඔහුගේ ඇඟිල්ලේ ලේ තවරා ගැනීමෙන් . මගේ උත්තල කාචයෙන් මට පෙනුණා, අර

http://sherlockholmesinvestigations.blogspot.com

විධියට ඇඟිල්ලෙන් ලියද්දී, බිත්තිය කපරාරු කිරීමට යොදා ගත් හුණු තට්ටුව යන්තමින් සීරී ඇති බව. ඔහුගේ ඇඟිල්ලේ නියපොතු හොඳින් කපා තිබුණා නම් මෙහෙම දෙයක් සිදුවෙන්නේ නැහැ. ඊළඟට මට හැකිවුණා බිම එකතු වී තිබුණු අළු ස්වල්පයක් එකතුකර ගැනීමට. එහි වර්ණය හුඟක්ම අඳුරුයි. ඒ වගේම එය තිබුණේ පතුරු වශයෙන්. ඒ විධියට අළු සෑදෙන සුරුට්ටු වර්ගය, ට්‍රිචිනෝපොලී සුරුට්ටු පමණයි.

මං සිගරට් සුරුට්ටු අළු ගැන විශේෂ අධ්‍යයනයක් කරල තියෙනවා වොට්සන්. ඇත්තම කියනවා නම්, මං ඒ පිළිබඳව පොත්පිංචක් ලියා තිබෙනවා. මට බොහොම සන්තෝෂයෙන් ඔබට කියන්න පුළුවනි, ඕනෑම සුරුට්ටු හෝ දුම්කොළ වර්ගයක අළු පරීක්ෂා කරලා, එය අයිති දුම්වැටි වර්ගය මට හඳුනාගැනීමට හැකි බව. ඔන්න ඔය වගේ විද්‍යානුකූල කාරණා ගැන අවබෝධයක් ලබාගැනීමෙන් තමා, ග්‍රෙග්සන්ල ලෙස්ට්‍රේඩ්ලට වඩා වෙනස් විධියේ අපරාධ පරීක්ෂකයන් බිහිවන්නේ."

"ඊළඟට ඔහුගේ රතු පැහැති මුහුණ.?"

"ඒක නම් නිරීක්ෂණවලින් කළ නිගමනයක් නෙමෙයි. ඒ වුණත් ඒක නිවැරදි බවට මගේ හිතේ සැකයක් නෑ. මේ වෙලාවේ ඒ ගැන වැඩිදුරට අහන්න එපා."

"මේ අපරාධය ගැන හිතන්න, හිතන්න ඒකෙ අභිරහස් බව වැඩිවෙනවා. මගේ හිස කරකැවෙන්න පටන් ගන්නවා." මා කීවේ මගේ නළල් තලය අතගාමිනි.

"මේ වගේ මිනිස්සු දෙදෙනෙක් මෙවැනි පාළු ගේකට ඇතුළු වුණේ කොහොමද? එතැන දෙදෙනෙක් හිටියා නම්." මම කීවෙමි. ඊළඟට ඔවුන් දෙදෙනා මෙතැනට කැඳවාගෙන ආව කුලීරථ රියදුරාට මොකද වුණේ? එක මිනිහෙක් කොහොමද විෂක් ගිල දමන්න කියලා තවත් මිනිහෙකුට බලකරන්නේ? මෙහෙම බිත්තියේ ලියන්න, ඔහුට ලේ ලැබුණේ කොහොමද? මියගිය තැනැත්තාගේ ධනය මංකොල්ල කා නොමැති බව පැහැදිලියි. එහෙම නම් මිනීමරුවා මෙවැනි දෙයක් කළේ මොන අරමුණකින්ද? ගැහැනියකගේ මුද්දක් මෙතැනට ආවේ කොහොමද? ඒ ඔක්කොටම වඩා, අනික් මිනිහා මෙතැනින් යන්න කලින් RACHE කියලා ජර්මන් භාෂාවෙන් ලියුවේ ඇයි ? මේ කාරණා කිසි දෙයක් එකට සම්බන්ධ කරන්න

http://sherlockholmesinvestigations.blogspot.com

හෝ ගළපන්න පුළුවන් ආකාරයක් මට නම් පෙනෙන්න නැහැ. ඇත්තමයි."

මගේ මිතුරා සිතාපුණේ මා කී දේ අනුමත කරන අයුරිනි.

"මෙතැන තියෙන ගැටලු සහගත තැන් හැම එකක්ම, ඔබ හොඳින් එකතු කරලා, සැකෙවින් දක්වූවා." ඔහු කීය.

"මෙහි ඇති ප්‍රධාන අභිරහස ගැන මගේ හිතෙන් විසඳුමකට ආවත්, තවමත් නොපැහැදිලි තැන් රාශියක් තිබෙනවා. අසරණ ලෙස්ට්‍රේඩ් කළ සොයාගැනීම ගැන නම් කියන්න තියෙන්නේ මේ විකයි. මේක සමාජවාදය හා රහස් සංවිධාන සම්බන්ධව කළ මිනීමැරුමක් බව හඟවලා, පොලීසිය නොමග යවන්න කළ උත්සාහයක්. මේක ලියල තියෙන්නේ ජර්මන් ජාතිකයෙක් නෙමෙයි. A අකුරේ නම් යම් පමණකට ජර්මන් ලක්ෂණ තිබෙනවා. නමුත් අනෙක් අකුරුවල ජර්මන් ජාතිකයන් යොදා ගන්නා ගොතික් අක්ෂර සම්ප්‍රදාය නැහැ. තිබෙන්නේ ලතින් අක්ෂර පිළිවෙළ. නියම ජර්මන් ජාතිකයෙක් නම්, ගොතික් ක්‍රමයට තිබිය යුතුමයි. ඒ හින්දා අපට භය නැතුව කියන්න පුළුවනි, මේක කරල තිබෙන්නේ ජර්මන් ජාතිකයෙකු විසින් නොවන බව. එවැන්නක් අනුකරණය කරන්න තැත් කළ, නමුත් ඒ කටයුත්තේ අදක්ෂ පුද්ගලයෙකු විසින් බව. ඔහුගේ අරමුණ වුණේ පරීක්ෂණය වැරදි මඟකට යොමු කිරීමයි.

ඉතින් දොස්තර මහත්මයා මං මේ පරීක්ෂණය ගැන ඔබට දිගින් දිගටම කරුණු පැහැදිලි කර දෙන්න යන්නේ නැහැ. ඒ මොකද ඉන්ද්‍රජාලියෙක් තමන් කළ ඒ අද්භූත දේවල්, කළේ කොහොමද කියල හෙළිදරව් කරල දුන්නම, ඔහුට ලැබෙන ගෞරවයක් නැහැ. මගේ වැඩකටයුතුත් ඒ වගෙයි. එතකොට ඔබ අන්තිමට කියාවි, මමත් බොහොම සාමාන්‍ය රහස් පරීක්ෂකයෙක් පමණයි කියලා.

"මං කවදාවත් එහෙම කියන්නේ නැහැ." මම කීවෙමි.

"ඔබ අපරාධ පරීක්ෂණය, විද්‍යානුකූල ශාස්ත්‍රයක් බවට පත් කරලයි තියෙන්නේ. මේ ලෝකේ එය කවදා හරි විද්‍යාවක් බවට පත් වේවි. ඒක එම තත්ත්වයට පත්කිරීමේ ගෞරවය හිමිවන්නේ ඔබට බවට සැකයක් නැහැ."

http://sherlockholmesinvestigations.blogspot.com

මා පැවසූ වදන්වලින් මගේ මිතුරයාගේ මුහුණ රතු විය. මා එය කියූ අවංක අයුරින් ඔහු අපමණ සන්තෝෂයට පත් වූවා නිසැකය. තරුණ ළඳක් ඇගේ රූපශෝභාව ගැන කරන වර්ණනාවකට දක්වන්නේ දැඩි සංවේදී බවකි. මගේ මිත්‍රයා ද, රහස් පරීක්ෂණ වෘත්තියේ ඔහු දක්වන දක්ෂතා ගැන කරන වර්ණනාවලට දක්වන්නේ ද මෙවැනිම සංවේදී බවකි.

"මං ඔබට තවත් කාරණයක් කියන්නම්" හෝම්ස් කීය. "වටිනා සමින් කළ සපත්තු හා රළු බූට් සපත්තු ඒ ගෙදරට ආවේ එකම කුලීරියක, බොහොම මිත්‍රශීලීව, බොහොම වෙලාවට දෙන්න එකිනෙකාගේ අත්වලින් අල්ලාගෙන. නමුත් ගෙට ඇතුළු වුණාට පස්සේ ඔවුන් ඉහළ පහළ ඇවිද්දා. හරියටම කියනවා නම් වටිනා සපත්තුකාරයා එක තැන හිටගෙන ඉද්දී, රළු බූට් සපත්තු කාරයා ඉහළ පහළ ඇවිද්දා. එහි පොළොවේ එකතු වී තිබුණු දූවිලි තට්ටුව මත සලකුණුවලින්, ඒ දේ මට නිවැරදිව හඳුනාගැනීමට හැකිවුණා. ඔහු ඇවිදින්න, ඇවිදින්න, බොහොම ආවේගශීලී වුණා. ඒක මං තේරුම් ගත්තේ කොහොමද? ඔහු මුලින් තැබූ පියවර වලට වඩා, පසුව තැබූ පියවර දිගින් වැඩියි. ඔහොම කථාකරමින් දිගටම ඉහළ පහළ යද්දී, ඔහු අන්තිම හරියේදී ක්‍රෝධියට පත්වුණා. ඊට පස්සේ තමයි මේ ඛේදවාචකය සිදුවුණේ. මට දැනගැනීමට ලැබුණු හැම දෙයක්ම මං ඔබට කියල අවසන්. ඉතිරි හැම දෙයක්ම, ලැබී ඇති කරුණු අනුව කළ නිගමනයන් පමණයි. කොහොම වුණත්, පරීක්ෂණය පටන්ගන්න අපට අත්තිවාරමක් තිබෙනවා. අපි ඉක්මන් කළ යුතුයි. ඒ මොකද මං අද යන්න ඕනෙ හැලේගේ සංගීත ප්‍රසංගයට. අද හවස විල්මා නෝර්මන් නෙරූඩාගේ සංගීත වාදනයක් තිබෙනවා. මං හරිම කැමැතියි ඇගේ සංගීතයට සවන් දෙන්න.

මෙම සංවාදය පැවැතියේ අප දෙදෙනා කුලීරියෙන් ගමන් කරමින් සිටියදීය. ලන්ඩනයේ ඉතාම පටු මාවත් හා අතුරු පාරවල් දිගේ ඇදී ගිය කුලීරිය, එක්වරම නැවතිණි.

"මහත්මයා. ඕඩ්ලි කෝට් කියන්නේ අන්න අර හරිය. රියදුරා පැවසුවේ රථය ගෙනයාමට අපහසු, ඉතාම පටු පාරකට අත දිගු කරමිනි. ඔබ ආපසු එනතුරු මං රැඳී ඉන්නම්."

http://sherlockholmesinvestigations.blogspot.com

ඕඩ්ලි කෝට් යනු එතරම් චිත්තාකර්ශනීය පෙදෙසක් නොවේ. දුර්වර්ණ වූ රෙදි සහිත රෙදිවැල් යටින් රිංගා, පාරේ ගැවසුණු අපිරිසිදු කුඩා ළමයින් අතරින් අපි ඉදිරියට ගියෙමු. මඳ දුරක් යද්දී අංක 46 දරන නිවස අපට දකගන්නට ලැබිණි. එහි දොරේ, රාන්ස් යන නම සටහන් කර තිබූ පිත්තල තහඩු කැබැල්ලක් විය. පොලිස්භටයා තවමත් නිදි බව අපට අසන්නට ලැබිණ. ඔහු එනතුරු කුඩා ඉස්තෝප්පුවේ අපි රැඳී සිටියෙමු. ඔහුගේ නින්දට බාධාකිරීම ගැන ඔහු මදක් කෝපයට පත්විය.

"කියන්න තිබුණු හැම දෙයක්ම, මං අපේ කාර්යාලයට ලියා දුන්නු වාර්තාවේ සඳහන් කළා."

හෝම්ස් සාක්කුවෙන් පවුම් භාගයේ කාසියක් අතට ගත්තේය.

"ඒ කථාව ඔබේ කටින්ම අහගත්තොත් වඩා හොඳයි කියලා අපට හිතුණා."

හෝම්ස් කීවේ රන්කාසිය අතින් අතට මාරු කරමිනි.

"හොඳයි මහත්මයා. මට පුළුවන් හැම දෙයක්ම මං බොහොම සතුටින් කියන්නම්". පොලිස් භටයා කීවේ රන්කාසිය දෙස බැලුම් හෙළමිනි.

"හැම දෙයක්ම ඔබට දකින්න ලැබුණු පිළිවෙළටම අපට කියන්න."

රළු සෝපාවේ හිඳගත් රාන්ස්, නළල රැළි ගන්වමින් කල්පනා කළේය. කථාන්තරයේ කිසිම දෙයක් මගහැරී නොයන ලෙස මතකකරගත යුතු යයි ඔහුට හිතෙන්නට ඇත.

"මං එහෙනම් මුල ඉඳලම කියන්නම්. මගේ රාජකාරී වෙලාව රෑ දහයෙ ඉඳල, උදේ හය වෙන තුරු. රෑ එකොළහට විතර වයිට්හාට් තැබැරුම ගාව සණ්ඩුවක් වුණා. ඒ ඇරුණම රාජකාරී වෙලාවේ වෙන කිසිම අමුතු දෙයක් සිදුවුණේ නැහැ."

රෑ එකට විතර වැස්ස පටන්ගත්තා. හොලන්ඩ් ග්‍රෝව් පෙදෙසේ මුර සංචාරයේ යෙදෙන්නේ හැරී මර්චර් නම් පොලිස්භටයා. හෙන්රියටා වීථියේ කෙළවරේ, අපි දෙන්නා ටිකක් වෙලා කතාබහ කරමින් හිටියා. ඊට පස්සේ රෑ දෙකට විතර, නැත්නම් ඊට ටිකකට පස්සේ මට හිතුණා, තවත් සැරයක් ඇවිදලා බලන්න. මං යන්න හිතුවේ බ්‍රික්ස්ටන් පාර පැත්තට. වැස්සෙන් මඩ වෙලා ඒ පැත්ත

http://sherlockholmesinvestigations.blogspot.com

හරිම අපිරිසිදුයි. ඒ විගේම පාළුයි. මං ඒ පැත්තට ඇවිදගෙන ගියා. එක මනුස්සයෙක්වත් මට ඉස්සරහට හම්බවුණේ නැහැ. හැබැයි කුලීරියක් නැත්නම් දෙකක් මාව පහුකරලා ගියා. මං නිකං කල්පනා කර කර ගියේ, මේ වෙලාවේ අපි දෙන්නට ඇඟ රත්කරගන්න, ජින් අඩියක් දෙකක් තිබුණා නම් කොච්චර අපූරුද කියලා.

ඔහොම යද්දී එක පැරේඩ් අර අංගදරක ජනේලයකින් මට එළියක් පෙනුණා. ඒකෙන් මම හරිම පුදුමයකට පත්වුණා. ඒ මොකද මං දනගෙන හිටියා, ලෝරිස්ටන් උයනේ මේ ගෙවල් දෙකක්ම හිස් වෙලා වහල තියෙන බව. ඒ මොකද, ඒ ගෙවල් අයිතිකාරයා උනන්දු වුණේ නැතිලු, එකාගේ අවහිර වෙලා තිබුණු කසළ කාණු පද්ධතිය ශුද්ධ කරවා ගන්න. ඒ නිසා වෙන්න ඇති, ඔයින් එක ගේක ඉඳපු මනුස්සයෙක් උණසන්නිපාතය හැදිලා මළාලු. ඒ හින්දා මේ පාළු ගෙයි මහ රෑ එළියක් දුටුව ගමන්, මාව උඩ විසිවුණා. මොකක් හරි වැරැදි වැඩක් සිද්ද වෙන බවට මගේ හිතේ සැකයක් ඇතිවුණා. මං ඉදිරි දොර ළඟට ගියා විතරයි.........''

''.......... ඔබ ඒ ගේ දෙසට ඇවිදගෙන ගිය ගමන නවත්වලා, ආපහු ගේට්ටුව ළඟට ඇවිද ගෙන ආවා. එහෙම නේද?'' මගේ මිත්‍රයා කථාවට අවහිර කළේය.''ඔබ එහෙම කළේ ඇයි?''

රාන්ස් එක්වරම තිගැස්සුණේය. ඔහු දෑස් විශාල කරගෙන හෝම්ස් දෙස බලාසිටියේ මවිතයට පත් වූ අයුරිනි.

''හැබෑ නෝන්නම් මහත්මයා. ඒක හරියටම හරි. ඒක ඔබ දනගත්තේ කොහොමද කියලා 'දෙයියෝ තමයි දන්නේ. මං ගේ ළඟටම ගිහින්, ගේ ඇතුළ දිහා බැලුවහම ගේ ඇතුළ පාළුයි. කිසිම ශබ්දයක් නැහැ. මට නිකමට හිතුණා මගේ තනියට තව කවුරු හරි හිටිය නම් හොඳයි කියලා. මං යක්කුටවත් බය ඇති මිනිහෙක් නෙමෙයි මහත්තයා............ඒ වුණත් ........ඒ වුණත් මට හිතුණා අර උණසන්නිපාතය හැදිල මැරිච්ච මිනිහගේ අවතාරේ ඇවිත්ද කියලා. එයා මැරුණේ කොහොමද කියලා කරුණු සෝදිසි කරලා, බලන්න ඒ මිනිහගේ අවතාරය ඇවිත් වෙන්න ඇති කියලා මට හිතුණා. එහෙම හිතුණාම මගේ හිතේ පොඩි තිගැස්මක් ඇතිවුණා. ඉතින් මං ආපහු ගේට්ටුව ළඟට ගිහින් බැලුවේ, මර්චර්ගේ ලන්තෑරුමේ එළිය පෙනෙන්න තිබෙනවද, ඔහු පෙනෙන තෙක්

http://sherlockholmesinvestigations.blogspot.com

මිනිහෙක්ද කියලා. ඒ වුණාට ඔහුව පෙනුණේ නෑ. පෙනෙන මානෙක වෙන කවුරුත් හිටියෙත් නෑ."

"පාරේ වත් කවුරුත් හිටියෙ නැද්ද?"

"කිසිම පරාණියෙක් හිටියේ නැහැ මහත්තයෝ. බල්ලෙක්වත් හිටියෙ නෑ. ඉතින් මං හිතට ටිකක් ධෛර්යය අරගෙන, ආයෙමත් ඒ ගෙයි දොර ළඟට ගියා. ගිහින් දොරට තල්ලු කළා. දොර ඇරුණා. ගේ ඇතුළ බොහොම නිශ්ශබ්දයි. කිසිම හැල හොල්මනක් නෑ. ඊළඟට මම ගියා අර එළියක් දල්වෙනවා පෙනුණු කාමරයට. ගිනි උදුන් පඩිය මත රතුපාට ඉටිපන්දමක් දල්වලා තිබුණා. ඒකෙ එළියෙන් මට දකින්න ලැබුණා......."

"........ඔව්. මං දන්නවා ඔබට දකින්න ලැබුණු හැමදෙයක් ගැනම. ඔබ කීප ඇරයක්ම කාමරයේ ඇතුළේ වටේට ඇවිද්දා. ඊළඟට ඔබ මළසිරුර ළඟ දණ ගහලා එය පරීක්ෂා කරල බැලුවා. ඊළඟට ඔබ ගේ ඇතුළෙන් ඇවිදගෙන, කුස්සිය ළඟට ගියා. ඒකෙ දොර අරින්න උත්සාහ කරල බැලුව. ඊට පස්සෙ.........."

"දෙයියන්ටම ඔප්පු වෙච්චාවේ! මේ හැම එකක්ම බලාගෙන මහත්තයා හැංගිලා හිටියේ කොහෙද? දැන් පෙනෙන හැටියට ඔබ දන්නවානෙ මෙතැන මට වඩා දේවල්." පුදුමෙන් නැගී සිටි රාන්ස්ට කෑ ගැසුණේ පුදුමයෙනි.

හඬනගා සිනාසුණු හෝම්ස් තම ආගන්තුක පත්‍රය පොලිස් භටයා වෙත දිගු කළේය. "දැන් ඉතින් මේ මිනීමැරුම ගැන මාව සිරභාරයට ගන්න හදන්න එපා." හෝම්ස් කීය. "මමත් අපරාධකාරයා සොයාගෙන යන දඩබල්ලෙක්. ඒ මිසක් ඔබ ලුහුබඳින අපරාධකාරයා නෙමෙයි. ග්‍රෙග්සන් සහ ලෙස්ට්‍රේඩ් ඒ ගැන ඔබට කියාවි. හොඳයි ඒකට කමක් නැහැ. ඉතින් ඊළඟට ඔබ මොකද කළේ?"

රාන්ස් යළිත් වරක් අසුනේ වාඩිවිය. එහෙත් විස්මයට පත් ලකුණු තවමත් ඔහුගේ මුහුණේ ඇඳී තිබිණි.

"මම ගේට්ටුව ළඟට ගිහින් මගේ පොලිස් නළාව පිඹියා. ඒ හඬ ඇහිලා මර්චර් සහ තවත් දෙදෙනෙක් එතැනට ආවා."

"ඒ වෙලාවේ වීථියේ වෙන කවුරුවත් හිටියේ නැද්ද?"

"ඔව්. එහෙමයි කියන්න පුළුවන්. මං කිව්වේ වැඩකට ඇති මිනිස්සු ගැන."

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only. Not For Print

"මොකක්ද ඔබ ඒයින් අදහස් කළේ?"

පොලිස් භටයාගේ මුහුණට සිනාවක් නැගිණ. "බීල වෙරිවුණු මිනිස්සු මගේ ජීවිත කාලය පුරාම මං දැකල තියෙනවා. ඒත් ඊයෙ රෑ දැකපු බේබද්ද වගේ එකෙක් මං කවදාවත් දැකල නෑ. මං ගේට්ටුව ළඟට යද්දි ඒ යකා එතැන හිටියා. බොහොම අමාරුවෙන් ගේට්ටුවේ එල්ලිලා හිටියෙ.

"තරු ලෙල දෙන අපෙ ධජයේ" කියා කියා ගිරිය පුප්පාගෙන, සිංදුවකුත් කියනවා වේරිමරගානේ. අපට උදව් කරන්න තියා, ඒ යකාට කෙළින් හිටගෙන ඉන්න පණක් තිබුණේ නෑ."

"ඔහු මොන වගේ කෙනෙක්ද?"

හෝම්ස් ඇසීය. මෙම අතුරු ප්‍රශ්නය නැගීම ජෝන් රාන්ස් නොරිස්සූ බව පෙනිණ.

"ඒ මිනිහ ඔය නිතරම දකින්න ලැබෙන බේබද්දෙක් නම් නොවෙයි. අපට වෙන වැඩ තිබුණු නිසා ඌ බේරුණා. නැත්නම් මං ඌව අල්ලාගෙන ඇවිත් පොලිස් කූඩුවේ දානවා."

"ඔහුගෙ මුහුණෙ හැටි, ඇඳගෙන හිටි ඇඳුම. ඒවා මොන වාගේද කියල ඔබ දුටුවේ නැද්ද?" හෝම්ස් ඇසුවේ නොඉවසිල්ලෙනි.

"මං යන්තමට වගේ දක්ක මට හිතෙන්නේ ..........ඒ මොකද ඒ යකා තව පොඩ්ඩෙන් බිම ඇදගෙන වැටෙනවා. මායි මර්චරුයි එකතුවෙලා, මිනිහව ගේට්ටු කණුවට හේත්තු කළා. රතුපාට මුහුණක් තිබුණු උස මිනිහෙක්. මුහුණේ පහළ කොටස නම් ආවරණය වෙලා තිබුණේ........"

"ඒ ඇති." හෝම්ස්ට කෑගැසිණ. "ඒ මිනිහ ඊළඟට මොකක්ද කළේ කියල ඔබ දුටුවද?"

"ඒ හාදයා ගැන බල බල ඉන්නවට වැඩිය අපට කරන්න වෙන වැඩ තිබුණා. මං ඕන ඔට්ටුවක් අල්ලන්නම් ඌ කොහොම හරි ගෙදර යන්න ඇති."

"මොකක්ද ඔහු හැඳගෙන සිටි ඇඳුම?"

"දුඹුරු පාට පිට කබායක්."

"අතේ කසයක් එහෙම තිබුණද?"

"කසයක් ?..................නෑ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක මනු මග දමල එන්න ඇති." හෝම්ස් කිය. "ඊට පස්සේ කුලීරියක් පිටත්වෙලා යනවා ඔබට දකින්න හෝ ඒකෙ සද්දෙ ඔබට අහන්න ලැබුණෙ නැද්ද?"

"නැහැ."

"මේ පවුම් බාගේ කාසිය ඔබටයි." මගේ මිතුරා කීවේ අසුනෙන් නැගිට තම හිස් වැස්ම අතට ගනිමිනි.

"මට කණගාටුයි රාන්ස් මේ දේ කියන්න. ඔබේ රැකියාවේ ඉහළට යන්න ඔබට අවස්ථාවක් ලැබේවි කියලා මම නම් හිතන්නේ නැහැ. ඔය ඔලුව කියන එක තියෙන්නේ ආභරණයක් හැටියට විතරක් නෙමෙයි. උවමනා වෙලාවලදී පාවිච්චි කරන්න, කල්පනා කරන්න. ඔබට සාජන්ට් තනතුරට උසස් වෙන්න අවස්ථාවක් ඊයේ රෑ ලැබුණා. ඔබේ ඔය අත් දෙකෙන් අල්ලා ගෙට්ටු කණුවට හේත්තු කළ මිනිහ තමා අපි හොයන්නේ. ඔහු තමා මේ අභිරහසට විසඳුම දන්නේ. දැන් ඉතින් ඒ ගැන වාද විවාද කරන්න වැඩක් නැහැ. මං ඔබට ආයෙමත් කියන්නම්. ඇත්ත ඒකයි. අපි යමු දොස්තර මහත්මයා යන්න."

රාන්ස් විමතියෙන් අප දෙස බලා සිටියදී, අපි කුලීරිය වෙත ගියෙමු.

"මහා මෝඩයෙක්." හෝම්ස් කීවේ අප ආපසු නිවසට එමින් සිටියදීය.

"හිතල බලන්න වොට්සන්. ඒ මිනිහට වාසනාව අතටම ලැබුණා. ඒත් ඒකෙන් නියම ප්‍රයෝජන ගත්තෙ නෑ."

"මට නම් තවමත් කිසිදෙයක් හරිහැටි තේරුම් ගන්න අමාරුයි හෝම්ස්. මේ අභිරහසට සම්බන්ධ අනෙක් පුද්ගලයා ගැන තොරතුරු වගයක් කලින් කිව්වානේ. ඒව නම් මේ කියන පුද්ගලයාට ගැළපෙන බව පෙනෙනවා. නමුත් ඔහු ඒ ගෙදරින් පිටවෙලා ගියා නම්, ආපසු ආවේ ඇයි? අපරාධකාරයෝ ඒ විදියට හැසිරෙන්නෙ නෑ?"

"අර මුද්ද! මනුස්සයෝ මුද්ද! ඔහු ආපසු ආවේ අර මුද්ද අරගෙන යන්න. මිනිහ අල්ල ගන්න වෙනත් විදියක් නොතිබුණොත්, අපටත් පුළුවනි මුද්ද ඇමක් හැටියට පාවිච්චි කරන්න. මං කොහොම හරි මිනිහව අල්ලගන්නවා දොස්තර මහත්තයා. ඔබ දාන එක පවුමට මං පවුම් දෙකක් ඔට්ටු අල්ලන්නම්. මං කොහොම හරි ඔහුව

http://sherlockholmesinvestigations.blogspot.com

අල්ල ගන්නවා. මේ පරීක්ෂණය ගැන මං ඔබට ස්තුති කළ යුතුයි. ඔබ නිසා නොවන්න, මං මේ සිද්ධිය ගැන බලන්න නොයන්නත් ඉඩ තිබුණා. මේ දක්වා මට කරන්න ඉඩ ලැබුණු හොඳම පරීක්ෂණය, මෙය විය හැකියි. මේක ලෝහිත පරීක්ෂණයක්? එහෙම කියන්න පුළුවන් නේද? අපිත් යොදා ගමු අන්න ඒ වගේ කලාත්මක නමක්. ජීවිතය කියන පැටළුණු අවර්ණ නූල්බෝලය තුළින් ගමන් කරන, ලෝහිත නූලක් නමැති මිනීමැරුම. ඒ පැටළුණු ගැටලුව විසඳීම අපට භාර රාජකාරියක්. ඒකේ සැඟවී තියෙන සෑම අඟලක්ම හෙළිකිරීම අපට භාරයි.

හොඳයි. දැන් ඉක්මන් වෙලා දවල් කෑම. ඊළඟට යන්න ඕනේ නෝමන් නෙරූඩාගේ සංගීත ප්‍රසංගයට සවන් දෙන්න. ඇයගේ සංගීත වාදන ඉතාම විශිෂ්ටයි. මොනතරම් අර ඇය ඉතාම රමණීය ලෙස වාදනය කරන, චොපැන්ගේ වාද බන්ධය?"

මුලල්ල ලාල ලා ලා ලලා
ලිරා ලිරා ලේ..........................

කුලිරියේ අසුන පිටුපසට හේත්තුවුණු අපරාධ පරීක්ෂකයා, කුරුල්ලෙකු මෙන් ගී ගායනයේ යෙදෙන්නට පටන් ගත්තේය. අතිශය දක්ෂ මිනිස් සිතකට ලබාගත හැකි විවිධ මුහුණුවර කොතෙක් ද? මම ඒ ගැන කල්පනා කරන්නට පටන් ගත්තෙමි.

http://sherlockholmesinvestigations.blogspot.com

# 5

# අපේ දැන්වීමට අමුත්තෙක් එයි

එදා උදේ වරුව පුරා අප යෙදුණේ දීර්ඝ පරීක්ෂණ කටයුත්තකයි. එය මගේ දුර්වල සිරුරට අහිතකර ලෙස බලපෑ නිසාදෝ, සවස් වෙද්දී මගේ ඇඟට මහත්සි ගතියක් දැනිණ. හෝම්ස් සංගීත ප්‍රසංගය සඳහා පිටත් වී ගිය පසු, මම සෝපාවේ වැතිර ටිකක් නිදාගැනීමට උත්සාහ කළෙමි. එහෙත් එය නිෂ්ඵල උත්සාහයක් විය. දකින්නට හා අසන්නට ලැබී තිබුණු දෙයින් මගේ සිත කැලැඹීමට පත් වී තිබිණ. නොයෙක් බහුවිධ අදහස් මගේ සිත තුළට රිංගා ඒමට පටන් ගත්තේය. නිදාගැනීමේ අරමුණෙන් මම දෑස වසා ගතිමි. එහෙත් සෑම මොහොතකම, මගේ සිතට මැවී පෙනුණේ, මියගොස් සිටි මිනිසාගේ වානරයෙකු වැනි විරූපී මුහුණයි. ඔහු පිළිබඳව මගේ සිතේ ඇතිව තිබූ පිළිකුල කොතරම් ද යත්, ඔහු මෙලොවින් තුරන් කළ මිනීමරුවා කෙරෙහි මගේ සිතේ ඇතිවූයේ කෘතඥතාවයකි. මා මෙතෙක් දැක තිබූ ඉතාම දුෂ්ට, කෲර, ලක්ෂණ මිනිස් මුහුණක දැක තිබුණා නම්, ඒ ක්ලීව්ලන්ඩ්හි එනොක් ජේ. ඩ්‍රෙබර්ගේය. ඒ කෙසේ වෙතත් අපරාධකරුවෙකුට නියමිත, සුදුසු දඬුවම් ලබාදිය යුතුයි. මරණයට පත්වූ තැනැත්තාගේ මුහුණේ තිබූ බිහිසුණුකම නිසා, මිනීමරුවාට නීතියෙන් ගැලවීමක් නැත.

මගේ මිත්‍රයාගේ මතය වූයේ විෂක් ශරීරගත වීම නිසා මරණය සිදුවී ඇති බවයි. මම මේ කරුණ ගැන දිගින් දිගටම කල්පනා කළෙමි. ඔහුගේ ඒ උපකල්පනය ඉතා ගැටලු සහගත එකක් බව එවිට මට පෙනී ගියේය. හෝම්ස් මළසිරුරේ තොල් අවට ප්‍රදේශයට නාසය ළං කොට, ආඝ්‍රාණය කර බැලූ හැටි මට

http://sherlockholmesinvestigations.blogspot.com

Readers Purpose Only Not For Print

සිහි විය. එසේ නම් විෂක් ගැන අදහසක් ඔහුගේ සිතට ඇතුළුවන්නට ඇත්තේ මේ වෙලාවේ බවට සැකයක් නැහැ. අනෙක් අතට විෂකින් නොවේ නම් මේ පුද්ගලයා මියගියේ කෙසේද? ඔහුගේ සිරුරේ තුවාල කිසිවක් නොතිබිණි. අනෙක ඔහුගේ හුස්ම හිරකළ බවට සලකුණුකුදු නොවීය. එසේ නම් බිම එකතු වී තිබුණු ලේ කාගේද? සැහෙන ගනකම් තට්ටුවක් ලෙසින් එතැනට ලේ එකතු වී තිබිණි. මෙහි පොර බැදීමක් ඇතිවූ බවට එක් සලකුණක්වත් නොවීය. ඔහුගේ සතුරාට තුවාල සිදුකිරීමට යොදාගත්තායයි සිතිය හැකි ආයුධයක්, මියගිය තැනැත්තා අසල නොතිබිණි.

මේ ප්‍රශ්නවලට සතුටුදායක විසඳුමක් ලැබෙන තුරු, නිදාගැනීම මට දුෂ්කර ක්‍රියාවක් වන බව පෙනිණි. මට පමණක් නොවේ. හෝම්ස්ට ද එය එලෙසම වනු නොඅනුමානය. එහෙත් ඔහුගේ සිතේ ඇත්තේ නැන්පත් බවකි. ආත්ම විශ්වාසයෙන් කථාකළ ආකාරයෙනුත් මට පෙනුණේ, මේ හැම ප්‍රශ්නයකටම ගැළපෙන සිද්ධාන්තයක්, ඔහු විසින් ගොඩනගා ඇති බවයි. එහෙත් එය කුමන ආකාරයේ එකක්දැයි, මට කිසිසේත් සිතා ගැනීමට නොහැකි විය.

හෝම්ස් ආපසු එනවිට මැදියම් රැයවත් ළං වී තිබිණි. එහෙත් සංගීත ප්‍රසංගය අවසන් වන්නට ඇත්තේ, මෙයට පැය කිහිපයකට කලින් විය යුතුය. ඔහු නිවසට ළඟාවෙද්දී රෑ කෑම පවා සූදානම්ව තිබිණි.

"ඒක හරිම විශිෂ්ට සංගීත ප්‍රසංගයක් වොට්සන්." ඔහු කීය. "ඔබට මතකද සංගීතය ගැන ඩාවින් කියල තිබුණු දේ? මනුෂ්‍යයාට කතාබස් කිරීමේ හැකියාව ලැබෙන්නත් කලින්ලු, සංගීත රසාස්වාදයට ඇති හැකියාව දියුණු වුණේ. බොහෝවෙලාවට ඒ නිසා වෙන්න ඇති අපි සංගීතයෙන් මේ තරම් මෝහනයට පත් වන්නේ. මේ මිහිතලය ළදරු අවදියේ පටන්, සංගීතය අපේ ආත්මය සමග මුසු වෙලා තියෙන්න ඇති."

"ඔබේ අදහස් බොහොම ගැඹුරුයි." මම කීවෙමි.

"සොබාදහමේ ගැඹුරු බව විග්‍රහ කරන්න නම් අපේ අදහසුත් ඒ වගේම ගැඹුරු විය යුතුයි." ඇයි මොකක්ද ඔබට ඇති වෙලා තියෙන ප්‍රශ්නේ? ඔබ බොහොම කැළැඹීමට පත්වෙලා වගෙයි මට

http://sherlockholmesinvestigations.blogspot.com

පෙනෙන්නේ. ඇයි මේ බ්‍රික්ස්ටන් පාරේ සිද්ධියෙන් ඔබේ හිතත් අවුල් වුණාද?"

"ඔබට ඇත්තම කියනවා නම් ඒක තමයි මට ඇති වෙලා තිබෙන ප්‍රශ්නෙ" මම කීවෙමි. ඇෆ්ගනිස්ථාන් යුද්ධයට සහභාගි වෙලා, මරණය ගැන මේ තරම් අත්දැකීම් ලබලත්, මං බොහොම සංවේදී වැඩියි. මගේ හිත මීට වඩා තද එකක් විය යුතුව තිබුණා. මයිවාන්ඩ් වලදී මගේ හමුදා මිත්‍රයින්ව, පෙති පෙති වලට කපන හැටි මගේ දෑස් වලින්ම දුටුවා. අත් මට ඒවා ඉවසා දරාගන්න පුළුවන් වුණා."

"මට තේරෙනවා මිත්‍රයා. මෙතැන් තියෙනවා අභිරහසක්. ඒකෙන් ඔබේ හිතේ කැලැඹීමක් ඇතිවෙලා. ඔබ නොයෙක් නොයෙක් දේ හිතන්න පටන් අරගෙන. සිත අවිනිශ්චිත භාවයට පත්වුණොමයි, සිතේ භය ඇතිවෙන්නේ, ඔබ දුටුවද අද හවස පුවත්පත?"

"නැ?"

"අප මැදිහත් වුණු සිද්ධිය ගැන සෑහෙන්න හොඳ විස්තරයක්, පත්තරේ තියෙනවා. අර මළසිරුර උඩව ඔසවද්දි, එතැන තිබී කාන්තාවකගේ මඟුල් මුද්ද බිමට වැටුණු බවක් පත්තරේ සඳහන් වෙන්නෙ නැහැ. එහෙම සඳහන් නොවුණු එක හොඳට ගියා."

"ඒ ඇයි?"

"මේ දැන්වීමත් කියවල බලන්න" ඔහු කීය.

"මම මේ දැන්වීම අද උදේ හැම පුවත්පතකටම යැව්වා."

ඔහු පුවත්පත මා වෙතට විසි කළේය." නැතිවීම් හා සම්භවීම්" තීරය යටතේ පළ වුණු පළමුවන යුහු දැන්වීම හෝම්ස් සඳහන් කළ එකයි. එහි මෙසේ සඳහන් විය.

"අද උදේ බ්‍රික්ස්ටන් පාරේ වයිට්හාට් තැබෑරුම හා හොලන්ඩ් ග්‍රෝව් පෙදෙස අතර පාරේ තිබී, රන්රන් මංගල මුද්දක් හමු වී ඇත. බේකර් වීථියේ, අංක 221 බී දරන ස්ථානයේ දොස්තර වොට්සන් වෙතින් අද රාත්‍රී 8ත් 9ත් අතර පැමිණියහොත්, අයිතිකරුවාට එය ලබාගත හැක."

"ඔබේ නම පාවිච්චි කළාට මට සමාවන්න." ඔහු කීය. "මගේ නම යෙදුවා නම්, මය උම්භර පිස්සෝ ඒක හඳුනා ගන්නවා. ඒසේ අතරමැදියා වෙන්න ඔබුන්ට මිතු වේවි."

http://sherlockholmesinvestigations.blogspot.com

"ආ ඒකට තමක් නෑ." මම කීවෙමි. නමුත් කවුරුවත් ඇවිත් ඉල්ලුවොත් දෙන්න මා ළඟ මුද්දක් නමයි තැත්තේ."

"නෑ නෑ.. මෙන්න එකක් තියෙනවා." ඔහු කීවේ මුද්දක් මගේ අතට දෙමිනි. "ඒක අර මුල් මුද්ද විධියටම තැනූ වෙනත් එකක්."

"මේ දන්වීමට කවුරු ඒවි කියලද ඔබ හිතන්නේ?" මම ඇසීමි.

"ඇයි අර දුඹුරු පාට පිටකබායක් අඳින, රතු මුහුණක් තිබෙන අපේ මිත්‍රයා. ඔහු එන්නේ නැත්නම්, කවුරු හරි උදව්කාරයෙක්වත් එවාවී."

"ඒක අවදානම් වැඩක් කියලා ඔහුට හිතෙන එකක් නැද්ද?"

"කොහොමටවත් නෑ. මේ පරීක්ෂණය ගැන මං තේරුම් අරගෙන තියෙන හැටි නිවැරදියි කියලා මං විශ්වාස කරනවා. එහෙම නම්, මොන අවදානමක් තිබුණත් ඒ මිනිහා මුද්ද අහිමිකරගන්න කැමති වෙන්නෙ නෑ. ඔහු අතින් මුද්ද ගිලිහෙන්න ඇත්තෙ, ඔහු ඩ්‍රෙබර්ගේ මළසිරුර උඩින් ඉදිරියට නැමෙද්දී. ඒ වෙලාවෙ ඒක වැටුණු බව ඔහුට තේරුණේ නැහැ.

ගෙයින් පිටවෙලා ටික දුරක් යද්දී තමයි ඔහුට තේරුණේ මුද්ද තමන් ළඟ නොමැති බව. ඔහු ඉක්මනටම ආපහු ආවා. නමුත් මොකක්ද ඔහුට දකින්න ලැබුණේ? පොලීසිය ඒ වෙනකොටත් ගෙට ඇතුළුවෙලා. ඒකත් ඔහුගේ වැරැද්ද නිසා. ඉටිපන්දම නිවල දාල යන්නෙ නැතිව, ඒක දල්වී තිබියදීම පිටවෙලා ගිය නිසා. ඒ නිසා ඔහු ගේට්ටුව ළඟට ආවා. ඔහු ගැන සැකයක් ඇති නොවන්න හොඳටම බීල වෙරිවුණු මිනිහෙක් විධියට රඟපෑවා. ඔහු සිටින තත්ත්වයට ඔබ පත්වුණිය කියලා හිතුන්න වොට්සන්.

තවදුරටත් කල්පනා කරද්දී ඔහුට හිතේවි, බාගවෙලාවට මුද්ද ඔහුගෙන් ගිලිහුණේ මහපාරේදී වෙන්න පුළුවන් කියලා. එහෙම වුණය නම් ඔහු මොකද කරන්නේ? එහෙනම් ඔහු ඉක්මනටම පත්තරවල නැතිවීම් සම්බවීම් තීරුය පරීක්ෂා කරනවා. ඒ මොකටද? කොටහරි අහම්බෙන් වත් මුද්ද හම්බවෙලාවත්ද බලන්න. මේ දන්වීම දක්ක ගමන් ඔහුගේ හිතේ ලොකු සතුටක් ඇතිවේවි. මෙතැන උගුලක් ඇති කියලා ඔහු මොකටද සැක හිතන්නේ? පාරේ තිබිල

http://sherlockholmesinvestigations.blogspot.com

කවුරු හරි ඇහිඳ ගනිපු මුද්ද, මිනීමැරුමකට සම්බන්ධ එකක් කියලා කාටහරි හිතෙන්නේ ඇයි ? ඔහු මුද්ද හොයා ගෙන එනවා, එනවාමයි. තව පැයක් ගතවෙන්න කලින් ඔබට ඔහු දකින්න ලැබේවි."

"ඊට පස්සෙ?" මම ඇසීමි.

"ආ.........ඔහු එක්ක කරන ගනුදෙනුව මං භාරගන්නම්. ඔබ ළඟ මොකක් හරි ආයුධයක් තියෙනවද?" ඔහු ඇසීය.

"මා ළඟ තියෙනවා හමුදාවෙන් ලැබුණු පරණ රිවෝල්වරය සහ පතොරොම් කිහිපයක්."

"රිවෝල්වරය පිරිසිදු කරලා, උණ්ඩ පුරවලා, සූදානම්ව තියාගන්න. ඒක වඩා හොඳයි මිත්‍රයා. සැකයක් නෑ ඔහු හරිම නොඉවසිලිමත් බවක් දක්වාවි. මං බලාපොරොත්තු වෙන්නේ ඔහුට නොතේරෙන්න ඔහුව අල්ලාගන්න. ඒ වුණත් ඕනෑම දේකට සූදානමින් ඉන්න එක වඩා හොඳයි."

මම නිදන කාමරයට ගොස්, මගේ රිවෝල්වරය ලාච්චුවෙන් එළියට ගෙන පිරිසිදු කළෙමි. එය රැගෙන මා විසිත්ත කාමරයට එද්දී හෝම්ස් රෑ කෑම ගෙන අවසන්ය. මේසය මත වූ භාජන පිඟන් ආදිය ඉවත්කොට තිබිණි.

හෝම්ස් වයලීනය අතට ගෙන, ඔහුට පුරුදු අයුරින් එහි තත් හඬ නංවමින් සිටියේය.

"ගැටලුව බොහොම දුරදිග යන හැඩයි." ඔහු කීය. මං ඇමරිකාවට යැවූ විදුලිපුවතට මේ දැන් පිළිතුරක් ලැබුණා. මේ සිද්ධිය ගැන මං හිතූ දේ හරි."

"මොකක්ද ඔබ හිතූ දේ?"

"මගේ වයලීනයට යොදල තියෙන්නේ අලුත් තත්. මේක ටිකක් වාදනය කරල තියෙන එක කොයි අතටත් හොඳයි." ඔහු කීය. "ඔබ රිවෝල්වරය සාක්කුවේ දමාගන්න. ඒ මිනිහ ආවම බොහොම සාමාන්‍ය පිළිවෙළට කතාබහ කරන්න. ඉතුරු හරිය මං බලා ගන්නම්. ඕනෙවට වඩා තියුණු විදිහට ඔහු දිහා බලන්න එපා."

"වෙලාව හරියටම අටයි."

මා කීවේ මගේ ඔරලෝසුව දෙස බලමිනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. මිනිත්තු කිහිපයක් යද්දී ඔහු මෙහෙ ඒවි. දොර බාගෙට ඇරල තියන්න.......... අන්න හරි..........ඔය ඇති. දොරේ යතුර ඇතුළු පැත්තේ යතුරු කටේ රඳවා තියන්න. හොඳයි. මට අමුතුම තාලේ පොතක් හමුවුණා වෙළඳහැලක තිබිලා. 1642 දී ලතින් භාෂාවෙන් ප්‍රකාශයට පත් කළ එකක්. ඒ කියන්නේ පළමුවෙනි චාල්ස් රජතුමා, ඝාතනය කරන්නත් කලින්.

"කවුද ඒක මුද්‍රණය කරලා තියෙන්නේ?"

"පිලිප් ඩී ක්‍රෝයි. පොතේ මුළු පිටුවේම අයිතිකාරයාගේ නම තීන්තෙන් ලියල තියෙනවා. දත් නම් දුර්වර්ණ වෙලා. නම විලියම් වයිට්. කවුද දන්නේ නෑ, මේ වයිට් .......... කවුරු හරි 17 වැනි සියවසේ ඉඳපු නීතිඥයෙක් වෙන්න ඇති. අත්අකුරුවල තියෙනවා නීතිඥයින් ලියන රටාව. ඔන්න අපේ මිනිහ එනවා වගෙයි!"

ඔහු එසේ කියද්දීම අපේ සීනුව හැඬවිණ. ශබ්දයක් නොනගා පුටුවෙන් නැගී සිටි හෝම්ස් දොර මැදසට ගියේය. සේවිකාව නිවසේ ඉදිරි දොර වෙත ගමන් කළ හඬ ද, අනතුරුව ඇය දොර විවෘත කරද්දී නැගුණු හඬ ද අපට අසන්නට ලැබිණ.

"දොස්තර වොට්සන් ඉන්නේ මේ ගෙදරද?" තරමක් රළු, එහෙත් පැහැදිලි කටහඬකින් අසන්නට ලැබිණි. සේවිකාවගේ පිළිතුරු අපට ඇසුණේ නැත.

ඊළඟට අපට ඇසුණේ දොර වසන ශබ්දය හා කිසිවෙකු තරප්පුව නැග උඩට එන ශබ්දයයි. එය එතරම් විශ්වාසයකින් උඩට පැමිණි කෙනෙකුගේ අඩි ශබ්දයක් නොවන බව මට හැඟිණ. මගේ මිත්‍රයාගේ මුහුණේ පළවූයේ විස්මයකි. අනතුරුව සෙමින් දොරට තට්ටු කළ හඬකි.

"ඇතුළට එන්න." මම උස් හඬින් කීවෙමි.

අප බලාපොරොත්තුව සිටි තිහිසුණු මිනිසා වෙනුවට, කොරගසමින් කාමරය ඇතුළට ආවේ දුර්වල, මහලු කාන්තාවකි.

කාමරයේ දීප්තිමත් ආලෝකය ඇගේ දෙනෙත් වලට අපහසු වූ අයුරක් දිස් විය. දෙනෙත් හකුළමින් ඉතා අපහසුවෙන් අප දෙස බලා සිටි ඇය, සාක්කුවට අත දමා යමක් සෙවීමට පටන්ගත්තාය. මම මගේ මිත්‍රයා දෙස බැලීමි. සවස පුවත්පත එළියට ගත් ඇය, දැන්වීම පෙන්වමින් අපට කථා කළාය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මෙන්න මේ දන්වීම් නිසයි මං මෙහෙ ආ වී. කරුණාවන්ත මහත්වරුනි. බ්‍රික්ස්ටන් පාරේ තිබුණු රත්රන් මුද්ද අයිති මගේ කෙල්ල සැලීට. දොළොස් මාසෙකට කලින් ඒකි කසාද බැන්දා. නැවක වැඩ කරන මිනිහෙක්. ඔය මිනිහා ගෙදර ඇවිත් බලන කොට කෙල්ල අතේ මුද්ද නැතිවුණොත් ........? ඒ මිනිහ ඒකිට මොනවා කරාවිද කියලා මට හිතාගන්නවත් බෑ. අනික් වෙලාවට නම් මිනිහ හොඳයි. ඒ වුණාට බිව්වාම අන්තිම දරුණුයි. ඒකි ඊයේ රෑ පිකැඩලියට ආවා..."

"මේකද ඇගේ මුද්ද?" මම ඇසීම්.

"දෙවියන්ට ස්තුති වේවා. මහලු ගැහැනිය උස් හඬින් කීවාය. අද රෑට කෙල්ලට සැනසිල්ලේ නිදාගන්න පුළුවන්. මේක තමයි මහත්තයෝ මුද්ද."

"ඔහේගේ ලිපිනය මොකක්ද?"

මම පැන්සල අතට ගනිමින් ඇසීම්.

නොම්මර 13, ඩන්කන් වීථිය, හවුන්ඩ්ස්ඩිච්. හරි ඈතක මහත්මයා.

"හවුන්ඩ්ස්ඩිච් ඉඳගෙන පිකැඩිලියට එද්දී, බ්‍රික්ස්ටන් පාර අහුවෙන්නේ නැහැනේ." ෂර්ලොක් හෝම්ස් එක්වරම කීය.

මැහැල්ල හෝම්ස් දෙස හැරී බැලුවාය.

"මේ මහත්තයා ඇහුවේ මගේ ලිපිනය නේ. මගේ දුව සැලී ඉන්නේ කුලී ගේක. නොම්මර 3, මේෆීල්ඩ් පෙදෙස, පෙක්හැම්.

"ඔබේ නම මොකක්ද?"

"මගේ නම සෝයර්. ඈගේ නම ඩෙනිස්. ඈගේ මිනිහගේ නම ටොම් ඩෙනිස්. මුහුදේ ඉන්න කුරු හොඳ ගුණයහපත් දක්ෂ ඉලන්දාරියා. ඔය සමාගමේ නෑ ඒ තරම් හොඳ නාවිකයෙක්. ඒත් ගොඩබිමකට ආවාම, තැබෑරුමකට ඒං වුණාම, ඌ තරම් එපා කරපු එකෙක් මේ රටේ නෑ."

"සෝයර් නෝනා. මෙන්න ඔබේ මුද්ද." මා කීවේ මිත්‍රයාගේ සංඥාවට අවනත වෙමිනි. "ඒක අයිති ඔහේගේ දුවට බව අපට විශ්වාසයි. ඒකේ නියම අයිතිකාරයාට මුද්ද භාරදෙන්න හැකි වීම ගැන සන්තෝෂයි."

Reading Purpose Only - Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

තම ස්තුතිය අප වෙත පළකරමින්, අපට ආශීර්වාද කරමින්, මැහැල්ල, මුද්ද තම සාක්කුවේ දමා ගත්තාය. ඊළඟට තරප්පු පෙළේ හෙමින් හෙමින් පහළට බසින්නට පටන්ගත්තාය.

විදුලි වේගයෙන් පුටුවෙන් නැගී සිටි හෝම්ස් තම කාමරය තුළට වැදුණේය. තත්පර කිහිපයකින් ඔහු එළියට පැමිණියේ දිගු ලිහිල් පිට කබායකින් සැරසීගෙනයි. මුහුණේ කොටසක් හා බෙල්ල ආවරණය වන සේ, ඔහු කරලේන්සුවක් ඔතාගෙන සිටියේය.

"මං යනවා ඇයගේ පිටුපසින්." ඔහු කලබලයෙන් කීය.

"ඇය ඔහුගේ උදව්කාරියක් විය යුතුයි, ඇය පිටුපසින් ගියොත් මට ඔහුව හොයාගන්න පුළුවනි. මං එනතුරු අවදියෙන් ඉන්න වොට්සන්."

අපේ අමුත්තා පිට වී දොර වැසුණු වහාම, හෝම්ස් තරප්පු පෙළේ පහළට බසින්නට පටන්ගත්තේය. මම ඉක්මනින් ජනේලය වෙත ගොස් මහමඟ දෙස බැලීමි.

පාරේ අනෙක් පැත්තේ, ඇය අපහසුවෙන් මෙන් සෙමින් ගමන් කරමින් සිටියාය. මගේ මිත්‍රයා ඇයට තරමක් පිටුපසින් ඉදිරියට ගියේය.

"එක්කෝ ඔහුගේ උපකල්පනය සම්පූර්ණයෙන්ම වැරදියි." මම මටම කියා ගතිමි. "එහෙමත් නැතිනම් දැන් ඔහු යන්නේ මේ අභිරහස මුලටම."

ඔහු එනතුරු අවදියෙන් සිටින්නැයි මගේ මිත්‍රයා මට කීවේය. එහෙත් එසේ කිරීමට උවමනාවක් නොවීය. කුමක් නිසාද යත්, ඔහුගේ ඒ වික්‍රමාන්විත ගමනේ ප්‍රතිඵල දැනගන්නා තුරු, නින්දට යාම මට කිසිසේත් කළ නොහැකි වීමයි.

හෝම්ස් නිවසින් පිට වී ගියේ රාත්‍රී නවයට පමණය. ඔහු මේ කටයුත්තට කොපමණ වේලා ගනීදැයි දැනගතහැකි ක්‍රමයක් නැත. මම පයිප්පය ද දල්වාගෙන, පොතක් කියවීමට පටන් ගත්තෙමි. මා පොතේ පිටු පෙරළාගෙන ගියා මිස කියවූ දෙයක් නොවීය.

සේවිකාව නින්දට යන වෙලේ ඇගේ පියවර හඬ මට පහළ තට්ටුව දෙසින් ඇසෙන්නට ලැබිණි. එකොළහ වෙද්දී ගෙහිමි කාන්තාව පහන් නිවා දමා නින්දට ගිය බව මම තේරුම් ගතිමි. ඇය පියවර

http://sherlockholmesinvestigations.blogspot.com

තැබුවේ වඩාත් උදාර ලීලාවෙනි. අමතර යතුරෙන් දොර විවෘත කරන හඬ මට අසන්නට ලැබෙන විට, රාත්‍රී දොළහට ළං වී තිබෙන්නට ඇත. ඔහුගේ රාජකාරිය සාර්ථක වී නොමැති බැව්, හෝම්ස්ගේ මුහුණ දුටු විගසම මම තේරුම් ගතිමි. කිවයුත්තේ කුමක්ද යි තීරණය කිරීමට අපහසුවෙන් මෙන්, මොහොතක් දෙකක් බලා සිටි හෝම්ස්, එක්වරම මහහඬින් සිනාසීමට පටන්ගත්තේය.

"මුළු ලෝකයම දෙනවා කිව්වත් මේක ස්කොට්ලන්ඩ්යාඩ් එකේ අය දැනගන්නවාට මම නම් කැමති නැහැ." කී ඔහු පුටුවේ හිඳගත්තේය.

"මං උන්ගේ අදක්ෂකම් ගැන උන්ට කොයිතරම් කොලොප්පම් කරල තියෙනවද? මේක දැනගත්තොත් නම් උන් කිසිදවසක මට කොලොප්පම් කිරීම අත්හැර දමන්න එකක් නැහැ. මේක මට හිනාවෙලා අමතක කර දමන්න පුළුවන් වොට්සන්. ඒ මොකද මමත් උන් වගේම වරද්දගත්තා. නමුත් අන්තිමේදී මං ජයග්‍රහණය කරන බව මට විශ්වාසයි."

"මොකක්ද දැන් සිද්ධ වුණේ?" මම ඇසීමි.

"ආ..........මාව රැවටුණු බව ඔබට හෙළිකරන්න මං මැලි වෙන්නෙ නෑ වොට්සන්. අර නාකි ගෑනි ටික දුරක් ඇවිදගෙන යද්දී හොඳටම නොන්ඩිගහන්න පටන්ගත්තා, කකුල් රුදාව හැදිල වගේ. අන්තිමට ඒ ගෑනි මඟ නැවතුණා. ඊළඟට ඇය රෝද හතරේ කුලීරියක් නවත්වා ගත්තා. යන්නේ කොහාටද කියලා ඇය කියන එක අහගන්න මං ඉක්මණටම එතැනට කිට්ටු වුණා. නමුත් ඇය පාරේ අනෙක් පැත්තට ඇහෙන්න තරම් ශබ්දෙට කෑගහල කිව්වා

"මාව එක්කගෙන යන්න හවුන්ඩ්ස්ඩිච්වල, ඩන්කන් වීථියේ අංක 13 නිවසට."

මෙතැන නම් මොකුත් හොර වංචාවක් නැහැ වගෙයි කියලා මට හිතුණා. ඇය කරත්තය ඇතුළට නගින හැටි බලාගෙන ඉඳලා, මමත් ඉක්මනින් වෙන කුලීරියකට නැගුණා. ඒක සෑම රහස් පරීක්ෂකයෙකු විසින්ම මනාව ඉගෙනගත යුතු උපක්‍රමයක්. ඉතින් අපි පිටත්වෙලා ගියා. අර කිව්ව පාරේ කිව්ව තැනට එන තුරු, කරත්තෙ නැවැත්තුවේ නැහැ. නියම තැනට එන්න ටිකකට කලින් කරත්තයෙන් බැහැල, මම ඉක්මනට ඉදිරියට ඇවිදගෙන ගියා.

Personal Purpose Only Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

නාකි ගෑනි ආව කුලී රිය නවත්වපු හැටි මම බලාගෙන හිටියා. රියදුරා ඔහුගේ අසුනෙන් බිමට පැනලා ඇවිත්, කරත්තයේ දොර ඇරගෙන බලාගෙන හිටියා. එළියට ආව කෙනෙක් නෑ. මං එතැනට ළං වුණා. ඔහු මොනවාදෝ කියමින් කුලීරිය පුරා අර ගෑනිව හොයනවා. ඊළඟට මං ජීවිතේටම අහල නැති විධියට දිවුරලා, අර උත්සාහය අත්හැර දැම්මා. ඔහුගේ මගියා ගැන කිසිම සලකුණක් තිබුණේ නැහැ. අපි ගිහින් ඩන්කන් වීථියේ අංක 13න් විමසා බැලුවා. ඒ නිවසේ හිමිකරුවා කඩදාසි අලවා බිත්ති සැරසීමේ රැකියාව කරන, කෙස්වික් නම් වැදගත් මනුස්සයෙක්. සෝයර් කෙනෙක් ගැනවත්, ඩෙනිස් කෙනෙක් ගැනවත් ඔවුන් අහලවත් නෑ.

"එහෙනම් ඔබ කියන්නේ අර ඇවිදගන්නත් බැරිව, කොර ගහ ගහ ආව නාකි ගෑනි, ඔබටවත් රියදුරාටවත් නොපෙනී අශ්වකරත්තයෙන් පැනගත්ත කියලද?

මම ඇසීමි.

"මොන නාකි ගෑනියෙක්ද?" මගේ මිත්‍රයා කීවේ තරමක් කෝපයෙනි.

"අපි දෙන්න තමයි ඒ ප්‍රයෝගෙ වලට රැවටුණු නාකි ගෑනු. ඒකා බොහොම ක්‍රියාශීලි තරුණයෙක් වෙන්න ඕනේ. ඔක්කොටම වඩා ඌ බොහොම දක්ෂ නළුවෙක්. ඔහු දැනගත්තා මං ඔහු පසුපස ලුහුබඳින බව. මිනිහ ඉටාගත්තා මාව මගහැරලා යන්න. දැන් බලන කොට අල්ලගන්න හොයන මිනිහා අප හිතුව තරම්, තනිව ක්‍රියාකරන කෙනෙක් නොවෙයි. අවදානමකට ලක්වෙලා හරි, ඔහුට උදවු කරන්න සූදානම් යහළුවන් ඉන්නවා. දොස්තර මහත්තයා, ඔබට හරිම වෙහෙස මහන්සි පාටයි. මගේ කීම අහල ගිහිං නිදාගන්න."

ඇත්තෙන්ම මා සිටියේ අධික විඩාවට පත්වය. එහෙයින් ඔහුගේ අවවාදය පිළිගතිමි. හෝම්ස් ගිනිඋදුන ඉදිරිපිට වාඩිවී, වයලීනය වාදනය කරන්නට පටන්ගත්තේය. ශෝකාකුල අඳෝනාවක් වැනි නාදයක් ඔහු වයලීනයෙන් නංවද්දී, තවමත් නොවිසඳුණු ගැටලුව ඔහුගේ සිතේ වද දෙමින් තිබූ බව මම තේරුම් ගතිමි.

http://sherlockholmesinvestigations.blogspot.com

## 6

# ටෝබියස් ග්‍රෙග්සන් ඔහුගේ හපන්කම් පෙන්වයි.

පසුවදා පළ වූ පුවත්පත් සියල්ලම, බ්‍රික්ස්ටන්හි මිනීමැරුම පිළිබඳ තොරතුරුවලින් පිරී තිබිණ. ඔවුන් එය හැඳින්වූයේ බ්‍රික්ස්ටන්හි අබිරහස යනුවෙනි. සමහර පුවත්පත්වල අළ වී තිබූ තොරතුරු, මට දැනගැනීමට ලැබුණේ ද මුල්වරටයි. පුවත්පත්වල වැදගත් ලිපි කපා පොතක අලවා, මා තැනූ ස්ක්‍රැප් පොතේ තවමත් දක්නට ලැබෙන ලිපි සමහරක් මෙසේයි.

ඩේලි ටෙලිග්‍රාෆ් -

මේ තරම් අද්භූත ලක්ෂණ ඇති මිනීමැරුමක් අපරාධ ඉතිහාසයේ සඳහන් වී ඇත්නම්, ඒ ඉතා කලාතුරකිනි. මියගිය තැනැත්තාට ජර්මන් නමක් තිබීම, ඔහු මරාදැමීමට වෙනත් අරමුණක් නොතිබීම, බිත්තියේ ලේ වලින් කළ ලේඛනය ආදී මේ හැම එකකින්ම පෙන්නුම් කරන්නේ කුමක්ද? ඒ අන් කිසිවක් නොව, දේශපාලන සරණාගතයින් සහ විප්ලවකාරීන් මෙයට සම්බන්ධ බවයි. සමාජවාදීන් ගේ ශාඛා ඇමරිකාවේ ද ඇත. මෙම මියගිය තැනැත්තා කිසියම් හේතුවක් නිසා සමාජවාදීන්ගේ කටයුතුවලට එරෙහි වන්නට ඇත. එහෙයින් ඔහු පසුපස පැමිණි සතුරන් ඔහු මරා දමන්නට ඇති බවට නිගමනය කිරීම අපහසු නොවේ. රැට්ක්ලිෆ් මහා මාර්ගයේ සිදුවූ මිනීමැරුම් ගැන ද මේ අවස්ථාවේ අපේ සිහියට නැගෙන්නේ නිතැතිනි. එංගලන්තයේ වාසය කරන විදේශිකයන් වෙත, රජයේ අවධානය මීට වඩා යොමු කළ යුතු බව බුද්ධිමතුන්ගේ අදහසයි.

ස්ටෑන්ඩර්ඩ් -

ලිබරල් පක්ෂය රට පාලනය කරන සමයක, මේ ආකාරයේ අපරාධ සිදුවීමේ පුදුමයක් නැත. මෙවැනි දේ සිදුවීමට ප්‍රධාන හේතුව,

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

මහජනයාගේ සිත්වල ඇති අසහනයයි. ඒ නිසාම, වගකිවයුත්තන් නීතිය නිසිලෙස ක්‍රියාත්මක කිරීමට දක්වන දුර්වලකම තවත් හේතුවකි.

මියගිය පුද්ගලයා, කාලයක් තිස්සේ ලන්ඩනයේ ජීවත් වූ ඇමරිකානු ජාතික මහත්මයෙකි. කැම්බර්වෙල්හි ටෝකේ ටෙරසයේ චාපෙන්ටියර් මහත්මියගේ නිවසේ, ඔහු නේවාසිකව සිට ඇත. ඔහු සෑමවිටම ගමන් බිමන්වල යෙදී ඇත්තේ, ඔහුගේ පෞද්ගලික ලේකම් වරයා වන, ජෝසප් ස්ටැන්ගසන් මහතා සමගයි. පසුගිය අඟහරුවාදා එනම් 4වැනිදා, ඔවුන් දෙදෙනා ගෙහිමි කාන්තාවගෙන් සමුගෙන යුස්ටන් දුම්රිය පොළ වෙත පැමිණ ඇත. ඔවුන්ගේ අරමුණ වී ඇත්තේ, ලිවර්පූල් බලා යන ශීඝ්‍රගාමී දුම්රිය අල්ලා ගැනීමයි. පසුව ඔවුන් දෙදෙනා යුස්ටන් දුම්රියපොළේ වේදිකාවේ සිටිනු දක්නට ලැබී ඇත. ඉන්පසු ඔවුනට සිදුවූයේ කුමක් ද යන්න කිසිවෙකු නොදනී. මීළඟට ඔවුන් ගැන අසන්නට ලැබෙන ආරංචිය, යුස්ටන් සිට සැතපුම් ගණනක් ඈතින් පිහිටි, බ්‍රික්ස්ටන් පාරේ පාළු නිවසක තිබී, ඩ්‍රෙබර්ගේ මළසිරුර හමුවීමයි.

ඔහු එහි පැමිණියේ කෙසේද, ඔහුට එම ඉරණම අත්වූයේ කෙසේද යන ප්‍රශ්න මෙතෙක් නොවිසඳුණු අභිරහස්ය. ස්ටැන්ගසන්ට සිදුවූයේ කුමක්ද හෝ ඔහු ආ ගිය තැන් පිළිබඳව කිසිදු ආරංචියක් නොමැත. ස්කොට්ලන්ඩ් යාඩ්හි රහස් පරීක්ෂකවරුන් වන ලෙස්ට්‍රේඩ් හා ග්‍රෙග්සන් යන මහත්වරුන් දෙදෙනාම, මෙම පරීක්ෂණය මෙහෙයවන බව දැනගන්නට ලැබීම අපට සතුටකි. මෙම සුප්‍රසිද්ධ පොලිස් නිලධරයන් දෙදෙනා, අභිරහස ඉතා විශිෂ්ට අන්දමින් හෙළිකරනු ඇතැයි අපි දැඩි විශ්වාසයකින් බලාපොරොත්තුව සිටිමු.

## ඩේලි නිවුස්

මෙය තවත් දේශපාලන මිනීමැරුමක් බවට කිසිදු සැකයක් නැත. යුරෝපා මහාද්වීපයේ සමහර රටවල, රාජ්‍ය තන්ත්‍රය අනුගමනය කරන ලිබරල් විරෝධී ආකල්ප හා ජාති සංග්‍රහ මෙවැනි අපරාධ වලට මුල බව අමුතුවෙන් කිවයුතු නොවේ. තමන්ගේ රටවල හොඳ රටවැසියන් වී සිටි බොහෝ දෙනෙකු, තමනට විඳින්නට සිදුවූ කටුක අත්දැකීම් නිසා එම රටවල් හැර දමා මෙරටට පැමිණීමට පටන්ගෙන ඇත. මියගිය තැනැත්තා පිළිබඳ වැඩි විස්තර හා ඔහු ගත කළ ජීවිතය පිළිබඳ නියම තත්ත්වය දැනගැනීම සඳහා ඔහුගේ පෞද්ගලික ලේකම්වරයා වූ ස්ටැන්ගසන් සොයාගැනීමට සෑම උත්සාහයක්ම දැරිය යුතුය. මියගිය තැනැත්තා නේවාසිකව වාසය කළ ස්ථානයේ ලිපිනය සොයා ගැනීම, මෙම අභිරහස විසඳීම සඳහා හොඳ පියවරකි. එහි කීර්තිය හිමිවන්නේ ස්කොට්ලන්ඩ්යාඩ්හි ග්‍රෙග්සන් මහතාටයි.

http://sherlockholmesinvestigations.blogspot.com

උදෑසන තේ මේසයේදී ෂර්ලොක් හෝම්ස් සහ මම, එම පුවත්පත් කියවා බැලුවෙමු. මගේ මිත්‍රයා එම පුවත්වලින් ඉමහත් විස්මයට පත්වූ බව මම දුටුවෙමි.

"මං ඔබට කිව්වේ වොට්සන්, මොනවා වුණත් අන්තිමට ලකුණු වැටෙන්නේ ග්‍රෙග්සන්ටයි, ලෙස්ට්‍රේඩ්ටයි."

"නමුත් ඉතින් ඒක සිද්ධවන්නේ, පරීක්ෂණය පෙරළෙන්නේ මොන පැත්තකටද කියන එක උඩයි."

"ඔබ මේ මොනවා කියනවද. අපරාධකාරයා අල්ලගත්තොත් ඒ ඔවුන්ගේ නොපසුබට වීර්යය නිසා......! අපරාධකාරයා පැන ගියොත්, ඒ ඔවුන් දරූ අප්‍රතිහත ධෛර්යය මධ්‍යයේත් ....... මං ඕන ඔට්ටුවක් අල්ලනවා. ඔවුන් මොනවා කළත් ඔවුන්ගේ ගුණ වර්ණනා කරන අය නම් අප්‍රමාණව ඉඳීවි."

"දෙයියෝ සාක්කි! මොකක්ද හෝම්ස් ඒ ශබ්දය?" මා ඇසුවේ තරප්පු පෙළ දිගේ ඉහළට දුව එන කිහිප දෙනෙකුගේ අඩි ශබ්ද ඇසුණු විටයි. ඒ සමගම අපේ ගෙහිමි කාන්තාව තම අප්‍රසාදය පළකරන හඬ ද මට අසන්නට ලැබිණි.

"ඒ තමයි අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවේ බේකර් වීථියේ ශාඛාව!" මගේ මිත්‍රයා පැවසුවේ දැඩි උනන්දුවකිනි. ඔහු එසේ කියද්දීත් වැරහැලි ඇඳුමෙන් සැරසුණු, අපිරිසිදු හිඟන කොලුවෝ හයදෙනෙක්, අපේ විසිත්ත කාමරයට ඇතුළුවූහ.

"සීරුවෙන් සිටින්!" හෝම්ස් අණ දුන්නේය. හිඟන කොලුවෝ හයදෙනා එකපෙළට නැඟී සිටිමින්, ප්‍රතිමා මෙන් නිශ්චල වූහ.

"මීට පස්සේ මොනවා හරි තොරතුරු දැනගන්න ලැබුණොත්, උඹලා ඔක්කොම මෙහෙට දුවගෙන එන්න එපා. තේරුණාද? විගින්ස් ඇවිත් මට දැනුම් දෙන තුරු, උඹලා ආරට වෙලා ඉන්න ඕනෑ. තේරුණාද? හොඳයි විගින්ස් උඹලට ලැබුණාද ඒක?"

"නැහැ මහත්තයා. ලැබුණේ නැහැ." එක කොලුවෙක් කීය.

"උඹලට ඒක මේ තරම් ඉක්මණට ලැබේවි කියලා, මගේ එච්චර විශ්වාසයක් තිබුණේ නැහැ. නමුත් එය ලැබෙන තුරු හොඳ විමසිල්ලෙන් ඉන්න ඕනෙ. දැන් මෙන්න උඹලගේ පඩි." එකාට සිලිමේ කාසිය බැගින්, හෝම්ස් ඔවුන්ගේ අත්වල තැබුවේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"දැන් යන්න පුළුවන්. ඊළඟ දැරේ එනකොට ආරංචිය මීට වඩා හොඳ වෙන්න ඕනේ."

ඔවුනට විසිර යන මෙන් හෝම්ස් සංඥා කළේය. විගසින් පැන දුවන මීයන් රංචුවක් මෙන්, ඔවුහු තරප්පු පෙළ බැස ගියහ. ඊළඟ මොහොතේ ඔවුන්ගේ තියුණු කටහඬවල් අපට වීථිය දෙසින් අසන්නට ලැබිණි.

"පොලිස් හටයින් දුසිමක් යොදවලා හොයාගන්න පුළුවන් කරුණුවලට වඩා කරුණු, ඔය එක කොල්ලෙකුට පුළුවන් හොයාගන්න." හෝම්ස් කීය. පොලිස් නිලඇඳුම් දුටු ගමන් මිනිසුන්ගේ කටවල් වැහෙනවා. මේ අභිගුන්ඨික කොලුගැටවු හැමතැනම රිංගනවා. උන්ගේ බුද්ධිය මොකක්ම තියුණුයි. හැමෝගෙම කථාවලට කන් දෙනවා. උවමනා කරන්නේ උන්ව ටිකක් පුහුණු කරලා මෙහෙයවීම පමණයි."

"ඔබ ඔවුන් යොදවන්නේ, මේ බ්‍රික්ස්ටන් පාරේ සිද්ධියටද?"

"ඔව්. මට තියෙනවා එක කාරණයක් පැහැදිලි කරගන්න. ඒ සඳහා මට උවමනා කරන්නේ කාලය පමණයි. ඔහෝ! ඔන්න අපි හිතුවාට වඩා ඉක්මනින් අපට ආරංචියක් අහන්න ලැබෙනවා වගෙයි. ග්‍රෙග්සන් නේද මේ පාර දිගේ එන්නේ ? ඔහු එන්නේ මේ පැත්තටයි. ඔහුගේ මුහුණෙන් ප්‍රකාශ වන්නේ නම් අප්‍රමාණ සන්තෝෂයට පත් වී ඇති වගක්. ඔහු මේ එන්නේ නම් අප හමුවන්න තමයි.......ඔන්න නැවතුණා."

අපේ සීනුව ඉනොක්ඩවාම් නාදකරන හඬක් ඇසිණ. රහස්පරීක්ෂකයා වරකට තරප්පු තුන බැගින් නගිමින් උඩට පැමිණ තත්පර කීපයකින් අපේ කාමරයට කඩාවැදුණේය.

"මගේ මිත්‍රයා!" ඔහු කීවේ, හෝම්ස්ගේ දකුණත ගෙන සොලවමිනි. "මගේ ජයග්‍රහණය ගැන මට සුභ පතන්න. මට හැම දෙයක්ම පැහැදිලි කරගැනීමට හැකි වුණා."

මගේ මිත්‍රයාගේ මුහුණේ පළ වූයේ, බලාපොරොත්තු කඩ වූ අයුරකි.

"ග්‍රෙග්සන්. ඔබ අදහස් කළේ ඔබ දැන් හරි පාරට වැටුණා කියලද?"

"හරි පාරට? මොනව කියනවද මහත්මයා. අපි අපරාධකාරයා අල්ලාගෙන ඔහු පොලිස් හිරකුඩුවේ දමලත් අවසන්."

http://sherlockholmesinvestigations.blogspot.com

"මොකක්ද ඔහුගේ නම?"

"ආතර් කාපෙන්ටියර් -නාවික හමුදාවේ උපලූතිනන් කෙනෙක්." ග්‍රෙග්සන් ආඩම්බරයෙන් කීවේ, හුස්මක් ඉහළට ඇද ළය පුම්බාගනිමිනි.

හෝම්ස් සැනසුම් සුසුමක් හෙළුවේය. ඔහුගේ මුහුණට නැගුණේ සිනහවකි.

"වාඩිවෙන්න. බොමු සුරුට්ටුවක්" හෝම්ස් කීය. "ඔබ මේ හපන්කම කළේ කොහොමද කියලා දැනගන්න අපි හරි කැමතියි. එහෙම නම් අපි බොමු විස්කි ටිකක්?"

"විස්කි ටිකක් තිබුණත් කරදර නෑ." ග්‍රෙග්සන් කීය.

"මේ පසුගිය දවසේ දෙකේ මං හරියට මහන්සි වුණා. ඒකෙන් ඇඟට හරිම අමාරුයි. ඔබට තේරෙනවා නේද මහත්මයා. ඇඟ වෙහෙසුවා නෙමෙයි, මොළය වෙහෙසුවා. ෂර්ලොක් හෝම්ස් මහත්මයා. අපි දෙන්නම වැඩ කරන්නේ මොළය වෙහෙසවීමෙන් නිසා ඔබට හොඳහැටි තේරෙනවා ඇති මගේ අමාරුව."

"මාත් ඔබ වගේම හපනෙක් කියන එක මටත් ලොකු ගෞරවයක්." හෝම්ස් කීය. "ඒක නොවෙයි, මේ වගේ විශිෂ්ට ප්‍රතිඵලයක් ලබාගන්න ඔබ කොහොමද සමර්ථ වුණේ?"

හාන්සිපුටුවේ සුවපහසු ලෙස හිඳගත් ග්‍රෙග්සන්, සුරුට්ටුවෙන් දුම්ගුළියක් පිටකළේය. ඊළඟට ඔහු මහහඬින් සිනාසීමට පටන් ගත්තේ ලොකු විහිළුවකට සවන්දීමට ලැබුණු අයුරෙනි.

"අර මෝඩයා ලෙස්ට්‍රේඩ් ......" ග්‍රෙග්සන් කීය. "මිනිහ හොඳටම වැරදි පාරකයි යන්නේ. දැන් ඔහු ඒකේ සෑහෙන දුරක් ගිහින්. මිනිහ අර මැරුණු මනුස්සයගේ පුද්ගලික ලේකම් - ස්ටැන්ගසන් හොයමින් යනවා. ඒ මනුස්සයා - ස්ටැන්ගසන් නූපන් දරුවෙක් වගේ අහිංසකයෙක්. කිසි සැකයක් නෑ මේ වෙනකොට, ලෙස්ට්‍රේඩ් ඒ අහිංසකයාව අත්අඩංගුවට අරගෙන ඇති."

මෙයින් ග්‍රෙග්සන්ගේ සිතේ ඇතිවූ හාස්‍යය කොපමණද යත්, ඔහු මිනිත්තු කීපයක් යන තුරු නොනවත්වාම සිනාසුණේය.

"මේ අපරාධකාරයාව අල්ලගන්න, ඔබට කොහොමද හෝඩුවාව ලැබුණේ?" හෝම්ස් ඇසීය.

http://sherlockholmesinvestigations.blogspot.com

"ආ.......මං ඒ ඔක්කොම කියන්නම්....... වොට්සන් දොස්තර මහත්තයා, මේක රහසක්. මුලින්ම අපට තිබුණු ප්‍රශ්නේ මේ මැරුණු මිනිහගේ මුල් තොරතුරු සොයා ගැනීම. ඔහු කාගේ කවුද? පදිංචි කොහෙද? එංගලන්තයට ආවේ මොකටද? නෑදෑයෝ කවුද? ඔය ආදී වශයෙන් විස්තර. සමහර රහස් පරීක්ෂකයෝ මොකද කරන්නේ? පත්තරේට දැන්වීම් දාල, ඒවට පිළිතුරු එනතුරු බලා ඉන්නවා. එහෙමත් නැත්නම් නෑදෑ හිතමිත්‍රයෝ පොලිසියට ඇවිත්, තමන්ගේ කැමැත්තෙන් විස්තර කියන තුරු බලාගෙන ඉන්නවා. මේ ටෝබියස් ග්‍රෙග්සන් යොදාගන්නේ ඒ ක්‍රමය නොවෙයි. ඔබට මතකද මළසිරුර අසල තිබුණු තොප්පිය?"

"ඔව්." හෝම්ස් කීය. "අර කැම්බවෙල් පාරේ, අංක 129 දරන තැන ජෝන් අන්ඩවුඩ් සහෝදරයන් නිෂ්පාදනය කළ එක?"

එම පිළිතුරෙන් ග්‍රෙග්සන් මදක් සසුබැමට පත් වූ බව මම දිටිමි.

"ඔබටත් ඒක දකින්න ලැබුණු බවක් මං දනහිටියේ නෑ. හොඳයි. කොහොම හමුත් ඔබ එතැනට ගියාද සොයාගෙන?"

"නැහැ."

"හඃ" ග්‍රෙග්සන්ගේ මුවෙන් සැනසීමට හුස්ම හඬක් නිකුත් විය.

"මේ වගේ පොටක් පෑදෙනව නේද?" ග්‍රෙග්සන් කීය. "ඒක කොයිතරම් සුළු එකක් වුණත්, සුළුයි කියා අත්හැර දමන්න හොඳ නෑ."

"ඔව්. ඔව්. ශ්‍රේෂ්ඨ මනසකට කිසිම දෙයක් සුළු නෑ." හෝම්ස් කියද්දී සාඩම්බර ග්‍රෙග්සන් තවුත් දිරිමත් විය.

"ඉතින් මං අන්ඩවුඩ් සමාගමට ගිහින් විමසලා බැලුවා. මං ඇහුවා මේ විස්තරයට ගැළපෙන, මේ ප්‍රමාණයේ තොප්පියක් මෙහෙන් විකුණුවාද කියලා. ඔවුන් පොත් පරීක්ෂා කර බැලුවා. ඔවුනට හමුවුණා හරියටම මේක. ඔවුන් කිව්වා මේ තොප්පිය ටෝකේ ටෙරසයේ, ශාපෙන්ටියර් නේවාසිකාගාරයේ, ඩ්‍රෙබර් මහතාට විකුණු බව. අන්න එහෙමයි මට ඒ ලිපිනය ලැබුණේ."

"ඔබ හරි දක්ෂයි......හරිම දක්ෂයි." හෝම්ස් කීය.

"ඉතින් මං ගියා ශාපෙන්ටියර් මහත්මිය හමුවන්න. ඇය හිටියා සුදුමැලිවෙලා, බොහොම කැලඹීමට පත්වෙලා. ඒ වෙලාවේ

http://sherlockholmesinvestigations.blogspot.com

ඇගේ දියණියත් කාමරයේ හිටියා. ඇය හර් ලක්ෂණ තරුණ ගැහැනු ළමයෙක්. මං ඇයට කතා කරද්දී ඇගේ දෙතොල් වෙවුලන හැටිත්, දෑස් රතුවෙලා තිබුණු හැටිත් මං දුටුවා. මෙතැන මොකක් හරි වැරැදි දෙයක් සිදුවෙලා තියෙන බව මට එක්වරම තේරුම් ගියා. ඔබ දන්නවා නේ හෝම්ස් මහත්තයා අපරාධකාරයා පිළිබඳ ඉවක් දැනුනම....... අපි නිවැරදි මාර්ගයට වැටුණම අපේ සිතට ඇතිවෙන හැඟීම. ඉතින් මං චාපෙන්ටියර් මහත්මියගෙන් මෙහෙම ඇහුවා."

"ඔබේ බෝඩිමේ නේවාසිකව හිටි එක්සත් ජනපදයේ ක්ලීව්ලන්ඩ්හි එනොක් ජේ. ඩ්‍රෙබර් ගේ අභිරහස් මරණය ගැන ඔබට අහන්න ලැබුණද?"

මගේ ප්‍රශ්නයට ඒ අම්මණ්ඩි ඔලුව හෙලෙව්වා විතරයි. ඇයට වචනයක්වත් කතාකරගන්න බැරිවුණා. දියණිය ඉකිගසමින් හඬන්න පටන් ගත්තා. මට හොඳහැටි තේරුණා, මේ ගොල්ලෝ මේ සිද්ධිය ගැන යමක් දන්න බව. ඉතින් මං දිගටම ප්‍රශ්න කළා."

"දුම්රියට නගින අදහසින් ඩ්‍රෙබර් මහත්මයා, ඔබේ නිවසින් පිටත්වුණේ කීයටද?"

"රෑ අටට." ඇය බොහොම අමාරුවෙන් කීවේ හිතේ තිබුණු කැලැඹීම යටපත් කරන්න උත්සාහ දරමින්.

"ඔහුගේ ලේකම් ස්ටැන්ගසන් මහත්මයා කිව්වා, දුම්රිය දෙකක් තියෙනවා කියලා. එකක් 9.15 ට පිටත්වෙන එකක්. අනෙක රෑ එකොළහට පිටත්වෙන එකක්. ඔහුට ඕනැවුණා කලින් දුම්රිය අල්ලාගන්න."

"ඔබ ඔහුව අන්තිම වරට දුටුවේ ඒ වෙලාවෙද්ද?"

මං මේ ප්‍රශ්නය අහද්දී වයසක ගෑනිගේ මුහුණ මහ භයානක විධියට වෙනස් වුණා. ඇගේ මුහුණ සම්පූර්ණයෙන් කළු වුණා. තත්පර කිහිපයක් යන තුරු ඇයට කතාකරගැනීමටවත් බැරිවුණා. ඊට පස්සේ බොහොම අමාරුවෙන් 'ඔව්' කියාගත්තා.

"මොහොතක දෙකක නිශ්ශබ්දතාවයකට පස්සේ, දියණිය බොහොම සන්සුන් විධියට කතා කළා."

"අපි මේ මහත්තයට බොරු කියන එකෙන් වැඩක් නෑ අම්මේ. අපි ඇත්තම කියමු. ඇත්ත කියනවා නම් ඩ්‍රෙබර් මහත්තයාව ආයෙමත් සැරයක් අපට දකින්න ලැබුණා."

Reading Purpose Only Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

"දෙවියන් වහන්සේ මේ කෙල්ලට සමාව දෙන සේක්වා." ඇගේ අම්මා කිව්වේ දෑත් අහසට දිගු කරමින්."

"උඹ, උඹේ අයියව එල්ලුම් ගස් යවන්නයි හදන්නේ."

"අයියට එහෙම දෙයක් වුණත්, අපි මේ කිව්වේ ඇත්තමයි." තරුණිය අවංකව කිව්වා.

"තරුණ නෝනා. ඔබට කරන්න තියෙන්නේ මේ ගැන දන්න හැම දෙයක්ම, වහාම මට කියන එකයි. කරුණු බාගෙට කීමෙන් ප්‍රයෝජනයක් නෑ. ඒ මොකද, අප කොයි තරමක් දේවල් දන්නවද කියල ඔබ දන්නේ නැහැනේ."

"ඇලිස්. උඹ නිසයි මේ ඔක්කොම කරදර!" එහෙම කිව්ව චාපෙන්ටියර් මහත්මිය ඇය දෙසට හැරුණා.

"මහත්මයා. මං ඔබට හැම දෙයක්ම කියන්නම්. මං ලොකු කැලැඹීමකට පත් වෙලා ඉන්න බව සම්පූර්ණ ඇත්ත. නමුත් හිතන්න එපා ඒක මේ මිනීමැරුමට වැරදිකාරයා මගේ පුතා කියලා හිතාගෙන ඇතිවූ එකක් කියලා. ඔහු සම්පූර්ණයෙන්ම නිර්දෝෂයි. නමුත් මගේ හිතේ තියෙන භය, ඔබත් අනික් අයත් ඔහුව සැකකරාවි කියල. නමුත් ඔහු කොහොමටවත් මෙහෙම දෙයක් කරන කෙනෙක් නෙවෙයි මහත්තයා. ඔහු හොඳ චරිතයක් තියෙන, නීතිගරුක මහත්මයෙක්. වැදගත් තනතුරක් හොබවන කෙනෙක්. කවදාවත් මගේ පුතා මේ වගේ දේකට පැටලිලා නැහැ."

"නෝනා. ඔබට කරන්න තියෙන හොඳම දේ, හැම දෙයක්ම, අවංකව මට හෙළිකරන එකයි. ඊනෙ හැටියට ඔබේ පුතා අහිංසක නම්, ඔහුට කරදරයක් සිද්ධවෙන්නෙ නෑ."

"ඇලිස්. මට මේ කථාව කියන්න දීල, උඹ මෙතනින් පලයං යන්න." අම්මා එහෙම කිව්වාම දියණිය ඉවත් වී ගියා.

"මහත්මයා. මුලින් නම් මේ හැම දෙයක්ම හෙළිකරන්න මගේ හිතේ අදහසක් තිබුණේ නැහැ. නමුත් මගේ අසරණ කෙල්ල ඒක එළියට දැම්මා. දැන් මට ඒක තවත් හංගාගෙන ඉන්න බැහැ. මං ඔක්කොම විස්තර ඔබට කියන්නම්."

"හැම දෙයක්ම හෙළිකරන එක තමා නුවණට හුරුම වැඩේ."

"ඩ්‍රෙබර් මහත්තයා අපේ බෝඩිමට ඇවිත් සති තුනක් විතර වෙනවා. ඔහුත් ඔහුගේ ලේකම් ස්ටැන්ගසනුත්, යුරෝපා රටවල

http://sherlockholmesinvestigations.blogspot.com

සංචාරයක යෙදිල තමා, එංගලන්තයට ඇවිත් තියෙන්නේ. ඒ මොකද ඔවුන්ගේ ට්‍රන්ක පෙට්ටිවල මං දුටුවා, කෝපන්හේගන් කියන ලේබලය. ඒ කියන්නේ ඔවුන් අන්තිමට නැවතී සිටි නගරය. ස්ටැංගසන් බොහොම නැන්පත්, නිශ්ශබ්ද, පාඩුවේ ඉන්න කෙනෙක්. නමුත් මට කණගාටුයි කියන්න. ඔහුගේ ස්වාමියා නම් එහෙම කෙනෙක් නෙමෙයි. ඔහුගේ හැසිරීම බොහොම රළු නරක එකක්. ඒ වගේම නපුරුයි.

ඔහු මෙහෙට ආව දවසේම රාත්‍රියේ, හොඳටම බීල වෙරිවුණා. ඇත්තම කියනවා නම් හැමදාම වගේ දවල් වෙනකොට ඔහු හිටියේ බීමත්ව වෙරිවෙලා. තරුණ සේවිකාවන්ට ඔහු සැලකුවේ බොහොම අශෝභන විධියට. වැඩි දවසක් යන්න කලින් ඔහු මගේ දුව ඇලිස්ටත් ඒ වගේ සලකන්න පටන්ගත්තා. ඔහු ඇයට කථාකළේ මහා නරක විධියට. තවම ලාබාල නිසා වාසනාවකට වගේ ඔහු කීව දේවල් ඇයට තේරුණේ නැහැ. එක්වරක් ඔහු දෑතින්ම මගේ කෙල්ලව බදාගන්න හැදුවා. ඔහුගේ පුද්ගලික ලේකම්වරයා මැදිහත්වෙලා තමා ඒක නැවැත්තුවේ."

"ඇයි ඉතින් ඔබ මේ වගේ මිනිහෙක් ඔබේ බෝඩිමේ තියාගත්තේ. ඔබට හිතුණු වෙලාවක මේ වගේ නේවාසිකයන් නිවසින් පන්නා දමන්න ඔබට පුළුවන් නේද?" මං ඇසුවා.

මගේ ප්‍රශ්නයට ෂාපෙන්ටියර් නෝනාගේ මුහුණ රතු වුණා.

"ඔවුන් මේ ගෙදරට පා තැබූ දවසේම මෙතැනින් පිටමන් කරන්න, මගේ හිතට ආව බව දෙයියෝ පමණයි දන්නේ. මුදලට තිබූ ආශාව නිසයි මහත්මයා, මං ඔවුන්ව තියාගත්තේ. ඔවුන් එක්කෙනෙක් දවසකට රන්පවුම ගණනේ ගෙවුවා. දෙන්නගෙන්ම සතියකට පවුම් 14 ක් ලැබුණා. මේ කාලෙ සංචාරකයින් එන්නෙ නැති අහේනි කාලෙ. මගේ මහත්තයා මියගිහින්. මගේ පුතාව නාවික හමුදා නිලධාරියෙක් කරන්න මං සල්ලි හුඟක් වියදම් කළා. මේ වගේ මුදලක් ලැබෙන එක ප්‍රතික්ෂේප කරන්න මට හැකියාවක් තිබුණේ නෑ. නමුත් අන්තිමට ඇතිවුණු සිද්ධිය මට තවත් ඉවසගෙන ඉන්න පුළුවන් එකක් නෙවෙයි. මං ඔහුට පහුවදාම නිවසෙන් පිට වී යන්න කියල දැනුම් දුන්නා. අපේ ගෙදරින් ඔවුන් ගිය කාරණාව ඒකයි."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඉතින්?"

"ඔවුන් අශ්වකරත්තයක බඩුත් පටවාගෙන පිටත්ව යන හැටි දුටුවාම, මගේ හිතට ලොකු සැහැල්ලුවක් දැනුණා. මේ දවස් වල මගේ පුතා නිවාඩු පිට ගෙදර ඇවිත් ඉන්නේ. මේ නේවාසිකයා ගැන කිසිම දෙයක් මං මගේ පුතාට කිව්වේ නැහැ. ඒ මොකද, ඔහු බොහොම සැරට කේන්ති යන කෙනෙක්. ඒවගේම ඔහු තමන්ගේ නංගිට හරි ආදරෙයි. ඩ්‍රෙබර්ලා ගිහින් කරත්තය පිටත්වුණු වෙලාවේ ගෙදර දොර වැහුවාම, මගේ හිතෙන් විශාල බරක් ඉවත්වුණා. පැයක් යන්න කලින් අපේ ගෙදර සීනුව නාදවුණා. මට දකින්න ලැබුණේ ඩ්‍රෙබර් මහත්තයා ආපසු ඇවිත් ඉන්නා බව.

ඔහු හොඳටම මත්පැන් බී සිහි විකල් වෙලා වගේ හිටියේ. මං මගේ දියණියත් සමග මගේ කාමරයෙ ඇතුලෙයි හිටියේ. ඔහු බලෙන්ම මගේ කාමරයට ඇතුළුවුණා. ඊට පස්සේ දුම්රිය අල්ලාගන්න බැරිවුණු කතාවක් කිව්වා. ඊළඟට ඔහු ඇලිස්ට මෙහෙම කිව්වා."

"උඹ එනවද කෙල්ලේ මාත් එක්ක යන්න?" මගේ මුහුණටමයි ඔහු එවැනි යෝජනාවක් කළේ. තවත් කුරිරු කළා.

"උඹ දැන් වයස සම්පූර්ණ වුණු ගෑනු ළමයෙක්. උඹ කසාද බඳින්න හිතුවොත් නීතියෙන් ඒකට අවහිරයක් නෑ. මං ළඟ ඕනතරම් සල්ලි තියෙනවා. මේ නාකි ගෑනි ගැන හිතන්න එපා. වරෙන් මා එක්ක යන්න. උඹට කුමාරිකාවක් වගේ ජීවත්වෙන්න පුළුවනි."

මගේ අසරණ ඇලිස් හොඳටම භයවුණා. ඇය ඔහුගෙන් ඈතට ගියා. නමුත් ඔහු ඇගේ අතින් අල්ලාගෙන ඇයව දොර දෙසට අදින්න පටන්ගත්තා. මගේ කටින් විලාප නැගුණා. මගේ පුතා ආතර් ඒ මොහොතේම කාමරයට දුවගෙන ආවා. ඊට පස්සේ මොකක්ද වුණේ කියන්න, මං දන්නේ නැහැ මහත්මයා. දිවුරණ හඬක් ඇහුණා. සණ්ඩුවක්, පොරබැදීමක් ඇතිවෙන ශබ්දයක් ඇහුණා. මං හරි භයකට පත්වෙලා හිටියේ. මං ඔලුව උස්සලා බැලුවෙ නෑ.

මං හිස ඔසවලා බලද්දී, මං දැක්කා ආතර් දොරකඩ හිනාවෙමින් ඉන්න හැටි. ඔහුගේ අතේ පොල්ලක් තිබුණා.

"මං හිතන්නේ නෑ ඒ උන්නැහේ මීට පස්සේ අපට කරදර කරන්න එයි කියලා. මකායි එකටත් මං ඔහු පස්සෙන් ගිහින් බලන්නම් ඔහු මොකද කරන්නේ කියලා." මෙහෙම කිව් ආතර්

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහුගේ හිස්වැසුම අරගෙන පාරට බැස්සා. ඊට පස්සෙන්දා උදේ තමයි ඩ්‍රෙබර් මහත්තයාගේ අභිරහස් මරණය ගැන අහන්න ලැබුණේ."

ෂාපෙන්ටියර් මහත්මියගෙන් මේ කථාඋත්තරය ලැබුණේ, තැනින් තැන නවත්වමින්, හඬමින්. වෙලාවකට ඈ කථා කළේ බොහොම හෙමින්. ඒ වෙලාවට කියූ දේ අහගැනීම පවා මට අමාරු වුණා. කොහොම වුණත් ඇය කියූ හැම දෙයක්ම මං ලඝුලේඛනයෙන් සටහන් කර ගත්තා. එතකොට වැරදීමක් සිදුවෙන්න විධියක් නෑ."

"හරිම සිත්ගන්නාසුලුයි." ෂර්ලොක් හෝම්ස් කීවේ ඇනුමක් හරිමිනි. "ඉතින් ඊට පස්සේ මොකද වුණේ?"

"ෂාපෙන්ටියර් මහත්මිය කථාව මේදකට නැවැත්වූවාම, මං එක් දෙයක් හිතට ගත්තා. මේ හැම දෙයක්ම තියෙන්නේ එක් වැදගත් කාරණයක් මත බව මට තේරුණා. මෙහෙම වෙලාවලට ගැහැනුන්ගේ කටින් ඇත්ත එළිකරගන්න පුළුවන් ක්‍රමයක් මං දන්නවා. ඔවුන්ගේ දෑස් දිහා කෙළින් බලාගෙන කථා කළොත්, සත්‍යය ඉබේම එළියට එන බව මං හොඳින් අත්දුටු දෙයක්. මගේ ඇස් ඇගේ දෑස්වලට සමීපව තියාගෙන මං ඇහුවා."

"එදා රෑ, නැත්නම් පාන්දර කීයටද ඔබේ පුතා ගෙදර ආවේ?"

"මං දන්නෙ නෑ."

"දන්නෙ නෑ?"

"නෑ මහත්තයා. ඒ මොකද ඔහු ළඟ තියෙනවා ඉස්සරහ දොරට අමතර යතුරක්. අපි රෑට දොර වහල නිදාගත්තට පස්සේ ඔහුට තනියම දොර ඇරගෙන එන්න පුළුවන්."

"ඒ කියන්නේ ඔහු එන්න ඇත්තේ ඔබ නිදාගන්න ගියාට පස්සේ?"

"ඔව්."

"ඔබ නින්දට ගියේ කීයටද?"

"එකොළහට විතර."

"ඒ කියන්නේ ඔබේ පුතා ගිහින් අඩු ගණනේ පැය දෙකක්වත් වුණා?"

"ඔව්."

"ඔහු ආපසු ගෙදර එන්න තවත් පැය හතරක්, පහක් ගත වුණා වෙන්න පුළුවනි ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්."

"මේ වෙලාවේ මොනවද ඔහු කරල තිබුණේ ?"

"මං දන්නේ නෑ." එහෙම කියද්දී ඇගේ දෙතොල් සුදුමැලි වුණා.

"ඉතින් එතැනින් එහාට මට වෙන කරන්න දෙයක් තිබුණේ නැහැ. ලුතිනන් ෂාපෙන්ටියර් ඉන්නේ කොහෙද කියල දනගෙන මම තවත් නිලධරයන් කීපදෙනෙකු සමග ගිහිං, ඔහුව අත් අඩංගුවට ගත්තා. මං ඔහුගේ උරහිසට තට්ටු කරලා කිව්වා, කලබල නොකර අප සමග එන ලෙස. ඔහු මං නොහිතූ විධියට එක්වරම පිළිතුරු දුන්නා."

"මං හිතන්නේ ඔබ මාව හිරභාරයට ගන්නේ, අර තක්කඩියා ඩ්‍රෙබර් මරාදමීමට මා සම්බන්ධයි කියල වෙන්න ඇති?"

මුලින් අපි ඔහුට මෙහෙම කථාවක් කිව්වේ නැහැ. ඉතින් එහෙම දෙයක් ඔහුගේ කටින්ම පිටවුණාම, මගේ හිතේ තිබූ සැකය තවත් තහවුරු වුණා."

"ඒක හරි." හෝම්ස් කීය.

"ඔහුගේ මව කලින් සඳහන් කළ, ඔහු ඩ්‍රෙබර් පිටුපස යද්දී ගෙනගිය විශාල මුගුර, මේ වෙලාවෙත් ඔහුගේ අතේ තිබුණා. ඒක ඕක් අරටුවෙන් සැදූ ශක්තිමත් දණ්ඩක්."

"ඔබ හිතන හැටියට මොකක්ද සිදු වුණේ?" හෝම්ස් ඇසීය.

මගේ උපකල්පනය මේකයි. ඔහු බ්‍රික්ස්ටන් පාර දක්වා ඩ්‍රෙබර් පසුපස ගියා. එහිදී ඔවුන් දෙදෙනා අතර වූ සණ්ඩුව තවත් සැරයක් ඇවිළුණා. මේකෙදි ෂාපෙන්ටියර් තරුණයා ඩ්‍රෙබර්ට පොලුපාරක් එල්ල කළා. බාගවෙලාවට ඒක වැදුණේ ඩ්‍රෙබර්ගේ බඩට වෙන්න ඇති. ඒකෙන් ඔහු මරණයට පත්වුණා, ශරීරයේ කුමන හෝ ලකුණක් ඉතිරි නොකර. එදා මහවැස්ස සහිත රාත්‍රියක්. පාරේ කිසිවෙක් නැහැ. ෂාපෙන්ටියර් මළසිරුර ඇදගෙන ගිහින් දැම්මා අර පාළු ගෙදර. දල්වා තිබූ ඉටිපන්දම, බිම තිබුණු ලේ, බිත්තියේ කළ ලිවීම සහ මුද්ද, මේ සියලු දේවල් පොලීසිය වැරදි මාර්ගයේ යැවීමේ අරමුණෙන් යෙදූ උපක්‍රම වෙන්න පුළුවනි."

"ඉතාම විශිෂ්ටයි." හෝම්ස් කීවේ දිරිගන්වනසුලු කටහඬකිනි. "ඇත්තෙන්ම ඔබ ඉතා සාර්ථක අන්දමින් ඉදිරියටම යනවා නොවැ

http://sherlockholmesinvestigations.blogspot.com

ග්‍රෙග්සන්. මෙතෙක් අපට ඔබේ නියම දක්ෂකම දකින්න ලැබී තිබුණේ නැහැනේ."

"ඉතා සියුම් අයුරින් මං මේ පරීක්ෂණය, නිවැරදිව කරගෙන ගිය හැටි මතක් වෙනකොටත්, හිතට ලොකු සතුටක් දැනෙනවා. රහස් පරීක්ෂකයා පැවසුවේ පාඩම්බරයෙනි.

"ඉලන්දාරියා ඔහුගේ කැමැත්තෙන්ම කඩ උත්තරයක් දුන්නා."

"ඔහු මට මෙහෙම කිව්වා, මං සෑහෙන දුරක් ඩ්‍රෙබර් පිටුපසින් ගියා. ඔහු දුටුවා මං ඔහුව ලුහුබඳින බව. ඔහු තේරුම් ගත්තා මං එන්නේ හොඳකට නොවෙයි කියලා. මගෙන් බේරිලා යන්න ඔහු කුලීරියකට නැගුණා. ඉතින් මං ගෙදර එන්න ආපහු හැරුණා. ඒ එද්දි මාත් එක්ක නැව්කු එකට වැඩ කළ මගේ පරණ මිත්‍රයෙක් හමුවුණා. අපි දෙන්නා කතා බහ කර කර හුඟක් දුර ඇවිද ආවා ......"

චාපෙන්ටියර් තරුණයා එහෙම කිව්වාම මං ඔහුගෙන් ඇහුවා ඒ මිත්‍රයා ඉන්නෙ කොහෙද කියල. ඒකට සතුටුදායක පිළිතුරක් දෙන්න තරුණයාට බැරිවුණා. මට හිතෙන්නේ දන් නම් කරුණු හැම එකක්ම එකිනෙකට ගැළපෙනවා. අපේ ලෙස්ට්‍රේඩ් ගැන මතක් වෙනකොට මට හිනාගිහිලා පණයනවා. මිනිහ මුල ඉඳලම ගියේ වැරදි පාරක. මං හිතන්නේ නෑ ඔහු ඒකේ වැඩිදුරක් යාවි කියලා..... දෙයියෝ සාක්කි! මතක් කරනකොටම මේ එන්නේ ලෙස්ට්‍රේඩ්!"

ඇත්තෙන්ම ඒ ලෙස්ට්‍රේඩ්ය. කතාබහ කරමින් සිටි නිසා ඔහු විසිත්ත කාමරයට පැමිණෙන ශබ්දයවත් අපට ඇසුණේ නැත. ලෙස්ට්‍රේඩ්ගේ වෙනදා දක්නට ලැබෙන ආත්ම විශ්වාසය හා හැසිරීම අද නැත. ඔහුගේ මුහුණෙන් පෙනුණේ, කැලැඹීමට පත් ලකුණුය. එමෙන්ම ඇඳුම් පොඩිවී කිලිටිවී තිබූ බවක් ද අපි දුටුවෙමු. ඔහු එහි පැමිණ තිබුණේ ෂර්ලොක් හෝම්ස් හමුවී, යම් අදහසක්, උපදෙසක් ලබාගැනීමට විය යුතුය. එහෙත් හදිසියේම ග්‍රෙග්සන් දකින්නට ලැබීමෙන් දෝ ලෙස්ට්‍රේඩ් ලැජ්ජාවට පත්ව සිටියි. තම හිස්වැස්ම ද අතේ තබා ගෙන, ඔහු කාමරය මැද සිටගෙන සිටියේ, කළයුත්තේ කුමක්දැයි තීරණය කරගැනීමට අපහසු අයුරෙනි.

"මේක මහා පුදුමාකාර පරීක්ෂණයක් මහත්මයා. හේතුවාවත් එකකට එකක් නොගැළපෙන, තේරුම් ගන්න බැරි, මහා සංකීර්ණ එකක්."

http://sherlockholmesinvestigations.blogspot.com

"ආ........ඔබටත් ඒ බව තේරුණාද ලෙස්ට්‍රේඩ්?" ග්‍රෙග්සන් කිවේ ජයග්‍රාහී ලීලාවෙනි. ඔබ අන්තිමට මේ නිගමනයට එන බව මං දැනගෙන හිටියා. ඩ්‍රෙබර්ගේ ලේකම් ජෝසප් ස්ටැන්ගසන් ඔබට හමුවුණාද?"

"ජෝසප් ස්ටැන්ගසන්......."ලෙස්ට්‍රේඩ් කිවේ බැරෑරුම් මුහුණකිනි. ඔහු අද උදේ හයට විතර හැලිඩේ පෞද්ගලික හෝටලයේදී මරාදමලා!"

http://sherlockholmesinvestigations.blogspot.com

## 7

# අන්ධකාරයේ ආලෝකයක්.

ලෙස්ට්‍රේඩ් දුන් ආරංචිය අප කොතරම් විස්මයට පත්කළේද යත්, මඳ වේලාවක්-යනතුරු අප තිදෙනාටම කථාකරගත නොහැකි විය. මෙය අප කිසිසේත් බලාපොරොත්තු නොවූ පුවතකි. දුන්නකින් ඉහළට විදිනු ලැබූ ඊගයක් මෙන්, ග්‍රෙග්සන් වාඩිවී සිටි පුටුවෙන් ඉහළට එසැවුණේය. ඔහු අතේ තිබූ වීදුරුවේ වූ විස්කි සියල්ලම ඉවතට හැළිණි. ෂර්ලොක් හෝම්ස්ගේ දෙතොල් එකට තද වී නළල රැළි වැටෙද්දී, මම සියල්ල නිහඬව බලා සිටියෙමි.

"එහෙනම් ස්ටැන්ගසනුත් මරලා? ගැටලුව තව තවත් සංකීර්ණ වෙනවා" හෝම්ස් කීය.

"මේකට කලිනුත් ගැටලුවේ තිබුණු සංකීර්ණ බවේ අඩුවක් තිබුණේ නැහැ." කෙඳිරි ගෑ ලෙස්ට්‍රේඩ් අසුනක් තමා වෙතට ඇද ගත්තේය. මගේ මොළේ මහ අවුල්ජාලයක පැටළිලා වගෙයි මට දැනෙන්නේ."

ඔබට..........ඔබට හොඳටම විශ්වාසද මේ ආරංචිය ඇත්තක් කියලා?" ග්‍රෙග්සන් ඇසුවේ ගොතගසමිනි.

"මං දැන් මේ එන්නේ, ඔහු මරාදමා තිබූ කාමරයේ ඉඳලා. ඔහුට අත්වුණු ඉරණම ගැන මුලින්ම දැනගත්තේ මම."

"අපි මෙච්චර වෙලා මේ සිද්ධිය ගැන, ග්‍රෙග්සන්ගේ අදහස් වලට සවන් දීගෙනයි හිටියේ." හෝම්ස් කීය. "ඔබ මොනවද කළේ, දකින්න ලැබුණේ මොනවද කියලා අපට කියන්න."

"ප්‍රශ්නයක් නෑ. මං කියන්නම්."

ලෙස්ට්‍රේඩ් තමා ළං කරගත් පුටුවේ හිඳගත්තේය. "මං මුලින්ම ඔබට කියන්නම්, මං හිතාගෙන හිටියේ ඩ්‍රෙබර්ගේ මරණය ගැන

http://sherlockholmesinvestigations.blogspot.com

වගකිවයුත්තා මේ ස්ටැන්ගසන් කියලයි. නමුත් මේ සිදුවීමෙන් පෙනෙනවා,, යූස්ටන් දුම්රිය පොලේ ඉඳපු බවට, ඇසින් දුටු සාක්ෂි තියෙනවා. මට විසඳගන්න ප්‍රශ්න දෙකක් තිබුණා. එකක්, රෑ අටහමාරේ ඉඳලා මිනීමැරුම සිදුවුණු වෙලාව වෙනතුරු ස්ටැන්ගසන් සිටියේ කොහෙද? දෙවැන්න ඊට පස්සේ ඔහුට මොකක්ද වුණේ ?

ස්ටැන්ගසන්ගේ හැඩහුරුකම සහ විස්තර ගැන කියලා, මං වහාම ලිවර්පූල් වරායට විදුලිපුවතක් යැව්වා. මං ඔවුනට දනුම් දුන්නා, ඇමරිකාව බලා පිටත්වෙන නැව්වලට මේ වගේ කෙනෙක් නගිනවද යන්න ගැන, සෝදිසියෙන් ඉන්න කියලා. ඊළඟට ඔහු ගැන සොයා බලමින්, මං යූස්ටන් අවට හැම හෝටලයක්, හැම නේවාසිකාගාරයක් ගණන්නම් ගියා. මගේ හිතට නැගුණේ මෙහෙම අදහසක්. ඔහු ඩ්‍රෙබර් සමග එකට හිටියා) නමුත් ඩ්‍රෙබර් සෙනග අතර මහහැරුණා. එතකොට මොකක්ද ස්ටැන්ගසන් ගන්න පියවර? එහෙනම් ඔහු යූස්ටන් දුම්රියපොළ අවට කොහේ හරි තැනක රාත්‍රියට ලැගුම් ගනීවි. ඊළඟට පසුවදා උදේට යළිත් දුම්රිය පොළට ඇවිත් හොයලා බලාවි."

"සෙනග අතරේ එහෙම මගහැරී ගියොත්; හමුවෙන්න තැනක් ගැන, බාගවෙලාවට ඔවුන් කලින් තීන්දු කරගෙන තියෙන්නත් ඇති." හෝම්ස් කීය.

"හරියටම හරි හෝම්ස් මහත්තයා. එහෙම තමා වෙලා තිබුණේ. ඊයේ මුළු හවස් වරුවෙම මං ගත කළේ, හෝටලයක් ගාණේ යමින්, ඔවුන් ගැන විමසමින්., ඒත් කිසි වැඩක් වුණේ නෑ. ඊට පස්සේ අද උදේ පාන්දරින්ම ඒ වැඩේ මං අයෙමත් පටන්ගත්තා. අද උදේ අට වෙද්දී මං ගියා, ලිට්ල් ජෝජ් වීථියේ හැලිඩේ පෞද්ගලික හෝටලයට.

"ස්ටැන්ගසන් කියලා ඇමෙරිකන්ජාතික මහත්මයෙක් මේ හෝටලයේ ඉන්නවද?"

"ඇත්තෙන්ම ඔව්. එහෙනම් ඔබ වෙන්න ඇති, ඔහු හමුවෙන්න බලාපොරොත්තුවෙන් ඉන්න මහත්මයා? ඔහු දන් මෙහේ ලැගුම් ගෙන දින දෙකක් වෙනවා. මේ දවස් දෙකේම ඔහු ඔබ එනතුරු බලාගෙන හිටියේ."

http://sherlockholmesinvestigations.blogspot.com

"කෝ ඔහු දැන්?" මං ඇහුවා.

"ඔහු ඉන්නේ ඉහළ තට්ටුවේ කාමරයක. මේ වෙලාවේ නිදි. උදේ නවයට ඔහුව අවදිකරන්න කියලා අපට කිව්වා."

"කමක් නෑ. මං යන්නම් උඩ තට්ටුවට. ගිහින් ඔහුව හමුවෙන්නම්." මං කීවා.

"මට හිතුණේ, ඔහු බලාපොරොත්තු නැති විදියට මං එක්වරම ඔහුගේ කාමරයට යා යුතුයි. ඔහුගෙන් ප්‍රශ්න කිරීම හිටිහැටියේම කළොත්, මට වාසියක් සැලසෙන්න ඉඩ තියෙනවා. එතකොට ඔහුට කරුණු සැකසීමට අවස්ථාවක් ලැබෙන්නේ නෑ. නොදැනුවත්වම මොනවා හරි කියවෙන්න ඉඩ තියෙනවා. ආගන්තුකයන්ගේ සපත්තු මදින, බඩු ගෙනියන ළමයා කැමතිවුණා, මට ඒ කාමරය පෙන්වන්න.

ඒ කාමරය තිබුණේ දෙවැනි තට්ටුවේ. කාමරයේ දොර දෙසට යාමට තිබුණේ පටු කොරිඩෝවක්. ඒ කොලුවා මට කාමරයේ දොර පෙන්වලා, ආපසු පහළ තට්ටුවට බහින්නයි සූදානම් වුණේ. එතකොටම මම අහම්බෙන් වගේ දුටුවා, මගේ සිතේ මහා අප්‍රසන්න හැඟීමක් ඇති කළ දෙයක්. අවුරුදු විසිපහක් පොලිස් නිලධරයෙක් ලෙස රාජකාරී කළත්, මගේ සිතට ඒ හැඟීම ඇතිවුණා.

කාමරයේ දොර යටින් රතු පීත්ත පටියක් එලුවා වගේ, රතුපාටට යමක් කොරිඩෝව වෙත ගලා ඇවිත් තිබුණා. ඒකෙන් කොරිඩෝවේ කුඩා විලක් සෑදී තිබුණා. ඒ ලේ විලක් බව හඳුනාගන්න, මට මොහොතක් ගතවුණේ නැහැ. මට එක්වරම කෑගැසුණා. කොලුවා වහාම ආපසු දුවගෙන ආවා. ලේ විල දුටු ගමන් ඔහු තව ටිකෙන් එතැනම ක්ලාන්ත වෙනවා. දොර ඇතුළතින් අගුළු දමා තිබුණේ. අපි දෙන්න දොර තල්ලු කරලා, අගුළ කඩලා එය විවෘත කරගත්තා.

කාමරයේ ජනේලය ඇර දමා තිබුණා. ජනේලය අසලම තිබුණේ රාත්‍රි ඇඳුමෙන් සැරසුණු කෙනෙකුගේ මළසිරුර. ඒක තිබුණේ එකට ගුලිගැහිලා වගේ. ඔහු මියගිහින් සෑහෙන වෙලාවක් වෙන්න ඇති. ඒ මොකද, අත් පා සීතලව දරදඬු වෙලා තිබුණා. මං ඔහුගේ මුහුණ උඩ අතට හැරෙව්වා. ඒ දින දෙකකට කලින් මේ කාමරයේ ලැගුම් ගත් මහත්මයා බව හඳුනාගන්න සේවකයාට හැකිවුණා. මරණයට හේතුව ශරීරයේ වම් පැත්තේ ඇති වූ තුවාලයක්. ඒක ගැඹුරට, හදවත පසාරු කරගෙන ගිහින් තියෙන්න ඇති. මීළඟට

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only, Not For Print

මට කියන්න තියෙන්නේ මා දුටු පුදුමාකාරම දෙය. මළසිරුරට උඩින් මට දකින්න ලැබුණේ මොකක් කියලද ඔබ හිතන්නේ?"

මගේ ඇඟ කිළිපොළා ගියේය. ෂර්ලොක් හෝම්ස් කථාකිරීමට පෙරම මගේ සිතේ ඇතිවූයේ භීතියකි.

"බිත්තියේ ලේ වලින් RACHE කියලා ලියලා තිබුණාද?" හෝම්ස් ඇසීය.

"හරියටම හරි හෝම්ස් මහත්තයා." ලෙස්ට්‍රේඩ් කීවේ කම්පාවට පත් හඬිනි. අපි සියලුදෙනාම නිශ්ශබ්දව මදවේලාවක් බලා සිටියෙමු.

කවුද මේ ඝාතකයා? ඔහු මිනීමැරුම් සිදුකරන්නේ යම් ක්‍රමානුකූල පිළිවෙළකටයි. එහෙත් මෙයේ මිනිසුන් මරාදැමීමට හේතුව වත්, එය මෙවැනි සංකීර්ණ ආකාරයකට සිදුකරන්නේ ඇයිද කියාවත් අපට සිතාගැනීමට නොහැක. එහෙයිනම මේ අපරාධ වල බිහිසුණු බව තවත් වැඩිවේ. යුදපිටියේ පවා නොසැළුණු මගේ සිතේ තරමක කම්පනයක් දනිණි.

ලෙස්ට්‍රේඩ් යළිත් කථාව පටන්ගත්තේය.

"අපරාධකාරයා දකපු කෙනෙක් ඉන්නවා. හෝටලය පිටුපසින් වැටී තිබූ පාරකින්, කිරිපට්ටියකට ගිය එහි සේවකයෙක් තමා, ඔහුව දකල තියෙන්නේ. මේ ළමයා දුටුවාලු ඔහුට කවදාවත් දකින්න නොලැබුණු දෙයක්. දෙවැනි තට්ටුවෙ කාමරයක ජනේලයක් වෙතට, බිම සිට ඉණිමගක් යෝජනාකර ඇති සැටිත්, ඒ ජනේලය විවෘතව තිබුණු හැටිත් ඔහු දුටුවාලු. මෙතැන පහු කරලා ගිය කිරිකාරයා තවත් සැරයක් ආපහු හැරීල බලල තියෙනවා. එතකොට ඔහු දුටුවාලු අර ඉණිමග දිගේ කෙනෙකු, පහළට බහින හැටි. කිසිගණනකට නැතිව ඒ මිනිහ පහළට බැස්ස පිළිවෙළට ඒ ළමයාට හිතුණාලු, මේ හෝටලයේ අලුත්වැඩියා කටයුත්තකට ගිය වඩුබාස් කෙනෙකු වෙන්න ඇති කියලා. ඒ ළමයාට මතක හැටියට ඒ මිනිහා රතුපාට මුහුණක් තියෙන උස කෙනෙක්. දුඹුරු පැහැති පිට කබායක් හැඳ සිටියාලු.

මිනීමැරුමෙන් පස්සේ ඔහු ටික වෙලාවක් කාමරයේ රැඳී ඉන්න ඇති කියල මට හිතෙනවා. ඒ බවට අපට සාක්ෂි ලැබුණා. කාමරයේ වතුර බේසමේ වතුරවල ලේ තිබුණා. මිනීමරුවා අත්

http://sherlockholmesinvestigations.blogspot.com

සෝදාගන්න ඇති. ඊළඟට ඔහු ඉතාකුමින්ම පිහියේ තිබුණු ලේ, ඇඳරෙදි වලින් පිහිදා ගෙන තිබුණා."

ෂර්ලොක් හෝම්ස් මිනීමරුවා ගැන කල්තබා කළ විස්තරයට හරියටම සැසඳෙන දේහ ලක්ෂණ, තිරිකරුවා විසින් ද දැක ඇත. මම හෝම්ස් දෙස බැලීමි. එහෙත් සතුටට හෝ තෘප්තියට පත් ලකුණක් ඔහුගේ මුහුණේ පිළිබිඹු නොවීය.

"මිනීමරුවා ගැන තොරතුරක් ලබා ගතහැකි යම් හෝඩුවාවක් ඔබට කාමරයෙන් හමුවුණේ නැද්ද?" හෝම්ස් ඇසීය.

"මොකුත් නෑ. ඩ්‍රෙබර්ගේ මුදල් අසුම්බිය, ස්ටැන්ගසන්ගේ සාක්කුවේ තිබුණා. ඒකේ මොකුත් අමුත්තක් නැහැ. ඒ මොකද මුදල් ගෙවීමේ කටයුතු හැම විටම වාගේ කරල තියෙන්නේ ස්ටැන්ගසන් නිසා. ඒකේ පවුම් අසූවකට වැඩිය මුදලක් තිබුණා. නමුත් කිසිවක් අරගෙන නැහැ. මේ බිහිසුණු අපරාධවල අරමුණ මොකක්ද කියන්න මං දන්නේ නැහැ. නමුත් පැහැදිලිවම මුදල් මංකොල්ලකෑම නම් නොවෙයි. විදුලි පුවතක් හැරෙන්න ස්ටැන්ගසන්ගේ සාක්කුවල ලියුම් හෝ සටහන් කිසිවක් තිබුණේ නැහැ."

"මොකක්ද ඒ විදුලි පුවත?"

"ඒක මාසෙකට විතර කලින් ඇමෙරිකාවේ ක්ලීව්ලන්ඩ් සිට එවූ එකක්. මෙන්න එය."

***J.H. දැන් යුරෝපයේ***

එය එවූ කෙනෙක් ගැන සඳහන් වී නොතිබිණි.

වෙන මොකුත්ම තිබුණේ නැද්ද කාමරයේ? හෝම්ස් ඇසීය.

"ඒ තරම් වැදගත් දෙයක් තිබුණේ නැහැ. ඇඳ උඩ තිබුණා ඔහු කියවමින් සිටි නවකථාවක්. ඔහුගේ පයිප්පය තිබුණා, ඒ අසලම පුටුවක් උඩ. මේසය උඩ තිබුණා වතුර වීදුරුවක්. ජනෙල් පඩිය උඩ තිබුණා පුංචි පෙට්ටියක්. ඒකෙ ඇතුළත තිබුණා බෙහෙත් පෙති කීපයක්."

ෂර්ලොක් හෝම්ස් පුටුවෙන් ඉහළට පැන්නේ ඉවසාගත නොහැකි සන්තෝෂයකිනි. "අන්න අන්තිම පුරුක." හෝම්ස් කීය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මගේ දම්වැල සම්පූර්ණ කිරීමට තිබුණු අඩුව මෙච්චරයි. දැන් මගේ විසඳුම සම්පූර්ණයි."

පොලිස් රහස්පරීක්ෂකයන් දෙදෙන හෝම්ස් දෙස බලා සිටියේ අතිශයින්ම පුදුමයට පත්වය.

"දැන් මං ළඟ තියෙනවා......" හෝම්ස් කථාව පටන්ගත්තේය. "මේ පැටළුණු අවුලේ ඔක්කොම නූල් පොටවල කෙළවරවල්. මේ අවුල ලිහාගැනීම දැන් බොහොම පහසුයි. තේරුම් ගන්න අමාරු, පුරවා ගත යුතු, හිස් තැන් කිහිපයක් තිබෙන බව ඇත්තයි. නමුත් මූලික කරුණු හැම එකක්ම පැහැදිලියි. ඩ්‍රෙබර් දුම්රිය පොළේදී ස්ටැන්ගසන් ගෙන් වෙන්වුණු තැන ඉඳලා, ඔහුගේ මිනිය හමුවූ තැනට එනතුරු, හැම එකක්ම පැහැදිලියි. මගේ ඇස්වලින් බලාහිටිය වගේ ඒ හැම දෙයක්ම මට දැන් පැහැදිලිව පෙනෙනවා. මං ලබාගත් ඒ දැනුම නිවැරදි බව, මං ඔබට ඔප්පුකර පෙන්වන්නම්. කෝ ලෙස්ට්‍රේඩ්, ඒ බෙහෙත් පෙති අඩංගු පෙට්ටිය ඔබ ගෙනාවද?"

"ඔව්. මා ළඟ තියෙනවා." ලෙස්ට්‍රේඩ් කීවේ සුදු පැහැති කුඩා පෙට්ටියක් සාක්කුවෙන් එළියට ගනිමිනි.

"මං මේ පෙට්ටියත්, මුදල් පසුම්බියත්, විදුලි පුවතත් අරගත්තේ පොලිස් ස්ථානයට ආරක්ෂාව සඳහා භාර දෙන්නයි. මේ පෙට්ටිය ගත්තේ අහම්බෙන් වගේ. ඇත්තම කියන්නම්. මේකෙ ඇති වැදගත්කමක් මට නම් පෙනුණෙ නැහැ."

"ඕක මෙහාට දෙන්න." හෝම්ස් එය ඉල්ලා ගත්තේය. "දොස්තර මහත්තයා මේක පරීක්ෂා කරල බලන්න. මේව සාමාන්‍ය බෙහෙත් පෙතිද?"

මම ඒවා පරීක්ෂා කර බැලීමි. ඒවා සාමාන්‍ය බෙහෙත් පෙති බවට සලකුණක් නොවීය. ආලෝකයෙන් යන්තමට විනිවිද පෙනුණු, එම කුඩා වටකුරු ගුළිවල තිබුණේ අළු පැහැයකි.

"පැහැල්ලු බව නිසාත්, විනිවිද පෙනෙන ගතිය නිසාත්, මං හිතනවා මේවා වතුරේ දියවේවි කියලා." මම කීවෙමි.

"ඉතාම නිවැරැදියි." හෝම්ස් කීය. "ඉතින් දොස්තර මහත්තයා. දැන් ඔබට පුළුවන්ද මට උදව්වක් කරන්න?"

අපේ ගෙහිමි කාන්තාවට අයත්, බල්ලෙකු ගැන ඇය කීවා ඔබට මතකද? ඇය ඔබට කිව්වෙ සෑහෙන කාලයක ඉඳන් අසනීප

http://sherlockholmesinvestigations.blogspot.com

වී, මෙහෙම දුක් විඳින එකෙත් ඉවරයක් කරන්න කියලා? අන්න ඌව මෙහාට අරගෙන එන්න පුළුවන්ද?"

මම පහළ තට්ටුවට බැස ගියෙමි. සෑහෙන කාලයක සිට රෝගී බවට පත්ව වේදනා විඳිමින් සිටි බල්ලා, මම දෑතින් ඔසවා ගතිමි. ඉතා අපහසුවෙන් ඌ හුස්ම ගන්නා අයුරෙනුත්, මැලැවුණු දෑසෙනුත්, උගේ අවසානය අද හෙටම සිදුවිය හැකි බැව් මට පෙනීගියේය. උගේ ගෙල පෙදෙසින් මට දකින්නට ලැබුණේ, සාමාන්‍යයෙන් බල්ලෙකුට උරුම ආයුෂට වඩා වැඩි කාලයක්, ඌ ජීවත් වී ඇති බවයි. මම ඌ ඔසවාගෙන ගොස්, බුමුතුරුණ මත වූ කොට්ටය උඩින් තැබීමි.

"මං මේ බෙහෙත් පෙත්තක් දෙකට කපනවා." පෑන පිහිය අතට ගත් හෝම්ස් කීය. ඊළඟට ඔහු එම කටයුත්තේ යෙදුණේ ඉතා පරෙස්සමිනි.

"මෙයින් එක භාගයක් අපි ආපහු පෙට්ටියට දමමු. අනෙක් භාගය මේ වීදුරුවට දමමු. වීදුරුවේ තිබෙනවා වතුර තේහැන්දක ප්‍රමාණය. මගේ මිත්‍ර දොස්තර මහත්තයා කිව් දේ ඇත්ත බව දැන් ඔබට පෙනෙනවා ඇති. ඒක වතුරේ ඉක්මනින් දියවී ගෙන යනවා."

"මේක බොහොම සිත්ගන්නාසුලු පරීක්ෂණයක් වෙන්න පුළුවනි."

ලෙස්ට්‍රේඩ් කීවේ මෙය තමාට සිනාසීමට යොදාගත් උපක්‍රමයක් දෝයි සැක සිතමිනි. "නමුත් මට නම් පෙනෙන්නේ නෑ, මේක ජෝසප් ස්ටැන්ගසන්ගේ මරණයට සම්බන්ධ වෙන්නේ කොහොමද කියලා?

"ඉවසන්න මගේ මිත්‍රයා, ඉවසන්න. ටිකවේලාවක් ගත වෙද්දී ඔබට පෙනේවි, එය සම්බන්ධ වෙන්නේ කොහොමද කියලා. දැන් මං මේ බෙහෙත් පෙති භාගය දිය කළ වතුරට, කිරි ස්වල්පයක් දමනවා. එතකොට අපට පෙනේවි, අප්‍රියක් නැතුව මේ බල්ලා ඒක ඉක්මනින් බොන හැටි."

මෙසේ කියමින් හෝම්ස් වීදුරුවේ වූ කිරි මිශ්‍ර බෙහෙත, පීරිසියට වත්කළේය. ඊළඟට ඔහු එය බල්ලා ඉදිරියෙන් තැබීය. පීරිසියේ වූ සියල්ල ඉතා ඉක්මනින් ගිල දැමූ බල්ලා, එය ලෙව කා පීරිසිය පිරිසිදු කළේය.

http://sherlockholmesinvestigations.blogspot.com

ෂර්ලොක් හෝම්ස් මෙතෙක් පැවසූ දෙයින් හා ක්‍රියාකළ අයුරෙන්, අපට ඔහු සතු දක්ෂතාවය පිළිබඳව විශ්වාසයක් ගොඩ නැංවී තිබිණ. එහෙයින් සතා කෙරෙහි අවධානය යොමු කොට, අපි නිහඬව බලා සිටියෙමු. අප සිතා සිටියේ උගේ පිළිවෙළේ ලොකු වෙනසක්, ඉතා ඉක්මනින් අපට දකින්නට ලැබේවි කියාය. සෑහෙන වේලාවක් බලා සිටියත් කිසිදු වෙනසක් සිදුනොවීය. බල්ලා ඌට සුපුරුදු ආකාරයටම අමාරුවෙන් හුස්ම ගනිමින් නිදන්නට පටන්ගත්තේය. ඌට ලැබුණු බෙහෙත් නිසා උගේ තත්ත්වය යහපත් අතට හෝ අයහපත් අතට හැරුණු බවට ලකුණක් හෝ නොවීය.

තම ඔරලෝසුව අතට ගත් හෝම්ස් ඒ දෙසට නෙත් හෙළමින් බලාසිටියේ නොඉවසිල්ලෙනි. මිනිත්තුවෙන් මිනිත්තුව ගත වී ගියත් බල්ලාගේ සිදුවූ වෙනසක් නොවීය. හෝම්ස්ගේ මුහුණේ බලාපොරොත්තු සුන් වී යන ලකුණු අපට දකින්නට ලැබිණි. යටිතොල සපාගත් ඔහු ඇඟිලිවලින් මේසයට තට්ටුකළේ නොඉවසිල්ල පළකරමිනි. මගේ මිත්‍රයා කොපමණ අතැවිල්ලකට පත් වී සිටියේද යත්, මට ඔහු ගැන කණගාටු සිතිණ. එහෙත් පොලිස් නිලධරයන් දෙදෙනාගේ ආකල්ප නම් ඊට හාත්පසින්ම වෙනස් විය. හෝම්ස් මුහුණපා තිබූ පරාජය ඉදිරියේ, ඔවුන්ගේ මුහුණුවල නැගී තිබුණේ උපහාසාත්මක සිනාය.

" මේක කොහොමටවත් අහම්බෙන් සිදුවුණු දෙයක් වෙන්න බෑ." හෝම්ස් කීවේ අසුනෙන් නැගී සිටිමිනි. ඔහු කාමරයේ ඉහළ පහළ සක්මන් කිරීමට පටන්ගත්තේය.

"ඩ්‍රෙබර්ගේ මරණය සිදුකිරීමට සමත්වුවාය කියා මා සිතූ විෂ පෙති, ස්ටැන්ගසන් මියගිය තැන තිබී හමුවුණා. මේක කොහොමද අහම්බෙන් සිදුවුණු දෙයක් වෙන්නේ. නමුත් දැන් අපට ඔප්පු වුණා ඒ පෙතිවල කිසිම විෂක නැති බව. මොකක්ද මේකෙ තේරුම? නිරීක්ෂණ අනුව මං නිගමනවලට ආවා. මේ නිගමන එකකට එකක් ඈමිණිලා තියෙන්නේ, දම්වැලක පුරුක් වගේ. මේ නැම එකක්ම සම්පූර්ණයෙන්ම වැරදි වෙන්න බෑ? ඒ වුණත් මේ මරණාසන්න බල්ලාට බෙහෙත් පෙති වලින් වුණු විපතක් නෑ."

"අහා! මට තේරුණා! මට තේරුණා!! "

අපමණ සතුටෙන් ඔහු යළිත් දිව ගියේ, බෙහෙත් පෙති පෙට්ටිය තිබූ තැනටයි. එය අතට ගත් ඔහු, ඒ තුළ වූ අනෙක්

http://sherlockholmesinvestigations.blogspot.com

පෙත්ත දෙකට කැපුවේය. එය පෙර පරිදිම වතුරේ දියකොට, කිරි ස්වල්පයක් දමා බල්ලා දෙසට ළං කළේය. එම අවාසනාවන්ත සතාගේ දිව, එම දියරයෙන් තෙමුණා පමණකි. වලිප්පුව පැදුණු රෝගියෙකුගේ මෙන් උගේ මුළු සිරුරේම පේශි සංකෝචනය වීමට පටන් ගත්තේය.

විළඟට උං එක්වරම දරදඬු වී, එක් ක්ෂණයකින් මැරී වැටුණේ අකුණු පහරක් වැදුණු අයුරෙනි.

දිග සුසුමකින් ළය සැහැල්ලු කරගත් හෝම්ස්, නළල් තලයේ වූ ඩහදිය පිසදැම්මේය.

“මගේ ක්‍රමයේ නිවැරදිකම ගැන, මං මීට වඩා විශ්වාසයක් ඇතිකරගන්න ඕනෙ.” හෝම්ස් කීය.

“එකින් එක බැඳුණු පූර්ව නිගමන රැසක් මගින් අවසන් නිගමනයකට ආවාම, ඒක එක්වරම කඩවැටෙන්න විදියක් නෑ. අවසන් නිගමනයේ වැරදි බවක් පෙනෙනවා නම්, ඒකට හේතුව වෙනත් විකල්ප තිබීම විය හැකියි. පෙට්ටියේ තිබුණු අර පෙති දෙකෙන් එකක් උග්‍ර විෂ. අනෙක කිසිම විෂක් නැති ද්‍රව්‍යයක්. මය පෙට්ටිය දකින්න කලින් සිටම මං එය දැනසිටිය යුතුව තිබුණා.”

ඔහු අන්තිමට පැවසූ ඒ වැකිය ගැන මම පුදුමයට පත්වීමි. මෙය ඔහු සිහිකල්පනාවෙන් කියන ලද්දක්ද? එහෙත් බල්ලාගේ මළසිරුර අප ඉදිරිපිට ඇත.

ෂර්ලොක් හෝම්ස් විසින් කරන ලද විනිශ්චය නිවැරදි බව එයින්ම සනාථ වේ. මගේ මනස වසා පැවති මීදුම් වලාවන් දැන් ක්‍රමයෙන් ඉවත්වී යාමට පටන්ගෙන ඇත. දැන් මට සත්‍යය කෙමෙන් කෙමෙන් අවබෝධ වෙමින් ඇත.

“මේ හැම දෙයක්ම ඔබට පෙනෙනවා ඇත්තේ මහ පුදුමාකාර විදියටයි.” හෝම්ස් කථාව පටන්ගත්තේය. “ඒකට හේතු වුණේ මොකක්ද දන්නවද? පරීක්ෂණය මුලදීම එක් වැදගත් හෝඩුවාවක් පමණක් මතු වුණා. නමුත් ඒක නිසිපරිදි ග්‍රහණය කරගන්න ඔබට හැකි වුණේ නෑ. නමුත් ඒක හොඳින් හඳුනාගෙන, මගේ ප්‍රයෝජනයට යොදාගන්න තරම් මං වාසනාවන්ත වුණා. එතැන් සිට ඉදිරියට වුණු සිදුවීම් මොනවද? ඒ හැම දෙයකින්ම මගේ සිතේ ඇතිවූ

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

සැකය, තවදුරටත් තහවුරු වුණා. ඔයින් මෙයින් මොකක්ද අන්තිමට සිදුවුණේ? ඔබව පුදුමයට පත්කළ ඔබට ප්‍රහේලිකාවක් වුණු කාරණාවලින්, මගේ සිතට ලැබුණේ ලොකු පහසුවක්. ඒවායින් මගේ සිතේ තිබුණු ගැටලුව, ටිකෙන් ටික ලිහී යන්න පටන් ගත්තා. මගේ නිගමනය වඩාත් ශක්තිමත් වෙන්න පටන්ගත්තා. හොඳට මතක තියාගත යුතු දෙයක් මං කියන්නම්. අද්භූත ගතිය කියන එක, අභිරහස කියන දේ කියලා පටලවා ගැනීම ලොකු වැරැද්දක්. බොහොම සාමාන්‍ය විදියට පෙනෙන අපරාධ තමා, බොහෝවිට සංකීර්ණ අභිරහස් වෙන්නේ. ඒ මොකද අපට නිගමනවලට එළැඹිය හැකි අලුත් හෝඩුවාවල් හෝ විශේෂ නිරීක්ෂණ ඒවායේ නැහැ."

අපි නිකමට හිතමු ඩ්‍රෙබර්ගේ මළසිරුර, පාර අයිනේ වැටී තිබුණා කියලා: පාළු ගේකට ඔහු කැඳවාගෙන යන්නේ නැතිව, ලේ වලින් යමක් බිත්තියේ තොලිහා තිබුණා කියලා: එහෙම නම් මේ ගැටලුව විසඳාගන්න එක මීට වඩා අමාරු වෙනවා. අපරාධය හා බැඳී තිබුණු සංකීර්ණ දේවල් නිසා, එය විසඳීමට අමාරු වුණා නෙමෙයි ලෙහෙසි වුණා."

මෙතෙක් වේලා හෝම්ස්ගේ දේශනාව නිහඬව, ඉතා අපහසුවෙන් අසා සිටි ග්‍රෙග්සන්ට, තවත් ඉවසා සිටීමට හැකි වුයේ නැත.

"මේක අහන්න ෂර්ලොක් හෝම්ස් මහත්තයා." ඔහු කීය.

"ඔබ බොහොම දක්ෂයෙක් කියලා පිළිගන්න අපි සූදානම්. ඔබ මේවා විසඳන්න යොදාගන්නේ පුදුමාකාර, අද්විතීය ක්‍රම කියන එක පිළිගන්නත්, අප හැම දෙනාම සූදානම්. ඒ වුණත් දැන් අපි කැමතියි ඔය දේශනා වලටයි, උපකල්පන වලටයි වඩා යමක් දකින්න. කෝ මේ මිනීමැරුමට වගකිවයුතු අපරාධකාරයා? අප ඔහු අල්ලා ගත යුතුයි. මං අර් ෂාපෙන්ටියර් තරුණයාව අල්ලගත්තා. දැන් පෙනෙන හැටියට අර දෙවැනි මිනීමැරුමට ඔහු සම්බන්ධ වෙන්න ක්‍රමයක් නැහැ. ඒ අනුව පෙනෙන්නේ මගේ ගමන් මග වැරදි බවයි. ලෙස්ට්‍රේඩ් ගියා ස්ටැන්ගසන් පිටුපසින්. නමුත් ලෙස්ට්‍රේඩුත් වැරදි බව දැන් අපට පෙනෙනවා. ඔබ එහෙන් මෙහෙන් කාරණා ටිකක් එළිකරනවා. පෙනෙන හැටියට නම් ඔබ අපට වඩා මොනවා හරි දන්නවා. දැන් ඉතින් අපට කාලය ඇවිත් තියෙන්නේ. අපටත් අයිතියක් තියෙනවා ඔබෙන් අහන්න: මේ

http://sherlockholmesinvestigations.blogspot.com

අපරාධය ගැන ඔබ දන්නේ මොනවාද? මේ අපරාධකාරයාගේ නම ඔබට හෙළිකරන්න පුළුවන්ද?"

"මහත්මයා. මමත් සම්පූර්ණයෙන්ම එකඟවෙනවා ග්‍රෙග්සන් කියූ දෙයට." ලෙස්ට්‍රේඩ් කීය. "අපි දෙන්න අපේ සම්පූර්ණ උත්සාහය යෙදුවා. ඒත් අසාර්ථක වුණා. ඔබ මේ කාරණයේදී කිහිප සැරයක්ම කිව්වා, ඔබට උවමනා කරන සාක්ෂි හැම දෙයක්ම ඔබ ළඟ තියෙනවා කියලා. ඇයි ඉතින් ඔබ ඒවා තවදුරටත් හංගාගෙන ඉන්නේ?"

"අපරාධකාරයා අත්අඩංගුවට ගැනීම ප්‍රමාද වුණොත් තවත් අපරාධ සිදුවන්න පුළුවනි." මම කීවෙමි.

අප හැමදෙනාගෙන්ම හෝම්ස් වෙත එල්ල වූයේ පීඩනයකි. එහෙත් ඔහුට තීරණයක් ගැනීමට අපහසු බව පෙන්වමින්, හෝම්ස් කාමරයේ ඉහළ පහළ සක්මන් කිරීමට පටන්ගත්තේය.

"තවත් මිනීමැරුම් සිදුවන්නේ නෑ." සක්මන නවත්වා ඔහු කීවේ අපේ මුහුණු දෙස එක එල්ලේ බලමිනි.

"ඒ ගැන ඔබේ හිත්වල සැක තියෙනවා නම් ඒවා ඉවත්කරගන්න පුළුවනි. ඔබ ඇහුවා අපරාධකාරයාගේ නම මං දන්නවද කියලා. ඔව් මං දන්නවා. නමුත් නම දැනගැනීමෙන්ම මේ ප්‍රශ්නය විසඳෙන්නේ නැහැ. නම දැනගැනීම සුළු දෙයක්. නමුත් ඔහු අල්ලා ගැනීම ඊට වඩා බොහොම බැරෑරුම් දෙයක්.

ඒක බැරෑරුම් දෙයක් වුණත් බොහොම ඉක්මනට කරන්න මං බලාපොරොත්තු වෙනවා. මං සැලසුම් කර තිබෙන පිළිවෙළ අනුව, ඒක සාර්ථක අයුරින් ඉටුකරන්න ලැබේවි කියලා මට විශ්වාසයි. නමුත් අප ඒක ක්‍රියාවට නැංවිය යුත්තේ ඉතාම සියුම් ආකාරයට. ඒ මොකද, මේ මිනිහා බොහොම කෛරාටික පුද්ගලයෙක්. ඒ වගේම ඔහු ඉවසනසුලු ශාන්ත දාන්ත මිනිහෙක් නොවෙයි. අනෙක මට සාක්ෂි ලැබිල තියෙනවා, ඔහු වගේම දක්ෂ උදව්කාරයෙකුගේ සහයෝගයත්, අපරාධකාරයාට ලැබෙන බව. මේ මිනිහා තවමත් හිතාගෙන ඉන්නේ, ඔහු ගැන කිසිම හෝඩුවාවක්, වෙනත් කිසිකෙනෙක් දන්නේ නැහැ කියලයි. ඔන්න ඔය තත්ත්වය දිගටම පැවතුණොත්, ඔහුව අල්ලා ගන්න යම් යම් අවස්ථා එළඹේවි. ඒ වුණත් ඔහුගේ හිතේ යන්තමින් හෝ සැකයක් ඇතිවුණොත් ?

Reading Purpose Only. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

එහෙම වුණොත් ඔහු එහාම අතුරුදන් වේවි. තමන්ගේ නමත් වෙනස් කරගෙන, මේ නගරයේ ඉන්න මිලියන හතරක ජනතාව අතරේ අතුරුදන් වේවි."

මේ වෙලාවේ මට මෙහෙම දෙයකුත් ඔබට කියන්න සිද්ධවෙනවා. ඒ ඔබ දෙදෙනාගේ සිත් රිදවීමේ අරමුණෙන් කියන දෙයක් නොවෙයි. නමුත් මම ඇත්තම කියන්නම්, අපරාධකාරයා සහ ඔහුගේ මිත්‍රයා, ස්කොට්ලන්ඩියාඩ් පොලිසියේ බුද්ධි අංශයට වඩා ඉහළ මට්ටමක ඉන්නා අය. පොලිසියට ඔවුන් අල්ලාගන්න තියා හිතන්නවත් බෑ. අන්න ඒ නිසයි මං ඔබේ ආධාරය ඉල්ලා නොහිටියේ. යම් විධියකින් මං අසාර්ථක වුණොත්, එහි වගකීම මං භාරගන්නවා. දන් මං මේ ටික ඔබට කියන්නම්. මගේ රහස් ආරංචි මාර්ග අවදානමකට ලක්කරන්න මට හැටියක් නෑ. නමුත් ඔවුන් අවදානමකට ලක් නොකර, ඔබට ආරංචියක් දෙන්න හැකිවුණු විහාම මං එය කරන්නම්. ඒක ගැන මං ඔබට පොරොන්දු වෙන්නම්."

හෝම්ස් දඩි විශ්වාසයකින් හා අවංකව මේ පොරොන්දුව දුන්නත් ග්‍රෙග්සන් හා ලෙස්ට්‍රේඩ් එයින් සෑහීමකට පත් නොවූ බව අපි දුටුවෙමු. බාගවෙලාවට එයට හේතුවන්නට ඇත්තේ, පොලිස් අපරාධ පරීක්ෂණ අංශය හෝම්ස් විසින් අවතක්සේරුවට ලක්කිරීම විය හැකිය. ග්‍රෙග්සන්ගේ මුහුණ සම්පූර්ණයෙන්ම රතු වී තිබිණ. ලෙස්ට්‍රේඩ් ගේ දෑස්වලින් පළවූයේ සිත්වේදනාව හා අසහනයයි. කිසිවෙකු දොරට තට්ටු කළ නිසා ඔවුන් දෙදෙනාට කථාකිරීමට ඉඩක් නොලැබිණ. දොර විවෘත කරගෙන ඇතුළට ආවේ, අපිරිසිදු හිඟන කොලු රැළේ නායකයා වූ විගින්ස්ය.

"සමාවෙන්න මහත්මයා." ඔහු කිය. "අර කුලී රිය පහළ දොරටුව ළඟ සූදානමින් තිබෙනවා."

"හොඳ කොල්ලා." හෝම්ස් කිය "ස්කොට්ලන්ඩියාඩ් පොලිසියේ ඔබත් මේ ක්‍රමය යොදාගන්නේ නැත්තේ ඇයි?" හෝම්ස් ඇසුවේ ලාච්චුවකින් වානේ මාංචු යුගලක් අතට ගනිමිනි.

"බලන්න මේ දුන්න වැඩ කරන ලස්සන? එක් ක්ෂණයකින් ක්‍රියාත්මක වෙනවා."

"පරණ මෝස්තරේ මාංචු ඇති තරම් හොඳයි." ලෙස්ට්‍රේඩ් කිය."ඒක දාන්න අපට මිනීමරන් මිනිහා හොයාගන්න පුළුවන් නම්"

http://sherlockholmesinvestigations.blogspot.com

"බොහොම හොඳයි. බොහොම හොඳයි." හෝම්ස් කීවේ සිනාසෙමිනි. "විගින්ස්, මගේ හම් පෙට්ටි ටික පටවා ගන්න කුලීරථ රියදුරාගෙන් මට උදව් ලැබුණොත් හොඳයි. විගින්ස් ගිහිං ඒ මනුස්සයට උඩ තට්ටුවට එන්න කියන්න."

මගේ මිත්‍රයා කථා කළේ, ඔහු දීර්ඝ ගමනක යෑමට සූදානම් අයුරිනි. මේ පිළිබඳව ඔහු මට කලින් දැනුම්දීමක් කර තිබුණේවත් නැත. එහෙයින් මම අතිශයින්ම පුදුමයට පත්වීමි. ඇඳුම් දමා තිබුණු තරමක් විශාල හම්බෑගයක් අපේ කාමරයේ විය. එය එළියට ඇදගත් හෝම්ස්, එහි පටිවල විශාල ගාංචු දැමීමට උත්සාහ කළේය. කුලීරථ රියදුරා කාමරයට ඇතුළු වෙද්දීත්, හෝම්ස් සිටියේ බෑගයේ පටි තදකිරීමට උත්සාහ දරමිනි.

"මෙන්න මේ ගාංචු දාගන්න, මට උදව් කරන්න රියදුරු උන්නැහේ." බිම දණගසාගෙන සිටි මගේ මිත්‍රයා කීවේ, රියදුරා දෙස හිස ඔසවා බලමින් වත් නොවේ.

ඉදිරියට ආ රියදුරා, දෑතින්ම එම ගාංචුව තදකිරීමට උත්සාහ කළේය. ඒ සමගම ක්ලික් යන හඬක් ද, ලෝහ ගැටෙන හඬක් ද ඇසිණි. හෝම්ස් එක් ක්ෂණයකින් එතැනින් නැගිට්ටේ දිගහැරෙන දුන්නක් පරිද්දෙනි.

"මහත්වරුනි." ඔහු කීවේ බැබළෙන දෑස අප වෙත යොමුකරමිනි. "මෙන්න මං කැමැතියි ඔබට හඳුන්වා දෙන්න, ජෙෆර්සන් හෝප් මහත්තයා- එනොක් ජේ. ඩ්‍රෙබර් හා ජෝසප් ස්ටැන්ගසන් මරාදැමූ මිනීමරුවා!"

මේ සියල්ලම සිදුවීමට ගතවූයේ එක් නිමේෂයකි. ඒ කොපමණ ඉක්මනින්ද යත්, කුමකින් කුමක් සිදුවුවාද යන්න වටහා ගැනීමට වත් මට වේලාවක් නොතිබිණි. එම සිදුවීමේ අවස්ථා ක්ෂණිකව පෙනී, නොපෙනී ගිය අයුරු මට සිහිකළ හැක.

හෝම්ස්ගේ ජයග්‍රාහී ප්‍රකාශය: කුලීරථ රියදුරාගේ භ්‍රාන්තව ගල්ගැසුණු මුහුණ. ඉන්ද්‍රජාලයකින් මෙන් තම දෑතට වැටුණු දිලිසෙන විලංගු වෙත ඔහු හෙළූ බැල්ම: එක් තත්පරයකට හෝ දෙකකට අපි සියලුදෙනාම ගල්වලින් නෙළූ පිළිම ලෙස නිශ්චලව සිටියෙමු. ඊළඟ මොහොතේ ක්‍රෝධයෙන් සර්ජනා කළ සිරකරුවා, හෝම්ස් ගේ ග්‍රහණයෙන් මිදී, ජනේලය කඩාගෙන එළියට පැන්නේය. ඔහු

Reading Purpose Only - Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

පිනූ වේගයට, ජනේලයේ ලී රවුම් හා වීදුරු සියල්ල කැඩී ගියේය. එහෙත් සිරකරුවාගේ ශරීරය සම්පූර්ණයෙන්ම ඉවතට යාමට පෙර, ලෙස්ට්‍රේඩ්, ග්‍රෙග්සන් හා හෝම්ස් ඒ දෙසට පැන්නේ දඩබල්ලන් තිදෙනෙකු විලසිනි. සිරකරුවාගේ කකුල්වලින් අල්ලාගත් ඔවුනු, ඔහු කාමරය තුළට ආපසු ඇදගෙන බිමින් තැබූහ.

බිහිසුණු අරගලයක් පටන්ගැනුණේ ඒ මොහොතේදීයි. සිරකරුවා ඉතාමත් ශක්තිමත්, භයංකර පුද්ගලයෙකු විය. ඔහු අල්ලා මර්දනය කරගැනීමට, අප සිවු දෙනා උත්සාහය අසාර්ථක වෙමින් තිබිණි. මේ හැඩිදැඩි මිනිසාගේ මල්ලව පොර නිසා අප එහි මෙහි විසි වී ගියා මිස, ඔහු පාලනය කරගැනීමට අපට හැකිවූයේ නැත. වියරු වූ තිරිසන් සතෙකු මෙන් ඔහු දඟළු විලාසයේ තිබුණේ, මනුෂ්‍යයෙකු සතු ශක්තියට වඩා වැඩි එකකි. ජනේලයේ වීදුරු වලට කැපී යාම නිසා, ඔහුගේ මුහුණෙන් ද දෑත්වලින් ද ලේ ගලමින් තිබිණි. කොපමණ ලේ ගලා ගියත් ඔහුගේ ශක්තිය දුර්වල වන බවක් නම් නොපෙනිණ. අන්තිමේදී ඔහුගේ ගෙල පෙදෙසට අත දමූ ලෙස්ට්‍රේඩ්, අර්ධ වශයෙන් සිරකරුගේ ගෙල තදකළේය. එයින් ලැබුණු අවසරයෙන් සිරකරුගේ දෙපා වටා තුවායක් දමා, තදින් ගැට ගසන ලදී. එය අවසන් වූ පසු, අපි හතිදමමින් නැගී සිටියෙමු.

"ඔහුගේ කුලීරිය තිබෙනවා." හෝම්ස් කීය. "ඒක හොඳයි. ඔහුව ස්කොට්ලන්ඩ්යාඩ් වෙත ගෙනයන්න. ඉතින් මහත්වරුනි. අපි දැන් ඇවිත් ඉන්නේ මේ පුංචි අභිරහසේ අවසන් කෙළවරටම වගේ. ඔබට අහන්න ප්‍රශ්න එහෙම තියෙනවා නම් ඉදිරිපත් කරන්න. මං බොහොම සන්තෝෂයෙන් ඒවා භාරගන්නවා. ඒවාට පිළිතුරු දීම මගෙන් ප්‍රතික්ෂේප වේවි කියා අවදානමක් නැහැ."

http://sherlockholmesinvestigations.blogspot.com

# 2 වන කොටස

## ශාන්තුවරයන්ගේ රට

### 1

### මහා ලවණ තලාවේදී.

උතුරු ඇමෙරිකා මහාද්වීපයේ මැද හරියට වන්නට, ඉතා කටුක පරිසරයක් ඇති විශාල කාන්තාරයක් පිහිටා ඇත. ආදි මිනිසා ශිෂ්ටාචාරයේ දියුණු වෙමින් මහාද්වීපය පුරා විසිර යද්දී, මේ කාන්තාරය ඔවුන්ගේ ඉදිරි ගමනට වැළැක්වූ බාධකයක් විය.

එක් පැත්තකින් සියරා නෙවාඩා කඳුකරයේ සිට නෙබ්‍රස්කා දක්වාත්, උතුරෙන් යෙලෝස්ටෝන් ගංගාවේ සිට දකුණේ කොලරාඩෝ දක්වාත් විහිදුණු මෙය, විශාල ප්‍රදේශයකි. නිහඬ බවෙන් වෙළුණු, හුදකලා බවෙන් පිරුණු, මේ වියළි කතර මිනිස් වාසයක් නොතිබුණු ශෝකාකුල අඩවියක් විය. මෙම දොම්නසින් පිරුණු බිම් පෙදෙසේ, සොබාදහම පවා එක් සොබාවකට රැඳී තිබුණේ නැත. එක් තැනක, මුදුන හිමෙන් වැසුණු ඉතා උස් කඳු ශිඛරය. තවත් තැනක අඳුරු බවෙන් පිරුණු මිටියාවත්ය. ඒ අසල වූ, ගල්පර්වත ගහණ පහත් බිම් හරහා ගංගාවෝ වේගයෙන් ගලා ගියහ. යෝධ තැනිතලා බිම්, ශීත ඍතුවේදී, හිමෙන් වැසී සුදු පැහැයට හැරිණි. ගිම්හානයේදී මේවා ක්ෂාරමය ලවණ දූවිල්ලෙන් වැසී අළු පැහැයක් ගත්තේය. එහෙත් මේ හැම එකක්ම වසාගෙන, පොදුවේ පැවැතියේ දුක්ඛදායක, කාන්තාරික, දොම්නස් ස්වභාවයයි.

මේ අඩවියේ මිනිස් වාසයක් නොවීය. තම දඩබිම් කරා ගමන්ගත්, රතුඉන්දියානු ගෝත්‍රයක් හෝ දෙකක්, මේ අඩවිය හරහා ඉඳහිට ගමන්කළ බව සැබෑය. එහෙත් අතිශයින් නිර්භය

http://sherlockholmesinvestigations.blogspot.com

පුද්ගලයින් පවා මේ ශුෂ්ක තලාපයෙන් ඉවත්ව ගියේ අපමණ සතුටකිනි. වෘකයන් ගොදුරු සොයා කටු අතුලේ සැරිසරද්දී, ගිජුලිහිණියෝ එම අරමුණෙන්ම අහසේ තටු සැලූහ. අඳුරු මිටියාවතේ පඳුරු අතර, ගොදුරු සොයා ඇදුණේ, රූදුරු වගවලසුන්ය. මේ වනවදුලේ දිවිගෙවූයේ ඔවුන් පමණි.

සියරා බ්ලැන්කෝ කන්දේ උතුරු කඳු බෑවුමේ සිට බලද්දී, දිස්වන මේ දසුන තරම් ශෝකාතුල දසුනක්, මේ මුළු ලෝකයේම නැතුවා නොඅනුමානය. පෙනෙන තෙක් මානයේ ඇත්තේ එකම තැනිතලා බිමකි. අළු පැහැති ලවණ දූවිල්ලෙන් වැසී ඇති එහි, තැන් තැන් වල වපරාල් පඳුරු දක්නට ලැබේ. ඈත එපිට ක්ෂිතිජයේ කෙළවර, හිමෙන් වැසීගිය කඳු හිඹර වළල්ලකි. තෙරක් නොපෙනෙන කාන්තාරයක් වැනි මේ වාලුකාවේ, පණ ඇති සතෙකුගේ සේයාවක් පවා නොවීය. නිල් අහසේ පියාඹන කුරුල්ලෙකුවත්, බිම සැරිසරන සිවුපාවෙකුවත් දක්නට නොවීය. එහෙයින් එහි තිබුණේ හද කම්පා කරවන ආකාරයේ නිහඬ බවකි.

මේ පාළු තැනිතලාවේ බිම හරහා පණ ඇති සතෙකු කිසිදාක ගමන් කළ බවට සලකුණක් වත් නැතැයි කීවොත් එය වැරැදිය. සියරා බ්ලැන්කෝ කන්දේ සිට බලද්දී, කාන්තාරය හරහා වැටුණු ගමන් මාර්ගයක් පැහැදිලිව දකිය හැක. මෙහි ගමන්කළ බොහොමයක් ගවේෂකයන්ගේ, දෙපා වලින් නැගුණු සලකුණු සහ කරත්ත රෝද වල සලකුණු, තවමත් හඳුනාගත හැකිය. පොළොවේ ඇති අළු පැහැති ක්ෂාර දූවිල්ලෙන් වෙන්ව, පහසුවෙන් හඳුනාගත හැකි, අව්වට දිලිසෙන සුදුපැහැති වස්තූන් ද, තැනින් තැන විසිරී ඇති බැව් බැලූ බැල්මට පෙනේ. ළං වී ඒවා පරීක්ෂා කර බලන්න! කුමක්ද ඒ ? අන් කුමක්ද, ඇටකටු ඇට්ටීන් මිස. සමහරක් ඉතා විශාලව හා රළුව: සමහරක් කුඩාව හා සියුම්ව. රළු ඒවා ගවයින්ගේය. සියුම් ඒවා මිනිසුන්ගේය. මහ ඇද වැටී මියැදුණු දසදහස් ගණනක් ජීවීන්ගේ සුන්බුන්, සැතපුම් එක්දහස් පන්සියයක් දුරට මෙම කරත්ත පාර දෙපස දකිය හැකිවේ.

1847 මැයි 4 වැනිදා මෙම දර්ශන නරඹමින්, මේ මඟේ ගමන් කළ එක් සංචාරයෙකි. ඔහුගේ වයස වඩා කිව්වූ හතළිහට ද හැටට ද යන්න, බැලුබැල්මට කීමට අපහසුය. කෙසේ වෙතත් පෙනුමෙන් නම් ඔහු; මේ අඩවිය ජයගන්නට උත්සාහ දරන දක්ෂයෙකු

http://sherlockholmesinvestigations.blogspot.com

හෝ යක්ෂයෙකු විය හැකි. මුහුණ ඇදී ගොස්ය. කෙට්ටු සිරුරේ අස්ථීන් වසාගෙන ඇදී තිබුණේ තුනී දුඹුරු පැහැති සමකි. දික්වූ කොණ්ඩය හා රැවුළ දුඹුරු පැහැතිය. එහෙත් එය තැනින් තැන සුදු වී ගොසිනි. දැස් ගිලී තිබුණත්, ඒවායේ දල්වුණේ අසාමාන්‍ය දීප්තියකි. තුවක්කුවක් ග්‍රහණය කරගෙන සිටියත්, ඒ දැත් ඉතා දුර්වල කෙට්ටු ඒවා විය. ඔහු සිටගෙන සිටියේ ආයුධය පොළොවේ රඳවා, එයට බරදෙමිනි. ඉතා උස, විශාල පැතිල්ලකින් යැදී තිබුණත් කෙසඟ සිරුරේ යම් ශක්තිමත් බවක් ද දිස්විය. නමුත් ඇත්තෙන්ම ඔහු සිටියේ මරණාසන්නවයි. කුසගින්න හා පිපාසය නිසා මරණාසන්නවයි.

කඳු අතරින් වැටී තිබුණු විශාල උමගක් දිගේ ඇවිද ගොස්, ඔහු ගල්කුළක් මතට නැගුණේ ඉතා අපහසුවෙනි. ඒ වතුර ඇති තැනක් දක ගැනීමේ අරමුණෙනි. හතර වටින්ම ඔහුගේ දෑසට දිස්වූයේ මහා ලවණ තලාවයි. එය කෙළවර රුදුරු කඳු ශිඛර වළල්ලය. පිපාසයට දිය පොදක් බීමට හැකි තැනක්, ගසක් හෝ පඳුරක් පෙනෙන තෙක් මානයක නොවීය. ඉබාගාතේ ආ මේ ගමන දැන් කෙළවරකට පැමිණ ඇත. මරණය ඔහු කරා ළං වෙමින් ඇත.

"මෙතන මැරුණාම ඇති වැරැද්ද මොකක්ද? පණයද්දී වැතිරෙන්න, පිහාටු වලින් හැදූ මෙට්ටයක්ම උවමනාය? අවුරුදු විස්සක් තිස්සේ......."

ඔහු තමාටම කොඳුරා ගත්තේ ගල් පර්වතයට පිට දී හිඳගනිමිනි.

බිම හිඳගැනීමට පෙර, ඔහු, දැන් වැඩකට නැති තුවක්කුව පසෙකට දැම්මේය. දකුණු කරේ එල්ලාගෙන ආ, රෙද්දක ගැටගැසූ විශාල පොදිය ද ඉවතින් තැබුවේය. ඔහුගේ දුර්වල සිරුරට පොදියේ බර වැඩිවූ අයුරකි. කුමක් නිසාද යත්, එය බිම තබද්දී අනපේක්ෂිත ලෙස එය ඉක්මනින් බිම වැදිණි. අළු පැහැති පොදියෙන් එක්වරම හඬක් නිකුත් විය. මෑත් කළ රෙද්දෙන් එළියට දිස්වූයේ, බියපත්, කුඩා සියුමැලි මුහුණකි. අතිශයින්ම දීප්තිමත් දුඹුරු පැහැති දෙනෙතකි.

"මට රිදුණා!" වේදනාවට පත් කුඩා දැරිය කීවාය.

"හැබැට? මං ඕනකමින්ම නම් ඒක කළේ නෑ." එසේ කියූ ඔහු පොදිය ලිහා, අවුරුදු පහක් පමණ වයසැති, කුඩා සුන්දර

http://sherlockholmesinvestigations.blogspot.com

දරියක එලියට ගත්තේය. ඇය හැඳ සිටි කුඩා රෝස පැහැති ගවොමෙන් හා කුඩා පාවහන් යුවළෙන් කියැවුණේ මවකගේ ආදර කරුණාවයි. දරිය සුදුමැලි, පාණ්ඩු පාට එකියක වූවාය. එහෙත් දැත් හා දෙපා නිරෝගීය. එයින් හැඟවුණේ, වැඩිහිටියා තරම් දුෂ්කරතා වලට, ඇයට මුහුණපාන්නට සිදුවී නොතිබුණු බවයි.

"දැන් කොහොමද? තවමත් රිදෙනවද?"

ඔහු ඇසුවේ, රන්වන් පැහැති අක්බමරු හිසකෙස් සහිත හිසේ පිටිපස, ඇය තවමත් අතගාමින් සිටි නිසයි.

"මෙතන ඉඹින්න. එතකොට රිදෙන එක හොඳ වෙයි" රිදෙන තැන පෙන්වමින් ඇය කීවේ විහිළුවට නොවේ. "අම්මා කළේ එහෙමයි. කෝ අම්මා?"

"අම්මා දුර ගමනක් ගියා. මං හිතන්නේ වැඩිකල් යන්න කලින් දුවට අම්මව දකින්න ලැබේවි."

"ගියා? ඇත්තට?" දරිය කීවාය. "හරිම පුදුමයි. මං ගිහින් එන්නං දුවේ කියන්නෙ නැතිව ගියා? අම්මා තේ බොන්න නැන්දලා ගේ ගෙදරට ගියත්, ගිහිං එන්නම් දුවේ කියලයි ගියේ. අම්මා ගිහින් දැන් දවස් තුනක් වුණානේ. හරිම රස්නෙයි. හරිම තිබහයි. නැද්ද බොන්න වතුර ටිකක්? කන්න දෙයක්?"

"කිසිදෙයක් නෑ. ටිකක් ඉවසන්නකෝ. ඔන්න ඔය විදියට ඔයාගේ ඔලුව මගේ ඇඟට හේත්තු කරගන්නකෝ. එතකොට සනීපයි. තොල් දෙක, ලෙණ්ඩු හම කෑලි වගේ වුණාම කතාකරන්නත් අමාරුයි. ඒ වුණත් මට හිතෙනවා, අපි දැන් ඉන්න තත්වය ගැන ඔයාට කියලා දුන්නොත් හොඳයි කියලා. මොනවද ඔය අතේ තියෙන්නේ."

"හරිම ලස්සන බඩුවක්" කුඩා දරිය කීවේ, බිම තිබී අහුලාගත් දිලිසෙන තලාතු මිනිරන් කැබලි දෙකක් පෙන්වමිනි.

"මම ගෙදර ගියාම මේවා දෙනවා බොබ් මල්ලිට."

"ඔයාට මේවාට වඩා ලස්සන දේවල් ළඟදීම දකින්න ලැබේවි." මිනිසා කීවේ විශ්වාසයෙනි. "ඔහොම ඉන්නකෝ ටිකක්, මං ඔයාට කියන්න හිතාගෙන හිටියේ........ඔයාට මතකද අපි ගංගාව ළඟින් පිටත්වෙලා ආව දවස?"

"ඔව්."

http://sherlockholmesinvestigations.blogspot.com

"අපි හිතුවේ අපට ඉක්මනටම තවත් ගහක් දකින්න ලැබේවි කියලා නේ. නමුත් මොකක් හරි වැරැදීමක් වුණා. සිතියමේ වැරැද්දක් ද, මාලිමා යන්ත්‍රයේ වැරැද්දක්ද මං දන්නේ නෑ. නමුත් අපට ගංගාව හම්බවුණේ නෑ. වතුර ටික ඔක්කොම ඉවරවුණා. ඔයාට උවමනා නිසා තව වතුර බින්දුවක් තියෙනවා......"

"ඔයාට මුහුණ හෝදගන්නවත් වතුර තිබුණෙ නැද්ද?"

"නෑ. බොන්නවත් වතුර තිබුණෙ නෑ. ඉස්සර වෙලාම ගියේ බෙන්ඩර් මහත්මයා. ඊළඟට පීට් රතු ඉන්දියන්කාරයා. ඊළඟට මැක්ග්‍රෙගෝර්, ඊළඟට ජොනී, ඊළඟට ඔයාගෙ අම්මා."

"එහෙනම් අම්මත් මැරිලද?"

කුඩා දරිය හිස ඒත්තුකරමින ඉකිගසමින් හැඬීමට පටන් ගත්තාය.

"ඔව්. ඒ ගොල්ලෝ ඔක්කොම ගියා. ඉතුරුවුණේ අපි දෙන්න විතරයි. ඊට පස්සේ මං හිතුවා, මේ පැත්තට ආවොත් වතුර ටිකක් තියේවි කියලා. ඉතින් ඔබව මගේ කරේ තියාගෙන මෙච්චර දුර ආවා. ඒ වුණත් ඒකෙන් පල ප්‍රයෝජනයක් වුණු පාටක් පෙනෙන්න නෑ. අපට දැන් තියෙන්නේ දෙවියන්ගේ පිහිට විතරයි."

"ඔයා කියන්නේ අපි දෙන්නත් ඉක්මනට මැරේවි කියලද?"

ඉකිගැසීම නවත්වා හිස එසවූ දරිය ඇසුවාය.

"මට හිතෙන හැටියට අපට ඉතිරි වෙලා තියෙන්නේ එච්චරයි."

"ඇයි ඉතින් ඔයා ඒක කලින් කිව්වේ නැත්තේ?" දරිය කීවේ සතුටෙන් සිනාසෙමිනි.

"ඔයා මාව කොච්චර භය කළාද? මැරුණට නම් කමක් නෑ. එතකොට අයෙමත් මට අම්ම ළඟට යන්න පුළුවන් නේ."

"ඔව් චූටි දරුවෝ"

"ඇයි ඔයත් එනව නේද මාත් එක්ක? මං අම්මට කියන්නම් ඔයා මට හරි ආදරයෙන් සැලකුව කියලා. මං දන්නවා අම්ම ලොකු වතුර ජෝගුවක් අරගෙන, දිව්‍යලෝකෙ දොරටුව ළඟ අපි එනතුරු බලාගෙන ඇති. ඇයි අර දෙපැත්තම තර කළ පුංචි කේක්? ඒවාත් ගොඩක් ළඟ තියාගෙන ඉදීවි. මායි බොබ්

http://sherlockholmesinvestigations.blogspot.com

මල්ලියි කැමති ඒ කේක් වලට යනු. අපි මැරෙන්න හුහක් වෙලා යාවිද?"

"මං දන්නේ නෑ. එච්චර වෙලාවක් යන එකක් නෑ මගේ හිතේ." ඔහුගේ දෑස් ඈත ක්ෂිතිජය වෙතට යොමු විය.

තිල් පැහැති අහස් කුසේ ක්ෂිතිජයට ළංව, කුඩා තිත් තුනක් මතුවිය. ඒවා ක්‍රමයෙන් විශාල වූ සැටින්, ඔවුන් සිටින දිශාවට ගමන් කළ අයුරුත්, ඔහු බලාසිටියේ විස්මයෙනි. ඒ තිත් දුඹුරු පැහැති ලොකු කුරුල්ලන් බවට පත්විය. පක්ෂීහු මේ දෙදෙනා වටා රවුමට පියාඹීමට පටන්ගත්හ. ඒ ඇමෙරිකන් මහාද්වීපයේ බටහිර දී දකින්නට ලැබෙන ගිජුලිහිණියන් තිදෙනෙකි. උන්ගේ පැමිණීම මරණයේ සංඥාවයි.

"කුකුලොයි කිකිළියොයි." කුඩා දූරිය කීවේ පක්ෂීන් දෙස බලා අත්පොළසන් දෙමිනි.

"මට කියන්නු මේ රටත් මැවුවේ දෙවියන් වහන්සේමද?"

"ඔව්. උන්වහන්සේ තමයි." මේ බලාපොරොත්තු නොවූ පැනයට වැඩිහිටියා පිළිතුරු දුන්නේය.

"දෙවියන් වහන්සේ ඉලිනොයි මැව්වා. මිසූරි මැව්වා." දූරිය කීවාය."මං හිතන්නේ මේ හරිය මවන්න ඇත්තේ වෙනින් කෙනෙක්. වතුර මවන්න, ගහකොළ මවන්න එයාට අමතක වෙන්න ඇති."

"මොකද කියන්නේ, අපි දෙන්නා දත් ටිකක් යාච්ඤා කරමුද?" මිනිසා ඇසීය.

"කෝ ඒකට තවම රෑ වුණේ නැහැනේ." දූරිය පිළිතුරු දුන්නාය.

"ඒකට කමක් නෑ. අවේලාවේ යාච්ඤා කරන එක එච්චර පිළිවෙළක් නම් නෑ තමයි. ඒ වුණාට දෙවියෝ ඒක ගණන් ගන්න එකක් නෑ. අපි අග්ව කරත්තයෙන් තලාවේ එද්දී හැමදාම රෑට ඔයා යාච්ඤා කාලේ. අන්න ඒව ආයෙත් කියන්න."

"ඔයාට ඕනෙ නම්, ඇයි ඉතින් ඔයාම කියන්නෙ නැත්තේ? දූරිය ඇසුවාය.

"මට දත් යාච්ඤා ඔක්කොම අමතකයි. අර තුවක්කුවෙන් භාගයක් තරම් උස කාලේ මං යාච්ඤා කළා. ඊටත් පස්සේ ඒක අත්ඇරිල ගියා. දැන් කිසිදෙයක් මතක නෑ. කියන්න. කියන්න. මං අන්තිම හරියෙදි හවුල් වෙන්නම්."

http://sherlockholmesinvestigations.blogspot.com

"එහෙනම් අපි දෙන්නම දනගහ ගමු." දරිය කීවේ සළුව බිම එළමිනි.

"ඊළඟට ඔයාගෙ අත්දෙක මෙන්න මෙහෙම ඉහළට ඔසවා ගන්න. හොඳ ළමයි යාච්ඤා කරන්නේ එහෙමයි."

එය පුදුමාකාර දර්ශනයක් විය. ගිජුලිහිණියන් හැර එය දකීමට කිසිවෙකු සිටියේ නම්, ඔවුන් පුදුමයට පත්වෙනු නිසැකයි. සළුව මත දණගසා ගෙන, කුඩා පුන්ටිමන් දරිය සහ කෝඩැරී වුණු මිනිසා, වලාකුළෙන් තොර අහස දෙසට මුහුණු හා දෑත් යොමු කරගෙන යාච්ඤාවේ යෙදුණාහ. අනතුරුව ඔවුහු යළිත් හිදගත්හ. පර්වත සෙවණේ දරිය නින්දට වැටුණාය. ඇය නිදන ආකාරය ඔහු බලා සිටියේය. රෑ තුනක්, දහවල් තුනක් නොනිදා, කිසිදු විවේකයක් නොගෙන ඔහු ගමන් කළේ, දිය බිඳක් සොයාගන්නා අරමුණෙනි. එහෙත් එය අසාර්ථක විය. තම දෑස් පියවී ගෙන යනු ඔහුට දනිණ. ඔහුගේ හිස පහතට නැමිණි. ඔහුගේ දුඹුරු පැහැති දිගු හිසකෙස්, ඇයගේ රන්වන් හිසකෙස් මත වැටිණි. දෙදෙනාටම නිදිදෙව්දුවගේ තුරුලේ සුවය ලැබිණි.

මෙම වැඩිහිටි සංචාරකයා තවත් පැය භාගයක් නොනිදා සිටියේ නම්, ඔහුගේ දෑස් වලට අපූර්ව දර්ශනයක් දකින්නට ලැබෙනු නොඅනුමානය. ලවණ තලාවේ ඈත කෙළවරේ මතුවුණු කුඩා දූවිලි රැල්ලක් ක්‍රමයෙන් විශාල වී, ඝන දූවිලි වලාකුළක් බවට පත් විය. ක්‍රමක්‍රමයෙන් එහි ප්‍රමාණය වඩාත් විශාල විණි. එවැන්නක් ඇති විය හැක්කේ කාන්තාරය හරහා ගමන්කරන විශාල සෙනගක් නිසා පමණි. ප්‍රෙයරී තණබිම වැනි තැනක නම් මේ තණබිමේ ගැවසෙන වල්හරක් රංචුවක් නිසා ඇති වන්නෙකැයි කෙනෙකු අනුමාන කිරීමට ඉඩ ඇත. මඳ වේලාවක් ගතවෙද්දී මේ, අනාථයන් දෙදෙනා නිදාසිටි ගල්කුළට පහළින් වූ වාලුකා කාන්තාරයේ, යෝධ දූවිලි වලාව ඉදිරියට ඇදිණ.

කැන්වස් රෙදිවලින් ආවරණය කළ, එකක් පිටුපස එකක් ගමන් කළ අශ්වකරත්ත රැසකි. අවිආයුධ රැගෙන, අශ්වයන් පිට නැගී ඉදිරියට ආ මිනිසුන් සමූහයකි. ඔවුන් අශ්වකරත්ත සමග ගමන් කරනු දූවිලි අතරින් දකගන්නට ලැබිණි. මෙය ඇත්ත වශයෙන්ම කාන්තාරය හරහා බටහිර දෙසට, සමූහයක් වශයෙන් ගමන් කළ ජන කණ්ඩායමකි. එය කොපමණ යෝධ කණ්ඩායමක්ද?

http://sherlockholmesinvestigations.blogspot.com

එහි ඉදිරි කෙළවර ගල්කුළ පාමුලට පැමිණ සිටියත්, පිටුපස කෙළවර, දුර ඈත ක්ෂිතිජයේ වත් දක්නට නොවීය. විශාල අශ්ව කරත්ත, කුඩා කරත්ත, අශ්වයන් පිට නැගී ගමන් කළ මිනිසුන්, බඩු මසවාගෙන ගමන් කළ කාන්තාවන්, කරත්ත ඇතුළේ සිට එබිකම් කළ කුඩා දරුවන් ආදී වශයෙන් මෙය විශාල ජන ගංගාවක් විය. මෙය කිසියේත් යම් ප්‍රදේශයකට සංචාරය සඳහා ගිය සංචාරකයින් පිරිසක් නොවේ. යම්කිසි බලපෑමක් නිසා, තමන්ගේ පදිංචිය සඳහා රටක් සොයා සංක්‍රමණයේ යෙදුණු ජනකොට්ඨාශයකි. මෙහි ගමන්ගත් කරත්තවල රෝදවලින්, අශ්වයන්ගෙන් හා මනුෂ්‍යයින්ගෙන් නැගුණු හඬ එක් වූ කල, එය මහා ඝෝෂාවක් විය. එහෙත් නිදා සිටි දෙදෙනා අවදි කිරීමට එය ද ප්‍රමාණවත් නොවීය.

තවලම ඉදිරියෙන්ම ගමන් කළේ අවිආයුධ අතින් ගත් කිහිප දෙනෙකි. කඳු පාමුලට ළඟා වූ පසු, ඔවුහු නැවතී සාකච්ඡාවක යෙදුණහ.

"සහෝදරයා. වතුර ළිං තියෙන්නේ දකුණු පැත්තේ." හිසකෙස් නැතිත් තරම සුදු වූ එකෙක් කීය.

"සියරා බ්ලැන්කෝ කන්දෙන් දකුණු පැත්තට. එහෙම ගියානම් අපට රියෝ ග්‍රාන්ඩේ වෙත ළඟාවෙන්න පුළුවන්." තවෙකෙක් කීය.

"වතුර ගැන බයවෙන්න එපා." තුන්වැන්නා කීය. "ගල් පුපුරවා වතුර ගන්න පුළුවන් උත්තමයා, තමන්ව තෝරාගත් තමන්ගේම ජනයා, පිපාසයෙන් මැරෙන්න අරින්නේ නෑ."

"එසේම වේවා! එසේම වේවා!!"

ඔවුන් ගමන යළිත් ඇරඹීමට සූදානම් වූවා පමණි. එම කණ්ඩායමේ සිටි ලාබාලම, එහෙත් තියුණු ඇස් පෙනීමක් තිබූ තැනැත්තා, තම විස්මය පළකරමින් ගල මුදුන වෙත අත දිගු කළේය. අළු පැහැති පසුබිම ඉදිරියේ රෝස පැහැති යමක් ඔවුනට පැහැදිලිව දක ගන්නට ලැබිණි. උරහිසේ එල්ලාගෙන සිටි ගිනිඅවි එළියට ගෙන, ඉදිරි පෙළ ආරක්ෂක භටයෝ සූදානම් වූහ. පිටිපසින් එහි ළඟා වූ අමතර ආරක්ෂකයෝ අවි අමෝරා ගත්හ. කාගේත් මුවග රැව් දුන්නේ "රතු ඉන්දියානු මිලේච්ඡයෝ!" යන වචනයයි.

"මෙහේ රතු ඉන්දියානුවන් ඉන්න විදියක් නෑ." කණ්ඩායම මෙහෙයවමින් ඉදිරියෙන්ම ගමන් කළ වයස්ගත මිනිහා කීය.

http://sherlockholmesinvestigations.blogspot.com

"අපි උන්ගේ අඩවිය පහුකළා, දැන් ඉතින් මහා කඳු ප්‍රදේශය පහුකරන තුරු රතු ඉන්දියානුවන් නැහැ."

"එහෙනම් මං ගිහින්, මේ කවුද කියලා හොයල බලල එන්නද ස්ටැන්ගසන් සහෝදරයා?" එකෙක් ඇසීය.

"මමත් යන්නම්, මමත් යන්නම්." දුසදොළොස් දෙනෙකු කියනු ඇසිණ.

"අශ්වයෝ ඔහොම හිටිද්දී පලයල්ලා. අපි උඹල එනතුරු මෙහෙමම බලාගෙන ඉන්නවා." වැඩිහිටියෝ පිළිතුරු දුන්හ.

මොහොතක් ගතවෙද්දී තරුණයෝ අසුපිටින් බැස, තමන්ගේ සිත්වල කුතුහලය ඇති කළ, ගල මුදුනට බඩ ගෑමට පටන්ගත්හ. ශබ්දයක් නොනහා එහෙත් ඉක්මනින් ඔවුන් පර්වතය මුදුනට නැගුණේ, පුහුණු කළ ඔත්තුකරුවන් විලසිනි. මොවුන් ගලින් ගලට පනිමින් පර්වතය මුදුනට නැගි ආකාරය, වැඩිහිටියෝ පහළ සිට බලාසිටියහ. එහි ඉදිරියෙන්ම ගමන්ගත්තේ මෙය මුලින්ම දුටු තරුණයාය. ඔහු එක්වරම මවිතයට පත්ව දෑත් එසවූ සැටිත්, සෙස්සෝ ද දෑත් ඔසවමින් ඔහුට එකතු වූ හැටිත්, කන්ද පහළ බලාසිටියවුන් පුදුමයට පත්කළේය.

තරුණයන් මවිතයට පත් වී බලාසිටි ඒ දර්ශනය කුමක්ද? උස් සිරුරක් සහ දිගු රැවුලක් තිබූ කෘශ මිනිසෙකි. ඔහු හුස්ම ඉහළ පහළ හෙළූ ආකාරයෙන් ගැඹුරු නින්දකට වැටී සිටි බැව් ඔවුනට අවබෝධ විය. ඔහු අසලම වූයේ කුඩා දැරියකි. රෝස පැහැති දෙතොල් අතරින් සුදු දත් පෙන්වා සිනාවක් නගාගෙන, දෑතින්ම වැඩිහිටියාගේ ගෙල බදාගෙන, ඇය ද නින්දකට වැටී සිටියාය. මේ අසලම පර්වතය මතට වී මේ දෙදෙනා දෙස බලාසිටි ගිජුලිහිණියන් තිදෙනෙකි. එතැනට ළඟා වූ පිරිස දුටු වහාම තම අසතුට පළකරමින්, ගිජුලිහිණියෝ උස් හඬින් කෑගැසූහ. අනතුරුව ඉවතට ඉගිල ගියහ.

කුරුල්ලන්ගේ කෑගැසීම නිදාසිටි දෙදෙනා අවදිකිරීමට සමත්විය. මිනිසා හුන් තැනින් නැගිට වටපිට බැලුවේ පුදුමයෙනි. තමාට නින්ද යාමට පෙර පාළු කාන්තාරයක්ව පැවති මේ බිම මිනිසුන්ගෙන් ගැහැනුන්ගෙන් පිරී තිබෙනු ඔහු නැරඹුවේ අතිශය

http://sherlockholmesinvestigations.blogspot.com

විස්මයට පත්වය. ඔහුගේ මුහුණෙන් පළවූයේ මේ කිසිවක් විශ්වාස නොකරන හැඟීමය.

"මේකට තමයි කියන්නේ, සිහි විකල්වීමෙන් දකින මායා දර්ශන කියලා." ඔහු තමාටම කොඳුරා ගත්තේය.

කුඩා දැරිය ඔහු අසලටම වී ඇගේ ගවොමෙන් අල්ලාගෙන වටපිට බැලුවත් කිසිවක් නොකීවාය. පුදුමයට පත් කුඩා දරුවන් දෑස් කරකවමින් වටපිට බලන ආකාරයට, ඇය සියල්ල නැරඹුවාය.

මෙය සිහිවිකල් වීමෙන් දකින මායාවක් නොව, තමන් ඇත්ත මනුෂ්‍යයින් බව වැඩිහිටියාට අවබෝධ කරවීමට තරුණයෝ සමත්වූහ. කුඩා දැරිය ඔසවා ගත් එකෙක් ඇය තම කර මත හිඳුවා ගත්තේය. තවත් දෙදෙනෙක් දුර්වලකමින් කුදු ගැසුණු මහල්ලා එත්තම් කර ගත්හ. අනතුරුව ඔවුහු අශ්වකරත්ත නවතා තිබූ දෙසට ගමන්ගත්හ.

"මගේ නම ජෝන් ෆෙරියර්" මහල්ලා කීය. "කාන්තාරය හරහා ගමන් කළා අපි විසිඑක් දෙනෙක්. එයින් ඉතුරු වුණේ මාත් මේ දැරියත් විතරයි. අනෙක් හැමදෙනාම, කුසගින්නෙන් හා පිපාසයෙන් මියගියා."

"ඇය ඔබේ දියණියද?" එකෙක් ඇසීය.

"මං හිතන්නේ දැන් ඇය අයිති මටයි. මං ඇගේ ජීවිතය බේරාගත් නිසා ඇය මගේ දරුවා. අද ඉඳන් ඇය ලූසී ෆෙරියර්. ඒ වුණත් කවුද ඔබ?" ඔහු ඇසුවේ, තමන් ගලවා ගත් පිරිස දෙස පුදුමයෙන් බලමිනි. "ඔබේ කණ්ඩායමේ විශාල සංඛ්‍යාවක් ඉන්නවා නේද?"

"දහදාහක් විතර ඉන්නවා." එක් තරුණයෙක් පැවසීය. "අපි දෙවියන්ගේ දරුවෝ. මොරෝනි දේවදූතයා විසින් තෝරාගනු ලැබූ ශ්‍රාවකයෝ. දෙවියන් වහන්සේගේ දරුවෝ. අසාධාරණයට ලක්වූ, පළිගැනීමට ලක්වූ, පීඩාවට පත්වූ, දෙවියන් වහන්සේගේ දරුවෝ."

"මං ඔවුන් ගැන කවදාවත් අහල නැහැ. දෙවියන් වහන්සේ ඔබ වැනි අය විශාල ගණනක් තෝරාගෙන ඇති බවයි පෙනෙන්නේ."

"ශුද්ධ වූ දේවල් විහිළුවකට ගන්න එපා." අනෙකා කීයේ තරමක් කෝපයට පත් හඬිනි. "පැල්මයිරා නගරයේදී ඊජිප්තු රූපාක්ෂරවලින් ලියූ, දෙවියන් වහන්සේගේ ශුද්ධ ලියවිලි හමුවුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

ඒවා අති උත්තම ජෝසප් ස්මිත් වෙත භාරදෙනු ලැබුවා. අපි ඒ ශුද්ධ වූ ධර්මය අදහන අය. අපේ දේවස්ථානය තිබුණේ ඉලිනෝයි ජනපදයේ නව්වුහි. දෙවියන් වහන්සේ විශ්වාස නොකරන බිහිසුණු මනුෂ්‍යයන්, අපට හිරිහැර කළා. උන්ගෙන් ගැලවී අපි මේ හොයන්නේ අපට වාසයට සුදුසු භූමියක්. කාන්තාරය මැද වුණත් කමක් නැහැ. අපට වෙන්ව විසීමට බිමක්."

'නව්වු' යන නාමය ජෝන් ෆෙරියර්ගේ මතකය අවදි කළේය.

"මට තේරෙනවා........ඔබ මෝර්මොන්වරු නේද?"

"ඔව්. අපි මෝර්මොන්වරු" ඔවුහු එක්හඬින් කීහ.*

"ඉතින් කොහෙද ඔබ මේ යන්නේ?"

"අපි දන්නේ නෑ. දෙවියන් වහන්සේගේ අදිසි හස්තයෙන් අප කැඳවාගෙන යනවා. අපේ ආගමේ නායක උතුමාණන් මගින් දෙවියන් අප ගෙනයනවා. ඔබත් ඔහු වෙතට යා යුතුයි. ඔබ ගැන කළයුත්තේ කුමක්ද කියා ඔහු පවසාවි."

මේ වන විට ඔවුහු කඳු පාමුල වෙත පැමිණ සිටියහ. සංචාරක බැතිමතුන් පිරිස විසින් මේ දෙදෙනා වට කරගන්නා ලදී. කෙසේ වෙතත් කුඩා දැරිය හා වැඩිහිටියා කැඳවාගෙන යන ලද්දේ විශාලම අශ්වකරත්තය වෙතයි. අනෙක් රථ ඇදගෙනයාම සඳහා යොදා තිබුණේ අශ්වයින් දෙදෙනෙකි. නැත්නම් සතරදෙනෙකි. නමුත් මෙම රථය අශ්වයින් සයදෙනෙකු විසින් ඇදගෙන යනු ලැබූ අලංකාර රථයක් විය. රියැදුරා අසල වාඩි වී සිටියේ වයස අවුරුදු තිහක පෙනුමක් තිබූ පුද්ගලයෙකි. ඔහුගේ ප්‍රමාණයෙන් විශාල හිස මෙන්ම මුහුණේ ප්‍රතාපවත් පෙනුම ද කියා පෑවේ මොහු නායකයා බවයි.

"අප ඔබව භාරගන්නේ, අපේ ආගම ගැන විශ්වාසය තබා, අපගේම අය වෙනවා නම් පමණයි." නායක උතුමාණන් පැවසුවේ අතරමං වූ දෙදෙනා පිළිබඳ තොරතුරු අසන්නට ලැබුණු විටයි.

"අප අතරේ වෘකයන් නැහැ. මේ මහා කාන්තාරයේ ඔබ වෘකයන්ට ගොදුරු වී ඔබේ ඇටකටු සුදු පැහැයට හැරී විනාශ වී යාවි. අපේ ආගම ඇදහීමේ පොරොන්දුව පිට අප සමග එන්න

* මෝර්මොන්වරුන් හඳුනා ගැනීම සඳහා මෙම පොත අවසානයේ (286 පිටුවේ) උපග්‍රන්ථය1 බලන්න.

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purpose Only, Not For Print

කැමතිද?" "මං මින පොරොත්තුවක් පිට එන්නම්." පෙරියර් පැවසුවේය.

"මිනුව භාරගන්න ස්ටැන්ගසන් සහෝදරයා. මිනුටත් දරුවාටත් කන්න බොන්න දෙන්න. ඔවුනට අපේ ශුද්ධ වූ ධර්මය ඉගැන්වීම ඔබට භාරයි. අපි හුඟක් ප්‍රමාදවුණා. ඉතින් තවත් පමා නොවී ඉදිරියටම යමු. දෙවියන් අප වෙත ලබාදෙන භූමිය කරා යමු."

"යමු යමු! දේවභූමියට! යමු යමු!"

මෝර්මොන් භක්තිකයෝ රථ පිළියෙළ තැගුහ. ඒ සමගම අසුන් මෙහෙයවන රියැදුරන්ගේ කසවලින් නිකුත් වූ හඬ ද කරත්ත රෝද වලින් නිකුත් වූ හඬ ද යළිත් අසන්නට ලැබිණි. අනාථයින් දෙදෙනා භාර දෙනු ලැබූ පූජකයන්ගේ කරත්ත තුළම, අනාථයින්ට රැඳිසිටීමට ඉඩහරින ලදී. ඔවුන්ට වහා ආහාරපාන ලැබිණ.

"ඔබ මෙහිම ඉන්න." පූජකයා කීය. "දින කිහිපයක් යද්දී ඔය මහන්සි ගතිය මහහැරිල යාවි. ඒ අතරේ මතක තියාගන්න. ඔබ මුළු ජීවිතේටම අපේ ආගමේ. බ්‍රිග්හැම් යං එය පැවසුවා. ඔහු එය පැවසුවේ ජෝසප් ස්මිත් ගේ කටහඬින්. ඒ කියන්නේ දෙවියන් වහන්සේගේ කටහඬින්."

http://sherlockholmesinvestigations.blogspot.com

Pradeep Purpose Only, Not For Print

# 2

## යූටා කාන්තාරයේ පිපුණු මලක්

මෝමොන් බැතිමතුන් ඔවුන්ගේ ගමනාන්තය වෙත පැමිණෙද්දී මුහුණ දුන් දුෂ්කරතා ගැන විස්තර කිරීමට, මෙය අවස්ථාව නොවේ. මිසිසිපි ගං ඉවුරේ සිට, රොකී කඳුවැටියේ බටහිර බෑවුම වෙත ඔවුන් සංක්‍රමණය වූයේ, ඉතිහාසයේ නොවූ විරූ දුෂ්කරතා මැදයි. බිහිසුණු මනුෂ්‍යයන්, බිහිසුණු වනසිව්පාවුන්, ලෙඩරෝග, විඩාව, කුසගින්න, පිපාසය, මේ ආදී සොබාදහමෙන් එල්ල වූ බාධක හැම එකක්ම මැඩගෙන, ඉදිරියට යාමට ඔවුහු සමත්වූහ. කෙසේ වෙතත් මෙම දීර්ඝ ගමනේදී නොකඩවා ඔවුන් වෙත ළඟාවූ දුක් ගැහැට අපමණය. මේවා ඉදිරියේ ඔවුන්ගේ ශක්තිමත් නිර්භයම පුද්ගලයන් පවා භීතියෙන් සැළුණාහ. දීර්ඝ ගමන අවසානයේ ඔවුහු යූටා ශුෂ්ක කාන්තාර ප්‍රදේශය වෙත ළඟාවූහ.

"මෙන්න මෙතැන තමයි අපේ භූමිය. සදාකල්හිම අපට වාසය කිරීමට දෙවියන් වහන්සේ ලබා දුන් තැන." නායක උතුමාණන් වූ බ්‍රිග්හැම් යංගේ මුවෙන් එසේ අසන්නට ලැබුණු විට, සියල්ලෝම දණින් වැටී දෙවියන්ට යාච්ඤා කළහ.

නායකත්වය දැරීමට මෙන්ම පරිපාලනයට ද තමා සුදුස්සෙකු බව, බ්‍රිග්හැම් යං ඉක්මනටම ඔප්පු කර පෙන්නුවේය. හිස් කාන්තාර බිමේ අනාගත නගරය සැලසුම් කරන ලදී. පිඹුරුපත් ඇඳ, ඉඩම් කැබලිවලට වෙන්කරන ලදී. එක් එක් පුද්ගලයින්ගේ අවශ්‍යතා අනුව ඉඩම් බෙදා දෙන ලදී. වෙළඳුන්ට වෙළඳාම් ඇරඹීම සඳහා ඉඩම් ද අනෙක් වෘත්තිකයන්ට ඒ ඒ වෘත්තීන් සඳහා ඉඩම් ද හිමිවිය. මංමාවත් හා චතුරශ්‍ර ඉදිකෙරිණි. වැසි ජලය ගලා බැසීමට

http://sherlockholmesinvestigations.blogspot.com

කාණු පද්ධති, පැළ රෝපණය කිරීම හා මල්වතු ද සැකසිණි. ඊළඟ ගිම්හානය උදාවෙද්දී කෙත්වතු තිරිඟු කරලින් බරවිය. ධාන්‍ය වැපිරූ කෙත්, පැහෙන කරලින් බරවෙද්දී, යූටාව රන් පැහැයෙන් බැබලෙන්නට පටන්ගත්තේය. මෙම සංක්‍රමණිකයන් අත ගැසූ සෑම කටයුත්තක්ම පුදුමාකාර ලෙස සාර්ථක විය. මේ හැම එකකටම වඩා අලංකාර වූයේ, නගරයේ මධ්‍යයේ ඔවුන් ඉදිකළ දෙව් මැඳුරයි. එය උසින් ඉතා වැඩිවූ අතර, ප්‍රමාණයෙන් ද බොහෝ විශාල විය. උදේ හිරු පායන මොහොතේ සිට, හිරු බැස යන තෙක් සංගීත වාදන රටේ සතර අතින් අසන්නට ලැබිණි. ඒ, දහසක් අන්තරායන් මැදින් තමන් මෙහි කැඳවා ගෙන ආ, ආගමික නායකයා වෙනුවෙන්, බැතිමතුන් පැවැත්වූ සංගීත වාදනය.

අනාථයින් දෙදෙනා - ජෝන් ෆෙරියර් හා කුඩා දරිය, මෝමොන් බැතිමතුන් සමග ගමනාන්තය දක්වා කැඳවාගෙන එන ලදී. දරිය ජෝන් ෆෙරියර්ගේ දියණිය ලෙස ඔහුගේ භාරයට පත්විය. නිවාස ඉදිවෙන තුරු ඇය රැඳී සිටියේ, ස්ටැන්ගසන් නම් ආගමික සහෝදරයාට අයත් කරත්තයේය. ස්ටැන්ගසන්, ඔහුගේ බිරියන් තිදෙනා, සහ දොළොස් හැවිරිදි පුත්‍රයා ද එහි වාසය කළෝය. කුඩා කාලයේදීම තම මව අහිමි වීමෙන් කම්පනයට පත්ව සිටි දරිය, මේ කාන්තාවන්ගේ සුරතලිය බවට පත්වූවාය.

මේ අතර ජෝන් ෆෙරියර් විඩාපත් නොවන දඩයක්කාරයෙකු ලෙසත්, දක්ෂ මගපෙන්වන්නෙකු ලෙසත්, සහෝදර ජනයා අතර ප්‍රසිද්ධියට පත්විය. අන් අයට සමාන තත්ත්වයේ සශ්‍රීක ඉඩම් කැබැල්ලක් ප්‍රධානීන්ගේ තීරණයෙන් ඔහුට හිමිවිය. මේ ඉඩම ප්‍රමාණයෙන් කුඩාවූයේ නායක උතුමාණන් වූ බ්‍රිග්හැම් යංගේත්, ශුද්ධවන්තයින් සිවුදෙනා වූ ස්ටැන්ගසන්, ඩ්‍රෙබර්, කිම්බෝල් හා ජොන්සන් යන අයගේ ඉඩම් කැබැලිවලට පමණි.

ඔහුට ලැබුණු මේ බිම් කැබැල්ලේ ජෝන් ෆෙරියර්, ලී කොට වලින් නිවසක් තනාගත්තේය. කලක් ගතවෙද්දී මෙයට අමතර කාමර එකතුවී මෙය අගනා වාසස්ථානයක් බවට පත් විය. බුද්ධිමත්, ක්‍රියාශීලී මනසක් තිබූ ඔහු, දෑතේ වැඩකටයුතුවලට දක්ෂයෙක් විය. උදේ සිට හැන්දෑ වන තුරු තමාට අයත් ඉඩම සී සෑමට හා අස්වැද්දීමට, ඔහු සම්පූර්ණ කාලය ගත කළේය. එහෙයින් කල් ගෙවෙද්දී ජෝන් ෆෙරියර්ගේ ගොවිපොළ හොඳින් සරුසාර විය.

http://sherlockholmesinvestigations.blogspot.com

භෝග වගාව හා සතුන් ඇති කිරීම සාර්ථක වෙද්දී, ඔහු ධනය අතින් යහපත් අතට හැරිණි. අවුරුදු තුනක් ගත වෙද්දී ඔහු තම අසල්වාසීනට වඩා ධනවතෙකු විය. අවුරුදු හයක් ගතවෙද්දී ඉඩම්හිමි වැවිලිකරුවෙකු විය. අවුරුදු නවයක් ගතවෙද්දී ඔහු හැඳින්වුණේ, ඉඩම්හිමි ධනවත් ව්‍යාපාරිකයෙකු ලෙසිනි. අවුරුදු දොළහක් ගතවෙද්දී, ෆෙරියර් ධනකුවේරයකු බවට පත්විය. සෝල්ට්ලේක් නගරයේ ඔහුගේ මට්ටමට ළං විය හැකි ධනවතුන් සිටියේ, දුසිම් භාගයකටත් අඩුගණනකි. රට අභ්‍යන්තරයේ මුහුදක් වූ මහා ලුණු විලේ - සෝල්ට් ලේක් සිට, වාසාච් කඳු වැටිය දක්වා ජෝන් ෆෙරියර් තරම් සුප්‍රසිද්ධියට පත් අනෙකකු නොවීය.

ඔහු සමග ආගම ඇදහූ මෝමොන් සමාජයේ, ෆෙරියර් අප්‍රසාදයට පත්වූයේ එකම කරුණක් සම්බන්ධයෙන් පමණි. කවුරු කොතරම් තර්ක විතර්ක ඉදිරිපත් කළත්, ආයාචනා කළත්, විවාහයක් කරගැනීම ජෝන් ෆෙරියර් ප්‍රතික්ෂේප කළේය. මෙසේ කිරීමට හේතුවක් ඔහු කිසිවිටෙකත් ඉදිරිපත් කළේ නැත. ඔහු තම මතයට දැඩිව ඇලී සිටියේය. ඔහු මෙසේ අවිවාහකව සිටීමෙන් පෙන්වන්නේ, මෝමොන් ආගම ගැන ඔහු දක්වන නොසැලකිලිමත් බව යයි සමහරු චෝදනා කළහ. තවත් සමහරුන්ගේ මතය වූයේ, විවාහයක් කර ගැනීමෙන් මුදල් වියදම් වෙන නිසා, ධනයට තණ්හාවෙන් ෆෙරියර් විවාහ නොවෙන බවයි. ෆෙරියර් තරුණ කාලයේ ඔහුගේ ආදරය දිනූ, රත්වන් කෙස් තිබූ ආදරවන්තියක් ඔහුට සිටි බවත්, ඇය ඔහු හැර දමා අත්ලාන්තික් වෙරළ දෙසට පැන ගිය නිසා, විවාහ නොවීමට තීරණය කර ඇති බවත්, තවත් සමහරුන්ගේ මතය විය. කාරණය කුමක් වුවත් ෆෙරියර් ජීවත්වූයේ අවිවාහකවය. අනෙක් සියලුම ආකාර වලින් ඔහු නිසිපරිදි ආගම ඇදහුවේය. ඔහු සෝල්ට් ලේක් නගරයේ ප්‍රකට වූයේ, භක්තිමත්ව ආගම ඇදහූ, අවංක පුද්ගලයෙකු ලෙසයි.

දව නිවසේ හැදුණු වැඩුණු ලූසි ෆෙරියර්, සෑම කටයුත්තකදීම සිය පියාණන්ට සහාය වූවාය. කඳුකරයෙන් හමා ආ වේගවත් සුළඟත්, පයින් ගස් වලින් හැමූ කපුරු සුගන්ධයත්, ඇයට මවක හෝ සේවිකාවක නැති අඩුව පිරවීමට සමත්විය. කාලය වසරින් වසර ගෙවී යද්දී, ලූසී උසින් මහතින් මෙන්ම, ශක්තියෙන් ද වැඩුණාය. ඇගේ කම්මුල් වඩාත් රත් පැහැ වෙද්දී, පියවර තැබීමේ

http://sherlockholmesinvestigations.blogspot.com

ලාලිත්‍යය වෙනස් විය. ෆෙරියර්ගේ ගොවිපොළ අසලින් වැටී තිබූ අඩි පාරේ ගමන් ගත් පැයිණි ගම්වාසීන්ට ලූසීගේ සුන්දර වෙනස පැහැදිලිවම දකිය හැකි විය. සිය පියාගේ තිරිඟු ගොවිපොළෙන් තිරිඟු කරල් මිටියක් නෙලාගෙන, අශ්වයා පිට නැගී ආ ලූසී, ඔවුනට නිතර දකින්නට ලැබිණි. අශ්වයා ද පහසුවෙන් කීකරු කරගෙන, ගොවිපොළේ ධාන්‍ය ද රැගෙන ආ ඇය, ඔවුනට පිහිකලේ බටහිර දිග ජනපදවල තරුණ තරුණියන්ට උරුම, සැබෑ සොඳුරු බව හා කාර්යශූර බවයි. මේ අපූරින් මල් පොහොට්ටුව මලක් බවට විකසිත වෙද්දී, ඇගෙ පියා පැසිෆික් බෑවුමේ ධනවත්ම ගොවියා බවට පත්විය.

මෝමොන් ආගමිකයෝ තමන්ව හඳුන්වාගත්තේ, ජේසුතුමාගේ "මෑත යුගයේ ශාන්තුවරයන්" ලෙසිනි. ඔවුන් තම ආගමේ සංකේතය ලෙස යොදා ගත්තේ මීවදයයි. ඒ ජූනි මාසයේ උණුසුම් දිනයකි. මෑත යුගයේ ශාන්තුවරයෝ මීමැස්සන් මෙන් කඩිසරව වැඩකටයුතුවල යෙදී සිටියහ. ගොවිපොළේත්, මහමගත්, එකසේ අනලස්ව ඔවුහු ක්‍රියාශීලී වූහ.

කැලිෆෝනියා ජනපදයේ රත්රන් ඉල්ලම් හමුවීමේ ආරංචිය උතුරු ඇමෙරිකානු මහාද්වීපය පුරා පැතිර ගියේ ලැව්ගින්නක් මෙනි. එක්සත් ජනපදය පුරා වැසියෝ රත්රන් හෑරීමේ අරමුණෙන්, කැලිෆෝනියාව වෙත සංක්‍රමණය වීමට පටන්ගත්තෝය. ඔවුන්ගේ ගමන් මඟ වැටී තිබුණේ, මෝමොන් දේශයේ අගනුවර වූ සෝල්ට්ලේක් නගරය හරහායි. මේ තවලම්, බඩු පැටවූ කොටළුවන්ගෙන් සහ සංක්‍රමණිකයන් රැගත් අශ්වයින්ගෙන් සැදී තිබිණ. ඒවා වැල නොකැඩී ගමන් ගත්තේ බටහිර දෙසටයි. මේ මිනිස් හා සත්ත්ව ගංගාව නිසා සෝල්ට්ලේක් නගරයේ වීථිවල, නිතිපතා තදබදයක් පැවැතිණි. මීට අමතරව, නුදුරු තණබිම්වල බැටළුවන්ට හා ගවයින්ට තණ කවමින් සිටි ගොපල්ලෝ, තම සතුන් දක්කාගෙන නගරය හරහා ගමන්කළහ. මෙසේ මහජනයාගෙන් සහ සතුන්ගෙන් වීථි පිරී ගිය අවස්ථාවක, ඒ අතරින් අශ්වයෙකු පිට නැගී ගමන්කිරීමට ලූසිට සිදුවිය. ඒ, වෙනදා මෙන්ම එදින ද ඇගේ පියා ඇයට පැවරූ රාජකාරියක් ඉටු කිරීම පිණිසයි.

ඇගේ දුඹුරු පැහැති දිගු කේශකලාපය සුළඟේ ලෙලදෙද්දී, ලූසී අසු පිට නැගී වේගයෙන් ඉදිරියට ගමන්කළාය. ගමන් වෙහෙස

http://sherlockholmesinvestigations.blogspot.com

නිසා ඇගේ මුහුණ රත්පැහැ වී තිබිණි. නිර්භයව අසු ඉදිරියට මෙහෙයවූ මේ සුන්දර තරුණිය දෙස, සංචාරකයෝ විස්මිතව බලා සිටියහ.

නගරයේ පිටත සීමාවට ළංවෙද්දී, පාර සම්පූර්ණයෙන්ම අවහිර වී ඇති බැව් ලූසී දුටුවාය. තණබිම්වල සිට නගරය මධ්‍යයට, ගවයන් දක්කාගෙන ආ ගොපල්ලන්ට තිබුණේ රළු ගති පැවතුම්ය. තමන් නිසා මාර්ගයේ ඇතිවන බාධාව ගැන, ඔවුනු තැකීමක් නොකළහ. මාර්ගය වසා සිටි මීහරක් රංචුවෙන් මිදී සිය කටයුත්ත සඳහා යාමට, ලූසී නොඉවසිල්ලෙන් බලා සිටියාය. ගව පේළියේ හිස් වූ තැනක් දුටු විගස, ඇය තම අසු එතැනට මෙහෙය වූවාය. එහෙත් පසුපසින් ආ ගවයෝ ඒ හිඩැස වැසී යන සේ එතැනට එකතුවූහ. දන් ලූසී, දිගු අං සහිතව බිහිසුණු බැලුම් හෙළූ මීහරක රංචුව මධ්‍යයේය. ගොවිපොළේ වැඩ කටයුතු නිසා ගවයන් ගැන දන සිටි ඇය, බියට පත් වූයේ නැත.

ඇය උත්සාහ දැරුවේ, සතුන් අතරින් ලැබෙන සුළු ඉඩකින්, කෙසේ හෝ තම අශ්වයා ඉදිරියට ගෙන යාමටයි. එහෙත් අවාසනාවක මහත! එක් මීහරකෙකුගේ දිග අඟක් අහම්බෙන් ඇය නැගී සිටි අශ්වයාගේ උදරයේ ඇනිණි. දැඩි වේදනාවට පත් අශ්වයා කෝපයෙන් වියරු විය. ඉදිරි කකුල් දෙක ඉහළට ඔසවාගත් ඌ, මරහඬ දෙමින් දඟලන්නට පටන්ගත්තේය. අශ්වයින් හැලැවීමට පත්ව, කුලප්පු වී, ඉදිරි දෙපා ඔසවමින් කලබල කරන විටෙක, ඌ පිට රැඳී සිටිය හැක්කේ දක්ෂ අශ්වාරෝහකයෙකුට පමණි. මෙය ඉතා භයානක අවස්ථාවකි. ඌ ඉදිරි දෙපා පහළ හෙළා සතරපයින් සිටීමට උත්සහ කළ සැම විටකම, මීහරකුන්ගේ අං අශ්වයාගේ සිරුරේ ඇනිණ. එයින් සිදුවූයේ, ඌ නැවත තවත් කෝපයට පත් වීමයි. ලූසී කෙසේ හෝ අශ්ව සෑදලයේ රැඳී සිටිය යුතු විය. යන්තමින් හෝ පය ලිස්සා ගියහොත් සිදු වන්නේ, ඇය අසුපිටින් බිම ඇද වැටීමයි. එසේ වුවහොත් සිදු වන්නේ, සිය ගණනක් සතුන්ගේ කුරවලට පෑගී, අනිවාර්යයෙන්ම ජීවිතක්ෂයට පත්වීමයි.

මෙවැනි අවස්ථාවකට මුහුණදී පුරුද්දක් නොතිබුණු ලූසීට ක්ලාන්ත ගතියක් දැනිණ. ඉහළට මතුවූ දූවිල්ලෙන්ද, දහලන සතුන්ගේ ප්‍රාශ්වාසයෙන් ද ඇය තවත් අපහසුවට පත් වූවාය. අශ්වයාගේ රේන්ස් පටි අල්ලාගෙන සිටි ඇගේ, දෑත්වල ග්‍රහණය ලිහිල් විය.

http://sherlockholmesinvestigations.blogspot.com

තව මොහොතකින් දිවි ගළවා ගැනීමේ සියලු බලාපොරොත්තු සුනුවිසුනු වී යාමට ඉඩ තිබිණි. එහෙත් එක්වරම ඇගේ වැලමිට අසලින් කරුණාවන්ත වදනක හඬක් ඇයට අසන්නට ලැබිණි. ඒ කිසිවෙකු ඇගේ සහායට ඒමට සූදානම් බවයි. ඒ මොහොතේම දුඹුරු පැහැති හැඩි දැඩි අතක්, අශ්වයාගේ කටකලියාවෙන් අල්ලාගෙන, ඌ ගව රංචුවෙන් ඉවතට ඇද ගත්තේය.

"ඔබට තුවාලයක් සිදුවුණේ නැහැ නේද මෙනෙවිය?" ඇගේ ගැළවුම්කාරයා විමසුවේය.

ඇය හිස ඔසවා නිර්භය, දුඹුරු පැහැති මුහුණ දෙස බලා සිනාසුණාය.

"මං හරියට භය වුණා. මී එළදෙන්නු ගොඩකට, පොන්චෝ මෙච්චර භය වේවි කියල මං හිතුවෙ නෑ."

"ඔබට අශ්ව සැදලයේ රැඳී ඉන්න පුළුවන් වුණු එක ගැන අපි දෙවියන්ට ස්තුතිකරන්න ඕනෙ." ඔහු කීය.

ඔහු බිහිසුණු පෙනුමක් තිබූ උස තරුණයෙකි. වේගයෙන් ගමන් කළ හැකි ශක්තිමත් අසෙකු පිට නැගී සිටි ඔහු, දඩයක්කරුවෙකු මෙන් හැඳ, කරේ රයිෆලයක් එල්ලා ගෙන සිටියේය.

"ඔබ නේද ජෝන් ෆෙරියර්ගේ දියණිය? මං දුටුවා ඔබ ගෙදර ඉඳල මේ පැත්තට ආ හැටි. ඔබේ තාත්තා හමුවුණාම අහන්න, ශාන්ත ලුවී නගරයේ ජෙෆර්සන් හෝප්ව මතකද කියලා. ඔබේ තාත්තා මං හිතන ජෝන් ෆෙරියර් නම්, ඔහු මගේ තාත්තාගේ හොඳ මිත්‍රයෙක්."

"එහෙනම් ඇයි ඉතින් ඔබම අපේ තාත්ත හමුවෙන්න ඇවිත් ඒක අහන්නෙ නැත්තේ?" ඇය ඇසුවේ නැනප්පත් ස්වරයෙනි.

මෙම යෝජනාව ගැන තරුණයා හැබෑම සතුටට පත්වූ බව පෙනිණ. ඔහුගේ කළු පැහැති දෙනෙත ප්‍රීතියෙන් දිලිසෙන්නට විය.

"හොඳයි මම එන්නම්. අපි පසුගිය මාස දෙකම කඳුකරයට වෙලා රළු ජීවිතයක් ගතකළේ. ගෙදරකට ගොඩවදින්න තරම් පිරිසිදු පෙනුමක් මා ළඟ නැහැ. ඔහුට අපව පිළිගන්න වෙනවා මේ හැටියටම!!"

"ඔබට ස්තුතිකරන්න ඔහුට හේතු ගොඩක් තියේවි. ඒ වගේමයි මටත්." ඇය පිළිතුරු දුන්නාය. "තාත්ත මට හරි ආදරෙයි. අර

http://sherlockholmesinvestigations.blogspot.com

එළදෙනුන්ට පෑගිලා මාව මළා නම්, ඔහුට ඒක දරාගන්න බැරි වේදනාවක් වෙනවා."

"ඇයි මටත් ඒක දරා ගන්න බැරි වේදනාවක් වෙනවා." ඔහු කීය.

"ඔබට? ඒකෙන් ඔබේ හිතට අමාරුවක් ඇතිවෙන්නේ කොහොමද කියලා මට හිතාගන්නවත් බෑ. ඔබ අපේ යාළුවෙක්වත් නෙමෙයි නේ."

ලුසී ෆෙරියර්ගේ මේ ප්‍රකාශයෙන් තරුණයාගේ මුහුණ අඳුරු විය. ලුසී ඊට හඬ නගා සිනාසුණාය.

"ඔන්න බලන්න. මං එහෙම දෙයක් අදහස් කළේ නෑ." ඇය කීවාය. "ඔබ දැන් අපේ යාළුවෙක් නේන්නම්. ඔන්න කොහොම හරි අපව බලල යන්න අපේ ගෙදර එන්න ඕනෙ. එහෙනම් මං යන්නම්. මට ප්‍රමාද වෙනවා. තවත් ප්‍රමාද වුණොත් ඔහුගේ රාජකාරි ගැන තාත්තා තවදුරටත් මං ගැන විශ්වාසයක් තියන එකක් නෑ. ආයුබෝවන්!"

"ආයුබෝවන්!" ඔහු පිළිතුරු දුන්නේ හුරුල් වාටියක් සහිත ඔහුගේ හිස්වැස්ම ඔසවමිනි.

තම අශ්වයාට කස පහරක් දුන් ඇය, දූවිලි වලාකුළක් මැද්දේ අසු ඉදිරියට මෙහෙයවූවාය.

ජෙෆර්සන් හෝප් තරුණයා තම සගයින් සමග අසුන් පිට නිහඬව ඉදිරියට ගමන්කළේය. ඔහු තම හිතමිතුරන් සමග ගොස් සිටියේ නෙවාඩා කඳුකරයටයි. රිදී ඉල්ලම් ගැරීම සඳහා එහි ගිය ඔවුනට ඉල්ලම් කිහිපයක්ම හමු විය. එහෙත් මේ කටයුත්ත සඳහා යෙදවීමට තරම් මුදලක් ඔවුන් අත නොතිබිණි. ඔවුන් සෝල්ට් ලේක් නගරයට ආවේ එම අරමුදල උපයා ගැනීම සඳහායි.

අනෙක් අය මෙන්ම ඔහුගේ ද උනන්දුව යොමු වී තිබුණේ, තමන් යෙදීමට බලාපොරොත්තු වන කටයුත්ත කෙරෙහිය. එහෙත් හදිසියේ මෙම තරුණිය දකින්නට ලැබීම නිසා, දැන් ඔහුගේ අවධානය වෙනස් වී ඇත. තම සිතේ යටපත් නොවෙන කැලැඹීමක් හටගෙන ඇති බැව් ඔහුට වැටහිණි. රිදී ඉල්ලම් ගැරීමවත්, වෙනත් කිසිම කටයුත්තක්වත් මේ අලුත් ප්‍රශ්නය තරම් වැදගත් ඒවා නොවන බව ජෙෆර්සන් හෝප් මෙනෙහි කළේය. ඔහුගේ සිතේ ඇතිවූයේ අවංක

http://sherlockholmesinvestigations.blogspot.com

ආදරයකි. තමන් අතගැසූ සෑම කටයුත්තක්ම සාර්ථක ලෙස ඉටුකරගැනීමට මේ දක්ෂා ඔහු සමත්විය. අප්‍රතිහත ධෛර්යයෙන්, මිනිසෙකුට යෙදිය හැකි උපරිම උත්සාහය යොදා, ඇය දිනාගන්නෙමැයි ඔහු සිතාගත්තේය. ඒ අයුරින් මේ කටයුත්ත සාර්ථක කරගන්නෙමැයි, ඔහු තමාටම ශපථ කරගත්තේය.

එදා රාත්‍රී ජෝන් ෆෙරියර් හමුවීමට ඒ නිවසට ගියේ කවරෙක්ද, මේ තරුණයා මිස? එදා පමණක් නොවේ. ඔහුගේ මුහුණ ෆෙරියර් නිවසේ හුරුපුරුදු දසුනක් බවට පත්වෙන තරමට, ජෙෆර්සන් හෝප් යළි යළිත් එහි ගියේය.

මෙම මිටියාවතටම වී, පසුගිය අවුරුදු දොළහක කාලයක් ගොවිතැන් කටයුතුවල ඇලී ගැලී සිටි ජෝන් ෆෙරියර්ට, බාහිර ලෝකයේ සිදුවන්නේ කුමක්ද යන්න දැනගැනීමට අවස්ථාවක් නොවීය. ඒ හැම දෙයක්ම ඔහුට ජෙෆර්සන් හෝප්ගෙන් දැනගන්නට ලැබිණි. ඔහු ඒවා විස්තර කළේ මහල්ලාගේ පමණක් නොව ලූසීගේ ද සිත්ගන්නා අයුරෙනි.

කැලිෆෝනියාවට සංක්‍රමණය වූ පුරෝගාමීන් අතර, හෝප් ද එක් අයෙක් විය. සාමය පැවැති ඒ දිනවල, සමහරු විශාල වශයෙන් ධනය ඉපැයූ හැටිත්, සමහරු ඒ ධනය විනාශ කරගත් හැටිත් ගැන පුදුමාකාර කථා රැසක්, තරුණයා දැන සිටියේය. ඔත්තුකරුවෙකු, දඩයක්කාරයෙකු, රිදී ඉල්ලම් ගරන්නෙකු සත්ත්ව ගොවිපොළක් පවත්වාගෙන යන්නකු ආදී, නොයෙක් රැකියාවල යෙදී ඇති ඔහුට අත්දැකීම් සම්භාරයක් විය. වික්‍රමාන්විත ක්‍රියාවක් සිදුවෙමින් තිබුණේ කොහිද, ජෙෆර්සන් හෝප් ඒ තැන් සොයා ගොස්, ඒවාට සහභාගි විය. වැඩි දවසක් යාමට පෙර ඔහු මහලු ෆෙරියර්ගේ ළබැඳි මිත්‍රයෙක් බවට පත්විය. තරුණයාගේ නොසැලෙන අධිෂ්ඨානය ගැන මහලු ගොවියා පැහැදුණේය. තරුණයාගේ යහපත් ගතිගුණ ගැන ප්‍රශංසා කිරීමට ද ජෝන් ෆෙරියර් පසුබට නොවීය.

මෙවැනි අවස්ථාවලදී ලූසි නිහඬ වූවාය. එහෙත් ඇගේ සතුටෙන් බැබළෙන දීප්තිමත් දෑස් හා රත් පැහැ දෙකොපුල්වලින් පැවසුණේ, ඇගේ හදවත තවදුරටත් ඇය සතුව නැති බවයි. ඇගේ තාත්තාට නම්, මෙම ලකුණු තේරුම් ගන්නට අමාරු වන්නට ඇත. එහෙත් ඇගේ සිත දිනාගත් තරුණයාට නම් එම ලකුණු තේරුම් ගැනීමට අපහසුවක් නොවීය.

http://sherlockholmesinvestigations.blogspot.com

ගිම්හාන සෘතුවේ එක් උදෑසනක ජෝන් ෆෙරියර් ගේ නිවස වෙත වේගයෙන් පැමිණියේ අශ්වාරෝහකයෙකි. ඒ ජෙෆර්සන් හෝප්ය. ඔහු ගේට්ටුව අසල අසුපිටින් බසිද්දී, දොර අසල සිටි ඇය, ඔහු හමුවීමට ඉදිරියට ගියාය.

"මං මේ නගරයෙන් පිටවෙලා යන්නයි හදන්නේ ලුසී." ඔහු කීවේ ඇගේ දෑත්වලින් අල්ලාගෙන, ඇගේ දෑස් වෙතට එබී බලමිනි. "අද මා එක්ක යන්න සූදානම් වෙන්න කියලා, මං ඔයාගෙන් ඉල්ලා හිටින්නේ නෑ. ඒ වුණත් ලුසී මං ආයේ මෙහෙ එන දවසට ඔයා සූදානම් නේද?."

"කවදද ඒ දවස?" ඇය ඇසුවේ සිනාසෙමින් එහෙත් ලැජ්ජාවෙන් රතුවෙමිනි.

"වැඩිම උණොත් තව මාස කිහිපයකින්. මං ආයෙමත් ආව දවසට, ඔබව මට විවාහ කරදෙන්න කියලා මං ඔබේ තාත්තාගෙන් ඉල්ලා සිටිනවා. අපට බාධාකරන්න කිසිකෙනෙක් නෑ."

"එතකොට තාත්ත මොනව කියාවිද මම දන්නෙ නෑ.?"

"ඔහු කැමැතියි. හැබැයි අපේ රිදී පතල්වල ඉල්ලම් හෑරීමේ වැඩේ සාර්ථකව කෙරෙනවා නම්. ඒක හරියන බවට මගේ හිතේ සැකයක් නෑ."

"එහෙනම් කොච්චර හොඳද? තාත්තයි ඔබයි හැම දෙයක් ගැනම කථාකරල තීරණයකට ඇවිත්. මං ඉතින් මොනව කියන්න ද?" ඇය කොඳුළාය.

"දෙවියන්ට ස්තුතිවේවා." ඔහු කීය.

"එහෙනම් ඒක තීන්දුයි. මං මෙතැන රැඳී සිටින වෙලාව වැඩිවෙන්න වැඩිවෙන්න, මෙතැනින් පිටවී යාමත් අපහසු වෙනවා. මගේ මිත්‍රයන් මං එනතුරු මග බලාගෙන. එහෙනම් ආයුබෝවන් ලුසී. තව මාස දෙකකින් ඔබට මාව දකින්න ලැබේවි. ආයුබෝවන්!"

ඔහු ඇයගෙන් සමුගෙන අසුපිටට නැඟී මිතුරන්ට එක්වුණේය. අනතුරුව ඔවුනු වේගයෙන් මේ පෙදෙසින් ඉවත්වී ගියහ. ඔහු තම දර්ශන පථයෙන් ඉවත්වී යන තුරු, ඇය ගේට්ටුව අසලට වී බලා සිටියාය. ඇය ආපසු නිවස වෙත ආවේ මුළු යූටාවේම ප්‍රීතිමත්ම යුවතිය ලෙසිනි.

Reading Purpose Only. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

## 3

# ජෝන් ෆෙරියර් නායක උතුමාණන් සමග සාකච්ඡාවක

ජෙෆර්සන් හෝප් ඔහුගේ සගයන් සමග සෝල්ට් ලේක් නගරයෙන් පිටවී ගොස් සති තුනක් ගතවිය. මාස දෙක සම්පූර්ණ වෙද්දී තරුණියා ආපසු පැමිණෙන බව ජෝන් ෆෙරියර්ට සිහිවිය. එවිට තමා ආදරයෙන් හදා වඩා ගත් දියණිය තමාට අහිමිවන බව සිතද්දී, ඔහුගේ සිතේ ඇති වූයේ ශෝකයකි. එහෙත් දන් ඇය අතිශය සතුටෙන් කාලය ගතකරන සැටිත්, ඇයගේ මුහුණ සිනහවෙන් ඔප වැටී ඇති සැටිත් දකිද්දී, ඔහුගේ සිතට ඇතිවූයේ සැනසීමකි.

මෝමොන් භක්තිකයෙකුට තම දියණිය කිසිදිනෙක විවාහ කර නොදෙන්නෙමැයි යන අදහසක්, ඔහුගේ යටි සිතේ තැන්පත් වී තිබිණි. මෝමොන් විවාහයක් කිසිසේත් විවාහයක් ලෙස තමාට සැලකිය නොහැකි බව ෆෙරියර් මෙනෙහි කළේය. එවැන්නක්, අවනම්බුවක්, ලැජ්ජාවට කරුණක් මිස විවාහයක් නොවේ. මෝමොන් භක්තිකයන්ගේ අනෙකුත් නීතිරීති හා ක්‍රියා පිළිවෙත් ගැන එතරම් බැරෑරුම්ව නොසිතුවත්, එක පිරිමියා එක්වර කාන්තාවන් ගණනාවක් විවාහකරගන්නා චාරිත්‍රය ගැන, ෆෙරියර්ගේ සිතේ තිබුණේ පිළිකුලකි. කෙසේ වෙතත් ඒ ගැන විවෘතව අදහස් දක්වීමට ඔහුට හැකියාවක් නොවීය. මෝමොන් වරුන්ගේ පිළිවෙතට විරුද්ධ අදහසක් ප්‍රකාශකිරීම, අතිශයින් භයානක කටයුත්තකි.

ඔව්. ඇත්තෙන්ම එය අති භයානක පියවරකි. ආගම පිළිබඳ තමන්ගේ අවංක හැඟීම් කෙනෙකුගේ මුවෙන් පිටවුණහොත් නම්, ඒ කෙඳිරිලි හඬිනි. තමාටම ඇසෙන සේ පමණි. ඒ කුමක් නිසාද යත්, කෙනෙකුගේ මුවෙන් පිටවන එවැනි අදහස්, ඉහළ තැන්වලට ආරංචි

http://sherlockholmesinvestigations.blogspot.com

වන්නේ නොයෙකුත් විකෘතිවීම් ද සහිතවය. එවිට එම පුද්ගලයාට ලැබෙන්නේ ක්ෂණික මෙන්ම දරුණු දඬුවමකි. තමන් එක්සත් ජනපදයේ මිසූරි, ඉලිනොයිස් හා අනෙක් තැන්වලදී අසාධාරණයට හා අවනීතියට යටත්ව හිංසාවට පත්වූයේ යයි මෝර්මොන්වරු චෝදනා කළහ. එහෙත් දැන් අවනීතියක් රජකරවමින්, අසරණයින්ට බිහිසුණු අයුරින් හිංසා පීඩා කරන්නේ ද මෝර්මොන්වරුන්මය. ජර්මන් ඝාතක සංවිධාන, ඉතාලියේ රහස් මිනීමැරුම් කල්ලි ආදී මේ කිසිවකින් නොකළ වර්ගයේ භීෂණයක්, නිතිපතා දෙවියන්ට යාච්ඤා කරන, මෑත යුගයේ ශාන්තුවරයන් අතින් සිදුවිණි. එය යූටා ජනපදය වසාගෙන පැතිර ගියේ බේදජනක අඳුරු වලාකුළක් විලසිනි.

මෙම සංවිධානයේ ක්‍රියාවලි වඩාත් බිහිසුණු ස්වභාවයක් ගැනීමට හේතු දෙකකි. එකක් එහි තිබූ අද්‍යශ්‍යමාන ස්වරූපයයි. අනෙක එය ගොඩනැගූ අභිරහස් ස්වභාවයයි. එයට දැනගන්නට ලැබූ කාරණා සහ එකතුවූ දැනුම පුදුමාකාර විය. එම සංවිධාන සතුවූ බලයේ ද සීමාවක් නොවීය. එහෙත් එවැන්නක් පැවතුණු බව පිටතට නොපෙනුණ අතර, ඔවුන්ගේ හඬක් කිසිවෙකුට අසන්නට ද නොලැබිණ. ආගමේ අන්තවාදී ස්වභාවයට එරෙහිව, කිසිවෙකුගෙන් වචනයක් හෝ කියැවුණොත්, ඒ පුද්ගලයා අතුරුදන් වෙයි. ඔහු රට හැර දමා ගියාද, ඔහුට අත්වූයේ කිනම් ඉරණමක්ද යන්න, කිසිවෙකුට දැනගැනීමට නොලැබේ. ඔහුගේ බිරිඳ හා දරුවන් ඔහු එනතුරු බලා සිටිනු නො අනුමානය. එහෙත් රහසිගත විනිසුරුවන් ඉදිරියේ තමාට ලැබුණේ කුමන දඬුවමක්දැයි කීමට පියා කිසි දිනෙක ගෙදර ආවේ නැත. අසරණයෙකුගේ මුවෙන් පිටවන එක් වචනයක් හෝ සිදුවන සුළු අත් වැරැද්දක් නිසා, ඔහුගේ මුළු ආත්මයම, ජීවිතයම විනාශකර දැමීම සිදු විය. තමන්ගේ හිස්වලට ඉහළින් පාවෙමින් පැවති, මේ බලසම්පන්න භීෂණය කුමක්දැයි තේරුම් ගැනීමට, අසරණ යූටා වැසියන් කිසිවෙකුට හැකියාවක් නොතිබිණි. කවුරුත් එදිනෙදා කටයුතු වල යෙදුණේ, ඔබමොබ ගියේ, සිතේ භයෙන් හා තැතිගැන්මෙනි. එසේ වීම පුදුමයක් නොවේ. තමන්ට එරෙහිව ක්‍රියාත්මක වූ බලවේගය පිළිබඳව, රහසිගතව, එක් වචනයක් හෝ කෙඳිරීමටවත් කිසිවෙකු නිර්භය වූයේ නැත.

http://sherlockholmesinvestigations.blogspot.com

මුලදී මෙම ප්‍රහාර එල්ල වූයේ, ආගම් නීතිරීති අවඥාවට ලක් කළ හෝ නොසලකන අයටයි. මෙසේ දඬුවම් ලැබූ සමහර දෙනා, මෝමොන් ආගම වැළඳගෙන සිට, පසුව ඒ ගැන කලකිරී වෙනත් ආගම්වල පිහිට පැතූ අය වූහ. වැඩිකල් යාමට පෙර මෙම ප්‍රහාර වඩාත් පුළුල්ව ක්‍රියාත්මක වීමට පටන් ගත්තේය. මෙයට ප්‍රධාන හේතුව වූයේ මෝමොන් ආගමික පිරිමින්ට, භාර්යාවන් කිහිපදෙනෙකු විවාහ කරගැනීමට හැකිවීමේ නීතියයි. වැඩිහිටි කාන්තාවන් සංඛ්‍යාව අඩුවෙද්දී හොයෙකුත් ගැටලු පැනනැගිණ.

යූටාවට සංක්‍රමණය වූ අසරණ ජනයා ලැගුම්ගත් ප්‍රදේශවලට කඩා වැදුණු මැර පිරිස්, පිරිමින් මරා දැමීමට පටන්ගත්හ. ශෝකයෙන් වැළපෙන කාන්තාවන්, විශාල වශයෙන්, ආගමික නායකයින්ට අයත් නිවාසවල සිටිනු දක්නා ලදී. ඔවුන්ගේ මුහුණුවලින් පළවූයේ භීෂණයේ සලකුණුය. අඳුරු වැටුණු පසු, මෙස්මුහුණුවලින් මුහුණු ආවරණය කරගෙන, ආයුධවලින් සන්නද්ධව, කඳුකරයේ සැඟවී ක්‍රියාත්මක වූ මැර කල්ලි ගැන කඳුකරයේ විසූ ගැමියෝ කථාකිරීමට පටන්ගත්හ. මෙම කටකතා මෙන්ම දූසමාන ආරංචි, නිවැරදි බවට සාක්ෂි, සෑම දෙසකින්ම ලැබෙන්නට විය. ඒ ආරංචි සත්‍ය බව නැවත නැවතත් ඔප්පු විණි. මඳ කලක් ගතවෙද්දී මෙම මිනීමරු කල්ලි, විශේෂිත නම් වලින් තමන් හඳුන්වා ගැනීමට පටන්ගත්හ. බටහිර දිග යූටාවේ 'ඩැනයිට් කල්ලිය' 'පළිගන්නා දේවදූතයෝ' ආදී නම් ඇසෙන විටත් ප්‍රදේශ වාසීන් තුළ ඇති වූයේ, භීතිය සහ තමන්ගේ අවාසනාව පිළිබඳ හැඟීමය.

මෙවැනි රහස් සංවිධාන පිළිබඳ සම්පූර්ණ තොරතුරු හෙළි වන්නේ කලාතුරකිනි. නමුත් ඒවා හෙළි වූ විට මිනිස් සිත්වල ඇති වන භීතිය, අඩුවනවා වෙනුවට එය දෙගුණ තෙගුණ වේ. මෙම රහස් සංවිධානවල සාමාජිකයන් වූයේ කවුරුන්ද යන්න කාටත් රහසක් විය. ආගමේ නාමයෙන් මේ බිහිසුණු ලේ වැගිරීම් කළ පුද්ගලයින්ගේ නම් පවා, රහසිගතව තබා ගැනිණි. ආගමික නායකයා හා ඔහුගේ පාපිෂ්ඨ ධර්මය ගැන ඔබේ සිතේ ඇතිවන හැඟීම්, ඔබේ ළඟම මිතුරාට හෙළිකරන්නට ඔබට සිතෙනු නොඅනුමානයි. එය භයානකය! සමහර විට එදා රාත්‍රියේම ඔබව ඝාතනය කිරීමට කඩු, කිණිසි තුවක්කු රැගෙන පැමිණෙනා ඝාතකයා, ඔබේ ඒ මිතුරා විය හැකියි. එහෙයින්. සෑම කෙනෙකුම තම අසල්වැසියාට පවා

http://sherlockholmesinvestigations.blogspot.com

බියවිය. තම සිතේ ඇතිවුණු හැඟීම් කිසිවෙකුටත් හෙළිකළේ ද නැත.

එක් සුන්දර උදෑසනක ජෝන් ෆෙරියර්, තිරිඟු වගාකර තිබූ තම කුඹුරු යාය ගැන සොයා බැලීම සඳහා පිටත්ව යාමට සූදානම් විය. තම ගේට්ටුවේ අගුළ විවෘත වන හඬ ඔහුට ඇසිණ. ජනේලයෙන් එබී බැලූ ඔහු දුටුවේ මැදිවියේ කෙනෙකු ඔහු සොයා නිවසට එන හැටියි.

මඳක් සුදුවුණු කොණ්ඩය සහිත මේ තුරබාරු පුද්ගලයා තම දොර වෙත එද්දී, ජෝන් ෆෙරියර් වඩාත් විමසිල්ලෙන් බැලීය. මේ අන්කිසිවෙකු නොව, ආගමේ නායක උතුමාණන් වූ බ්‍රිග්හැම් යං බව දුටු ෆෙරියර්, මවිතයට පත් විය. මෙවැනි පැමිණීමක් යහපතක පෙරනිමිත්තක් නොවේ: ඒ බව ෆෙරියර් දැන සිටියේය. ඔහු භීතියෙන් හැකිගත්තේය. වහා දොරටුව වෙත ගිය ෆෙරියර් මෝමොන් නායකයාට ආචාර කළේය. එහෙත් අමුත්තා ඒ ආචාරය ඒ තරම් ගණනකට ගත් බවක් නොපෙණින. ඔහු විසිත්ත කාමරය තුළට පැමිණ අසුන් ගත්තේය. ආගමික නායකයාගේ මුහුණේ තිබුණේ අනුකම්පා විරහිත හැඟුමකි.

"ෆෙරියර් සහෝදරයා." ඔහු කීවේ ගෙහිමියා වෙත තියුණු බැල්මක් හෙළමිනි. "සැබෑ බැතිමත්හු* හැමදාමත් ඔබේ සැබෑ මිතුරන් වුණා. ඔබ කාන්තාරයේ නිරාහාරව මියයන්න සිටියදී අප ඔබව බේරාගත්තා. අපේ කෑම බීම ඔබ සමඟ බෙදාහදා ගත්තා. අවසානයේ අප ඔබව දෙවියන් වහන්සේ අප වෙනුවෙන් තෝරාගත් භූමියේ ඊකවරණයට ගෙන ආවා. එහි හොඳම ඉඩම් කැබැල්ලක් අපි ඔබට ලබාදුන්නා. ඊළඟට අපේ ආරක්ෂාව යටතේ ඔබට විශාල ධනවතෙක් වෙන්න පහසුකම් සලස්වා දුන්නා, එහෙම නොවෙයිද?

"ඔබ කී හැම දෙයක්ම ඇත්තයි." ෆෙරියර් පිළිතුරු දුන්නේය.

"මේ හැම දෙයක්ම වෙනුවෙන්, අපි ඔබෙන් ඉල්ලා හිටින්නේ එක දෙයයි. ඒ මොකක්ද? ඔබ අපේ ආගම නියමාකාරයෙන්

---

* ජේසුස් වහන්සේගේ ආගම සැබෑ ලෙස අදහන්නේ තමන් පමණක් බව කියමින් මෝමොන් භක්තිකයෝ තමන් "සැබෑ බැතිමතුන්" යන පදයෙන් හඳුන්වාගත්හ.

http://sherlockholmesinvestigations.blogspot.com

වැළඳගෙන, එහි නීතිරීති වලට අනුකූලව කටයුතු කිරීමයි. නමුත් ඔබ ගැන මට ලැබිලා තියෙන වාර්තා ඇත්ත නම්, ඔබ අර හැමදෙයක්ම නොසලකා හැරලා."

"මං ආගමානුකූලව කටයුතු කිරීම නොසලකා හැරිය කියන්නේ කොහොමද?" පෙරියර් ඇසුවේ තම දැන් ඔසවා එයට විරුද්ධත්වය ප්‍රකාශ කරමිනි.

"මං පොදු අරමුදලට මුදල් පරිත්‍යාග කළේ නැද්ද? මං නිතරම දේවස්ථානයට ගියේ නැද්ද? මං......"

"කෝ ඔබේ බිරින්දෑවරුන්?" යං ඇසීය. "එන්න කියන්න ඔවුන්ට මෙහාට. මං කැමැතියි ඔවුනට ආශිර්වාද කරන්න."

"මං විවාහ වුණේ නැති බව නම් ඇත්තයි. නමුත් කාන්තාවන් සිටියේ බොහොම අඩුවෙන්. ඔවුන් විවාහ කරගන්න මට වඩා සුදුස්සන් හිටියා. කොහොම වුණත් මට පාළුවක් දැනුණේ නෑ මගේ දුව මගේ දුක සැප හොයා බැලුවා."

"ඔබේ අන්න ඒ දුව ගැන කථාකරන්න තමයි මං මේ ආවේ." නායක උතුමා පැවසීය. "ඇය දැන් හැදිල, වැඩිල යුවාවට පිපුණු මලක් වගෙයි. මේ දේශයේ ඉහළම තනතුර දරන කිහිප දෙනෙකුගේම සිත්වල, ඇය ගැන පැහැදීම් ඇතිවෙලා."

ජෝන් පෙරියර්ට සිත ඇතුළෙන් කෙඳිරිගෑවිණි.

"ඇය ගැන නොයෙක් කතන්දරත් මට අහන්න ලැබිල තියෙනවා. කවුද කිව්වා, ඇය කවුදෝ මිථ්‍යාදෘෂ්ටිකයෙකුට කැමැත්ත දීල කියලා. මං ඒ කටකතා විශ්වාස කරන්න කැමැති නැහැ. ඕව මේ වැඩක් නැති මිනිසුන්ගේ ඕපාදූප වෙන්න ඇති. ඔබ දන්නවා අපේ ශාස්තෘවරයාණන් වන ජෝසප් ස්මිත් පැනවූ 13 වැනි නීතිය? අපේ ආගමේ සෑම තරුණියක්ම, අපේ ආගමේ කෙනෙක් සමග විවාහ විය යුතුමයි. ඇය වෙනත් ආගමික කෙනෙක් සමග විවාහ වුණොත් ඒක බරපතල පාපයක්. අන්න ඒ නිසා, ආගම හොඳින් අදහන කෙනෙක් හැටියට, එවැනි කටයුත්තක් ඔබට අනුමත කරන්න බැහැ. ඇයට ඒ නීතිය උල්ලංඝනය කරන්න දීල ඔබ කොහොම බලා ඉන්නද?"

ජෝන් පෙරියර් ඊට පිළිතුරක් දුන්නේ නැත. එහෙත් ඔහුගේ අතැඟිලි අශ්වයින්ට තලන කසයේ දවටුණේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"ෆෙරියර්. ඔබ අපේ ආගම කෙරෙහි දක්වන සම්පූර්ණ භක්තිවන්තකම, අප පරීක්ෂා කර බලන්නේ මෙන්න මේ එකම කාරණාවෙන්. ඒ ගැන ශුද්ධවන්තයින් සිවුදෙනාගේ මණ්ඩලය තීරණයකට ඇවිල්ලයි තියෙන්නේ. ඔබේ දුව තරුණියි. ඇයට විවාහ වෙන්න, කෙස් සුදුවෙන තුරු බලාගෙන ඉන්න අපි ඉඩ තියන්නේ නෑ. අනික එකම කෙනෙක් සමග විවාහ වියයුතුම යි කියලා අපි ඇයට බලකරන්නේ නෑ. තමන්ගෙ මනාලයා තෝරගන්න අපි ඇයට අවස්ථාවක් දෙනවා. අපේ ආගමික නායකයන්ට නම් ඕනෑ තරම් බිරින්දෑවරු ඉන්නවා. නමුත් අපේ තරුණ ළමයින්ටත් විවාහ වෙන්න අවස්ථාවක් සලස්වන්න ඕනෑ. ස්ටැන්ගසන්ට පුතෙක් ඉන්නවා. ඩ්‍රෙබර්ට පුතෙක් ඉන්නවා. ඒ දෙන්නාගෙන් කවුරු වුණත් කැමති වෙච්, ඔබේ දුව මනාලියක් හැටියට භාරගන්න. මේ තරුණයන් දෙදෙනාම පොහොසත්. තෝරගන්නේ මොන තරුණයාද කියන එක තීරණය කිරීම ඇයට භාරදෙන්න. ඔබ මොකද ඒ ගැන කියන්නේ?"

තම නළල රැලි ගන්වාගෙන ෆෙරියර් මද වේලාවක් කල්පනාකරමින් සිටියේය.

"අපට ටිකක් කල් දෙන්න." ඔහු අන්තිමේදී කීවේය. "මගේ දුව හරි ලාබාලයි. ඇයට තවම විවාහ වෙන්න තරම් වයසක් නෑ."

"තෝරාගැනීම කරන්න, අපි ඇයට මාසයක් කල් දෙන්නම්." යං කීවේ අසුනෙන් නැගීසිටිමින් "ඒ කාලය අවසන් වෙනකොට ඇය පිළිතුරක් දිය යුතුයි."

නිවසින් පිටත්ව යාමට සූදානම් වූ ඔහු, යළිත් ආපසු හැරුණේ කෝපයෙන් රතුවූ මුහුණෙනි.

"ජෝන් ෆෙරියර් ඔහේ මතක් තියාගන්නවා හොඳයි. ශුද්ධවන්තයින් සිව් දෙනාගේ මණ්ඩලයේ තීරණයට විරුද්ධ වෙන්න නම් හිතන්නවත් එපා. එහෙම විරුද්ධ යමක් කළොත් තමුසෙට හිතේවි, සියරා බ්ලැන්කෝ කඳු ආමුල ඇටසැකිලි වෙලා අව්වට පිළිස්සුණා නම් ඊට වැඩිය හොඳයි කියලා." දබරැඟිල්ල ඔසවා අනතුරු ඇඟවූ බ්‍රිග්හැම් යං නිවසින් පිටවී ගියේය.

අසුනේ වාඩිවී සිටම, නිකට අල්ල මත තබාගෙන ජෝන් ෆෙරියර් කල්පනා කළේය. උද්ගත වී ඇති මේ තත්ත්වය දුවට දනුම් දෙන්නේ කෙසේ දයි ඔහු සිතුවේය. එසේ සිතමින් සිටියදී

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

සියුමැලි අතක්, තමාගේ අත මතු තබනු ෆෙරියර්ට දැනිණි. ඔහු හිස ඔසවා බැලුවේය. ලුසී සිය පියාණන් අසල සිටගෙන සිටියාය. ඇගේ මුහුණ භයෙන් ත්‍රස්තව සුදුමැලි වී තිබිණි. ඇය සියල්ල අසා සිට ඇති බව, ඇගේ මුහුණ දෙස හෙළූ එක බැල්මෙන්ම ඔහු තේරුම් ගත්තේය.

"ඔහු කියූ දේවල් නොඇසා ඉන්න පුළුවන් කමක් මට තිබුණේ නෑ තාත්තේ. ඔහු කථාකළේ මුළු ගෙයම දෙදරන්න තරම් ශබ්දෙට. අනේ තාත්තේ දැන් අපි මොකද කරන්නේ?"

"ඔයා භය වෙන්න එපා දුවේ." ෆෙරියර් කීවේ දියණිය තමා වෙත ළං කරගෙන ඇගේ හිස අතගාමිනි.

"අපි කොහොම හරි මේ ප්‍රශ්නය විසඳාගමු. අර තරුණයා ගැන ඔබේ තිබෙන අදහස වෙනස් කරගන්න බලාපොරොත්තුවක් නැහැ නේද?"

පියාගේ අත තදින් අල්ලාගත් ලුසීගෙන් පිටවුණේ ඉකිගසන හඬකි.

"නෑ නෑ ඒක කොහොමටවත් වෙනස් කරන්න උවමනා නෑ. ඔයා එහෙම කියාවි කියලා මං බලාපොරොත්තු වුණේත් නෑ. ඒ ඉලන්දාරියා හොඳ කොල්ලෙක්. ඔහු පිරිසිදු ක්‍රිස්තියානි ආගම අදහන කෙනෙක්. මේ මෝමොන් කාරයින්ගේ ඔක්කොම යාච්ඤා වලටයි දේශනවලටයි වඩා, මට ඒක වටිනවා. හෙට නෙවාඩා වලට පිටත් වී යන කණ්ඩායමක් ඉන්නවා. මං ඔවුන් අතේ අර තරුණයාට පණිවුඩයක් යවන්නම්. අපි හිරවෙලා ඉන්න උගුල ගැන මං ඔහුට දන්වන්නම්. මං ඔහු ගැන තේරුම් ගත්ත හැටි හරි නම්, ඔහු ඒවි විදුලිපුවතක් එනවාට වඩා වේගයෙන්."

සිය පියා යෙදූ උපමාව ගැන ලුසී කඳුළු අතරින් සිනාසුණාය.

"ඔහු මෙහෙ ආවාම කියාවි, කරන්න තියෙන හොඳම දේ මොකක්ද කියලා." ඇය කීවාය. "ඒ වුණාට මට භය තියෙන්නේ තාත්තා ගැනයි. ආගමික නායකයන්ගේ ආඥාවලට, විරුද්ධ අදහස් පළ කරන අයට සිදුවෙන දේ ගැන, භයානක කථා අහන්න ලැබෙනවා. මොන විධියකින් හරි ඔවුනට මුහුණපාන්න වෙන්නේ භයානක ඉරණම්වලට."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ ඔවුනට අපි තවම ඔවුනට විරුද්ධව ගියේ නැහැ නේ." ඇගේ පියා පැවසීය. "අපි එහෙම කරනවා නම් කරන්න වෙන්නේ විලාප තියලා අඩන්න බලාගෙන. අපට තව මාසයක් කල් තියෙනවා. ඒක ඉවරවෙද්දී.........මං හිතන්නේ අපට යූටාව දාල පැනල යන්න වේවි."

"යූටාව දාලා යන්න?"

"එහෙම තමයි කරන්න වෙන්නේ."

"එතකොට තාත්තගෙ ගොවිපොළ?"

"අපට පුළුවන් තරමක් මුදල් වලට හරවාගමු. අනෙක් හරිය අපට අහිමි වෙනවා. ඒකට කරන්න දෙයක් නෑ. ඔයාට ඇත්තම කියන්නම් දුව. මං මේ මෙහෙන් පැනල යන්න හිතුව මුල් වතාව නෙමෙයි. මේ මිනිස්සු උන්ගේ නායක උතුමාණන් කියන මෝඩයා ඉදිරියේ දණින් වැටුණට, මං කැමති නෑ ඒක කරන්න. මං නිදහස්ව උපන් ඇමරිකන් ජාතිකයෙක්. මේ හැමදෙයක්ම මට අලුත්. මං හිතන්නේ මේ දේවල් අලුතෙන් පුරුදුවෙන්න මට වයස ගියා වැඩියි. මගේ ඉඩමට බලෙන් ඇතුළු වෙන්න ආවොත්, ඔවුනට මුහුණ දෙන්න සිදුවේවි විරුද්ධ දිශාවට ගමන් කරන වෙඩි උණ්ඩවලට."

"ඒ වුණත් උන් අපට මෙහෙන් පිටවෙන්න දෙන එකක් නෑ."

"කොයි එකටත් අපි ජෙෆර්සන් එනතුරු ඉමු. මේ ප්‍රශ්නය විසඳාගන්න ඔහු මොනවා හරි කරාවි. ඒ අතරේ ඔයා අඬා වැළපෙන්නෙ නැතිව ඉන්න දුව. නැත්නම් ඔහු ඇවිත් ඔබේ හැටි දුටුවාම මා එක්කයි අමනාප වෙන්නේ. භයවෙන්න දෙයක් නෑ. කිසිම අනතුරක් නෑ."

ජෝන් ෆෙරියර් මේ සැනසිලි වදන් පැවසුවේ දැඩි විශ්වාසයකිනි. එහෙත් එදා රාත්‍රී නිවසේ දොරගුළු දමද්දී, ඔහු වෙනදාට වඩා සැලකිලිමත් වුණු බව ලුසී දුටුවාය. නිදන කාමරයේ බිත්තියේ එල්ලා තිබූ, මල කෑ පරණ තුවක්කුව පිරිසිදු කොට, ඔහු එයට උණ්ඩ පුරවා තැබූ සැටි ද ඇයට දක්නට ලැබිණි.

http://sherlockholmesinvestigations.blogspot.com

# 4

## පණ බේරාගෙන පලායාමට

මෝමොන් ආගමික නායකයා සමඟ කතාබහේ යෙදුණු දා උදේම ජෝන් ෆෙරියර් සෝල්ට්ලේක් නගරයට ගියේය. නෙවාඩා කඳුකරය බලා යාමට සූදානමින් සිටි තමාගේ මිතුරා හමුවූ ෆෙරියර්, ජෙෆර්සන් හෝප් වෙත දැනුම් දිය යුතු පණිවුඩයක් මිතුරාට දුන්විය. ඔහු එහි සඳහන් කළේ, ඔවුන් මුහුණපා සිටි අවදානම් තත්ත්වයයි. එබැවින් ජෙෆර්සන් හෝප් ඉක්මණින් ආපසු පැමිණීම අත්‍යවශ්‍ය බව, ෆෙරියර් අවධාරණය කළේය. මේ කටයුත්ත අවසන් කළ පසු, ජෝන් ෆෙරියර්ගේ සිතට දැනුණේ සැහැල්ලුවකි, ඔහු ආපසු නිවස බලා පිටත්විය.

තම නිවස වෙත ආපසු පැමිණි ඔහු, එහි ගේට්ටු කණු දෙකට ගැටගසා සිටි අශ්වයන් දෙදෙනෙකු දැක පුදුමයට පත්විය. ෆෙරියර් පුදුමයෙන් පුදුමයට පත්වූයේ, තම විසිත්ත කාමරයේ සිටි තරුණයන් දෙදෙනා දුටු විටයි. ෆෙරියර්ගේ පැද්දෙන පුටුවට වී සිටි එක් අයෙක්, සුදුමැලි මුහුණක් තිබූ එකෙකි. ඔහු තම දෙපා ඉහළට ඔසවාගෙන, ගිනි උදුන අසල තබාගෙන සිටියේය. ගවයකුගේ වැනි ගෙලක් තිබූ තරබාරු අනෙකා, ජනේලය අසල සිටගෙන සිටියේ දෑත් සාක්කුවල ඔබාගෙන සිවුරුහන් කරමිනි. ෆෙරියර් ඇතුළුවෙද්දී දෙදෙනාම හිස් සොලොව්වත්, කථාව ඇරඹුවේ පැද්දෙන පුටුවට වී සිටි තරුණයාය.

"බාගවෙලාවට ඔහේ අපිව අඳුනන්නෙ නැතුවත් ඇති. මේ ඉන්නෙ ආගමික නායක ඩ්‍රෙබර්ගෙ පුතා. මම ජෝසප් ස්ටැන්ගසන්. මං තමයි, දෙවියන් ඔහුගේ දෑතින්, ඔබ සත්‍ය වූ ධර්මයට කැඳවා ගනිද්දී , ඔබ සමග කාන්තාරයේ ආවේ."

http://sherlockholmesinvestigations.blogspot.com

"අන්ත හරි." අනෙකා කීවේය.

ජෝන් ෆෙරියර් ආචාර කළේ හිත සතුටෙන් නොවේ. මේ අමුත්තන් කවුදයි ඔහු අනුමාන කර තිබිණි.

"අපි මේ ආවේ ......." ස්ටැන්ගසන් කීය. "අපේ පියවරුන්ගේ උපදෙස් මත. අපි දෙන්නාගෙන් කොයි එක්කෙනාගේ අතගන්නද ඔබේ දුවගේ කැමැත්ත කියලා බලන්න. ඒ මොකද මට ඉන්නේ බිරින්දෑවරු හතර දෙනයි. ඩ්‍රෙබර් සහෝදරයාට නම් හත්දෙනෙක් ඉන්නවා. ඒ හින්දා මට පෙනෙන විදියට මෙතැන වැඩි අයිතියක් තියෙන්නේ මට."

"නෑ. නෑ. ස්ටැන්ගසන් සහෝදරයා." අනෙකා කෑ ගැසීය. "ප්‍රශ්නය තියෙන්නේ අපට දැනටමත් ඉන්නේ බිරින්දෑවරු කීදෙනාද කියන එක නෙමෙයි. අපට කී දෙනෙක් නඩත්තු කරන්න පුළුවන්ද කියන එකයි. මගේ තාත්තා සතුව තිබුණු මෝල් ඔක්කොම මට පවරල දීලයි තියෙන්නේ. මං තමයි වඩා ධනවත්."

"නමුත් අනාගතයේ දී මට හොඳ තැනක් ලැබෙනවා." අනෙකා කීය. "දෙවියන් මගේ තාත්තාව භාරගත්තට පස්සෙ, ඔහුගේ සම් පදම් කරන ව්‍යාපාරයත්, සම් නිෂ්පාදන කර්මාන්තශාලාවත් අයිති වෙන්නේ මට. අනෙක මං ඔහේට වඩා වයසින් වැඩියි. දේවස්ථානයේත් මං ඉන්නේ ඔහේට වඩා ඉහළින්."

"කවුරු එක්කද විවාහ වෙන්නේ කියන එක තීරණය කිරීම, අපි ගැහැනු ළමයාට භාර දෙමු." ඩ්‍රෙබර් තරුණයා කීවේය.

මේ සංවාදය සිදුවෙන වේලේ ජෝන් ෆෙරියර් දොරටුව අසල බලා සිටියේ කෝපයෙන් පිපිරෙමිනි. ඔහු තමා අතේ තිබූ කසය අමුත්තන්ගේ පිටට එල්ල නොකර තබාගත්තේ දැඩි ආයාසයකිනි.

"මේ බලනවා." ඔහු කීවේ තරුණයන් අසලට යමිනි. "මගේ දුව ඔහේලට එන්න කිව්වට පස්සෙ මෙහේ එන්න පුළුවන්. එහෙක් ඔහේලාගේ මූහුණු ආයෙමත් දකින්න මං කැමති නැහැ."

මෝමොන් තරුණයන් දෙදෙනා ෆෙරියර් දෙස බලා සිටියේ මහත් පුදුමයෙනි. ඔවුන් සිතා සිටියේ තරුණිය විවාහ කර ගැනීමට ඔවුන් අතර තිබූ තරඟය, පියාටත් දුවටත් මහත් ගෞරවයක් වෙතැයි කියාය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මේ විසිත්ත කාමරයෙන් එළියට යන්න පාරවල් දෙකක් තියෙනවා." ෆෙරියර් කීය. "එකක් දොරෙන්. නැත්නම් ජනේලයෙන්. කොයි එකෙන් එළියට යන්නද ඔහේල කැමැති?"

ජෝන් ෆෙරියර්ගේ මුහුණේ තිබුණේ තර්ජනාන්විත බවකි. තරුණයෝ වහා නිවසෙන් පිටවූහ. ෆෙරියර් ඔවුන් පසුපස ගියේය.

"අපට මේ විදියට සැලකුවට ඔහේට පසුතැවිලි වෙන්න සිද්ධවෙනවා. " ස්ටැන්ගසන් තරුණයා කීවේ කෝපයෙනි. "ඔබ අපේ නායක උතුමාණන්ටත්, ශුද්ධවන්තයින් සිව්දෙනාගේ මණ්ඩලයටත් අපහාස කළා. ඔහේට මරණය දක්වාම පසුතැවෙන්න සිද්ධවේවි."

"දෙවියන්ගෙන් ඔහේට සමාවක් ලැබෙන එකක් නෑ." ඩ්‍රෙබර් තරුණයා කෑගැසුවේය. "ඔහුගේ ප්‍රහාර ඔබේ හිස මතට එල්ල වේවි."

"එහෙනම් මං පටන්ගන්නම් මගේ ප්‍රහාර." ෆෙරියර් උඩුමහලට දිව යාමට සූදානම් වූයේ තම තුවක්කුව ගෙන ඒමටයි. එහෙත් ඔහුගේ අතේ එල්ලුණු ලූසි, ෆෙරියර්ව රඳවා ගත්තාය. ඔහු ඇයගේ ග්‍රහණයෙන් ගැලවීමට උත්සාහ දරද්දී, පිටවී යන අශ්වයින්ගේ කුර හඬ අසන්නට ලැබිණි.

"හොර තක්කඩි!" ජෝන් ෆෙරියර් කීවේ තම නළලේ ඩහදිය පිසදමමිනි. "ඔය දෙන්නාගෙන් එකෙකුගේ හරි බිරිඳ වෙනවට වඩා, මං කැමතියි දුවේ උඹ මැරෙනවා දකින්න."

"මාත් කැමතියි තාත්තේ ඒකට." ඇය කීවාය. "ඒ වුණාට ජෙෆර්සන් ඉක්මනට මෙහේ ඒවි."

"ඔව්. වැඩි දවස් යන්න කලින් ඔහු ඒවි. ඉක්මනට ආව තරමට හොඳයි. ඒ මොකද අපි දන්නෙ නෑ, මූං ඊළඟට මොනවා කරාවිද කියලා."

මේ වයස්ගත ගොවියා හා ඔහු හදාගත් දියණිය දත් සිටින්නේ අන්තරායදායක තත්ත්වයකයි. ඔවුනට පිහිටවීමට, ඔවුනට අවවාද හා උපදෙස් දියහැකි කෙනෙකුගේ පැමිණීම අත්‍යවශ්‍ය වෙලාවකි මේ. ආගමික නායකයන්ගේ බලපුළුවන්කාරකමට, කිසිවෙකු කීකරු නොවූ අවස්ථාවක්, යූටා පදිංචිකරුවන්ගේ ඉතිහාසයේම නොවීය. සුළු වැරදි වලටත් දැඩි දඬුවම් නමුණුවන මේ සමාජයේ, මෙවැනි කැරලි ගසන්නෙකුට අත්වන ඉරණම කුමක්ද?

http://sherlockholmesinvestigations.blogspot.com

ආගමික නායකයන්ගේ ආඥාවලට ගරු සරු නොකළ තමාට, තම දේපොළවලින් වත් තනතුරුවලින් වත් ප්‍රයෝජනයක් නොවන බව ෆෙරියර් දැනසිටියේය. ඔවුන්ගේ නියෝගවලට අවනත නොවූ ධනවතුන්, හිටිහැටියේ අතුරුදන් වූ සැටිත්, දේපොළ දේවස්ථානයට හිමි වූ සැටිත් ෆෙරියර් මෙනෙහි කළේය. ඔහු නිර්භය පුද්ගලයෙක් විය. එහෙත් ඔහුගේ හිසට ඉහළින් පාවෙමින් තිබූ, බිහිසුණු අන්තරායේ සෙවණැල්ල ඉදිරියේ, ෆෙරියර්ගේ දෙපා වෙවුලන්නට විය. අන්තරාය එල්ලවන්නේ මුහුණට මුහුණ නම්, එයට නිර්භයව මුහුණදීම ෆෙරියර්ට අපහසු නැත. එහෙත් කිසිවක් නොදක, නොදන, සංත්‍රාසයෙන් බලාසිටීමට වීම, ඔහුට ඉවසුම් නොදෙන්නක් විය. එහෙත් තම සිතේ තිබූ සියලු සැක සංකා දියණියට නොපෙන්වීමට, ෆෙරියර් උත්සාහ දරුවේය. එසේ වෙතත් තම පියාට තිබූ ආදරය නිසා, ඔහු පත්ව සිටි තත්ත්වය ලූසිට සැඟවීමට, ඔහුට නොහැකි විය.

තම හැසිරීම පිළිබඳ විරෝධය පළකරමින් බ්‍රිග්හැම් යං පණිවුඩයක් එවතැයි, මහලු ෆෙරියර් බලාපොරොත්තුවෙන් සිටියේය. ඔහු අනුමාන කළ අයුරින් එය සිදුවිණි. එහෙත් ඒ බලාපොරොත්තු නොවූ ආකාරයකටයි. ජෝන් ෆෙරියර් පසුවදා උදේ නින්දෙන් අවදිවෙද්දී, ඔහු පොරවාගෙන සිටි රෙද්දේ, කුඩදාසි කැබැල්ලක් අල්පෙනෙත්තකින් අමුණා තිබිණි. එසේ කොට තිබුණේ හරියටම ඔහුගේ හදවත ඉදිරියෙනි.

**"ඔබේ අදහස වෙනස් කර ගැනීමට තව ඇත්තේ දින විසිනවයයි. ඊට පසු .....''**

දෙන දඬුවමක් සඳහන් නොකොට, හිස් තැනක් තබා තිබීම සිතට වඩාත් බිය ගෙන දෙන කරුණක් විය. මෙම අනතුරු ඇඟවීම තම කාමරය තුළට ආවේ කෙලෙසද යන්න ෆෙරියර්ට සිතාගැනීමට පවා නොහැකි විය. ඔහුගේ සේවකයන් නිදාගත්තේ මෙම නිවසෙන් වෙන්ව පිහිටි වෙනත් නිවසකයි. ගෙදර, දොර ජනෙල් සියල්ල හොඳින් අගුළු දමා තිබිණි. කඩදාසි කැබැල්ල පොඩිකොට ඉවතට විසි කළ ඔහු, ඒ ගැන තම දියණියට කිසිවක් සඳහන් කළේ නැත. එහෙත් ලියුම් කැබැල්ලේ වූ පණිවුඩයෙන් තම හදවත හිරිවැටී ගියාක් මෙන් ඔහුට දැනිණ.

දින විසිනවය යනු, යං විසින් "කල්පනා කිරීමට'' ඉඩ ලබා දුන් මාසයේ, ඉතිරිව ඇති කාලයයි. මෙවැනි අද්භූත බලයක් ඇති

http://sherlockholmesinvestigations.blogspot.com

සතුරෙකු හා සටන් කිරීමට කොපමණ ධෛර්යයක් හා ශක්තියක් අවශ්‍ය වේද ? පොරෝනාවට ලියුම් කැබැල්ල ඇමිණුවේ කවුද? ඒ පුද්ගලයා කවුරු වුණත් ක්ෂණිකව මියයන සේ තමාට පහරක් එල්ල කිරීමට ඔහුට හැකියාව තිබුණු බව පෙරියර්ට සිහිවිය. එසේ වුවා නම්, ඒ කාගේ ප්‍රහාරයක්ද යන්න කිසිලෙසකින්වත් තේරුම්ගැනීමට, කාට හෝ නොහැකි වනු නියතය. පසුවදා උදැසන ජෝන් පෙරියර් තවත් කැලැඹීමට පත්විය. පියා සහ දුව උදැසන ආහාරය සඳහා තේ මේසයට වාඩිවූහ. එක්වරම පුදුමයෙන් කෑගැසූ ලුසී සිවිලිම දෙසට අත දිගු කළාය. සිවිලිමේ '28' යනුවෙන් අඟුරු කැබැල්ලකින් ලියා තිබිණි. ලුසීට එය කුමක්දැයි තේරුම් ගත නොහැකි විය. ඔහු එය තේරුම් කර දීමට උත්සාහ කළේ ද නැත. එදා රාත්‍රියේ තුවක්කුව ද සූදානම් කරගෙන, දැඩි අවධානයකින්, පෙරියර් නොනිදා රාත්‍රිය ගතකළේය. ඔහුට කිසිවක් දකින්නට හෝ කිසිදු ශබ්දයක් අසන්නට නොලැබිණි. එහෙත් පසුවදා උදයේ බලද්දී, ඉදිරිදොර පිටපැත්තේ '27' තීන්තෙන් පින්තාරු කර තිබිණි.

මෙසේ දවසින් දවස ගෙවී ගියේය. උදැසන හිරු පායන අයුරින්, ඔවුනට ඉතිරි වී ඇති දින ගණන, නොවරදවාම ලකුණු කිරීමට නොපෙනෙන සතුරා අමතක නොකළේය. සමහර විට ඒවා බිත්තිවල හෝ පොළොවේ ලියා තිබුණු අතර, තවත් විටෙක ඒවා කඩදාසි කැබැලිවල ලියා, ගේට්ටුවේ හෝ වැටේ එල්ලා තිබිණි. කොපමණ සුපරීක්ෂාකාරීව සිටියත් මේවා කළේ කවුරුන්ද, කොයි වෙලාවේද, යන්න සොයාගැනීමට, පෙරියර් කිසිවිටෙකත් සමත් වූයේ නැත. මිථ්‍යා විශ්වාස නිසා, සිතේ හටගන්නා භයකින්, නැති ගන්නා අයුරෙන් මෙම අංකය දකිද්දීම ඔහු තැතිගත්තේය. සිතේ තිබූ භීතිය නිසාම කයෙන් දුර්වල වූ ඔහු, දිවි ගෙවුවේ රෝගියකු විලසිනි. දෑස් ගිළුණු ඔහුගේ පෙනුම, උගුලකට හසුවූ සතෙකුට සමාන විය. ජීවිතය ගලවා ගැනීම සඳහා දැන් මොහුගේ සිතේ තිබුණේ එකම බලාපොරොත්තුවක් පමණි. ඒ අන්කිසිවක් නොව, නෙවාඩාහි සිට තරුණ දඩයක්කාරයාගේ පැමිණීමයි.

දින විස්ස, පහළොවටත්, පහළොව දහයටත් හැරිණි. දඩයක්කාර තරුණයා ගැන කිසිදු ආරංචියක් නොවීය. දවස් එකින් එක ගෙවී යද්දී ඔහු පිළිබඳ සලකුණකුදු නොවීය. මහලු ගොවියා සිටියේ, තරුණයා කොයි මොහොතේ හෝ තම නිවසට එතැයි

http://sherlockholmesinvestigations.blogspot.com

විශ්වාසයෙනි. අශ්වාරෝහිකයෙක් හාදේ ගමන් කළ. ශබ්දය ඇසෙද්දී, පෙරියර් ඉදිරි දොර වෙත පැමිණ සවන් දුන්නේය. අශ්වකරත්ත රියැදුරෙක් තම අශ්වයනට අණදෙද්දී මහල්ලා ගේට්ටුව වෙත දිව ආවේය. ඔහු සිතා සිටියේ, කෙසේ හෝ අවසන් මොහොතේ තමා වෙත යම් පිහිටක් ළඟාවී ඇති බවයි. එහෙත් එය එසේ නොවූ බව දුටු විට, ඔහුගේ හදවත ශෝකයෙන් හඬා වැළපුණේය.

අන්තිමේදී තිවස අසල සල්කුණු වූ අංකය පහ, හතර, තුන ලෙස වෙනස් වන්නට පටන්ගත්තේය. මේ වන විට ජෝන් පෙරියර් ගෙන් දිස්වූයේ සිහි විකල්වූවකු ගේ ලකුණුය. අතිශය කම්පාවට පත් ඔහු, පැනයාමේ සියලු බලාපොරොත්තු අත්හැර දමීමේය. කඳුකරය ගැන ඔහුට තිබුණේ සීමිත දැනුමකි. කිසිවෙකුගේ ආධාර උපකාර නොමැතිව, පැන යාම, කිසිසේත් කළ හැකි දෙයක් නොවීය. නිතර භාවිතයට ගත් ප්‍රධාන මාර්ග සැමවිටම සුපරීක්ෂාකාරීව මුර කෙරිණි. සිව්දෙනාගේ මණ්ඩලයේ අවසරය නොමැතිව, ඒවායේ ගමන්කිරීම තහනම් විය. මොන අයුරින් කටයුතු කළත්, තමන් වෙත එල්ල වී ඇති බිහිසුණු අනතුරින් ගැළවීමට ක්‍රමයක් නොමැති බව, ජෝන් පෙරියර්ට වැටහිණි. එහෙත් මේ මහලු මිනිසා, කිසිසේත් තම දිවි තොර කර ගැනීමට නොසිතුවේය. තම දියණියගේ ගෞරවය සුරැකීමට තමාට කළ හැකි යමක් ඇත්නම්, එයට ප්‍රමුඛත්වය දිය යුතු බව ඔහු සිහිකළේය.

එක් සැන්දෑවක ජෝන් පෙරියර් තම කරදර ගැන කල්පනා කරමින්, මෙතැනින් ගැළවී යා හැකි ක්‍රමයක් ගැන සිතමින් හුන්නේය. එදා උදයේ ඔහුගේ බිත්තියේ පින්තාරු කර තිබූ අංකය 2 ය. ඔහුට ලැබෙන්නේ තවත් එක් දවසක් පමණි. ඊළඟට සිදුවන්නේ කුමක් ද? නොයෙක් භයානක මෙන්ම, විකාර සිතුවිලි වලින් ඔහුගේ මනස පිරිණි. තමාගේ මරණයෙන් පසු, දියණියට අත්වන්නේ කවර ඉරණමක්ද? ඔවුන් සිරකරගෙන සිටින මේ අදිසි දැලෙන් ඔවුනට ගැළවීමක් නොමැතිද? මේසය මත හිස තබාගත් පෙරියර් තමා පත්ව සිටි අසරණ භාවය ගැන ඉකි ගසමින් හඬා වැළපුණේය.

කුමක්ද ඒ ශබ්දය? අවට පැවැති නිශ්ශබ්දතාවය මැද, යන්තමින් ඔහුට ඇසුණේ දොරක් පහුරු ගාන්නාක් වැනි ශබ්දයකි. එය ඇසුණේ ඉදිරි දොර් වෙතිනි. බිම දණගාගෙන සාලයට ගිය

http://sherlockholmesinvestigations.blogspot.com

පෙරියර්, යළිත් වරක් සවන් දුන්නේය. එම පහුරුගාන ශබ්දයම යළිත් ඇසෙන්නට විය. කවුරුන් හෝ තම නිවසේ උළුවස්සට, ඉතා සෙමින් තට්ටුකරන බව මහල්ලා වටහා ගත්තේය. ඒ රහස් මිනීමරු කල්ලිය විසින් එවනු ලැබූ මහ රෑ එන මාරයෙක් ද? එසේත් නැත්නම් අංක 1 ලකුණු කිරීමට පැමිණි කිසිවෙක් ද? තමා දැඩි කම්පනයකට පත් කරවමින්, මෙසේ දහඩිය මැරී මැරී උපදිනවාට වඩා, ක්ෂණික මරණය හොඳ යයි ෆෙරියර්ට සිතිණි. එක්වරම ඉදිරියට පිනූ ඔහු, අගුළ හැර දොර විවෘත කළේය.

නිවසින් පිටත සියල්ල නිශ්චලය. සන්සුන්ය. රාත්‍රිය සුන්දරය. අහසේ දහසක් තාරකා අලංකාරව බැබළෙමින් තිබිණ. ගෙදර මල් උයන හා ගේට්ටුව එලෙසමය. එහි වත් ගෙදරට එන පාරේ වත් මනුෂ්‍යයෙකු සිටින බවට, සලකුණකුදු නැත. සැනසුම් සුසුමක් හෙළූ පෙරියර් වම්පසටත් දකුණුපසටත් බැලීය. කිසිවෙකු නැත. ඔහු අවසානයේ තමාගේ දෙපා අසල බැලුවේ, දොර වසා දැමීමට සූදානමෙනි. බිම, දැත් දෙපා විහිදාගෙන සිටි මිනිසෙකි! තමාගේ දෙපා මුල සිටි මිනිසා දුටු පෙරියර්, භීතියෙන් හිගැස්සුණේය.

මෙයින් ඔහු කොයිතරම් කම්පනයට ලක්වූවාද කිවහොත්, ඔහුට ක්ලාන්ත ගතියක් දැනිණි. වහාම බිත්තියකට හේත්තු වී, උදව් ඉල්ලා දියණිය කැඳවිය යුතු යයි ඔහුට සිතිණි. මේ බිම වැටී සිටි මිනිසා තුවාල වූ හෝ මරණාසන්න මිනිසෙකු විය යුතුයි. නමුත් පෙරියර් බලාසිටියදීම, මේ බිම සිටි මිනිසා, බිම බඩගාමින් ගේ තුළට ඇදීයන සැටි පෙරියර්ට දකින්නට ලැබිණ. ඔහු නිවස තුළට ඇදුනේ සර්පයෙකු බඩගාන විලසිනි. නිවස තුළට ගිය වහාම දොර වසා දමූ අමුත්තා, විස්මයට පත් ගොවියාට තම මුහුණ පෙන්වීය. ඒ ජේෆර්සන් හෝප්ගේ මුහුණයි.

"දෙවියන්ට ඔප්පුවෙව්වාවේ!" කී පෙරියර් හුස්මක් ඉහළට ගත්තේය. "ඔබ මාව බිය කළ තරමක්! ඔබ මොකද මේ විදියට ආවේ?"

"මට කන්න දෙයක් දෙන්න." හෝප් කීවේ ගොරෝසු හඬෙනි."මට දවස් දෙකකින් කිසිම කෑමක් නෑ."

ඔවුන්ගේ රාත්‍රී ආහාරයෙන් මේසය උඩ ඉතිරිවී තිබූ මස් හා පාන් සියල්ල තරුණයා ඉක්මණින් ගිල දැම්මේය.

http://sherlockholmesinvestigations.blogspot.com

Freedom Purpose Only. Not For Print.

"ලුසී හැම දෙයක්ම ඉවසාගෙන ඉන්නවාද?" ඔහු ඇසුවේ ආහාරය අවසන් කළ පසුයි.

"ඔව්. අප මුහුණ පා ඉන්න අනතුර ගැන ඇයට තේරුමක් නැහැ."

"ඒක වඩා හොඳයි." තරුණයා කීය. "හැම පැත්තෙන්ම මේ ගේ ගැන ඔවුන් සෝදිසියෙන් ඉන්නේ. ඒකයි මං බඩගාගෙන ආවේ. ඔවුන්ට බොහොම තියුණු ඇස් තියෙන බව ඇත්තයි. නමුත් හැංගිලා ඉදිරියට යන, වෂූ ප්‍රදේශයේ දඩයක්කාරයෙක් අල්ලාගන්න තරම් තියුණු පෙනුමක් උන්ට නෑ."

ජෙෆර්සන් හෝප්ගේ පැමිණීමත් සමඟම ජෝන් ෆෙරියර් වෙනස් මිනිසෙකු බවට පත්විය. දැන් තමා වෙනුවෙන් කැපවුණු එක් මිනිසෙකුවත් තමා සමීපයේ සිටින බව ෆෙරියර්ට හැඟිණ. ඔහු දෑතින් තරුණයා බදා ගත්තේ සාදරයෙනි.

"උඹ අපට ආඩම්බර වෙන්න පුළුවන් මිනිහෙක් පුතා. අපි මුහුණදීලා තියෙන්නේ මහා භයානක අවදානම් තත්ත්වයකට. අපේ කරදර වලට හවුල් වෙන්න කිසිකෙනෙක් එන කාලයක් නෙමෙයි මේක."

"ඔබ ඒක තේරුම් අරගෙන තියෙන හැටි හරි පියාණෙනි." තරුණයා කීය. "මගේ හිතේ ඔබ ගැන විශාල ගෞරවයක් තියෙනවා. ඒ වුණත් ඔබ මේ කරදරයේ පැටලී හිටියේ තනියම නම්, උදව්වට එන්න කලින් මං දෙපාරක් කල්පනා කරනවා. දරුණු විදියට ඇවිස්සී තිබෙන මේ බඹරවදය මැද්දට, මං ඔලුව දාන්න හිතුවේ ලුසී නිසයි. ඇයට අනතුරක් වෙන්න කලින් හෝප් පරම්පරාවේ එකෙක් මේ ලෝකෙන් අඩුවේවි."

"දැන් අපි මොකද කරන්නේ?"

"හෙටයි ඔබට තියෙන අවසාන දවස. අද රෑට මොනව හරි කළේ නැත්නම් ඔබ විනාශයි. කඳුකරයට යන කැලෑ පාරේ, රාජාලි උමඟ අසල, මගේ අශ්වයෝ දෙදෙනෙක් සහ කොටළුවෙක් බැඳලා තියෙනවා. ඔබ ළඟ කොයිතරම් මුදල් තියෙනවද?"

"රත්රන් වලින් ඩොලර් දෙදාහක් තියෙනවා. නෝට්ටුවලින් ඩොලර් පන්දාහක් තියෙනවා."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ ඇති. මා ළඟත් එච්චර විතර මුදලක් තියෙනවා. අපි කඳුකරය හරහා කාසන් නගරයට පැනලා යමු. දැන් ලූසීව අවදිකරගන්න. හොඳ වෙලාවට සේවකයින් මේ ගේ ඇතුළෙම නිදා නොගන්නේ."

ෆෙරියර් ගමන සඳහා තම දියණිය සූදානම් කරගන්නා අතරේ ජෙෆර්සන් හෝප්, හැකිතරම් කෑම ද්‍රව්‍ය එක්කොට කුඩා පොදියක් ලෙස රෙද්දකින් ගැටගසා ගත්තේය. කඳුකරයේ ජලය හිඟ බවත්, එහි ජලය ලබා ගතහැකි ළිං හෝ දිය පාරවල් පිහිටියේ තැනින් තැන බවත් ඔහුට සිහිවීය. පිහන් මැටි ගුරුලේත්තුවකට, ඔහු සෑහෙන තරම් ජලය පුරවා ගත්තේය. ඔහු මේ කටයුතු අවසන් කරද්දීම, දියණිය කල්බලයේ ගමනට සූදානම් කරගත් පියා එතැනට පැමිණියේය. පෙම්වතුනට සුහද කතාබහක යෙදීමට කාලයක් නොතිබිණ. කළ යුතු වැඩ කටයුතු රාශියක් තිබූ බැවින්, සෑම මිනිත්තුවකම තිබුණේ මිල කළ නොහැකි වටිනාකමකි.

"අපි වහාම පිටත්විය යුතුයි." හෝප් කීවේ කෙඳිරිලි හඬින් කතා කරමිනි. උද්ගත වී ඇති තත්ත්වයේ භයානක කම ඔහු හරි හැටි අවබෝධ කරගෙන සිටියේය. ඒ අනුව ඔහු ඕනෑම දේකට මුහුණදීමට සූදානමෙන්, අධිෂ්ඨානශීලීව සිටි බව පෙනිණ.

"ඉස්සරහයි පිටිපස්සෙයි දොරවල් දෙක දිහාම, ඔත්තුකාරයෝ හැංගිල හොඳ සෝදිසියෙන් බලාගෙනයි ඉන්නෙ. ඒත් අපට පුළුවනි ගෙයි පැත්තක තිබෙන ජනේලයකින්, බොහොම පරිස්සමෙන් එළියට පැනගන්න. ඊළඟට ඒ පැත්තෙන්ම තිරිඟුයායට රිංගලා ඒක මැද්දෙන් පලා යමු. පාරට වැටුණාට පස්සෙ, මං අශ්වයෝ රඳවලා ඉන්න රාජාලි උමඟ ළඟට තියෙන්නේ හැතැක්ම දෙකයි. ඉර පායද්දි අපට හැකිවේවි කඳුකරයේ බාගයක් දුරට යන්න."

"උන් අපව මගදි නැවැත්තුවොත්?" ෆෙරියර් ඇසීය.

හෝප් ඔහුගේ කමිසයේ, ඉදිරියට නෙරා තිබූ සාක්කුවට තට්ටු කළේය. එහි තිබුණේ රිවොල්වරයකි.

"මේ තනි එකෙනුත් මෙල්ල කරගන්න බැරි තරම් සෙනඟක් උන් අතරේ ඉන්නවා නම්, අපි මෙයින් තවත් දෙක තුනක් අරගෙන යමු." හෝප් පැවසුවේ දරුණු සිනාවක් පාමිනි.

නිවස තුළ වූ සියලුම පහන් නිවාදමන ලදී. හඬක් නොනැගෙන සේ ජනෙල් පියන විවෘත කෙරිණි. ජනෙල් කවුළුවෙන් ෆෙරියර් තම

http://sherlockholmesinvestigations.blogspot.com

තිරිහු කුඹුරුයාය දෙස බලා සිටියේය. තමාට අයත්, තමා දුක් මහන්සියෙන් අස්වැද්දූ මේ සියල්ල, සදහටම අත්හැර දමා යාමට වන බව සිහිකරද්දී ඔහුට දිග සුසුමක් හෙළිණි.

තම සියලු දේපොළ අත්හැර දමා යාමට ඔහු බොහෝ කාලයක සිට හිත හදාගෙන සිටියේය. තම දියණියගේ සතුටත් ගෞරවයත්, මේ හැම ධනයකටම වඩා ඔහු අගය කරන බව ෆෙරියර් සිහිකළේය. පරිසරයේ තිබුණේ ශාන්ත නිශ්චල බවකි. තිරිහුයාය හරහා හමා ආ සුළඟෙහත්, සෙලවුණු කොළ වලින් නිකුත් වූයේ මිහිරි හඬකි. මේ පරිසරය වටා සැහවී තිබුණේ භීෂණය බව සිතාගැනීමටත් අපහසු විය. එවිටම ෆෙරියර්ට සිහිවුණේ, තම නිවසට ළඟාවූ තරුණ දඩයක්කාරයාගේ මුහුණේ පළ වූ හැඟීම් හා සුදුමැලිබවයි. පසුගිය සති හතරක කාලයක්, තමා වටා ක්‍රමයෙන් ගොඩනැගෙමින් තිබූ භීෂණය ගැන, හොඳම සාක්ෂියක් නොවේද ඒ?

ෆෙරියර් අත තිබූ මල්ලේ රත්රන් හා මුදල් නෝට්ටු කර තිබිණි. ආහාර හා දියබඳුන අහිත මල්ල තරුණයා කර තබා ගත්තේය. ඇය ඉතාම අගය කළ ඇඳුම් හා ආභරණ ස්වල්පයක් ලුසී අත වූ පොදියේ විය.

ඉතා පරෙස්සමෙන් ජනේලය විවෘත කළ ඔවුහු, කළු වලාකුළකින් සඳ වැසී යනතුරු බලා සිටියහ. මීළඟට ඔවුහු වරකට එකා බැගින් ජනේලය තුළින් නිවසෙන් එළියට පැන ගත්හ. අනතුරුව හඬක් නොනැඟෙන සේ හුස්ම ගනිමින්, දෙකට නැමී, මල්වැටේ ආවරණය ලබා ඉදිරියට ගමන් ගත්හ. එය කෙළවර වූ තැනින් තිරිහුයායට පිවිසිය හැකි කඩුල්ලක් විය. එහෙත් එතැනින් එළියට ගමන් කිරීමට පෙර ඔවුහු, නිහඬව, මඳ වෙලාවක් විමසිල්ලෙන් බලාසිටියහ. ඔවුන් එතැනින් නැඟිට පිටත්වීමට සූදානම් වූවා පමණි. අනෙක් දෙදෙනාගේ අත් වලින් දැඩිව අල්ලාගත් තරුණයා ඔවුන් අඳුරු සෙවණැලි තුළට ඇදගත්තේය. ඔවුහු නිහඬව, වෙවුලමින් එහි රැඳී බලා සිටියහ.

ජෙෆර්සන් හෝප් ප්‍රෙයරි තණබිමේ දඩයක්කාරයකු ලෙස දීර්ඝ අත්දැකීම් ලබා තිබූ තැනැත්තෙකි. එය ඔවුන්ගේ වාසියක් විය. මුවෙකුගේ වැනි තියුණු දෙසවණක් හෝප් සතුවිය. ඔවුන් තිදෙනා යන්තම් අඳුරේ සැඟවුණා පමණි. ඔවුන් සිටි තැනට යාර

Reading Purpose Only
http://sherlockholmesinvestigations.blogspot.com

කිහිපයක් තුදුරින්, ගසක සිටි කඳුකර බකමූණෙක් ශෝකාකුල අයුරින් හැඬුවේය. තවත් බකමූණෙක් තරමක් දුර සිට ඊට පිළිතුරු ලෙස හැඬුවේය. ඒ මොහොතේම, ඔවුන් යාමට සූදානම් වූ මල්වැට කෙළවර කඩුල්ලට, කළු පැහැති අඳුරු සෙවණැල්ලක් ළඟාවිය. ඒ සෙවණැල්ලෙන් ද නැඟුණේ බකමූණාගේ හඬයි. ඒ හඬ නිකුත් වෙද්දී කොහේදෝ සිට තවෙකෙක් එළියට මතුවිය.

"හෙට මධ්‍යම රාත්‍රියට!" පළමුවැන්නා කීවේ ආඥාවක් නිකුත්කරන ස්වරයෙනි."මුකලන් බිස්සා තුන් පාරක් හඬලද්දී."

"බොහොම හොඳයි." අනෙකා පිළිතුරු දුන්නේය. "මං ඩ්‍රෙබර් සහෝදරයටත් කියන්නද?"

"ඔහුටත් පණිවුඩය දෙන්න. අනෙක් අයටත් පණිවුඩය යවන්න කියන්න. නවයේ ඉඳන් හතට!"

"හතේ ඉඳන් පහට!" අනෙකා පිළිතුරු දුන්නේය.

මීළඟට අද්භූත පුද්ගලයෝ දෙපසට හැරී වෙන්ව ගියහ. ඔවුන්ගේ අවසන් දෙබස නිසැකවම යම්කිසි සංඥාවක් හා එයට පිළිතුරකි. ඔවුන්ගේ අඩිශබ්දය නොඇසී ගිය වහාම, ජේෆර්සන් හෝප් සැඟවී සිටි තැනින් නැගිට්ටේය. අනතුරුව අනෙක් දෙදෙනාද නැඟවාගෙන, ඔහු කඩුල්ලෙන් පැන, තිරිඟුයායට පිවිසුණේය. මීළඟට අඳුරේ වුවත් ඔවුන් ඉදිරියට ඇදුණේ ඉතා වේගයෙනි. විටෙක ලූසිට ඇවිදගැනීමට නොහැකි වෙද්දී, ඇය බාගෙට ඔසවාගෙන යාමට හෝප්ට සිදුවිය.

"ඉක්මන් කරමු! ඉක්මන් කරමු!" ඔහු පැවසුවේ හති දමමිනි. "මුර හටයින් ඉන්න ඉසව්ව අනුකරල අපට යන්න සිදුවෙනවා. හැමදෙයක්ම තීරණය වෙන්නෙ අපේ ගමන් වේගය උඩ. ඉක්මන් කරමු!"

ප්‍රධාන පාරට වැටුණු පසු ඔවුන්ට තවත් වේගයෙන් ඉදිරියට යාමට හැකිවිය. කෙනෙකු තමන් ඉදිරියට එනු ඔවුන් දුටුවේ එක්වරක් පමණි. ඔහුට තමන් හඳුනාගැනීම අපහසු වන ලෙස, මහ අසල වූ කුඹුරකට බැසීමට ඔවුනට සිදුවිය.

නගරයේ ප්‍රධාන කොටසට ළඟාවීමට පෙර, මහපාරට සම්බන්ධ වූ අඩිපාරක් දෙසට තුරුණයා මහ පෙන්විය. එය කඳුකරය වෙත වැටී තිබුණු අතුරු පාරකි. ඔවුන්ගේ හිස්වලට ඉහළින්

http://sherlockholmesinvestigations.blogspot.com

දක්නට ලැබුණේ පර්වත දෙකක අඳුරු ඡායාවන්ය. එම පර්වත දෙක අතරින් තිබූ මහ කෙලවර වූයේ රාජාලි ගුහාවෙනි. ඒ තරුණියා අශ්වයන් බැඳ දමා තිබුණු තැනයි. නොවරදින ඉවකින් ඉදිරියට ගිය ජෙෆර්සන් හෝප්, විශාල ගල් පර්වත අතරින් රිංගා ගොස්, වියළුණු දියපහරක් පසුකොට අශ්වයන් රඳවා සිටි තැනට ළඟාවිය. තරුණිය කොටළුවා පිටේ හිඳුවන ලදී. ඔහුගේ මුදල් සහිත මල්ල අතැතිව ජෝන් ෆෙරියර් එක් අශ්වයෙකු පිට ද, හෝප් අනෙක් අශ්වයා පිට ද නැඟුණහ. අනතුරුව හෝප් පෙරමුණ ගෙන සෙස්සන් ද කැටිව ගමන් ඇරඹුවේය.

ඔවුනට යාමට තිබුණේ, බෑවුම් හා භයානක ප්‍රපාත සහිත, අන්තරායදායක මාර්ගයකි.

ඝන වනාන්තරයක, සොබාදහමෙන් නිමැවුණු මාර්ගවල ගමන, කෙනෙකු වෙහෙසට පත්කරවන්නකි. මෙය ද එවැනි මාර්ගයකි. ගමන් මගේ එක් පැත්තක් යෝධ ගල් පර්වතයකි. අනෙක් පැත්තේ කුඩා ගල්, පඳුරු හා කැඩී ගිය පාෂාණවල සුන්බුන්වලින් තැනුණු පොළොවකි. මෙවැනි බිමක ඉදිරියට ගමන් කිරීම ඉතාම දුෂ්කරය. සලකුණු වී තිබූ අඩිපාර ද පුළුල් එකක් නොවීය. විටෙක ඔවුනට යෑමට සිදුවූයේ එකා පිටුපස එකා බැගින් තනි පේළියකටයි. මෙවැනි මඟක ගමන් කළ හැක්කේ, කඳුකරයේ රළු පාර හුරුපුරුදු අයට පමණි. කොපමණ දුෂ්කරතා තිබුණත්, පලායන්නන්ගේ සිත්වල තිබුණේ සැහැල්ලු බවකි. ඉදිරියට තබන සෑම පියවරකින්ම, තම බිහිසුණු සතුරාගෙන් අඩියෙන් අඩිය හෝ ඈත්වීමට ලැබීම මේ තිදෙනාට විශාල සැනසීමක් විය.

කෙසේ වෙතත් ඔවුන් තවමත් සිටින්නේ, මෑතකාලයේ ශාන්තුවරයන්ගේ අණසකට යටත් පෙදෙසේ බව හඟවන ලකුණක්, ඉක්මනින්ම දකින්නට ලැබිණ. තිදෙනා පැමිණ සිටියේ දුර්ග මාර්ගයේ, ගමන් කිරීමට අපහසු භයානකම කොටසටයි. වටපිට බලමින් ගමන් කළ ලුසීට එක් වරම කෑගැසිණ. ඇය තම අත ඉහළට දිගුකොට පෙන්නුවාය. මාර්ගය හොඳින් දකිය හැකි, ඈත වූ පර්වතයක් මුදුනේ තනි මුර භටයෙක් රැඳී සිටියේය. දෙපක්ෂයටම ඔවුනොවුන් දකින්නට ලැබුණේ එකවරමය. මුරභටයා වහාම සංචාරකයන්ට අභියෝග කළේ සටන්කාමී අයුරෙනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"කවුද ඔහේ යන්නේ?"

"නෙවාඩාවට යන සංචාරකයෝ." ජෙෆර්සන් හෝප් පිළිතුරු දුන්නේ අශ්ව සැදලය මත වූ රයිෆලය සූදානම් කර ගනිමිනි.

පිළිතුරෙන් සෑහීමට පත්නොවූ භටයා, ඔහුගේ ගිනි අවිය අතට ගෙන ඔවුන් දෙස පරීක්ෂාවෙන් බලා සිටි අයුරු තිදෙනා දුටුවෝය.

"ඒකට අවසර ලැබුණේ කාගෙන්ද?" ඔහු විමසීය.

"ශුද්ධවන්තයින් සිව්දෙනාගෙන්." ෆෙරියර් පිළිතුරු දුන්නේය. මෝමොන් ආගම පිළිබඳව ඔහු ලබා තිබූ අත්දැකීම්වලින් පාලන අධිකාරියේ ඉහළම බලධරයා මෙය බව ෆෙරියර් දැන සිටියේය.

"නමේ ඉඳන් හතට." මුරභටයා කෑගැසීය.

"හතේ ඉඳන් පහට." ජෙෆර්සන් හෝප් ක්ෂණිකව පිළිතුරු දුන්නේ, ගෙළයතේ දී ඔවුනට අසන්නට ලැබුණු සංඥා දෙබස සිහිකරමිනි.

"ඉදිරියට යන්න. ඔබට දෙවියන්ගේ ආරක්ෂාව ලැබෙනවා." භටයා ඉහළ සිටම කෑගැසීය.

එතැනින් ඉදිරියට පාර වඩාත් පුළුල් වූ අතර, වඩාත් හොඳින් පියවර තැබීමට අශ්වයින්ට හැකියාව ලැබිණි. ආපසු හැරී බැලූ ඔවුනට දකින්නට ලැබුණේ, මුර භටයා තම ගිනිඅවියට බරවී ඔවුන් දෙස බලා සිටින ආකාරයයි. මෝමොන්වරුනට අයත් භූමියේ දේශසීමා කපොල්ල මෙය බවත්, නිදහස සඳහා තවත් බොහෝ දුර ඉදිරියට යාමට ඇති බවත්, ඔවුහු වටහා ගත්හ.

http://sherlockholmesinvestigations.blogspot.com

# 5

# පළිගන්නා දේවදූතයෝ

රාත්‍රිය පුරා ඔවුනට ගමන් කිරීමට සිදුවී තිබූ පටු මාර්ගය, ගල්පර්වත අතරින් වැටී තිබූ සංකීර්ණ එකක් විය. කිහිප වාරයක්ම ඔවුනට මඟ වැරැදිණි. එහෙත් කඳුකරයේ මාර්ග පිළිබඳව හෝප් සතු වූ දැනීම නිසා යළිත් නිවැරදි මඟට පිවිසීමට හැකිවිණි.

උදෑසන හිරු පායා එද්දී, මේ සංචාරකයන්ට දකින්නට ලැබුණේ ඉතා අලංකාර දර්ශනයකි. සෑම දිශාවකින්ම දිස්වූයේ, මුදුන හිමෙන් වැසී ගිය කඳුගැට රාශියකි. ඔවුන් වටා වළල්ලක ආකාරයට පිහිටි මේ කඳුශිඛර, ඈත ක්ෂිතිජය දක්වාම දිස්විය. ගමන් කළ කඳු බෑවුම කොතරම් තියුණු ආනත තලයක පිහිටියා ද යත්, එහි වැවී තිබුණු ලාච් හා පයින් ගස්, පොළොවේ රැඳී තිබුණේ යන්තමින් යයි කෙනෙකුට සිතිණි. මේ නිසා කුඩා සුළං රැල්ලකින් වුවද, මේ ගස් තමන්ගේ හිස මතට කඩා වැටෙතැයි බියක් ඇතිවීම, පුදුමයක් නොවේ. මෙය අහේතුක බියක් නොවීය. කුමක් නිසාද යත්, කඩා වැටී පහළට පෙරළුණු වෘක්ෂ හා ගල්කුළු ගණනාවක් පහළ මිටියාවතේ දකින්නට ලැබුණු හෙයිනි. ඔවුන් ඒ අඩවිය පසුකර යද්දීම මහ හඬක් නංවමින් ගලක් පෙරළී ගියේ, මුළු පරිසරයම දෝංකාර නංවමිනි. විඩාව නිසා සෙමෙන් ගමන් කරමින් සිටි අශ්වයෝ, මේ හඬෙන් බියපත්ව ගමන ඉක්මන් කළහ.

පෙරදිග අහසේ හිරු පායා එද්දී, හිමෙන් වැසී තිබූ කඳුමුදුන් එකින් එක දීප්තිමත් වන්නට පටන්ගත්තේය. උත්සවයකදී පහන් එකින් එක දල්වෙන ආකාරයට, කඳුමුදුන් ආලෝකමත් වූයේ රත් පැහැයෙන් බැබළෙමිනි. මෙම අලංකාර දර්ශනය,

Reading Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

භීතියෙන් පැන දුවන තිදෙනාගේ සිත් පුබුදුවාලීමටත්, නව ජීවයක් ගෙනදීමටත් සමත් විය.

කඳු අතරින් ගලා ආ ජල ධාරාවක් සමීපයේ, ඔවුහු මඳකට නතරවූහ. අශ්වයිනට වතුර බීමට සලස්වා, ඔවුහු උදේ ආහාරය ඉක්මනින් ගෙන අවසන් කළෝය. මඳ වේලාවක් එහි නැවතී විඩා හැරීමට ලූසීගේ හා ඇගේ පියාගේ කැමැත්තක් තිබිණ. එහෙත් ජෙෆර්සන් හෝප්ගෙන් ඊට අවසර නොලැබිණ.

"අපි පැන ආ බව මේ වෙනකොට දැන් දනගෙන ඇති. දැන් අපේ පිටිපස්සෙන් එළවාගෙන එන්න පටන් අරගෙනත් ඇති. අපේ ජීවිත ගළවා ගන්න හැකිවෙන්නේ, අපි ඉක්මන් කළොත් පමණයි. කාසන් නගරයට ළඟාවෙලා, එහි ආරක්ෂාව ලබාගත්තොත් ජීවිතයේ හැමදාමත් අපට විඩාහරින්න පුළුවන්."

එදා දවස පුරාම ඔවුනට ගමන් කිරීමට සිදුවූයේ, දෙදෙනෙකුට එක පෙළට යා නොහැකි පටුමාර්ග ඔස්සේය. තමන් සතුරාගෙන් සැතපුම් තිහක් පමණ ඈතට පැමිණ ඇති බව, සවස් වෙද්දී ඔවුහු ගණනය කළහ. රාත්‍රිය ළඟාවෙද්දී මහා ගල්කුළක සෙවණේ ඔවුහු විවේකගත්හ. ඇතින් හමා ආ ශීතල සුළඟෙන් යම් පමණකට බේරී සිටීමට, ගල්කුළ නිසා හැකිවිය. එහෙත් කඳුමුදුනේ වූයේ අධික ශීතලක් නිසා, උණුසුම පතා එකිනෙකාට ළංවී සිටීමට ඔවුනට සිදුවිය. පැය කිහිපයක කෙටි නින්දක් ලබාගැනීමට ද මෙහිදී ඔවුනට අවස්ථාව සැලසිණ.

කෙසේ වෙතත්, ඉර පායා ඊමට පෙර යළිත් වරක් ගමන් අරඹන ලදී. ඔවුන් ලුහුබැඳ එන්නන්ගේ කිසිදු ලකුණක් නොවීය. මිනීමරු සංවිධානයේ මාරග්‍රහණයෙන්, තමන් සැහෙන දුරට ගැළැවී ඇතැයි හෝප්ට සිතිණි. මේ ඝාතකයන්ගේ අයෝමය හස්තය, කොතරම් දුරට දිගු කළ හැකිද යන්න හෝප් හරිහැටි දැන සිටියේ නැත. එය ඔවුනට ළංවී, ඔවුන් විනාශකිරීමේ අරමුණෙන් හඹා එන බව, ඔහුට අවබෝධ නොවීය.

දෙවැනි දවසේ දහවල් කාලය වෙද්දී, ඔවුන් සතුව තිබූ කෑම සියල්ල අවසන් විය. එහෙත් තරුණයා ඒ පිළිබඳව එතරම් අසහනයකට පත්වූයේ නැත. කඳුකරයේ ආහාර සඳහා දඩයම් කරගත හැකි සතුන් ගැවසුණු බව ඔහු දැනසිටියේය. මීට පෙර

http://sherlockholmesinvestigations.blogspot.com

බොහෝ අවස්ථාවලදී ඔහු තම ආහාරය සපයා ගත්තේ ගිනි අවියේ පිහිටෙනි.

එදා හිරු අවරට යද්දී එක් කඳු බෑවුමක ඉහළට කළ ගමන අවසන් වී තිබිණ. මීළඟට ඔවුනට තිබුණේ තවත් කන්දක් තරණය කිරීම සඳහා ඒ දෙසට බැසයාමයි. කඳුබෑවුමේ තරමක් ආවරණය වූ මුල්ලකට ඔවුහු ළඟාවූහ. මේ වනවිට මුහුදු මට්ටමේ සිට අඩි පන්දහසක් ඉහළ සිටි තිදෙනාට දැනුණේ, ඇටමිදුළු දක්වා කා වදින දැඩි ශීතලකි. වියළි දර කැබලි කිහිපයක් එකතු කළ හෝප් ගල්තලාව මත ගිනිමැලයක් දල්වූයේය. ආහාරයට යමක් සොයාගන්නා තුරු, එතැනට වී විඩාහැරීමට ඔවුහු තීරණය කළහ. අශ්වයින් ගැටගසා, ලූසිගෙන් සමුගත් ඔහු, රයිෆලය කරේ දමාගෙන පිටත්වූයේ, හමුවන කුමන සතෙකු හෝ දඩයම් කරගැනීමේ අරමුණෙනි. වයසක ෆෙරියර් හා ලූසී සීතල ඉවසිය නොහැකිව, ගිනිමැලයට ළංවී ගිනිතැපීමට පටන්ගත්හ. මඳ දුරක් ඉදිරියට ගිය තරුණයා ආපසු හැරී බැලුවේය. සතුන් තිදෙනා පසුබිමේ නිශ්චලව සිටින අයුරුත්, පියා හා දියණිය ගිනිමැලයට ළංවී සීතල දුරු කරගන්නා අයුරුත්, ඔහුට දකින්නට ලැබිණි. තවත් ඉදිරියට යද්දී ගල්කුළකින් ආවරණය වීම නිසා මේ දසුන ඔහුට නොපෙනී ගියේය.

කෙසේ හෝ සතෙකු දඩයම් කරගැනීමේ අරමුණෙන් ජෙෆර්සන් හෝප් සැතපුම් කිහිපයක් ඉදිරියට ගියේය. ගල් පර්වත අතරින් වැටුණු දෙබොක්කා අතරින් රිංගමින්, ප්‍රපාතයන්හි පහළට බසිමින්, සතෙකු සොයා ගිය ඔහුට, අන්තිමේදී බලාපොරොත්තු වූ ලකුණු දකින්නට ලැබිණි. ඒ විශාල ගස්වල කඳේ පොත්ත මත වූ සීරීම් හා තවත් සලකුණුය. මෙයින් පැහැදිලි වූයේ මේ අවට වලසුන් ගැවසෙන බවයි. එහෙත් පැය දෙකක් තුනක් තිස්සේ සොයා බැලුවත් දඩයම් කරගැනීම සඳහා කිසිම ආකාරයක සතෙකු ඔහුට හමුනොවීය. උත්සාහය නිෂ්ඵල වීම නිසා, ජෙෆර්සන් හෝප් තවත් පමා නොවී ආපසු යෑමට තීරණය කළේය. අවසන් වරටත් හිස කරකවමින් ඔහු සෝදිසි බැල්මක් හෙළුවේය.

තරුණයාට මෙවර දකින්නට ලැබුණු දසුනෙන් ඔහුගේ හදවත ප්‍රීතියෙන් පිනා ගියේය. ඔහු සිටි තැනට යාර තුන් හාර සියයක් දුරින්, කොතක් මෙන් ඉදිරියට දික්වූ පර්වත තුඩක් මත සිව්පාවෙක්

http://sherlockholmesinvestigations.blogspot.com

සිටියේය. හැඩයෙන් හා ප්‍රමාණයෙනුත් බැටළුවෙකුට සමාන, විශාල අං තට්ටුවක් තිබූ මේ සතා, දඩයක්කරුවන් හැඳින්වූයේ "මහ අහා" යනුවෙනි. තමාට නොපෙනී පහත් බිමක සිටි සතුන් රංචුවක මුරකරු ලෙස, මේ සතා ගල මුදුනේ බලාසිටිනවා විය යුතුයයි හෝප් අනුමාන කළේය. වාසනාවකට මෙන් ඌ බලාසිටියේ අනෙක් දිශාවයි. එහෙයින් දඩයක්කරුවා තමා වෙත කුරුමානම් අල්ලනු ඌ දුටුවේ නැත. මුහින් අතට බිම වැතුරුණු තරුණයා, රයිෆලය පර්වතයට හේත්තු කරගෙන, හොඳින් එල්ලය ගෙන එය ක්‍රියාත්මක කළේය. වෙඩි පහරින් උඩ විසිවූ සතා, පර්වත දාරයේ මොහොතක් දඟලමින් සිට, පහත වූ ප්‍රපාතයට ඇදවැටුණේය.

දඩයම් කරගත් සතා ඔස්වා කරට ගැනීම ඔහුට පහසු වූයේ නැත. එහෙයින් තමාට ඔසවාගෙන යාහැකි තරම් කැබැල්ලක් කපා ගැනීමට ඔහු තීරණය කළේය. සැඳෑ කාලය ළං වෙමින් තිබූ බැවින්, සතාගේ කපාගත් ගාතය කර තබාගෙන හෝප් ආපසු එන්නට පිටත්විය. එහෙත් වැඩිදුර යාමට පෙර, ඔහුට මුහුණදීමට සිදුවූයේ බලවත් ප්‍රහේලිකාවකටයි.

සතෙකු දඩයම් කරගැනීමට තිබූ නොඉවසිල්ල නිසා, හෝප් අතින් සිදුවී තිබුණේ කුමක්ද? ඔහුට කඳුකරයේ හොඳින් හුරු පුරුදු පෙදෙස් පසුකොට, ඔහු ගමන් කර තිබුණේ නුපුරුදු, කිසිදාක නොඅා පෙදෙසකටයි. තමා මංමුලා වීඇති බැව් ඔහුට වැටහිණ. දැන් ඉතින් ආපසු යාම සඳහා මඟ සොයාගැනීම, පහසු කටයුත්තක් වන්නේ නැත. නිවැරදි මාර්ගය යයි ඔහු සිතූ දෙසට හෝප් සැතපුමක පමණ දුරක් ගමන් කළේය. එහෙත් එහි තිබුණේ ඔහු කිසිදාක නුදුටු ඇළ පාරකි.මඟ වැරදී ගිය බව වටහා ගත් තරුණයා ආපසු හැරී ගොස් වෙනත් මඟක ගමන් කොට බැලීය. එය ද වැරදි මඟක් විය. මේ අයුරින් කීප වාරයක් වැරදි මාර්ගවල ගිය තරුණයාට, කරකියා ගත හැකි දෙයක් නොවීය. අඳුර ගලා එමින්, රාත්‍රිය ළංවෙමින් තිබිණි.

කිහිපවාරයක් උත්සාහ කොට, අන්තිමේදී ඔහු හුරු පුරුදු මාර්ගය සොයාගන්නා විට ඇඳිරි වැටී තිබිණි. තවමත් හඳපායා නොතිබුණු නිසා, ඉදිරිමඟ සොයාගැනීම ද එතරම් පහසු කටයුත්තක් වූයේ නැත. කරේ වූ දඩයමේ බරෙන් ද දැඩි විඩාව නිසා ද ඔහු ඉදිරියට පා නැඟුවේ අපහසුවෙනි.

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු දිරිමත් වූයේ, ඉදිරියට තබන සෑම පියවරකින් ම තමා ලූසීට ළං වන බව සිතීමත්, ගමනේ ඉතිරි කොටසට අවශ්‍ය තරම් ආහාර දත් ඔවුන් සතුව ඇත, යන සැනසුම් සහගත හැඟීමත්ය.

ලූසී හා ඇගේ පියා රඳවා තබා, ඔහු පිටත්වී ගිය ගල්කුළ සමීපයටම හෝප් ආපසු පැමිණියේය. අඳුරේ වුවද එතැන හඳුනාගැනීම ඔහුට අපහසු වූයේ නැත. දියණියත් පියාත් තමා එනතුරු දත් නොඉවසිල්ලෙන් බලා සිටිනවා ඇත. එහි ළඟා වීමට හැකිවීම ගැන සතුටට පත් තරුණයා, එක් අතක් මුව වටා රවුම් කර සතෙකු මෙන් මහ හඬින් කෑගැසුවේය, ඒ තමා ළඟ එන බව ඇයට දන්වීමටයි. පිළිතුරු වශයෙන් ඇය නගන ශබ්දය කුමක්දැයි ඔහු මඳක් නැවතී සවන් දුන්නේය. එහෙත් එවැනි පිළිතුරක් නොලැබිණ. තරුණයාට අසන්නට ලැබුණේ, ඔහු නැඟූ හඬ වටේවූ පර්වත වල වැදී හට ගැනුණු ප්‍රතිරාවය පමණි. පෙරටත් වඩා උස් හඬින් හෝප් තවත් වරක් කෑ ගැසුවේය. එහෙත් පිළිතුරු ලෙස, පැය කිහිපයකට පෙර හැර දමා ගිය මිතුරන්ගෙන් කෙඳිරියක් වත් නොඇසිණ. වචනයෙන් විස්තර කළ නොහැකි දැඩි භීතියක්, ඔහුගේ මුළු සිරුරටම දැනිණි. කැලැඹීමෙන් ඉදිරියට දිවගිය ඔහු අතින්, කෑමට ගෙන ගිය සත්ත්ව ඝාතය බිම අතහැරිණි.

ඉදිරියටම ගිය ජෙෆර්සන් හෝප්ට, ගිනිමැලය දල්වා තිබූ තැන ඈතට පෙනිණ. එහි තවමත් දිළිසෙන ගිනිඅඟුරු කිහිපයක් දිස්විය. එහෙත් තමා එතැනින් පිටත් වී ගිය පසු, ගිනිමැලය හොඳින් දල්වා තැබීම සිදුවී නොමැති බැව් ඔහුට පෙනිණ. හතරවටින්ම දිස්වූයේ මරණයේ තිබූ බියකරු බව රැගත් නිහඬතාවයකි. ගිනිමැලය අසල පණ ඇති කිසිදු ජීවියෙකු නොවීය. සතුන්, මහලු මිනිසා, තරුණිය සියල්ල අතුරුදහන් වී ගොස්ය! තමා එතැන නොසිටි වෙලාවේ එක්වරම, මහා බිහිසුණු ඛේදවාචකයක් සිදුවී ඇති බැව් පැහැදිලිය. ඔවුන් තිදෙනා හා බැඳුණු මහා විනාශයක්! එහෙත් ඒ කුමන ආකාරයක එකක්ද යන්න හැඟවීමට, කිසිදු සලකුණක් ඉතිරි වී නොතිබිණි.

මෙය හිසට එක්වරම එල්ල වූ, හෙණ පහරක් වැනි බිහිසුණු සිදුවීමකි. ජෙෆර්සන් හෝප්ගේ හිස කැරකී, ක්ලාන්ත වන බවක් ඔහුට දැනිණ. බිම ඇද නොවැටී සිටීමට, ඔහු රයිෆලයට වාරු විය. අපහසුවෙන් හුස්ම ගනිමින් ඔහු මඳ වෙලාවක් ගත කළේය.

http://sherlockholmesinvestigations.blogspot.com

ජීවිතය පුරා දුක් කරදර කම්කටොලු වලට, මුහුණ දී තිබූ හෝප් ක්‍රියාශීලී මිනිසෙකි. මෙම බියකරු සිදුවීමෙන් කම්පනයට පත්වී, ඔහු ගතකලේ ස්වල්ප වේලාවකි. වහාම ක්‍රියාත්මක වී, සිදුවී ඇති දේ පිළිබඳව සොයා බැලීමට ඔහු තීරණය කළේය. ඔහු පන්දමක් සාදාගෙන, ගිනිගොඩේ අඩක් දැල්වී තිබුණු ගිනි අඟුරු වලට පිඹ, එය ගිනි අවුළුවා ගත්තේය. මීළඟට ඔහු කඳවුරු බැඳගත් තැන සෝදිසි කර බැලීමට පටන්ගත්තේය. ඔවුන්ගේ ලැගුම් පොළේ අශ්වයින්ගේ කුර සටහන් රාශියක් විය. මේ අනුව සිතාගත හැකිවූයේ අශ්වාරෝහකයින් විශාල ගණනක්, පලා ගිය තිදෙනා හොයා පැමිණ ඇති බවයි. ඔහු තවදුරටත් ඒ අවට පොළොව පරීක්ෂාකර බැලීය. එම අශ්වයින්ගේ කුර සටහන් සෝල්ට් ලේක් නගරයට යන මාවත දෙසට වැටී ඇති බව හෝප් දුටුවේය එසේ නම් පියා සහ දියණිය දෙදෙනාම ආපසු ගෙන ගොස්ද? එසේ වන්නට ඇතැයි සිතුවිල්ලක් ඔහු තමාගේ සිතට ඇතුළු කර ගත්තේය.

මඳ වේලාවක් යද්දී දකින්නට ලැබුණු දෙයින් හෝප්ගේ මුළු ඇඟම හිරිවැටී ගියේය. ඔවුන්ගේ කඳවුරට මඳ දුරක් ඔබ්බෙන්, රතු පැහැති අලුත් පස්ගොඩක් ඔහුට දකින්නට ලැබිණි. පැය කිහිපයකට පෙර එවැන්නක් මෙතැන නොතිබුණු බව ඔහුට හොඳමට විශ්වාසය. එය පැය කිහිපයකට පෙර හෑරූ මිනීවළක් බවට සැකයක් නැත. ඔහු එතැනට ළං වෙද්දී, පස්ගොඩ මත සවි කර තිබූ කෝටුවක් හා එහි දෙබලේ රඳවා තිබූ කඩදාසි කැබැල්ලක් හෝප්ගේ නෙත ගැටිණි. එහි ලියා තිබුණේ කෙටි වුවත් ඉතා පැහැදිලි පණිවුඩයකි.

**සෝල්ට් ලේක් නගරයේ**

**ජීවත් වූ**

**ජෝන් ෆෙරියර්**

**1860 අගෝස්තු 4 වැනිදා**

**අභාවප්‍රාප්ත විය.**

මීට පැය කිහිපයකට පෙර, සිය දියණිය සමග රඳවා ගිය, වයස්ගත එහෙත් සවිමත් මිනිසා. දැන් ඔහු මළවුන් අතර! මේ ඔහුගේ සොහොන් ගැබ මත වූ අවමඟුල් පුවරුවයි. තවත් මිනීවළක් ඇත්දයි, ජෙපර්සන් හෝප් සොයන්නට පටන්ගත්තේ යක්ෂාවේශ

http://sherlockholmesinvestigations.blogspot.com

වුවෙකු මෙනි. එහෙත් එවැන්නක සලකුණක් හෝ නොවීය. එසේනම් නිසැකවම ඔවුන් ලුසීව පැහැරගෙන යන්නට ඇති. පූජකවරුන්ගේ පුතෙකුගේ බිරින්දවරුන් සමූහයේ, තවත් එකියක කර ගැනීම සඳහා ගෙන යන්නට ඇති. ඇයට අත්වෙන ඉරණම කුමක්දැයි දන් තරුණයාට පැහැදිලිය. එය වළක්වාලීමට තමාට තනිව කළ හැකි දේ කුමක්ද? තමා අසරණ බව ඔහුට වැටහිණ. වයස්ගත ගොවියාට අත්වූ ඉරණම තමාට ද අත්වන්නේ නම් මැනවැයි විටෙක ඔහුට සිතුණේය.

බලාපොරොත්තු කඩවීමෙන් සිතේ ඇතිවූ කම්පනය හා කලකිරීම යටපත් කරගෙන, ඔහුගේ ක්‍රියාශීලී සිත යළිත් වරක් උඩට මතුවිය. තමාට අන් කළහැකි කිසිවක් නොමැති නම්, ඉතිරිව ඇත්තේ ඔවුන්ගෙන් පළිගැනීම බව හෝප් සිතාගත්තේය.

අන් කිසිම පුද්ගලයෙකුට නොතිබුණු තරම් ඉවසීමකුත්, තම අරමුණ ජයගන්නා තුරු එය හඹායෑමේ ගතියකුත්, ජෙෆර්සන් හෝප් සතුවිය. ඊට අමතරව, කිසිදා යටපත් නොවෙන පළිගැනීමේ චේතනාවක් ද ඔහුගේ සිතේ ඇතිවිය. මේ ගතිගුණ ඔහුට ලැබෙන්නට ඇත්තේ, ඔහු දීර්ඝ කාලයක් සමීපව ඇසුරු කළ, රතු ඉන්දියානු ජාතිකයන්ගෙන් වීමට ඉඩ ඇත. නිවීගිය ගිනිමැලය අසලට වී ඔහු කල්පනා කළේය. තම සිතට ඉවසා දරාගත නොහැකි තරමට යළි යළිත් ඇවිළී එන ශෝකය යටපත් කරගත හැකි ක්‍රමය කුමක් ද? ඒ සඳහා යොදාගත හැකි එකම ක්‍රමය නම්, මේ සතුරන්ගෙන් අංග සම්පූර්ණ අයුරෙන් පළිගැනීම බව ජෙෆර්සන් හෝප් අන්තිමේදී සිතාගත්තේය. තමා සතු දැඩි අධිෂ්ඨානයත්, වෙහෙසට පත් නොවන ශරීර ශක්තියත් මේ සඳහා කැප කිරීමට ඔහු තීරණය කළේය. හෝප්ගේ ශෝකයෙන් හරිත වූ මුහුණ සුදුමැලි වී තිබිණි. ඔහු ආපසු ගියේ සත්ත්ව ගාතය අත්හැර දමා ආ තැනටයි. එය ගින්නෙන් පුළුස්සා, තමාට දින දෙකකට සෑහෙන තරම් ආහාර ඔහු පිළියෙල කර ගත්තේය. දැඩි වෙහෙසකට පත්ව සිටියත්, ආහාර ස්වල්පයක් ගිල දමා, ඉතිරි සියල්ල පොදියක් ලෙස බැඳගත් හෝප්, යළි ගමන් ඇරඹීය. "පළිගන්නා දේවදූතයන්"ගේ පා සලකුණු ඔස්සේ, සෝල්ට් ලේක් නගරයට ඔවුන් සොයා යාමට ඔහු පිටත් විය.

http://sherlockholmesinvestigations.blogspot.com

දින දෙකකට කලින් අශ්වයා පිට නැගී ගමන් කළ දුර්ගමාර්ගය ඔස්සේ, ඔහු දෙපයින් දින පහක් තිස්සේ ගමන් කළේය. රළු මඟක නොකඩවාම ගමනේ යෙදීම නිසා, ඔහුගේ දෙපා තුවාල වී තිබිණ. ගතට අධික වෙහෙසක් දැනිණ. එහෙත් ඔහු රාත්‍රියට නිදාගත්තේ, පැය කිහිපයක් පමණි. හිරු උදාවට පෙර ඔහු යළිත් ගමන් ඇරඹුවේය. හයවැනි දිනයේ රාජාලි ගුහාව වෙත ළඟා වීමට හෝප්ට හැකිවිණි. ඔවුන්ගේ අවාසනාවන්ත ගමන ඇරඹූ තැන මෙයයි.

මැත යුගයේ ශාන්තුවරයන්ගේ නිවාස නගරයේ පිහිටි ප්‍රදේශය, ඔහුට කඳුමුදුනේ සිට දැකිය හැකිවිය. පීඩාපත්ව සිටි නිසා, තම ගිනිඅවියට වාරුවී, එදෙස බලා සිටි ඔහුට නගරයේ යම් වෙනසක් දකින්නට ලැබිණි. අමහර වීථි ලෙලදෙන කොඩි වලින් අලංකාර කර තිබුණේ උත්සවයක් පැවැත්වෙන පරිද්දෙනි. මේකට හේතුව කුමක්දැයි සිතා ගැනීමට නොහැකිව, හෝප් කල්පනා කරමින් සිටියේය. අසෙකුගේ කුර ගැටෙන හඬක් ඔහුට අසන්නට ලැබිණි. අශ්වාරෝහකයෙකු ඔහු සිටි තැනට ළඟාවෙන අයුරු හෝප් දුටුවේය. මේ, තමාගෙන් වරක් උදව් උපකාර ලබා ඇති කවුපර් නම් මෝමොන් භක්තිකයා බව හෝප් හඳුනා ගත්තේය. තරුණයා අමුත්තා වෙත ළං වූයේ ලුසී ෆෙරියර්ට අත්වූ ඉරණම ගැන දැනගැනීමටයි.

"මම ජෙෆර්සන් හෝප්. ඔබට මතක ඇති මාව?"

කවුපර් තරුණයා දෙස බලා සිටියේ, අතිශයෙන්ම පුදුමයටත් භීතියටත් පත්වය. කලකට පෙර තමා හඳුනන කඩවසම් තරුණයාද මේ, යයි ඔහුට සිතිණි. මේ සිටින්නේ, වැහැරී ගිය සිරුරක් ඇති, අපිරිසිදු මුහුණක් ඇති කෙනෙකි. මඳ වේලාවක් අමුත්තා දෙස බලා සිටි කවුපර්, මේ ජෙෆර්සන් හෝප් බව සැකහැර හඳුනාගත්තේය. හඳුනාගැනීම සම්පූර්ණ වූ විට ඔහුට වැටහුණේ තම මොළය අවුල් වීගෙන යන බවයි.

"උඹ මෙහාට ආවේ පිස්සුවෙන්ද?" ඔහු කෑ ගැසීය. "මං උඹත් එක්ක කථාකරනවා කවුරු හරි දක්කොත් මගේ ජීවිතෙත් ඉවරයි. ෆෙරියර්ලා පැනලා ගියාට වැරැදිකාරයා උඹයි කියලා ප්‍රසිද්ධ කරලයි තියෙන්නේ. උඹව දුටු තැන අල්ලන්න කියලා ශුද්ධවන්තයින් සිව්දෙනා වරෙන්තු නිකුත් කළා."

http://sherlockholmesinvestigations.blogspot.com

"උන්ගෙ වරෙන්තුවලට මං භය නෑ." හෝප් කීය. "දැන් මෙහේ සිද්ධ වෙලා තියෙන්නේ මොනවද කියලා ඔහේ දන්නව නේද කව්පර්? මං ඔහේගෙන් බැගෑපත්ව ඉල්ලා සිටිනවා, මගේ මේ ප්‍රශ්නවලට පිළිතුරු දෙන්න කියලා. අපි ඉස්සර ඉඳන්ම යහළුවෝ. මගේ ප්‍රශ්නවලට දෙවියන්ගේ නාමෙන් පිළිතුරු දෙන්න. මගහැරල යන්න හදන්න එපා."

"හරි. හරි. මොනවද උඹව දනාගන්න උවමනා?" කව්පර් ඇසීය. "ඉක්මන් කරපන්. මේ ගල්වලට කන් තියෙනවා. ගස්වලට ඇස් තියෙනවා."

"ලුසී ෆෙරියර්ට දැන් මොකක්ද වෙලා තියෙන්නේ?"

"තරුණ ඩ්‍රෙබර් ඊයේ ඇයව විවාහ කරගත්තා. ඔහොම ඉඳපන් මනුස්සයෝ !........... ඔහොම ඉඳපන්! ......... ඔය! උඹ ක්ලාන්ත වෙලා ඇද වැටෙන්නයි හදන්නේ."

"......... මං හැන .... බලන්න එපා." හෝප් කියද්දී ඔහුගේ මුහුණ ක්ලාන්ත ගතියෙන් මෙන් සුදුමැලි වී තිබිණි. ඔහු වහාම එතැන වූ ගලක් අතින් අල්ලාගෙන හිඳගත්තේය. "උඹ කිව්වෙ කසාද බැන්දා කියලද?"

"ඔව්. ඊයේ කසාද බැන්දෙව්වා. පවරාදීමේ මන්දිරයේ කොඩි දාලා තියෙන්නේ ඒකයි. ඇයව අයිති කරගන්නේ කොයි එක්කෙනාද කියන එක ගැන, ඩ්‍රෙබර් හා ස්ටැන්ගසන් අතරේ කතාබහක් ඇති වුණා. ෆෙරියර්ලා ලුහුබැඳ ගිය කණ්ඩායමේ, ඔවුන් දෙදෙනාම ඉඳලා තියෙනවා. මහලු ෆෙරියර්ට වෙඩිතියලා මරා දමල තියෙන්නේ ස්ටැන්ගසන්. ඒ නිසා ඇය අයිති ඔහුට කියලා මතයක් ඉදිරිපත් වෙලා තියෙනවා. අන්තිමට ශුද්ධවන්තයින් සිව්දෙනාගේ මණ්ඩලයේ මේ ගැන විවාදයක් ඇතිවුණාලු. ඩ්‍රෙබර්ගේ පක්ෂය වඩා ශක්තිමත් නිසා, නායක උතුමාණන් ඇය තරුණ ඩ්‍රෙබර්ට භාර දුන්නා. ඒ වුණාට ඇයව කාටවත් උවමනා වෙන එකක් නැහැ, වැඩි දවසක්. ඒ මොකද මට ඊයේ ඇගේ මුහුණේ දකින්න ලැබුණේ මරණය! ඇය දැන් ගැහැනියක් නෙමෙයි: ඇවිදින මළකඳක්.... හෝ උඹ මිය යන්නද හදන්නේ."

"ඔව්. මම යනවා." හෝප් කීවේ වාඩිවී සිටි තැනින් නැගිටිමිනි. ඔහුගේ මුහුණේ මාංශ පේශි දැඩි වූයේ, කිරිගරුඬින් තෙළු පිළිමයක

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

විලසිනි. ඒවායේ ප්‍රකාශිත හැඟීම් ඉතාම දුරුණු ඒවා විය. එහෙත් දෙනෙත්වල වූයේ දීප්තියකි.

"උඹ කොහෙද මිය යන්නේ?"

"කොහේ වුණත් කමක් නෑ." පිළිතුරු දුන් තරුණයා ආපසු හැරී ගමන්කළේ, වනගත වූ කඳුකරය දෙසටයි. ජෙෆර්සන් හෝප් මහා වනාන්තරයේ රුදුරු වන සිව්පාවුන් අතර, බිහිසුණු සතෙකු මෙන් ජීවත්වීමට තීරණය කළේය.

මෝර්මොන් ජාතික කව්පර්ගේ අනාවැකිය ඒ අයුරින්ම සැබෑ විය. අසරණ ලුසීට හොඳ සිහියෙන් හිඳ ඔසවා ජීවත්වීමට හැකි වූයේ නැත. ඊට හේතු වූයේ ඇගේ පියාට අත්වූ බිහිසුණු ඉරණම දකීමද, තමා පිළිකුල් කළ විවාහයක පැටළීමද යන්න කිසිවෙකුට සිතාගත නොහැකි විය. රෝගී බවට පත් ඇය, මසක් ගතවීමට පෙර මියගියාය.

ඩේබඩු ඩ්‍රෙබර් ප්‍රධාන වශයෙන්ම ලුසී විවාහ කරගත්තේ ෆෙරියර්ගේ ධනය තමා සතු කරගැනීමටයි. එහෙයින් ඇගේ මරණය ඔහුට කණගාටුවට කරුණක් නොවීය. එහෙත් ඔහුගේ අනෙක් බිරින්දෑවරු, ඇගේ මරණය ගැන ශෝක වූහ. මෝර්මොන් චාරිත්‍රය අනුව, ඇය භූමදාන කරන දිනට පෙර දිනයේ රාත්‍රියේ, ඩ්‍රෙබර්ගේ අනෙක් බිරින්දෑවරු මිනියට තනි රකිමින් සිටියහ. පසුවදා හිරු පායා ඒමට පෙර, පාන්දර යාමයේ වූ සිදුවීමකින්, මේ කාන්තාවෝ අතිශය භයටත් විස්මයටත් පත්වූහ.

මෘතශරීරය තබා තිබූ කාමරයේ දොර එක්වරම හැරගෙන කිසිවෙක් එහි ඇතුළුවිය. ඔහු දුරී ගිය ඇඳුම් හැඳ සිටි, අව්වැසි වලින් පීඩාවට පත්, වනචාරියෙකුගේ පෙනුමක් තිබූ තරුණයෙකි. රැස්ව සිටි ගැහැනුන් වෙත එක් බැල්මක් හෝ නොහෙළූ ඔහු, වචනයක් හෝ කථා නොකොට කෙළින්ම ගියේ මළසිරුර වෙතටයි. වරක් ලුසීගේ ආත්මය දැරූ මේ මෘතදේහය වෙත පහත් වූ ඔහු, ඇගේ නළල සිපගත්තේය. මීළඟට ඇගේ අත ගෙන, එහිවූ මංගල මුද්ද ගළවා ගත්තේය.

"මේ මුද්ද එක්ක ඇයව භූමදාන කරන්න මගෙන් ඉඩ ලැබෙන්නෙ නෑ." ඔහු උස් හඬින් කෑගැසුවේය. මීළඟට ඔහු පඩිපෙළෙන් බිමට පැන, කාමරයෙන් පිටවී අතුරුදන්වූයේ,

http://sherlockholmesinvestigations.blogspot.com

ආරක්ෂකයින් කැඳවීම සඳහා අනතුරු ඇඟවීමටත් පෙරයි. එය සිදුවීමට ගතවූයේ එක් නිමේෂයකි. මෙම අද්භූත සිදුවීම, අන් අයට විශ්වාස කිරීම පවා අපහසු විය. එය සත්‍ය සිදුවීමක් බව සනාථ කිරීමට තිබූ එකම සාක්ෂිය වූයේ, මළ සිරුරේ වූ රත්රන් මංගල මුද්ද අතුරුදන් වී තිබීමයි.

ජෙෆර්සන් හෝප් මාස ගණනක් වනාන්තරයට වී කාලය ගතකළේය. සතුරන්ගෙන් පළිගත් යුතු ආකාරය සැලසුම් කරමින් ඔහු ගෙවූවේ වනචාරී දිවියකි. කඳුකරයේ පාළු ගල්ගුහා අසල ගැවසුණු, නගරයට ආසන්න අන්ධකාර ප්‍රදේශවල රාත්‍රියට සංචාරය කළ, අභිරහස් අවතාරයක් ගැන කටකතා පැතිර ගියේය.

වරක් ස්ටැන්ගසන්ගේ නිවසට වෙඩි ප්‍රහාරයක් එල්ල විය. ඔහුගේ කන අසලින්ම ගමන් ගත් වෙඩි උණ්ඩ, බිත්තියේ වැදී නැවතුණු නිසා, ඔහුගේ ජීවිතය අනූනවයෙන් බේරිණි. තවත් වරක් ඩ්‍රෙබර් කන්දක් අසලින් ගමන් කරමින් සිටියදී විශාල ගලක් ඔහු වෙතට පෙරළීගෙන ආවේය. ඔහු දිවි ගලවාගත්තේ, වහා අහකට පැන බිම පෙරළීමෙනි. ඔවුන්ගේ ජීවිතවලට මරණීය තර්ජන එල්ල වී ඇති බැව්, තරුණ මෝමොන් භක්තිකයන් දෙදෙනාටම වැටහිණ. මෙසේ බිහිසුණු උපද්‍රව එල්ල වීමට හේතුව ද ඔවුහු වටහා ගත්හ. සතුරා අල්ලා ගැනීමේ හෝ මරා දැමීමේ අරමුණෙන්, කිහිපවාරයක්ම ඝාතක කණ්ඩායම් කඳුකරය වෙත යවන ලදී. එහෙත් සෑම වාරයකදීම ඔවුන්ගේ උත්සාහ අසාර්ථක විය. ඉන්පසු ස්ටැන්ගසන් හා ඩ්‍රෙබර් දෙදෙනා, අඳුරු වැටුණු පසු නිවසින් පිටනොවී සිටීමට තීරණය කළහ. ඔවුන්ගේ නිවාසවල ආරක්ෂාව සඳහා, අමතර ආරක්ෂක භටයන් යොදවන ලදී.

ටික කලක් ගතවෙද්දී මේ අමතර ආරක්ෂක පියවර අවශ්‍ය නොවන බවක් පෙනිණ. ඔවුන්ගේ සතුරා කිසිවෙකුට දකින්නට හෝ ඔහු ගැන අහන්නට නොලැබිණ. කාලය ගතවෙද්දී ඔහු තුළ තිබූ දැඩි පළිගැනීමේ චේතනාව සංසිඳී යන්නට ඇතැයි, මෝමොන් ආගමික නායකයෝ විශ්වාස කළහ.

ඇත්තෙන්ම සිදුවූයේ, එය සංසිඳී යාම නොව, වඩාත් තීව්‍ර වීමයි. දඩයක්කාරයාට තිබුණේ මෘදු බවට නොහැරෙන, නොනැමෙන දැඩි සිතකි. පළිගැනීමේ චේතනාවෙන් ඒ සිත කොතරම් වෙළී තිබුණාද කිවහොත්, වෙනත් හැඟීමකට ඒ සිතේ ඉඩක් නොවීය.

http://sherlockholmesinvestigations.blogspot.com
Feedline Purpose Only. Not For Print

එහෙත් ඔහු බුද්ධිමත් ප්‍රායෝගික මිනිසෙකු විය. තමා කොතරම් නිරෝගී වුවත්, දිගින් දිගටම එළිමහනේ දිවිගෙවීම, ශරීර සුවතාවට හිතකර නොවන බව ඔහු දැන සිටියේය. කලට වේලාවට නිසි ලෙස ආහාර නොලැබීමත්, අව්, වැසි, කුණාටුවලට නිතර නිරාවරණය වීමත් නිසා, ශරීර ශක්තිය කෙමෙන් දුර්වල වන බව ඔහුට අවබෝධ විය. තමා බල්ලකු මෙන් කඳුකරයේ මියගියහොත්, පලිගැනීමේ සැලැස්මට සිදුවන්නේ කුමක්ද? එහෙත් දිගටම කඳුකරයේ රැඳී සිටියහොත්, පලිගැනීමට පෙර තමා මරණයට පත්වන බව නියතය. තම සතුරාට අවශ්‍යව ඇත්තේද එයයි. එහෙයින් අකමැත්තෙන් වුවද යළිත් නෙවාඩාහි පතල් කර්මාන්තය සඳහා යාමට ඔහු තීරණය කළේය. ඒ මගින් ශරීරශක්තිය නැවත ලබාගැනීම, වඩාත් නැණවත් මඟක් වන බව ඔහුට වැටහිණ. සෑහෙන මුදලක් උපයාගතහොත්, තම අරමුණ නිසි ලෙස ඉටුකර ගැනීම අපහසු නොවන බව ඔහු තේරුම් ගත්තේය.

ජෙෆර්සන් හෝප් බලාපොරොත්තු වූයේ, පතල් කර්මාන්තයේ යෙදෙමින් ගතකරන කාලය, එක් අවුරුද්දකට පමණක් සීමා කිරීමටයි. එහෙත් කලින් කලට ඔහුට මුහුණදීමට සිදුවූයේ, බලාපොරොත්තු නොවූ සිදුවීම් රැසකටයි. ඒ අනුව ඔහුට පතල් ප්‍රදේශයේ, අවුරුදු පහක කාලයක් ගතකිරීමට සිදුවිණි. කෙසේ වුවත් මේ කාලය අවසානයේදීත්, සතුරන්ගෙන් පලිගැනීමේ චේතනාව, එදා ජෝන් ෆෙරියර්ගේ සොහොන අසලදී තිබූ අයුරින්ම ජෙෆර්සන් හෝප් තුළ පැවැතිණ.

වෙස් මාරු කරගෙන වෙනත් නමක් ද ආරූඪ කරගත් ඔහු, සෝල්ට් ලේක් නගරය බලා පිටත් විය. තමා සාධාරණය, යුක්තිය යයි විශ්වාස කළ දේ ඉටු කරගත හැකිවුවොත්, තම ජීවිතයට කුමක් වන්නේද යන්න ඔහුට වැදගත් නොවීය. සෝල්ට් ලේක් නගරයේදී ඔහුට අසන්නට ලැබුණේ, බලාපොරොත්තු නොවූ පුවතකි.

මෑත යුගයේ ශාන්තුවරයන් යයි හඳුන්වාගත් මෝමොන් ආගමිකයන් අතර, මාස කිහිපයකට පෙර මහා වියවුලක් හටගෙන තිබිණ. වැඩිහිටි ආගමික නායකයන්ගේ පාලනයට එරෙහිව, තරුණ සාමාජිකයන් ඇරඹූ කැරැල්ලක් නිසා, ආගම කැබලි කිහිපයකට කැඩී, බිඳී ගොස් තිබිණි. මෙහි ප්‍රතිඵලයක් ලෙස කිහිප දෙනෙක්, යූටාව අත්හැර ගොස් වෙනත් ආගම් වැළඳ ගත් බව ද අසන්නට

http://sherlockholmesinvestigations.blogspot.com

ලැබිණ. ඩ්‍රෙබර් හා ස්ටැන්ගසන් දෙදෙනා ද මේ අතර විය. ඔවුන් සංක්‍රමණය වූයේ කුමන රටකටද යන්න කිසිවෙක් දැන සිටියේ නැත. පැතිර ගිය කටකතා අනුව නම්, ඩ්‍රෙබර් ඔහුගේ දේපොළෙන් විශාල කොටසක් විකුණා මුදල් ලබාගෙන ඇත. ඔහු යූටාවෙන් පිටවී ගොස් ඇත්තේ, ධනවතෙකු ලෙසිනි. එහෙත් ස්ටැන්ගසන්ට එතරම් මුදලක් ලබාගැනීමට හැකිවී නැති බැවින්, ඔහු පිටවී ගොස් ඇත්තේ දුප්පතෙකු ලෙසිනි. කෙසේ වෙතත් ඔවුන් ගියේ කුමන රටකටද ආදී කිසිම තොරතුරක් දත් කිසිවෙකු හෝප්ට හමු නොවීය.

මෙවැනි බරපතල දුෂ්කරතාවයන් හමුවේ, ඕනෑම කෙනෙක් තම පළිගැනීමේ චේතනාවින් අත්හැර දමනු නිසැකය. එහෙත් පසුබට වූයේවත්, අමතක කර දැමූයේවත් ජේෆර්සන් හෝප් නොවේ. ඔහු තම සහජ දක්ෂතාවයන් උපයෝගී කර ගනිමින්, ලැබෙන රක්ෂාවක යෙදෙමින්, අරමුණ කෙසේ හෝ ඉටුකර ගැනීමට තීරණය කළේය. ඔහු ඇමරිකා එක්සත් ජනපදයේ, ජනපදයෙන් ජනපදයට, නගරයෙන් නගරයට, ගමින් ගමට, සංක්‍රමණය විය. ඔහුගේ අරමුණ වූයේ කෙසේ හෝ තම සතුරන් සොයාගැනීමයි. අවුරුද්දෙන් අවුරුද්ද ගතවිය. ඔහුගේ කළු හිසකෙස් තැනින් තැන පුදුවීමට පටන්ගත්තේය. එහෙත් ඔහු තම උත්සාහය අත් නොහැරියේය. තම ජීවිතයම කැප කළ මේ අරමුණ මුදුන් පමුණුවා ගැනීමට, ඔහු තැනින් තැන ගියේ, මිනිස් දඩබල්ලෙකු මෙන් ඉව කරමිනි.

ජේෆර්සන් හෝප්ගේ නොපසුබට උත්සාහය නිසා, අන්තිමේදී සාර්ථක ප්‍රතිඵල ලැබිණ.එක් දිනක් ඔහුට ජනෙල් වීදුරුවක් හරහා එක් මුහුණක් දකින්නට ලැබිණි. මුහුණ හඳුනා ගැනීමට ඒ ක්ෂණික බැල්ම ප්‍රමාණවත් විය. ඔහු ලුහුබැඳ ගිය පුද්ගලයින්, දැන් වාසය කරන්නේ ඔහායෝ ජනපදයේ ක්ලීව්ලන්ඩ් නගරයේ බව ජේෆර්සන් හෝප් තේරුම් ගත්තේය.

ඔහු තම නවාතැන්පොළට ආපසු ඇවිණියේ පළිගැනීම සඳහා සියලු කටයුතු සූදානම් කරගැනීමටයි. එහෙත් අවාසනාවක මහත! ජනෙල් වීදුරුවෙන් මඟ මඟ බලා සිටි ඩ්‍රෙබර්ට, ඔහුගේ හතුරාගේ මුහුණුවර හඳුනාගැනීමට අපහසු නොවීය. ඒ මුහුණේ රැඳී තිබුණේ 'මරණය' බව ඩ්‍රෙබර් තේරුම් ගත්තේය.

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු වහාම ස්ටැන්ගසන් ද කැඳවාගෙන සාමදාන විනිශ්චයකාරයකු වෙත ගියේය. පැරණි සතුරෙකුගෙන් තමන්ගේ ජීවිතවලට අන්තරායක් ඇති බවට ඔවුහු පැමිණිලි කළහ. එදා හැන්දෑවේම ජෙෆර්සන් හෝප් අත්අඩංගුවට ගන්නා ලදි. ඔහු වෙනුවෙන් ඇප දීමට කිසිවෙකු ඉදිරිපත් නොවීය. එබැවින් සති කිහිපයක් සිරභාරයේ සිටීමට හෝප්ට සිදුවිණි. අවසානයේ ඔහු එතැනින් නිදහස ලබා සොයා බලද්දී, ඩ්‍රෙබර් පැනගොස් නිවස හිස්ව ඇති බව හෝප් දුටුවේය. ඩ්‍රෙබර් සහ ස්ටැන්ගසන් යුරෝපයට පැන ගොස් ඇති බව දැනගන්නට ලැබිණි.

පළිගැනීමේ උත්සාහය යළිත් වරක් අසාර්ථක විය. එහෙත් ඔහුගේ සිතේ වූ වෛරය ඔහු යොමු කළේ සතුරන් ලුහුබැඳ යාමටයි. මේ සඳහා ඔහුට වැඩිපුර මුදල් අවශ්‍ය විය. ඒ සඳහා රැකියාවට ගිය ඔහු, සෑම ඩොලරයක්ම ඉතිරි කර ගත්තේ, ගමන සඳහා දරන්නට සිදුවන වියදම වෙනුවෙනි. ප්‍රමාණවත් තරම් මුදලක් එකතු කර ගත් පසු, හෝප් යුරෝපය බලා පිටත්ව ගියේය.

සතුරන් සොයමින් යුරෝපයේ නගරයෙන් නගරයට ගිය ඔහුට, ඔවුන් අල්ලා ගැනීමට නොහැකි විය. සුළු සුළු රැකියාවල යෙදෙමින් ඔහු නගර පීරමින් ඇවිදිද්දී, සතුරන් රුසියාවේ ශාන්ත පීටර්ස්බර්ග් නගරයේ සිටි බව අසන්නට ලැබිණි. හෝප් සතුරන් හඹා එහි ගියේය. ඔහු ශාන්ත පීටර්ස්බර්ග් නගරයට ළඟාවෙද්දී ඔවුහු පැරිස් නගරය බලා පිටත්ව ගොස් සිටියහ. ඔහු එතැනට යද්දී ඔවුන් ඊට පෙර කෝපන්හේගන් නගරය බලා ගොස් තිබිණි. ජෙෆර්සන් හෝප් ඩෙන්මාර්කයේ අගනුවර වෙත ගිය ද, යළිත් ඔහු ප්‍රමාදය. දින කිහිපයකට පෙර ඔවුහු ලන්ඩන් නගරය බලා පිටත්ව ගොස් සිටියහ. එහිදී ඔවුන් අල්ලා ගැනීමට, අවසානයේදී හෝප් සමත් විය.

එහි සිදුවූයේ කුමක්ද යන්න විස්තර කිරීමට සුදුසුම ආකාරය, දඩයක්කාරයා කී කතාව, ඔහුගේ වචන වලින්ම ඔබ වෙත ගෙන ඒමයි. ඒ හැමදෙයක්ම දොස්තර වොට්සන් ලියූ වාර්තාවේ සඳහන් වන නිසා, අපි එය මෙසේ ඉදිරිපත් කරමු.

http://sherlockholmesinvestigations.blogspot.com

## 6

# දොස්තර වොට්සන්ගේ මතක සටහන්වල ඉතිරි කොටස

සිරකරුවා අපේ විලංගුවෙන් මිදීමට බිහිසුණු සටනක යෙදුණත්, ඔහු අප කෙරෙහි දක්වූ ආකල්පය දරුණු එකක් නොවීය. අන්තිමේදී තමාට ගැළවීමක් නොමැති බැව් වටහා ගත් පසු, ඔහු සිනාසුණේ සුහද අයුරෙනි.

"මා සමග පොර බදන්න ගිහිං, ඔබතුමන් ලා කාටවත් තුවාල වුණේ නැහැ නේද? මං හිතුවේ ඔබ දන් මාව පොලිස් ස්ථානය වෙත ගෙන යාවි." ඔහු කීවේ ෂර්ලොක් හෝම්ස්ටයි. "මගේ කුලීරිය පහළ දොර ළඟ තියෙනවා. මගේ දෙපා බැඳල තියෙන ගැට ලිහිල් කළොත්, මට තනියම බැහැල යන්න පුළුවනි. මාව උස්සාගෙන යන එක අමාරු වේවි. ඒ, මොකද ඉස්සර තරම් දන් මගේ සිරුර සැහැල්ලු නෑ."

ග්‍රෙග්සන් හා ලෙස්ට්‍රේඩ් මුහුණට මුහුණ බැලුවේ, මේ යෝජනාව අපට එතරම් වාසිදායක එකක් නොවූ නිසා විය යුතුය. එහෙත් සිරකරුවාගේ වචනය හෝම්ස් එක්වරම විශ්වාසයට ගත්තේය. ඔහු සිරකරුවාගේ කකුල් බැඳීමට අප යෙදූ තුවාය ඉවත් කළේය. කෙළින් සිටගත් සිරකරු තම දෙපා දෙපසට දිගු කළේ, ඒවා නිදහස් බව තමාටම ප්‍රත්‍යක්ෂ කරගැනීමට මෙනි. මෙතරම් සවිමත් ලෙස ගොඩනැගුණු සිරුරක් ඇති කෙනෙකු මා දක ඇත්තේ ඉතාමත් කලාතුරකිනි. අව්වට පිළිස්සී කළු පැහැගැන්වුණු මුහුණෙන් පැවසුණේ, දැඩි අධිෂ්ඨානය හා නොසැලෙන මානසික ශක්තියයි. එය ද ශාරීරික ශක්තිය මෙන් යෝධ එකක් බව බැලූ බැල්මට පෙනිණි.

http://sherlockholmesinvestigations.blogspot.com

"පොලිස්පති තනතුරට ඇබෑර්තුවක් ඇතිවුණොත්, මං හිතන්නේ ඒකට සුදුසුම පුද්ගලයා ඔබයි." ඔහු කීවේ හෝම්ස් දෙස බලමිනි. "ඔබ මා පසුපස ලුහුබැඳ ආ ආකාරය විශිෂ්ටයි."

"ඔබත් එන්න මා සමග යන්න." හෝම්ස් කීවේ පොලිස් නිලධරයන් දෙදෙනාටයි.

"මට පුළුවනි කරත්තය පදවන්න." ලෙස්ට්‍රේඩ් කීය.

"බොහොම හොඳයි. එහෙනම් ග්‍රෙග්සන් එන්න ඇතුළට. දොස්තර මහත්මයා. ඔබත් එන්න අප සමඟ. ඔබ මේ පරීක්ෂණය ගැන ලොකු උනන්දුවක් දක්වූවානෙ. ඒ නිසා දිගටම අප සමග ඉඳලා, කථාවේ ඉතිරි ටිකත් අහගන්න."

මම ඉතා කැමැත්තෙන් ඊට එකඟ වීමි. අපි සියලුදෙනාම පහළ තට්ටුවට බැස්සෙමු. පැන යාමට උත්සාහයක් නොදරූ සිරකරුවා, ශාන්තදාන්තව තමාගේ කුලීරියට නැඟුණේය. ඔහුට පසුව අපි එහි නැඟුණෙමු. රියැදුරු අසුනට නැගගත් ලෙස්ට්‍රේඩ් කරත්තය දක්කාගෙන, අප ඉතා ඉක්මනින් පොලිස් මූලස්ථානය වෙත ගෙන ගියේය.

පොලිස් පරීක්ෂකයෙක් සිරකරුවාගේ නමත්, ඔහු අදාළ මිනීමැරුම්වල, මරණයට පත්වූවන්ගේ නම් ද සටහන් කරගත්තේය.

"මේ හිරකාරයා මේ සතියේ දවසක අපි මහේස්ත්‍රාත්තුමා ඉදිරියට පමුණුවනවා." ඔහු කීය. "ජෙෆර්සන් හෝප් මහත්මයා. ඔබට කියන්න කැමැති දෙයක් තියෙනවා නම් කියන්න පුළුවනි. නමුත් ඒ දේවල් ඔබට විරුද්ධව සාක්ෂි ලෙස ඉදිරිපත් කළ හැකි බව, මා ඔබට සිහි කළ යුතුයි." පොලිස් පරීක්ෂකයා කීය.

"මට කියන්න තියෙනවා දිග කථාවක්." සිරකරු කීය. "මං කැමතියි මේ මහත්වරු ඔක්කොම ඒ කථාව අහගෙන ඉන්නවා නම්...."

"....... ඔය කථාව නඩු විභාගයේදීම කියන්න තියාගත්තොත් නරකද?" පොලිස් නිලධරයා ඇසීය.

"මං හිතන්නේ නෑ මට විරුද්ධව නඩු විභාගයක් පවත්වන්න ඔබට අවස්ථාවක් ලැබේවි කියල." ඔහු පිළිතුරු දුන්නේය. "මය විටියට බොහොම බයෙන් භ්‍රාන්තවෙලා මා දිහා

http://sherlockholmesinvestigations.blogspot.com

බලන්න එපා. මං සියදිවි හානිකරගන්න හදනවා නෙමෙයි....... ඔබ වෛද්‍යවරයෙක් ද?" ඔහු ඇසුවේ මා දෙස නෙත් යොමු කරමිනි.

"ඔව්"

"එහෙනම්, මෙන්න මෙතැනින් පොඩ්ඩක් අත තියල බලන්න." ඔහු සිනහමුසුව පැවසුවේ, විලංගු සහිත දෑත් තම හදවත දෙසට ළං කරමිනි.

මම ඔහුගේ හදවත හා ඒ අවට ප්‍රදේශය මත අත තබමින් පරීක්ෂා කර බැලීමි. හෘදය ස්පන්දනය සිදුවූයේ ඉතා අසාමාන්‍ය පිළිවෙළකට බව එක්වරම මට දැනිණ! ඔහුගේ හෘදය හා රුධිර නාල පද්ධතියේ යම් කිසි අර්බුදකාරී තත්ත්වයක් හටගෙන ඇති බව මම වටහාගතිමි. ඔහුගේ උර: කුහර බිත්තියේ තිබුණේ, රෝගීන්ගේ පමණක් දක්නට ලැබෙන, අසාමාන්‍ය අයුරක දෙදරීමකි. දුර්වල බිත්ති සහිත ගොඩනැගිල්ලක් තුළ, අධික බලශක්ති යන්ත්‍රයක් ක්‍රියාකරද්දී මුළු ගොඩනැගිල්ලම දෙදරුම් කයි. සිරකරුගේ පපු කුහරය ගැන ද මගේ සිතේ ඇතිවූයේ එවැනිම සිතුවිල්ලකි. කාමරය නිහඬ වෙද්දී මම ඊට සවන් යොමුකළෙමි. හෘදයෙන් ඉවතට ලේ ගලායාමේදී සාමාන්‍යයෙන් ඇසෙන ඩාඩට ඩ්ඩා, වෙනත් ආකාරයක හඬක් මට පැහැදිලිව ඇසිණි.

"දෙයියෝ සාක්කි!" මට කෑගැසිණ. "ඔබට තියෙනවා අයෝටික් ඇනියුරිස්මයක් - මහා ධමනියේ බිත්තිය ප්‍රසාරණය වීමෙන් ඇතිවූ ගෙඩියක්."

"දොස්තර මහත්වරු හැමෝම කියන්නේ ඒක තමා. මං ගිය සතියේ දොස්තර මහත්තයෙක් හමුවෙන්න ගියා. ඔහු කිව්වා වැඩි දවසක් යන්න කලින් ඒක පුපුරාවි කියලා." සිරකරු කීවේය. "දැන් අවුරුදු ගණනාවක් තිස්සේ මේ අසනීපය එන්න එන්නම වැඩිවුණා. නෙවාඩා කඳුකරයේ, සීතලෙන්, අව්වෙන්, වැස්සෙන් හිමෙන් පීඩා විඳිමින්, හරි හැටි ආහාරයක් නොගෙන ජීවත්වුණු නිසා තමයි මට මේක හැදුණේ.

මගේ රාජකාරිය මං කරල අවසානයි. දැන් ඉතින් කොයිතරම් ඉක්මනට මං මළත්, ඒක මට ප්‍රශ්නයක් නොවෙයි. ඒ වුණත් මං කැමතියි මට මේ විදියේ දෙයක් කරන්න සිදුවුණේ ඇයි කියලා, මේ ලෝකේ මිනිසුන්ට කියල යන්න. මහ පාරේ දකින්න ලැබෙන,

http://sherlockholmesinvestigations.blogspot.com

පිහියෙන් අනින, බෙල්ල කපන සාමාන්‍ය මිනීමරුවෙක් හැටියට මා ගැන මිනිස්සු මතක තියාගන්නවාට මං කැමති නෑ."

පොලිස් නිලධරයෝ තිදෙනා ඉක්මන් සංවාදයක යෙදුණහ. ඒ, සිරකරුවාට ඔහුගේ කථාව කීමට ඉඩ දිය යුතුද නැද්ද යන්න පිළිබඳවයි.

"දොස්තර මහත්තයා. ඔබ හිතන හැටියට ඔහුගේ ජීවිතය තියෙන්නේ අවදානම් තත්ත්වයකද?"

"ඇත්තෙන්ම ඔව්."

"එහෙම නම් යුක්තිය ඉෂ්ඨ කිරීමේ චේතනාවෙන්, ඔහුගෙන් කට උත්තරයක් ගැනීම අපේ වගකීමක්. හොඳයි හෝප් මහත්තයා. ඔබට කියන්න යමක් තියෙනවා නම්, දැන් ඒක කියන්න පුළුවනි. එය මා සටහන් කරගන්නා බව ඔබට දැනුම් දිය යුතුයි." පොලිස් නිලධරයා කීය.

"ඔබගෙන් අවසර ලැබෙනවා නම් මම ටිකක් වාඩිවෙන්නම්." සිරකරුවා කීවේ අසුනක හිඳගනිමිනි. "මේ අසනීපය නිසා මට හරි ඉක්මනට, මහන්සි දනෙනවා. අපි ඉස්සර වෙලා කළ පොර බැදීමෙන් මගේ මහන්සිය වැඩිවුණා. මං මේ ඉන්නේ මහායි මොහොතේ හෝ මිනීවළට පය තියන්න සූදානමෙන්. ඉතින් මොකටද මං ඔබට බොරු කියන්නේ? මං මේ කියන හැම වචනයක්ම සම්පූර්ණ ඇත්ත. ඒ බව මට දිවුරා කියන්න පුළුවනි. ඔබ ඒ කථාන්තරය මොන විධියට පාවිච්චි කළත් මට ඒකේ ප්‍රශ්නයක් නෑ."

එසේ කිව් ජෙෆර්සන් හෝප්, පුටුවේ පිටුපසට හේත්තු වී ඔහුගේ දීර්ඝ කථාන්තරය අපට කීමට පටන් ගත්තේය. ඔහු එය කියාගෙන ගියේ ක්‍රමානුකූලව හා ශාන්ත ස්වරයකිනි. සිරකරුවා කථාව කියද්දී ලෙස්ට්‍රේඩ් එය ලඝු ලේඛනයෙන් සටහන් කරගත්තේය. විස්තරයේ ඇති නිවැරදි බව ගැන මම සහතික වෙමි. ඒ ලෙස්ට්‍රේඩ් සියල්ල සටහන් කර ගත් පොත පරිහරණය කිරීමට, මට අවස්ථාව ලැබුණු නිසයි.

"මං මේ මිනිස්සුන්ට මෙච්චර වෛර කළේ ඇයිද කියන එක ඔබට එච්චර වැදගත් නැතුව ඇති." ඔහු කීය. "අහිංසක මනුෂ්‍යයින් දෙදෙනෙකුගේ - පියෙකුගේ හා දුවකගේ මරණය ගැන, ඔවුන් සම්පූර්ණ වරදකරුවෝ. ඒ නිසා මේ කාලකණ්ණි මිනිසුන් දෙදෙනාට

http://sherlockholmesinvestigations.blogspot.com

ජීවත්වෙන්න අයිතියක් නෑ. ඒ අපරාධය සිදුවෙලා බොහොම කාලයක් ගතවුණා. ඒ ගතවී තිබෙන කාලයේ හැටියට, අධිකරණයක් ඉදිරියට ගිහින් සාධාරණයක් ඉටු කරගන්න, කොහොමටවත් බෑ. ඔවුන් ඒ අපරාධයට වගකිව යුතුබව මං හොඳින්ම දන්නවා. ඒ නිසා මං තීරණය කළා, විනිශ්චයකාරයාත්, ජූරියත්, අලුගෝසුවාත් යන තනතුරු තුනම මං භාරගන්න. මං මේ මුහුණදුන්නු තත්ත්වයට ඔබ පත්වුණා නම්, ඔබේ ළඟ මිනිස් හැඟීම් තිබුණා නම්, ඔබ කරන්නේත් මං කළ දේමයි.

මං ඒ ඔබට කිව්ව යුවතිය අවුරුදු විස්සකට කලින් විවාහ කරගන්නයි, මං බලාපොරොත්තුවෙන් හිටියේ. ඔය ඩ්‍රෙබර් ඇයව බලෙන් විවාහ කරගෙන, ඒ ශෝකයෙන් හදවත පැළී ඇය මියගියා. මං ඒ මඟුල් මුද්ද ඇගේ මිනියේ අතෙන් ගලවා ගත්තා. ඩ්‍රෙබර් මගේ අතින් මැරුම් කන වෙලාවට, ඔහුගේ දෑස්වලට මං ඒ මුද්ද පෙන්වනවා කියල, මං මටම දිවුරා ගත්තා. මුද්ද සුරැකිව මා ළඟ තියාගෙන, මං යන යන තැන එය රැගෙන ගියා. මං මහාද්වීප දෙකක ඔවුන් ලුහුබැඳ ගියා. අවසානයේ මට උන් අහුවුණා. උන් හිතුවේ, මං උන් පස්සේ ඇවිත්, මහන්සිවෙලා, බැරිතැන මේක අත්හැර දාවි කියලයි. නමුත් උන් හිතූ විධියට මං ඒක අත්හැර දැම්මේ නැහැ. මං හෙට මැරෙන්න ඉඩ තියෙනවා. ඒත් මං මැරෙන්නෙ, මට කරන්න තිබුණු වැඩ කොටස මං ඉටු කළා - හොඳින් ඉටු කළා කියන සැනසීමෙන්. මගේ දෑතෙන් උන් විනාශ වුණා. මගේ තවත් බලාපොරොත්තු කිසිවක් නෑ.

උන් බොහොම ධනවත්. ඒ නිසා උන් පසුපස එළවා යෑම, ඒ තරම් පහසුවුණේ නැහැ. මං ලන්ඩනයට එද්දී මගේ සාක්කු හිස්. ජීවත්වෙන්න මොකක් හරි රස්සාවක් කරන්න වෙන බව මට තේරුණා. අසුන් පිට යෑමත්, අශ්ව තුරන්න පැදවීමත්, මට බිම ඇවිදිනවා වගේ පහසු දේවල්. ඉතින් මං කුලීරථ කාර්යාලයක රැකියාවක් සොයාගත්තා. මට නියමිතව තිබුණේ, ඒ කාර්යාලයට සතියකට යම් නියමිත මුදලක් ගෙවන්න. ඊට අමතරව උපයාගත හැකි මුදල මට. මේ විධියට, ඒ තරම් විශාල මුදලක් මට ඉතිරි වුණේ නැහැ. නමුත් කොහොම හරි ජීවිතේ ගැටගසා ගන්න එය ප්‍රමාණවත් වුණා. මට අමාරුම වැඩේ වුණේ, ලන්ඩන් නගරයේ පාරවල් හොයා ගැනීමයි. ලෝකයේ මං දුටු නගරවලින්, මේ තරම්

http://sherlockholmesinvestigations.blogspot.com

සංකීර්ණ මාවත්, අතුරු පාරවල් ඇති නගරයක් වෙන කොහේවත් නෑ. මා ළඟ තිබුණා සිතියමක්. ප්‍රධාන හෝටල් හා දුම්රිය පොළවල් හඳුනාගත්තට පස්සේ මට වැඩේ පහසු වුණා.

මේ මහත්වරු දෙන්නා ජීවත්වුණේ කොහෙද කියලා සොයාගැනීම මට ලේසි කටයුත්තක් වුණේ නැහැ. මං හොයාගෙන, හොයාගෙන ගියා. අන්තිමට ඒක සාර්ථක වුණා. ඔවුන් හිටියේ තේම්ස් ගඟෙන් එහා පැත්තේ, චැම්බර්වෙල්හි නේවාසිකාගාරයක. උන් ඉන්න තැන හොයා ගත්තට පස්සේ, උන්ගේ ජීවිත රැඳී තියෙන්නේ මගේ අතේ: මට හිතෙන තාක් කල් විතරයි. ඒ බව මං දැනගෙන හිටියා. මං මුහුණ වැහෙන්න රැවුලක් වවල තිසා, මාව හඳුනාගන්න උන්ට හැකියාවක් තිබුණේ නැහැ. මට සුදුසු අවස්ථාවක් ලැබෙන තුරු ඔවුන් පිටුපස්ස යන්න මං තීරණය කළා. මේ සැරේ නම් උන්ට මගෙන් බේරිලා පැනල යන්න මං කොහෙත්ම ඉඩ තියන්නේ නැහැ. ඒ බවට මං දැඩිව අධිෂ්ඨාන කරගෙනයි හිටියේ.

මගේ හතුරෝ බොහොම නිදහසේ ලන්ඩන් නගරයේ හැසිරුණා. හැමතිස්සෙම වගේ මං හිටියේ උන්ගේ පිටුපසින්. සමහර වෙලාවට මගේ කුලීරියෙන්, සමහර වෙලාවට පයින් මං උන් පසුපසින් ගියා. කුලීරිය තමා ඒ වැඩේට වඩාත් හොඳ වුණේ. ඒ මොකද මට නොපෙනී පැනගන්න, එවිට උන්ට හැකියාවක් ලැබෙන්නෙ නෑ. මේ කටයුත්ත නිසා මට මුදලක් උපයාගන්න ඉඩක් ලැබුණේ, උදේ පාන්දරම සහ රාත්‍රියේ පමණයි. ඒකෙන් වුණේ, මගේ කුලීරිය අයිති තැනට ගෙවන මුදලේ, හිඟ එකතුවෙන්න පටන්ගත්තා. ඒක මගේ හිතට ප්‍රශ්නයක් වුණේ නැහැ. මගේ ඉලක්කය වුණේ මගේ හතුරන්ගෙන් පළිගැනීමයි.

උන් බොහොම කෛරාටික යක්කු. උන් පසුපසින් මා එන්න පොඩි ඉඩක් හරි තියෙනවා කියලා උන්ට හිතෙන්න ඇති. කොයිවෙලාවක වත්, එකෙක් තනිවම එළියට ගියේ නැහැ. දෙන්නම එකටයි ගියේ. අනෙක රෑ බෝ වුණාට පස්සේ ගෙදරින් පිටවුණේ නෑ. පසුගිය සති දෙකේම මං උන් පසුපස්සේ ගියා. නමුත් දෙන්නා වෙන්වුණේ නැහැ. ඩ්‍රෙබර් නම් හැමතිස්සෙම වගේ හිටියේ හොඳටම බීල, වෙරිවෙලා. නමුත් ස්ටැන්ගසන් හොඳ කල්පනාවෙන්, අවබෝධයෙන් හිටියා. මට පොඩි අවස්ථාවක් වත් ලැබුණේ නැහැ.

http://sherlockholmesinvestigations.blogspot.com

නමුත් මං ඒකෙන් අධෛර්යට පත්වුණේ නැහැ. මගේ අරමුණ ඉටුකර ගන්නා වෙලාව බොහොම ළං වෙලා බව මගේ හිත කිව්වා. මගේ හිතට තිබුණු එකම භය, මේ කටයුත්ත ඉවරයක් කරන්න කලින්, මගේ පපුවේ ලේ නහරය පුපුරාවි කියලයි.

එක දවසක් හැන්දෑවේ මම කිහිපවාරයක්, ටෝකේ ටෙරසයේ ඉහළ පහළ, මගේ කුලී රිය පදවාගෙන ගියා. මේ පාරේ තමයි ඔවුන් නැවතිලා හිටියේ. ඔවුන්ගේ බඩුමුට්ටු දොර අයිනට ගෙනැවිත් කරත්තයට පටවන හැටි මට දකින්න ලැබුණා. ඒ කරත්තය පිටත් කරලා, ඩ්‍රෙබර් හා ස්ටැන්ගසන් තවත් කරත්තයකින් ඒ පිටුපස ගියා. මමත් රථය දක්කාගෙන, ඔවුන් පෙනෙන තෙක් මානයේ ගමන්කළා. මගේ හිතේ ලොකු භයක් තිබුණා, මොවුන් මේ සූදානම් වෙන්නේ, පදිංචිය වෙනස් කරන්නද කියලා.

යුස්ටන් දුම්රියපොළේදී ඔවුන් කරත්තයෙන් බැස්සා. මං මගේ කරත්තය කොලුවෙකුට බලාගන්න දීලා, අර දෙන්නා පසුපස දුම්රියපොළ ඇතුළට ගියා. ඔවුන් ඇහුවේ ලිවර්පූල් බලා පිටත්වෙන දුම්රියක් ගැන. එහි සිටි සේවකයා කිව්වා, ලිවර්පූල් යන එක දුම්රියක් දැන් පිටත්වෙලා ගිය බවත්, ඊළඟ එක තියෙන්නේ තවත් පැය කිහිපයකින් බවත්.

මේකෙන් ස්ටැන්ගසන්ගෙන් පෙනුණේ බලාපොරොත්තු කඩවුණු තත්ත්වයක්. නමුත් ඩ්‍රෙබර් නම් සතුටට පත්වුණු බව පෙනුණා. සෙනග අතරේ මං ඔවුන් දෙදෙනා ළඟටම කිට්ටු වුණා. ඔවුන් අතරේ ඇතිවුණු කතාබහ මට හොඳට ඇහුණා.

" මට උවමනා කරන වැඩක් ගැන බලන්න යන්න තියෙනවා. ඔහේට පුළුවනි නේ මං එනතුරු බලාගෙන ඉන්න. මං ඉක්මණට එන්නම්" ඩ්‍රෙබර් කිවුවා.

"එහෙම ගිහිං කොහොමද?" ස්ටැන්ගසන් විරුද්ධවුණා. "අපි දෙන්නා එකඟතාවයකට ආවනේ. අපේ පරෙස්සම ගැන හිතලා එකටම ඉන්නවා කියලා දෙන්නම පොරොන්දු වුණානේ?"

"බෑ බෑ. මේ වැඩේට ඔහෙත් එක්ක යන්න බෑ" ඩ්‍රෙබර් කිව්වා. "මේක බොහොම සියුම් පෞද්ගලික කටයුත්තක්. මං යා යුත්තේ තනිවම."

http://sherlockholmesinvestigations.blogspot.com

එයට ස්ටැන්ගසන් මොනවා හරි කිව්වා. ඒ පිළිතුර මට ඇහුණේ නෑ. ඒකට ඩ්‍රෙබර්ට කේන්ති ගියා.

"තමුසේ කොහොමද මිනිහෝ, මං වැඩකරන්න ඕන පිළිවෙළ මට කියල දෙන්නේ?" ඩ්‍රෙබර් කේන්තියෙන් දිවුරමින් උස්හඬින් කිව්වා. "උඹ දැන් මං දෙන පඩියෙන් ජීවත්වෙන මගේ සේවකයෙක්. මං වැඩකරන්නේ මට ඕන හැටියට. උඹ ඒවා මට කියල දෙන්න උත්සාහ කරන්න එපා."

"ඔව්. එහෙම නම් ඔබ කැමැති හැටියකට ඒවා කර ගන්න." ස්ටැන්ගසන් පිළිතුරු දුන්නා. "ඔබේ වැඩකටයුතු වලට මං බාධා කරන්නේ නෑ. නමුත් ලිවර්පූල් බලා යන අන්තිම දුම්රියට නියමිත වෙලාවට මං වේදිකාවට එනවා. ඔබට ඒක අල්ල ගන්න බැරි වුණොත් මං හෝටලයකට ගිහිං ඔබ එනතුරු බලාගෙන ඉන්නම්. මං නවතින්නේ අර හැලිඩේ පෞද්ගලික හෝටලයේ. එතැනට එන්න."

"නෑ නෑ. මං ඒ තරම් ප්‍රමාද වෙන්නේ නෑ. රෑ එකොළහ වෙන්න කලින් මං මේ වේදිකාවට එන්නම්."

එහෙම කිව් ඩ්‍රෙබර් දුම්රියපොළෙන් පිටවෙන්න සූදානම් වුණා.

මෙච්චර කාලයක් තිස්සේ මං නොඉවසිල්ලෙන් බලාසිටි මොහොත ළඟාවුණා. දැන් අතින් මගේ හතුරන් පරාජය කරන්න මගේ අවස්ථාව. උන් දෙන්නා එකට හිටියොත්, උන් පරාජය කරන්න මට අමාරුයි. නමුත් උන් තනි තනියේ ආවොත් මට ජයගන්න පහසුයි. කොහොම වුණත් මං ඕනෙවට වඩා කලබල වුණේ නෑ. කළ යුතු පිළිවෙළ මං හිතෙන් සැලසුම් කරගෙනයි තිබුණේ. මගේ සතුරා නිකම්ම මියගියොත්, මේ පළිගැනීමෙන් ඇති වැඩක් නෑ. ඔහු මැරෙන්න කලින් දැනගන්න ඕනෑ, කාගෙ අතින්ද මැරුම් කන්නේ කියන එක. ඊළඟට ඔහු දැනගන්න ඕනේ, ඔහුට ඒ ඉරණම අත්වෙන්න හේතුව මොකක්ද කියලා. මගේ හතුරා මට කොටුවුණු දවසක, ඔහු කළ පාපය ඔහු පසුපස එළවාගෙන ආ බව, තේරුම් කරන හැටි මං හිතෙන් සැලසුම් කරගෙනයි හිටියේ.

ටික දවසකට කලින් ගෙවල් කුලියට ගැනීමට ගෙවල් පරීක්ෂා කරන මහත්වරු වගයක්, මගේ කුලී රථයෙන් ගෙනියන්න මට සිදුවුණා. එදා ඔවුන් පරීක්ෂා කළේ, බ්‍රික්ස්ටන් පාරේ හිස්වුණු ගෙවල්. එක් නිවසක යතුරු, නැතිවීමකින් මගේ කරත්තයේ වැටී

http://sherlockholmesinvestigations.blogspot.com

තිබුණා. යතුරු හොයාගන්න ආව මනුස්සයට, එදා හැන්දෑවෙම මං ඒක භාර දුන්නා. නමුත් ඊට කලින් මං ඒ යතුරේ අච්චුව ගත්තා. ඒ අච්චුවෙන් මම පිටපත් යතුරක් හදවා ගත්තා. කාගේවත් බාධාවක් නැතුව, මගේ කටයුත්ත නිදහසේ කරන්න තැනක් මේ යතුරෙන් මට ලැබුණා. ඩ්‍රෙබර්ව කොහොමද මේ ගෙදරට ගෙන යන්නේ? ඊළඟට මට ඇතිවුණු ප්‍රශ්නය ඒකයි.

දුම්රියපොළෙන් එළියට ආ ඔහු, තැබෑරුමකට ගිහින් මත්පැන් බිව්වා. ඒකෙන් ඉක්මණට එළියට ආවත්, දෙවැනි තැබෑරුමටත් ගියා. ඒකේ පැය භාගයක්වත් ගත කරන්නැති ඇති. ඒකෙන් එළියට ආවේ, හොඳටම වැනි වැනී, බොහොම අමාරුවෙන්. මගේ රියට ඉස්සරහින් කුලීරියක් තිබුණා. ඩ්‍රෙබර් ඒක කතාකරගත්තා. ඔවුන් ඉදිරියට යද්දී මං ඒක පිටුපස ගියා. මගේ කරත්තයේ අශ්වයා ගමන් කළේ, ඒ කුලීරියට බොහොම ළඟින්. අපි වෝටලූ පාළමත් පහුකරගෙන ඉදිරියට ගියා. ඔහොමම ගිහින් ඔහු ආයෙමත් ආවේ, එදා වෙනතුරු ලැගුම් ගෙන හිටි ටෝකේ පෙරසයටමයි. මට පුදුමත් හිතුණා. ඔහු ආව කාරණය මොකක්ද කියලා මට හිතාගන්න බැරිවුණා. නමුත් ඒ නිවසට යාර කිහිපයක් ඇතුළත මම මගේ කුලීරිය නවත්වාගෙන හිටියා. ඔහු එහි ගෙන ආ කුලීරිය යන්න ගියා.

"......මහත්වරුනි මට බොන්න වතුර ටිකක් දෙන්න..... දිගටම කථාකරද්දී තොල කට වේළෙනවා."

මම ඔහු අතට වතුර වීදුරුවක් දුන්නෙමි. ඔහු වීදුරුවේ වතුර සියල්ල බී අවසන් කළේය.

"දැන් හරි." ඔහු කීය. "ඉතින් මං එතැන පැය කාලක් විතර බලාගෙන ඉන්න ඇති. එකපැහැරම ඒ ගේ දෙසින් මට විශාල ශබ්දයක් අහන්න ලැබුණා. ගේ ඇතුළේ මහත්වරු සණ්ඩුවෙනවා වැනි ශබ්දයක්. ඊළඟ මොහොතේ ඉදිරි දොර ඇරුණා. මිනිසුන් දෙදෙනෙක් එළියට ආවා. එක්කෙනෙක් ඩ්‍රෙබර්. අනෙකා මම ජීවිතේට දැකල නැති තරුණයෙක්. මේ තරුණයා ඩ්‍රෙබර්ගේ කමිස කොළරයෙන් තදින් අල්ලාගෙන එළියට ඇදගෙනයි ආවේ. ඉදිරි තරප්පුව උඩට ආවම තරුණයා ඩ්‍රෙබර්ට වේගවත් පා පහරක් දුන්නා. ඩ්‍රෙබර් උඩින් විසිවෙලා වගේ ඇවිත් මහ පාරේ මැද හරියට වෙන්න වැටුණා."

http://sherlockholmesinvestigations.blogspot.com

"එතවර බල්ලා!" තරුණයා කෑ ගැසුවේ ඔහු අතේ තිබුණු මුගුරක් පෙන්වමින්.

"අහිංසක ගෑනුළමයෙකුට අපහාස කරන්න ආවට, මං උඹට හොඳ පාඩමක් උගන්වන්නම්." ඔහු එහෙම කිව්වේ දැඩි කෝපයෙන්. තව ටිකෙන් ඔහු අතේ තිබූ මුගුරෙන් ඩ්‍රෙබර්ට හොඳටම පහර දෙනවා. නමුත් ඩ්‍රෙබර් අමාරුවෙන් නැගිටලා, ඉක්මණින් ඉදිරියට දිව්වා. ටිකදුරක් ගිය ඔහු, මගේ රිය දැකලා, මාව කැඳවලා රියට නැගුණා.

"මාව අරං යනවා හැලිඩේ පෞද්ගලික හෝටලයට." ඔහු කිව්වා.

ඔහු මගේ රියට නැඟලා ඉදිරියට යද්දී, මගේ හිතේ ඇතිවුණේ ඉවසගන්න බැරි සතුටක්. මේ සතුට නිසා දැන් කොයි මොහොතේ හරි මගේ ලේ නහරය පුපුරායාවිද කියලා මට හයත් හිතුණා.

මං රිය පදවාගෙන ගියේ බොහොම හෙමින්. මං කල්පනා කර කර ගියේ, මං මීළඟට කළයුතු හොඳම දේ මොකක්ද කියලා. මට හිතුණේ ඔහු ගම්බද පාළු හරියකට අරගෙන ගිහිං, මගේ අවසන් සම්මුඛ පරීක්ෂණය පවත්වන්න, මං මේක කරන්න හිතුවා විතරයි. තවත් මත්පැන් ටිකක් බොන්න තිබුණු කෑදරකම නිසා, තැබෑරුමක් ළඟ කරත්තය නවත්තන්න ඔහු මට නියම කළා. ඔහු එනතුරු මා එතැන රැඳී සිටිය යුතු බව කියමින් ඔහු තැබෑරුමට ගොඩවැදුණා. ඔහු ඒක ඇතුළේ සෑහෙන වේලාවක් ගතකළා. එළියට ආවේ තැබෑරුම වහන වෙලාවටයි. මේ වෙලාවෙ ඔහු හොඳටම වෙරිවෙලා. දැන් සියල්ල සම්පූර්ණයෙන්ම තියෙන්නේ මගේ අතේ බව මට වැටහුණා.

මට ඕනෑ නම් ඔහුව අමුඅමුවේ එක් වරම මරා දමන්න තිබුණා. නමුත් ඔබ හිතනවද මං එහෙම කරාවි කියලා? මං එහෙම කළා නම් ඒක යුක්තියක්, සාධාරණයක් ඉටුකිරීම නෙමෙයි. එවැනි දෙයක් කරන්න මට කොහොමටවත් හිත හදාගන්න බැහැ. මං හුඟක් කාලෙක ඉඳලා හිතාගෙන හිටි දෙයක් දැන් මං කියන්නම්. මගේ හතුරන් අල්ලගත්තම, උන්ට ආත්මාරක්ෂාව සඳහා ප්‍රයෝජනයට ගන්න කැමති නම් මං උන්ට අවස්ථාවක් ලබා දිය යුතුයි යන්න, තමයි ඒ.

http://sherlockholmesinvestigations.blogspot.com

ඇමෙරිකා එක්සත් ජනපදයේ ජනපදයෙන් ජනපදයට, නගරයෙන් නගරයට යමින්, මම රැකියාවන් රාශියක් කළා. ඒ අතරේ කළ එක් රැකියාවක් තමයි යෝර්ක් විශ්වවිද්‍යාලයේ රසායනාගාරයේ සේවකයෙකු හැටියට සිටීම. එක දවසක් එතැන මහාචාර්යවරයා විෂ වර්ග ගැන ඔහුගේ සිසුනට දේශනයක් පැවැත්තුවා. ඔහු එදා කීවේ ඇල්කලොයිඩ නම් විෂ වර්ගය ගැන. ඔහු කිව්වා දකුණු ඇමෙරිකාවේ වනචාරී මිනිසුන්, සතුන් මැරීම සඳහා ඊතලයේ, තුඩට ආලේප කරණ විෂ වර්ගයක් ගැන. ඒක කොයිතරම් උග්‍ර විෂක්ද කිව්වොත්, ඒකෙන් ග්‍රේන් එකක ප්‍රමාණයක් සිරුරට ඇතුළු වුණොත්, මරණය ක්ෂණිකව සිදුවෙන බව මහාචාර්යතුමා කිව්වා. ඔහු ඒ විෂ වර්ගය ලබාගත් හැටි කියලා, එම බෙහෙත සිසුනට පෙන්නුවා. එය ගබඩා කර තිබූ බෝතලය කුමක්ද කියලා මං හොඳින් බලාගත්තා.

ඔවුන් හැමදෙනාම පිටවෙලා ගියාට පස්සේ, මං එයින් ටිකක් අරගත්තා. එහි සේවය කිරීමෙන්ම, රසායනාගාරයේ ඖෂධ තැනීම හා මිශ්‍ර කිරීම පිළිබඳ මට හොඳ දැනුමක් තිබුණා. මං මේ කිව් විෂ වර්ගය, වතුරේ දියවෙන කුඩා පෙති හැටියට සකස් කළා. ඒ සමගම පෙති වර්ගයක් හැදුවා, කිසිම විෂක් නැති. මං මේ සියල්ල කුඩා පෙට්ටියකට දමලා ළඟ තබා ගත්තා. මං තීරණය කරලා තිබුණේ මෙහෙම දෙයක් කරන්නයි. සුදුසු අවස්ථාව ආවම පෙට්ටියෙන් පෙත්තක් අරගෙන අර මහත්වරුන්ට කන්න කියනවා. තවත් පෙත්තක් අරගෙන මං කනවා. ඒ ක්‍රමය රිවෝල්වරයක කටට ලේන්සුවක් තියලා වෙඩිතියනවාට වඩා බොහොම නිශ්ශබ්දයි. නමුත් උවමනා දේ ඉටුවෙනවා. මා ළඟ තිබූ මේ බෙහෙත් පෙති පෙට්ටිය භාවිතයට ගත යුතු වෙලාව ආවා.

එතකොට වෙලාව රෑ දොළහ පහුවෙලා, එකටත් කිට්ටුයි. මහ අන්ධකාර රාත්‍රියක්. වේගයෙන් සුළං හැමුවා. මහ වැස්සක් ඇද හැළුණා. එළියේ තිබුණේ හරිම අයහපත් කාලගුණයක්. නමුත් මගේ හිතේ තිබුණේ ලොකු සතුටක්. සතුටෙන් හඬනගා කෑ ගහන්න පුළුවන් තරම් හිතේ පිරුණු සතුටක්. මහත්වරුනි. ඔබ අවුරුදු විස්සක් තිස්සෙ යම් දෙයක් බලාපොරොත්තුවෙන් එය හොයා ගන්න උත්සාහ කළා නම්, අන්තිමේදි එය ඔබේ අතටම ලැබුණාම මොන වගේ සතුටක්ද ඇතිවන්නේ? ඔබටත් එහෙම වුණා නම්

http://sherlockholmesinvestigations.blogspot.com

මගේ හිතේ ඇතිවුණු සන්තෝෂය කොයිතරම්ද කියලා ඔබට තේරේවි. මගේ ස්නායු වල චංචල ගතියක් දැනුණා. මං ඒවා සන්සුන් කරගන්න සුරුට්ටුවක් දල්වාගත්තා. එයින් දුම් පිටකරමින් සිටියත් මගේ අත්දෙක වෙව්ලන්න ගත්තා. හිතේ ඇතිවූ කලබලකාරී ගතිය නිසා, නළල දෙපැත්තේ ලේ නහර ස්පන්දනය වෙන හැටි මට දැනුණා. මං කරත්තය දක්කාගෙන යද්දී මට පෙනුණා, මහලු ජෝන් ෆෙරියර් හා ලුසී. ඔවුන් අන්ධකාරේ ඉඳගෙන මං දිහා බලාගෙන මා එක්ක සිනාසුනා. ඔබ සියලුදෙනා මේ කාමරයේ වාඩිවෙලා ඉන්න හැටි මට පේනනවා වගේම, මට ෆෙරියර් හා ලුසීව පෙනුණා, ඔවුන් මා ඉදිරියෙන් දිගටම ඉදිරියට ගමන්කළා. මං බ්‍රික්ස්ටන් පාරේ අර ගෙදර ළඟ කරත්තය නවත්වන තුරුම, ඔවුන් අශ්වයාගේ දෙපැත්තෙන් ගමන්කළා.

බ්‍රික්ස්ටන් පාරේ තිබුණේ මහා ඝන අන්ධකාරයක්. කිසිම මනුස්ස පරාණයක් පේනෙන තෙක් මානයක නැහැ. ඇදහැළුණු වැස්සේ හඬ ඇරෙන්න, කිසි ශබ්දයක් නැහැ. කරත්තයේ වීදුරුවෙන් ඇතුළත බැලූ මට දකින්න ලැබුණේ, මත්පැනින් මත්වෙලා වකුටු වී නිදන ඩ්‍රෙබර්. මං ඔහුගේ උරහිසෙන් අල්ලා හෙලෙව්වා."

"බහින්න බහින්න. වෙලාව හරි."

"හා හොඳයි."

ඔහු හිතන්න ඇති ඔහු සඳහන් කළ හෝටලයේ ළඟට අපි ඇවිත් කියලා. වචනයක් වත් කථා නොකර, ඔහු කරත්තයෙන් බැස්සා. බැහැල මා පිටුපස්සෙන් උද්‍යානය දිගේ ගේ දිහාවට ආවා. මත්පැනින් වෙරිවී සිටි ඔහු, තවමත් ගමන්කලේ බොහොම අමාරුවෙන්, වැනි වැනී. ඒ නිසා ඔහු බිම ඇදවැටෙතැයි කියන භයට, මට ඔහු ළඟින්ම යාමට සිදුවුණා. ගෙයි ඉදිරි දොර විවෘත කරලා, මං ඔහු ඉස්සරහ කාමරයට කැඳවාගෙන ගියා. මේ හැමවෙලාවෙම ලුසී හා ඇගේ පියා දිගටම මා ගාව හිටියා.

"හරි අන්ධකාරයිනේ." ඔහු කිව්වා.

"ඉක්මනට අපි එළියක් දල්වා ගමු." කී මම අරගෙන ආ ඉටිපන්දම දල්වූවා.

"හොඳයි එනොක් ඩ්‍රෙබර්," මා කීවේ ඔහු දෙසට හැරෙමින්, ඉටිපන්දමේ එළිය මගේ මුහුණට ළං කරමින්.

http://sherlockholmesinvestigations.blogspot.com

"කියනව බලන්න මං කවුද කියලා!"

මා දිහා ඇසිපිය නොහෙළා ඔහු බලාගෙන හිටියේ මත්වූ දෑසින්. ඒත් ඊළඟට ඔහුගේ මුහුණ භීතියෙන් සුදුමැලි වුණා. මුළු ශරීරයම ගැහෙන්න පටන් ගත්තේ අපස්මාර රෝගියෙකු වගේ. ඔහු මාව හඳුනාගත් බව මට තේරුණා. ඔහුගේ මුහුණ මලමිනියක් වගේ වුණා. නළලේ ඩහදිය මතුවුණා. දත් ඇඳි දෙක එකට වැදෙන අයුරින් වෙව්ලන්න පටන්ගත්තා.

මේ දර්ශනයෙන් මට හිනා ගියා. මං මහ හඬින් හිනාවුණා. හුඟක් වෙලා හිනාවුණා. මොහුගෙන් පළිගැනීම බොහොම සතුට ගෙනදෙන්නක් බව මං දැන සිටියා. ඒත් ඒක මගේ හිතේ මේ තරම් සතුටක් ඇති කරාවි කියලා මං හිතුවේ නැහැ.

"පර බල්ලා!" මං කිව්වා.

"මං සෝල්ට්ලේක් නගරයේ ඉඳලා ශාන්ත පීටර්ස්බර්ග් වලට උඹව ලුහුබැඳගෙන ගියා. උඹ හැම විටම මගෙන් බේරුණා. උඹේ ඒ පැනීම් අදින් ඉවරයි. එක්කො උඹ නැත්නම් මම හෙට ඉරපායනවා දකින්නෙ නෑ."

ඔහුගේ මුහුණේ හැටිත්, හිතේ ඇතිවුණු හැඟීම් මං තේරුම් ගත්තා. ඔහු හිතන්න ඇති මට පිස්සු කියලා. ඒ වෙලාවේ නම් මම හිටියේ ඊට බොහොම ළඟින්. මගේ නළල දෙපැත්තේ ලේ නහර ක්‍රියාත්මක වුණේ, හිස ඇතුළේ කුළුගෙඩි පහරවල් ගහනවා වගේ. ඒ වෙලාවේ මගේ නාසයේ ලේ නහරයක් පුපුරලා, ලේ ගැලීමක් සිදුවුණා. එහෙම නොවෙන්න මට ඊට වඩා බරපතල දෙයක් වෙන්න ඉඩ තිබුණා.

"උඹට මොකද හිතෙන්නේ ලුසී ෆෙරියර් ගැන?" මං ඇහුවේ දොර යතුරු දාලා එහි යතුර ඔහුගේ මුහුණට ළං කරමින්. "උඹ කළ අපරාධ වලට දඬුවම් ලැබෙන්නෙ බොහොම ප්‍රමාද වෙලා. ඒත් ඒක අවසානයේ උඹ ළඟට ආවා."

මං දුටුවා මේ බයගුල්ලාගේ දෙතොල් වෙව්ලන හැටි. ඔහු නොමරා බේරන්න කියලා ඉල්ලා හිටින්නත්, ඔහුට හිතෙන්න ඇති. ඒත් ඒකෙන් වැඩක් නොවෙන බව ඔහු දන හිටියා.

"මට අනුකම්පා කරපන්. උඹ මාව මරන්නද හදන්නේ?" ඔහු ඇහුවේ ගොතගසමින්.

http://sherlockholmesinvestigations.blogspot.com

"මෙතැන මිනීමැරුමක් කෙරෙන්නේ නෑ." මං කිව්වා.

"පිස්සු හැදුණු බල්ලෙක්ව මරා දමන එකෙන් ඇති වැඩේ මොකක්ද? කවුද එහෙම දෙයක් කරන්නේ? ඇගේ පියා අමු අමුවේ මරාදමලා, මගේ ආදරවන්තියව බලෙන් අරගෙන යද්දි මොකක්ද උඹලගේ තිබුණු අනුකම්පාව."

"ඇගේ තාත්තා මැරුවේ මම නෙමෙයි." ඔහු කිව්වා.

"ඒත් ඇගේ හදවත වේදනාවෙන් පුපුරවා හැරියේ උඹ." මං කිව්වේ අර පෙති අඩංගු පෙට්ටිය ඔහු දෙසට දිගුකරමින්. "කවුද හරි, කවුද වැරදි කියන එක උඩ ඉන්න දෙයියෝ තීරණය කරාවි. අපි බලමු මේ ලෝකේ, සාධාරණත්වය, යුක්තිය කියල එකක් තියෙනවද කියලා? එහෙම නැත්නම් හැම දෙයක්ම ඔහේ අහම්බෙන් සිදුවෙන දේවල්ද?"

ඔහුගේ ජීවිතය හානි නොකරන ලෙසට ඔහු දුක් අඳෝනා කියමින් හඬාවැටුණා. නමුත් මං පිහිය එළියට ඇදලා අරගෙන, ඔහුගේ බෙල්ලට තියලා තර්ජනය කළා. මගේ අණට කීකරු වෙලා ඔහු එක් පෙත්තක් කටේ දමා ගත්තා. මං අනෙක් පෙත්ත ගිල්ලා.

අපි මුහුණට මුහුණ බලාගෙන එක මිනිත්තුවක් නිශ්ශබ්දව හිටියා. කවුද ජීවත්වෙන්නේ, කවුද මැරෙන්නේ අපි බලාගෙන හිටියා. ඊළඟ මොහොතේ ඔහුගේ මුහුණෙන් පළවෙන්න පටන්ගත් හැඟීම් මට කවදාවත් අමතක කරන්න බෑ. එතකොටයි මට තේරුණේ ඔහුගේ ශරීරයට විෂ ඇතුළුවී ඇති බව. ඒක දකිද්දී මං මහ හඬින් හිනාවුණා. ලූසීගේ මංගල මුද්ද මගේ සාක්කුවෙන් අරගෙන ඔහුගේ දෑස් ඉදිරියට ගෙනැත් මං හිනාවුණා.

ඒත් ගතවුණේ එක් මොහොතයි. ඒ බෙහෙත ක්‍රියාත්මක වුණා. ඔහුගේ මුහුණේ මස් පිඬු වේදනාවෙන් ඇඹරෙන්න පටන්ගත්තා. අත් පා ඒ මේ අතට දිගු කරමින්, මුළු ශරීරයම වෙව්ලන්න පටන්ගත්තා. ඊළඟට කෙළින් හිටගෙන ඉන්න බැරිව, මරළතෝනියක් නගමින් ඔහු බිම ඇද වැටුණා. මං මගේ සපත්තුවෙන් ඔහු උඩුබැලි අතට හරවලා ඔහුගේ හදවතට අත තබා බැලුවා. ස්පන්දනයක් නැහැ. ඔහු මියගිහින්.

එක දිගටම මගේ නාසයෙන් ලේ ගලා ගොහින් තිබුණා. නමුත් මට ඒක කලින් දැනුණේ නැහැ. ඊළඟට මම ලේ ටිකක් මගේ

http://sherlockholmesinvestigations.blogspot.com

ඇඟිල්ලට ගත්තා. එහෙම අරගෙන, බිත්තියේ යමක් ලියන්න හිතුණෙ ඇයි කියලා මම ම දන්නේ නෑ. බාගවෙලාවට සතුටින් හිටි මගේ හිතේ, පොලිසිය නොමඟ යවන්න ඇතිවුණු දඟකාර සිතුවිල්ලක් වෙන්න ඇති. මට මතක් වුණා, ඒ කාලෙ නිව්යෝර්ක් නගරයේ ඇතිවුණු සිද්ධියක්. ජර්මන් ජාතිකයෙක් මරා දමා තිබුණා. එතැන බිත්තියේ RACHE කියලා ලියලා තිබුණා. ඒක ජර්මන් මිනීමරු කල්ලියක් විසින් කරන ලද මිනීමැරුමක් කියලා, ඒ කාලේ පුවත්පත් වල පළවුණා. ඉතින් මට හිතුණා නිව්යෝර්ක් නගරවාසීන්ට ඇතිවුණු ප්‍රහේලිකාව ලන්ඩන් නගරවාසීන්ටත් ඇතිවේවි කියලා. ඉතින් මං ඇඟිල්ලෙන් මගේම ලේ ටිකක් අරගෙන බිත්තියේ මට පහසු හරියේ RACHE කියල ලිව්වා.

ඊට පස්සේ මං එතැනින් පිටවෙලා මගේ කුලීරියට ගියා. ඒ අවට කිසිකෙනෙක් හිටියේ නැහැ. කුණාටුවත් එක්ක වැස්ස, ඒ වෙනකොටත් තිබුණා. මං වහාම කරත්තයට නැගලා එය පදවාගෙන ගියා. ටිකදුරක් යද්දී මං මගේ සාක්කුවට අතදමල බැලුවා. ලුසීගේ මුද්ද මං ආරක්ෂා කරගෙන හිටියේ ඒ සාක්කුවේ. මුද්ද තිබුණේ නැහැ. මට කිසිවක් හිතාගන්න බැරිවුණා. ලුසී මතක් වෙන්න මට තිබුණ එකම සිහිවටනය එයයි. මං ඩ්‍රෙබර් ගේ මිනියේ පපුවට අත තියලා බලද්දි, ඒක මගේ අතින් ගිලිහෙන්න ඇති කියලා මට හිතුණා. මං වහාම වාහනය පදවාගෙන ආපසු ගියා. එය පාර අයිනේ නවත්වලා කෙළින්ම ගෙට ඇතුළුවෙන්නයි හැදුවේ. මුද්ද වෙනුවෙන් ඕනෑම දෙයක් කරන්න මං ඒ වෙලාවේ සූදානම්. නමුත් මං ගිහින් තිබුණේ, ගෙයින් එළියට එමින් හිටි පොලිස් භටයෙකුගේ දෑත් අතරට. ඔහුගේ හිතේ ඇතිවෙන සැකය මඟහරවා ගන්න හැකිවුණේ, හොඳටම බීල වෙරිවුණු මිනිහෙක් හැටියට රඟපෑමෙන්.

එහොක් ඩ්‍රෙබර් ගේ අවසානය සිදුවුණේ එහෙමයි. මට තව ඉතිරිවෙලා තිබුණේ ස්ටැන්ගසන්ටත් ඒ දඬුවම දීමයි. එතකොට ලුසී හා ජෝන් ෆෙරියර් වෙනුවෙන් ගෙවන්න තිබෙන ණය ගෙවල අවසන් වෙනවා.

ඔහු ගියේ හැලිඩේ හෝටලයට බව මං දැනහිටියා. ඒ අවට මං දවස පුරාම ගැවසුණා. නමුත් ඔහු එළියට ආවේ නැහැ. ඩ්‍රෙබර් ආපසු ආවේ නැතිවුණාම ස්ටැන්ගසන්ගේ හිතට සැකයක් ඇතිවෙන්න ඇති කියලයි මං හිතන්නේ. ඔහු මහා කෙරාටිකයෙක්.

http://sherlockholmesinvestigations.blogspot.com

ඔහු කොයිවෙලෙත් සිටියේ බොහොම පරෙස්සමෙන්. ඔහු හිතන්න ඇති හෝටලය ඇතුළටම වෙලා හිටියාම, මගෙන් බේරෙන්න හැකිවේවි කියලා. ඒක ලොකු වැරැදීමක්. ඔහුගේ කාමරයේ ජනේලය කොයි එකද කියන එක මං ඉක්මනින්ම හොයා ගත්තා.

පහුවදා උදේ පාන්දරම මං හෝටලය වෙත ගියා. ඒ ළඟම පටුමගක දමා තිබුණු ඉණිමගක් මට බොහොම ප්‍රයෝජනවත් වුණා. උදේ පාන්දර එළිය වැටෙන්නත් කලින්, ඉණිමග බිත්තියට හේත්තුකරලා ඔහුගේ ජනේලය වෙත ගියා. ජනේලයෙන් ඔහුගේ කාමරයට ඇතුළු වුණු ගමන් මං ඔහුව අවදි කළා. මං ඔහුට කිව්වා ඔහු විසින් විනාශ කළ ජීවිතවලට වන්දි ගෙවන්න, දැන් කාලය ඇවිත් බව. ඩ්‍රෙබර් මැරුවා සොයා ගිය හැටි මං ස්ටැන්ගසන්ට විස්තර කරල කිව්වා, මං ඔහුටත් දුන්න අවස්ථාවක්. විෂ පෙති සහිත පෙට්ටිය මං ඔහු වෙත දිගු කළා. නමුත් අවස්ථාවෙන් ප්‍රයෝජන ගන්නවා වෙනුවට, ඔහු මා වෙත කඩාගෙන පැන්නා. ඒ මගේ බෙල්ල හිරකිරීමේ අරමුණින්. මගේ ආරක්ෂාවට ඔහුට පිහියෙන් අනින්න මට සිදුවුණා. කොහොම වුණත් ලැබෙන්නේ එකම ප්‍රතිඵලය.

තවත් මට කියන්න තියෙන්නේ කාරණා බොහොම ටිකයි. මට හරි මහන්සියක් දැනෙනවා. ඒ නිසා ඒ කාරණාත් කියල අවසන් කළොත් වඩා හොඳයි. මං ආයෙමත් කුලීරථ රියැදුරු රැකියාව පටන්ගත්තා. මට උවමනා වුණේ ආපහු ඇමෙරිකාවට යන්න, මුදල් ටිකක් උපයාගන්න. මං කුලීරථ ගාලේ ඉන්න කොට, වැරහැලි ඇඳගත්තු කොලුවෙක් ආවා. ඌ ඇහුවා ජෙෆර්සන් හෝප් කියලා රියැදුරෙක් ඉන්නවද කියලා. බේකර් වීථියේ අංක 221 බී දරන තැන මහත්මයෙකුට, මගේ කුලීරිය උවමනා වී තිබෙන බව ඔහු කිව්වා. මගේ හිතේ කිසි සැකයක් ඇතිවුණේ නැහැ. ඊළඟට මට දකින්න ලැබුණේ, මේ තරුණ මහත්මයා මගේ දෑතට විලංගු දමා ඇති බවයි. මගේ සම්පූර්ණ කථාන්තරය ඒකයි මහත්වරුනි. ඔබ හිතනවා ඇති මං මිනීමරුවෙක් කියලා. නමුත් මගේ හිත දන්නවා මං කළේ මොකක්ද කියන වග. මම කළෙත් ඔබ වගේම අපරාධකාරයින් සොයා ඔවුනට දඬුවම් දීමයි."

ජෙෆර්සන් හෝප්ගේ කථාන්තරය කොයිතරම් අපේ සිත් ඇද ගත්තේ ද යත්, අපි එයට වශී වී නිහඬව සවන් දුන්නෙමු. මිනීමැරීම් පිළිබඳ කථා අප්‍රමාණව අසා තිබූ පොලිස් නිලධරයන් පවා,

http://sherlockholmesinvestigations.blogspot.com

මෙයට සවන් දුන්නේ දැඩි උනන්දුවකිනි. කථාව අවසන් වූ පසු අපි මිනිත්තු කිහිපයක් නිහඬව, නිසොල්මනේ සිටියෙමු. එය යන්තමින් හෝ බිඳුණේ, ලඝුලේඛනයෙන් සියල්ල සටහන් කරගනිමින් සිටි, ලෙස්ට්‍රේඩ්ගේ පෑන්සලෙන් නිකුත් වූ ශබ්දයෙන් පමණි.

"මං කැමතියි එක කාරණයක් ගැන පමණක් තව ටිකක් විස්තර දැනගන්න." හෝම්ස් කීය. "මුද්ද ගැන මං දමූ දැන්වීමට, ඒක ගෙනියන්න ආව ඔබේ උදව්කාරයා කවුද?"

සිරකරුවා විහිළුවක් කරන්නාක් මෙන් එක් ඇසක් වසා ඉඟි කළේය.

"මගේ රහස් මට එළි කරන්න පුළුවන්. ඒත් අනෙක් මිනිසුන්ගේ රහස් එළිකරලා ඔවුන් අමාරුවේ දාන්න මං කැමති නෑ. පත්තරේ තිබුණු දැන්වීම මං දුටුවා. ඒක ඇත්තම දැන්වීමක් වෙන්නත් පුළුවන්, ප්‍රයෝගයක් වෙන්නත් පුළුවන් කියලා මට හිතුණා. මගේ මිත්‍රයෙක් කැමැත්තෙන්ම, මට උදව්කරන්න ඉදිරිපත් වුණා. ඔබ පිළිගන්නවා ඇති ඔහු ඒක විශිෂ්ට අයුරින් කළා කියලා."

"ඒකෙ කිසි සැකයක් නෑ!" හෝම්ස් කීය.

"ඉතින් මහත්වරුනි." පොලිස් නිලධරයා කීවේ මහත් වගකීමෙනි. "නීතිපොතේ හැටියට සියලු කටයුතු සිදුවිය යුතුයි. අපි මේ සිරකරුවා, බ්‍රහස්පතින්දාට මහේස්ත්‍රාත්තුමා ඉදිරියට පමුණුවනවා. එදාට ඔබතුමන්ලාගේ පැමිණීමත් අවශ්‍යයි. එතෙක් ඔහු ගැන වගකීම මං භාරගන්නවා." පැවසූ ඔහු සීනුවක් නාද කළේය.

පොලිස් භටයෙක් පැමිණ ජෙපර්සන් හෝප් පොලිස් සිරකුටිය වෙත කැඳවාගෙන ගියේය. මගේ මිත්‍රයා සහ මම බේකර් වීථියේ අපේ නිවහනට ආපසු පැමිණියෙමු.

Reading Purpose Only Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

## 7

# අවසානය

අපට දැනුම් දී තිබුණේ සාක්ෂිදීම සඳහා, බ්‍රහස්පතින්දාට උසාවියට එන ලෙසයි. බ්‍රහස්පතින්දා දිනය පැමිණියේය. අපේ සාක්ෂි විමසීමක් නොකෙරිණි. එයට හේතුවූයේ, මෙම නඩු විභාගය, ඉහළ උසාවියේ විනිශ්චයකාරතුමෙකු විසින් භාරගෙන තිබීමයි. ජෙෆර්සන් හෝප්ට එරෙහි නඩුවේ, යුක්තිය නිසිලෙස පසිඳලීම සඳහා, ඔහු විනිශ්චයකාරවරුන්ගෙන් සැදුම් ලත් මණ්ඩලයක් ඉදිරියට පැමිණවීමට තීරණය කෙරිණි.

කෙසේ වෙතත් පසුදා උදයේ ජෙෆර්සන් හෝප් ඔහුගේ සිරමැදිරියේ බිම වැතිර සිටිනු දක්නට ලැබිණි. ඔහුගේ මුහුණේ වූයේ ශාන්ත සිනහවකි. මහා ධමනියේ වූ ඇනියුරිස්මය පුපුරායාමෙන් ඔහු මරණයට පත්ව සිටියේය!

"මේ මරණය ගැන ලෙස්ට්‍රේඩ්ටයි ග්‍රෙග්සන්ටයි හරියට කේන්ති යාවි."

හෝම්ස් කීවේ පසුදා සැඳෑවේ අප කතාබහේ යෙදී සිටියදීයි. "ඇයි ඉතින් සිරකරුවා අල්ලා ගැනීම, ඒ ගොල්ලන්ගේ හපන්කමක් කියලා පුවත්පත්වලින් මහා ප්‍රචාරයක් ලැබෙන්නේ, නඩුව විභාගයට ගැනුණා නම් නේ."

"ඒ වුණාට ඔහු අල්ලා ගැනීමට ඒ දෙන්නාගෙන් මහ ලොකු ප්‍රයෝජනයක් වුණා කියල මං හිතන්නේ නෑ." මම කීවෙමි.

"ඒ අංශයෙන් මේ ලෝකයේ ඔබට කරන්න පුළුවන් වැඩ කොටස බොහොම සුළුයි මිත්‍රයා." හෝම්ස් කීවේ කලකිරීමෙනි. "වඩාත්ම වැදගත් වන්නේ, ඔබට මොකුත් කරගන්න බැරිවුණත්,

http://sherlockholmesinvestigations.blogspot.com

ඔබ මේ මේ දේවල් කළා කියලා මිනිස්සුන්ට ඒත්තු ගන්වන්න තියෙන හැකියාවයි. ඒකට තුමක් නෑ. මං මෙතෙක් කළ පරීක්ෂණ වල මේ තරම් සිත්ගන්නාසුලු එකක් ලැබුණු බවට මතකයක් නෑ. බොහොම සරල පරීක්ෂණයක්. නමුත් හරිම වැදගත් කාරණා කිහිපයක් තිබුණා."

"සරල?" මට එසවරම ඇසිණි.

"ඇත්තෙන්ම ඒක සරල ගැටලුවක් කියනවා මිස, සංකීර්ණ එකක් කියන්න අමාරුයි." ෂර්ලොක් හෝම්ස් කීවේ මා පුදුමයට පත්වීම ගැන සිනාසෙමිනි. "ඒක කොයිතරම් සරල ගැටලුවක්ද කියන එක ඔප්පු වෙනවා මෙන්න මේ කාරණාවෙන්. මං ප්‍රයෝජනයට ගත්තේ බොහොම සාමාන්‍ය නිරීක්ෂණ කිහිපයක්. ඒවා උපයෝගී කරගෙන නිගමන කිහිපයකට පැමිණියා. ඊළඟට ඒ නිගමනවල උදව්වෙන්, බාහිර උදව්වක් නැතුව, ගැටලුව මං විසඳුවා. දින තුනක් ඇතුළත අපරාධකාරයාවත් අත්අඩංගුවට ගත්තා."

"ඒක ඇත්තයි." මම කීවෙමි.

"මං මෙන්න මේ දේ ගැන ඔබට කලිනුත් කිව්වා. අපට ලැබෙන යම් හෝඩුවාවක් අසාමාන්‍ය යයි කියමුකෝ. ඒක අපේ පරීක්ෂණයේ ඉදිරියට යෑමට බාධාවක් නොමෙයි. ඒක අපට මහ පහසු කිරීමක්."

මෙවැනි ගැටලුවක් විසඳන්න යොදාගත යුතු ක්‍රමය මං ඔබට කියන්නම්. මෙන්න මෙහෙමයි. අප පටන්ගන්න ඕන අවසන් සිදුවීමෙන්. ඊළඟට කරුණු ඉදිරිපත් කරමින් අපි ආපස්සට යා යුතුයි. ඒක බොහොම කාර්යක්ෂම ක්‍රමයක්. ඒ වගේම පහසුයි. ඒ වුණාට හුඟ දෙනෙක් ඒ ක්‍රමය යොදාගන්නේ නෑ. හේතුව මේකයි. එදිනෙදා ජීවිතයේ කටයුතු වලදී, අපි තර්කානුකූලව ගමන් කරන්නේ ඉදිරියට. ඒ නිසා ආපසු ගමන් කිරීමේ ක්‍රමය අපට අමතක වෙලා යනවා. දොස්තර මහත්තයා, කරුණු සංශ්ලේෂණය මගින් ගැටලුවක් විසඳන්න පුළුවන් අය පනස්දෙනෙක් ඉන්නවා නම්, කරුණු විශ්ලේෂණය මගින් විසඳන අය ඉන්නේ එක්කෙනයි."

"ඔබ කියන කිසි දෙයක් මට තේරුම් ගන්න බෑ." මම කීවෙමි.

"මං දනගන්නා ඔබට මේක තේරුම් ගන්න අමාරුවෙන බව. කෝ බලන්න මේක ඔබට ලිහිල්ව තේරුම් කර දෙන්න පුළුවන්ද කියලා."

http://sherlockholmesinvestigations.blogspot.com

මෙහෙම හිතමු. එකිනෙකට සම්බන්ධ යම්කිසි සිදුවීම් ගණනාවක් සිදුවීගෙන යන ආකාරය හෙළිවෙනවා. එතකොට එයින් ඇතිවන අවසාන ප්‍රතිඵලය මොකක්ද කියන එක බොහොම දෙනෙකුට කියන්න පුළුවනි. ඔවුන් ඒ සිදුවීම් සියල්ල ඔවුන්ගේ මනසට ඇතුළ්කරනවා. ඒවා තර්ක විතර්කවලට ලක් කරනවා. එතකොට ඔවුන්ට පුළුවන් අවසන් නිගමනයකට එන්න. එහෙම නේද? නමුත් ඔබ දන්නවාද, අතලොස්සක් අය ඉන්නවා. ඔබ දෙන්න ඔවුනට අවසන් ප්‍රතිඵලයක්. ඔවුන් ඒකෙ ආපස්සට ගිහිං, තර්කානුකූලව හිතලා ඔබට කියාවි, ඒ මේ පියවරෙන් පියවර සිදුවුණු ආකාරය. අන්න ඒකට තමා මං කිව්වෙ විශ්ලේෂණාත්මකව විසඳීම කියලා."

"දැන් මට තේරෙනවා."

"මේ පරීක්ෂණයත් ඒ වගේ එකක් කියන්න පුළුවනි. ඔබට දීලා තියෙනවා අවසන් ප්‍රතිඵලය. එතකොට ඔබේ මනසින් ඔබ හැමදෙයක්ම සොයාගන්න ඕන. මං කරුණු ගොනු කළ ආකාරයේ විවිධ පියවර මං ඔබට පෙන්වා දෙන්නම්."

අපි මුලින්ම පටන්ගමු. අපි බ්‍රික්ස්ටන් පාරේ අර ගෙදරට ගියේ පයින්. එක එක්කෙනාගේ අදහස්, යෝජනා, සිතුම් පැතුම් කිසිවක් මගේ ඔලුවේ තිබුණේ නැහැ. මං මුලින්ම පරීක්ෂා කරගෙන ගියේ නිවස වෙත වැටී තිබුණු පාර. අශ්වකරත්තයක් එහි පැමිණි ලකුණු මා දුටුවා. ඒක පෞද්ගලික එකක් නෙමෙයි, කුලීරියක්. ඒ මොකද රෝද වල පළල අඩුයි. පෞද්ගලික රථවල රෝද පළලින් වැඩියි.

ඊළඟට මං ගෙවත්තේ ඉදිරියට ඇවිදගෙන ගියා. එහි පොළොව මැටි සහිත පොළොවක්. ලාංඡන ඉතා හොඳට සලකුණු වෙනවා. සැකයක් නෑ. ඔබට නම් ඒ තැන පෙනෙන්න ඇත්තේ, මහ ගොඩක් අයට පෑගිලා, මඩ ඇවිස්සුණු මඩ ගොහොරුවක් හැටියටයි. නමුත් හොඳින් පුහුණු කළ මගේ ඇස් වලට ඒ හැම ලකුණකින්ම යමක් දැනගන්න ලැබුණා. අපරාධ පරීක්ෂණ විද්‍යාවේ එක් ප්‍රධාන, වැදගත් අංශයක් නොසලකා හැරලයි තියෙන්නේ. ඒ තමයි අඩි සටහන් පිළිබඳ අධ්‍යයනය.

වාසනාවකට වගේ මං හැමදාමත් අඩිසටහන් ගැන විශේෂ අවධානයක් යොමු කරනවා. මං ඒ ගැන කොයිතරම් පළපුරුද්දක්

http://sherlockholmesinvestigations.blogspot.com

ලබල තියෙනවද කිව්වොත්, අඩි සටහන් දුටු වහාම කාරණා රාශියක් මගේ හිතේ පහළ වෙන්නේ ඉබේටම, උත්සාහයක් නැතුව. පොලිස් භටයන්ගේ බූට්ස් සපත්තු අඩි මං දුටුවා. නමුත් ඒවාට කලින් මේ ගෙවත්තට ආ මහත්වරු දෙදෙනෙකුගේ අඩි සටහන් මම නිරීක්ෂණය කළා. ඔවුන් කලින් ආ බව කියන්න හරි පහසුයි. ඒ මොකද ඒවා, පොලිස් භටයන්ගේ අඩිසටහන් වලින් පොඩිවී, මැකී ගොස් තිබුණා. ඔන්න ඔතනකොට තමයි මගේ දම්වැලේ දෙවැනි පුරුක හැදුණේ.

රාත්‍රියේ පැමිණි අමුත්තන් ගණන දෙකයි. එක්කෙනෙක් බොහොම උස කෙනෙක්-එක් පියවරක දිග මැනීමෙන් මං ඒක හොයාගත්තා. අනෙක් තැනැත්තා බොහොම අලංකාරව ජේන්තුවට අඳින පළඳින කෙනෙක්. ඒ පා සලකුණු කුඩායි: වැදිල තිබුණේ හොඳ වර්ගයේ බූට් සපත්තු කුට්ටමකින්.

ගෙදරට ඇතුළුවුණාම මම අන්තිමට කළ නිගමනය නිවැරදි බව ඔප්පුවුණා. හොඳ වර්ගයේ බූට්ස් පැළැඳි මිනිහා මං ඉදිරියේ බිම. එහෙනම් මේ මිනීමැරුම කරල තියෙන්නේ උසින් වැඩි පුද්ගලයා, ඒක මිනීමැරුමක් නම්. මළසිරුරේ කිසිම තුවාලයක් තිබුණේ නැහැ. නමුත් එහි මුහුණෙන් ප්‍රකාශවුණු හැඟීම්වලින් මා දැනගත්තා එක් කාරුණක්. ඒ තමයි තමන්ට අත්වන ඉරණම ගැන මියගිය තැනැත්තා දැන සිටි බව.

හෘදයාබාධයකින් හෝ වෙනත් යම්කිසි ස්වාභාවික හේතුවක් නිසා ක්ෂණිකව මරණයට පත්වෙන අයෙකුගේ මුහුණේ, මේ වගේ භීතියට පත් ලක්ෂණ දකින්න ලැබෙන්නේ නෑ. මළසිරුරේ දෙතොල් ප්‍රදේශය මං ආඝ්‍රාණය කර බැලුවා. මට දැනුණේ යන්තම් "ඇඹුල් වුණු" ගඳක්. ඒකෙන් මට තේරුම් ගියා මේ පුද්ගලයාට බලෙන් වසදීමෙන් මරණය සිදුවී ඇති බව. ඊළඟට මගේ සිතට නැඟුණු ප්‍රශ්නය, මේ පුද්ගලයාට බලෙන් වස දුන්නේ ඇයි? එහෙනම් දෙන්න ඇත්තේ ඔහු සමග තිබූ කිසියම් වෛරයක් නිසා. මළසිරුරරේ මුහුණේ ප්‍රකාශවුණු භීතියෙන් ඒ බව තහවුරු වුණා.

මං මේ නිගමනයට පැමිණියේ බැහැරකිරීමේ න්‍යාය මත, වෙන නොයෙක් නොයෙක් ආකාර වල උපකල්පන වලට ඇවිත් ඉදිරියට යන්න පුළුවනි! නමුත් මේ දකින්න තිබෙන සිදුවීම් හා සාධක සමග ගළපද්දී, ඒ හැම උපකල්පනයක්ම බිඳවැටෙනවා.

http://sherlockholmesinvestigations.blogspot.com

Feeding Purpose Only, Not For Print

අපි ටිකෙන් ටික ඉදිරියට යද්දී, අරූ නොගැළපෙන සෑම උපකල්පනයක්ම බැහැර වෙනවා. එතකොට ඉතිරි වෙන්නේ මේක විතරයි. ඒක තමයි බැහැර කිරීමේ න්‍යාය.

මේ බලෙන් විෂ පෙවීම, කියීකුලෙක අහල නැති පුදුමාකාර ක්‍රමයක් කියල හිතන්න එපා. මේක අපරාධ ඉතිහාසයට අලුත්දෙයක් නෙමෙයි. ඔඩෙස්සාවෙ ඩොල්ස්කි මිනීමැරුම, මොන්ට් පෙලියර් ලෙටූරියර් සිද්ධිය, විෂ විද්‍යාඥයෝකුගේ මතකයට නිතැතින්ම එන හොඳ උදාහරණ දෙකක්.

ඊළඟට මතුවෙන ප්‍රධානතම ප්‍රශ්නය තමා, ඇයි මෙහෙම දෙයක් කළේ? මේක මුදල් හෝ වටිනා දෙයක් පැහැර ගැනීමට කළ දෙයක් නොවන බව පැහැදිලියි. ඒ මොකද අපරාධකාරයා කිසිවක් හොරකම් කරගෙන නොතිබුණු නිසා. එහෙනම් මේක දේශපාලන කටයුත්තක්ද නැත්නම් කාන්තාවක්ද? ඒක තමයි මට මතුවුණු ප්‍රශ්නය. පළමුවැනි එකට වඩා මගේ හිත ගියේ දෙවැනි එකටයි. දේශපාලන මිනීමැරුම් කරන අය බොහොම කැමතියි, ඒ කටයුත්ත වහාම නිම කරලා එතනින් පළා යන්න. මේක එහෙම එකක් නොවන බව ඔප්පු වුණා. මිනීමරුවා එය කර තිබෙන්නේ බොහොම හෙමින් හෙමින්. ඔහු කාමරය පුරා ඇවිද ගිය අඩිපාරවල් තිබුණා. මේක කරන සම්පූර්ණ කාලයම, ඔහු එතැන රැඳී ඉඳල තියෙනවා. ඇයි ඔහු එතරම් වේලාවක් එතැන රැඳුණේ? ඇයි ඔහු පළිගැනීමට කළ මිනීමැරුමක්, කාලය ගත කරලා බොහොම හෙමින් ක්‍රමානුකූලව සිදුකළේ. ඒ මොකද, ඒක ඔහුට පෞද්ගලිකව සිදුවුණු අසාධාරණයක්. දේශපාලන එකක් නොවෙයි.

බිත්තියේ ලියැවුණු දේ දුටුවාම මං හිතූ දේ තවත් ස්ථාපිත වුණා. නමුත් ඔහු මෙවැනි දෙයක් ලිව්වේ පොලීසිය නොමග යවන්න බව තේරුම් ගත හැකිවුණා. මඟුල් මුද්ද හමුවුණාම, ගැටලුව ගැන හිතේ තිබුණු සැක ඉවත්වෙලා ගියා. මිනීමරුවා මේ මුද්ද පාවිච්චි කරන්න ඇත්තේ මොකකටද? ඒ මියගිය හෝ එහි නොසිටි ගැහැනියක ගැන ඩ්‍රෙබර්ට මතක් කර දෙන්න බව පැහැදිලියි. ඔන්න ඔය වේලාවේ තමයි මං ග්‍රෙග්සන්ට ප්‍රශ්නයක් ඉදිරිපත් කළේ. ඩ්‍රෙබර් ගැන අහල ක්ලීව්ලන්ඩ්වලට යැවූ විදුලිපුවතේ, ඔහු කලින් කළ රැකියාව ගැන විමසුවාද කියා, ග්‍රෙග්සන්ගෙන් ඇහුවාම ඔහු එය නොකළ බව කීවා.

http://sherlockholmesinvestigations.blogspot.com

ඊළඟට මං කාමරය තිබුණු සෝදිසියකට ලක් කළා. මිනීමරුවාගේ උස ගැන මං කර තිබූ නිගමනය නිවැරදි බව එතැනදී ඔප්පු වුණා. ඊට අමතරව ඔහුගේ නියපොතු, ඔහු දුම්බීමේදී යොදා ගත් ට්‍රිචිනෝපොලි සුරුට්ටුව ගැන මං සඳහන් කළා ඔබට මතක ඇති. පොර බැදීමක ලකුණුවත්, මියගිය තැනැත්තාට තුවාල සිදුකළ ලකුණුවත් අපට දකින්න ලැබුණේ නැහැ. ඒ නිසා කාමරයේ බිම තිබූ ලේ, මිනීමරුවාගේ සිරුරෙන් ගැලූ ඒවා විය යුතුයයි, මං නිගමනය කළා. කොහොන්ද මේ විධියට ලේ ගලන්න පුළුවන්? යමෙකුගේ සිතේ ඇතිවෙන දැඩි ආවේගයක් නිසා, නාසය වැනි සියුම් කේශනාලිකා තිබෙන තැනක, ඒවා පුපුරා ලේ ගලන්න පුළුවනි. ඒ නිසා ඒ මිනීමරුවාගේ ලේ යයි අනුමාන කළ හැකි වුණා. ඒක සනාථ කරවන තවත් දෙයක් මා දුටුවා. ලේ බින්දු බිම වැටී තිබුණේ, රළු අඩියක් සහිත සපත්තු පැළඳ සිටි තැනැත්තා ඉහළ පහළ ගමන් කළ ආකාරයට අනුරූපවයි. සෑහෙන තරම් තරබාරු, හැඩිදැඩි කෙනෙක් නොමෙයි නම්, ආවේගශීලී මොහොතක මේතරම් නහර පුපුරලා ලේ පිටවෙන්නේ නෑ. ඒ නිසයි මං කිව්වේ ඔහු රතු පැහැති මුහුණක් ඇති කෙනෙක් කියලා. මගේ ඒ නිගමනය හරි බව පසුව ඔප්පු වුණා.

ඒ ගෙදරින් පිටවෙලා යද්දී මං ශීයේ ග්‍රෙග්සන් නොසලකා හැරදමූ වැඩේට. මමත් යැවුවා විදුලි පුවතක්, ක්ලීව්ලන්ඩ්හි පොලිස් ප්‍රධානියාට. මං ඔහුගෙන් අහල යැවූ දේ එක් කාරණාවකට සීමා කළා. ඒ තමයි එනොක් ජේ. ඩ්‍රෙබර්ගේ විවාහය. පිළිතුරක් ලැබුණා. ඒකෙන් බොහොම පැහැදිලි ලෙසට අපට අවසන් නිරීක්ෂණයකට එන්න පුළුවන්. ඒ මොකක්ද? ඩ්‍රෙබර් ක්ලීව්ලන්ඩ්හි පොලීසියට පැමිණිලි කරලා තියෙනවා, ඔහුගේ ජීවිතයට තර්ජන ඇති බව කියා. ඔහු පොලිස් ආරක්ෂාව ඉල්ලා තිබෙනවා. ආදරයක් සම්බන්ධ ප්‍රශ්නයක් නිසා, ජේෆර්සන් හෝප් නම් තමන්ගේ පරණ සතුරෙකුගෙන් මරණ තර්ජන ඇති බව, ඔහු පොලීසියට දනුම් දුන්නාලු. මේ හෝප් දන් යුරෝපයට පැමිණ ඇති බව විදුලිපුවතේ සඳහන් වුණා. ඔන්න දන් මට තේරුණා, මේ මහා අභිරහසට විසඳීම මා ළඟ ඇති බව. තව ඉතිරි වෙලා තිබුණේ මිනීමරුවා අත්අඩංගුවට ගැනීම පමණයි.

http://sherlockholmesinvestigations.blogspot.com

මං දැන් මේ වෙනකොටත් තීරණය කර අවසන්, ඩ්‍රෙබර් සමඟ ගෙට ඇතුළුවුණේ කුලීරිය පදවාගෙන ආ තැනැත්තායි කියලා. අශ්වරිය නවත්වා තිබුණු තැන පරීක්ෂා කළාම, මට ඒ කරුණු පැහැදිලි වුණා. රිය නවත්වලා තිබුණු වෙලාවේ, අශ්වයා ඒ මේ අතට ඇදී ගිහින් තිබුණා. අශ්වකරත්තය ඇතුළේ රියදුරා රැඳී සිටියා නම් මෙහෙම දෙයක් සිදුවෙන්න විධියක් නෑ. එහෙනම් මේක පදවාගෙන ආ රියැදුරා කෝ? ඔහු යන්න ඇත්තේ ගේ ඇතුළට මිසක් වෙන කොහේද?

හිතාමතා මිනීමැරුමක් කරන්න සැලසුම් කරන බුද්ධිමත් මිනිහෙක්, තුන්වැන්නෙකුට එය දකින්න ලැබෙන විධියට එහෙම කෙනෙක් කැඳවාගෙන ඒවිද? එහෙම හිතුවොත් ඒක මෝඩ සිතිවිල්ලක්. මේ තුන්වැන්නා කවදා හරි තමාට එරෙහිව සාක්ෂිදෙන්න ඉඩ තියෙනවා. තවත් කාරණයක්, තමන්ගේ සතුරෙකු යන එන තැන් හොයාගන්න, ඔහුට හොරෙන් ඉවකුරමින් යන්න කෙනෙකුට උවමනා නම්, කුලීරථ රියදුරෙක් වෙනවා හැරෙන්න ඊට වඩා හොඳ රැකියාවක් තියෙනවද? මේ හැම කරුණකින්ම මං තේරුම් ගත්තේ, ජෙෆර්සන් හෝප් සිටිය යුත්තේ ලන්ඩනයේ කුලීරථ රියදුරන් අතරයි කියලා.

ඔහු කළේ ඒ රක්ෂාව නම්, දැන් ඔහු ඒක අත්හැර දමල වෙන්න කිසිම හේතුවක් නෑ. ඊළඟට ඔහුගේ පැත්තෙන් බලන කොට එක්වරම රැකියාව අත්හැර දමල ගියොත් ඔහු ගැන සැකකරන්නත් ඉඩ තියෙනවා. අඩුම ගණනේ කෙටි කාලයකටවත් ඔහු මේ රැකියාවේ යෙදෙන්න ඉඩ තියෙනවා. ඊළඟට ඔහු ලන්ඩනයට ආවට පස්සේ, නම වෙනස් කරගෙන රැකියාවක යෙදුණා කියල හිතන්න අමාරුයි. මේක ඔහුගේ රට නොවෙයි. ඔහුගේ මුල් නමෙන් පවා කිසිවෙකු ඔහු හඳුනා ගන්නේ නැති නිසා, ඒක වෙනස් කරන්න උවමනාවක් නෑ. ඉතින් මං බේකර් වීථියේ කොලු රැළ සංවිධානය කළා, මේ ගැන හොයලා බලන්න. මං ඔවුනට කිව්වේ ලන්ඩන් නුවර පදවන කුලීරථ හිමියන්ගේ සංගමයට ගිහින්, මා කියන නම ඇති පුද්ගලයෙකු ගැන හොයා බලන්න.

ස්ටැන්ගසන් මරාදැමීම මං කලින් බලාපොරොත්තු වුණු දෙයක් නොමෙයි. කොහොම වුණත් ඒ මිනීමැරුමත් කොටවත් කිසි ලෙසකින් වළක්වන්න පුළුවන් එකක් නොමෙයි. විෂ බෙහෙත් අඩංගු

http://sherlockholmesinvestigations.blogspot.com

පෙතිවර්ගය ගැන මං අනුමාන කරල තිබුණා. ස්ටැන්ගසන්ගේ මරණයෙන් අපට ඒක හමුවුණා. ඔබට පෙනෙනවා නේද, මේ හැම කුඩා සිදුවීමක්ම එකිනෙකට සම්බන්ධයි. එකින් එක කොහේවත් පළුදු වීමක්, බිඳීයාමක් නෑ."

"ඉතාම විශිෂ්ටයි." මම කීවෙමි. "ඔබේ ඇති මේ සුවිශේෂ කුසලතාවය අප ප්‍රසිද්ධියට පත්කළ යුතුයි. ඔබ මේ අපරාධය පරීක්ෂා කර, එය විසඳූ ආකාරය ගැන විස්තරයක් පුවත්පත්වල පළ කළ යුතුයි. ඔබ ඒක නොකළොත් මං කරන්නම්."

"දොස්තර මහත්මයා. ඔබට කැමති දෙයක් කරන්න පුළුවනි. මගේ විරුද්ධත්වයක් නෑ." ඔහු කීවේ මා දෙසට පුවත්පතක් දිගුකරමිනි. "ඒ වුණත් මේකත් කියවලා බලන්න."

ඒ එදින උදේ පළවූ 'එකෝ' පුවත්පතය. ඔහු මගේ අවධානය යොමුකළේ එහි පළවූ පුවෘත්තියක් වෙතටයි.

"......එනොක් ඩ්‍රෙබර් හා ජෝසප් ස්ටැන්ගසන් මරාදැමීම ගැන චෝදනා ලබා සිටි හෝප් නම් මිනිසාගේ හදිසි මරණය නිසා, සිත් ඇදගන්නාසුලු නඩු විභාගයකට සවන්දීමට මහජනයාට තිබූ අවස්ථාව අහිමිවිය. මේ අභිරහස් සිද්ධිය පත්ලේ ඇති තොරතුරු අපට කිසිදාක දැනගන්නට නොලැබෙනු නොඅනුමානයි. කෙසේ වෙතත් මේ සිද්ධියට පාදක වූයේ, ප්‍රේමය හා මෝමොන් ආගම මුල්කරගත් දීර්ඝකාලීන වෛරයක් බව අපට විශ්වාස කටයුතු මාර්ගයකින් දැනගන්නට ලැබිණ. මැරුම් කෑ පුද්ගලයින් දෙදෙනාම තරුණ කාලයේ මෑත යුගයේ ශාන්තුවරයන්ගේ ආගම ඇදහූ බවත්, සැකකාර හෝප් ද සෝල්ට් ලේක් නගරයේ වැසියෙකු බවත් හෙළිවිය.

මෙම නඩුව විභාගයට නොගැනීම නිසා අනෙක් සියල්ල අහිමි වූ බව සැබෑය. එහෙත් අපේ පොලීසියේ අපරාධ පරීක්ෂණ අංශයේ නිලධාරීන්ගේ, බුද්ධි මහිමය හා දක්ෂතාවය ඔප්පු කිරීමට, මේ පරීක්ෂණය උදව් වෙයි. තම තමන්ගේ පෞද්ගලික ආරවුල්, තම රටවලදීම විසඳාගෙන මිස, බ්‍රිතාන්‍යයට පා නොතැබිය යුතු බවට, මෙය විදේශිකයනට කදිම පාඩමකි. අපරාධකරුවා ඉතා සූක්ෂම ලෙස කොටුකර ගැනීම පිළිබඳව, සියලුම ගෞරවය හිමිවන්නේ, ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියේ සුප්‍රසිද්ධ අපරාධ පරීක්ෂක ටෝබියස් ග්‍රෙග්සන්ට හා ජී.ලෙස්ට්‍රේඩ් දෙදෙනාට බව ප්‍රසිද්ධ රහසකි.

http://sherlockholmesinvestigations.blogspot.com

අපරාධකරුවා අල්ලා ගන්නා ලද්දේ ෂර්ලොක් හෝම්ස් නම් මහතෙකුගේ කාමරයේදීය. ආධුනික රහස් පරීක්ෂකයෙකු වන මුහුද යම් කුසලතා ඇත්තෙක් බව සැලයි. පොලීසියේ ප්‍රවීණ අපරාධ පරීක්ෂකයින්ගේ උපදෙස් හා පුහුණුව ලබාගතහොත්, කල්යාමේ දී මේ ෂර්ලොක් හෝම්ස්ටද තම දක්ෂතාවය දියුණුකර ගැනීමට හැකිවනු ඇත. පොලිස් නිලධරයන් දෙදෙනා දක්වූ හපන්කමට, ඔවුන්ගේ සේවය අගය කරමින්, රජය මඟින් ඔවුන් වෙත දක්ෂතා සම්මාන සහතික ප්‍රදානය කරනු ඇතැයි, මහජනයා බලාපොරොත්තු වේ.

"මං ඔබට පටන් ගන්නකොටම කිව්ව නේද දොස්තර මහත්තය." ෂර්ලොක් හෝම්ස් කීවේ මන්දහාසින් සිනාසෙමිනි. "අපි මේ ලෝහිත පරීක්ෂණයක් කෙදිල ලැබුණු ප්‍රතිඵලය තමයි, ඒ දෙන්නට දක්ෂතා සම්මාන සහතික ප්‍රදානය."

"ඒව ගණන් ගන්න එපා." මම කීවෙමි.

"ඔබ මේ අපරාධ පරීක්ෂණය මෙහෙයවලා හැම දෙයක්ම හෙළි කරගත්තු හැටි, මගේ වාර්තා පොතේ මං සඳහන් කරනවා. ඒක කියෙව්වාම මහජනයා දැනගනීවි, ඇත්ත මොකක්ද කියලා. ඒ අතරේ ඔබට සෑහීමට පත්වෙන්න පුළුවන්, මේ පරීක්ෂණය සාර්ථකව විසඳීමෙන් ලැබෙන තෘප්තියෙන්."

ලෝහිත පරීක්ෂණය සමාප්තයි.

http://sherlockholmesinvestigations.blogspot.com

# සොහොයුරන් දෙදෙනා

Reading Purpose Only.. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com

# සොහොයුරන් දෙදෙනා

මගේ විවාහයෙන් ටික කලකට පසු, පැඩිංටන් පෙදෙසේ පවත්වාගෙන ගිය වෛද්‍ය චිකිත්සාගාරයක් මිලයට ගැනීමට මම තීරණය කලෙමි. එහි මුල් අයිතිකරු වූයේ දොස්තර පර්කාර් නම් වයස්ගත වෛද්‍යවරයෙකි. කලකට පෙර බොහෝ ජනප්‍රිය තැනැත්තෙකු වූ ඔහුගෙන් ප්‍රතිකාර ගැනීමට, එකල රෝගීන් වැළ නොකැඩී පැමිණි බව මට අසන්නට ලැබිණි. නමුත් ඔහු වයස්ගතවීම නිසාත් "සෙන්ට් විටසස් ඩාන්ස්" නම් සුළු ආබාධයෙන් පෙළෙන්නට වීම නිසාත්, චිකිත්සාගාරයේ වැඩ කටයුතු පිරිහෙන්නට පටන්ගත්තේය. "තමන්ගේ අසනීපය සුව කරගන්නට බැරි වෙදා, අනෙක් අයට ප්‍රතිකාර කරන්නේ කොහොමද?" යන අදහස, මහජනයාගේ හිතේ මුල්බැසගත් එකකි. මුලදී අවුරුද්දට පවුම් 1200 ක්ව තිබූ ආදායම, මා මිලට ගනිද්දී අවුරුද්දට පවුම් 300 දක්වා පහත බැස තිබිණි. කෙසේවෙතත්, තාරුණ්‍යයේ ශක්තියෙන්, මේ වෙදකම යළිත් මුල් තත්ත්වයට ගොඩ නගා ගත හැකිවේවි යයි, මගේ සිතේ විශ්වාසයක් විය.

යළි වෙදකම අරඹා තුන් මසක් යනතුරු, රෝගීන් ගැන දැඩි උනන්දුවකින්, ඔවුනගේ ප්‍රතිකාර වෙනුවෙන් මගේ මුළු කාලයම කැප කලෙමි. එහෙයින් මගේ හිතවත් මිත්‍ර ෂර්ලොක් හෝම්ස් දකිමට බේකර් වීථියට යාමටවත් මට විවේකයක් නොවීය. මා නිවසෙන් බැහැර ගියා නම්, හැමවිටම එහෙ ඒ රෝගියකු බැලීම සඳහායි.

ජූනි මාසයේ එක් උදෑසනක, මම ශල්‍යාගාරයට වී බ්‍රිතාන්‍ය වෛද්‍ය සඟරාව කියවමින් සිටියෙමි. අපේ නිවසේ සීනුව නාද කරනු මට අසන්නට ලැබිණි. මීළඟට එක්වරම ඇසුණු කටහඬෙන් මම ඉමහත් පුදුමයට පත්වීමි. කුමක් නිසාද යත්, ඒ මගේ හිතවත්ම මිත්‍රයාගේ කටහඬ නිසයි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මගේ හිතවත් වොට්සන්, කලකට පස්සේ ඔබ දකින්න ලැබීම ගැන මට හරිම සන්තෝෂයි." ඔහු කීවේ කාමරය තුළට පිවිසෙමිනි. හෝම්ස් මිනිත්තුවක් දෙකක් නිශ්ශබ්දවම මා දෙස බලා සිටියේය. "ඉතින් කොහොමද? සිව්රහස් සලකුණ සිද්ධියේදී අපට මුහුණ දෙන්න වුණු ත්‍රාසජනක සිදුවීම්වලින්, ඔබේ බිරිඳ හරියට හිත කලබල කරගෙන හිටියා නොවැ. දැන් ඇය ඒවා අමතක කරලා, හිත සන්සුන් කරගෙන ඇති කියල මං විශ්වාස කරනවා."

"අපි දෙන්නාම සනීපෙන් ඉන්නවා."

ඔහුගේ සුරත ගෙන, උණුසුම් අයුරින් ඔහු පිළිගනිමින් පැවසීමි.

"මතකද වොට්සන්, ඒ දවස්වල අප නිරීක්ෂණ හා නිගමන මගින් කළ ගැටලු විසඳීම්? ඒවා ගැනත් ඉස්සර වගේම ඔබ තවමත් උනන්දුයි ද? මං හිතනවා, රෝගීන්ට වෙදකම් කිරීමේ කටයුතු නිසා, ඒ ආශාව සම්පූර්ණයෙන්ම යටපත් වෙලා නැතුව ඇති කියලා?" ඔහු කීවේ ශල්‍යාගාරයේ වූ පැද්දෙන පුටුවේ හිඳ ගනිමිනි.

"සිද්ධවෙලා තියෙන්නේ ඒකෙ අනික් පැත්ත" මම කීවෙමි. "අපි ඒ කාලෙ යෙදුණු පරීක්ෂණවල සටහන්, මං ඊයෙ රෑත් කියවමිනුයි හිටියෙ. එයින් ප්‍රතිඵල ලැබුණු පරීක්ෂණ සමහරක්, මං වර්ගීකරණය කළා."

"එහෙනම් ඔබ මේ පරීක්ෂණ සටහන් එකතු කිරීම සම්පූර්ණයෙන්ම අත්හැර දමලා නැහැ?" හෝම්ස් ඇසීය.

"කොහොමටවත් නැහැ. තවත් ඒ වගේ පරීක්ෂණවලට සහභාගිවෙලා, එවැනි අත්දැකීම් ලබාගන්න හැකිනම් මට ඊට වඩා සතුටක් නැහැ."

"හොඳයි. එහෙම වැඩකට යෙදෙන්න ඔබට අදම අවස්ථාවක් ලැබුණොත්?"

"මම ලෑස්තියි අද වුණත්."

"හැබැට? නමුත් හුඟක් දුර යන්න වෙනවා. බර්මිංහැම් දක්වා යන්න සිදුවුණොත් හෙම?"

"සත්තකින්ම මං එනවා."

Reading Purpose Only Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com



181. "හ හා ! ඒ ප්‍රශ්නයත් පහසුවෙන් විසඳෙනවා නම්....."

http://sherlockholmesinvestigations.blogspot.com

"එතකොට ඔබෙන් බෙහෙත් ගන්න එන ලෙඩුන් ගැන බලන්නෙ කවුද?"

"මගේ අල්ලපු ගෙදර ඉන්නෙත් පෞද්ගලික වෛද්‍යවරයෙක්. ඔහු නිවාඩුවක් ගත්තාම මං තමයි ඒ රෝගීන්ට ප්‍රතිකාර කරන්නේ. ඉතින් ඒ වෙනුවෙන්, මට ඕනෙම වෙලාවක උදව් කරන්න ඔහු සූදානම්."

"හ හා! ඒ ප්‍රශ්නයත් පහසුවෙන්ම විසඳෙනවා නම් වෙන මොකුත් ඕනෙ නැහැ" හෝම්ස් සතුටෙන් කීවේ පුටුවේ පිටුපසට හේත්තුවෙමිනි. මීළඟට ඔහු අඩවන් දෑසින් මඳ වේලාවක් මා දෙස බලා සිටියේය.

"වොට්සන්, ළඟකදී ඔබ ටිකක් අසනීපයෙන් ඉඳලා තියෙන බව මට කියන්න පුළුවනි. මේ ග්‍රීෂ්ම සෘතුවේ උණ-හෙම්බිරිස්සාවක් හැදුණාම හරියට අමාරුවෙනවා. එහෙම නේද?"

"ඔව්. ගිය සතියේ උණ ගැනිලා දවස් තුනක්ම මට ගේ ඇතුළට වෙලාම ඉන්න සිදුවුණා. ඒත් මං හිතාගෙන හිටියේ රෝගීවීමේ ලක්ෂණ හැම එකක්ම මගේ සිරුරෙන් දැන් ඉවත්වෙලා ගිහිං කියලයි...."

".... ඇත්තෙන්ම ඔව්. ඔබේ තියෙන්නෙ දැන්, සැහෙන්න නිරෝගී පෙනුමක්."

"එහෙනම් මගේ අසනීපෙ ගැන ඔබ දැනගත්තෙ කොහොමද?"

"මගේ හිතවත් මිත්‍රයා. ඔබ දන්නවානේ මං ඒ සඳහා යොදාගන්නා ක්‍රම?"

"යම්කිසි හෝඩුවාවක් මගින් ඔබ, තර්කානුකූලව නිගමනයකට එන්න ඇති?"

"සත්තකින්ම ඔව්."

"ඒ මොකකින්ද?"

"ඔබේ පයේ දමාගෙන ඉන්න සෙරෙප්පු කුට්ටමෙන්."

මගේ අලුත් සෙරෙප්පු කුට්ටම දෙස මගේ දෙනෙත් ඉබේම යොමුවිය.

"හරිම පුදුමයි. ඔබ කොහොමද......?"

".... ඔබේ සෙරෙප්පු කුට්ටම අලුත්. ඒක මිලදී ගෙන සති කිහිපයකට වඩා ගතවුණා වෙන්න බැහැ. සෙරෙප්පු අඩියේ

http://sherlockholmesinvestigations.blogspot.com

යටිපැත්ත, මට මේ මොහොතෙත් පෙනෙනවා. ඒවා යන්තමින් ගිනි රස්නෙන් දවී ගිහින්. මගේ සිතේ එක්වරම පහළවුණු සිතුවිල්ල මේකයි. ඒවා වැස්සට තෙමිලා, ගින්නෙන් වියළන්න උත්සාහ දරද්දී, උවමනාවට වඩා ගිනි රස්නය වැදෙන්න ඇති කියල. නමුත් ඔබේ කකුලේ යටිපතුල වදින, සෙරෙප්පුවේ ඇතුළු පැත්ත දිහා බලන්න. එහි අලවා තිබූ කුඩා කඩදාසි කැබැල්ලක් තවමත් එහෙමම තියෙනවා. කඩකාරයින්ගේ රහස් සංකේත එක්ක මෙවැනි කඩදාසි කැබලි ඕනෑම සෙරෙප්පු කුට්ටමක දකින්න පුළුවන්. නමුත් වැස්සට තෙමුණා නම් මේක ඉවත්වෙනවා. ඒකෙන් මට පැහැදිලිව තේරුම් ගන්න පුළුවන් එක් දෙයක්. ඔබ ඔබේ දෙපා ගිනි උදුනට බොහොම ළං කරගෙන ඉඳලා තියෙනවා. ඒකනුයි සෙරෙප්පු අඩිය යන්තමට දැවුණේ. මේ ජුනි මාසයේ වැස්ස තිබුණා වුණත්, හරි ග්‍රීෂ්මයකුත් තිබුණා. ඉතිං අසනීප වෙලා හිටියේ නැත්නම්, කෙනෙක් කීයටවත් දෙපතුල් ගිනි උදුනට ළං කරගෙන ගිනි තපින්නේ නෑ."

මීට පෙර අවස්ථාවලදී මෙන්ම මේ මොහොතේදීද, හෝම්ස් සියල්ල පහදා දුන් පසු, නිගමනයකට ඒම කොයිතරම් සරල ද යන්න, මට පැහැදිලි විය. මේ බව මගේ මුහුණෙන් පැවසෙන්නට ඇත. මගේ සිතේ ඇතිවූ හැඟීම් කියවූ හෝම්ස්ගෙන්, තරමක අසතුටක් පළවිය.

"මේ විදියට හැම දෙයක්ම තේරුම් කරලා දෙන එකෙන් මගේ අගය අඩුවෙනවා. මං කොහොමද දැනගත්තේ කියන එක නොකියා, ප්‍රතිඵලය පමණක් පෙන්නුවා නම් ඒක වඩාත් සිත්ගන්නාසුලුයි. එහෙනම් ඔබ මා එක්ක බර්මිංහැම් යන්න එනවාද වොට්සන්?"

"ඇත්තෙන්ම ඔව්. ඔබ යෙදෙන මේ පරීක්ෂණය මොකක්ද?"

"මං ඔබට ඒක දුම්රියේදි කියන්නම්. මගේ අනුග්‍රාහකයා ලොකු කුලීරියකට වෙලා එළියේ බලාගෙන ඉන්නවා. ඔබට පුළුවන්ද වහාම එන්න"

මං මිනිත්තුවෙන් එන්නම්" මම කීවෙමි.

මගේ අසල්වැසි වෛද්‍යවරයා වෙත ලියුම් කැබැල්ලක් ලියා, ගමන ගැන කිරිඳට පැවසීමට උඩතට්ටුවට දිව ගියෙමි. මා ආපසු එද්දී හෝම්ස් අපේ නිවසින් එළියට බසිමින් සිටියේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"වෛද්‍යවරයා ඉන්නේ අල්ලපු නිවසේමයි?" හෝම්ස් කීවේ ඒ නිවසේ පිත්තල නාමපුවරුව වෙත නෙත් හෙළමිනි.

"ඔව්. ඔහුත් මං වගේ, කරගෙන ගිය වෛද්‍යකමක් මිලයට ගත්තා."

"පැරණි, ඒ වගේම සාර්ථකව තිබුණු වෛද්‍යකමක්?"

"මගේ වගේමයි. මේ ගෙවල් දෙක හැදූ කාලෙ ඉඳලම, මේ චිකිත්සාගාර තිබිල තියෙනවා."

"ආ! නමුත් දෙකෙන් වඩාත් සාර්ථක එක ඔබට අහුවුණා?"

"මාත් හිතන්නෙ එහෙමයි. නමුත් ඔබ කොහොමද හෝම්ස් ඒ කරුණ දනගත්තේ?"

"ඉලන්දාරියා, මං නිරීක්ෂණය කළා, මහපාරේ සිට මේ නිවසට එන තරප්පු පේළිය. ඔහුගේ තරප්පු වලට වඩා, ඔබේ තරප්පු අඟල් තුනක් ගැඹුරට ගෙවී ගිහින්. ඒකෙන් කමක් නෑ"

හෝම්ස් කීවේ මා සමග කුලීරියට ගොඩවදිමිනි.

"මේ ඉන්නේ මගේ අනුග්‍රාහක මහත්මයා. හෝල් පයික්‍රොෆ්ට් මහත්මයා. රියැදුරු උන්නැහේ ඉක්මන් කළොත් හොඳයි. අපට දුම්රිය අල්ලාගන්න තව ඉතිරි වෙලා තියෙන්නේ බොහොම සුළු වෙලාවයි."

අන්ධකාරත්තය තුළදී හමුවූ ඒ මහතා, හොඳින් වැඩුණු සිරුරක්, පැහැපත් ශරීර වර්ණයක් හා අවංක පෙනුමක් තිබූ පුද්ගලයෙකි. ඔහුගේ රතු පැහැති පිරුණු මුහුණේ ප්‍රසන්න ස්වභාවයක් දිස්විය. කළුපැහැති කලිසමකින් හා කබායකින් සැරසී සිටි ඔහු, දිලිසෙන, ටොප්හැට් වර්ගයේ හිස්වැස්මක් පැළඳ සිටියේය. ඔහුගේ කවේ දෙකෙළවර දෙපසට ඇදී තිබුණු ආකාරයෙන්, එක්වරම මගේ සිතේ යම් හැඟීමක් ඇතිවිය. ඒ ඔහු යම්කිසි ඇබැද්දියකට, මුහුණපා ඇති බවයි. අපි පළමුවෙනි පංතියේ දුම්රිය මැදිරියකට නැග අසුන් ගත්තෙමු. ඔහු ෂර්ලොක් හෝම්ස් සොයා ඒමට හේතු වූ ගැටළුව කුමක්ද කියා මට පැවසුවේ, දුම්රිය පැඩිංටන් දුම්රියපොළෙන් පිටවී තරමක් වේලා ගතවූ පසුයි.

"මෙහේ ඉඳල බර්මිංහැම් වලට යන්න, මේ දුම්රියට විනාඩි 70ක් ගතවෙනවා." හෝම්ස් කීය. "හෝල් පයික්‍රොෆ්ට් මහත්මයා මගේ මේ ඉල්ලීම ඉටුකරන්න. ඔබ මට කලින් කිව්, ඒ සිත්ගන්නා

http://sherlockholmesinvestigations.blogspot.com

සුලු අත්දැකීම ඒ ආකාරයටම, හැකිනම් තවත් විස්තර සහිතව මගේ මිත්‍රයාට කියන්න. මේ සිදුවීමේ හැම පියවරක්ම, ඒ අනු පිළිවලින් තවත් වාරයක් අහගැනීම, මටත් හරිම ප්‍රයෝජනවත් වෙනවා. වොට්සන්, මේක යම්කිසි සැඟවුණු අභිරහසක් ඇති සිද්ධියක් වෙන්නත් පිළිවන්. එහෙම නොවෙන්නත් පිළිවන්. නමුත් මේ මහත්තයා කියන සිදුවීම් වල තියෙනවා, හරිම අසාමාන්‍ය ගතියක්. ඔය වගේ දේවලට කන්දෙන්න, මං වගේම ඔබත් කැමැති නොවැ. ඔන්න පයික්‍රොෆ්ට් මහත්මයා. මං තවදුරටත් ඔබේ කථාවට බාධා කරන්නෙ නෑ."

අපේ තරුණ අනුග්‍රාහකයා මා දෙස හෙළුවේ දහකාර බැල්මකි. අනතුරුව ඔහු කථාව ඇරඹීය.

"මහත්මයා. මේ කතන්දරයේ තිබෙන ලොකුම වැරැද්ද මොකක්ද දන්නවද, ඒ, බැලූබැල්මට මං මහ මෝඩයෙක් වගේ කෙනෙකුට පෙනෙන එක. බාගවෙලාවට ඉදිරියේ දී මේ ප්‍රශ්නය කිසි අවුලක් නැතිව විසඳෙන්නත් පුළුවන්. අනෙක මට වෙන කරන්න දෙයක් තිබුණෙත් නෑ. මගේ රස්සාවත් නැතිවෙලා. ඒ වෙනුවට මුදලකුත් මට නොලැබී ආවිද. අනේ මං දන්නෙ නෑ. එහෙම වුණොත්, මං මොන මෝඩයෙක්ද කියලා මට පසුතැවිලි වෙන්න සිදුවෙන්නත් පුළුවන්. වොට්සන් මහත්මයා මං කථා කීමට නම් එච්චර දක්ෂයෙක් නෙමෙයි. නමුත් සිදුවුණේ මෙන්න මේකයි.

මම ඩ්‍රේපර් උද්‍යානයේ කොක්සන් සහ වුඩ්හවුස් සමාගමේ ලිපිකරුවෙක් ලෙස රැකියාව කළා. නමුත් පසුගිය කාලයේ ඇතිවුණු වෙනිසියුලානු ණය අර්බුදය නිසා, අපේ සමාගම බංකොලොත් වුණා. මං ඔවුන් ළඟ අවුරුදු පහක් රැකියාව කරලයි තිබුණෙ. සමාගම වහල දමද්දි, අපේ වයසක කොක්සන් මහත්මයා, මට ඉතාම හොඳ සහතිකයක් දුන්නා. කොහොම වුණත් මං වගේ ලිපිකරුවන් විසිහත් දෙනෙකුටම රැකියා අහිමි වුණා.

අපි රැකියාවක් හොයා ගන්න, අරහේ, මෙහේ, හැමතැනම හොයා බැලුවා. නමුත් සාර්ථක වුණේ නැහැ. මගේ වයසේ, මං තරම් ඉගෙන ගත්තු, මං වගේ පළපුරුද්ද ඇති තරුණයන් ඕනෑතරම් හිටියා. මට පෙනුණේ සෑහෙන කාලයක් රැකියාවක් නැතිව ඉන්න වෙයි වගේකියලයි. කොක්සන් සමාගමේදී, මට සතියකට පවුම්

http://sherlockholmesinvestigations.blogspot.com

තුනක වැටුපක් ලැබුණා. ඒ නිසා ඒ කාලෙ මං පවුම් හැත්තෑවක මුදලක් ඉතිරි කර ගත්තා. නමුත් රැකියාව අහිමි වුණාට පස්සේ, ඒ ඉතිරි කරගත් මුදලත් ටිකෙන් ටික වියදම් වුණා. ඒ මුදලත් ඔක්කොම ඉවරවෙන තැනටයි ආවෙ. රක්ෂාවලට ඉල්ලුම් පත්‍ර යවන්න, මුද්දර ගන්නත් අමාරු තත්ත්වයටයි මං පත්වුණේ. සම්මුඛ පරීක්ෂණ වලට කාර්යාලවලට ගිහිං, තර්ප්පු බඩගාලා, මගේ සපත්තු දෙකත් අඩියටම ගෙවී ගිහින් තිබුණේ. ඒත් රක්ෂාවක් නම් පෙනෙන තෙක් මානෙක තිබුණෙ නැහැ.

ඔහොම ඉන්න අතරේ මට පුවත්පතක දකින්න ලැබුණා, මෝසන් සහ විලියම්ස් සමාගමේ ඇබෑර්තුවක් ඇති බව. ඔවුන්ගේ කාර්යාලය තියෙන්නේ ලොම්බාඩ් වීථියේ. ඔවුන් කොටස් වෙළඳ පොළේ අලෙවි කටයුතුවලට මැදිහත් වෙන, තැරැව්කාර සමාගමක්. ඔබ බාගවෙලාවට ඒ ක්ෂේත්‍රය ගැන එතරම් දන්නෙ නැතුවත් ඇති. නමුත් මට භය නැතිව කියන්න පුළුවන්, මේ ක්ෂේත්‍රයේ අංක එකට ඉන්න, ඉහළම, ධනවත්ම සමාගම, මෝසන් සහ විලියම්ස්. ඔවුන්ගේ ඇබෑර්තුවට ඉල්ලුම් පත්‍රයක් පුරවාගෙන අප එහි යනවාට වත්, ඔවුන් කැමැති නැහැ. අපේ ඉල්ලුම් පත්‍රය සහ සහතික, හැම එකක්ම තැපෑලෙන් එවිය යුතු බවයි දන්වීමෙ කියල තිබුණේ. මමත් ඉල්ලුම්පත්‍රයක් දැම්මා. නමුත් ඒ රැකියාව හරියාවි කියල මගේ ඒ තරම් විශ්වාසයක් තිබුණෙ නැහැ. නමුත් මට හැරෙන තැපෑලෙන් ඔවුන්ගෙන් පිළිතුරක් ලැබුණා. ඒකෙ කියල තිබුණා, ඊළඟ සඳුදාට නොවරදවාම ඔවුන්ගේ කාර්යාලයට එන්න කියලා. මගේ පෙනුම සතුටුදායක නම්, වහාම රැකියාව දෙන බව ඔවුන් සඳහන් කර තිබුණා.

රැකියාවලට තෝරා ගැනීම් කරන්නේ මොන ආකාරයටද කියල, කවුරුවත් හරි හැටි දන්නේ නෑ. සමහරු කියනවා, ලැබෙන ඉල්ලුම් පත්‍ර ගොඩකට එතැන කළමනාකාරයා අත දාලා, අතට අහුවෙන ඒ වල අය, රැකියාවට ගන්නවා කියලා. කොහොම හරි මටත් වාරයක් ලැබුණා. මං ඒ ගැන හරිම සතුටකට පත්වුණා. එතැන පඩිය සතියකට පවුම් හතරක්. වැඩ රාජකාරි, මං කොක්සන් සමාගමේ කළ ඒවාමයි.

ඔන්න මං දැන් එල්ලෙන්නේ, මගේ කතාවේ ඉතාම අසාමාන්‍ය කොටසටයි. මං නේවාසිකව ඉන්නේ හැම්ස්ටෙඩ්වේ ප්‍රදේශයේ,

http://sherlockholmesinvestigations.blogspot.com

පොටර්ස් ටෙරසයේ, අංක 17 දරන නිවසේ.එදා හවස බෝඩිම අයිති නෝනා, ආගන්තුක පත්‍රයක් මා වෙත අරගෙන ආවා.

**ආතර් පිනර්**
**මූල්‍ය කටයුතු නියෝජිත**

එහි සඳහන්ව තිබුණා. මං එහෙම කෙනෙක් ගැන කවදාවත් අහල තිබුණෙ නැහැ. ඔහුට මගෙන් උවමනා වෙලා තියෙන්නෙ මොනවද කියල මට හිතාගන්නවත් බැරිවුණා. කොයි එකටත් ඔහුව මගේ කාමරයට එවන්න කියලා, මං ගෙහිමි කාන්තාවට කිව්වා.

ඔහු මධ්‍යම ප්‍රමාණයේ සිරුරක් තිබුණු කෙනෙක්. හිසකෙස් අඳුරු පාටයි. මුහුණ පුරා කළුපාට රැවුලක් වවාගත් කෙනෙක්. ඔහුගේ වැඩ කටයුතු බොහෝම කඩිසර බව පෙනුණා. කාලයේ වටිනාකම හොඳින් තේරුම් ගත් අයකෙනෙක් වගේ, බොහොම ඉක්මනින් කථාකරගෙන ගියා.

"මේ හෝල් පයික්‍රොෆ්ට් මහත්මයා නේද?" ඔහු ඇසුවා.

"ඔව් මහත්මයා" මං කිව්වේ ඔහු වෙත පුටුවක් ළං කරමින්.

"කලින් ඔබ සේවය කළේ කොක්සන් සහ වුඩ්හවුස් සමාගමේ නේද?"

"ඔව් මහත්මයා."

"දැන් මෝසන් සහ සමාගමේ කාර්ය මණ්ඩලයේ?"

"ඔව් හරි."

"බොහොම හොඳයි" ඔහු කිව්වා. "මූල්‍ය කටයුතු ගැන ඔබ දක්වන විශිෂ්ට දක්ෂතාවය ගැන, අපට අහන්න ලැබුණා. ඔබට මතක ඇති කොක්සන් සමාගමේ කළමනාකාරයා හැටියට හිටි පාකර්? ඔහු ඔබ ගැන කළ වර්ණනා වල ඉවරයක් නෑ."

අමුත්තා ඒ කිව් දේ ඇසීම, මට ලොකු සතුටක් වුණා.

"ඔබට හොඳ මතකයක් තියෙනවාද?" ඔහු ඇසුවා.

"සෑහෙන තරම් හොඳයි." මං කිව්වා.

Peadfree Purpose Only Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ රැකියාවෙන් අස්වුණොත් පස්සෙත්, කොටස් වෙළඳපොළේ කොටස් අලෙවිය ගැන, හොඳ අවධානයකින්ද හිටියේ?"

"ඔව්. හැමදාම උදේට මං පුවත්පතේ කොටස් හුවමාරු මිල දර්ශනය කියවනවා."

"ඒකෙන්ම පෙනෙනවා, ඔබ රැකියාවට දක්වන උනන්දුව " ඔහු කිව්වේ සතුටට පත් හඬෙන්. "ඔහොම කටයුතු කරන අය තමයි, රැකියාවේ බොහොම ඉහළට යන්නේ. මං ඔබේ දැනුම ටිකක් පරීක්ෂා කරල බලනවට අමනාප නැහැ නේද?.... කෝ බලන්න.... අයර්ෂයර්ලගෙ කොටස් මිල කොහොමද?",

"එකසිය හයයි කාලෙ ඉඳල, එකසිය පහයි අටෙන් හතයි"

"එතකොට නිව්සිලෑන්ඩ් කොන්සොලිඩේටඩ්?"

"එකසිය හතරයි"

"බ්‍රිටිෂ් බ්‍රෝකන් හිල් සමාගම?"

"පවුම් හතේ සිට හතයි සිලිං හය දක්වා"

"අතිවිශිෂ්ටයි "ඔහු කීවේ දෑත් ඔසවමින් " මං ඔබ ගැන ඇහැව්ව හැම දෙයක්ම සම්පූර්ණ ඇත්ත බව මේකෙන් පෙනෙනවා. ඉලන්දාරියා! ඉලන්දාරියා!! මෝසන් සමාගමේ ලිපිකරු තනතුරකට ඔබ හොඳ වැඩියි!"

ඔහුගේ මේ කථාවෙන් මං හරිම පුදුමයකට පත්වුණා. ඉතින් මං මෙහෙම කිව්වා.

"පිනර් මහත්මයා. ඔබ මං ගැන ඔය හිතන දේවල්. අනෙක් අයට පෙනෙන බවක් මට නම් පෙනෙන්නෙ නෑ. මේ රක්සාව මං හොයාගත්තෙ බොහොම අමාරුවෙන්. ඒ නිසා ඒක ලැබුණු එක ගැන මං සන්තෝෂවෙනවා"

"පූඃ මනුස්සයෝ. ඔහේ ඊට ඉහළින් යන කෙනෙක්. ඔහේගෙ තියෙන දක්ෂකම්වලට සුදුසු තැනක් ලැබිල නෑ. ඔබේ හපන්කම් ගැන මට අවංකවම හිතෙන දේ කියන්නද? ඔබ සතු විශිෂ්ට හැකියාව ගැන හිතනකොට, ඊට සරිලන විදියේ වැටුපක් ගෙවන්න මට හැකියාවක් නෑ. ඒ වුණත් අපේ ළඟ රැකියාවට ආවොත්, මෝසන්ල ගෙවන වැටුපට වඩා බොහොම ඉහළ වැටුපක් මං ගෙවන්නම්. ඔබ කවදද මෝසන් සමාගමේ රැකියාවට යන්නෙ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"සඳුදා"

"හ හා! මං ඕනෙ ඔට්ටුවක් අල්ලන්නම් ඔබ සඳුදාට එතැන රැකියාවට යන්නෙ නෑ."

"මං මෝසන්හි රැකියාවට යන්නෙ නෑ?"

"නැහැ මහත්මයා. සඳුදාට ඔබ, ඊට වඩා ඉතාම ඉහළ තනතුරක් භාරගන්නවා. ඒ තමයි ව්‍යාපාර කළමනාකාර තනතුර. කොහේද? ප්‍රංශයේ නගර හා ගම්දනව් වල ශාඛා එකසිය තිස්හතරක් ඇති, බෙල්ජියමේ බ්‍රසල්ස් හා ඉතාලියේ සැන් රීමෝහිත් ශාඛා තිබෙන, ෆ්‍රැන්කෝ-මිඩ්ලන්ඩ් පිහන් භාණ්ඩ සමාගමේ, ව්‍යාපාර කළමනාකාර තනතුර."

මේ කථාවට මං ඇඟපාරට හුස්මක් ඉහළට ඇද්දා?

"එහෙම සමාගමක් ගැන මං කවදාවත් අහල නෑ?" මං කිව්වා.

"ඔබ එහෙම අසා නැති එකේ පුදුමයක් නෑ. මේ ව්‍යාපාරය ගැන, අපි ඒ තරම් ප්‍රසිද්ධියකට පත්කළේ නෑ. ඒ මොකද මේකට ප්‍රාග්ධනය යොදවලා තියෙන්නේ, කීපදෙනෙක් පෞද්ගලිකව. ඒක පොදුවේ මහජනතාවට විවෘත කරන්නට ඔවුන් කැමැති නෑ. මගේ සහෝදරයා හැරී පිනර් තමයි මාව මේ වැඩේට යෙදෙව්වේ. ඔහු අධ්‍යක්ෂක මණ්ඩලයෙයි හිටියේ. ඔහුට අලුතෙන් උසස්වීමක් ලැබුණා, මුල් පුටුවට, කළමනාකාර අධ්‍යක්ෂක ලෙස. මං ලන්ඩන් නගරයට එන බව කිව්වාම, ඔහු මට කිව්වා හොඳ දක්ෂ පුද්ගලයෙක් හොයාගන්න කියලා. හැබැයි ඊකක් අඩු වැටුපකට. ඔහු කිව්වේ වෙහෙස වෙලා වැඩ කරන්න පුළුවන්, දක්ෂ තරුණයෙක් හොයා ගන්න කියලා. ඉතින් පාකර් ඔබ ගැන වර්ණනා කළාම, මං තීරණය කළා මෙහේ එන්න. හැබැයි පටන්ගැනීමේදී, ඔබේ වැටුප ලෙස අපට දෙන්න පුළුවන් අවුරුද්දට පවුම් පන්සීයයි."

"අවුරුද්දට පවුම් පන්සීයක්?" මට කෑගැසුණා

"නෑ. ඒ පටන්ගැනීමේදී විතරයි. මීට අමතරව, ඔබේ නියෝජිතයන් මගින් කෙරෙන විකුණුම්වලින්, ඔබට සියයට එකක කොමිස් මුදලක් ලැබෙනවා. මගේ වචනෙ විශ්වාස කරන්න මහත්මයා. ඒ කොමිස් ඒක එකතු වුණාම ඔබට ලැබෙන ආදායම පඩියට වඩා වැඩියි."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ වුණත් පිහන් භාණ්ඩ අලෙවිය ගැන මං කිසිදෙයක් දන්නෙ නෑ" මං කිව්වා.

"ෂෲ ෂෲ ඉලන්දාරියා. ඒකෙ ප්‍රශ්නයක් නෑ. ඔබ මුදල් ගනුදෙනු ගැන දන්නවා නේ" ඔහු කිව්වා.

වොට්සන් මහත්මයා. මගේ හිස කැරකෙනවා වගේ දැනුණා. මං වැනි සුළු ලිපිකරුවෙකුට, මේ තරම් විශාල සමාගමක කළමනාකාර තනතුරක් ? මට පුටුවේ බාඩිවෙලා ඉන්නත් අමාරු වගේ දැනුණා. මේ වෙලාවේ මගේ හිතට ආවා පොඩි සැකයක්.

"මේ කරුණ අවංකවම මං ඔබට හෙළිකළ යුතුයි."මං කිව්වා.

"මෝසන් සමාගමෙන් මට දෙන්න පොරොන්දු වුණේ අවුරුද්දකට පවුම් දෙසීයයි. නමුත් එතැන රැකියාව විශ්වාසදායකයි. ඔවුන්, ව්‍යාපාර ලෝකයේ දැවැන්ත, ඹබාහොම ස්ථාවර සමාගමක්. නමුත් ඔබේ සමාගම ගැන මං කිසිදෙයක් නොදන්න ගණනයි."

"හරි හරි. ඔබේ පිළිතුරත් බොහොම බුද්ධිමත්" ඔහු කිව්වේ හරි සන්තෝෂයෙන්."අපට ඕනෙ කරන නියම පුද්ගලයා ඔබයි. ඔබේ තියෙන දක්ෂකම් නිසාම කථාවෙන් අපට ඔබව නම්මා ගන්න බැහැ. මෙහෙම කරමු. මෙන්න තියෙනවා පවුම් සියයක නෝට්ටුවක්. ඔබට හිතෙනවා නම් අපේ සමාගමේ රැකියාවට බැඳිලා, සේවය කරන එක හොඳයි කියලා, මේක සාක්කුවට දමාගන්න. ඒ මුදල ඔබේ වැටුප වෙනුවෙන් ගෙවූ අත්තිකාරම් මුදලක් ලෙස සලකන්න."

"වැඩ කෙරෙන්නේ ඒ විදියට නම්, බොහොම හොඳයි." මං කිව්වා "ඉතින් ඔබේ රැකියාවේ වැඩ භාරගන්න, මං එන්න ඕනෙ කවදටද?"

"හෙට දවල් එකට බර්මිංහැම් නගරයට යන්න" ඔහු කීවා. "මගේ ළඟ ලියුමක් තියෙනවා. ඒක ඔබ ගෙනිහින් මගේ සොහොයුරාට දෙන්න. ඔබට ඔහුව හමුවෙන්න පුළුවන්, කෝපරේෂන් වීථියේ අංක 126 බී දරන තැනදී. අපේ කාර්යාලය තාවකාලිකව පිහිටුවා තිබෙන්නේ එතැනයි. ඔබ අපේ සමාගමේ රැකියාවට බඳවා ගන්නවාද කියන එක මගේ සහෝදරයා ස්ථිර කළ යුතුයි. නමුත් මට හොඳටම විශ්වාසයි ඔබට කිසි ප්‍රශ්නයක් වෙන්නෙ නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

"පිතර් මහත්මයා. ඔබට කොහොම ස්තුති කරන්නද කියලා, මට නම් තේරෙන්නෙ නෑ." මං කිව්වා.

"ආ ඒක සුළු දෙයක් ඉලන්දාරියා. මේ ඔබට ලැබුණේ ඔබට අනිවාර්යයෙන්ම හිමිවිය යුතු දෙයක්. ඔබ සම්පූර්ණ කළ යුතු තවත් කුඩා කටයුත්තක් තිබෙනවා. ඒකත් කළොත් හොඳයි. ඔබ ළඟ කඩදාසියක් තියෙනවා නේද. ඒකේ මෙහෙම ලියන්න.

සීමාසහිත ෆ්‍රැන්කෝ- මිඩ්ලන්ඩ් පිඟාන් භාණ්ඩ සමාගමේ, ව්‍යාපාර කළමනාකරු ලෙස, අවුරුද්දකට පවුම් 500 ක අවම වැටුපකට සේවය කිරීමට මම එකඟවෙමි. එහෙම ලියලා යටින් අත්සන් කරන්න."

ඔහු කියූ විදියට ලියලා, මං අත්සන් කළා. ඔහු ඒ ලියවිල්ල සාක්කුවේ දමාගත්තා.

"තවත් කාරණයක් තිබෙනවා." ඔහු කිව්වා "ඔබ දැන් මෝසන් සමාගමේ රැකියාව ගැන මොකද කරන්නේ?"

"හිතේ ඇතිවුණු සන්තෝෂෙට මට මෝසන්ලව අමතක වුණා. රැකියාවෙන් මා ඉල්ලා අස්වෙන බව මං ඔවුන්ට දන්වනවා." මං කිව්වා.

"අන්න ඒක තමයි ඔබ නොකළයුතු ම දෙය" ඔහු කිව්වා.

"ඇයි ඒ?" මං ඇහුවා.

"හේතුව මේකයි. මං ඔබ ගැන විස්තර දනගන්න මෝසන් සමාගමට ගියා. මං එතැන් කළමනාකාරවරයා හමුවුණා. ඔබ ගැන විස්තර ඇහුවාම, ඔහු මට හොඳටම දොස් කියන්න පටන්ගත්තා. ඔහු කියනවා මං ඔවුන්ගේ රැකියාවෙන් ඔබව බලෙන් ගන්නවාලු. අන්තිමට අපි දෙන්නා අතර සණ්ඩුවක් ඇතිවුණා. මටත් හොඳටම කේන්ති ගියා. මං කිව්වා

"ඔහේලට හොඳ දක්ෂ මිනිස්සු ඕනෙ නම්, ඒ විධියට ඔවුනට වැටුප් ගෙවිය යුතුයි."

ඉතින් මිනිහා කියනවා, "ඔහේලගෙ ලොකු වැටුපට වඩා අපේ ආයතනයේ සුළු වැටුපකට වුණත් වැඩකරන්න, පයික්‍රොෆ්ට් කැමැතිවේවි"

http://sherlockholmesinvestigations.blogspot.com

"මං පවුම් පහක් ඔට්ටු අල්ලන්නම්" මං කීවා. "පයික්‍රොෆ්ට් මං දෙන රැකියාව භාරගනීවි. මෝසන්ස් සමාගමට ඔහුගෙන් ලියුමක් වත් ලැබෙන එකක් නැහැ"

"හරි ඕන ඔට්ටුවක්" කලමනාකරු කිව්වා. "පයික්‍රොෆ්ට් කියන්නේ කාණු පල්ලේ ඉඳල අපි ඇහිඳ ගතිපු එකෙක්. ඒ යකා ඒ තරම් ලේසියට අපව දාලා යන්නෙ නෑ."

බලන්න පයික්‍රොෆ්ට් මහත්මයා. කලමනාකාරයා පාවිච්චි කළේ ඔන්න ඔය වචනමයි."

"ලැජ්ජාවක් නැති හොර තක්කඩියෙක්." මං කිව්වේ තරහින්. "මං ඔහුව ජීවිතේට දකල නෑ. මං මොකටද එයාව ගණන් ගන්නෙ. පිනර් මහත්මයා කියනවා නම්, මං එයාට ලියල දන්වන්නෙ වත් නෑ."

"බොහොම හොඳයි. ඒ පොරොන්දුව ඔබ ඒ හැටියටම ඉෂ්ට කරාවි කියල මං බලාපොරොත්තු වෙනවා." ඔහු කීවේ පුටුවෙන් නැගිටිමින්. "මගේ සහෝදරයා වෙනුවෙන් අතිදක්ෂයෙක් හොයා ගන්න ලැබීම ගැන මට හරි සන්තෝෂයි. මෙන්න ඔබට අත්තිකාරම් ලෙස පවුම් සීයක්. මෙන්න මං කිව්ව අර ලියුම. ඒ ලිපිනය 126 බී කෝපරේෂන් වීථිය. මතක තියාගන්න. ඔහුව හමුවෙන්න ඔබ යා යුත්තේ හෙට දවල් එකටයි. එහෙනම් පයික්‍රොෆ්ට් මහත්මයා, ඔබට ශුභ රාත්‍රියක්. "

ඉතින් වොට්සන් මහත්මයා අප දෙදෙනා අතර ඇතිවුණු කතාබහ ඔන්න ඕකයි. මං මේ වගේ වාසනාවන්ත වීම ගැන මගේ හිතේ ඇතිවුණේ අප්‍රමාණ සතුටක්. ඒ ගැන සන්තෝෂයෙන් මං කල්පනා කර කර හිටියා. හුඟක් ර වෙනකුරු මට නින්ද ගියෙත් නැහැ.

පහුවදා බර්මිංහැම් බලා යන්න, මම ලන්ඩන් නගරයෙන් පිටත්වුණා. මං ගියේ උවමනා වේලාවටත් වඩා කලින්, බර්මිංහැම් නගරයට ...ාවෙන දුම්රියක. මගේ බඩු බාහිරාදියත් අරගෙන මම කෙළින්ම ගියේ බර්මිංහැම්හි නව මාවතේ හෝටලයකට. එහි කාමරයක් අරගෙන, හොඳ ඇඳුම් පැළඳුම් වලින් සැරසිලා, මට දී තිබුණු ලිපිනය හොයාගෙන ගියා.

http://sherlockholmesinvestigations.blogspot.com

නියමිත වෙලාවට පැය භාගයකටත් කලින්, මං යා යුතු තැනට ළඟාවුණා. කෝපරේෂන් වීථියේ 126 බී කියලා තිබුණේ තට්ටු ගොඩනැගිල්ලක, ඉහළම තට්ටුව. ඒ සඳහා යා යුතු තරප්පුව තිබුණේ, විශාල සාප්පු දෙකක් අතරින් තිබූ බරාඳයක. ඒ ගොඩනැගිල්ල තට්ටු පහක එකක්. ඉහළ තට්ටුවල කාමර කුලියට ගත් අයගේ නම්, පහළ බිත්තියේ පින්තාරු කර තිබුණා. නොයෙකුත් වෘත්තීන්වල යෙදුණු අයගේ නම්, සහ සමාගම්වල කාර්යාල ඒ අතර තිබුණා. නමුත් ෆ්‍රැන්කෝ මිඩ්ලන්ඩ් පිඟන්බඩු සමාගමේ නම, නම් ඒ අතර තිබුණේ නැහැ. මං හරිම භයකට පත්වුණා. මේක ලොකු රැවටිල්ලක්ද ප්‍රයෝගයක්ද කියන අදහස මගේ සිතට නැඟුණා. එතකොටම මා වෙතට ආ කෙනෙක් මා සමග කථා කළා. ඔහු කලින් දා රාත්‍රියේ මා හමුවෙන්න ආ පුද්ගලයා වගේමයි. නමුත් මුහුණ පුරා වැඩුණු රැවුලක් නැහැ. ඉකාණ්ඩෙත් සුදු වෙලා. නමුත් සිරුරේ හැටිත්, කටහඬත් එසේමයි.

"ඔබ හෝල් පයික්‍රොෆ්ට් මහත්මයාද?" ඔහු ඇසුවා.

"ඔව්."

"ඔහෝ! මං ඔබව බලාපොරොත්තුවෙන් හිටියේ. ඔබ නියමිත වේලාවටත් විකක් කලින්. මගේ සොහොයුරාගෙන් මට අද උදේ ලියමනක් ලැබුණා. ඒකෙ ඔබ ගැන හරියට වර්ණනා කරල තිබුණා."

"මං මේ වටපිට බලමින් හිටියේ, ඔබේ කාර්යාලය තියෙන්නේ කොහෙද කියලයි."

"තවමත් අපේ නාම පුවරුව දමාගන්න බැරිවුණා. අපි මේක තාවකාලිකව කුලියට ගත්තේ ගිය සතියෙනේ. යමු උඩ තට්ටුවට. ගිහිං ඔක්කොම කථාකරගමු."

මං ඔහු පසුපස ගියා. තරප්පු පෙළේ ඉහළටම නගින්න මට සිදුවුණා. කොහොම හරි අපි ගියේ ඉහළම - පස්වැනි තට්ටුවට. ඒකෙ තිබුණා, දූවිලි පිරුණු හිස් කාමර කිහිපයක්ම. ඔහු මාව කැඳවාගෙන ගියේ, ඒ වගේ කාමරයකටයි. කළාල හෝ ජනෙල් තිර කිසිවක් නොතිබුණු එහි බිම දූවිලි පිරී තිබුණා.

ෆ්‍රැන්කෝ-මිඩ්ලන්ඩ් සමාගම කිව්වාම, මගේ හිතේ මැවී තිබුණේ, මං කලින් රැකියාව කළ කාර්යාලය වගේ අලංකාර

http://sherlockholmesinvestigations.blogspot.com

එකක්. කාර්යාලය දෙපැත්තේම ඔප වැටුණු මේස පිරුණු, ලිපිකරුවන් රාශියක් වැඩේ යෙදී ඉන්න තැනක්. මං දකින්න බලාපොරොත්තු වුනේ එවැනි විශාල කාර්යාලයක් වුණාට, මේක බොහොම පුංචි තැනක්. මෙහි තිබුණේ කුඩා මේසයක් හා බාල පුටු දෙකක් පමණයි. මේසය මත එක ලෙජර් පොතක් හා බිම කුණුකූඩයක් තිබුණා. එච්චරයි.

"අධෛර්යයට පත්වෙන්න එපා පයික්‍රොෆ්ට් මහත්මයා" අර තැනැත්තා කිව්වේ, මගේ මුහුණ බෙහෙස්වුණු හැටි දකලා. "රෝමය කියන්නේ එක දවසකින් ගොඩනැගුව තැනක් නෙමෙයි. අපේ තැන්පතුවල, විශාල වශයෙන් මුදල් තියෙනවා. නමුත් අපි මේ කර්යාල වගේ ඒවල ශෝභනත්වයට, ඒ තරම් මුදල් වියදම් කරන්නේ නැ. ඉතින් වාඩිවෙන්න මහත්මයා. දෙන්න ඔබ ගෙනා ලියුම."

ලියුම අතට අරගෙන, ඔහු ඒක බොහොම පරෙස්සමෙන් කියවලා බැලුවා.

"මගේ සොහොයුරා ආතර්ට ඔබව හොඳට හිතට අල්ලලා" ඔහු කිව්වා. "මං දන්නවා ආතර් ලේසියෙන් කෙනෙකු ගැන පැහැදීමට පත්වෙන්නේ නැ. ඔහු හැමවිටම කියන්නේ හපන්නු ඉන්නේ ලන්ඩන් නගරයේ කියලයි. මං කියන්නේ බර්මිංහැම් වල අය වැඩිය දක්ෂ බවයි. නමුත් මේ සැරේ නම් මං ඔහුගේ අදහසට සම්පූර්ණයෙන්ම එකඟවෙනවා. මහත්මයා අපි ඔබව ස්ථිර වශයෙන්ම මේ රැකියාව සඳහා තෝරා ගත්තා."

"මොනවද මගෙන් කෙරෙන්න ඕන රාජකාරි?"

"අපි ඔබව පත්කරන්නේ කොහැනටද දන්නවද? ප්‍රංශයේ පැරිස් නුවර තියෙනවා, අපේ ප්‍රධාන බෙදාහැරීමේ මධ්‍යස්ථානය. එහි කළමනාකරු වශයෙනුයි අපි ඔබව පත්කරන්නේ. එහිදී එංගලන්තයේ නිෂ්පාදනය කරන පිඟන් කෝප්ප ආදිය, ප්‍රංශයේ සාප්පු පවත්වාගෙන යන අපේ නියෝජිතයන් එකසිය තිස් හතර දෙනෙකු වෙත බෙදාහරිනවා. මෙහෙන් පිඟන්බඩු මිලදීගෙන අවසන් කරන්න, මෙවර අපට සතියක් ගතවෙනවා.ඒ අතරේ ඔබ බර්මිංහැම් වල රැඳී ඉන්න. ඔබට ප්‍රයෝජනවත් වැඩකොටසක් කළහැකි වේවි."

"ඒ මොන ආකාරයටද?"

"මගේ ඒ ප්‍රශ්නයට පිළිතුරක් හැටියට, ඔහු ලාච්චුවකින්

Reading Purpose Only. Not For Fun
http://sherlockholmesinvestigations.blogspot.com

රතුපාට කවරයක් තිබෙන ලොකු පොතක් එළියට ගත්තා.

"ඔබ මේ පොත අරගෙන යන්න. මේ තියෙන්නේ පැරිස් නගරයේ ව්‍යාපාරික නාමාවලියක්. මේකෙ සඳහන් වෙනවා පුද්ගල නාම සහ ලිපින. ඒ ළඟින්ම සඳහන් කර තිබෙනවා ඔවුන්ගේ වෘත්තිය. ඔබට තියෙන්නේ මෙහි සඳහන් චීනන් බඩු, හැඳි ගෑරුප්පු වෙළෙඳුන්ගේ නම් හා ලිපින සටහන් කරගන්නයි. ඒ ටික මට බොහොම ප්‍රයෝජනවත් වේවි."

"එච්චර කාලය ගත කරන්නේ මොකටද? වෘත්තීන් හා වෙළඳ ව්‍යාපාරවල ස්වභාව අනුව, වර්ගීකරණය කළ නාමාවලි තියෙනවනේ" මං කිව්වා.

"ඒවා ගැන ඒ හැටි විශ්වාසයක් තියන්න බැහැ මහත්මයා. ප්‍රංශයේ ක්‍රමය අපේ රටේ ක්‍රමයට වඩා වෙනස්. වෙන මොකුත් නොකර ඉස්සර වෙලා මේ වැඩේ සම්පූර්ණ කරල ඉන්න. මට ඒ ලේඛනය ඕනෑ සඳුදාට. අපි දහවල් දොළහට මෙතැනදී හමුවෙමු. ඔබට සුබ දවසක් පයිනෝලාන්ට් මහත්මයා. කැපවීමෙන් වැඩ කළ හැකිබව හා බුද්ධිමත් කෙනෙකු බව, පෙන්වීමට ඔබට හැකි වුණොත්, අපේ සමාගම හොඳ ස්වාමියෙක් බව ඔබට පෙනේවි"

මං ආපහු හෝටලයට ගියේ අර ලොකු, රතු පොතත් අරගෙනයි. නමුත් මගේ මොළයේ වැඩකළේ පරස්පර විරෝධී අදහස්. එක් පැත්තකින් කල්පනා කර බැලුවාම, මගේ රැකියාව නම් ස්ථිරයි. ඒ බවට මට පවුම් සියයක අත්තිකාරමකුත් ලැබිල තියෙනවා. අනෙක් අතට මාව රක්ෂාවට බඳවාගත්ත සමාගම ගැන හිතේ ඇතිවුණේ ලොකු සැකයක්. ඔවුන්ගේ කාර්යාලයේ පෙනුම බොහොම බාලයි. නාමපුවරුවක් කොහේවත් තිබුණේ නැහැ. වෙන දෙයක් වුණාවේ. මගේ අතට දනටමත් සෑහෙන මුදලකුත් ලැබිලනේ තියෙන්නේ, කියල මං හිතාගත්තා. ඊළඟට මම මට භාරවුණු වැඩේ කරන්න පටන්ගත්තා. මුළු ඉරිදා දවසම මම ඒ වෙනුවෙන් ගතකළා. සඳුදා වෙනතුරු මට යා හැකිවුණේ 'H' අකුර දක්වා පමණයි. පසුදා දවල් නියමිත වේලාවට, මං මගේ ප්‍රධානියා හමුවෙන්න ගියා.

ඒ දූවිලි පිරුණු අපිරිසිදු කාමරයේදීම මට ඔහු හමුවුණා. බදාදා වෙනතුරු මේ භාරදුන් කටයුත්ත කරගෙන ගිහින්, බදාදාට ඇවිත් ඔහුව හමුවෙන්න කියලා පිනර් මහත්මයා කිව්වා. දිගටම

http://sherlockholmesinvestigations.blogspot.com

වැඩ කළත්, බදාදා වෙනකොටත් මට ඒ ඉවර කරගන්න බැරිවුණා. ඉතින් මම දිගටම සිකුරාදා, ඒ කියන්නේ ඊයෙ වෙනතුරු ඒ කටයුත්තේ යෙදුණා. ඊට පස්සේ මං හැරී පිනර් මහත්මයා හමුවෙන්න ගියා.

"ඔබට බොහොම ස්තූතියි" ඔහු කිව්වා

"මට හිතුණේ නෑ, ඕක ඔය තරම් බැරෑරුම් වැඩක් වේවි කියල. මේ ලේඛනය මට හරිම ප්‍රයෝජනවත් වේවි."

"මට ඒකට සෑහෙන කාලයක් ගතවුණා."

"දැන් ඔබට කරන්න තියෙන්නේ මේක්යි"

ඔහු කිව්වා. "මේ පොතේ තිබෙන ලී බඩු වෙළඳුන්ගේ ලේඛනයකුත් පිළියෙළ කරන්න. ඒ මොකද, ප්‍රංශයේ ලී බඩු සාප්පු වල පිඟන්බඩුත් විකුණනවා."

"බොහොම හොඳයි" මං ඊට එකඟ වුණා.

"ඒක කරලා, හෙට හැන්දෑවේ හතට ඇවිත් මාව හමුවෙන්න." ඔහු කීවා." ඔබේ වැඩකටයුතුවල සාර්ථක බව කොහොමද කියලා එතකොට බලමු. මේ කටයුත්ත වෙනුවෙන් දිගටම මහන්සි වෙන්නත් එපා. හැන්දෑ වෙලාවෙ සංගීත ප්‍රසංග ශාලාවට ගිහින් සංගීතෙට සවන්දීලා, ටිකක් විනෝද වෙන්න." ඔහු සිනාවෙමින් කිව්වා.

ඔහු හිනාවෙද්දී මට එක් දෙයක් පැහැදිලිවම දකින්න ලැබුණා. ඔහුගේ කටේ උඩු ඇන්දේ, වම් පැත්තේ, දෙවැනි දත රත්තරන්වලින් පුරවා තිබුණා, නමුත් ඒ පිරවීම කර තිබුණේ ඉතාම අවලක්ෂණ අයුරෙන්."

ෂර්ලොක් හෝම්ස් අතිශයින් ස්ඵුටව පත් විලසින් තම දෑත් පිරිමැද්දේ ය. මම ඉමහත් පුදුමයෙන් අපේ අනුග්‍රාහකයා දෙස බලා සිටියෙමි.

"ඒ ගැන ඔබ පුදුමයට පත්වුණා වගෙයි වොට්සන් මහත්මයා. නමුත් ඒකෙ වැදගත්කම මේකයි." අපේ අනුග්‍රාහකයා කීය.

"එදා ලන්ඩනයේදී මාව හමුවෙන්න ආව ආතර් පිනර් හිනාවුණු වෙලාව මට මතකයි. මං මෝසන් සමාගමට නොයන්න තීරණය කළ එකට ඔහු හිනාවුණා. ඔහුගේත් උඩු ඇන්දේ වම් පැත්තේ

Reading Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

දෙවැනි දත, මේ අයුරින්ම අවලක්ෂණ අයුරින් රත්තරනින් පුරවා තිබූ බව මට හොඳට මතකයි. මගේ අවධානය ඒ ගැන යොමුවුණේ අවස්ථා දෙකේදීම දත, රත්තරන් පාටින් දිලිසුණු නිසයි. මේ දෙන්නාගේ කටහඬවල් එකමයි. සිරුරේ හැඩයත්, ප්‍රමාණයත් එකම විදියයි. එක්කෙනෙක් අනෙකා බවට හැරවීම බොහොම පහසු බව මට පෙනී ගියා. ඊට වුවමනා වෙන්නේ එක්කො දලි පිහියක්. නැත්නම් බොරු කොණ්ඩයක් හා බොරු රැවුලක් පමණයි. මේ දෙදෙනා එක්කෙනෙක් බව මගේ හිතට තහවුරු වුණා. ඒ ගැන කිසිම සැකයක් නැහැ. සහෝදරයන් දෙදෙනෙක් පෙනුමෙන් බොහෝ දුරට එක සමාන වෙන්න පුළුවනි. නමුත් දෙදෙනාගේම එකම දත, එකම විදියට රත්තරනින් පුරවා තිබීම විය හැකිද?"

මං එතැනින් පිටවී පාරට බැස්සා. මං හෝටලයට ගියේ හරිම ගැටලු සහගත සිතකින්. මං කටයුතු කරන්නේ බුද්ධිමතෙක් වගේද මෝඩයෙක් වගේද? හෝටල් කාමරයේ දී, මං ඔලුව සීතල වතුර බේසමක ඔබාගෙන, මේ ගැටලුව විසඳා ගන්න උත්සාහ කළා. ඔහු මොකටද මාව ලන්ඩන් ඉඳලා බර්මිංහැම් වලට එව්වේ? ඔහු මොකද මට කලින් මෙහාට ආවේ? ඇයි තමන් විසින් තමන්ටම ලියුමක් ලියාගත්තේ? මේක මට කිසිසේත් විසඳාගන්න බැරි ගැටලුවක් බව මං වටහා ගත්තා. මං ඔය ගැන හිත හිතා ඉන්නකොට, මගේ හිතට හොඳ අදහසක් ආවා. මට මතක්වුණා, මේක මට පැහැදිලි නැති වුණාට, ෂර්ලොක් හෝම්ස් මහත්මයාට නම් තේරුම් ගන්න පුළුවන් වේවි කියලා. ඉතින් මං මහරෑම දුම්රියෙන් ලන්ඩනයට ඇවිත්, උදෑසන ෂර්ලොක් හෝම්ස් මහත්මයා හමුවුණා. දැන් ඔබ දෙදෙනාම එක්කගෙන ආපහු බර්මිංහැම් බලා යනවා."

තරුණ ලිපිකරුවා තම පුදුමාකාර අත්දැකීම් විස්තරය අවසන් කළ පසු, මඳ නිහැඬියාවක් පැවතිණි. එහෙත් මගේ මිත්‍රයාගේ දෙනෙත් සෑහුවම එල්ල වුයේ මා වෙතයි. ඔහුගේ මුහුණෙන් පළ වූයේ කිසිවක් අවබෝධ කරගත් සුවිශේෂ බැල්මකි. ඒ, පැරැණි වයින් පිළිබඳ විශේෂඥයෙක්, තමා රස බැලූ එක වයින් උගුරෙන්ම අතිවිශිෂ්ට වර්ගයක් හඳුනාගත් විට හෙළන බැල්මකි.

"බොහොම සියුම් සිදුවීම් මාලාවක්. එහෙම නේද වොට්සන්" හෝම්ස් කීය. "මේකෙ තියෙනවා, මගේ සිත ආකර්ෂණය කරගන්නා තැන් කිහිපයක්ම. සීමාසහිත ෆ්රැන්කෝ - මිඩ්ලන්ඩ් සමාගමේ

http://sherlockholmesinvestigations.blogspot.com

කාර්යාලයේදී ආතර් හැරී පිනර් මහත්මයා හමුවෙන්න ලැබීම, අපට බොහොම විනෝදජනක අත්දැකීමක් වේවි."

"ඒත් කොහොමද අපි ඒක කරන්නෙ?" මම ඇසීමි.

"ආ... ඒක බොහොම පහසුයි." පයික්‍රොෆ්ට් කීය. "ඔබ දෙදෙනා රැකියා සොයන මගේ මිත්‍රයින් දෙදෙනෙක්. කළමනාකාර අධ්‍යක්ෂතුමා හමුවෙන්න, මේ රැකියා නැති යාළුවන් දෙදෙනෙකු කැඳවාගෙන යාම වැරැද්දක් නැහැ නේද?"

"අන්න හරි. " හෝම්ස් කීය.

"මේ වැදගත් මහත්මයාගෙ මූහුණ ටිකක් බලාගත්තොත් මට ඇති. එතකොට මට හිතාගන්න පුළුවන් වේවි, ඔහු මේ ගෙනියන සෙල්ලම මොකක්ද කියලා. පයික්‍රොෆ්ට් මහත්මයා. ඔබේ සේවය ඔහුට මේ තරම් වටිනා එකක් වීමට, ඔබේ තිබෙන සුවිශේෂ ගුණාංග මොනවද?.... එහෙමත් නැත්නම්... මේ වගේ දෙයක් ද?....."

වාක්‍යය අතරමග නැවැත්වූ හෝම්ස්, දුම්රිය කවුළුවෙන් ඉවත බලාගෙන, නියපොතු සපන්නට පටන්ගත්තේය. අප බර්මිංහැම් හි නව මාවත වෙත පැමිණෙන තුරුම, හෝම්ස්ගේ මුවෙන් වචනයක් හෝ පිටවූණේ නැති තරම් ය.

එදා හැන්දෑවේ අපි තිදෙනා කෝපරේෂන් වීථියේ ඇවිද ගියෙමු. අප ඒ කාර්යාලය වෙත ළඟාවෙන විට, රාත්‍රි හත වී තිබිණ.

"වෙලාවට කලින් අපි එතැනට යන එකෙන් වැඩක් නෑ" අපේ අනුග්‍රාහකයා කීය. "ඔහු එතැනට එන්නේ මාව හමුවෙන්න. ඒ වෙනතුරු කාර්යාලය වහලයි තියෙන්නේ"

"ඒකෙන් කාරණය වඩාත් පැහැදිලි වෙනවා." හෝම්ස් කීය.

"දෙයියෝ සාක්කි! මං ඔබට කිව්වා නේද?" ලිපිකරුවාට කෑ ගැසිණ.

"අර යන්නේ ඒ මිනිහා. අර...අර... අපට ටිකක් ඉස්සරහින්"

ඔහු ඇඟිල්ල දිගුකොට පෙන්වීය. පාරේ අනෙක් පැත්තේ වේගයෙන් ඉදිරියට යමින් සිටියේ, ශරීර ප්‍රමාණයෙන් කුඩා පුද්ගලයෙකි. අව්වට පිළිස්සීම නිසා දුඹුරු පැහැ ගත් සමක් තිබූ ඔහු, හොඳ ඇඳුම් කට්ටලයක් හැඳ සිටියේ ය. අප බලාසිටියදීම,

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only, Not For Print

ඔහු පුවත්පත් විකුණන කොලුගැටයාට හඬගැසීය. මීළඟට වාහන අතරින් පාර හරහා දිවගිය ඔහු, සවස පුවත්පතේ අලුත්ම මුද්‍රණය මිලදී ගත්තේ ය. එය රැගෙන ඔහු දොරටුව අතරින් අතුරුදන් විය.

"අන්න මිනිහා යනවා. ඕකට තමයි සමාගමේ කාර්යාලය කිව්වෙ. යමු යමු. මං ඔහුට කථා කරන්නම්."

තරුණ ලිපිකරුවා පසුපස අපි තට්ටු පහක් ඉහළට නැගුණෙමු. ඔහු එක් කාමරයක දොරට තට්ටු කළේය. ඇතුළෙන් කැඳවීමක් ලැබිණි. කාමරය පයික්‍රොෆ්ට් අපට විස්තර කළ ආකාරයේ, බුමුතුරුණු හෝ තිර රෙදි කිසිවක් නොමැති, දූවිලි පිරුණු කාමරයක් විය. අප වීථියේදී දුටු තැනැත්තා, පුවත්පත මේසය මත එළාගෙන එය කියවමින් සිටියේ ය. ඔහු හිස ඔසවා අප දෙස බැලුවේය.

ඔහුගේ මුහුණෙන් ප්‍රකාශ වූයේ, අතිශයින්ම සංවේගයට හෝ භීතියට පත් ලකුණුයි. ඔහුගේ නළල ඩහදියෙන් දිලිසුණු අතර, මුහුණ සම්පූර්ණයෙන්ම සුදුමැලි වී තිබිණි. දෑස්වලින් පැවසුණේ සිහි විකල් බවට පත් කෙනෙකුගේ ස්වභාවයකි.

"පිනර් මහත්මයා, ඔබ අසනීපයෙන් වගෙයි" තරුණ ලිපිකරුවා කීය.

"ඔව් මට ටිකක් සනීප නෑ." පිනර් කීවේ වියළුණු දෙතොල් දිවෙන් තෙත් කර ගනිමිනි. "ඔබ මේ කැඳවාගෙන ඇවිත් ඉන්න, මහත්වරු දෙදෙනා කවුද?"

"එක්කෙනෙක් බර්මොන්ඩ්සිහි හැරිස් මහත්මයා. අනෙක් එක්කෙනා මේ නගරයේම කෙනෙක්. ප්‍රයිස් මහත්මයා. මේ දෙන්නා මගේ යහළුවෝ දෙන්නෙක්. ටික කාලෙක ඉඳල මේ දෙන්නටම සතුටුදායක රැකියා නැහැ. ඒ ගොල්ලන්ගේ සුදුසුකම් හා පළපුරුද්දට ගැළපෙන රැකියා සොයමිනුයි ඉන්නෙ. ඉතින් මේ දෙන්නා ආවේ, ඔබේ සමාගමේ ඔවුන් දෙදෙනාටත් රැකියා සොයගන්න පුළුවන් වේද බලන්න."

"අපොයි පුළුවන් පුළුවන්" පිනර් පැවසුවේ කෙනෙකු භීතියට පත්කරවන අයුරින් හඬනගා සිනාසෙමිනි. "කිසි සැකයක් නැහැ අපට පුළුවවන් ඔබ දෙදෙනාටත් රැකියා ලබා දෙන්න. හැරිස් මහත්මයා. ඔබට පළපුරුද්දක් තියෙන්නෙ කුමන ක්ෂේත්‍රයෙන්ද?"

"මං ගණකාධිකාරීවරයෙක්" හෝම්ස් කීය.

http://sherlockholmesinvestigations.blogspot.com

"ආ... ඒ වගේ අය අපට ප්‍රයෝජනවත්. එතකොට ප්‍රයිස් මහත්මයා ?"

"මං ලිපිකරුවෙක්."

"මට හොඳටම විශ්වාසයි, ඔබ දෙදෙනාටම අපේ සමාගමේ රැකියා ලබාගන්න හැකිවේවි කියලා. අපි තීරණයකට ආවාම ඔබට දන්වන්නම්. දන් මා ඔබෙන් ඉල්ලා සිටිනවා, මෙතැනින් යන්න කියලා. දෙවියන්ගේ නාමයෙන් මට නිදහසේ ඉන්න දීල යන්න!"

මේ අන්තිම වාක්‍යය ඔහුගේ මුවෙන් පිටවී ගියේ උස් හඬිනි. ඔහුට එසේ කෑගැසුණේ, අමාරුවෙන් යටපත් කරගෙන සිටි හැඟීම් රැසක්, පාලනය කරගත නොහැකිව පුපුරා ගිය අයුරෙනි. හෝම්ස් සහ මම, මුහුණට මුහුණ බලා ගත්තෙමු. පයික්‍රොෆ්ට් අඩියක් ඉදිරියට තැබුවේය.

"පිනර් මහත්මයා, ඔබට අමතක වුණා වගෙයි. ඔබ මට අද මේ වෙලාවට එන්න කිව්වා. මං ආවෙ උපදෙස් ගන්න."

"සත්තකින්ම ඔව් පයික්‍රොෆ්ට් මහත්මයා. සත්තකින්ම ඔව්" පිනර් කීවේ මදක් සන්සුන්වූ ස්වරයෙනි. "ඔයා එහෙනම් ටිකක් වෙලා මෙහෙන් ඉන්න. ඔබේ මිත්‍රයින් දෙන්නත් ඔබ සමඟ ඉඳීමේ ප්‍රශ්නයක් නෑ. මං එනතුරු මිනිත්තු තුනක් ඉවසන්න."

ඔහු අසුනෙන් නැගිට්ටේ, අපට ද හිස නමා ආචාර කරමිනි. මීළඟට කාමරය, හරහා ගිය ඔහු, දොරක් විවෘත කරගෙන එහි ඇතුළු වී දොර වසාගත්තේ ය.

"මොකක්ද ඒ වැඩේ තේරුම?" හෝම්ස් ඇසුවේ කෙඳිරිලි හඬිනි. "මිනිහ පැනල යන්නද් දන්නේ නෑ හදන්නෙ?"

"වෙන්න බෑ" පයික්‍රොෆ්ට් කීය.

"ඒ මොකද?"

"ඔය දොරෙන් යන්න තියෙන්නේ ඇතුළේ කාමරයකට"

"එතැනින් පිටතට යන්න බැරිද?"

"බැහැ"

"මොනවද ඒකේ තියෙන් ගෘහ භාණ්ඩ?"

"ඊයේ නම් මොකුත් තිබුණේ නෑ."

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only.. Not For Print.

http://sherlockholmesinvestigations.blogspot.com



201. ඔහුගේ මුහුණෙන් ප්‍රකාශ වූයේ, අතිශයින්ම භීතියට පත් ලකුණුය.

"එහෙනම් මිනිහට ඒක ඇතුළේ තියෙන රාජකාරිය මොකක්ද? මෙතැන මොකක්ද මේ සිද්ධවෙන්නෙ කියන එක, මට ටිකක් තේරුම් ගන්න අමාරුයි. මේ පිනර් විතර භීතියට පත්වුණු කෙනෙක්, මං සෑහෙන කාලයකට දැකල නැහැ. මොන හේතුවකින්ද ඔහු භයට පත්වුණේ?"

"අපි රහස් පරීක්ෂකයෝ කියල ඔහුට සැක හිතෙන්න ඇති." මම කීවෙමි.

"ඔව් ඒක වෙන්නැති" පයික්‍රොෆ්ට් කීය.

හෝම්ස් හිස සෙලවූයේ, ඊට එකඟ නොවන බව හඟවමිනි.

"ඔහු සුදුමැලි වුණේ අපව දැකලා නොමෙයි. අපි කාමරයට ඇතුළුවෙන කොටත් ඔහු සුදුමැලියි. බාගවෙලාවට..."

හෝම්ස්ගේ කථාවට බාධා කරමින්, ඇතුළු කාමරයේ සිට මේ කාමරය සම්බන්ධවන දොරට, "ටක් ටක් ටක්" යන හඬින් තට්ටු කරනු අපට අසන්නට ලැබිණි.

"මොන එකකටද එයාම දොර වහගෙන, දැන් එයාම දොරට තට්ටු කරන්නේ?" පයික්‍රොෆ්ට් ඇසීය.

දොරට තට්ටුවෙන ශබ්දය යළිත් ඇසුණේ, පෙරටත් වඩා උස් හඬිනි. අපි ඒ දොර දෙස නොඉවසිල්ලෙන් බලා සිටියෙමු. හෝම්ස්ගේ මුහුණේ මාංශපේශී දරදඬු වූ ආකාරය අපි දුටුවෙමු. මී ළඟට අපට කාමරය තුළින් ඇසුණේ, කෙනෙකු අපහසුවෙන් හුස්ම ගැනීමට තැත් කරද්දී, උගුරෙන් නිකුත්වෙන හඬකි.

තවත් මොහොතක්වත් ඉමා නොවූ හෝම්ස්, දොර වෙත කඩාපැන්නේ ය. එය ඇතුළතින් අගුළු දමා තිබිණි. අපි තිදෙනාගේම උත්සාහයෙන් දොර කඩාගෙන, ඇතුළු කාමරයට පිවිසුණෙමු. ඇතුළු කබායක් හා පිට කබායක් බිම තිබිණි. දොර පිටිපස උළුවස්සේ වූ කොක්කක කිසිවෙක් එල්ලී සිටියේය. ඒ ෆ්‍රැන්කෝ මිඩ්ලන්ඩ් පිහන්බඩු සමාගමේ කළමනාකාර අධ්‍යක්ෂකවරයායි. ඔහු තම දණහිස් නමාගෙන එල්ලී සිටියේ අමුතු කෝණයකිනි. අපේ කතාබහට බාධාවන ලෙස ශබ්දය නැගී තිබුණේ, ඔහුගේ දෙපා දොරට වැදීම නිසයි.

එක් ක්ෂණයකින් ඔහුගේ ඉහටිය දෙපසින් දැත් යවා බදාගෙන, ඔහු ඉහළට එසවූයෙමි. මේ අතර හෝම්ස් හා පයික්‍රොෆ්ට්, පිනර්ගේ

http://sherlockholmesinvestigations.blogspot.com
Reading Purposes Only, Not For Print

ගෙල පෙදෙසේ පැටලී තිබූ ඉලාස්ටික් පටි ලිහා දැමූහ. ඔහුගේ මුහුණ කිරිමැටි පැහැයට හැරී, දෙතොල් දම් පැහැය ගෙන තිබිණි. අපි අනෙක් කාමරයට ඔහු ඔසවාගෙන ආවෙමු. මළමිනියක පෙනුම ලැබී තිබුණත්, ඔහු වරින් වර අක්‍රමවත්ව හුස්ම ගත්තේය. මම ඔහු පරීක්ෂා කර බලා, ඔහුට ප්‍රථමාධාර දුන්නෙමි. මුලදී යන්තමින් දනුණු අක්‍රමවත් නාඩි, වඩාත් ක්‍රමවත් වීමට පටන් ගත්තේය. හුස්ම ගැනීම ද, ගැඹුරු විය. ඔහුගේ ඇසිපිය විවෘත කොට, මම පරීක්ෂා කර බැලීමි.

"මොකක්ද වොට්සන් ඔහුගේ තත්ත්වය?" හෝම්ස් ඇසීය.

"මරණය පෙනි පෙනී, මිනිහ අනුහාවයෙන් බේරිලා තියෙන්නේ. දන් ඉතින් පණ බේරුණා. ඔය ජනේලය ඇරලා, මට වතුර ඩිකැන්ටරය දෙන්න." පිනර්ගේ කරපටි ලිහිල් කර දමා, ඔහුගේ මුහුණ සීතල ජලයෙන් තෙමුවෙමි. අනතුරුව ඔහුගේ දෑත් ඔසවමින් පහත් කරමින් තවදුරටත් කෘතිම ශ්වසනය ලබා දුන්නෙමි."ටික වෙලාවක් ගතවේවි. නමුත් ඔහු මැරෙන්නෙ නෑ."

හෝම්ස් මේසය අසලට වී දෑත් කලිසම් සාක්කුවල දමාගෙන, කල්පනා කරමින් හුන්නේ ය.

"මං හිතන්නේ, දන් නම් ඉතින් අපට පොලීසිය කැඳවන්න වෙනවා." හෝම්ස් කීය. "ඒ වුණත් මගේ කැමැත්ත තියෙන්නෙ, ඔහු පොලිසියට භාරදෙනකොට, ගැටලුවට විසඳීමක් දෙන්න හැකියාවක් තිබෙනවා නම්."

"මටත් මේක හරි අභිරහසක්" පයික්‍රොෆ්ට් කීය. "මේ මිනිස්සු මොන එකකටද මාව ලන්ඩන් ඉඳල බර්මිංහැම් දක්වා අරගෙන ආවෙ. ඊළඟට ඔහු...."

"මට ඒ ඔක්කොම පැහැදිලියි." හෝම්ස් කීවේ නොඉවසිල්ලෙනි.

"ඔහුගේ මේ අවසාන පියවර තමා මට ටිකක් තේරුම් ගන්න අමාරු"

"ඒ කියන්නෙ ඔබට අනික් ඔක්කොම පැහැදිලිද?"

"මං හිතන්නේ ඒ හරියේ මොකුත්ම ගැටලුවක් නෑ. හරිම පැහැදිලියි. එහෙම නේද වොට්සන්?"

මම උරහිස් හැකිළුවෙමි. "මට කියන්න තියෙන්නෙ, මටත් කිසිදෙයක් තේරුම් ගන්න අමාරු බව"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඇයි ඒ තරම් අමාරු? මුලින් වුණු සිදුවීම් ගැන කල්පනා කළොත්, ඒ හැම දෙයක්ම යොමුවෙන්නෙ එක් දිශාවකට. එයින් අපට එක් පැහැදිලි නිගමනයකට එන්න පුළුවනි."

"හොඳයි, මොකක්ද හෝම්ස් මහත්මයා, ඔබ තේරුම් අරගෙන තියෙන හරිය?"

"ඒක මම පැහැදිලි කරන්නම්. නමුත් ඊට කලින් මේ ටික තේරුම් ගන්න පුළුවන්ද? හැම දෙයක්ම රැඳිලා තියෙන්නේ, වැදගත් කාරණා දෙකක් මත. එයින් පළමුවෙනි එක තමා පයික්‍රොෆ්ට් මහත්මයා ලවා ලියවූ ලියවිල්ල. මේ ලෝකේ කොහේවත් නැති සමාගමක සේවයට බැඳුණු බවට සහතික කර ඔබ ලියුමක් දුන්නා. ඔබට පෙනෙන්නෙ නැද්ද ඒකේ ඇති වැදගත්කම?"

"මට නම් හරියට හිතාගන්න අමාරුයි."

"ඇයි ඔවුන් එහෙම දෙයක් ඔබ ලවා ලියෙව්වේ? ඒ ව්‍යාපාරික ගිවිසුමක් හැටියට නෙමෙයි. ඔබට පෙනෙන්නේ නැද්ද තරුණ මිත්‍රයා? ඔවුන්ට වුවමනා වුණා, ඔබේ අත් අකුරුවල සාම්පලයක් ගන්න. එහෙම නැතුව ඔබේ අත් අකුරු ලබා ගත හැකි ක්‍රමයක් ඔවුනට නෑ."

"ඔවුනට මොකටද මගේ අත් අකුරු?"

"හරි ඔවුන්ට මොකටද ඔබේ අත්අකුරු?" ඒකට පිළිතුරක් දෙන්න පුළුවන් නම්, අපේ මේ පුංචි ගැටලුවෙන් කොටසක් විසඳා අවසන්.

ඔබේ අත් අකුරුවලින් ඇත්තේ එකම ප්‍රයෝජනයයි. කාටහරි වුවමනා වුණා, ඔබේ අත් අකුරු අනුකරණය කර, ඔබ විදියටම ලියන්න. ඊළඟට අපි එනවා දෙවැනි කාරණයට, ඒකෙන් අර මුල් කාරණය තවත් පැහැදිලි වෙනවා. පින්ර් ඔබට කිව්වා, මෝසන් සහ සමාගමේ රැකියාවෙන් ඔබ ඉල්ලා අස්වෙන බව දැනුම් දෙන්න එපා කියල. එතකොට මොකක්ද සිදුවෙන්නේ? මෝසන් සමාගමේ කළමනාකාරයා, සඳුදා උදේට මග බලාගෙන ඉන්නවා, මොකටද? තමන් කවදාවත් දැක නැති, හෝල් පයික්‍රොෆ්ට් මහත්මයා රැකියාවේ වැඩභාරගන්න එනතුරු."

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ! මං කටයුතු කරලා තියෙන්නේ කිසි දෙයක් නොතේරෙන මහා මෝඩයෙක් වගේ." පයික්‍රොෆ්ට් කෑගැසුවේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"දැන් ඔබට පෙනෙනවා නේද ඔබේ අත්අකුරු වුවමනා වුණේ ඇයි කියල. කවුරුහරි වෙනත් කෙනෙක් හෝල් පයික්‍රොෆ්ට් ලෙස පෙන්නාගෙන, මෝසන් සමාගමේ රැකියාවට යනවා. ඔහුගේ අත් අකුරු ඔබේ අත්අකුරු වලට වඩා වෙනස්වුණා නම් වැඩේ ගැස්සෙනවා. ඒ නිසා ඔහු රැකියාවට යන්නේ ඔබේ අත්අකුරු අනුකරණය කරන්න හොඳින් පුහුණු වෙලා. ඉතින් රැකියාව ස්ථිරයි. මං හිතන්නේ ඒ කාර්යාලයේ ඔබ පෞද්ගලිකව හඳුනන කිසිවෙක් නැතුව ඇති?"

"කිසිකෙනෙක් නෑ."

"හරියට හරි. දැන් මේ තක්කඩින්ට වුවමනායි, ඔබව මෝසන් සමාගමෙන් ඈත් කර තියන්න. ඒ මොකටද ? හදිසියේම ඔබ ඔවුන් සමඟ රැඳීමට ගත් තීරණය වෙනස්කර, මෝසන් සමාගම වෙත යෑම වළක්වන්න. එහෙමත් නැත්නම්, ඔබේ නමම තියෙන කෙනෙක් මෝසන් හි රැකියාවක් කරන බව, කවුරුහරි ඔබට දැනුම් දෙන එක වළක්වන්න. ඒ නිසා මේ තක්කඩින් ඔබේ වැටුපෙන් හොඳ අත්තිකාරමක් දීලා, ඔබව එවවා තර්ජ්මංහැම් වලට. ඊළඟට ඔවුන් මෙහේදී ඔබට වැඩ රාශියක් භාර දුන්නා. මොකටද? ඔබ ආපහු ලන්ඩන් නගරයට යාම වළක්වන්න. ඒ මගින් ඔවුන්ගේ ප්‍රයෝගකාරී වැඩ පිළිවෙළට ඇතිවිය හැකි බාධා වළක්වාගන්න. ඒ ටික පැහැදිලියි"

"නමුත් ඇයි මේ මනුස්සයා, ඔහුගේම සහෝදරයා ලෙසින් ද්විත්ව චරිතයක් නිරූපණය කළේ?"

"ඒක ඒ තරම් අපැහැදිලි නෑ. මේ හොර මගඩියට දෙදෙනෙක් සම්බන්ධයි. එක්කෙනෙක් හෝල් පයික්‍රොෆ්ට් ලෙස මෝසන් සමාගමේ වැඩ කරනවා. අනෙක් තැනැත්තා ඔබ ඒහෙන් ඉවත් කර තබන්න රැකියාවකට ඔබ බඳවා ගන්නවා. නමුත් ඔහුට පෙනෙනවා, මේ වැඩේ සාර්ථකව කරගෙන යන්න, ඔබව ලන්ඩන් නගරයෙන් ඉවත්කර තැබිය යුතු බව. එය ක්‍රියාත්මක කිරීමට තුන්වැනි පුද්ගලයෙකුත් ඕනෑ බව ඔහුට වැටහෙනවා. නමුත් ඔවුන් ඒකට කැමති නැහැ. ඒක අවදානම් වැඩක් නිසා."

එතකොට මොකද කරන්නේ. ඔහු වෙස් මාරුකරගෙන, ඔහුගේම සහෝදරයා ලෙස පෙනී සිටිනවා. පෙනුමේ සමාන කමක් තිබුණත්, ඔබ හිතන්නේ ඒක එක පවුලේ සොහොයුරන් වීම නිසා

http://sherlockholmesinvestigations.blogspot.com

ඇතිවූ සමානකමක් ලෙස. නමුත් විශුනාවකට වගේ, ඔහු හිනාවෙද්දී ඔහුගේ දත රත්තරන් වලින් පුරවා තිබූ හැටි ඔබේ අවධානයට ලක්වුණා."

සියල්ල තේරුම් ගත් හෝල් පයික්‍රොෆ්ට් මහතා දඩි ලෙස කෝපයට පත්විය. දැත් මිටි මොළවා ගත් ඔහුගේ මුහුණ රතු විය.

"දෙයියෝ සාක්කි! මං මෝඩයෙක් වගේ මෙහේට වෙලා කාලය ගතකරනවා. ඒ අතරේ හෝල් පයික්‍රොෆ්ට් හැටියට පෙනී හිටිමින්, අනෙක් තක්කඩියා මෝසන් සමාගමට වෙලා මොනවා කරනවද දන්නෙ නෑ. හෝම්ස් මහත්මයා. දන් අපි මේකට මොකක්ද කළ යුත්තේ?"

"අපි වහාම මෝසන් සමාගමට, මේ බව විදුලි පුවතකින් දන්විය යුතුයි."

"සෙනසුරාදා දවස්වල ඔවුන් දවල් දොළහට වහනවා" පයික්‍රොෆ්ට් කීය.

"ඒකට කමක් නෑ. දොරටුව ළඟ කුරුරු හරි සේවකයෙක් ඇති...."

"ආ... ඔව්. ඔවුන් හැමවිටම දොරටුව ළඟ ස්ථිර ආරක්ෂක නිලධරයෙක් රඳවල ඉන්නවා. ඒ මොකද ඔවුන්ගේ කාර්යාලයේ සුරැකුම්පත් විශාල ප්‍රමාණයක් ගබඩා කර තිබෙන නිසා."

"අන්න හරි. ඔබේ නම තිබෙන ලිපිකරුවෙක් එහි සේවය කරනවා නම්, හැම දෙයක්ම හොඳින් සිදුවෙනවාද කියා, අපි විදුලි පුවතක් යවල සොයා බලමු.

ඒ ඔක්කොම මට පැහැදිලියි. නමුත් මට තේරුම් ගන්න බැරි, අප දුටු විගසම එක හොරෙක්, කාමරයෙන් එළියට ගිහින් එල්ලුණේ ඇයි කියල"

"බලන්න පත්තරේ" අප පිටුපසින් කිසිවකු අමාරුවෙන් කෙඳිරිගානු ඇසිණි. අපි විගස හැරී බැලුවෙමු. කළමනාකාර අධ්‍යක්ෂකවරයා කිම වාඩිවී සිටියේ ය. තවමත් ඔහුගේ මුහුණ සුදුමැලි වී භීතියට පත් හැඟීම් පළවිය. බෙල්ලේ වටේ තිබූ රතුපැහැති සලකුණ ඔහු අතගාමින් සිටියේය.

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only.. Not For Pr



207. "ඇත්ත නේන්නම්. පත්තරේ! පත්තරේ!"

http://sherlockholmesinvestigations.blogspot.com

"ඇත්ත නෝන්නම්! පත්තරේ පත්තරේ!" හෝම්ස් කීවේ නොඉවසිල්ලෙනි.

"මං මහ මෝඩයෙක්. අපි මෙතැනට ආව එක ගැන හිතුව මිසක්, පුවත්පත ගැන කිසි දෙයක් මගේ හිතට ආවේ නැහැ." හෝම්ස් කීවේ පුවත්පත මේසය මත තබාගෙන දිග හරිමිනි.

"මේ බලන්න වොට්සන්."

ඒ ඊවනිං ස්ටෑන්ඩර්ඩ් පුවත්පතේ නගර මුද්‍රණයකි. එහි සිරස්තලය වෙත අපේ අවධානය යොමු විය.

## ලන්ඩන් නගරයේ මිනීමැරුමක් !

### යෝධ මංකොල්ලයකට දැරූ තැත විරදී. අපරාධකාරයා පොලීසියට අසුවේ.

"යටින් තිබෙන විස්තරයත් කියවන්න වොට්සන්."

**ලන්ඩන් නගරයේ අද සිදුවීමට ගිය මහා මංකොල්ලයක්, එක් මනුෂ්‍ය ඝාතනයක් සිදුවී, අපරාධකරු අල්ලා ගැනීමත් සමග අවසන් විය.**

**බොහෝ කාලයක සිට මූල්‍ය ක්ෂේත්‍රයේ දැවැන්තයන් ලෙස නමක් දිනාගෙන සිටින මෝසන් හා විලියම්ස් සමාගමේ, මේ අපරාධය සිදුවී ඇත. ඔවුන් සතු සුරැකුම්පත්වල වටිනාකම රන් පවුම් දශලක්ෂයකට අධිකයයි විශ්වාස කෙරේ. මේවායේ ආරක්ෂාව පිළිබඳව, තමා සතු වගකීම කළමනාකරුවා මැනැවින් වටහාගෙන සිටියේ ය. එහෙයින් සුරැකුම්පත්වල ආරක්ෂාව සඳහා යොදාගෙන තිබුණේ, අතිශයින්ම නවීන ආකාරයේ සේප්පු විශේෂයකි. ඊට අමතරව ආයුධ සන්නද්ධ ආරක්ෂක නිලධරයකු, දිවා රාත්‍රි, ආයතනය මුර කිරීම සඳහා යෙදවීමට කළමනාකරු අමතක නොකළේ ය.**

**පසුගිය සතියේ මෝසන් සමාගම විසින් හෝල් පයික්‍රොෆ්ට් නම් ලිපිකරුවකු සේවයට බඳවා ගන්නා ලදී. අත්අඩංගුවට ගත් පසු**

http://sherlockholmesinvestigations.blogspot.com

පෙනී ගියේ, මොහු අන් කවරෙකුවත් නොව, නමගිය අපරාධකරුවෙකු වන බෙඩිංටන් බවයි. ඔහු හොර මුදල් නෝට්ටු මුද්‍රණය සහ බැංකුවල මුදල් සේප්පු කැඩීමේ අති දක්‍ෂයෙකු බව ප්‍රසිද්ධ කරුණකි. ඔහු එම අපරාධ සම්බන්ධයෙන්, සිය සොහොයුරා සමග බන්ධනාගාරයේ අවුරුදු පහක් ගතකොට, මෑතදී නිදහස ලැබීය. ඔහු මෙම සමාගමේ සේවයට බැඳීමට සමත් වූයේ කෙලෙසකද යන්න තවමත් තේරුම්ගෙන නැත. කෙසේ වෙතත් සුරක්‍ෂිතාගාරයේ පිහිටීම හා එහි වැඩ කටයුතු සිදුවන ආකාරය ගැන, පැහැදිලි වැටහීමක් ලබා ගැනීමට ඔහුට හැකිවී ඇති බැව් පෙනේ. එහි යකඩ සේප්පුවල අගුළුවලට, හොර යතුරු ඉතා කෙටි කලකින් සාදාගැනීමට බෙඩිංටන් සමත්වී ඇත.

මෝසන් හා විලියම්ස් සමාගමේ ලිපිකරුවන්ගේ රාජකාරි, සාමාන්‍යයෙන් සෙනසුරාදා දහවල් දොළහට අවසන් වේ. එහෙයින් දහවල් එකයි විස්සට, විශාල බෑගයක් රැගත් පුද්ගලයකු, ආයතනයේ තරප්පුව බැස එනු දුටු ලන්ඩන් පොලිසියේ සාජන් ටූසෙන්ට්ට සැක සිතිණ. සැක කටයුතු පුද්ගලයා හඹා ගිය සාජන්ට්වරයා, පොලිස් කොස්තාපල් පොලොක්ගේ ආධාරය, ඇතිව සැකකරුවා අත්අඩංගුවට ගත්තේ, බිහිසුණු සටනකින් පසුවයි. ඔහු මංකොල්ලයක් සිදුකොට ඇති බව, පොලිස් නිලධරයන්ට එක්වරම පැහැදිලි විය. ඩොලර් ලක්‍ෂ ගණනක් වටිනා, ඇමරිකන් දුම්රිය සමාගම් වල හා රත්රන් දියමන්ති පතල් සමාගම්වල සුරැකුම්පත්, බෑගය තුළ තිබී හමුවිය.

මෝසන් සමාගමේ දොර විවෘත කොට සොයා බලද්දී, අවාසනාවන්ත මුරකරුගේ මළසිරුර දක්නට ලැබිණ. එය දෙකට නමා, විශාල සේප්පුවක් තුළට දමා, අගුළු ලා තිබිණ. සාජන්ට් ටූසෙන්ට්ගේ ප්‍රඥාව හා ක්‍ෂණික ප්‍රතිචාරය නොවන්නට, මළසිරුර සඳුදා හමුවීමට තිබිණ. පිටුපසින් එල්ලකරන ලද යකඩ පොලු පහරකින්, මුරකරුගේ හිස්කබලට බරපතල තුවාල සිදුවී ඇත. ආයතනය වසා දමූ පසු බෙඩිංටන් යළි ඇතුළු වූයේ කෙසේද යන්න, අනුමාන කළ හැක. තමාට යමක් අමතකව ගිය බව පවසා, ඔහු ආපසු ආයතනය තුළට පැමිණෙන්නට ඇත. ආරක්‍ෂක නිලධරයා මරා දමූ පසු, යකඩ සේප්පු තුළ තිබූ දේ බෑගයට දමාගෙන ඔහු පිටවී ඇති බැව් පැහැදිලිය. බෙඩිංටන් සමග හැමවිටම මෙවැනි අපරාධවල යෙදෙන ඔහුගේ සහෝදරයා, මෙයට හවුල් වූ බවට මේ

http://sherlockholmesinvestigations.blogspot.com

දක්වාත් හෝඩුවාවක් නැත. කෙසේ වෙතත් පොලීසිය දැන් ඔහු ගැන සොයමින් සිටී.,

"පොලීසියට ඒ කරදරේ නම් ටිකක් පහසු කරන්න අපට හැකිවේවි." හෝම්ස් කිවේ ජනේලය අසල සිටි පුද්ගලයා දෙස බලමිනි. "මනුෂ්‍යයාගේ ස්වභාවය හරිම පුදුමාකාර සම්මිශ්‍රණයක් වොට්සන්. තමන්ගේ ආදරණීය සහෝදරයාට එල්ලුම්ගස් යන්න වෙන බව දැනගත්තාම, මිනීමරන දරුණු අපරාධකාරයෙකුගේ වුණත් හිත උණු වෙනවා. ඔහුට ඇති වෙනවා දැඩි අනුකම්පාවක්. ඒ ශෝකය ඉවසාගන්න බැරිව, ඔහුත් තීරණය කරගන්නවා ජීවිතය කෙළවර කරගන්න. කොහොම වුණත් අපට ගන්න තියෙන්නෙ එකම ක්‍රියා මාර්ගයයි. මං දොස්තර මහත්තයා එක්ක මෙතැන මුරට ඉන්නම්. පයික්‍රොෆ්ට් මහත්මයා කරුණාකරල ගිහින් පොලීසිය කැඳවාගෙන එන්න."

Reading Purpose Only, Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

# කහ පුෂ්පරාගය

http://sherlockholmesinvestigations.blogspot.com

# කහ පුෂ්පරාගය

(මේ කථාන්තරය ඔබට පවසන්නේ දොස්තර වොට්සන් විසින් වත්, ෂර්ලොක් හෝම්ස් විසින් වත් නොව, තුන්වැන්නෙකු විසිනි.)

ෂර්ලොක් හෝම්ස් හා දොස්තර වොට්සන් යෙදුණු වික්‍රමාන්විත පරීක්ෂණ රැසක් ඇරඹුණේ බේකර් වීථියේ අංක 221 බී දරණ තැන ඔවුන්ගේ නිවහනේදීය. කිසි විටෙකත් පිළිවෙළට තබා නොගත් තමාගේ පැරණි නිවහනට, යළිත් වරක් පැමිණෙන්නට ලැබීම දොස්තර වොට්සන්ට සතුටක් විය. කාමරයේ අලුත් යමක් දකින්නට ඇත්දැයි ඔහු හිස හරවමින් වටපිට බැලුවේය.

රසායනික ද්‍රව්‍ය හා අම්ලවලින් මතුපිට දැවී ගිය මේස, කාමරයේ මුල්ලක බිත්තියට හේත්තු කර තිබූ හෝම්ස්ගේ වයලීනය, පයිප්ප හා ඒවාට යොදන දුම්කොළ ගබඩා කර තැබූ ලෝහ බඳුන, ඉක්මනින් විමර්ශනය කළ යුතු කරුණු සලකුණුකොට, බිත්තිවල අලවා තිබූ සටහන් පත්‍ර, මේ හැම දෙයක්ම වෙනදා පරිද්දෙන් නොවෙනස්ව තිබිණි. අවසානයේ දොස්තර වොට්සන්ගේ දැස් යොමු වුණේ, සිනහමුසු මුහුණෙන් ඔහු දෙස බලා සිටි පුද්ගලයා වෙතයි. ඒ නැණවත් මෙන්ම කාර්ය ශූර, බිලී නම් සේවක ළමයාය.

"මට පෙනෙන හැටියට මෙහේ නම් කිසිම වෙනසක් වෙලා නැහැ. වෙනදා විදියමයි. බිලීගේ හැටිත් එහෙමමයි. මං හිතන්නේ, මගේ මිත්‍රයා, හෝම්ස් මහත්තයාගේ පිළිවෙළත් ඒ වගේම ඇති?"

හෝම්ස්ගේ නිදනකාමරයේ වසා තිබූ දොර වෙත, බිලී දෙනෙත් යොමු කළේ කැලැඹුණු මුහුණෙනි.

"මං හිතන්නේ අපේ මහත්මයා හොඳටම නිදි ඇති." බිලී පිළිතුරු දුන්නේය.

http://sherlockholmesinvestigations.blogspot.com

ඒ සොඳුරු කාලගුණයක් තිබූ ගිම්හානයේ දවසකි. වේලාව හැන්දෑවේ හතට පමණය. ඒ කෙනෙකු නින්දට යන වෙලාවක් නොවේ. එහෙත් තම මිතුරා නිදාගන්නා වෙලාව මෙන්ම, අවදියෙන් සිටින වෙලාව ද අක්‍රමවත් එකක් බව, දොස්තර වොට්සන් හොඳින් දැන සිටියේය.

"ඒ කියන්නේ හෝම්ස්ට මොනව හරි අලුත් පරීක්ෂණයක් ලැබිල ඇති?"

"ඔව් මහත්මයා, ඒ කටයුත්තට එතුමා හරියට මහන්සි වෙනවා. මට භය ඔහු මේ විදියට වෙහෙසිලා, අසනීප වේවිද කියල. වැඩේ යෙදෙනවා මිසක් කෑම කටක් කන්නේ නෑ. ඒ නිසා එන්න එන්නම සුදුමැලි වෙනවා, කෙට්ටු වෙනවා. අපේ හඩ්සන් නෝනා මහත්තයා ඇහුවා, හෝම්ස් මහත්තයාට කෑම උවමනා කොයි වෙලාවටද කියලා ඒකට හෝම්ස් මහත්තය දුන්නු උත්තරේ මොකක්ද දන්නවද?"

"හෙට නෙමෙයි අනිද්දා, රෑ හතහමාරට!"

"ගැටලුවක් විසඳන්න පටන්ගත්තාම, අපේ මහත්තයාගේ පිළිවෙළ දොස්තර මහත්තයා දන්නවානේ."

"ඔව් බිලී. මං ඒක හොඳට දන්නවා.

"අපේ මහත්තයා මේ දවස්වල කාගෙ හරි තොරතුරු හොයාගන්න, ඔහු පිටිපස්සෙන් ඇවිදිනවා. ඊයේ ඔහු රක්සාවක් නැති සුදු කාරයෙක් වගේ, වෙස්වලාගෙන ගියා. අද ගියේ නාකි නෝනා කෙනෙක් වගේ. මමත් සෑහෙන්න රැවටුණා. මෙච්චර කාලයක් මෙහේ වැඩකළ එකේ, මං ඕව තේරුම් ගන්න එපාය" කී බිලී සෝපාවට හේත්තු කර තිබූ ලොකු කුඩයක් පෙන්වීය

"නාකිනෝනා චරිතයෙන් එකෙන් එකක් තමයි අර."

"මහත්තයා ඔය හැටි මහන්සි වෙන්නේ මොකක් ගැනද බිලී?"

රජයේ රහස් කථාකරන පුරවැසියෙකු මෙන්, බිලී ඔහුගේ කටේ ශබ්දය අඩු කළේය.

"මහත්තයට කිව්වහම මොකද. ඒ වුණාට මේව පිට කාටවත් කියන්න එපා. අපේ මහත්තය හොයන්නේ අර ඔටුන්නෙන් නැතිවුණු දියමන්තිය!"

http://sherlockholmesinvestigations.blogspot.com

"මොනවා" අර ප්‍රථම ලක්ෂයක් වටිනා, කහ පුෂ්පරාගය හොරකම් කළ එකද?"

"ඔව් මහත්මයා ඔවුන් අප්‍රමාණ උත්සාහයක් දරනවා ඒක හොයාගන්න. ඇයි මහත්තයා ඊයේ ඔය වැඩේට, අග්‍රාමාත්‍යතුමයි රාජ්‍ය ලේකම්තුමයි, දෙන්නම මෙහේ ආවනේ. අපේ මහත්තය එක්ක කතාබහ කලේ ඔන්න ඔය සෝෆාවෙ වාඩිවෙලාමයි. අපේ මහත්තය ඒ දෙන්නටම කථා කලේ හරි කරුණාවෙන්. දෙන්නාගෙම හිත් කලබල වෙලා, පිස්සුවෙන් වගේ දෙඩෙව්වා. නමුත් හෝම්ස් මහත්තය කී දේවල් අහල ඔවුන් සන්සුන් වුණා. මහත්තයා පොරොන්දුවුණා මැණික හොයලා දෙන්න, පුළුවන් හැම දෙයක්ම කරනවා කියලා. ඇයි එතකොට කැන්ටල්මියර් සාමිත් ආවනේ."

"ආ.........?"

"ඔව්. කැන්ටල්මියර් සාමිගේ නැට් වොට්සන් මහත්තයා දන්නවනේ. කිව්වහම මොකද එයා නම් හරි පුදුමාකාර මනුස්සයෙක්, අගමැතිතුමා නම් හරිම හොඳයි.කොහෙකුට ආශ්‍රය කරන්න පුළුවන් ගුණයහපත් කෙනෙක්. රාජ්‍ය ලේකම්තුමා ගැන වුණත් මට කියන්න වරදක් නෑ. ආචාරශීලී විනීත කෙනෙක්. ඒ වුණත් කැන්ටල්මියර් සාමිව නම් මට පෙන්නාන්න බෑ. හෝම්ස් මහත්තයටත් එහෙමයි. සාමි කියනවා, හෝම්ස් මහත්තයා මේ ගැටලුව විසඳාවි කියා විශ්වාසයක් තියන්න බැරිලු. මහත්තය මේකට යොදවා ගන්නවටවත් කැන්ටල්මියර් සාමි කැමැති නෑ."

"හෝම්ස් මහත්තය ඒ බව දන්නවාද?"

"දනගන්න තියෙන හැම එකක්ම අපේ මහත්තය දනගන්නවා නේ."

"අපි ප්‍රාර්ථනා කරමු හෝම්ස් මහත්තයාගේ උත්සාහය සඵල වේවා කියල එතකොට කැන්ටල්මියර් සාමි ලැජ්ජාවට පත්වේවි. ඒක නෙමෙයි බිලී. ඔය ජනේලෙන් එහා කෙළවරේ තිබෙන තිරරෙද්ද මොකටද?"

"දවස් තුනකට කලින් හෝම්ස් මහත්තය තමා මේක දැම්මෙවෙ. ඒක පිටිපස්සෙ තියෙනවා අපූරු බඩුවක්."

බිලී පැවසුවේ තිරය පැත්තකට අදිමිනි.

මවිතයට පත් දොස්තර වොට්සන්ට එක්වරම කෑ ගැසිණ. එතැන වූ හාන්සි පුටුවේ තබා තිබුණේ ඔහුගේ මිත්‍රයාගේ ජීවමාන

http://sherlockholmesinvestigations.blogspot.com



215. බිලී ඉදිරියට ගොස් තිරය පසෙකට ඇද්දේය.

http://sherlockholmesinvestigations.blogspot.com

ප්‍රතිමාවකි. එයට පිටකබායක් අන්දවා, හිස මඳක් පහතට නමාගෙන හෝම්ස් පොතක් කියවන ඉරියව්වෙන්, ප්‍රතිමාව සකස්කර තිබිණි. ජනේලයෙන් එළියට දිස්වුයේ සිරුරෙන් තුන්කාලක් පමණි. බිලී එහි හිස ගළවා, අතට ගෙන පෙන්වීය.

"වරින්වර අපි මේක එක එක පැත්තට හරවනවා. එතකොට එළියේ ඉන්න කෙනෙකුට පෙනෙන්නේ, පණ ඇති කෙනෙක් ඉන්නවා වගේ. ජනෙල්තිරය සම්පූර්ණයෙන්ම වහල නිසා තමයි, මං දන් මේක ඇල්ලුවේ. තිරය ඇරල තියෙන වෙලාවට පිළිමෙට අත තියන්නෙ නෑ. ඒ වෙලාවට මේක හරි ලස්සනට මහපාරට පෙනෙනවා."

"ඉස්සරත් අපි ඔය වගේ එකක් යොදාගෙන තියනවා."

"ඒ මං එන්න කලින් වෙන්න ඇති." බිලී කීය. ජනෙල් තිරය හොඳින් විවෘත කළ ඔහු වීථිය දෙස බැලුවේය.

"පාරෙ ඉඳන් අපේ ගේ දිහා සෝදිසියෙන් බලාගෙන ඉන්න පුද්ගලයො ඉන්නවා. මට දැනටමත් පෙනෙනවා ඒ වගේ කෙනෙක්. වොට්සන් මහත්තයම ඇවිත් බලන්න."

වොට්සන් එක් පියවරක් ඉදිරියට තබද්දීම, හෝම්ස්ගේ නිදන කාමරයේ දොර විවෘත විය. ඔහුගේ මුහුණ කෙට්ටුව, පුදුමැලිව තිබිණි. එක්වරම ජනේලය වෙත පිනූ ඔහු, තිරය ඇද කාමරය ඇතුළත ආවරණය කළේය.

"ඔය ඇති බිලී." හෝම්ස් කීවේය. "ඔබේ ජීවිතයත් අවදානමේ මේ කටයුත්ත නිසා. ඒත් තවමත් ඔබේ උදව් නැතුව මට මේක කරගන්න හැටියකුත් නෑ. ඉතින් වොට්සන්? ඔබේ පරණ නිවහනට ඔබ ඇවිත් ඉන්නවා දකින්නත් සන්තෝෂයි. ඔබ ආවෙ ඉතාම වැදගත් අවස්ථාවක."

එහෙම කතාවක් මටත් අහන්න ලැබුණා.

"දන් ඉතින් ඔය වැඩ නවත්වලා බිලීට මෙතැනින් යන්න පුළුවනි. වෙලාවකට මේ කොල්ලා හරි කරදරයක් වොට්සන්. මං නිසා ඔහුව මේ හැටි අවදානමකට ලක් කරන්නෙ කොහොමද?"

"මොකක්ද හෝම්ස් මෙතැන තියන අවදානම?"

"අවදානමද? ක්ෂණිකව මරණයට පත්වීම! අද හැන්දෑ වෙනකොට මොනවා හරි සිදුවෙන්න ඉඩ තියෙනවා."

http://sherlockholmesinvestigations.blogspot.com

"මොනවා හරි කීමෙන් මොකක්ද ඔබ අදහස් කළේ?"

"මාව මරා දමන්න!"

"මොනවා? නෑ නෑ. ඔබ විහිළු කරනවා හෝම්ස්.?"

"කිසි විහිළුවක් නෑ. විහිළු කතා කියන්න මං දක්ෂයෙක් නොවුණත්, මේක නම් විහිළුවක් නෙමෙයි."

"දන් ඉතින් ඔය ගැන නොහිතා, අපි ටිකක් හිත සැනසෙන කතාබහක යෙදෙමු. මද්‍යසාරය ටිකක් පිළිගන්වන්න අවසරද? සෝඩා සයිෆනය හා සුරුට්ටු ඇත්තෙ පරණ තැනමයි. මං වඩාත් කැමතියි වොට්සන්, ඔබ ඔබේ පරණ හාන්සිපුටුවේම වාඩිවෙනවා දකින්න. මගේ පයිප්පෙට මං යොදාගන්නා සැර දුම්කොළවල දුම, තවමත් ඔබට පිළිකුල් නැතුව ඇති කියලා මං විශ්වාස කරනවා. මේ දවස්වල ආහාර වේල වෙනුවට මං ගන්නේ එයයි."

"ඔබ කෑම කන එක අත්හැර දමල තියෙන්නේ ඇයි?"

"ඒ මොකද දන්නවද? සිරුර නිරාහාරව තැබීමෙන් තර්කන ඥානය වඩාත් තියුණු වෙනවා. ඇයි වොට්සන් වෛද්‍යවරයෙක් හැටියට, ඔබ මේවා හොඳින් දන්නවා ඇති නේ. ආහාර ජීර්ණය සඳහා, අවශෝෂණය සඳහා, සිරුරේ තුවන ලේ විශාල වශයෙන් උදරයට ගමන් කරනවා. එතකොට එම ලේ ප්‍රමාණය මොළයට නොලැබී යනවා. මගේ සිරුර ගැන හිතුවොත් ඒකෙ ප්‍රධානම, වැදගත්ම, සැලකිය යුතුම කොටස මොළය. සිරුරේ අනෙක් සියලුම කොටස්, නොවැදගත් උපාංගයන් පමණයි. ඒ හින්ද, මං ප්‍රධානම තැනක් දෙන්නෙ මොළයට."

"මොකක්ද හෝම්ස් මේ අන්තරාය දායක තත්ත්වයක් ගැන කිව්වෙ?"

"ආ ඔව්. ඒක සිද්ධවුණොත්, ඊට අදාල පුද්ගලයින් කවුද කියන එක ඔබ දන සිටිය යුතුයි. මිනීමරුවාගේ නමත් ලිපිනයත් මං ඔබට කියන්නම්. ඒක හොඳින් මතක තියාගෙන ඉඳලා ස්කොට්ලන්ඩ්යාඩ් පොලීසියට දැනුම්දෙන්න. ඔහුගේ නම සිල්වියස්-නෙග්‍රෙටෝ සිල්වියස් ආදිපාදවරයා. ලියාගන්නවා මනුස්සයෝ! ඒක ලියාගන්නවා! ලිපිනය අංක 135, මුවර්සයිඩ් උද්‍යානය, වයඹ දිග ලන්ඩනය. හරිද?."

http://sherlockholmesinvestigations.blogspot.com

අසන්නට ලැබුණු දෙයින් වොට්සන් ඉමහත් කැලැඹීමට පත් විය. හෝම්ස් මුහුණපා සිටින්නේ භයානක අවදානම් තත්ත්වයකටයි. ඒ ගැන සිතද්දී තම මුහුණේ මස්පිඬු වේදනාවෙන් හිරිවැටී ගියාක් මෙන් වොට්සන්ට දැනිණි. තම මිත්‍රයා මෙවැනි අවදානම් තත්ත්වයක් ගැන කියන්නේ අතිශයෝක්තියෙන් නොවේ. ඔහු මෙවැන්නක් දැනුම්දෙන්නේ, සත්‍ය වශයෙන්ම ඇති තත්වයට වඩා තවත් සැර අඩුකොට බව, වොට්සන් දැනසිටියේය. දොස්තර වොට්සන් මෙවැනි වේලාවක තම මිත්‍රයා වෙනුවෙන් ඔහු හා එක්ව සටනකට උරදීමට සූදානම් පුද්ගලයෙකි.

"මාත එනවා හෝම්ස් ඔබ සමග. මං සූදානම් ඕනෑම දේකට. දවසකට හෝ දෙකකට, මට යෙදෙන්න කිසි වැඩක් නැහැ."

"ඔබේ ගතිගුණ නම් හොඳ පැත්තනට හැරෙන පාටක් මට පෙනෙන්නෙ නෑ මිත්‍රයා. ඔබ දැන් බොරු කියන්නත් පටන් අරගෙන. ඔබ බොහොම අවිවේකී වෛද්‍යවරයෙක් බව බැලූ බැල්මටම පෙනෙනවා. ඔබෙන් ප්‍රතිකාර ගන්න, රෝගීන් වැළ නොකැඩී එන බවට කිසිම සැකයක් නෑ."

"ඒ තරමටම බරපතල අසනීප ඇති අය නැහැ. ඒක නෙවෙයි. මේ අපරාධකාරයා අත් අඩංගුවට ගන්න ක්‍රමයක් නැද්ද?

"බැරිකමක් නෑ වොට්සන්. ඒක මට පුළුවනි. ඔහුගේ හිතේ ඇති වී තිබෙන භීතියත් ඒකයි."

"ඉතින් ඇයි ඔබ එහෙම නොකරන්නෙ?"

"එහෙම නොකරන්නෙද? මං තවම දන්නෙ නෑ මැණික තියෙන්නෙ කොහේද කියලා. අන්න ඒකයි ප්‍රශ්නෙ."

"ආ! බිලී මට ටිකක් කිව්වා. ඔය කියන්නේ අර ඔටුන්නෙන් අතුරුදන්වූ මැණික නේද?"

"හරියට හරි. ඔටුන්නට සවිකර තිබූ කහපාට පුෂ්පරාගය. අපරාධකාරයා අල්ලාගන්න. මං දැල එළලයි තියෙන්නේ. මාළුවා ඒකෙ පැටළිලා ඉන්නවා ඒත් මැණික නැහැ. ඉතින් ඔහුව අත් අඩංගුවට ගැනීමෙන් ඇති ප්‍රයෝජනේ මොකක්ද? ඔවුන් භය කරලා මේ රටින් පන්නා දමන්නත් පුළුවනි. නැත්නම් හිරේ දමන්න පුළුවනි. එතකොට ලෝකය නම් වඩා යහපත් තැනක් වෙන බව ඇත්තයි.

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

නමුත් මට භාර කටයුත්ත ඒක නෙමෙයි. මට ඕනෑ කරන්නේ මැණික."

"මේ සිල්වියස් ආදිපාදවරයා ඔබේ දලේ පැටලී ඉන්න එක් මාළුවෙක්ද?"

"ඔව්. ඔහු තමයි ප්‍රධානම එකා. මිනීමෝරා.... ඌ හපා කනවා. අනෙකා තමයි සෑම් මර්ටන් - බොක්සිං ක්‍රීඩකයා. ඌ ස්වභාවයෙන් නරක මිනිහෙක් නෙමෙයි. මිනීමෝරෙක් නෙමෙයි. නමුත් තමන්ගේ මැරවරයෙක් ලෙස සිල්වියස් යොදාගෙන ඉන්නේ සෑම් මර්ටන්. ඔහු ශරීර ප්‍රමාණයෙන විශාල, නමුත් මෝඩයෙක්. කොහොම වුණත් මිනිහත් මගේ දලේ පැටලිලයි ඉන්නේ."

" සිල්වියස් ආදිපාදවරයා ගැවසෙන්නේ කොහේද?"

"උදේ වරුවෙම මං ඔහු ළඟ ගැවසුණා වොට්සන්. මං වයසක නෝනා කෙනෙක් වගේ වෙස් මාරුකරගෙන යන හැටි, ඔබ දකල ඇති නේද? හැබැයි, මේ තරම් හොඳට වෙස් මාරුකරගන්න මට කවදාවත් හැකිවුණේ නැහැ. මගේ කුඩේ මා අතින් වැටුණාම, ඔහු මට ඒකත් ඇහිඳලා දුන්නා. සිල්වියස්ගේ පරම්පරාවෙන් අඩක් ඉතාලි ජාතිකයෝ. ඉතාලිය වගේ දකුණු දිග යුරෝපීය රටවල මිනිසුන්ගේ තියෙනවා, අපේ නැති, ආචාරශීලී කරුණාවන්ත බවක්. සිල්වියස්ගෙත් වෙලාවකට ඒ ගතිගුණ තියෙනවා. හැබැයි අනෙක් වෙලාවලට යක්ෂයෙක් වගේ රෞද්‍රයි. ඔහොම තමා අපේ ජීවිත පිරී තිබෙන්නේ නොයෙක් අපූරු සිදුවීම් වලින්."

"අපූරුකම කොහොම වෙතත්, සිල්වියස් ඔබව හඳුනා ගත්ත නම්, ඒක ශෝකාන්තයක් ලෙස අවසන් වෙන්න ඉඩ තිබුණා.?"

"ඔව්. බාගවෙලාවට එහෙම වෙන්නත් ඉඩ තිබුණා. සිල්වියස් ගියේ කොහැනටද දන්නවද? ඔහු ගියේ ස්ට්‍රෝබෙන්සීගේ ආයුධ වැඩපොළට. මං ඔහු පසුපසින්ම ගිය නිසයි දන්නේ. ස්ට්‍රෝබෙන්සී තමයි. ඉතාම විශිෂ්ට නිර්මාණයක් වන වායු රයිෆල් හදන්න අතිදක්ෂයා. මං හිතන හැටියට ............සැකයක් නෑ ........ ඒ වායු රයිෆලයක්, මේ මොහොතේත් සූදානමෙන් තියෙනවා. කොහේද දන්නවද? අපේ මේ නිවහන ඉස්සරහම පාරෙන් අනෙක් පැත්තේ ගේක, ජනේලයක් පිටිපස. ඔබ දුටුවානේද වොට්සන්, ඉටිවලින් තනා තිබෙන මගේ ප්‍රතිමාව? බිලී ඔබට පෙන්වන්න ඇති නේ.

http://sherlockholmesinvestigations.blogspot.com

ඒකෙ හිසට කොයි මොහොතේ වෙඩි උණ්ඩයක් එල්ල වේවිද දන්නේ නෑ ..........ආ බිලී? .........මොකක්ද ප්‍රශ්නෙ?"

සේවක ළමයා බන්දේසියක තැබූ ආගන්තුක පත්‍රයක් රැගෙන කාමරයට ඇතුළුවිය. එය අතට ගත් හෝම්ස්ගේ මුහුණෙන් පළවූයේ මවිතයයි!

"ඔන්න වොට්සන් මතක් කරන කොටම ඒ යක්ෂයාම ඇවිත්! මේක මං බලාපොරොත්තු වුණු දේයක් නෙමෙයි. කැලෑවල තිබෙනවා එක් ගස් වර්ගයක්. ඒක ගෑවුණාම මුළු ඇඟම කහන්න ගන්නවා. ඉවසාගෙන ඉන්න බෑ. එක මොහොතක්. මෙයාටත් ඒ වගෙයි. අනෙක බලන්න, ඔහුගේ හිතේ තිබෙන භය නැතිකම. දවැන්ත, භයානක සතුන් දඩයම් කිරීමට ඇති දක්ෂතාවය ගැන සිල්වියස්ට කීර්ති නාමයක් ලැබිලා තියෙනවා. ඒ ගැන ඔබ අහල ඇති වොට්සන්. ඔහුගේ ඒ ප්‍රෞඪ දඩයම් ලේඛනයේ, අන්තිමට මගේ නමත් එකතු කරගන්න ඔහුට හැකිවුණොත් , ඒකත් විශිෂ්ට හපන්කමක්. නැද්ද? මං ඔහු පසුපස ඉතා ළඟින්ම හඹා එන බව ඔහුට වැටහිලා වගෙයි."

"අපි පොලීසිය කැඳවමු."

"ඔව්. මං ඉදිරියේදී කරන්නේ ඒ දේ තමයි. නමුත් දැන්ම නෙමෙයි වොට්සන්. ඔය ජනේලයෙන් යන්තමින් බලන්න. පාරෙ කවුරු හරි ඉන්නවද මේ පැත්ත බලාගෙන?"

"ඔව්. මැරවර පාට එළෙකක් ඉන්නවා, අපේ දොර ළඟම."

"ආ .... ඒ තමයි සෑම් මර්ටන්. බොහොම පක්ෂපාත, ඒහෙත් මන්දබුද්ධික සෑම්. කෝ බිලී මේ මහත්තයා?"

"අමුත්තන්ගෙ කාමරයේ බලාගෙන ඉන්නවා."

"මං සීනුව නාදකළාම ඔහුව මෙහේට කැඳවාගෙන එන්න."

"හොඳයි මහත්මයා."

"මං කාමරයේ පෙනෙන්න නොසිටියත් ඔහුව ඇතුළටම කැඳවාගෙන එන්න. ඊට පසු ඔබට යන්න පුළුවනි."

"හොඳයි මහත්මයා"

බිලී දොරවසාගෙන පිටතුව යන තුරු බලා සිටි වොට්සන්, හෝම්ස් දෙසට හැරුණේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මේ අහන්න හෝම්ස්. මේක තවත් බලාගෙන ඉන්න හොඳ දෙයක් නෙමෙයි. ඔහු ඉන්නේ ඔබත් එක්ක දැඩි වෛරයකින් නම්, තවත් ඉවසන එකක් නෑ. සමහරවිට ඔහු ඇවිත් ඉන්නේ ඔබව මරා දමන්න වෙන්නත් ඇති."

"එහෙම වුණොත් ඒකෙ පුදුමයක් නෑ"

"ඔබ සමග මාත් මෙතැන රැඳී සිටිය යුතුමයි.

"ඒකෙන්, කරන්න හදන කටයුත්තට බාධා සිදුවෙන්න පුළුවනි."

"ඔහු කරන්න හදන කටයුත්තටද?"

"නෑ මිත්‍රයා මං කරන්න හදන කටයුත්තට."

"කොහොම වුණත් ඔබව තනිකර දාල ගියොත් ඔබේ ජීවිතය අවදානමේ. මට එහෙම යන්න හැටියක් නෑ."

"නැහැ.ඔබට පුළුවන් වොට්සන්. ඔබ යා යුතුමයි. මෙහෙම වෙලාවලදි ඔබ මට බාධා කරල නැහැ. අවසානය දක්වා ඔබ මට සහාය වන බව, මට විශ්වාසයි. මේ මිනිහා ඇවිත් ඉන්නේ, ඔහුගේ යම් අරමුණක් ඉටු කරගන්න. නමුත් මගේ අරමුණත් ඉෂ්ට කරදෙන්න ඔහු රැඳී ඉඳීවි."

සටහන් පොතක් අතට ගත් හෝම්ස්, එහි කොළයක යමක් කුරුටුගෑවේය.

"කුලීරියක නැගිල යන්න ස්කොට්ලන්ඩ්යාඩ් වෙත. රහස් පොලිස් අංශයේ පරීක්ෂක යුගල්ට මේ ලියුම දෙන්න. පොලීසිය කැඳවාගෙන ආපසු එන්න. එතකොට මිනිහව අත් අඩංගුවට ගන්න පුළුවනි."

"ඒ ටික මං බොහොම සන්තෝෂෙන් කරන්නම්."

"ඔබ ආපහු එන්න කලින්, මැණික හංගාගෙන ඉන්නේ කොහේද කියලා මං දැනගන්නම්. මට ඒකට යන්තමට වෙලා ඇතිවේවි." කී හෝම්ස් සීනුව නාදකළේය.

"අපි නිදන කාමරය පැත්තෙන් පිටවෙමු වොට්සන්. මේ අමතර දොර හරිම ප්‍රයෝජනවත්. මං අල්ලාගන්න බලාපොරොත්තු-වන මිනීමෝරා, මාව දකින්න පෙර, මං කැමතියි ඔහුව හොඳට

http://sherlockholmesinvestigations.blogspot.com

බලාගන්න. ඔබ දන්නවනේ මගේ ඒ සඳහා විශේෂ ක්‍රම තිබෙන බව."

හෝම්ස් වොට්සන් දෙදෙනාම, හෝම්ස්ගේ නිදන කාමරයට ඇතුළුවූහ. එහෙයින් බිලී අමුත්තා කැඳවාගෙන ආවේ, හිස් විසිත්ත කාමරයටයි.

රාජාලියෙකුගේ හොටයක් වැනි, එක් වූ විශාල නාසයක් ද, කුරිරු බව පිළිබිඹු වෙන සිහින් රළු තොලක් ද, විශාල උඩු රැවුලක් හා යෝධ සිරුරක් ද සිල්වියස් ආදිපාදවරයා සතු විය. හොඳ ඇඳුම් කට්ටලයකින් සැරසී සිටි ඔහු, රනින් නිමකළ, මුදු ටයි කටු ආදී දිලිසෙන ආභරණ පැළැඳ සිටියේය. බිලී දොරවසාගෙන පිටවී ගියේය. දක්ෂ දඩයක්කාරයකු ලෙස සුප්‍රසිද්ධ සිල්වියස් ආදිපාදවරයා, කාමරයට ඇතුළු වූ වහාම, ක්ෂණිකව වටපිට බැලුවේය. ඒ, කොයි මොහොතේ තමා උගුලකට හසුකර ගනීවිදැයි සැකයෙන් සිටින පුද්ගලයෙකු විලසිනි.

ජනේලය අසල වූ හාන්සිපුටුව දෙස බැලූ සිල්වියස් තිගැස්සුණේය. ෂර්ලොක් හෝම්ස් හාන්සිපුටුවේ වාඩිවී, නිහඬව ඉවත බලාගෙන සිටියේය. තම බලාපොරොත්තු ඉටු කර ගැනීමට මේ නම් සුවිශේෂ අවස්ථාවකි. ලැබී ඇති අවස්ථාවෙන් වහා ප්‍රයෝජන ගත යුතුය යන හැඟීමෙන්, ඔහුගේ මිනීමරු දෑස් දිලිසෙන්නට විය. තමා කරන දේ කිසිවෙකු දකීදැයි විමසීමට, ඔහු තව වරක් ආපසු හැරී බැලුවේය. කිසිවෙකු නැත. පාවහන්වලින් ශබ්දයක් නොනැගෙන සේ සිල්වියස් හෙමින් හෙමින් ඉදිරියට ඇදුණේය. ඒ ඔහු නිතර ළඟ තබාගන්නා බර සැරයටිය ඔසවාගෙනයි. හාන්සිපුටුවේ නිහඬව සිටි හෝම්ස්ගේ හිසට, මරු පහරක් එල්ල කිරීමට ඔහු සැරයටිය එසවූවා පමණි. නිදන කාමරයේ දොර දෙසින් උපහාසාත්මක හඬක් ඇසිණි

"ඒක අපරාදේ කඩා දමන්න එපා! ආදිපාදතුමනි, ඒක කඩා දමන්න එපා!"

මේ බිහිසුණු පුද්ගලයා එක්වරම විස්මයට පත්විය. ඔහුගේ මුහුණේ දිස්වූයේ, කුරිරු හැඟීම් නිසා විරූපී වූ ලක්ෂණයි. මේ ශ්‍රවණ මායාවක්දැයි සිතූ ඔහු, යළිත් වරක් සැරයටිය එසෙව්වේය. එහෙත් මෙවර නිදන කාමරයේ දොර දෙසින් අසන්නට ලැබුණේ උපහාසාත්මක සිනහවක හඬකි.

http://sherlockholmesinvestigations.blogspot.com



223. "ඒක අපරාදෙ කඩා දමන්න එපා!"

http://sherlockholmesinvestigations.blogspot.com

"මේක ඉතාම විශිෂ්ට නිර්මාණයක්." ෂර්ලොක් හෝම්ස් පැවසුවේ නිදන කාමරයේ දොරින් විසිත්ත කාමරයට පා තබමිනි.

"මේක තෙළුවේ ප්‍රංශ ජාතික ප්‍රතිමා ශිල්පියා - ටැවනියර්. ඔබේ මිත්‍රයා ස්ට්‍රෞබෙන්සි, වායු රයිපල් හදන්න දක්වන දක්ෂතාවය වගේම, ඉටියෙන් පිළිම නෙලන්න ටැවනියර් හරිම දක්ෂයි."

"වායු රයිපල්? මොනවද ඔබ මේ කියන්නෙ?"

"ආදිපාදතුමනි. ඔබේ තොප්පියත්, අතේ තිබෙන සැරයටියත් ඔය මේසය උඩින් තියන්න. අන්න හරි. බොහොම ස්තූතියි. දන් කරුණාකර වාඩිවෙන්න. ඔබේ පිටුපස සාක්කුවේ තිබෙන රිවෝල්වරයත් කරුණාකරල එළියෙන් තියන්න පුළුවන්ද? හැබැට? ඔබ කැමැති ඒක එළියට නොගෙන, කලිසම් සාක්කුවෙම තියාගන්නද? බොහොම හොඳයි. හොඳ වෙලාවට ඔබ මාව හමුවන්න ආවෙ. ඔබ එක්ක මිනිත්තු කිහිපයක සාකච්ඡාවක් කරන්න, මං ලොකු උවමනාවකින් හිටියෙ."

ආදිපාදවරයාගේ මුහුණේ මතු වූයේ අප්‍රසන්න බැල්මකි.

"මටත් ඕනැවුණා හෝම්ස් ඔහේ එක්ක වචන කිහිපයක් කථා කරන්න. ඒකයි මං මේ ආවෙ. දන් මොහොතකට කලින් මං සූදානම් වුණේ ඔහේගෙ ඔලුවට පොලු පාරක් දෙන්නයි. මං ඒක නැහැ කියන්නෙ නෑ......."

".......ඔබේ හිතේ ඒ වගේ අදහසක් පහළ වී තිබෙන බව මට අහන්න ලැබුණා. ඒ වුණත් ඇයි පෞද්ගලිකවම මාව හොයාගෙන එන්නෙ.?"

"තමුසෙව හොයාගෙන එන්නෙ? තමුසෙ මොකද තමුසෙගෙ පාඩුවේ ඉන්නෙ නැතිව, මගේ වැඩකටයුතුවලට ඇඟිලි ගහන්නෙ? තමුසෙ මං ගැන ඔත්තු බලන්න එකා එකා යොදවන බව මං දන්නෙ නෑ කියලද හිතන්නෙ?"

"එක එකා යොදවනවා? මං ඔබට සහතික වෙන්නම්. ඒක බොරුවක්." හෝම්ස් කීය.

"මොන විකාර කතාවක්ද ඒ? මමත් උන් පිටිපස්සෙන් මිනිස්සු යවල හොයා බැලෙව්වා. තමුසෙට පුළුවන් නම්,මටත් පුළුවන් හෝම්ස් ඔය සෙල්ලම කරන්න."

Reading Purpose Only - Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

"මං ඔබට පුංචි කාරණාවක් මතක් කර දෙන්නම් ආදිපාද තුමනි. මාව අමතන කොට 'හෝම්ස් මහත්මයා' කියල කතා කරන්න. ඔබට තේරෙනවා නේද? මගේ රැකියාවේ හැටියට මට කටයුතු කරන්න වෙන අයගෙන් භාගයක්ම, හොම්මර එකේ හොර තක්කඩි. උන් හැම එකෙක්ම මගේ ළඟ මිත්‍රයෙක්, වගේ නිකම්ම 'හෝම්ස් කියල කියන කොට මට හිතට අමාරුයි."

"හොඳයි හෝම්ස් මහත්තයා!! මොකක්ද දන් ඔහේ......."

".......අන්න බොහෝම හොඳයි! කොහොම වුණත් මං ඔබට සහතික කර කියන්නම් ඔබේ ඔත්තු බලන්න ඔය කිව් විදියට, මං එක එකා එව්වේ නැහැ."

සිල්වියස් ආදිපාදධුර්යාගේ මුවෙන් නිකුත්වූයේ අවඥා සහගත සිනහවකි.

"අනික් මිනිස්සුන්ටත් පුළුවනි, ඔහේට වගේම සිදුවීම් නිරීක්ෂණය කරන්න. ඊයේ මං එළියෙන් ආව, රේස් ඔට්ටුදාන නාකි රස්තියාදුකාරයෙක්. අද නාකි නෝනා කෙනෙක්. උන් දවස පුරාම හිටියේ මගේ පිටුපසින්. මං ගියේ කොහේද උනුත් ආව මා ළඟින්ම."

"ආදිපාදතුමනි, ඇත්තම කියනවා නම්, ඔබ මගේ හපන්කම් වර්ණනා කරන හැටි අහන්නත් අන්තෝෂයි. ඔබ දන්නවද නාකි ඩෝසන් වංශාධිපතියා, එල්ලුම් ගස් යනදාට කලින් දවසේ, මා ගැන කියූ කථාව? ඔම මේ වෘත්තියේ යෙදෙන්න පටන් ගත්ත එකෙන්, නීති ක්ෂේත්‍රයට විශාල වාසියක් වුනාට රංගන ක්ෂේත්‍රයට වුණේ විශාල පාඩුවක්ලු. මගේ ඉතා සුළු රහපෑම් පවා, ඔබ දන් ඉහළ ඇගයීමකට ලක් කළා නොවැ."

ඔබ මා ගැන සැක කරන්න පටන්ගන්න කලින්, මට ඔබ ඇඟිදල දුන්නු පරණ කුඩේ, අර තියෙන්නෙ කාමරේ මුල්ලෙ."

"මං දනගෙන හිටිය නම් ඒ තමුසෙ කියල ....... මං තමුසෙට .......!"

"එහෙනම් මට මෙලොවෙ ජීවත්වෙන්න ඉඩ තියන්නෙ නෑ නේද ආදිපාදතුමනි. හොඳ ප්‍රයෝජනයක් ගැනීමට තිබූ අවස්ථාවක් නිකම්ම අපතේ ගියා. අප කාටත් ඔය වගේ පාඩු සිදුවෙනවා. ඒ

http://sherlockholmesinvestigations.blogspot.com

වෙලාවෙ ඔබට මාව අඳුනාගන්න බැරිවුණා. ඒ නිසා මෙන්න දැන් අප දෙදෙනා මුහුණට මුහුණ."

ආදිපාදවරයාගේ කුරිරු දෑස්වලට ඉහළින් පිහිටි ඇහිබැම, ඉහළට එසවුණේ, මුහුණේ රෞද්‍ර බව මූර්තිමත් කරමිනි.

"හෝම්ස්. ඔහේ කියන දේවල්වලින් ප්‍රශ්නය තවත් අවුල් වෙනවා මිසක් විසඳෙන්නෙ නෑ. මගේ පසුපස්සෙන් ආවෙ තමුසෙමයි කියලා පිළිගත්ත නේද? තමුසෙ මොන එකකටද එහෙම ආවෙ?"

"ඒකට හේතුව මං කියා දෙන්නම් ආදිපාදතුමනි. ඔබතුමා ඉස්සර ඇල්ජීරියාවේ සිංහයො දඩයම් කළා. එහෙම නේද?"

"ඔව්. ඉතින්?"

"ඒ මොකක් නිසාද?"

"මොකක් නිසාද? විනෝදෙට. මට ත්‍රාසජනක බිහිසුණු ක්‍රීඩාවක යෙදෙන්න උවමනා වුණු නිසා."

"ඇයි ආදිපාදතුමනි, ඔබට අමතක වුණු තවත් කාරණයක් මං කියන්නම්. සමාජයට විනාශකාරී දුෂ්ට, බිහිසුණු සතෙකුගෙන්, සමාජය මුදවා ගැනීමේ යහපත් චේතනාවෙනුත් නේද?"

"අන්න හරියට හරි."

"ආදිපාදතුමනි. කෙටියෙන් කියනවා නම්, මගේ චේතනාව වුණෙත් ඒකමයි!" හෝම්ස් කීය.

සිල්වියස් ආදිපාදවරයා පුටුවෙන් ඉහළට එසැවුණේ, දුන්නකින් ඉහළට විදිනු ලැබුවාක් මෙනි. කෝපයෙන් පිපිරෙමින් සිටි ඔහුගේ අත, නිරායාසයෙන්ම පිටුපස සාක්කුව වෙත ගියේය.

"වාඩිවෙන්න මහත්මයා! වාඩිවෙන්න!" හෝම්ස් කෑ ගැසීය.

"මගේ තවත් අරමුණක් තිබුණා. මට ඕනකරල තියෙනවා, අර කහපාට පුෂ්පරාගය."

සිල්වියස් ආදිපාදවරයා යළිත් අසුන් ගත්තේය. ඔහුගේ මුහුණේ නැඟුණේ කුරිරු සිනාවකි.

"ඔහේ ඔය කියන දේ ගැන, මම මුකුත්ම දන්නෙ නෑ. දෙයියම්පා!"

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only. Not For Print.

"ආදිපාදතුමනි. ඔබ දන්නවා, මං ඔබ පිටුපසින්ම ආවේ ඒක දැනගන්න. ඔහේ මේ බේකර් වීදියට මාව හොයාගෙන ආවෙත් ඒකට. මං ඒ ගැන කොයිතරම් තොරතුරු දන්නවාද කියල හොයාගෙන මාව මෙලොවින් තුරන් කරන්න. ඔබතුමාගේ පැත්තෙන් බැලුවොත් ඒක අත්‍යාවශ්‍යයි. ඒ මොකද, ඒ මාණික්‍යය මේ වෙලාවෙ තියෙන්න කොහේද කියන ඒක ඇරෙන්න, අනිත් හැමදෙයක්ම මං දන්නවා."

සිල්වියස් ආදිපාදවරයා ෂර්ලොක් හෝම්ස් වෙත හෙළුවේ තියුණු බැල්මකි. "ඔහේට මගෙන් දැනගන්න උවමනා ඒ දෙයයි එහෙනම්? හැබෑට? මේක යකාගෙ වැඩක්නේ. මං කොහොමද ඒ මැණික තියන තැන දන්නේ?"

ඔබ ඒක දන්නවා. ඔබ ඒක මට කියන බව සහතිකයි."

"අනේ ඇත්තට?"

"මට බොරුකරන්න ඔබට බෑ ආදිපාදතුමනි." හෝම්ස් කීවේ සිල්වියස්ගේ දෑස් වෙත තියුණු බැල්මක් හෙළමිනි. "ඔහේ හරියට වීදුරු තහඩුවක් වගෙයි. ඔහේගේ මනසේ අන්තිම කෙළවරටම යනතුරු, මට පැහැදිලිව පෙනෙනවා."

"එහෙනම් ඉතින් මාණික්‍යය තියෙන්නේ කොහේද කියලත් ඔහේට පෙනෙනවා ඇති!"

හෝම්ස් ඊට සතුටින් අත්පොලසන් දුන්නේය. "අන්න හරි! ඒ කියන්නේ ඔබ ඒක දන්නවා. ඔබ ඒ බව පිළිගත්තා!"

"මං පිළිගත්තු දෙයක් නෑ."

"ආදිපාදතුමනි. ඔබ තර්කානුකූලව, බුද්ධිමත්ව හිතනවා නම්, අපට පුළුවනි පොඩි ගනුදෙනුවක් කරන්න. එහෙම නැතිවුණොත් ඔබට නොයෙක් කරදර හිරිහැරවලට මුහුණපාන්න වෙනවා."

සිල්වියස් තම දෙනෙත් සිවිලිම දෙසට යොමුකර ගත්තේය.

"ඔය බොරු කතාවලින් මාව රවටගන්න බෑ හෝම්ස්."

හෝම්ස් මඳ වෙලාවක් ආදිපාදවරයා වෙත නිහඬව බලා සිටියේය. දක්ෂ චෙස් ක්‍රීඩකයෙකු ජයග්‍රහණයේ අවසන් පියවර සඳහා, ඉත්තන් චලනය කරන්නේ දැඩි විශ්වාසයකිනි. එවැනිම විශ්වාසයකින් යුතුව, තම ලාච්චුව විවෘත කොට, හෝම්ස් සටහන් පොතක් ඉවතට ගත්තේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"මං මේ පොතේ සටහන් කරගෙන ඉන්නේ මොනවද කියල ඔබතුමා දන්නවද?" හෝම්ස් ඇසීය.

"මං දන්නෙ කොහොමද?"

"ඔබ ගැන"

"මං ගැන?"

"ඔව් මහත්මයා. ඔබ ගැන හැම තොරතුරක්ම, ඔබේ දුෂ්ට, වංචනික ක්‍රියා හැම එකක්ම."

"උඹ යකාට බිලිවෙන්න ඕන හෝම්ස්! මගේ ඉවසීමේත් සීමාවක් තියෙනවා!"

"මේ පොතේ හැම දෙයක්ම අඩංගුයි. මතකද ඔබ අර සුදුවර ගිහිං අහිමිකර ගත්තු බ්ලයිමර් වතුයාය......? අන්න ඒක අයිතිව හිටි, වයසක හැරල්ඩ් තෝනා මහත්මියත් මතක ඇතිනේ. ඇය ඇත්තටම මියගියේ කොහොමද කියන එක මේ පොතේ සඳහන්."

"තමුසේ හීනයක් දැකලද කොහෙද?"

"ඊළඟට මේ පොතේ අඩංගුයි, මිනී වොරෙන්ඩර් මෙනෙවිය ගැනත්........ ඇයගේ සම්පූර්ණ ජීවිත කථාව........ ඇයට අත්වුණු බිහිසුණු ඉරණම!"

"හුං ඒ කිසි දෙයක් ඔප්පු කරන්න බෑ."

"තවත් හුඟක් කාරණා මේකෙ තියනවා ආදිපාදතුමා. 1892 පෙබරවාරි 13 වැනිදා රිවෙයිරාවට ගිය සුඛෝපභෝගී දුම්රිය මංකොල්ලකෑවා. ඒක කළේ කවුද? කොහොමද ආදී විස්තරත් මෙහි සඳහන්. ඊටත් පස්සේ තියෙනවා, ලියොන්ස් බැංකුවේ චෙක්පතකට හොර අත්සන් ගහලා, මුදල් වංචා කළ කටයුත්තක් ගැන.

"අන්න එතැනදි නම් ඔහේට වැරදුණා හෝම්ස් මහත්තයෝ"

"ඒ කියන්නේ අනිත් ඒවා හරි නේද ආදිපාදතුමනි. ඔබ කාඩ් ක්‍රීඩාවට අතිදක්ෂයෙක්. හොඳ තුරුම්පු කොළ ඔක්කොම තියෙන්නේ ප්‍රතිවාදියා අතේ නම්, ඒ කාඩ් අත සෙල්ලම් කරල වැඩක් නැහැ නේද? ඒ කාඩ් අත අකුලා දමන එකෙන් කාලයත් ඉතිරිවෙනවා. එහෙම නේද ආදිපාදතුමනි?"

"හෝම්ස් ඔහේ කිව්ව මැණිකෙයි, මේ කථාවලයි තිබෙන සම්බන්ධය මොකක්ද?"

Reading Purpose Only.. Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

"කලබල වෙන්න එපා ආදිපාදතුමනි. ඔබේ ඔය චංචල මනස ටිකක් සන්සුන් කරගන්න. මට පුරුදු විදියට, හෙමින් හෙමින්, එකින් එක විස්තර කරන්න මට ඉඩදෙන්න. මං අර කලින් කියූ හැම සිද්ධියක්ම, අධිකරණයක දී සැකෙන් තොරව ඔප්පු කර පෙන්වන්න සාක්ෂි මා ළඟ තියෙනවා. ඊට අමතරව ඔටුන්නේ මාණික්‍යය හොරකම් කිරීම ගැන, ඔබටත් ඔබේ සහචරයාටත් එරෙහිව පැහැදිලි සාක්ෂි රැසක් මං එකතුකරගෙන තියෙනවා."

"හැබෑට?"

"ඔබ වයිට්හෝල් දක්වා ගෙනගිය කුලී රථ රියැදුරා. ඔබ එතැන සිට ආපසු ගෙන ආ රථයේ රියැදුරා: ඔවුන් දෙදෙනාම සූදානම් සාක්ෂි දෙන්න. ඔබ ඔටුන්න අසල ගැවසෙනවා දුටු ආරක්ෂක නිලධරයා ඉන්නවා. ඒ විතරක් නොමෙයි. මැණික කප්පවා ගන්න ඔබ ඒක අරගෙන ගියා, අයිකි සැන්ඩර්ස් ළඟට. ඔහු ඒ කටයුත්ත ප්‍රතික්ෂේප කළා. ඔහු මට සැම දෙයක්ම හෙළි කරලයි තියෙන්නේ: ඒ හින්දා තවත් කථා කරල වැඩක් නෑ."

සිල්වියස් ආදිපාදවරයාගේ නළලේ ලේ නහර ඉලිප්පී පෙනෙන්නට විය. ඔහුගේ සිතට නැඟුණු දැඩි ආවේගය මැඩපවත්වා ගත් අයුරු, දැත් මිට මොළොවා ගත් හැටියෙන් තේරුම් ගැනීමට හැකිවිණි. ඔහු යමක් කීමට උත්සාහ කළත්, මුවෙන් කිසිදු ශබ්දයක් පිටනොවීය.

"මගේ කාඩ් අතේ හැටි එහෙමයි." හෝම්ස් කීය. "ඒ නිසා ඔන්න මං ඒක මේසය උඩ තියලා ඔබට පෙන්නුවා. මට අඩු එකම කොළයයි. ඒ රුවිත හේරා - දියමන්ති රජ්ජුරුවෝ. ඒක කොහේද කියලා මං තවමත් දන්නේ නෑ."

"ඔහේට ඒක ජීවිතේටම දැනගන්න ලැබෙන්නෙත් නෑ."

"නෑ?"

"නැහැ හෝන්නාම්."

"ආදිපාදතුමනි. මේ ගැන තව ටිකක් තර්කානුකූලව හිතල බැලුවොත් හොඳ නේද ? මං මුලින් කී කාරණාවලට අදාල සාක්ෂි අධිකරණයකට ඉදිරිපත් කළාම, ඔබට ලැබේවි අවුරුදු 20ක සිර දඬුවමක්. සෑම් මර්ටන්ටත් එච්චර විතරම ලැබේවි. එතකොට අර මාණික්‍යය හංගාගෙන ඉඳීමෙන්, ඔබට ලැබෙන ප්‍රයෝජනය

http://sherlockholmesinvestigations.blogspot.com

මොකක්ද? කිසිම දෙයක් නෑ. නමුත් ඔබ මට කහ පුෂ්පරාගය භාරදෙනවා නම්? එහෙනම් ඒවා සහගත වැඩකට හවුල්වෙන්න මම සූදානම්. අපට ඔබවත්, සෑම් මර්ටනවත් ඕනෙ නැහැ. උවමනා කරන්නේ මැණික පමණයි. මට ඒක දුන්නාම, මං ඔබට යන්න ඉඩහරිනවා. ඔබට නිදහසේ ජීවත්වෙන්න පුළුවනි. මං ඔබ හිරභාරයට පත් නොකරන්නේ, ඔබ ඉදිරි කාලයේදී හොඳින් ජීවත්වෙන බවට වෙන පොරොන්දුව මත. ඔබ යළිත් එසේ වැරැද්දක් හරි කළොත් ? එහෙම වුණොත් ඒක ඔබේ අවසාන වැරැද්ද වේවි. මේ වාරයේ මට භාරවෙලා තියෙන්නේ, මැණික හොයා ගැනීම මිස, ඔබේ අල්ලා ගැනීම නෙමෙයි."

"මං ඒව හෙළිකිරීම ප්‍රතික්ෂේප කළොත්?"

"ඔව්. එහෙම වුණොත් බොහොම කණගාටුයි. අපට ඔබ හිරභාරයට ගන්න සිදුවෙනවා."

ෂර්ලොක් හෝම්ස් සීනුව නාද කළවිට, බිලී විසිත්තකාමරය වෙත පැමිණියේය.

"ආදිපාදතුමනි. මං හිතන්නේ මේ ගැන, ඔබේ මිත්‍රයා සෑම් එක්කත් සාකච්ඡා කරල බැලුවොත් හොඳයි. ඇයි ඉතින් මේ ගැන ඔහුටත් අයිතියක් තියෙනවානෙ.

බිලී. අපේ ගේ ඉදිරි දොරටුව ළඟ පාරේ ඇති, ප්‍රමාණයෙන් විශාල එහෙත් අවලක්ෂණ මහත්මයෙක්. ඔහු උඩතට්ටුවට කැඳවාගෙන එන්න."

"ඔහු එන්න බැහැ කිව්වොත්?"

"ඔහුව බලෙන් මෙහේට ගෙනෙන්න හදන්න එපා බිලී. ඔහුට මොකුත් හිරිහැරයක් කරන්න එපා. සිල්වියස් ආදිපාදතුමා, අඬගහනවා කිව්වොත්, ඔහු ඒවි."

"මොකක්ද හෝම්ස් ඔහේ දැන් කරන්න සූදානම් වෙන්නේ?" බිලී දොර වසාගෙන පිට වී ගිය පසු, ආදිපාදවරයා ඇසීය.

"දැන් ටික වෙලාවකට කලින්, මගේ මිත්‍රයා දොස්තර වොට්සන්, මා හමුවෙන්න ඇවිත් ඉඳලා ගියා. මං ඔහු එක්ක මේ කතාව කිය කියා හිටියෙ : මං දැලක් දාලා තියෙනවා. ඒකෙ පැටළී ඉන්නවා ලොකු මෝරෙක් සහ හාල්මැස්සෙක්. මං දැල උඩට අදින කොට, ඔන්න දැන් දෙදෙනාම දැලත් එක්ක උඩට ඇදීගෙන එනවා......."

හෝම්ස් කථාකරද්දීම, ආදිපාදවරයා පුටුවෙන් නැගිට අවසන්ය.

http://sherlockholmesinvestigations.blogspot.com

එක් ක්ෂණයකින් ඔහුගේ දකුණත සිරුර පිටුපසට ගියේය. හෝම්ස් තම පිට කබායේ සාක්කුවට අත දමා, එහි එළියට නෙරා තිබූ යමක් ග්‍රහණය කළේය.

"හෝම්ස්. තමුසෙ හිතන්නේ, තමුසෙගෙ පණ යන්නේ නින්දෙදිම කියලද? ඒක නම් කවදාවත් වෙන්නේ නෑ."

"මටත් ඕක නිතර හිතිල තියෙන දෙයක් ආදිපාදතුමනි. මැරෙන වෙලාවට අපි කොහොම මැරුණාම මොකද? ඒ වුණත් සිද්ධවෙලා තියෙන දේවල් වල හැටියට, ආදිපාදතුමාගෙ පණ යන වෙලාවට, ඔබ ඉන්නෙ ඔලුව කෙළින් කරගෙන, සිරස් අතට බව මට විශ්වාසයෙන් කිව්ව හැකි.ඒ මොකද කෙනෙක් එල්ලුම්ගස් ගියාම පණයන්නෙ ඔලුව කෙළින් කරගෙන ඉඳිද්දී නොවැ.

ඒ වුණත් මේ අනාගතයේ සිදුවෙන්න තිබෙන මරණය ගැන හිත හිත මොකටද අපි දුක්වෙන්නේ? වර්තමානයේ අපට තියෙන නිදහස සන්තෝෂයෙන් භුක්ති විඳින්නයි තියෙන්නෙ. එහෙම නේද?"

සිල්වියස් නම් මේ බිහිසුණු අපරාධකරුගේ දෙනෙත, ගොදුරක් වෙත කඩා පැනීමට සූදානම් තිරිසනෙකුගේ මෙන් දිළිසිණි.

"ආදිපාදතුමා. ඔබේ ඔය රිවෝල්වරය කොකාගස්සන්න සූදානම් කළාට වැඩක් නෑ." හෝම්ස් කීවේ සන්සුන් අයුරෙනි.

"ඔහේට ආයුධය එළියට ගන්න මං ඉඩ දුන්නත්, ඒක පාවිච්චි කරන්න මං මොහොතක් වත් නොදෙන බව ඔහේ හොඳටම දන්නවා. මේ රිවෝල්වර බොහොම ලොකු ශබ්දයක් පිටවෙන, අවදානම් ගිනිඅවි. ඊට වඩා හොඳ නැද්ද, ඔබට හුරු පුරුදු, වායු රයිෆලයම පාවිච්චි කරන එක?

ආ....... මට ඇහෙනවා අඩි ශබ්දයක්....... දේවදූතයෙක් තරප්පු පෙළ නැගගෙන උඩට එනවා වගේ ශබ්දයක්. ඒ ඔබේ කීර්තිමත් සහචරයා. ඔබට සුභ දවසක් මර්ටන් මහත්මයා. පාර අයිනට වෙලා නිකම්ම බලාගෙන ඉන්න ගියාම කම්මැලි හිතෙනවා. එහෙම නේද?

යෝධ ශරීරයක් තිබූ බොක්සිං ක්‍රීඩකයා, හෝම්ස් දෙස බැලුවේ, මේ කිසිවක් තමාට තේරුම් ගැනීමට අපහසු බව හඟවමිනි. හෝම්ස්ගේ කතාබහේ තිබුණේ උපහාසාත්මක බවක් යන්න, මර්ටන්ට

http://sherlockholmesinvestigations.blogspot.com

වටහා ගැනීමට හැකිවිය. එහෙත් ඊට පිළිතුරු දිය යුත්තේ කිනම් ආකාරයකටද යන්න, මර්ටන් දන සිටියේ නැත. ඔහු තම ප්‍රශ්නය එල්ල කළේ, තම මිත්‍ර ප්‍රභූවරයා වෙතයි.

"ආදිපාදතුමා, මොකක්ද දන් සිද්ධවෙලා තියෙන්නේ? මේ මිනිහා දොඩවන්නේ මොනවා හරි මූන වෙලාද?"

එයට සිල්වියස් නිහඬ වූ අතර, පිළිතුර ලැබුණේ ෂර්ලොක් හෝම්ස්ගෙනි.

"මර්ටන් මහත්මයා. මං කොටින්ම කියන්නම්. දන් වැඩේ ගැස්සිලා. කාරණා ඔක්කොම දන් එළිවෙලයි තියෙන්නේ."

එයට පිළිතුරු ලෙස වචනියා යළිත් තම ඇමතුම යොමු කළේ තම මිත්‍රයාටයි.

"මොකද ආදිපාදතුමා, මෙයා මේ විහිළු කරනවද? මම නම් ඉන්නේ විහිළු කරන මානසික තත්ත්වයක නෙමෙයි."

"මං ඒක දන හිටියා." හෝම්ස් කීය. "ඒ වගේම මං ඔහේලට සහතික වෙන්නම්. අද ඉර බැහැගෙන ගිහිං අඳුර වැටෙන්න වැටෙන්න, ඔය විහිළු ගතිය එන්න එන්නම අඩුවෙලා යාවි.

සිල්වියස් ආදිපාදතුමා. මං කියන දේ අහන්න. මං බොහොම වැඩ රාජකාරී තියෙන මිනිහෙක්. මට බෑ මේ ගැන තවත් කාලය නාස්ති කරන්න. මං යනවා මගේ නිදන කාමරයට ටිකක් විවේක ගන්න. මං නැති අතරේ ඔහේලට පුළුවන්, නිදහසේ ඕනෑම දෙයක් සාකච්ඡා කරන්න.

දන් ඔහේලා, මුහුණපාලා ඉන්න තත්ත්වය, ඔබේ මිත්‍රයාට හොඳින් තේරුම් කරල දෙන්න. ඒ අතරේ මං කැමැතියි, මගේ වයලීනය ටිකක් වාදනය කරන්න. සුපුකට සංගීතඥ හොෆ්මාන් විසින් නිර්මාණය කරන ලද "බාකරෝලේ" කියන වාද ඛණ්ඩය ගැන ඔබ අහල තියෙනවද ආදිපාදතුමනි? කලබලකාරී මනසට, ඒකෙන් ශාන්ත සුවයක් ලබාගන්න නම් අමාරුයි. ඒත් මං මිනිත්තු පහකින් ආපසු එනවා. එතකොට ඔබට පුළුවනි, ඔබේ අවසන් තීරණය මට දනුම් දෙන්න. ඔබ දන්නවා නේද? මේ ප්‍රශ්නයට තියෙන්නෙ පිළිතුරු දෙකයි. එක්කො අපි ඔබව අත්අඩංගුවට ගන්නවා. නැත්නම් මාණික්‍යය මට භාරදෙන්න."

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com



233. "මං යනවා මගේ නිදන කාමරයට ටිකක් විවේක ගන්න."

http://sherlockholmesinvestigations.blogspot.com

"කාමරයේ මුල්ලක තිබූ වයලීනය අතටගත් හෝම්ස්, නිදන කාමරය වෙත පිටවී ගියේය. මිනිත්තුවකට දෙකකට පසු ඔහුගේ නිදන කාමරය දෙසින් සංගීත වාදනයක් අසන්නට ලැබිණ. වසා තිබූ දොර දෙසින් නැඟුණේ, දුක් අදෝනාවක් වැනි ශෝකී සංගීත රාවයකි.

"මොකක්ද දන් තත්ත්වය?" මර්ටන් ඇසීය. "ඔහු දන්නවද මැණික් ගල ගැන?"

"ඔහු දන්න ප්‍රමාණය හොඳටම වැඩියි. ඔහු ඒ ගැන හැමදෙයක්ම දන්නවා වෙන්නත් පුළුවනි. මට ඒ ගැන හරියටම විශ්වාස නැහැ."

"දෙයියන්ට ඔප්පු වෙච්චාවේ!" සුදුමැලි වූ බොක්සිං ක්‍රීඩකයාගේ මුවෙන් නිකුත්විය.

"අයිකි සැන්ඩර්ස් ඔක්කොම එළිකරලා."

"හැබෑට? මං ඌව දෙන්තුම් හොඳ වැඩක්: මට එල්ලුම් ගස් යන්න වුණත් කමක් නෑ."

"දන් ඉතින් අයිකිට දඬුවම් කරලා ඇති වැඩක් නෑ. කළ යුත්තේ මොකක්ද කියලා අපි ඉක්මනින් තීරණය කරන්න ඕන."

"මොහොතක් ඔහොම ඉන්න." මර්ටන් කීවේ නිදන කාමරයේ දොර දෙස, සැකසහිත අයුරෙන් බලමිනි. "මේ යකා ගැන හොඳ සෝදිසියෙන් ඉන්න ඕන. ඌ අපේ කතාබහට හොරෙන් කන්දීගෙන ඉන්නවද දන්නෙත් නෑ?"

"ඒ මිනිහ කොහොමද අපේ කතාවට කන්දෙන්නේ? ඇහෙන්නේ නැද්ද ඔය නිදනකාමරේ වයලින් ගෑහෙන සද්දේ?"

"ඔව්. ඒකත් හරි තමා. කවුරු හරි මේ තිර රෙදි අස්සෙ හැංගිල ඉන්නවද දන්නෙත් නෑ. මේ කාමරයේ හැම තැනකම තිර රෙදි."

තිරය මඳක් ඈත් කළ ඔහු, ජනේලය අසල වූ ෂර්ලොක් හෝම්ස්ගේ ඉටිපිළිමය ප්‍රථමවරට දැක, ගල්ගැසී බලා සිටියේය.

"ෂෘ ෂෘ ඒ පඹයෙක් සැමී. ඉටිවලින් හැදූ ප්‍රතිමාවක්." සිල්වියස් කීය.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒ මිනිහගෙ ප්‍රතිමාවද? මං හිතුවේ ඒ ඔහුය කියලා. හරියටම ඒ යකා පණපිටින් ඉන්නවා වගෙයි. ටූසෝ නෝනගෙ ඉටි පිළිම කෞතුකාගාරයේ ඒව පරාදයි...... ඒ වුණත් ආදිපාදතුමා, මේ වටේටම තිබෙන තිර රෙදි?"

"...... තිර රෙදි යකාට ගියාවෙ. අපේ කාලය නාස්ති වෙනවා. අපට තව වැඩි වේලාවක් නෑ. මැණික ගැන තියෙන සාක්ෂිවලින්, ඔහුට පුළුවන් අපව අත්අඩංගුවට අරගෙන හිරේ අරින්න."

"සැකයක් නෑ. ඌ ඒක කරාවි."

"ඒ වුණාට මැණික ආපහු දුන්නොත්, මිනිහ අපට පැනල යන්න ඉඩදෙනවලු."

"මොනවා? මැණික් ආපහු දෙන්න? පවුම් ලක්ෂයක් වටිනා පුෂ්පරාගය ආපහු දෙන්න?"

"අපි දෙකෙන් එකක් තෝරා ගත යුතුයි."

සැම් මර්ටන් ඔහුගේ හිසු කැසීමට පටන් ගත්තේය.

"ඒ යකා නිදන කාමරයේ ඉන්නෙ තනියම නේ. අපි ඇතුළට ගිහිං මිනිහව ඉවර කරමු. කාමරේ ලයිට් ටික නිවා දම්මට පස්සෙ අපට භයවෙන්න දෙයක් නෑ."

ආදිපාදවරයා හිස සෙලවූයේ ඊට නොකැමැත්තෙනි.

"ඒ මිනිහා ආයුධත් ලෑස්ති කරගෙන හොඳ සූදානමෙන් ඉන්නෙ. ඔහුට වෙඩි තියලා, මේ වගේ තැනකින් පැනල යන්න අමාරුයි. ඊටත් වඩා, ඔහු ළඟ තියෙන සාක්ෂි ඔක්කොම පොලීසියට හෙළිකරලත් ඇති. හොː!..... මොකක්ද ඒ සද්දෙ ?"

ජනේලය දෙසින් යම් සිහින් නොපැහැදිලි හඬක් ඇසිණි. සිල්වියස්, මර්ටන් දෙදෙනාම සිය අසුන්වලින් නැගිට, ඊට සවන් යොමුකරගෙන සිටියහ. එහෙත් ඔවුන් වටා පැවැතියේ, දැඩි නිශ්ශබ්දතාවයක් පමණි. තිර රෙදි මෑත්කර, ඔවුහු ජනේලය දෙස පරීක්ෂාවෙන් බැලූහ. හාන්සිපුටුවේ තබා තිබූ හෝම්ස්ගේ ඉටි රූපය හැරෙන්නට, කාමරයේ කිසිවක් නොතිබිණි.

"පාරේ මොකක් හරි ශබ්දයක් වෙන්න ඇති, ජනේලයෙන් ඇහුණෙ." මර්ටන් කීය. "අම් අහනවා ලොක්කා. මෙතැන මොළකාරයා ඔහේ නේ. හෝම්ස්ගේ ඔලුවට වෙඩි උණ්ඩයක් බස්සන

Reading Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

එකෙන් වැඩක් නැත්නං, කරන්න ඕන මොකක්ද කියල තීරණය කිරීම ඔහේගෙ වැඩක්.

"ෂර්ලොක් හෝම්ස්ට වඩා, හොම්බර එසේ කපටියන් රංවටන එකත් මං කරල තියෙනවා." ආදිපාදවරයා කිය. "මැණික තියෙ න්නේ කොහේද දන්නවද? මගේ ඇතුළු කබායේ රහස් සාක්කුවේ. ඒක කොහේවත් තියල එන්න මට හයයි. ඒ හින්දා මම ඒක යන යන තැන අරගෙන යනවා. අද රෑම මේක එංගලන්තයෙන් පිට කරන්න ඕනෙ. මැණික ඕලන්දයේ ඇම්ස්ටර්ඩෑම් වලට යවලා, ඉරිදා වෙන්න කලින් කෑලි හතරකට කප්පවමු. ෂර්ලොක් හෝම්ස්, වෑන් සෙඩාර් ගැන කිසිදෙයක් දන්නෙ නෑ."

"වෑන් සෙඩාර් ආපහු ඇම්ස්ටර්ඩෑම් යන්නෙ ලබන සතියෙ කියලයි මං හිතුවෙ."

"ඔහු යන්න හිටියෙ ලබන සතියෙ තමයි. නමුත් දැන් ඉතින් ඒක වෙනස් කරන්න වෙනවා. යන්න තියෙන පළමුවෙනි නැවෙන්ම, ඔහු මේකත් අරගෙන පිට වී යා යුතුයි. දැන් ඉතින් අපි දෙන්නාගෙන් එක්කෙනෙක් මැණිකත් අරගෙන, මෙතැනින් පැනගන්න ඕනෙ. ඊළඟට ඒකත් අරගෙන ලයිම් වීථියට ගිහිං, වෑන් සෙඩාර්ට භාරදීල අවශ්‍ය උපදෙස් දිය යුතුයි."

"ඒ වුණාට බොරු අඩියක් සහිත ඇඳුම් පෙට්ටිය තවම සූදානම් නැහැ නේ?"

"කරන්න දෙයක් නෑ. ඒක හදල තියෙන විදියට අරගෙන, ඔහු වහාම පිටවෙලා යා යුතුයි. තව එක මොහොතක්වත් ප්‍රමාද වෙන්න බෑ."

අනතුරක් ඉව වැටුණු බල්ලකු මෙන්, බොක්සිං ක්‍රීඩකයා, තිරරෙදි ඇත් මැත් කරමින් කාමරය අවටත්, ජනේලය සමීපයේත් පරීක්ෂාවෙන් බැලීය. එහෙත් සැකකටයුතු කිසිවක් එහි නොතිබිණි. කලින් ශබ්දය නැඟෙන්නට ඇත්තේ නිසැකවම බේකර් වීථියෙන් විය යුතුය.

"මේ මිනිහා හෝම්ස්ගෙන් කොහොමද අපි බේරෙන්නෙ?" මර්ටන් ඇසීය.

"මිනිහව බොරුවෙන් රැවටන එක ඒ තරම් අපහසු නෑ.

http://sherlockholmesinvestigations.blogspot.com

මැණික් ගල ඔහුට ලැබෙන්වා නම්, මේ මෝඩයා අපව අත්අඩංගුවට ගන්නේ නැ. ඉතින් අපි ඔහුට පොරොන්දුවෙමු, නොවරදවාම මැණික ඔහුට භාරදෙනවා කියල....."

"......ඊළඟට මැණික ඔහුට......"

"කලබල වෙන්නෙ නැතුව ඔහොම ඉන්නවකෝ. ඔහුට එහෙම පොරොන්දු වුණාට, අපි දිරච්ච ලණුවක් දීල මිනිහව යවමු වැරදි පාරක. මිනිහ ඒක වැරදි බව තේරුම් අරගෙන ගොඩ එද්දි මැණික ඕලන්දයේ. අපිත් රටින් පිටවෙලා ඉවරයි."

"ඒක නම් අපූරු අදහසක්." සෑම් මර්ටන් කීවේ අතිශය සතුටෙනි.

"මර්ටන්. තමුසෙට තියෙන්නේ වහාම ගිහිං ඕලන්දකාරයා හමු වෙන එකයි. මිනිහට දනුම්දෙනවා හැකි ඉක්මනින් පිටත්වෙන්න සූදානම් වෙන්න කියලා. මං මේ හෝම්ස් කියන මෝඩයාට බොරු පාපෝච්චාරණයක් කරන්නම්. මං මිනිහට කියන්නම්, මැණික් ගල තියෙන්නේ ලිවර්පූල්වල කියලා...... මොකක්ද මං දන්නෙ නැ අර අදෝනාව....... ඒක සංගීතයක් නෙමෙයි මන කන්දොස්කිරියාවක්....... මගේ හිස කැක්කුමත් හැදෙනවා ඒ ඔබ්දෙබ්...... හෝම්ස් ලිවර්පූල් වලට ගිහිං, එහේ හැමතැනම රස්තියාදු වෙලා, මැණික එහේ නැති බව හොයා ගනීවි. ඒ වෙනකොට මැණික කෑලි හතරකට කපලා අපි නිල්පැහැති සාගරයේ යාත්‍රා කරනවා.

දැන් මෙහෙට එනවා සෑම්. අර දොරේ යතුරුකටින් ඔහු බැලුවත් නොපෙනෙන හරියෙන්, මේ පැත්තට එනවා....... මෙන්න මැණික් ගල."

"ආදිපාදතුමා භය නැතුව මේක යන යන තැන අරගෙන යන හැටි."

"නැතුව මේක පරෙස්සම් කරගන්නේන කොහොමද මෝඩයෝ? මේක වයිට්හෝල් එකෙන් හොරකම් කරගන්න අපට පුළුවන් වුණා නම්, කාට හරි මගේ ගෙදරින් ඒක හොරකම් කරගන්න එක මහ ලොකු වැඩක් නෙමෙයි."

"මට ඔය මැණික හොඳට බලන්න ඕන." සෑම් මර්ටන් කීය.

සිල්වියස් ආදිපාදවරයා තම මැරවරයා දෙස හෙලුවේ

http://sherlockholmesinvestigations.blogspot.com

සැකසහිත බැල්මකි. තමා දෙසට දිගු කළ මර්ටන්ගේ අපිරිසිදු අත, සිල්වියස් නොසලකා හැරියේය. සෑම් මර්ටන් මෙයින් කෝපයට පත්විය.

"මොකද ලොක්කා භය වුණාද?" සෑම් ඇසීය. "ඔහේ හිතුවේ මං මේකත් අරන් පැනල දුවාවි කියලද ? ලොක්කා. ඔහේගේ මේ අමුතු පිළිවෙළ වෙලාවකට මට අල්ලන්නෙ නෑ."

"හරි හරි, සෑම්." සිල්වියස් කීය. "තමුසෙ ගැන සැක හිතුවා නොමෙයි. මේ වෙලාවෙ අපි දෙන්නා අණ්ඩුසරුවල් වෙලා කොහොමද? මේ මැණිකෙ ලස්සන හොඳට බලාගන්න ඕනෙ නම්, ඒක ඉර එළියට අල්ලලයි බලන්න ඕන. එනව මේ ජනේලය ළඟට. දන් මෙන්න මෙහෙම අල්ලනවා ඉර අව්වට. ඔන්න බලනවා ලස්සන."

"බොහොම ස්තූතියි."

එක්වරම ඉටිපිළිමය තබා තිබූ පුටුවෙන් ඉවතට පිනූ හෝම්ස්, දකුණු අතෙන් වටිනා මැණික ඩැහැගත්තේය. අනෙක් අතෙන් ඔහු තම රිවෝල්වරය, සිල්වියස් ආදිපාදවරයාගේ හිසට එල්ල කළේය. තක්කඩින් දෙදෙනා ගල්ගැසී බලා සිටියේ, අතිශයින් මවිතයට පත්වයි. ඔවුන් යළි සාමාන්‍ය තත්වයට පත්වෙද්දී, හෝම්ස් විදුලි සීනුව නාදකර අවසන්ය.

"කලබල කරන්න එපා මහත්වරුනි. කලබල එපා. මං ඔබට ආයාචනය කරනවා, නිකරුණේ මේ ලී බඩු කඩල බිඳල දමන්න එපා කියලා. ඔහේලට පැහැදිලිවම පෙනෙනවා ඇති, මැණික මගේ අතින් පැහැරගන්න ක්‍රමයක් නැති බව. පොලීසිය ඉන්නවා පහළ තට්ටුවේ: ඔහේලව සාදරයෙන් පිළිගන්න බලාගෙන."

කෝපයටත් භීතියටත් වඩා, ආදිපාදවරයාගේ සිතේ ඉස්මතු වී ආවේ විස්මයයි.

"මට පුදුම තමුසෙ කොහොමද....."

"ඔබ පුදුමයට පත්වීම හරිම ස්වාභාවිකයි. ඔහේල දන්නෙ නැතුවට, මගේ නිදන කාමරයෙන් පිටවෙන්න, ඔය පෙනෙන එකට අමතරව තවත් දොරක් තියෙනවා. ඒක විවෘත වෙන්නේ අන්න අර තිරය පිටුපසටයි. ඉටිරූපෙ අස්කරලා, මා ඔය හාන්සිපුටුවෙ වාඩිවෙද්දි, ඔහේලට ශබ්දයක් ඇහුණදෝ කියල, මගේ හිතේ

Personal Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

සැකයකුත් ඇතිවුණා. ඒ වුණාට, වාසනාව රැඳී තිබුණේ මගේ පැත්තට, ඔහේල දෙන්නාගේ සාකච්ඡාවට නිදහසේ කන්දෙන්න ඒකෙන් මට හැකිවුණා."

පරාජය පිළිගත් බව හඟවන සලකුණු ආදිපාදවරයාගේ මුහුණෙන් දිස්විය.

"තමුසේ දක්ෂයෙක් බව අපට පිළිගන්න සිදුවෙනවා හෝම්ස්. තමුසෙ දක්ෂයෙක් විතරක් නෙමෙයි, මහ යක්ෂයෙක්."

"ඔව්. යක්ෂයා නොමෙයි නම් ඊට බොහොම කිට්ටුයි." හෝම්ස් පිළිතුරු දුන්නේ ආචාරශීලී සිනහවක් ද සමඟිනි.

මෙය ක්ෂණිකව සිදුවූ අයුරු ඉක්මනින් තේරුම් ගැනීමට, එතරම් බුද්ධිමතෙකු නොවූ සැම් මර්ටන්ට අපහසු විය.

"ඔහේ පොලිස් කාරයෙක් හැටියට දක්ෂ බව ඇත්තයි. ඒ වුණාට අර කාමරය ඇතුලේ තවමත් වීණාවක් වාදනය වෙන හඬ මට ඇහෙන්නේ කොහොමද?"

"ෂෘ ෂෘ" හෝම්ස් කීය. "සංගීතය නැටියකට අරගෙන අපට යළිත් අහන්න සලස්වන, ග්‍රැමෆෝනය කියන යන්තරේ හරිම විශිෂ්ට නිෂ්පාදනයක්."

හෝම්ස්ගේ විසිත්ත කාමරය තුළට පොලීසිය ඒ මොහොතේ කඩා වැදිණ. විලංගුවල යකඩ අගුළු ක්‍රියාත්මක වෙන "ක්ලික්" ශබ්ද නිකුත් විය. පොලිස් නිලධරයෝ, අපරාධකරුවන් දෙදෙනා, පාරේ සූදානමින් තිබූ කුලී රථ වෙත කැඳවාගෙන ගියහ. වොට්සන් තවදුරටත් තම මිතුරා සමඟ රැඳී සිටියේය.

හෝම්ස්ගේ ජයග්‍රහණ රාශියට, අලුතින් එක්වූ මෙම ජයග්‍රහණය ගැන වොට්සන් තම මිත්‍රයාට සුභ පැතුවේය. මෙම සංවාදයට බාධාකරමින්, බිලී එහි ඇතුළු විය. ඔහුගේ අතේ වූ බන්දේසියේ ආගන්තුක පතක් තිබිණි.

"කැන්ටල්මියර් සාමි ඇවිත් ඉන්නවා මහත්මයා."

"ඔහුව මෙහාට එවන්න බිලී." හෝම්ස් කීය.

"වොට්සන් දන්නවාද. මේ වයසක මිනිහා රටටත් රජයටත් බොහොම පක්ෂපාත කෙනෙක්. ඒ වුණාට වලව් පැළැන්තියේ ප්‍රභූ තනතුරෙන් හිස උදුම්මවාගෙන ඉන්නා මිනිහෙක්: පැරණි අදහස්

http://sherlockholmesinvestigations.blogspot.com

නිසා කිසිවෙකුට හිස නොනමන දඩබ්බ කෙනෙක්. අපි මිනිහගේ සැර ටිකක් අඩු කරමුද? එහෙම දේකට බයවෙන්න හේතුවක් නෑ නේද වොට්සන්? මෙච්චර වෙලා මෙතැන සිද්ධවුණේ මොකක්ද කියල, බොහොම වෙලාවට ඔහු දන්නෙ නැතිව ඇති. අපි එහෙම හිතමු."

දොර විවෘත විය. දෙපා බිම අද්දමින් ඇතුළට ආවේ කෙට්ටු, එමෙන්ම වයස්ගත තැනැත්තෙකි. ඔහුගේ මුහුණේ දෙපස වැවී තිබුණු රැවුල නම් වයසට වඩා කළු පැහැයක් ගත්තේය. මුහුණෙන් ප්‍රකාශ වූයේ, ඔහු කිසිවෙකුට හිස නොනමන, ආඩම්බරකාරයෙකු බවයි. හෝම්ස් ඉදිරියට ගොස්, අමුත්තාට අතට අතදී පිළිගත්ත ද ඔහුගෙන් ඊට උණුසුම් ප්‍රතිචාරයක් නොලැබිණ.

"කැන්ටල්මියර් සාමි." හෝම්ස් කීය. "ඉතින් කොහොමද සැප සනීප? මේ කාලෙ තිබිය යුත්තේ උණුසුම් දේශ ගුණයක්. ඒ වුණාට එළියේ හරිම ශීතලයි. එහෙම නේද ? හැබැයි අපේ කාමරය ඇතුළත නම් උණුසුම්.කෝ ඔබේ පිටකබාය මං ඉවත් කරන්නම්. "

"නැහැ. උවමනා නැහැ. පිටකබාය ගලවන්න උවමනා නෑ." සාමිවරයා කීය.

එහෙත් හෝම්ස් තම දෑත් දෙපසින් යවා, සාමිවරයාගේ පිටකබායේ අත්, අල්ලාගත්තේ, කබාය ඉවත්කිරීමට උත්සාහ දරමිනි.

"කෝ මට ඉඩදෙන්න කැන්ටල්මියර් සාමි. මේ කබාය ඉවත් නොකළොත් ඔබට හරි අපහසුයි. මේ දේශගුණික වෙනස නිසා නොදනීම අපේ ඇඟට කොයිතරම් අයහපතක් සිද්ධවෙනවද. මේ මගේ මිත්‍රයා දොස්තර වොට්සන් ඔබට ඒ ගැන සහතික වේවි. " කැන්ටල්මියර් සාමි හෝම්ස්ගේ ග්‍රහණයෙන් නිදහස් වී ඉවතට ගියේ තරමක කෝපයකිනි.

"මහත්මයා. මං ඉන්නේ බොහොම සුවපහසුවෙන්. මගේ පිටකබාය ඉවත් කරන්නෙත් නෑ. මට මෙතැන වැඩි වෙලාවක් රැ දෙන්න උවමනාවකුත් නෑ. මං මේ ගොඩවැදුණෙ මොකටද කියලා, ඔබ දන්නවා ඇති. අර නැතිවුණු මැණික් හොයලා දෙන්නම් කියලා, ඔහේ පැනලා භාරගත්තා නේද? මං මේ ආවේ, ඒකෙ වැඩ කටයුතු කෙරී ගෙන යන ආකාරය දැනගන්න."

"ඒක අමාරු. කටයුත්තක් - හරිම අමාරුයි."

http://sherlockholmesinvestigations.blogspot.com

"මං දැනගත්තා මහේට ඒක අමාරු වෙන බව." කැන්ටල්මියර් සාමි පැවසුවේ උපහාසාත්මක සිනාවක් පාමිනි. "මිනිස්සුන්ට කරන්න පුළුවන් වැඩත් තියෙනවා. බැරි වැඩත් තියෙනවා. සමහරු හිතාගෙන ඉන්නේ තමන් විතර හපන්නු නෑ කියල. හෝම්ස් මහත්තයා. අඩු ගණනේ තමන්ට කරන්න පුළුවන් සීමාව මොකක්ද කියලාවත් තේරුම් ගත්තා නම්, ඒකත් ලොකු දෙයක්."

"ඒක සම්පූර්ණ ඇත්තයි මහත්මයා. මගේ මොළේ හොඳටම අවුල් වෙලයි මං මේ ඉන්නේ."

"ඒකෙ පුදුමයක් නෑ."

"එහෙම වෙන්න හේතුව ඒක වැදගත් කාරණයක් නිසා. බාග වෙලාවට මේ ගැන මට ඔබගෙන් උපදෙසක් ගන්න හැකිවේවිනේද?"

"ඔබ මගෙන් උපදෙස් ගන්න එන්නෙ දන් ද? ඔබේ ක්‍රම ඔක්කොම අසාර්ථක වෙලා, වැඩ වැරදුණාම, මගෙන් උපදෙස් ඉල්ලනවා. මං හිතුවා ඔබ සතුව තියෙනවා කියල, ඕනෑම අභිරහසක් හෙළි කරගත හැකි විධික්‍රම. ඒ වුණත් මං සූදානම් ඔබට උදව් කරන්න."

"ඔබට තේරෙනවා නේද කැන්ටල්මියර් සාමි. මැණික ඇත්තටම හොරකම් කළ අය අධිකරණය ඉදිරියට මුහුණුවන්න අපට පුළුවනි?"

"ඔව්. පුළුවන්. ඒ ඉසින් හොරුන් අල්ලා ගත්තොත්."

'හරියට හරි. නමුත් ප්‍රශ්නය තියෙන්නේ..... හොරුන්ගෙන් මැණික භාරගෙන........ ඒක හංගාගෙන ඉන්න අයට විරුද්ධව අපට කළ හැක්කේ මොකක් ද?"

'ඕක ගැන හිතන්න ඉස්සරවෙලා, හොරු අල්ලාගෙන හිටින්න එපායැ. දන්ම ,මොකටද අරව සැලසුම් කරන්නේ?"

"කල් තියා සැලසුම් කරගෙන ඉන්න එක වඩා හොඳයි. හොරකම් කළ මාණික්‍යය භාර අරගෙන ඉන්න පුද්ගලයාට විරුද්ධව තිබෙන, හොඳම සාක්ෂිය මොකක් කියලද ඔබ හිතන්නේ?" හෝම්ස් ඇසීය.

"මැණික ඔහු ළඟ තිබී හමුවීම." සාමිවරයා පිළිතුරු දුන්නේය.

http://sherlockholmesinvestigations.blogspot.com

"කෙනෙකු ළඟ එහෙම තිබුණය නම්, ඔහු වහාම අත්අඩංගුවට ගත යුතුයි කියලද ඔබ කියන්නේ?"

"ඒ ගැන කිසිම සැකයක් නෑ."

ෂර්ලොක් හෝම්ස් නිතර සිනාසෙන පුද්ගලයෙකු නොවේ. එහෙත් එදින නම් හෝම්ස් මඳ හඩින් සිනාසුණේය. දොස්තර වොට්සන්ට මතක ඇති කාලයක ඔහුගේ මිත්‍රයා එසේ සිනාසී නොමැති බැව් වොට්සන්ට සිහිවිය.

"කාරණාව එහෙම නම් මට කණගාටුයි කියන්න, කැන්ටල්-මියර් සාමි. ඔබව අත්අඩංගුවට ගන්න කියලා උපදෙස් දෙන්න මට සිද්දුවෙනවා."

මේ කතාවට සාමිවරයා දැඩි ලෙස කෝපාවිෂ්ට විය.

"හෝම්ස් මහත්තයා. ඔබ එක්ක සුහදාබහ කිරීමට තරම් මා කාරුණික වුණු නිසා, මාව විහිළුවකට ගත්තද? අවුරුදු පනහක කාලයක්, මං රාජ්‍ය සේවයේ යෙදුණා. මම විටියට මට අපහාස වෙන විටියට, කවුරු හරි කරාකළ පළමුවෙනි වතාවයි මේ.

මං හුඟක් වැඩ රාජකාරි තියෙන කෙනෙක්. ඔහේගෙ ඔය මෝඩ විහිළුවලට කන්දෙන්න මට වේලාවකුත් නෑ. ඔය විකාර මට අල්ලන්නෙත් නෑ. ෂර්ලොක් හෝම්ස් මහත්මයා, මං එකක් කියන්නම්. අභිරහස් අපරාධ විසඳීමට ඔබට පුදුමාකාර දක්ෂකමක් තියෙනවා කියල සමහරු කියනවා නේ. ඔබට එහෙම හැකියාවක් තියෙනවා කියල කිසිම දවසක මගේ විශ්වාසයක් තිබුණේ නැහැ. මේ වැඩේ ඔහේට භාරදෙනවාට වඩා, පොලිසියට යොමුකරන එක හුදුසුයි කියලයි මං මුල ඉඳලම කිව්වේ. මගේ ඒ තීරණය නිවැරදි බව ඔප්පුවෙනවා, ඔබේ ඔය හැසිරීමෙන්. ඔබට සුභ සන්ධ්‍යාවක් පතලා, මං කැමැතියි මෙතැනින් පිටවී යන්න."

හෝම්ස්, සාමිවරයාට නිවසින් පිටවී යාම අපහසු වන ලෙස දොරටුව අවහිර කළේය.

"කැන්ටල්මියර් සාමි. මැණික තාවකාලිකව ළඟ තියාගෙන ඉන්නවාට වඩා, ඒක අරගෙන පාරට බැහැල යන එක බරපතල වැරැද්දක්."

"ඔහේගෙ ඔය පිස්සු කථා, මට තවත් ඉවසන්න බෑ. මට යන්න දෙන්න."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබේ පිටකබායේ දකුණු පැත්තේ සාක්කුවට අත දමා බලන්න." හෝම්ස් ඉල්ලා සිටියේය.

"ඒ මොනවට ද?"

"මොනවට හරි. මං කිව්වදේ අහලා එය කරන්න."

මොහොතකට පසු කැන්ටල්මියර් සාමිවරයා කහ පැහැයෙන් බැබළෙන විශාල මැණිකක් අතට ගත්තේය. ඔහු එය දෙස ඇසිපිය නොහෙළා බලා සිටියේ, තම දෙනෙත් අදහාගත නොහැකි තරමේ පුදුමයකට පත්වය.

"මොනවා? මොනවා? මෙහෙම දෙයක් වුණේ කොහොමද හෝම්ස් මහත්තයා?"

"බොහොම නරකයි කැන්ටල්මියර් සාමි. බොහොම නරකයි.", කී හෝම්ස් මොහොතක් සිනාමුසු මුහුණෙන් බලා සිටියේය.

"මගේ මේ මිත්‍රයා වොට්සන් ඔබට කියාවි, ඉඩක් ලැබෙන වෙලාවට විහිළුවක්, දෙකක් කරන්න මං කැමැති බව. මෙහෙම රහපෑමක් කරන්න අවස්ථාවක් ලැබුණාම, ඒක පැහැර හරින්න මට කොහොමටවත් හිතෙන්නෙ නෑ. අපේ සාකච්ඡාව පටන් ගනිද්දිම, මේ මැණික මං ඔබේ සාක්කුවට දැම්මා."

මැණික දෙස බලා සිටි වයස්ගත සාමිවරයාගේ දෙනෙත් හෝම්ස් වෙත යොමු විය.

"මට මේක විශ්වාස කරන්නවත් බැහැ මහත්මයා. ඇත්තෙන්ම අපි ඔබට ණයගැතියි. නමුත් කොහොමද......?"

"පරීක්ෂණය තවමත් අවසන් වෙලා නැහැ. විස්තර ඔබට පසුව දැනගන්න ලැබේවි. මෙම මැණික සාර්ථකව ආපසු ලබාගත් හැටි ඔබේ මිත්‍රයින් සමඟ විස්තර කරන්න ලැබීම, ඔබට ලොකු සතුටක් ගෙන දේවි...... බිලී....... මේ කැන්ටල්මියර් සාමිට නිවසෙන් පිටවෙලා යන්න, දොර හැර දෙන්න. ඊළඟට හඩ්සන් මහත්මියට කියන්න හැකි ඉක්මනින් දෙදෙනෙකුට රෑ කෑම එවන්න කියලා."

http://sherlockholmesinvestigations.blogspot.com

# වොට්සන් ගපනෙක් වූ හැටි !

(ශ්‍රීමත් ආතර් කොනන් ඩොයිල් 1924 දී මේ කථාපිංච ලියුවේ, බ්‍රිතාන්‍ය රජ පවුලේ මාරි ලුවී කුමරිය (දෙවැනි එලිසබත් රැජිනගේ මිත්තනියක්) කළ ඉල්ලීමක් අනුවයි. රාජකීය දරුදැරියන්ගේ සෙල්ලම් ගෙයක, පුස්තකාලයේ තැන්පත් කිරීමට, කුඩා කතන්දරයක් අඩංගු පොතක් බැගින් එවන මෙන්, රජ කුමරිය ප්‍රසිද්ධ ලේඛකයින් ගෙන් ඉල්ලා සිටියාය. අඟල් 1 1/2 x 1 1/4 ප්‍රමාණයේ මෙම පොතේ, කොනන් ඩොයිල් මේ කථාව ලියුවේ තමාගේම අත් අකුරෙනි.)

* * *

උදේ ආහාරය සඳහා මේසයට වාඩිවූ වොට්සන්, සෑහෙන වේලාවක් තිස්සේ, තම මිත්‍රයාගේ මුහුණේ පළවූ හැඟීම් හා හැසිරීම් නිරීක්ෂණය කරමින් සිටියේය. වොට්සන්ගේ අසාමාන්‍ය නිහඬතාවය ගැන හෝම්ස් පුදුමයට පත්විය. ඔහුට එක්වරම අහම්බෙන් මෙන් දකින්නට ලැබුණේ, තම මිතුරා තමා දෙස බලාසිටින අමුතු පිළිවෙළයි.

"වොට්සන්! මොනව ගැනද අද ඔබ මේ හැටි කල්පනා කරන්නෙ?"

"ඔබ ගැන"

"මං ගැන?"

"ඔව් හෝම්ස්! මං මේ කල්පනා කළේ, ඔබ නිරීක්ෂණ මගින් නිගමනවලට පැමිණෙන්න, සුවිශේෂ දක්ෂතාවයක් දක්වනවා කියල ප්‍රසිද්ධියට පත්වෙලා තියෙනවානෙ. බලාගෙන ගියාම, ඒක මහ ලොකු වැඩක් නෙමෙයි. ඕනෑම කෙනෙකුට පහසුවෙන් කළ හැකි සරල දෙයක්. මිනිස්සු ඔබේ මේ දක්ෂකම ගැන වසඟ වෙලා ඉන්න හැටි, ඒක අතකින් හරිම පුදුමයි"



http://sherlockholmesinvestigations.blogspot.com

"ඔව්. ඔබේ ඒ අදහසට මාත් එකඟ වෙනවා." හෝම්ස් කීය.

"මට මතක හැටියට මාත් ඔය කරුණ ගැන, මීට කලින් සඳහන් කරල තියෙනවා."

"ඔබේ අතිසූක්ෂම නිරීක්ෂණ ක්‍රම.."වොට්සන් කීය. "....කෙනෙකුට බොහොම පහසුවෙන් ඉගෙන ගන්න පුළුවන්. ඒ වගේම ඒවා භාවිත කරලා, නිගමනවලට එන්නත් පුළුවන්"

"ඔව්. ඒ ගැන කිසිම සැකයක් නෑ" හෝම්ස් පිළිතුරු දුන්නේ සිනහමුසු මුහුණෙනි. "නිරීක්ෂණ මගින් නිගමනවලට ඒම බොහොම සරලයි කියලයි ඔබ කියන්නේ. හොඳයි මේ වෙලාවෙ ඒක උදාහරණයකින් ඔබට ඔප්පුකරල පෙන්වන්න බැරිද වොට්සන්?"

"බොහොම පහසුවෙන් පුළුවන් මිත්‍රයා" වොට්සන් කීවේය. " බොහොම සන්තෝෂයෙන් මං ඒ කටයුත්ත කරන්නම්. මුලින්ම මට මේ දේ කිවහැකියි. අද උදේ අවදිවුණු වේලාවෙ ඉඳල, ඔබ මොනවා හරි බැරෑරුම් ප්‍රශ්නයක් ගැන කල්පනා කරමිනුයි ඉන්නේ. ඔබේ හිත සම්පූර්ණයෙන්ම ඒ පැත්තට යොමුවෙලා. '

"හරිම දක්ෂයි!" හෝම්ස් කීය. "ඔබ කොහොමද ඒක දැන ගත්තේ?"

ඒ මොකද, ඔබ සාමාන්‍යයෙන් හොඳින් රැවුල කපලා, පිරිසිදුවට ඉන්න කෙනෙක්. නමුත් අද උදේ ඔබට රැවුල කපන්න අමතක වෙලා."

"අනේ ඇත්ත තේන්නම්! ඔබ කොයිතරම් දක්ෂයෙක්ද" හෝම්ස් කීය. "මගේ ක්‍රම, මේ තරම් දුරට ඉගෙනගන්න ඔබ දක්ෂයෙක් වී ඇති බව, මට හිතුම්වත් හිතුණෙ නෑ නොවැ. ඔබේ උකුසු ඇස්වලට තව මොනවද පෙනුණෙ වොට්සන්?"

"ඔව් හෝම්ස්. බාලෝ යන නම ඇති අනුග්‍රාහකයෙක් ඔබට ලැබිල ඉන්නවා. ඔහුගේ ගැටලුව විසඳීමට, ඔබ දැරූ උත්සාහය සම්පූර්ණයෙන්ම අසාර්ථක වුණා!"

"අනේ ඇත්තටම? කොහොමද වොට්සන් ඔබ ඒ බව දැනගත්තෙ?"

ඔබේ කබායේ ඉදිරි සාක්කුවේ දමා ඇති ලියුමක් මට පෙනෙනවා. එහි එක් කෙළවරක බාලෝ යන නම ලියා ඇති

http://sherlockholmesinvestigations.blogspot.com

හැටි, මම නිරීක්ෂණය කළා. ඔබ ඒ ලියුම විවෘත කරල බලද්දි, සිත් වේදනාවෙන් මෙන් ඔබට කෙඳිරි ගෑවුණා. ඊළඟට ඔබ ලියමන සාක්කුවට ඔබා ගත්තේ තළල රැළි කරමින්. ඒ වෙලාවේ ඔබේ මුහුණට නැඟුණු හැඟීම එතරම් ප්‍රසන්න එකක් නොවෙයි!!"

"විශිෂ්ටයි! නිරීක්ෂණය කිරීමට ඔබ නම් හැබෑ දක්ෂයෙක්. තවත් මොනවද ඔබ දුටුවේ?"

"මං දන්නවා හෝම්ස්, දැන් ඔබ කොටස් වෙළඳපොළේ මුදල් ආයෝජනය කරන්නත් පටන් අරගෙන........"

"ඔබ ඒක දැනගත්තේ කොහොමද, වොට්සන්?"

"ඔබ අද පුවත්පත අත්ම අරගෙන කෙළින්ම පෙරළුවේ, මූල්‍ය තොරතුරු හා කොටස් වෙළඳපොළේ අලෙවිය සඳහන් පිටුව. ඒ ගැන ඔබේ සිතේ ඇතිවූ සතුට හා උනන්දුව දක්වෙන හඬක් එක්වරම ඔබේ කටින් පිටවුණා"

"අති විශිෂ්ටයි! ඒක නම් හරිම දක්ෂ ලෙස කළ නිගමනයක් වොට්සන්. තවත් මොනවා හරි තියෙනවද?"

"ඔව් හෝම්ස් ඔබේ පිටකබාය හැඳගන්නවා වෙනුවට ඔබ කළුපාට කබාය හැඳ සැරසී සිටිනවා. ඒ කියන්නේ මේ මොහොතේ කවුරු හරි අමුත්තෙක් ඔබ හමුවෙන්න එනවා ඇති. ඔබ ඉන්නේ ඊට සූදානමෙන්"

"තවත් මොනවා හරි තියෙනවද මිත්‍රයා?"

"සැකයක් නෑ. මට පුළුවනි තවත් කාරණා රාශියක්ම ඔබට පෙන්වා දෙන්න. මං ඔබට කිව්වේ බොහොම ටිකයි. නිරීක්ෂණ මගින් නිගමනයන්ට එළඹීමට දක්ෂ පුද්ගලයින්, ලෝකයේ කොතෙකුත් ඉන්නවා: ඒක ෂර්ලොක් හෝම්ස්ටම සීමාවුණු හපන්කමක් නොවෙයි."

"හරියට හරි! නමුත් ඒ හපන්කම් බැරි අදක්ෂයනුත් ලෝකෙ ඉන්නවා" හෝම්ස් කීය. "එහෙම අය ඉන්නේ ඉතාම ටික දෙනෙක් බව මං පිළිගන්නවා. නමුත් මගේ හිතවත් වොට්සන්. කණගාටුයි කියන්න. ඔබ අයත් වෙන්නේ අන්න ඒ අදක්ෂයන් අතරට."

"මොනවා හෝම්ස්?"

"මගේ හිතවත් මිත්‍රයා, ඔබේ නිගමන ඔබ හිතූ තරම් නිවැරදි නැති බව මා කිවයුතුයි."

Reading Purpose Only, Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ කියන්නේ මට වැරදුණා කියලද?"

"ඔව්. වැඩිය බර් ඒ පැත්තටයි. අපි ඔබේ කරුණු පිළිවෙළින් ගමු.

මම අද උදේ රැවුල කපල නැහැ. ඒ මොක ද? මං මගේ රැවුල කපන දළිපිහිය යැව්වා පිහිමුවහත් කරන්නා වෙත. ඊළඟට මං කළු කබායක් සමග ඇඳුම් කට්ටලයෙන් සැරසුණා. ඒ මොකටද? මගේ දත්වල ප්‍රතිකාරයක් සඳහා දන්ත ශල්‍ය වෛද්‍යවරයා හමුවෙන්න යන්න. මගේ දන්ත වෛද්‍යවරයාගේ නම බාලෝ. ඔබ දුටුව අර ලියුම, මට ප්‍රතිකාර සඳහා අද උදේම එන්න කියලා, ඔහු වේලාවක් වෙන් කර එවූ ලියුම. ඊළඟට මං පුවත්පතේ මූල්‍ය තොරතුරු පිටුව පෙරළුවා. ක්‍රිකට් ක්‍රීඩා තරඟ පිළිබඳ විස්තර තියෙන්නෙත් ඒ පිටුවේමයි. පුවත්පත බැලුවාමයි මං දුටුවේ. අද සරේ ප්‍රාන්තය හා කෙන්ට් ප්‍රාන්තය අතර ක්‍රිකට් තරඟය.

ඉතින් කමක් නෑ. වොට්සන්. අධෛර්යයට පත්වෙන්න එපා. ඔබට බැරිවෙන්නෙ නෑ. දිගටම උත්සාහ කරන්න!"

http://sherlockholmesinvestigations.blogspot.com

# තැපෑලෙන් ආ තෑග්ග

Reading Purpose Only.. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

# තැපෑලෙන් ආ තෑග්ග

ඒ අගෝස්තු මාසයේ එක් උණුසුම් දවසකි. දැඩි අව්රශ්මිය නිසා, බේකර් වීථිය අපට දැනුණේ පෝරණුවක ඇතුළත විලසිනි. හෝම්ස් සෝපාවේ වැතිර, එදා උදයේ ඔහු වෙත ලැබුණු ලිපියක් නැවත නැවතත් කියවමින් සිටියේය. කලක් ඉන්දියාවේ සේවය කිරීම නිසා, මට සීතලටත් වඩා උණුසුම විඳ දරාගැනීමට හැකියාවක් තිබිණි. ෆැරන්හයිට් අංශක 90, මට එතරම් ඉහළ උෂ්ණත්වයක් නොවීය.

ග්‍රීෂ්මය ඉවසිය නොහැකිව, බොහෝ දෙනෙක් ලන්ඩනය අතහැර, සනීපවත් පෙදෙස් කරා ගොස් සිටියහ. නිව්ෆොරස්ට් හෝ සවුත්සී ප්‍රදේශයට ගොස් විවේකයක් ගැනීමට මගේ හිතේ ආශාවක් තිබිණි. එහෙත් අතමිට හිඟකම නිසා එය ද කල්දැමීමට මට සිදුවිය. මගේ මිතුරු ෂර්ලොක් හෝම්ස් නම්, වනගත පෙදෙසක හෝ මුහුදු වෙරළක සිත්ගන්නාසුලු බවක් කිසි දිනක නුදුටුවේය. ඔහු වඩාත් කැමැති වූයේ, ලක්ෂ පනහක ජනතාව මධ්‍යයට වී, සමාජයේ නොවිසඳුණු අපරාධ හා දූසමාන ආරංචි ගැන හාරා අවුස්සමින් කාලය ගතකිරීමටයි. ඔහු විවිධ කුසලතාවලින් පරිපූර්ණ පුද්ගලයෙකු වුවත්, සොබාදහමේ සුන්දරත්වය අගය කිරීමටත්, එහි පහස විඳීමටත් හෝම්ස්ට හැකියාවක් නොවීය. ඉතින් ඔහු නගරය හැරදමා පිටිසරකට යනවා නම් ඒ, ගම්බදව ජීවත්වන හොර තක්කඩියකුගේ වංචාවක් පිළිබඳ පරීක්ෂණ පැවැත්වීම සඳහායි.

හෝම්ස් ගැඹුරු කල්පනාවකට වැටී සිටි නිසා, ඔහු සමග කතාබහක යෙදීමේ අදහස ඉවත දමා, මා පුවත්පත අතට ගත්තා පමණි.

http://sherlockholmesinvestigations.blogspot.com

"වොට්සන් ඔබ ඊයේ අද පුවත්පතේ පළවූ මේ පුවෘත්තිය. ක්‍රොයිඩන්හි හරස් වීථියේ සූසාන් කුෂිං මෙනෙවියට තැපෑලෙන් ලැබී තිබුණු පාර්සලය ගැන පුවත?" ඔහු එක්වරම ඇසීය.

"නෑ. මං මොකුත්ම දක්කෙ නෑ."

"ආ...... එහෙනං ඔබට එය මඟහැරෙන්න ඇති. මෙහේට දෙන්න පුවත්පත. මෙන්න මෙතන, මුදල් හා ගනුදෙනු තීරයට යටින් තියෙන ඡේදය කරුණාකර හඬනගා කියවන්න."

මම පුවත්පත අතට ගතිමි.

## පිළිකුල් සහගත පාර්සලයක්

"ක්‍රොයිඩන්හි හරස්වීථියේ පදිංචිකාරියක වන සූසාන් කුෂිං මෙනෙවියට, කවුරුන් විසින් හෝ කරන ලද ඇස් රතුවන විහිළුවකට, මුහුණ දීමට සිදුවී ඇත. ඊයේ දහවල් දෙකට පමණ ඇයට, දුඹුරු කඩදාසියකින් එතූ පාර්සලයක් තැපෑලෙන් ලැබිණි. කඩදාසිය ඉවත්කළ විට දකින්නට ලැබුණු කාඩ්බෝඩ් පෙට්ටිය, රළු ලුණු කැටවලින් පුරවා තිබිණි. ලුණු ඉවත්කිරීමේදී කුෂිං මෙනෙවිය භීතියට පත්කරමින් පෙට්ටිය තුළ තිබී, මිනිස් කන් පෙති දෙකක් මතුවිය. ඒවා මිනිස් සිරුරකින් ඉතාම මෑතකදී වෙන් කළ ඒවා බව පෙනීගොස් ඇත. පාර්සලය, උතුරු අයර්ලන්තයේ බෙල්ෆාස්ට් නුවරින්, පෙරේදා උදෑසන තැපැල්කොට ඇති බව වාර්තාවේ. එය තැපෑලට භාරදෙන ලද්දේ කවරකු විසින්දැයි එහි කිසිම සඳහනක් නොවීය. කුෂිං මෙනෙවිය පනස් වියැති අවිවාහක කාන්තාවකි. ඇය කිසිවෙකු හා එතරම් ආශ්‍රයක් නොමැති, නිදහස් දිවිපෙවෙතක් ගතකරන්නියකි. එහෙයින් මෙවැන්නක් ඇයට ලැබීම පුදුම උපදවනසුළු කරුණකි.

කෙසේ වෙතත් මීට ටික කලකට පෙර ඇය, පෙං ප්‍රදේශයේ පදිංචිව සිටියාය. එහිදී ඇගේ නිවසේ කොටසක් වෛද්‍ය ශිෂ්‍යයින් තිදෙනෙකුට කුලියට දී තිබිණි. ඔවුන්ගේ කරදරකාරී හැසිරීම නිසා ඇගේ නිවහනෙන් ඔවුන් පිටමං කිරීමට ඇයට සිදුවී ඇත. වෛද්‍ය පීඨයේ කායව්‍යවච්ඡේද කාමරයෙන් ලබා ගන්නට ඇති මෙම කොටස්, කුෂිං මෙනෙවිය භය කිරීම සඳහා, වෛද්‍ය ශිෂ්‍යයින් විසින් එවන ලද්දක් යයි පොලිසිය විශ්වාස කරයි. ඔවුන් තිදෙනාගෙන් එක් අයෙකු උතුරු අයර්ලන්තයේ බෙල්ෆාස්ට් නුවර පුද්ගලයෙකු බව කුෂිං

Reading Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

මෙනෙවියට සිහිපත් වී ඇත. අපරාධ පරීක්ෂකයන් අතර විශිෂ්ටයකු ලෙස සැලකෙන, ලෙස්ට්‍රේඩ් මහතා, මේ පිළිබඳ පරීක්ෂණ පවත්වයි."

"ඩේලි ක්‍රොනිකල් පත්‍රයේ තිබෙන්නේ එපමණයි. අපේ හිත මිත්‍ර ලෙස්ට්‍රේඩ්ගෙන් මට අද උදේ මේ ලියමන ලැබුණා." හෝම්ස් කීය.

"මෙම සිද්ධිය ඔබටම ගැළපෙන වර්ගයේ ගැටලුවක් බව මට හැඟිණ. පරීක්ෂණ කටයුතු ඉදිරියට කරගෙන යාම සඳහා අපට සැලකිය යුතු තරම් හෝඩුවාවන් ලැබී නොමැත. අපි මේ ගැන බෙල්ෆාස්ට් තැපැල් කාර්යාලයෙන් ද විමසා බැලුවෙමු. නමුත් ඔවුන් එදින පාර්සල් රාශියක් භාරගෙන ඇති නිසා, එය භාරදුන් තැනැත්තා ගැන කිසිදු මතකයක් නැත. කාඩ්බෝඩ් පෙට්ටිය මොලැසස් යොදා පදම් කළ දුම්කොළ අසුරන, රාත්තල් භාගයේ ප්‍රමාණයේ එකකි. මෙය බොහෝ දුරට වෛද්‍ය ශිෂ්‍යයින්ගේ වැඩක් විය යුතුය යන්න මගේ අදහසයි. එහෙත් මේ සඳහා මිඩංගු කිරීමට කාලය තිබේ නම්, ඔබ ද මෙයට හවුල් කර ගැනීමට මම ඉතා සතුටුවෙමි. අද දවස පුරාම පොලිස් ස්ථානයේ හෝ නිවසේ රැඳී සිටීමට මම බලාපොරොත්තුවෙමි. - ලෙස්ට්‍රේඩ්,

"මොකද කියන්නෙ වොට්සන්. රස්නෙ අමතක කරලා දාලා මාත් එක්ක ක්‍රොයිඩන්වලට ගිහිං එමුද? මේ ඔබේ අපරාධ පරීක්ෂණ තොරතුරු පොතට තවත් කථාන්තරයක් විය හැකියි."

"මටත් මේ කරන්න වැඩක් නැතුවයි හිටියෙ" මම කීවෙමි.

"අන්න හරි. සීනුව නාදකරලා අපේ පාවහන් සූදානම් කරන්න කියන්න. කුලීරියක් කැඳවන්නත් කියන්න. ඒ අතරෙ මම ඉක්මණින් ඇඳුම් මාරුකරගෙන, දුම්වැටි කෝප්පුවට පුරුවටු ටිකක් අහුරගන්නම්."

අප දුම්රියෙන් පිටත්වෙද්දී වැස්සක් ඇද හැළිණි. ක්‍රොයිඩනයේ තිබූ උණුසුම් ගතිය ලන්ඩනයට වඩා අඩු බවක් දැනිණි. හෝම්ස් විදුලිපුවතක් යවා තිබුණෙන්, ලෙස්ට්‍රේඩ් අප එනතුරු දුම්රියපොලේ රැඳී සිටියේය. මිනිත්තු පහක ගමනකින් අපි කුෂිං මෙනෙවියගේ නිවසු පිහිටි වීථිය වෙත ළඟාවූයෙමු.

එය ඉතා දිගු වීථියක් විය. පාර දෙපසම ගඩොලින් තැනූ නිවාස රාශියක් තිබිණ. ඒප්‍රන ඇඳගත් ගෘහිණියෝ, කණ්ඩ වශයෙන් නිවාස අසල අල්ලාප සල්ලාප දෙඩීමේ නිරතව සිටියහ. මඳ දුරක්

http://sherlockholmesinvestigations.blogspot.com

ගිය ලෙස්ට්‍රේඩ් හැවනි නිවසක දොරට තට්ටු කළේය. කුඩා දරියක වූ සේවිකාව පැමිණ දොර විවෘත කළාය.

නිවසේ ඉදිරිපස කාමරය වෙත අප කැඳවාගෙන යන ලදී. කුෂිං මෙනෙවිය එහි අසුන්ගෙන සිටියාය. ඇයට තිබුණේ ශාන්ත, තැන්පත් පෙනුමකි. දෑස් ප්‍රමාණයෙන් විශාල වූ අතර, හිසකෙස් තැනින් තැන සුදු පැහැයට හැරී තිබිණ. සේද රෙදිවලින් සකස් කළ පුටු කවරයක් ඇගේ උකුළ මත විය. ඒ අසල වූ ටීපෝව මත නොයෙක් වර්ණවල සේද රෙදි කැබලිවලින් පිරුණු කූඩයක් ද විය.

"මහත්මයා. ඒ අප්‍රසන්න දෙය ඇත්තෙ එළියෙ මඩුවෙ. මම කැමැතියි ඔබ එය අරගෙනම යනවා නම්." ලෙස්ට්‍රේඩ් දුටු ඇය පැවසුවාය.

"සහතිකෙන්ම මං එය පොලිසියට ගෙනියනවා කුෂිං මෙනෙවිය. මා එය තියාගත්තට හැරියේ, මගේ මිත්‍ර හෝම්ස් මහත්මයා එය ඔබ ඉදිරියේ පරීක්ෂා කරන තුරු"

"ඇයි මම ඉදිරියේ ?"

"ඔහුට මොකුත් ප්‍රශ්න තිබුණොත් හෙම...."

"මගෙන් ප්‍රශ්න කිරීමෙන් ඇති ප්‍රයෝජනේ මොකක්ද? මං ඔබට කලිනුත් මේ ගැන කිව්වා. මං මේ සම්බන්ධයෙන් කිසිම දෙයක් දන්නෙ නෑ."

"ඒක ඇත්තයි නෝනා." හෝම්ස් කීවේ කැලැඹීමට පත්ව සිටි ඇය සනසනසුලු ස්වරයෙනි, "මට හොඳට තේරෙනවා. කිසිම සැකයක් නෑ මේ පිළිකුල් සහගත දෙය නිසා, ඔබගේ හිතට හරිම අප්‍රසන්න හැඟීමක් ඇතිවී ඇති."

"සත්තකින්ම ඔව් මහත්මයා. මං නිශ්ශබ්දව මගේ පාඩුවේ ජීවත්වෙන කෙනෙක්. මගේ නම පත්තරේට වැටෙන එක, පොලීසිය මගේ ගෙට ඇතුළුවීම, මට අලුත් දෙවල්. ඔබ ඒක මේ ගේ ඇතුළට ගෙනෙනවාට වත් මං කැමති නැහැ. ලෙස්ට්‍රේඩ් මහත්මයා. ඔබට එය බලන්න උවමනා නම් එළියෙ මඩුවට යන්න."

එය නිවස පිටුපස ගෙවත්තේ තනා තිබූ කුඩා මඩුවකි. එහි ගිය ලෙස්ට්‍රේඩ් කහපැහැති කාඩ්බෝඩ් පෙට්ටියක්, දුඹුරු කඩදාසියක් හා නූල් කැබැල්ලක් රැගෙන ආවේය. අඩිපාර කෙළවර තිබූ බංකුවේ

http://sherlockholmesinvestigations.blogspot.com



253. "මහත්මයා. ඒ අප්‍රසන්න දෙය ඇත්තෙ එළියෙ......"

...ing Purpose Only. Not For Print.
http://sherlockholmesinvestigations.blogspot.com

අපි හිඳගත්තෙමු. ලෙස්ට්‍රේඩ් දුන් හැඩල් හෝම්ස් එකින් එක හොඳින් පරීක්ෂා කිරීමට පටන් ගත්තේය.

"මේ නූල හරිම සිත්ගන්නා ආකාරයේ එකක්." පැවසූ හෝම්ස් එය ආලෝකය දෙසට හරවා බලා, නාසයට ළං කොට සුවඳ බැලීය.

"ලෙස්ට්‍රේඩ් මේ නූල් කැල්ලෙන් ඔබ මොනවද හොයාගත්තෙ?"

"මේක තාර ආලේප කළ ඇඹරූ හණ නූලක්."

"ඔව් ඒක හරි. ඇයි නිසැකවම ඔබ දකින්න ඇති කුෂිං මෙනෙවිය එය කපා ඇති ආකාරය. කැපුණු දෙකෙළවර ලිහී ගොස් තිබෙන හැටි දුටුවිටම, ඇය ඒ සඳහා යොදාගෙන ඇත්තේ කතුරක් බව කිව හැකියි. ඒකත් වැදගත් කරුණක්" හෝම්ස් කීය.

"හෝම්ස් මහත්මයා. මට ඒකෙ ඇති වැදගත්කමක් නම් පෙනෙන්නෙ නෑ."

"එය වැදගත් වෙන්නේ, කතුරෙන් කැපීමෙන් නූල ගැටගැසූ තැන එහෙමම තිබෙන නිසා. මේක අමුතුම තාලෙ ගැටයක්."

"ඔව්. ඒක බොහෝම පිළිවෙළට හොඳින් ගැටගසා තිබෙනවා. ඒ බව මම දැනටමත් සටහන් කරගෙනයි තියෙන්නෙ." ලෙස්ට්‍රේඩ් කීය.

"නූල ගැන එපමණයි එහෙනම්" හෝම්ස් කීවේ සිනාසෙමිනි. "ඊළඟට පාර්සලය එතූ කඩදාසිය. හොඳ කෝපි සුවඳක් හමන "බ්‍රවුන්පේපර්" වර්ගයේ කඩදාසියක්. මොනවා ඔබට එය දැනුණේ නැද්ද? ලිපිනය ලියල තියෙන්නේ, ලොකු කැපිටල් අකුරෙන්. එමෙන්ම ඒ අකුරු, ක්‍රමානුකූලව එක පේළියකට ලියල නැහැ. අකුරු පෙළ තැනින් තැන ඇදවී ගිහින්. ලිපිනය ලියා තිබෙන්නේ, එස්. කුෂිං මෙනෙවිය. හරස් වීථිය, ක්‍රොයිඩන්. ලිවීමට යොදා ගෙන තිබෙන්නේ මහත තුඩක් ඇති පෑන් තලයක්. බොහෝම වෙලාවට 'J' පෑන්තලයක්. තීන්ත නම් බොහෝම බාල වර්ගයේ තීන්තක්. Croydon කියන වචනයේ 'y' අකුර වෙනුවට මුලින් ලියල තියෙන්නේ 'i' අකුර. පසුව ඒක 'y' අකුරට වෙනස්කරලා. මේ ලිපිනය ලියා තියෙන්නේ පැහැදිලිවම පිරිමියෙක්. අත් අකුරු නිසැකවම පිරිමියෙකුගෙ. ඔහු උගත් කමින් අඩු, ක්‍රොයිඩන් ප්‍රදේශය ඒ තරම් හුරුපුරුදු නැති කෙනෙක්. ඒ කරුණු අපට නිගමනය කළ හැකියි. ඊළඟට පෙට්ටිය.

Pearline Purpose Only. Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

මේක එතරම් විශේෂත්වයක් නැති පෙට්ටියක්. මොලැසස්වලින් ප්‍රණීත රසයක් කැවූ, දුම්කොළ තමා මේකෙ මුලින් අසුරා තිබිල තියෙන්නේ. ඒකෙ පහළ කෙලවරේ තිබෙන මහපටැඟිලි සලකුණු දෙකක් ඇරෙන්න, වෙනත් වැදගත් යමක් එහි නැහැ. පෙට්ටිය පුරවා තිබෙන්නේ බොහොම ගොරෝසු ලුණු කැටවලින්. සම් පදම් කිරීම ආදී වාණිජ කටයුතු සඳහා යොදාගන්නා ගොරෝසු ලුණු. ඊළඟට ඇතුළේ තියෙනවා මේ විශේෂ භාණ්ඩ දෙකක්."

එසේ කියමින් හෝම්ස් කන් පෙති දෙක එළියට ගත්තේය. අනතුරුව තම දණිස්ස මත තැබූ ලෑල්ලක තබාගෙන ඔහු කන්පෙති පරීක්ෂා කිරීමට පටන් ගත්තේය. මේ අතර ලෙස්ට්‍රේඩ් සහ මම හෝම්ස් දෙපසින් වාඩිවී, කන්පෙති දෙක දෙසත්, හෝම්ස්ගේ හැඟීම්බර මුහුණ දෙසත් වරින් වර නෙත් යොමු කළෙමු. අන්තිමේදී ඒවා පෙට්ටියටම දැමූ හෝම්ස්, යළිත් වරක් කල්පනා කිරීමට පටන් ගත්තේය.

"ඔබ මේ කාරණාව සමහරවිට නිරීක්ෂණය කරන්නත් ඇති. මේවා එකම පුද්ගලයෙකුගේ කන්පෙති දෙක නොවෙයි." හෝම්ස් කීය.

"ඔව්. මම එය දුටුවා." ලෙස්ට්‍රේඩ් කීය.

"ඒත් මේක වෛද්‍ය ශිෂ්‍යයින් විහිළුවට කළ දෙයක් නම්, ව්‍යවච්ඡේද කාමරයේ එකම මිනියකින්, කන් දෙකක් කපා එවන එක ඔවුනට වඩා පහසුයි නේද?"

"ඇත්තෙන්ම ඔව්."

"මේක විහිළුවක් නෙමෙයි." හෝම්ස් කීය.

"ඔබට ඒක හොඳටම විශ්වාසද?"

"නිරීක්ෂණවලින් නිගමනය කළ හැක්කේ එයයි. ව්‍යවච්ඡේද කාමරයේ ඒ සඳහා තබාගන්නා මිනීවලට, ඒවා නරක් නොවී කල්තබා ගැනීම සඳහා, ෆෝමලින් ආදී රසායන ද්‍රව්‍ය නික්ෂේපණය කරනවා. මේ කන්පෙතිවල එහෙම මොකුත් නැහැ. ඒ වගේම මේවා අලුත්. අනෙක ඒවා කපන්න යොදාගෙන තියෙන්නේ මොට පිහියක්. වෛද්‍ය ශිෂ්‍යයකු අතින් සිදුවුවා නම් එසේ වන්න හේතුවක් නැහැ. අනෙක ඔවුන් මේවා නරක් නොවෙන්න යොදන්නේ, කාබොලික් අම්ලය හෝ පරිපාක ස්ප්‍රීතු. වෛද්‍ය විද්‍යාත්මක දැනුමක්

http://sherlockholmesinvestigations.blogspot.com

ඇති කෙනෙක් යුණු දමන එකක් නැහැ. ලෙස්ට්‍රේඩ් මං ඔබට අවධාරණය කරන්න කැමැතියි, මෙතැන කිසිම විහිළුවක් නැහැ. මේක බිහිසුණු අපරාධයකට සම්බන්ධයි."

හෝම්ස්ගේ කථාව අසා සිටි මගේ ඇඟ හිලිපොළා ගියේය. ඔහුගේ මුහුණ යළිත් කල්පනාකාරී වූ අයුරු මම දුටුවෙමි. මේ බිහිසුණු සුන්බුන්වලින් පිළිබිඹු වන්නේ, අතිශයින්ම භයානක එමෙන්ම ප්‍රහේලිකාකාර අපරාධයක් විය යුතුය.

"මේක විහිළුවක් නොවෙයි කියන්න තරම්, සාධක කිහිපයක් තිබෙන බව ඇත්තයි" ලෙස්ට්‍රේඩ් කීවේය. "ඒ වගේම මේක අපරාධයකට සම්බන්ධ කරන්නත්, මොකුත්ම සාධකයක් මෙතැන නැහැ නේද. අපි දන්නවා මේ කුෂිං මෙනෙවිය, පෙං නගරයේත් ක්‍රොයිඩන් වලත් පහුගිය අවුරුදු විස්සක කාලයක්, බොහොම වැදගත් විදියට නිහඬ ජීවිතයක් ගත කළ කෙනෙක්. ඇය ගෙදරින් පිට එක දවසක් ගතකරලා නැතුව ඇති. එහෙම නම් මොන එකකටද අපරාධකාරයෙක්, තමන් කර ඇති අපරාධයක් පිළිබඳ සාක්ෂි ඇයට එවන්නෙ? මම දන්නෙ නැහැ. ඇය බොහොම දක්ෂ අයුරින් අභිංසකාවියක් හැටියට, තමන්ගේ භූමිකාව රඟපාන නිළියක්ද කියලා. එහෙම නොවෙයි නම්, ඇයත් මේ ගැන දන්නෙ අපි වගේම බොහොම ටිකයි. එහෙම නේද?"

"අන්න ඒක තමයි අපට විසඳන්න තියෙන ප්‍රශ්නෙ." හෝම්ස් පිළිතුරු දුන්නේය.

"මම නම් සලකන්නේ මගේ නිරීක්ෂණයන් හා නිගමනයන් නිවැරදි ලෙසයි. මෙතැන දෙදෙනෙක් මැරුම් කාල තියෙනවා. එක කනක් ප්‍රමාණයෙන් කුඩායි. ස්වභාවයෙන් සියුමැලියි. කරාබුවක් සඳහා කන්පෙත්ත සිදුරු කර තියෙනවා. ඒක නිසැකවම කාන්තාවකගේ කනක්. අනෙක් කන අව්වට පිළිස්සී දුර්වර්ණ වූ ප්‍රමාණයෙන් විශාල එකක්. කරාබුවක් සඳහා කළ විදීමක් ඒකෙත් තියෙනවා. මේක පිරිමියෙකුගේ කනක්. මේ දෙන්නම බොහොම වෙලාවට දත් මියගිහින්. එහෙම නොවුණා නම්, අපට මෙලහකටත් ඔවුන් ගැන අහන්න ලැබිලා. අද සිකුරාදා. පාර්සලය තැපැල් කරල තියෙන්නේ බ්‍රහස්පතින්දා උදේ. එහෙම නම් මේ අපරාධය සිදුවෙන්න ඇත්තේ බදාදා, නැත්නම් අඟහරුවාදා. නැත්නම් ඊටත් කලින්. ඒ දෙන්නා මියගියේ මිනීමැරුමකින් නම් කවුද මේ විදියට

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only. Not For Print.



257. "ලෙස්ට්‍රේඩ් ......මෙක බිහිසුණු අපරාධයකට සම්බන්ධයි."

http://sherlockholmesinvestigations.blogspot.com

කන් දෙක කපලා කුෂිං මෙනෙවියට තැපැල් කරලා එව්වේ? වෙන කවුද මිනීමරුවා මිසක්? ඒ හින්දා අපට නිගමනයකට එන්න පුළුවනි. මේ පාර්සලය එවූ තැනැත්තා තමයි අපට ඕනෑ කරන මිනිහා.

නමුත් ඇයි ඔහු ඒක ඒ විධියට එව්වේ? ඔහු එහෙම එවන්න යම්කිසි වැදගත් හේතුවක් තිබිය යුතුයි. මොකක්ද ඒ හේතුව? කිසි සැකයක් නෑ, අසවල් පුද්ගලයන් දෙදෙනා මරාදමුවා කියල කුෂිං මෙනෙවියට දැනුම්දීමට. බාගවෙලාවට ඇයටත් කරන මරණ තර්ජනයක් ලෙස.

ඒක එහෙම නම්, ඒ පුද්ගලයා කවුද කියලා ඇය දනසිටිය යුතුයි. ඇය ඒ කරුණ ඇත්තෙන්ම දන්නවාද? මට නම් ඒ ගැන සැකයි. ඇය ඒක දන්නවා නම් මේ ගැන පොලිසියට දැනුම් දීල, මොකටද ඇය පොලිසිය කැඳවන්නේ? එහෙම නම් එක්කො ඇයට තිබුණා නිශ්ශබ්දවම පොළවේ වළක් හාරලා මේ කන්දෙක වළ දමන්න. එතකොට කිසි කෙනෙකුට දනගන්න ලැබෙන්නේ නෑ. අපරාධකාරයා ආරක්ෂා කරන්න ඇයට උවමනාවක් තිබුණා නම් මිස, ඇය නිසැකවම කරන්නේ ඒ දෙයයි.

අපි මීළඟට උපකල්පනය කරමු, ඇය මේ අපරාධකාරයා කවුද කියන එක දන්නවා. නමුත් ඔහු ආරක්ෂා කරන්න ඇයට උවමනාවක් නැහැ කියල. එහෙම නම් ඇය නිසැකවම ඔහුගේ නම පොලිසියට හෙළිකරනවා. ඒ ගැන සැකයක් නෑ. මෙතැන තියෙනවා බොහොම පැටළුණු අවුලක්. අපි ඒ අවුල ලිහාගත යුතුයි."

මෙතෙක් වේලා දේශනයක් පවත්වන ආකාරයෙන් කථාකරගෙන ගිය හෝම්ස්, එක්වරම අසුනෙන් නැගිට්ටේය. අනතුරුව ඉතා ඉක්මනින් නිවස දෙසට ඇවිද්දගෙන ගියේය.

"මට තියෙනවා කුෂිං මෙනෙවියගෙන් ප්‍රශ්න කිහිපයක් අහන්න." හෝම්ස් කීය.

"එහෙම නම් ඔබ ඒ කටයුත්ත කරද්දී මං පිටවෙලා යන්නම්." ලෙස්ට්‍රේඩ් කීය. "ඒ මොකද දනගන්න තිබෙන හැම දෙයක්ම, මං දනටමත් ඇයගෙන් දනගෙන අවසන්. මට තියෙනවා යෙදෙන්න තවත් කුඩා කටයුත්තක්. ඔබට මාව හමුවෙන්න පුළුවන් පොලිස් ස්ථානයේදී."

http://sherlockholmesinvestigations.blogspot.com

"අපේ දුම්රියට නව හුහක් වෙලා තියෙනවානෙ. ඒ නිසා අපට පුරුදු විධියට ඒ වෙලාව එනතුරු අපි හෙමින් හෙමින් කරුණු විමසන්නම්." හෝම්ස් පිළිතුරු දුන්නේය.

මොහොතකින් අපි දෙදෙනා ඉදිරිකාමරයේ දී, යළිත් කුෂිං මෙනෙවිය හමුවුණෙමු. අපට දක්නට ලැබුණේ මෙම සිද්ධියෙන් ඇය කිසිදු කැලැඹීමකට පත්ව නොසිටි බවයි. තවමත් පුටුකවරය සකස් කරමින් සිටි ඇය, එය උකුල මත දමා ඇගේ නිල් පැහැති දෙනෙත් අප වෙත යොමු කළාය.

"මට නම් මේ ගැන හොඳටම විශ්වාසයි මහත්මයා." ඇය කීවාය. "මෙතැන ලොකු වැරැද්දක් සිදුවෙලා තියෙනවා. මේක කොහොමටවත් මා වෙනුවෙන් එවූ පාර්සලයක් නෙමෙයි. ස්කොට්ලන්ඩ්යාඩ් පොලිසියේ මහත්මයාට මං ඒ බව කීපවාරයක්ම කිව්වා. මං එහෙම කිව්වාම ඔහු මට හිනාවෙනවා. මට මේ ලෝකෙ මොනම හතුරෙක්වත් නෑ මහත්මයා. ඉතින් ඇයි කවුරු හරි මට මේ වගේ නපුරු විහිළුවක් කරන්නේ?"

"කුෂිං මෙනෙවිය, මටත් හිතෙනවා ඔබේ අදහස නිවැරදියි කියලා." හෝම්ස් කීවේ ඇය අසලින් අසුන්ගනිමිනි.

"මං හිතනවා ඒ ගැන කිසිම සැකයක් නෑ..." කියා නතරව නැවැත්වූ හෝම්ස්, ඇගේ මුහුණේ පැත්තක් දෙස ඇසිපිය නොහෙළා බලාසිටියේය. ඔහුගේ මුහුණෙන් ප්‍රකාශවූයේ විස්මය මෙන්ම තෘප්තියට පත් ලකුණුය. හෝම්ස් එක්වරම නිහඬ වීමට හේතුව කුමක්දැයි බැලීමට, ඇය ඔහු දෙස බැලුවාය. එවිට හෝම්ස් යළිත් යථා තත්ත්වයට පත්විය.

මගේ මිත්‍රයාට ඇගේ මුහුණේ දකින්නට ලැබුණු මෙතරම් පුදුමාකාර ලක්ෂණ මොනවාදැයි බැලීමට මම ද ඇය දෙස පරීක්ෂාවෙන් බලාසිටියෙමි. නැතිත් තැනින් පුදුවූ හිසකෙස්, කන්වල පැළැඳ සිටි 'ගිල්ට්' නම් මිශ්‍රලෝහයෙන් තැනූ කරාබු, ශාන්ත ස්වභාවයක් පළකරන මුහුණ, ආදිය හැරුණු විට, වෙනත් කිසිදු වැදගත් යමක් මට නම් දකීමට නොහැකි විය.

"මට තිබෙනවා ඔබෙන් අහන්න ප්‍රශ්නයක් දෙකක්"

"...... ඔය ප්‍රශ්නවලට පිළිතුරු දීලා මට දන් එපාවෙලා." ඇය කීවේ නොඉවසිල්ලෙනි.

http://sherlockholmesinvestigations.blogspot.com

"මං හිතන්නේ ඔබට සොහොයුරියන් දෙදෙනෙක් ඉන්නවා. එහෙම නේද?"

"ඔබ කොහොමද ඒක දන්නෙ?"

"මේ කාමරයට ඇතුළුවුණු හැටියේම, මට අර ගිනිදළුන් පඩිය මත ඇති ඡායාරූපය දකින්න ලැබුණා. ඒකෙ ඉන්නවා කාන්තාවන් තිදෙනෙක්. ඉන් එක්කෙනෙක් නිසැකවම ඔබ. අනික් දෙදෙනාට තිබෙන්නේ බොහොම දුරට ඔබේ මුහුණුවර. ඒ හින්දා ඒ ඔබේ සොහොයුරියන් බවට සැකයක් නෑ."

"ඔව්. ඔබ හරියටම හරි. අර දෙන්නා මගේ නංගිලා. එක්කෙනෙක් සේරා. අනෙකා මේරි."

"ඊළඟට මගේ වැළමිට හරියේ තියෙනවා තවත් ඡායාරූපයක්. ඒක අරගෙන තියෙන්නේ ලිවර්පූල් වලදී. ඒකෙ ඔබේ නංගී ඉන්නවා පිරිමියෙකුත් සමග. ඔහු හැඳ සිටින නිල්ඇඳුමෙ හැටියට, ඔහු නාවිකයෙක්. මේ ඡායාරූපය ගත්ත දිනවලදී ඇය ඔහු සමග විවාහවෙලා හිටියෙ නැති බව මට කිව හැකියි."

"මේ හැම දෙයක්ම ඔබට හොඳින් පෙනෙනවා."

"ඒක මගේ රැකියාවේ කොටසක්."

"ඔව්. ඔබ දුටු දේ නිවැරදියි. ඔය ඡායාරූපය අරගෙන දින කිහිපයකට පස්සේ ඇය බ්‍රව්නර් මහත්මයා එක්ක විවාහ වුණා. ඔහු ඒ දවස්වල රැකියාව කරමින් හිටියේ එංගලන්තය හා දකුණු ඇමරිකාව අතර යාත්‍රා කරන නැව්වල. ඔහු ඇයට හරි ආදරයෙන් හිටියේ. ඒ නිසා ඇයව නොදක හුඟක් දවස් ඉන්න බැහැ කියලා, ඒ යාත්‍රා සේවයෙන් අස්වුණා. ඒ වෙනුවට ලිවර්පූල් හා ලන්ඩන් අතර යාත්‍රාකරන නැව් සේවයට බැඳුණා."

"බාගවෙලාවට ඔහු සේවය කරන්න ඇත්තේ කොන්කරර් නෞකාවේ වෙන්න ඇති."

"නැහැ. ජිම් අන්තිම වරට මාව දකින්න මෙහේ එද්දි, ඔහු සේවය කළේ 'මේ ඩේ' නෞකාවෙ බව මට කිව්වා. ඒ, ඒ දවස්වල. නමුත් ඊට පස්සෙ ඔහුගේ ආදර ගිවිසුම ඔහු කඩා දැම්මා. යළිත් මත්පැන් බොන්න පටන් ගත්තා. බීමට ඇබ්බැහිවුණා. ඔහු නොකඩවාම මත්පැන් පානය කළා. ටිකක් බිව්වාම ඇති ජිම්ට, වෙරිවෙලා පිස්සු හැදෙන්න. ඔහු ගොඩබිමේදී මත්පැන් තොල ගෑවොත්,

http://sherlockholmesinvestigations.blogspot.com

එදා අනෙක් අයට මහා අවාසනාවන්ත දවසක් වෙනවා. ඉස්සරවෙලාම ඔහු මා එක්ක අමනාප වුණා. ඊට පස්සේ ඔහු සේරා එක්ක සණ්ඩුසරුවල් වුණා. දන් මේරිගෙනුත් මට ලියුම් ලැබෙන්නේ නැහැ. දන් ඒ ගොල්ලන්ගේ ජීවිත කොහොම ගතවෙනවද කියල මං කියන්න දන්නෙ නෑ."

කුෂිං මෙනෙවිය කථා කිරීමට පටන් ගත් මාතෘකාවෙන්, ඇගේ සිත සසල වූ බව අපි දුටුවෙමු. තමන්ගේ ජීවිත තනිකඩව ගෙවන බොහෝදෙනෙකු තම පෞද්ගලික විස්තර අන් අයට හෙළි කිරීමට මැලිවෙති. ඇය ද එලෙසින් කිසිවක් අපට හෙළි කිරීමට මුලදී මැලි වූවාය. නමුත් මඳ වේලාවක් ගතවෙද්දී ඇය සියල්ල නොසඟවා හෙළි කිරීමට පටන්ගත්තාය. ඇගේ බාලම නැගණිය විවාහ කරගත්, නාවික මස්සිනා පිළිබඳ තොරතුරු රැසක් ඇය අපට කීවාය. අනතුරුව ඇගේ නිවසේ ලැගුම් ගෙන සිටි වෛද්‍ය ශිෂ්‍යයින් තිදෙනා පිළිබඳවත්, ඔවුන්ගේ සම්පූර්ණ නම් හා පුහුණුව ලැබූ රෝහල් ගැන ද අපට දන්වා සිටීමට, ඇයට අපහසුවූයේ නැත. හෝම්ස් සියල්ල අසා සිටියේ දැඩි උනන්දුවකිනි. ඇය කථාව කියාගෙන යද්දී හෝම්ස් ඇය වෙත ප්‍රශ්න කිහිපයක් ද යොමු කළේය.

"මම දනගත්තා ඔබට බාල, ඊළඟ සොයුරිය සේරා බව. ඔබ දෙදෙනාම අවිවාහක අය. මට පුදුම, ඇයි ඉතින් ඇයත් ඔබ සමග එක ගෙදරක නොසිට, වෙනත් ගෙදරක් අරගෙන ජීවත්වෙන්නෙ?"

"මහත්මයා, ඔබ දන්නෙ නෑ සේරාගෙ හැටි. ඇයට කේන්ති යන තරම් දන්නවා නම්, වෙනම පදිංචි වීම ගැන ඔබ පුදුම වෙන එකක් නෑ. මං ක්‍රොයිඩන්වල පදිංචියට ආවට පස්සේ, ඇයත් එක්ක සාමදානෙන් ජීවත්වෙන්න ලොකු උත්සාහයක් දරුවා. නමුත් මාස දෙකක් යන්න කලින්, අපි දෙන්නට දෙපැත්තට වෙන්න සිද්ධ වුණා. මගේම නංගි ගැන වචනයකින් හෝ දෝෂයක්, පිටකෙනෙකුට කියන්න මං කැමති නෑ. නමුත් මහත්මයා ඇය ඕනෑ එකටයි එපා එකටයි හැම එකකටම ඇඟිලි ගහනවා වැඩියි. කිසිදේකින් ඇයට සෑහීමකට පත්වෙන්න බෑ. සේරාගේ හැටි එහෙමයි."

http://sherlockholmesinvestigations.blogspot.com

"ඔබ කියන්නේ ලිවර්පූල් වල ඉන්න ඔබේ බාල නංගී මේරි හා ඇගේ සැමියා බ්‍රවුනර් මහත්මයා සමගත්, සේරා සණ්ඩුසරුවල් වුණා කියලද?"

"ඔව්. ඇය කාලයක් ඒ දෙන්නා එක්ක බොහොම යාළුකමෙන් හිටියා. ඇයි ඒ දෙන්නා එක්කම ඉන්න ඕනේ කියලා, සේරා ඒ ගෙදර පදිංචියට ගියා නේ. ඒ වුණාට දැන්? දැන් ඇයට ජිම් බ්‍රවුනර්ගේ බිහිසුණුකම ගැන විස්තර කරන්න වචන නැහැ. ඇය මා ළඟ ගත කළ හැම දවසකම කථා කළේ ජිම් බ්‍රවුනර් ගැනයි. ඔහුගේ මත්පැන් බීම ගැනයි. ඔහු ඒ වගේ බීමට ඇබ්බැහි වෙලා ඉන්න එක ගැන, සේරාට මුලින් හරියට අනුකම්පා හිතිලා තියෙනවා. ඉතින් ඇය පටන්ගත්තලු ජිම්ට අවවාද කරන්න. ඕකෙන් මේකෙන් ජිම්ගෙ හිතේ, සේරා ගැන පැහැදීමක් ඇතිවුණාලු. ඒක තමයිලු ඔය ඔක්කොම කලබල වලට මුල්."

"ඔබට බොහොම ස්තූතියි කුෂිං මෙනෙවිය." හෝම්ස් කීවේ අසුනෙන් නැගිට ඇයට හිසනමා ආචාර කරමිනි. "ඔබ කිව්වේ ඔබේ නැගණිය සේරා දැන් පදිංචිවී ඉන්නේ වොලිංටන්හි අලුත් මාවතේ කියල නේද? ඔබට ආයුබෝවන්. ඔබ කියන්න වගේ ඔබට කිසිම සම්බන්ධයක් නැති කරුණක් ගැන, මේ විධියට කරදර විඳින්න සිදුවෙලා තියෙන එක ගැන මටත් කණගාටුයි."

අප ඇගේ නිවසෙන් එළියට බහිද්දී හිස් කුලීරියක් පාරේ ගමන් ගනිමින් තිබිණි. හෝම්ස් එය නැවැත්වීය.

"වොලිංටන් වලට කොපමණ දුරද?"

"හැතැක්මක් විතර දුරයි. මහත්මයා."

"ඒක හොඳයි. ඉක්මනටම නැගිත්තා වොට්සන්. යකඩය හොඳට රත්වෙලා තියෙන වෙලාවෙ ඕන ඒක තලාගන්න. මේ ගැටලුව බොහොම සරල එකක් බවයි, මට නම් පෙනෙන්නෙ. මේක විසඳීමට ප්‍රයෝජනවත් වෙන ආකාරයේ ඉතාම වැදගත් තොරතුරුවක් හෝ දෙකක් තිබෙනවා....... රියැදුරු උන්නැහේ. ඔය විදුලි පුවත් කාර්යාලය ළඟ ටිකකට නවත්වන්න."

අශ්වකරත්තයෙන් බැස ගිය හෝම්ස්, කෙටි විදුලිපුවතක් යවා ඉක්මණින් ආපසු පැමිණියේය. ගමනේ ඉතිරි කොටස පුරාම ඔහු සිටියේ නිහඬව කල්පනා කරමිනි. මුහුණට හිරුඑළිය වැටීම

Feeding Purpose Only. Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only. Not For Print.



263. "වොලිංටන් වලට කොතරම් දුරද?"

http://sherlockholmesinvestigations.blogspot.com

වැළැක්වීමට, හෝම්ස් හිස්වැස්මෙන් මුහුණ ආවරණය කරගෙන, අසුන පිටුපසට හේත්තු වී සිටියේය. අප මඳ වේලාවකට පෙර පිටත්ව ආ නිවසට, තරමක් සමාන නිවසක් අසල රිය නවත්වන ලදී.

අප පැමිණෙන තුරු රිය නවතාගෙන සිටින ලෙස හෝම්ස් රියැදුරාට උපදෙස් දුන්නේය. අනතුරුව රියෙන් බැස ගොස් නිවසේ දොරට තට්ටු කිරීමට එයට අත තැබුවා පමණි. දොර විවෘත විය. අප ඉදිරියට ආවේ කළු පැහැති ඇඳුම් කට්ටලයකින් සැරසී, දිලිසෙන හිස්වැස්මක් අතින් ගත් තරුණයෙකි.

"කුමරි මෙනෙවිය ගෙදර ඉන්නවාද?" හෝම්ස් ඇසීය.

"සේරා කුමරි මෙනෙවිය බරපතල ලෙස රෝගාතුර වෙලා." ඔහු කීය. "ඊයේ සිට ඇගේ මොළයට තදබල අසනීපයක් වැළැඳිලා. මං ඇයගේ වෛද්‍යවරයා. ඇය ඉන්නා තත්ත්වයේ හැටියට, අමුත්තෙකුට ඇය හමුවෙන්න අවසර දෙන්න මට හැකියාවක් නෑ. ඇයට කථාකරන්න උවමනා නම්, තව දින දහයකින් එන්න."

මෙසේ කිව් තරුණයා, තම අත්වැසුම් පැළැඳගෙන වීථියට බැස යන්නට ගියේය.

"ඔව් ඉතින්, අපට ඇය හමුවෙන්න විදියක් නැත්නම්, වෙන කරන්න දෙයකුත් නැහැ."

"බාගවෙලාවට ඔබට කියන්න ඒ හැටි දෙයක් ඇයට නැතුවත් ඇති. අසනීප නිසා දන්නා දෙයක්වත් කියන්න හැකියාවකුත් නැතිව ඇති." මම කීවෙමි.

"ඇයගෙන් මොකුත් දැනගන්න මට උවමනාවක් තිබුණේ නැහැ වොට්සන්. මට උවමනා වුණේ ඇය දකින්න පමණයි. කොහොම වුණත් මං හිතන්නේ, දැනගන්න උවමනා හැම දෙයක්ම මට දැනගන්න ලැබුණා. රියදුරු උන්නැහේ අපව හොඳ හෝටලයකට ගෙනියන්න. දවාලට කෑම ටිකක් කාලා, අපි පොලිස් ස්ථානයට යමු, අපේ මිත්‍රයා ලෙස්ට්‍රේඩ් හමුවෙන්න."

අපි ප්‍රණීත ආහාර වේලක් භුක්ති වින්දෙමු. කෑම ගන්නා අතරතුරේ හෝම්ස් දිගින් දිගටම කථා කළේ වයලීන පිළිබඳවයි.

"වොට්සන් දන්නවද මගේ ස්ට්‍රැඩිවේරියස් වයලීනයේ වටිනාකම කොයිතරම්ද කියලා ?"

http://sherlockholmesinvestigations.blogspot.com

"නැහැ."

"මිත්‍රයා. ඒක ගිනි පත්සියයකට වඩා වටිනා එකක්. ඒ වුණත් මං ඒකට ගෙව්වේ කීයද දන්නවාද? ඔබ විශ්වාස කරන එකක් නෑ: සිලිං පනස් පහයි." ඔහු සිනාසීමට පටන් ගත්තේය. "ටොටන්හැම් කෝට් පාරේ ඉන්නවා යුදෙව් ජාතික තැරැව්කාරයෙක්. මං ඒක ගත්තේ මිනිහගේ මාර්ගයෙන්."

මීළඟට හෝම්ස් කථාකිරීමට පටන් ගත්තේ පැගනිනි ගැනයි. මේ අසාමාන්‍ය පුද්ගලයා ගැන සිත්ගන්නා තොරතුරු රැසක් හෝම්ස් දන සිටියේය. ක්ලැරට් වයින් බෝතලයක් ගෙන්වා ගෙන, වයින් තොල ගාමින් රසවත් කථා රැසක් කියද්දී, මම ඊට ආශාවෙන් සවන් දුන්නෙමි. බොහෝ වේලාවක් ගතවී, හිරු බැස යාමට ද, ආසන්න වී තිබිණි. පරිසරයේ උණුසුම් බව අඩුවී යද්දී, අපේ මිත්‍ර ලෙස්ට්‍රේඩ් සොයා යැමට අපි තීරණය කළෙමු. ඔහු පොලිස් ස්ථානයේ දොරකඩ අප එනතුරු බලා සිටියේය.

"හෝම්ස් මහත්මයා. ඔබේ නමට විදුලිපුවතක් ආවා."

"හා හා! මේක තමයි පිළිතුර."

එය විවෘත කොට කියවා බැලූ හෝම්ස්, මීළඟට එය ගුලි කොට සාක්කුවේ ඔබා ගත්තේය.

"මොනවද හෝම්ස් මහත්මයා ඔබ හොයාගත්තේ ?"

"මං හැම දෙයක්ම හොයාගත්තා."

"මොනවා?", ලෙස්ට්‍රේඩ් ඇසුවේ ඔච්චයෙනි. "ඔබ ඔය විහිළු කරනවා නේද?"

"කිසිම විහිළුවක් නෑ. ඉතා භයානක අපරාධයක් තමා සිද්ධවෙලා තියෙන්නෙ. මං හිතන්නෙ ඒ පිළිබඳ හැම විස්තරයක්ම මං දන් දන්නවා."

"එතකොට අපරාධකාරයා කවුද?"

තමාගේ ආගන්තුක පත්‍රයක් අතට ගත් හෝම්ස්, එහි අනික් පැත්තේ යමක් කුරුටු ගා එය ලෙස්ට්‍රේඩ් වෙත විසි කළේය.

"ඔන්න ඕක තමා ඔහුගේ නම." හෝම්ස් කීය. "කොයිතරම් උත්සාහ කළත්, හෙට රාත්‍රිය වෙනතුරු ඔබට ඔහුව හිරභාරයට ගන්න ලැබෙන්නෙ නෑ. මේ අපරාධ පරීක්ෂණය විසඳීම ගැන, ඔබ

http://sherlockholmesinvestigations.blogspot.com

මගේ නම සඳහන් නොකරන තරමට හොඳයි. ඒ මොකද ගැටලු විසඳීම සම්බන්ධයෙන් මගේ නම සඳහන් කරනවා නම්, එසේ කළ යුත්තේ, විසඳන්න ඉතාම අපහසු ගැටලු ගැන. එහෙනම් අපි යමු වොට්සන්."

තමා වෙත විසිකළ කාඩ්පත දෙස ලෙස්ට්‍රේඩ් මවිතයෙන් මෙන් බලා සිටියදී, අපි දෙදෙනා පොලිස් ස්ථානයෙන් එළියට පැමිණ, දුම්රියපොළ වෙත ගමන් කළෙමු.

* * *

එදා රෑ අපේ නිවසේ රාත්‍රී ආහාරය ගැනීමෙන් පසු, අපි කතාබහක යෙදී සිටියෙමු.

"මේ පරීක්ෂණය විසඳීමේදී අපි යොදාගත්ත ක්‍රමය මොකක් ද දන්නවාද වොට්සන් ?" හෝම්ස් කතාව ඇරඹුවේය. "ඔබ අර ලෝහිත පරීක්ෂණය, සිවරහස් සලකුණ ආදී නම්වලින් හැඳින් වූ පරීක්ෂණ විසඳීමට යොදාගත් ක්‍රමයමයි. ප්‍රතිඵලය ඇතිවෙන්න බල පෑ හේතු මොනවද කියලා ආපස්සට ගමන් කිරීමේ ක්‍රමය, මං මෙහිදීත් යොදා ගත්තා. මං ලෙස්ට්‍රේඩ්ට ලියුම් කෑල්ලක් යැව්වා, අප තවමත් නොදන්නා විස්තර, ඔහුට දැනගන්න ලැබුණාම අපට දන්වන්න කියලා. ඔහුට ඒවා දැනගන්න ලැබෙන්නේ අපරාධකාරයා අත්අඩංගුවට ගත්තාට පස්සෙ විතරයි. ඒ වැඩේ ඔහු හරියට කරාවි. කරුණු විශ්ලේෂණය කරලා, බුද්ධිමත් අයුරින් නිගමනයකට එන්න, ලෙස්ට්‍රේඩ් අදක්ෂ බව ඇත්තයි. නමුත් අපරාධකාරයා කවුද කියලා අපි හෙළිකළා කියමු. එතකොට බුල්ඩෝග් වර්ගයේ සුනඛයෙක් වගේ, අපරාධකාරයා වෙත පැනලා ඔහුව අල්ලාගන්න ලෙස්ට්‍රේඩ් දක්ෂයි. අන්න ඒ දක්ෂකම නිසා තමයි, ලෙස්ට්‍රේඩ් ස්කොට්ලන්ඩ්යාඩ් එකේ ඉහළටම නැග්ගේ. "

"එහෙම නම් ඔබේ පරීක්ෂණය තවමත් අසම්පූර්ණ ද?"

"අත්‍යවශ්‍ය කරුණු හැම එකක්ම අපි දන්නවා. ඒ නිසා සෑහෙන තරම් දුරට සම්පූර්ණයි. මෙම භයානක කටයුත්තේ මූලිකයා කවුද කියන එක අපි දන් දන්නවා. කොහොම වුණත් මේකට ගොදුරුවුණු එක් පුද්ගලයෙක් කවුද කියන එක අපි තවමත්

http://sherlockholmesinvestigations.blogspot.com

හරියට දන්නෙ නැහැ. වොට්සන්. මේ ගැන බාගවෙලාවට ඔබෙත් යම් විසඳුමක් ඇති නේද?"

"මා හිතන හැටියට ඔබ මේ අපරාධය ගැන සැක කරන්නේ ලිවර්පූල් නාවික සේවයේ වැඩකරන ජිම් බ්‍රව්නර් නේද?"

"ඔහ්! එතැන සැක කිරීමට වඩා වැඩි දෙයක් තිබෙනවා."

"ඒ වුණත් මට නම් පෙනෙන්නේ සිද්ධීන් කිහිපයක් පමණයි. ඒවා එකින් එකට සම්බන්ධ වෙන අයුරක් පෙනෙන්නේ නැහැ. මට නම් මේ කිසිදෙයක් තේරුම් ගන්නත් බැහැ."

"මගේ හිතේ නම් තියෙන්නෙ ඒකෙ අනික් පැත්ත. මේකෙ මූලික අවස්ථාවන් ගැන මං ඔබට ඉක්මනින් කියාගෙන යන්නම්. ඔබට මතක ඇති, මේ සිද්ධිය ගැන පරීක්ෂා කරන්න, අපි පිවිසුණේ විවෘත මනසකින්. අපි කිසිම දෙයක් දැනගෙන හිටියේ නැහැ. ඒක අපට ලොකු වාසියක් වුණා.

අපි කිසිම උපකල්පනයකට ඇවිත් තිබුණේ නැහැ. අපි එතැනට ගිහින් යම් යම් දේ නිරීක්ෂණය කළා. අපට තිබුණේ ඒවායින් නිගමනවලට පැමිණීමේ කටයුත්තයි. මොනවද අපි මුලින්ම දුටුවේ? බොහොම සන්සුන් ස්වභාවයක් ඇති, වැදගත් නෝනා කෙනෙක්. ඇයගේ කිසිම රහසක් තිබෙන බවක් පෙනුණේ නැහැ. ඊළඟට අප දුටුවා ඡායාරූපයක්. මේකෙ ඇය ඉන්නවා, නංගිලා දෙන්නෙකුත් සමග. එය දුටු හැටියේම එක් ක්ෂණයකින් මගේ හිතට නැගුණේ මොකක්ද දන්නවද ? අර පාර්සලය එවන්න ඇත්තේ ඇගේ නංගි කෙනෙකුට විය හැකි බව. මං ඒ අදහස හිතේ පැත්තකින් තැබුවා. මොකටද? පස්සේ තුඩක් ලැබුණාම ඒක යළිත් අරගෙන මට විමසා බලන්න පුළුවනි. අපට ලැබෙන දත්තවලින් ඒක ඔප්පු වෙනවාද, නැත්නම් බිඳ වැටෙනවාද යන්න. ඊළඟට ඔබට මතක ඇති, අපි දෙන්නා ගෙවත්තට ගිහිං, ඇයට තැපැලෙන් ආ තෑග්ග ගැන පරීක්ෂා කළා.

පාර්සලය බැඳ තිබුණේ කුමකින් ද? තාර ආලේප කළ නූලකින්. ඒක නැව්වල, රුවල් අලුත්වැඩියා කිරීමේදී යොදාගන්නා වර්ගයේ එකක්. එතකොට එක්වරම, අපේ පරීක්ෂණය, මහමුහුද හා යම් ආකාරයකින් බැඳුණු එකක් බවට පත්වුණා. ඊළඟට එක දිගට කරුණු රාශියක්ම නිරීක්ෂණය කරන්න මට අවස්ථාව සැලසුණා.

http://sherlockholmesinvestigations.blogspot.com

පාර්සලය බැන්ද නූල ගැට ගසා තිබුණේ රුවල් ගැටයෙන්. මේක නාවිකයන්ට ඉතාම හුරු පුරුදු එකක්. පාර්සලය තැපැල් කර තිබුණේ වරායකින්. පාර්සලය තුළ තිබූ පිරිමියාගේ කන, කරාබුවක් සඳහා සිදුරු කර තිබුණා. ගොඩබිම ගැවසෙන පිරිමින් කන්වල කරාබු පළඳින්නේ ඉතාම කලාතුරකින්. නමුත් නාවිකයන් අතර කරාබු පළඳින පිරිමින් බොහෝවිට දකින්න ලැබෙනවා. එතකොට මට ස්ථිර වුණා, අපේ මේ ශෝකාන්ත නාටකයේ හැම දෙනෙක්ම මුහුද හා බැඳුණු අය බව.

පාර්සලයේ ලිපිනය පරීක්ෂා කළාම, එහි සඳහන්ව තිබුණේ, එස්. කුෂිං මෙනෙවිය යනුවෙන්. වැඩිමල් අක්කා එස්. කුෂිං වුණාට, ඇයට නංගි කෙනෙකුත් ඉන්නවා. එස්. කුෂිං මෙනෙවිය ලෙස හැඳින්වෙන. මේක හරිහැටි පැහැදිලි කරගන්න මට උවමනා වුණා. මං ගේ ඇතුළට ගියේ ඒ අදහසින්. මෙතැන වැරැද්දීමක් සිදුවී ඇති බව මට විශ්වාසයි කියලා, මං අර කාන්තාවට කියන්න හැදුවා පමණයි... ඔබට මතකද මගේ කථාව එක්වරම නැවතුණා?

ඒ මොකද, ඒ වෙලාවෙ, හදිසියෙන්ම මට දකින්න ලැබුණු එක් දෙයකින්, මං මවිතයට පත්වුණා. ඒ විතරක් නෙමෙයි. මට පරීක්ෂණය පවත්වන්න තිබුණු ක්ෂේත්‍රයත් එකවරම පටුවුණා. වෛද්‍යවරයෙක් හැටියට ඔබ හොඳින් මේ කරුණ දන්නවා ඇති වොට්සන්. කෙනෙකුගේ කන්පෙත්ත තරම්, එක් කෙනෙකුගෙන් තවත් කෙනෙකුට වෙනස් වෙන තවත් ශරීරාංගයක් නැති තරමයි. එක් පුද්ගලයකුගේ කන, තවත් පුද්ගලයකුගේ කනට ඉඳුරාම වෙනස්. ගිය අවුරුද්දේ පළවූ මානව විද්‍යා සඟරා පරීක්ෂා කරල බැලුවොත්,, ඔබට පෙනේවි, මං මේ ගැන ලිපි දෙකක්ම ලියල තියෙන බව. ඒ නිසා අර පෙට්ටියේ තිබූ කපා වෙන් කළ කන්පෙති, මං පරීක්ෂා කර බැලුවේ විශේෂඥයෙක් හැටියට. මං ඉතා ඕනෑකමින්, ඒවායේ තිබූ ව්‍යුහ විද්‍යාත්මක ස්වභාවය, සනිටුහන් කර ගත්තා. ඊළඟට සුසාන් කුෂිං සමඟ කතාබහ කරන්න ගත්තා. පමණයි: මට පෙනුණා ඇගේ කන, මං මොහොතකට පෙර ලුණු සහිත පෙට්ටියේ දුටු කන්පෙත්තට අතිශයින්ම සමාන බව. මේක අහම්බෙන් සිදුවුණු දෙයක් වෙන්න බෑ. කන්පෙත්ත ඇතුළත් කාටිලේජයේ තිබෙන රැළි, එහි ඉහළ කොටසේ කෙටි නමුත් කවාකාර ස්වභාවය: ඊළඟට පහළට නිදහස්ව

http://sherlockholmesinvestigations.blogspot.com

එල්ලෙන කොටසේ වක්‍රය හා සිතුකුම මේ ආදී සෑම ලක්ෂණයක්ම නූලටම සමානයි.

ඒ සමගම මේ නිරීක්ෂණයේ ඇති වැදගත්කම, මට එක්වරම වැටහුණා. එයින් පැහැදිලි වුණේ මොකක්ද? මැරුම් කාල තියෙන තැනැත්තිය සුසාන් කුෂිං මෙනෙවියගේ ලේ ඥාතියෙක්: බොහොම වෙලාවට ඉතාම ළඟම ඥාතියෙක්. ඉතින් මං ඇයගේ පවුලේ තොරතුරු කථා කරන්න පටන් ගත්තා. ඇගේ පවුලේ අය ගැන වටිනා තොරතුරු සම්භාරයක් ඇය අපට විස්තර කළා ඔබට මතක ඇති.

එවිට අපට මුලින්ම දැනගන්න ලැබුණු වැදගත් තොරතුර මොකක්ද? මේ සුසාන් කුෂිංගේ වැඩිමහල් නැගණියගේ නම සේරා - තවත් එස්. කුෂිං මෙනෙවියක්. ඇය මෑතක් වෙන තුරු පදිංචි වී ඉඳල තියෙන්නේ මේ ගෙදරමයි. එතකොට පාර්සලය මෙහේට ආවේ කොහොමද, පටලැවිල්ල ඇතිවුණේ කොතැනද කියන එක අපට පැහැදිලියි.

ඊළඟට අපට අහන්න ලැබුණා, සුසාන්ගේ බාලම නංගි මේරි, විවාහ වී සිටින නාවිකයා ගැන තොරතුරු. ඔහු මේරිගේ අක්කා සේරා සමඟ හිතවත්ව හිටි හැටි. ඇය ඔවුන්ගේ ලිවර්පූල්හි නිවසේ පදිංචියට ගිය හැටි. පසුව අණ්ඩුසරුවල් වී ඔවුන් දෙපසට වූ හැටි. මේ සණ්ඩුවලින් පස්සේ සේරා ඒ ගෙදරින් පිටවෙලා ක්‍රොයිඩන්වල අක්කාගේ ගෙදර පදිංචියට ආවා. ඊට පස්සේ බ්‍රවුනර් යුවළ, ක්‍රොයිඩන්හි කුෂිං ලා සමඟ යාම් ඊම් හෝ ලිපි හුවමාරුවක් කලේ නැහැ. ඒ නිසා ජිම් බ්‍රවුනර්, සේරා කුෂිං නමට ලියුමක් හෝ පාර්සලයක් යවනවා නම්, යවන්නේ ක්‍රොයිඩන්හි ඇගේ පරණ ලිපිනයට.

දැන් ඔන්න පැටළුණු ගැටලු තැන් ටික ටික ලිහෙන්න පටන් ගන්නවා. අපට අහන්න ලැබුණා, බොහොම ප්‍රකෝපකාරී බිහිසුණු තත්ත්වයකට පත්විය හැකි නාවිකයා ගැන. ඔබට මතක ඇති ඔහු ඊ.කියාවේ ඉතාම හොඳ තනතුරක් අත්හැර දමල ආවා. ඒ ඔහුට බිරිඳගෙන් ඈත්වෙලා, ඇය නොදැක සිටීමට තියෙන අපහසුව නිසා. ඒ අතරම අපට අහන්න ලැබුණා, ඔහු මත්පැනින් සිහි විකල්වෙලා දරුණු වෙන හැටි ගැන. ඒ නිසා ලැබී ඇති සාක්ෂි අනුව, මේ මැරුම් කාල තියෙන තැනැත්තිය ඔහුගේ බිරිඳ මේරි

http://sherlockholmesinvestigations.blogspot.com

විය යුතුයි. පිරිමියෙකුත් මැරුම් කාල තියෙනවා. ඔහුත් නාවිකයෙක්. මොකක්ද මෙහෙම දෙයක් වෙන්න හේතුව?

ජිම් බ්‍රව්නර් තමන්ගේ බිරිඳ ගැන හිතේ තිබුණා දැඩි ආදරයක්. මේක එයින් හටගත් ඊර්ෂ්‍යාවෙන්, මත්පැනින් සිහි විකල් වෙලා කළ අපරාධයක් වෙන්න ඇති. එතකොට මොකටද මේ මිනීමැරුම් ගැන සාක්ෂි, සේරා කුෂිං වෙත යැව්වේ? ඒකට මට අනුමාන කරන්න පුළුවන් කාරණය මෙන්න මේකයි. සේරා කුෂිං, ලිවර්පූල්හි බ්‍රව්නර් නිවසේ ජීවත්වෙද්දී, ඇගේ අතින් යම් අකටයුත්තක් හෝ අත්වැරැද්දක් සිදුවුණා. ඒක දුරදිග යැම් තමා මේ ඛේදජනක අපරාධයට හේතු වුණේ. වොට්සන් දන් ඔබේ අවධානය යොමු කරන්න, ඔහු සේවය කරන නෞකාව නවත්වන වරායන් ගැන - ලිවර්පූල්, බෙල්ෆාස්ට්, ඩබ්ලින්, වෝටර්ෆෝඩ්. බ්‍රව්නර් මේ අපරාධය සිදුකරලා 'මේ ඩේ' නෞකාවට නැගුණා නම්, ඔහුට මුලින්ම හමුවෙන නැව්තොට තමා බෙල්ෆාස්ට්.

මේ අවස්ථාවේදී මේ සිදුවීම්වලට, වෙනත් ආකාරයක විසඳුමක් තිබෙන්නත් පුළුවන්. නමුත් මට හිතුණා ඒවැනි දෙයක් සිදුවෙන්න තියෙන ඉඩකඩ බොහොම අඩුයි. කියලා ඒ උපකල්පනය තමා, කවුරුන් හරි බ්‍රවුනර් මහතා සමග මහත්මිය, මරා දමුවා කියන එක - පිරිමි කන ජිම්ගේ. ගැහැනු කන මේරිගේ. නමුත් මේ උපකල්පනය බිඳ වැටෙන සාක්ෂි මතුවෙනවා. කොයි එකටත් මං විදුලිපුවතක් යැව්වා. ලිවර්පූල් පොලීසියේ මගේ මිත්‍ර අල්ගර්ට. මං ඔහුට කියල යැව්වේ,

"බ්‍රව්නර් මහත්මිය ගෙදර ඉන්නවද කියල, හොයල බලල දන්වන්න ඒ සමගම ජිම් බ්‍රව්නර් 'මේ ඩේ' නම් නෞකාවේ නැගිල පිටත්වෙලා ගිහින්ද?" ඊට පස්සේ අපි - වොලිංටන් වලට ගියා සේරා කුෂිං මෙනෙවිය හමුවෙන්න.

මේ පවුලට සුවිශේෂ කන් පෙන්න සේරා මෙනෙවියගේත් තියෙනවද බලන්න මං හරි ආශාවකින් හිටියේ. ඊට අමතරව අපට ඇගෙන් වැදගත් තොරතුරු රැසක් දැනගන්න ඉඩ තිබුණා. ඒ වුණත් ඇය විස්තර හැම එකක්ම හෙළි කරාවි කියල මගේ ඒ හැටි විශ්වාසයක් තිබුණේ නැහැ. කලින් දවසේ ඇගේ අක්කා වෙත ලැබුණු පාර්සලය ගැන ඇයට අහන්න ලැබෙන්න ඇති. ඒ මොකද මේ කතාව මුළු ක්‍රොයිඩන් ප්‍රදේශය පුරාම පැතිරී ගිය නිසා.

Reading Purpose Only. Not For Print
http://sherlockholmesinvestigations.blogspot.com

එතකොට සේරා හරියටම හිතා ගන්න ඇති, මේ පාර්සලය එව්වේ කා වෙනුවෙන්ද කියලා. මොහොතකට අපි හිතමු නීතිය ක්‍රියාත්මක වෙනවා දකින්න, සාධාරණයක් ඉටු කරන්න, ඇගේ හිතේ කැමැත්තක් තිබුණා කියල. එහෙම නම් ඇය වහාම මේ ගැන පොලිසියට දනුම්දිය යුතුයි.

කොහොම වුණත් ඇය හමුවෙන්න යාම අපේ වගකීමක්. ඒ නිසා අපි ගියා.අපට අහන්න ලැබුණා ඊට කලින් දවසේ වැළඳුණු මොළයේ අමාරුවකින්, ඇය බරපතල ලෙස රෝගාතුර වී ඇති බව. මේ අසනීපය ඇතිවුණේ, ඇගේ අක්කාට ලැබුණු පාර්සලය ගැන තොරතුරු දනගන්න වෙලාවේ ඉඳල. ඒකෙන් මට එක කාරණාවක් හොඳටම පැහැදිලි වුණා. ඒ තමයි සේරා කුෂිං මෙනෙවිය මේ හැම දෙයක්ම හොඳින් තේරුම් අරගෙන ඇති බව. ඒ වගේම පැහැදිලියි, මේ ගැටලුව විසඳන්න ඇගෙන් උදව් ලබාගන්න නම් අපට බොහෝ කාලයක් බලාගෙන ඉන්න වෙන බව.

නමුත් වාසනාවකට වගේ අපේ පරීක්ෂණය ඉදිරියට කරගෙන යන්න, අපට ඇගෙන් ආධාර අවශ්‍ය වුණේ නෑ. මං ඇලිගර්ට යැවූ විදුලිපුවතට පිළිතුරු, පොලිස් ස්ථානයට ලැබිල තිබුණා. ඒකෙන් හැම දෙයක්ම සක්සුදක් සේ පැහැදිලි වුණා.

බ්‍රවුනර් මහත්මියගේ නිවස දින තුනක් තිස්සේ වසා දමා තිබෙනවලු. අසල්වාසීන් හිතාගෙන ඉන්නේ, ඇය තමන්ගේ ඥාතීන් දකින්න, දකුණු දිග එංගලන්තයට ගිහින් කියලලු. නැව් කටයුතු කාර්යාලයෙන් කළ විමසීම්වලින් දනගන්න ලැබිල තියෙනවා, ලිවර්පූල් වරායෙන් පිටත් වී ගිය 'මේ ඩේ' නෞකාවේ ජිම් බ්‍රවුනර් ගමන් කර ඇති බව. මගේ ගණනය කිරීම් නිවැරදි නම්, 'මේ ඩේ' හෙට රාත්‍රියට තේම්ස් නැව් තොටට ළඟාවිය යුතුයි. එතකොට ඔහුව පිළිගැනීමට අපේ හිතවත් මිත්‍රයා ලෙස්ට්‍රේඩ් එතැන ඉඳීවි. සැකයක් නෑ, එවිට අපට හැකිවේවි, අපේ කතන්දරයේ අඩුතැන් පුරවා ගන්න"

ෂර්ලොක් හෝම්ස්ගේ බලාපොරොත්තු කඩවුයේ නැත. දින දෙකකට පසු, කඩදාසි කිහිපයක් අඩංගු ඝනකම් ලියුමක්, හෝම්ස් වෙත ලැබිණි. එහි ලෙස්ට්‍රේඩ්ගෙන් කෙටි ලියුමක් ද, යතුරු ලියනය කළ ෆුල්ස්කැප් පිටු ගණනාවක් ද විය.

http://sherlockholmesinvestigations.blogspot.com

"ලෙස්ට්‍රේඩ් කරදරයක් නැතිවම අපරාධකාරයා අල්ලාගෙන. අහන්න වොට්සන් ලෙස්ට්‍රේඩ් කියල තියෙන දේ"

මා හිතවත් හෝම්ස් මහතාණෙනි,

අප කළ උපකල්පනය කොතරම් සාර්ථකදැයි පරීක්ෂා කිරීමට, යොදාගත් සැලසුම් ගැන ඔබට මතක ඇතුවා නිසැකය. (බලන්න වොට්සන් ,අප, කියල ඉතා අලංකාර ලෙස යොදාගෙන තියෙන හැටි) ඒ අනුව මම, ඊයේ සවස හයට ඇල්බට් නටාකාංගනය වෙත ගියෙමි. ලිවර්පූල් - ඩබ්ලින් - ලන්ඩන් ධූම යාත්‍රා සමාගමට අයත්, ,එස්. ඒස්. මේ ඩේ, නෞකාවට පිවිසීමට මට හැකි විය. ජේම්ස් බ්‍රවුනර් නම් සේවකයකු එහි සේවය කරන බව, කළ විමසීමේදී මට දැනගන්නට ලැබිණි.

පසුගිය මුහුදු ගමනේදී ඔහුගේ හැසිරීම හා ස්වභාවය කොතරම් අයහපත් වූයේ ද යත්, ඔහු රාජකාරි කටයුතුවලින් ඉවත්කර තැබීමට තමාට සිදුවූ බව, කපිතාන්වරයා පැවසීය. බ්‍රවුනර් හමුවීම සඳහා, මම පහළ තට්ටුවේ වූ ඔහුගේ කුටිය වෙත ගියෙමි. ඔහු දෑතින් මුහුණ වසාගෙන, පෙට්ටියක් මත වාඩි වී සිටියේ ය. ඉදිරියටත් පිටුපසටත් නොවන්වාම පැද්දෙමින් සිටි ඔහුගෙන් මට දකින්නට ලැබුණේ, සිහිවිකල් වූවෙකුගේ ස්වභාවයකි. මේ නාවිකයා ශරීරය ඉතා දැවැන්ත, සවිමත් පුද්ගලයෙකි. මුහුණේ රැවුල් තිසිවක් වවා නොසිටි ඔහු දුටු මට සිහිවූයේ, කලින් පරීක්ෂණයකදී අපට උදව් කළ ,ඕල්ඩ්‍රිජ්,ය.

මා පැමිණි කාර්යය අහන්නට ලැබුණු විගස, ඔහු අසුන්ගෙන සිටි තැනින් නැගිට්ටේය. මගේ පරෙස්සමට මම වහාම මුවේ රඳවාගෙන සිටි පොලිස් නළාව පිම්බෙමි. නුදුරෙන් රඳවා සිටි,තේම්ස් ගංගා පොලිස් කාර්ය බලකායේ භටයෝ, වහා ඒ කුටිය වෙත කඩාවැදුණහ. එහෙත් කිසිදු අරගලයක් නොකළ නාවිකයා, විලංගු දැමීම සඳහා තම දෑත් මා දෙසට දිගු කළේ ය. අපි මේ පුද්ගලයා අත්අඩංගුවට ගෙන, පොලිස් සිරමැදිරිය වෙත ගෙන ආවෙමු. අපරාධයට සම්බන්ධ දේවල් තිබිය හැකි නිසා, ඔහුගේ පෞද්ගලික බඩුබාහිරාදිය සහිත පෙට්ටිය ද රැගෙන එන ලදී.

බොහොමයක් නාවිකයන් නිතර ළඟ තබා ගන්නා විශාල පිහියක් හැරෙන්නට, වෙනත් වැදගත් තිසිවක් ඔහුගේ බඩු අතර නොවී ය. කෙසේ වෙතත් පොලිස් ස්ථානයට ගෙන ආ පසු, නඩුව සඳහා තවත් අමතර සාක්ෂි අවශ්‍ය නොවන බව මට පෙනී ගියේය. ඒ කුමන් නිසාද යත්, මෙහි පැමිණී වහාම කට උත්තරයක් දීමට ඔහු කැමැත්ත පළ කළ නිසයි. ඔහු පැවසූ සියල්ල අපේ ලඝුලේඛකයා සටහන් කර ගත්තේය. එහි යතුරු ලියනය කළ පිටපතක් මේ සමග එවමි. මා සිතූ අයුරින්ම මෙය ඉතා සරල ගැටලුවක්

http://sherlockholmesinvestigations.blogspot.com



273. "විලංගු දැමීම සඳහා, ඔහු තම දෑත් මා දෙසට දිගු කළේය."

http://sherlockholmesinvestigations.blogspot.com

බව පෙනී යයි. කෙසේ වෙතත් මේ පරීක්ෂණයේදී මට දක්වූ සහයෝගය ගැන, ඔබ වෙත මගේ සංතෙදනාවය පුද කරමි.

මේ හිතවත්

ජී. ලෙස්ට්‍රේඩ්

"හ්ම්.... ගැටලුව ඉතාම සරල එකක් නෝන්නම්." හෝම්ස් කීය. "ඒ වුණත් අපි දෙදෙනා එහි කැඳවූ වෙලාවෙ නම් ඔහුට එහෙම හිතුණු බවක් මට පෙනුණෙ නැහැ. කොහොම වුණත් බලමු ජිම් බ්‍රව්නර් කටඋත්තරයෙන් කියන්නෙ මොනවද කියල. මෙම කට උත්තරය දීල තියෙන්නේ, හැඩ්වෙල් පොලිස් ස්ථානයේ, පරීක්ෂක මොන්ට්ගොමරි ඉදිරියේ. සිරකරුවා කිව් දේවල්, කථාකරන භාෂාවෙන් ඒ හැටියෙන්ම මොවුන් සටහන් කරගෙන තිබෙනවා. ඒ නිසා මේකෙ වටිනාකම තවත් වැඩියි."

* * * *

"මට කියන්න තියෙන්නෙ මොනවද කියල තේද ඇහුවෙ? ඔව් මට කියන්න හුඟක් දේවල් තියෙනවා. මං කැමතියි කිසි දෙයක් හංගන්නෙ නැතුව, සම්පූර්ණ ඇත්ත කථාව ඔබට හෙළි කරන්න. ඔහේලට ඕනෙ නම් මාව එල්ලුම්ගස් යවන්න. නැත්නම් මාව නිදහස් කරන්න. ඔහේල මොනව කළත් මට ඒකෙ ප්‍රශ්නයක් නෑ. විශ්වාස කරන්න මහත්වරුනි. ඒ දේ කළාට පස්සෙ, මට සැනසිල්ලේ එක මොහොතක් නින්ද ගියේ නෑ. මං හිතන්නේ නෑ පණ තියෙන තුරු, ආයෙ කවදාවත් මට සැනසිල්ලෙ නිදාගන්න ලැබේවි කියල. නින්ද යා ගෙන එනකොටම මට මහා භයානක ඒවා පෙනෙන්න පටන් ගන්නවා. සමහර වෙලාවට ඔහුගේ මුහුණ. නමුත් හුඟක් වෙලාවලට ඇගේ මුහුණ. ඒ දෙකෙන් එකක් නොපෙනී මට කොයි වෙලාකවත් නිදහසේ ඉන්න හැටියක් නෑ. ඔහු මං දිහා බලාගෙන ඉන්නෙ කෑකෑරෙන වෛරයකින්. නමුත් ඇය බලාගෙන ඉන්නෙ පුදුමයට පත්වෙලා වගේ.

ඒ වුණත් මේ ඔක්කෝටම වැරදිකාරිය සේරා. මං මේ වගේ අවාසනාවන්ත තත්ත්වයකට පත්කළ ඇයට ශාප වේවා! ඒ

Reading Purpose Only. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

බැල්ලිගේ නහරවල දුවන ලේ, කුණුවෙන්න කියල මං ශාප කරනවා. මං මේ කියන්න හදන්නේ මං සම්පූර්ණයෙන්ම නිර්දෝෂයි කියල නොමෙයි. මත්පැන් බිල වෙර්වුණාම මං හැසිරෙන්නෙ තිරිසනෙක් වගේ බව මං දනහිටියා. ඒත් මං අයෙමත් බොන්න පටන් ගත්තා. ඒ වුණත් මං දන්නවා, මේරි ඒ වැරැද්දට මට සමාව නොදී ඉන්නේ නෑ. අර කාලකණ්ණි හැතිරි, සේරා කුෂිං අපේ ගෙදර පදිංචියට ආවේ නැත්නම්, මේරි මාව අත්හැර දමන්නෙ නෑ.

සේරා අපේ ගෙදර පදිංචියට ආවේ ඇගේ හිතේ මං ගැන ආදරයක් ඇතිවෙලා. ඇය මුළු හිතින්ම මට ආදරය කළා. නමුත් ඇගේ ඒ ආදරය භාරගන්න මං සූදානම් වුණේ නැහැ. ඉතින් මොකද වුණේ? ඇගේ ඒ ආදරය වෛරයට හැරුණා. මගේ බිරිඳ මේරිගේ පයට පෑගුණු මඩගොඩක් වීතරවත්, මට සේරාව නොවටිනා බව මං ඇයට කිව්වා. ඉතින් මොකද වුණේ? මුළු හිතින්ම ඇය මට කළ ආදරය, මුළු හිතෙන්ම තළ විෂෙන් පිරුණු වෛරයකට හැරුණා.

මං කථාව මුල ඉඳලම ඔබට කියන්නම්. අක්කලා නංගිලා තුන්දෙනෙක් හිටියා. වැඩිමහල් අක්කා සුසන්, හොඳ ගුණයහපත් කාන්තාවක්. දෙවැනියා සේරා යක්ෂණියක්. තුන්වැනියා මේරි දිව්‍යාංගනාවක්. මං මේරිව කසාද බඳිද්දී ඇයට විසි නවයයි. සේරාට තිස්තුනයි. මේරිත් මමත් ලිවර්පූල්වල ගෙයක් කුලියට අරගෙන පදිංචි වුණා. මුළු ලිවර්පූල් පළාතටම හිටියේ නෑ මහත්මයා, මගේ බිරිඳ වගේ හොඳ කාන්තාවක්. ඊළඟට මේරි ඇගේ අක්කා සේරාට, අපේ ගෙදර සතියක නිවාඩුවක් ගත කරන්න එන්න කියල ආරාධනා කළා. සතිය දික්ගැස්සිලා මාසයක් වුණා. ඊට පස්සෙ තමයි ඔක්කොම දුරදිග ගියේ. සේරා අපේම පවුලෙ කෙනෙක් වගේ අපේ ගෙදර නැවතුණා.

- මහත්මයා මං ඒ දවස්වල මත්පැන් කටේ තිබ්බේ නෑ. ලැබුණු ආදායමෙන් කොටසක් ඉතිරි කර ගන්නත්, අපට පුළුවන්කම තිබුණා. ජීවිතය කියන්නේ අලුත් රන්කාසියක් වගේ දීප්තිමත් එකක් බවයි අපට පෙනුණේ. අනේ දෙවියනේ! අපට මේ වගේ ඉරණමකට මුහුණපාන්න වේවි කියල, කවුරුවත් හීනෙකිං වත් හිතුවද?

මට රැකියාවෙන් හැම සති අන්තයකම ගෙදර එන්න පුළුවන් වුණා. සමහර වෙලාවට ලිවර්පූල්වලින් නැවට පටවන්න තිබුණු

http://sherlockholmesinvestigations.blogspot.com

බඩු ප්‍රමාණය හුඟක් වැඩියි. ඒහෙම වෙලාවට නැව පිටත්වෙන දිනය ප්‍රමාද වුණා. එතකොට මට කිසිම කරදයක් නැතිව අමතර සතියක් ගෙදර ඊදෙන්නත් හැකියාව ලැබුණා. ඒකෙන් මට මගේ නෑනා සේරාවත් නිතර දකින්න ලැබුණා. ඇය බොහොම උස, ඉතාම ශෝභාසම්පන්න ගැහැනියක්. ඇය කොයි වෙලෙත්, බොහෝම ආඩම්බරයෙන් හිස කෙළින් කරගෙන සිටි කෙනෙක්. ඇගේ ඇස් දෙකේ තිබුණේ රිදී තාරකාවල වගේ දීප්තියක්. ඒ වුණත් මගේ පුංචි මේරි මා ළඟ ඉන්න තාක් කල්, සේරා ගැන මගේ හිතේ පැහැදීමක් ඇතිවුණේ නැහැ. මට ඒක දෙවියන් වහන්සේ ඉදිරියේත් දිවුරලා කියන්න පිළිවන්.

වෙලාවකට මට පෙනුණා සේරා කැමති වුණේ මාත් එක්ක තනියම කාලය ගතකරන්න. නැත්නං ඇයත් එක්ක ඇවිදින්න යන්න මට කථා කළා. ඒ වුණාට මං ඒවා ගැන වැඩිදුර හිතුවේ නැහැ. නමුත් එක දවසක් මගේ ඇස් ඇරුණා. එදා වරායට නැව ගොඩ බැස්සාම මං වැඩ අවසන් කර ගෙදර ආවා. මගේ බිරිඳ ගෙදර හිටියේ නැහැ. ගෙදර හිටියෙ සේරා.

"කෝ මේරි?" මං ඇහුවා.

"ආ...ඇය මොනවද බිල් වගයක් ගෙවන්න ගියා."

මං හිටියේ හරීම නොඉවසිල්ලෙන්. මං කාමරයේ ඉහළ පහළ වේගයෙන් ඇවිද්දා.

"ජිම්. ඔයාට මේරි නැතුව, මිනිත්තු පහක් සන්තෝෂයෙන් ඉන්න බැරිද?" සේරා ඇහුවා. "ඔය තරම් ටික වෙලාවක් වත් මාව ආශ්‍රය කරන්න ඔයා කැමති නෑ කියන්නෙ, මට කරන අපහාසයක්"

"ඒකට කමක් නෑ ගෑනියෙ." මං කීවේ ඇයව ගණන් නොගන්නා බව හඟවමින්.

තළල රැළි කරගෙන ඇය මඳ වෙලාවක් මං දිහා නිශ්ශබ්දව බලාගෙන හිටියා.

"ජිම් නමුසෙ මහා බය ගුල්ලෙක්." එහෙම කිව් ඇය, මහා උපහාසාත්මක විධියට හිනාවෙලා, කාමරයෙන් එළියට ගියා.

එදා ඉඳන් සේරා මට වෛර කරන්න පටන්ගත්තා. ඇගේ මුළු ආත්මයෙන්ම මට වෛර කළා. මේ තත්ත්වය යටතේ ඇයට තවත් අපේ ගෙදර ඉන්න ඉඩ හැරීමෙන් මං කළේ ලොකු මෝඩ

http://sherlockholmesinvestigations.blogspot.com



277. " ඒකට තමන් නෑ ගැනියෙ " මං කිව්වෙ ඇයව ගණන් නොගන්නා බව හගවමින්

http://sherlockholmesinvestigations.blogspot.com

කමක්. මං මේරිට එක වචනයක් කිව්වෙ නෑ. ඒ මොකද පුංචි දෙයක් හරි කිව්වා නම්, ඇය හරියට දුක්වෙවී කල්පනා කරන්න පටන්ගන්නවා.

ඉතින් වෙනදා විදියටම කාලය ගෙවිල ගියා. නමුත් මේරිගේ ස්වභාවය ටිකෙන් ටික වෙනස් වී ගෙන එන බව මට තේරෙන්න පටන්ගත්තා. ඇය මෙච්චර කාලයක් හිටියේ, මං ගැන විශ්වාසයක් තියාගෙන හිටි අහිංසක ගැහැනියක්. නමුත් ඇය මං ගැන අවිශ්වාස කරන්න පටන්ගත්තා. මං ගිහිං හිටියේ කොහේද? මෙච්චර වෙලා මොනවද කළේ? කවුද මට ඔය ලියුම් එව්වන්නෙ? මොනවද මගේ සාක්කුවල තියෙන්නෙ? මේ විදියට දහසකුත් එකක් දේ හාරා අවුස්සමින්, ඇය මගෙන් ප්‍රශ්න කරන්න පටන්ගත්තා. ඇගේ මේ පිළිවෙත එන්න එන්නම වැඩිවුණා. එකිට මාව පෙන්නන්න බැරුව ගියා. මගේ වැරැද්දක් තිබුණත් නැතත්, මා එක්ක රණ්ඩු දබර වෙන්න පටන් ගත්තා. මේක මට තේරුම් ගන්න බැරි මහා පුදුමයක් වුණා. මේ හැම දෙයක්ම වෙද්දි සේරා මගේ මුහුණවත් බැලුවේ නෑ. මා එක්ක එක වචනයක් කථා කළේ නෑ. ඇය මේරි එක්ක හොඳටම යාළු වුණා. දන් පණට පණ. මොකක්ද මේ සිද්ධවෙන්නේ කියන එක මට තේරුම්ගන්න බැරිවුණා.

සේරා මාව විනාශ කරන්න සැලසුම් කරලා, මගේ අහිංසක මේරිගේ හිතට විෂ ඇතුළු කරලා. නමුත් මගේ තියන මෝඩකමට මේක මට පෙනුණෙ නෑ. අන්ධයෙකුට වගේ කිසිම දෙයක් පෙනුණෙ නෑ. ඔන්න ඊට පස්සෙ, මෙච්චර කල් මත්පැන්වලට අත නොතියා ඉඳපු මම ආයෙමත් බොන්න පටන්ගත්තා. මේරි වෙනස් නොවී කලින් වගේ හිටියා නම්, මං ජීවිතේටම මත්පැන් බෝතලයක් අතින් අල්ලන එකක් නැහැ. මා ගැන හිත කලකිරෙන්න මොකක් හරි කාරණාවක් ඇගේ හිතට වැටිලා. දවසින් දවසම අපි දෙන්නා එකිනෙකාගෙන් ඈත්වුණා. ඔය අතරෙ තමයි ඇලෙක් ෆෙයාබර්න් අපේ ගෙදරට ආවෙ. එදා ඉඳල අපේ ගෙදර තත්ත්වය දහස් ගුණයකින් නරක අතට හැරුණා.

ඔහු මුලින් අපේ ගෙදරට ආවේ සේරා හමුවෙන්න. ඊළඟට ඔහු මේරිත් මාවත් හඳුනාගත්තම අපි හමුවෙන්නත් ආවා. ඔහුට තිබුණා, ගිය තැනක මිත්‍රයින් ඇතිකර ගැනීමට පුදුම දක්ෂකමක්. ඔහු බොහොම කඩවසම් පෙනුමක් තිබුණු පුද්ගලයෙක්. ඇලෙක්

http://sherlockholmesinvestigations.blogspot.com

ෆෙයාබර්න් ලෝකය වටේම රවුම් ගහලා, අපි නොදුටු දහසකුත් එකක් දේවල් දුටුව කෙනෙක්. අනෙක් අයට හරි ආශාවෙන් අහගෙන ඉන්න පුළුවන් විධියට, කථාකරගෙන යන්න ඔහු බොහොම දක්ෂයි. නාවිකයෙක් හැටියට නැව් වල සේවය කරල තිබුණත්, ඇලෙක්ගේ තිබුණේ බොහොම ආචාරශීලී හැසිරීමක්. මාසයක් පමණ ඔහු නිතරම අපේ නිවසට ආව ගියා. ඔහුගේ මේ සිත් ඇදගන්නා හැසිරීම නිසා, අපේ ජීවිතයට විනාශය ළං වෙවි කියල මට් කිසිවිටෙකත් හිතුණේ නෑ.

මේ සිද්ධිය ඇරඹුණේ බොහොම සුළු දෙයකින්. මං දවසක් ගෙදරට ගොඩවැදිලා සාලය ඇතුළට ආවා. අඩි ශබ්දයක් අහන්න ලැබිලා, මගේ බිරිඳගේ මුහුණ එළියවුණු හැටි මං දුටුවා. නමුත් ගෙට ඇතුළුවුණේ කවුද කියලා දකිනකොට, ඇගේ මුහුණ අඳුරු වුණා. ඒකෙන් හැමදෙයක්ම හිතාගන්න මට හැකිවුණා. ඇය මගේ අඩි ශබ්දය වරදවා වටහාගන්න ඇති ඇලෙක්ගේ කියලා. ඒ වෙලාවෙ මට ඔහුව අහුවුණා නම්, මං මොනවා කරාවිද දන්නෙ නෑ. ඒ මොකද කෝන්ති ගියාම මම බොහොම දරුණු විධියට ක්‍රියා කරන්නේ, සිහිවිකල් වෙලා වගේ.

මට යක්ෂයා ආවේශ වෙලා ඇති බව මේරි දුටුවා. අපේ විවාහ ජීවිතය විනාශ කළ, මේ හැමදේකටම වගකිවයුත්තා කවුද කියන එක මගේ මොළේට ආවා. මේව තවත් ඉවසාගෙන ඉන්න මට පුළුවන් කමක් තිබුණේ නැහැ.

මගේ හිතේ ඇතිවුණු හැඟීම් මේරි මගේ මුහුණෙන් වටහා ගන්න ඇති. ඇය දැන් ඔසවාගෙන ඉදිරියට පැන්නා.

"අනේ ජිම් එපා එපා."

"කෝ සේරා." මං ඇහුවා.

"කුස්සියේ වැඩක්." ඇය කිව්වා. මං ගියා කුස්සියට.

"සේරා. මං උඹට හොඳින් කිව්වා කියල හිතේ තියාගනිං. ෆෙයාබර්න් කියන එකා මීට පස්සේ මේ ගෙදර පස් පාගනවා හෙම නෙමෙයි."

මං කිව්වේ කැකෑරෙන කෝපයෙන්.

"හරි වැඩක් නේ! එයා මෙහේ ආවම තමුසෙට මොකද?" සේරා කිව්වේ කිසි ගණනකට නැතුව.

http://sherlockholmesinvestigations.blogspot.com

"ඒක මගේ ආඥාවක්."

"හො හෝ" ඇය කිව්වා "මේ ගෙදරට මගේ යාළුවො වැද්ද ගන්න හොඳ නැද්ද? එහෙනම් මේ ගෙදරට මාත් සුදුසු නැතිව ඇති?"

"උඹට ඕනැ එකක් උඹ කරපං. ඒත් මෙන්න මේක මතක තියාගනිං.පෙයාබර්න් මේ ගෙදරට ආයෙමත් අඩියක් තිබ්බොත්, මං උගේ කනක් කපලා, උඹට දෙන්වා පශ්චස්සමින් අරං තියාගන්න."

මං ඒ කිවු දේට ඇයට භය හිතෙන්න ඇති. ඊට පස්සේ ඊකි එක වචනයක් කථාකළේ නෑ. එදා හැන්දෑවෙම ඇ අපේ ගෙදරින් යන්න ගියා.

කොහොම වුණත් ශ්‍රේරාගේ හිතේ මා එක්ක තිබුණු වෛරය වැඩිවුණා මිසක් අඩුවුණේ නෑ. මං දන්නෙ නෑ ඊකිට අපේ පවුලට යක්ෂ භූත කොඩිවිනයක් කරන්න හැකියාවක් තිබුණද කියලා. එහෙමත් නැත්නම් ඔයගත් පලියක්හා, මගේ බිරිඳ වරදට පෙළඹෙව්වාද කියල. කොහොම හරි ශ්‍රේරා, අපි පදිංචිව හිටි පාරට නුහක් ළඟින්ම ගෙයක් කුලියට ගත්තා. අරගෙන ඒකෙ නාවිකයන්ට නේවාසිකාගාරයක් දම්මා. පෙයාබර්න් ඒ ගෙදර නැවතුණා. මගේ බිරිඳ මේ ගෙදරට යන එන බව මට දැනගන්න ලැබුණා. ඇය ගියේ හවස තේ වෙලාවට, ශ්‍රේරා එක්ක අතුරු සාමීචියේ යෙදෙන්න. ඇය නිතර නිතර එහෙ ගියාද මං හරියටම දන්නෙ නෑ. නමුත් එක දවසක්, මේරිට නොදනෙන්න මං ඇය පිටුපසින් ගියා.

ඔවුන් කතාබහ කරන්න පටන් ගන්නකොටම මං එහි කඩා වැදුණා. පෙයාබර්න් මහ බයගුල්ලා. ඌ ගේ පිටුපසට දුවලා, පිටි පස්සේ තාප්පෙන් පැනලා දිව්වා. ආයෙත් සැරයක් ඌ ඉන්න තැනක ඉඳලා අහුවුණොත් ඒකිව මරා දමන බව, මං මගේ බිරිඳට දිවුරලා කීවා. මං ඇයව ආපහු ගෙදර කැඳවාගෙන ආවා. ඇය ගෙදර ආවේ කඩදාසියක් වගේ භයෙන් සුදුමැලි වෙලා, වැළපෙමින්. ඇගේ හිතේ මා ගැන ඇතිවුණු වෛරය ගැන මං දනගෙන හිටියා. එතකොට මට කළ හැකිවුණේ සිහිවිකල් වෙනතුරු මත්පැන් බීම පමණයි.

ඇගේ නේවාසිකාගාරයෙන් ජීවත් වෙන්න තරම් ආදායමක් නොලැබෙන බව ශ්‍රේරාට වැටහෙන්න ඇති. ඊට පස්සේ මට අහන්න

http://sherlockholmesinvestigations.blogspot.com



273. "විලංගු දැම්ම සඳහා, ඔහු තම දෑත් මා දෙසට දිගු කළේය."

http://sherlockholmesinvestigations.blogspot.com

මං වේගයෙන් දුවලා, ඔවුන් අල්ලා ගන්නෙ නැතුව, ඔවුනට නොපෙනෙන්න අශ්වකරත්තය පිටුපසින් දිව්වා. ඔවුන් ගියේ දුම්රිය පොළට. ප්‍රවේශ පත්‍ර නිකුත්කරන තැන සෑහෙන සෙනගක් හිටියා. ඒ නිසා ඔවුනට නොපෙනී ඒ ළඟටම යන්න මට හැකිවුණා.

ඔවුන් නිව්බ්‍රයිටන් වලට ප්‍රවේශ පත්‍ර දෙකක් ගත්තා. ඊට පස්සේ මමත් ප්‍රවේශ පත්‍රයක් ගත්තා එතැනටම. ඔවුන් නගින දුම්රිය මැදිරිය බලාගෙන ඉඳලා, ඊට තුනක් පිටුපසින් මැදිරියක මං නැඟුණා. නිව්බ්‍රයිටන් දුම්රියපොළෙන් එළියට බැහැලා, ඔවුන් ඇවිදගෙන ගියේ මුහුදු වෙරළ දෙසට. මමත් ඒ පිටිපසින්ම ගියා. මං හිතන්නේ මං යාර සියයක් විතර පිටුපසින් යන්න ඇති. ඊළඟට මං දක්කා ඔවුන් බෝට්ටුවක් කුලියට ගන්නා හැටි. එදා හරි ග්‍රීෂ්ම දවසක්. ඔවුනට හිතෙන්න ඇති, වතුරේ බෝට්ටු පදින්න ගියොත්, සීතල සුළඟෙන් ඇඟට සනීපයක් දැනේවි කියලා. ඔවුන් බෝට්ටුව පැදගෙන දියඹට ගියා.

මේක හරියට මට හොඳ අවස්ථාවක් ලබල දුන්නා වගෙයි. ඒ වෙලාවෙ මුහුදේ තරමක් ඝන මීදුමක් තිබුණා. ඒ නිසා යාර සියයකට වැඩි දුරක් පෙනුණේ නැහැ. මමත් බෝට්ටුවක් කුලියට ගෙන ඔවුන් පසුපස ගියා. ඔවුන්ගේ යාත්‍රාව මට පෙනුණේ තරමක් නොපැහැදිලිව. ඔවුනුත් බෝට්ටුව පැදගෙන ගියේ මං ගිය වේගයටමයි. මං ඔවුන් ළඟට කිට්ටුවෙද්දී, ඔවුන් වෙරළේ ඉඳල හැතැක්මක දුරක් ගිහින් ඉන්න ඇති. අප වටේටම මීදුම ඝන වුණා. ඒක හරියට අපි තුන්දෙනා වටකරගෙන තිරයක් ඇද්දා වගෙයි. දෙවියනේ! උන්ගේ ළඟටම ළංවුණු බෝට්ටුවේ හිටියේ කවුද කියල දුටුවාම, උන්ගේ මුහුණුවල ඇතිවුණු හැඟීම්! මං ඒව කොහොමද අමතක කරන්නේ?

ඇය විලාප නගල කෑ ගැහුවා. ඔහු සිහිවිකල් වුණු මිනිහෙක් වගේ මට ශාප කරන්න පටන් ගත්තා. ඊළඟට අතේ තිබුණු හබලෙන් මා දෙසට පහරක් එල්ල කළා. මගේ මුහුණේ තිබුණු මිනීමරු හැඟීම ඔහුට පෙනෙන්න ඇති. ඔහුගේ හබල් පාරෙන් බේරෙන්න මට හැකිවුණා. ඊළඟට මගේ වාරය. මගේ අතේ තිබුණු බර ඕක් පොල්ලෙන් මං පාරක් එල්ල කළා, උගේ හිස් මුදුනටම. මට මේරිව මරන්න උවමනාවක් තිබුණේ නෑ. නමුත් මගේ පාරට ඌ බෝට්ටුව ඇතුළේ ඇද වැටෙද්දී, "අනේ ඇලෙක්" කියල ලතෝනි

http://sherlockholmesinvestigations.blogspot.com

Reading Purpose Only. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com



283. "ඇය විලාප නගල කෑ ගැහුවා"

දෙමින්, ඒකී උඩව බඳා ගත්තා. ඒකෙන් මම තවත් යක්ෂාවේශ වුණා. මගේ දෙවැනි පාරෙන් ඇයත් ඒ අසලම හාන්සි. ඒ වෙලාවෙ මං කෝපයෙන් කොයිතරම් වියරුවෙලා හිටියද කිව්වොත්, මං ලේ රහ බැලූ තිරිසනෙක් වගේ වුණා. ඒ වෙලාවෙ මට සේරා අහුවුණා නම්! දෙයියම්පා! එහෙනම් ඇයත් ඒ දෙන්නට එකතු වෙනවා.

මං ඊළඟට ගත්තා මා ළඟ තිබුණු පිහිය එළියට. මට මතක් වුණා මං සේරාට කලින් දඩුසක කිව්ව කථාව. මගේ හිතේ ඇතිවුණා තිරිසන් සතුටක්. මේ ඔක්කෝම අපරාධවලට මුල සේරා. මේ දෙන්නට අත්වුණු ඉරණම ඇයට කියාදිය යුතුයි. එතකොට බලන්න පුළුවන් ඇගේ හිතේ ඇතිවෙන හැඟීම.

මං මිනී දෙක එකට ගැටගහලා, ඒක බෝට්ටුවට ගැට ගැහැව්වා. ඊළඟට බෝට්ටුවේ ලෑල්ලක් කඩලා, බෝට්ටුවට වතුර පිරෙන තුරු බර කරගෙන ඉඳලා, ඒක ගිල්ලුවා. බෝට්ටු අයිතිකාරයා හිතන්න ඇති, මීදුමේ දිශාව හොයාගන්න බැරුව, ඔවුන් දියඹට ගසාගෙන යන්න ඇති කියලා. මං පිරිසිදු වෙලා, මගේ බෝට්ටුවෙන් ආපහු ගොඩට ඇවිත්, මගේ නැවට ගියා. එදා රාත්‍රි මං අරගෙන ආව තෑග්ග සූදානම් කළා, සේරා කුෂිංට යවන්න. පහුවදා ඒක බෙල්ෆාස්ට්වලින් තැපැල් කළා.

සම්පූර්ණ සත්‍ය කථාව ඔන්න ඕකයි. ඔහේලට ඕනෙ නම් මාව එල්ලා මරන්න. නමුත් දනටමත් මට දඬුවම් ලැබිලා ඉවරයි. එක මොහොතක් මට සැනසිල්ලේ ඇස් දෙක පියාගන්න බැහැ. උන්ගේ මුහුණු දෙක මැවී පෙනෙනවා. මං උන්ව එක් ක්ෂණයකින් මරා දැම්මා. නමුත් උන් මාව මරන්නේ, හෙමින් හෙමින්, ටික ටික. තවත් එක රැයක් මට මට මේ විදියට ඉවසාගෙන ඉන්න බැ. එක්කෝ මට පිස්සු හැදේවි. නැත්නම් මාව මැරේවි. මහත්වරුනි මාව අනිවාර්යයෙන්ම හිර මැදිරියකට දමන්න. ඒත් මට අනුකම්පා කරන්න. මාව තනියෙන් නම් තියන්න එපා!"

"මේකෙන් අපට තේරුම් ගන්න පුළුවන් මොකක්ද වොට්සන්?" හෝම්ස් ඇසුවේ, වාර්තාව මේසය මතට දමමිනි.

"දුක, වේදනාව, භීෂණය, කියන ඒවා එකට මිශ්‍රවෙලා, චක්‍රයක් වගේ මනුෂ්‍යයා වටේ කරකැවෙනවා නේ ද? ඒකෙ මොකක් හරි අවසානයක් තියෙන්න ඕන. එහෙම නොවුණොත් මේ මුළු විශ්වයම, අහම්බෙන් වෙන සිදුවීම්වලින් පාලනය වෙන්න පටන්

http://sherlockholmesinvestigations.blogspot.com

ගනීවි. එහෙම දේකට ඉඩ දීල අපට නිහඬවෙන්න පුළුවන් ද? සදාකාලිකව මිනිසා පසුපස එන, මහා විෂම චක්‍රය මේකයි. ඒකට දිය හැකි නිරසාර විසඳුමක්, තවමත් මිනිස් සිතට පළ වුණේ නැති එක මොන තරම් ඛේදජනක ද?'

- නිමි -

Reading Purpose Only. Not For Print

http://sherlockholmesinvestigations.blogspot.com

A Study In Scarlet

# ලෝහිත පරීක්ෂණය

පාළු නිවසක අභිරහස් මිනීමැරුමක්. අඩි සටහන්, පුරුවිටු අළු හා මඟුල් මුද්දකින් අපරාධකරුවා අල්ලා ගැනීමට හෝම්ස්ට හැකිවේද?

ඒ සමඟ තවත් කථා තුනක්

* කහ පුෂ්පරාගය
* සොහොයුරන් දෙදෙනා
* තැපෑලෙන් ආ තෑග්ග

ISBN 955-97776-0-2



මිල රු. 295/-

චන්දන මෙන්ඩිස් ප්‍රකාශන

Reading Purpose Only Not For Profit